# පටිච්චසමුප්පාද සංවණ්ණනා

## (හේතු ඵල විවරණය)

**සම්පාදක**

ත්‍රිපිටකාචාර්ය, අභිධර්මවිශාරද

පූජ්‍ය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේ

උතුම් ධර්මදානයක් ලෙස පිළිගන්වන්නේ බැතියෙනි.

**"සබ්බ දානං ධම්ම දානං ජිනාති"**

(සියලු දානයන් පරදවා ධර්ම දානය ජය ගනී.)

# පටිච්චසමුප්පාද සංවණ්ණනා

## (හේතු ඵල විවරණය)

**සම්පාදක**

ත්‍රිපිටකාචර්ය, අභිධර්මවිශාරද

පූජ්‍ය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේ

**ප්‍රථම මුද්‍රණය 2013 ජූනි**

**දෙවන මුද්‍රණය 2016 මැයි**

© Lithira ලිතිර Printing Industries 2013416

306, ඇඹුල්දෙණිය හංදිය, නුගේගොඩ.

0714521990/0718152131/0112835583/0711348282

lithira2000@yahoo.com

# පටිච්චසමුප්පාද සංවණ්ණනා

## (හේතු ඵල විවරණය)

## පෙරවදන

"ඉති ඉමස්මිං සති ඉදං හොති - ඉමස්සුප්පාදා ඉමං උප්පජ්ජති"

"ඉති ඉමස්මිං අසති ඉදං න හොති - ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති"

තථාගත බුදුරජාණන් වහන්සේ අභිධර්ම පිටකයේ විභංගප්පකරණ පච්චයාකාර විභංග දේශනාව යටතේ දේශිත පටිච්චසමුප්පාද අර්ථ විග්‍රහය අර්ථ සාගරයකි. එහිදී සූත්‍රාන්ත නය ක්‍රමයේ අවිද්‍යාදී දොළොස් අංගයන් අනුලෝම නය ක්‍රමයට පදාර්ථ සහිත දේශනා කොට වදාළ හ. එහිදී ගම්‍යවන පරමාර්ථ විග්‍රහය නම්, යම් යෝගාවචරයෙකුට නාමරූප විපස්සනාවේ යෙදී නාමරූප පරිච්ඡේද ඥානයෙන් විසද කරගත් තියුණු නුවණැත්තේ නම්, එම නාමරූප වැල ඔස්සේ අතීතයට ගමන්කරමින් මේ ජීවිතයේ ප්‍රතිසන්ධික්ෂණය - ප්‍රථම අතීත භවයේ මරණාසන්න චිත්තවීථිය ආදි ක්‍රමයෙන් අතීත භවය, පඤ්චස්කන්ධ වශයෙන් හඳුනාගෙන විපස්සනා කිරීම හා හෙතුඵල වශයෙන් විපස්සනා කිරීම දේශිතය. අතීත - වර්තමාන - අනාගත භවත්‍රය ගලපමින් කිලේශාදි තිවට්ටය, සංඛෙප - තිසන්ධි ආදි ක්‍රමයෙන්, පටිච්චසමුප්පාද අංගයන් විග්‍රහ කරන පිළිවෙලත් සූත්‍රාන්ත දේශනාවේ දී දේශනා කොට වදාළහ.

අභිධර්ම නය ක්‍රමයේ දී දේශනා වන්නේ ඊට වඩා හාත්පසින් වෙනස් ක්‍රමයකි. වර්තමාන වශයෙන් උපදින චිත්ත පරම්පරාව හඳුනාගෙන ඒ එක් එක් සිතක් පාසා වැඩෙන පරමාර්ථ ධර්ම (චෛතසික) හඳුනාගෙන ඒ අනුව වඩන පටිච්චසමුප්පාද විපස්සනාවයි. එහිදී හේතු ආදී චතුෂ්ක නය ක්‍රම සොළොස් (16) ආකාරයකට විග්‍රහ කර චිත්තයක් පාසා උපදින කුසලාකුසල විපාක ක්‍රියා සිත් වර්ග වෙන වෙනමත්

හඳුනාගෙන එක් එක් සිතක් පාසා ඒ ඒ මොහොතේ වැඩෙන හේතු ඵල විසඳුම දේශනා කොට වදාළහ.

මෙසේ පච්චයාකාර විභංගයත්, විභංග අට්ඨකථාවත්, ටීකාගත විස්තරත් ගලපමින් අප විසින් දේශිත ධර්ම දේශනා පෙරහැරක් මෙසේ පිටපත් වී ධර්ම ග්‍රන්ථයක් ලෙස මුද්‍රණය වෙමින් පවතී. සර්ව සම්පූර්ණ පටිච්චසමුප්පාද විග්‍රහයක් මෙහි නොවුනත්, පටිච්චසමුප්පාද විපස්සනා භාවනාවෙන් පච්චය පරිග්‍රහ ඥානය උපදවාගෙන කංඛාවිතරණ විසුද්ධිය ලබන පිළිවෙල මෙහි අන්තර්ගත වී ඇත. විපස්සනා භාවනාවේ යෙදෙන යෝගාවචරයෙකුට මහත් ප්‍රයෝජනයක් ගතහැකි ග්‍රන්ථයක් වන අතර ආධුනිකයනට නැවත නැවත කියවමින් අර්ථාවබෝධ කළ හැකිය.

මෙහි සම්පූර්ණ අර්ථ විග්‍රහය ඇතුළත් වන පටිච්චසමුප්පාද දේශනාව හෙවත් **"හේතු ඵල විවරණය"** වශයෙන් මුද්‍රණය කොට ධර්මදාන වශයෙන් බෙදා දෙනු ලැබේ.

මෙහි දෙවන මුද්‍රණය වෙනුවෙන් පෙළ ගැසුණු පිංවත් රුවන් රාජපක්ෂ මහත්මා, මහත්මනී ප්‍රධාන දරු දෙපළටත්, එසේම සමාධි චිත්ත විවේකාශ්‍රමයේ ප්‍රධාන අනුශාසක අතිපූජනීය මහරගම පදුම ස්වාමීන්ද්‍රයාණන් වහන්සේටත් නිරෝගී සුව දිගාසිරි පිණිස වේවා! එසේම අස්මදාචාර්යෝත්තම අතිපූජනීය නාඋයනේ අරියධම්ම නාහිමිපාණන් වහන්සේ, අතිපූජනීය මීතලාවේ විනීත මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගුරු උතුමන්ටත්, උතුම් ගුරු පූජාවක් වේවා! දෙවියන් සහිත සදේවක ලෝකයාටත් නිවන් පිණිස වේවා! හැදූ වැඩූ දෙමාපියන් ඇතුළු උපස්ථායක මවුපිය දූදරු සැමටත් ලොවුතුරා සුව පිණිස වේවා!

**"සබ්බෙ සත්තා භවන්තු සුඛිත මුදිතත්තා"**

මෙයට, මෙත් කරුණාවෙනි,

**කතුහිමි.**

# පටිච්චසමුප්පාදය

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ උරුවෙල් දනව්වෙහි නේරංජනා නදී තීරය සමීපයෙහි වූ බෝ රුක් මුල් හි අභිසම්බෝධියට පැමිණ, ඵල සමවත් සුව විඳිමින් පළමු සතිය එහිම වැඩහුන් සේක.

එසේ වැඩ හිඳිමින් භාග්‍යවතුන් වහන්සේ රෑ පෙරයම් මුළුල්ලෙහි " අවිජ්ජා පච්චයා සංඛාරා..." යනාදී වශයෙන් ද, "අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො..." යනාදී වශයෙන් මුල සිට අගටත්, අග සිට මුලටත් මෙනෙහි කළ සේක. මේ අයුරින් ලෝක සත්ත්වයා විඳින දුක්ඛ සමුදායේ හටගැන්මත්, නිරෝධ කිරීමත්, රාත්‍රී මැදියම් යාමයේදීත්, පෙරයම් යාමයේදීත් නැවත නැවතත් මෙනෙහි කළ බව විනය පිටකයේ මහා වග්ග පාළියේ ප්‍රථම භාගයේ මහා ඛන්ධකයේ ආරම්භයේම දැක්වේ.

අනමතග්ග සංසාරයේ සත්ත්වයා මැරෙමින් ඉපදෙමින් යන සංසාර ගමන සිදුවන ආකාරයත්, එය නවතාලන ආකාරයත් බුදු ඇසින් දුටු සේක. එය පහදා වදාළ දේශනාව පටිච්චසමුප්පාදයයි. හේතු ඵල දර්ශනය හෙවත් බෞද්ධ දර්ශනය ද එයයි. මෙය අනුපිළිවෙලට සජ්ඣායනා කිරීම පහසුවුවත් අවබෝධ කරගැනීම එතරම් පහසු නොවේ.

මෙම පටිච්ච සමුප්පාද ග්‍රන්ථය සම්පාදනය කළ අප කල්‍යාණ මිත්‍ර අභිධර්ම විශාරද දිගන සුගතවංශ ස්වාමීන් වහන්සේ සරල බසින්, බොහෝ දෙනාට පහසුවෙන් තේරුම්ගත හැකි පරිදි රචනා කර ඇත. උන්වහන්සේගේ සද්ධර්ම අවබෝධයත්, දේශන ලේඛණ කුසලතාවයත් මෙයින් ද ඔප්නැංවී තිබේ. මෙම සහජ කුසලතාවයන් වඩා වර්ධනය කරගැනීමට ආශිර්වාද කරන අතර, පාරමී ගුණ පුරා අපේක්ෂිත බෝධියකින් නිර්වාණාවබෝධය සුවසේ අවබෝධ කරගැනීමට මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේ කුසලය ද හේතුවේවා'යි පතමි.

මහරගම පදුම හිමි.

29 සී, සමාධි චිත්ත විවේකාශ්‍රමය,
පන්සල පාර, කළුබෝවිල, දෙහිවල.

2016. 04. 25.

# පුණ්‍යානුමෝදනාව

මහ පෙළෝ තලය සමතලා කොට අසුන් පනවා බුදු පසේබුදු මහරහතන් වහන්සේලා වඩා හිඳුවා ප්‍රණීතම සිවුපසයෙන් උපස්ථානකොට පිං අනුමෝදන් කරනවාටත් වඩා, ලෝවාමහාපාය, සුවාසූ දහසක් වෙහෙර විහාර, ජේතවනාරාම, පූර්වාරාම වැනි විහාර ගොඩනැගීමටත් වඩා සතරපද ගාථාවකින් තරම්වත් කෙරෙන ධර්ම දනමය පින්කම අති උතුම්යයි බුද්ධ වචනය මුදුනින් පිළිගත් අප මේ දහම් පොත මුද්‍රණය කරවා ධර්ම දන වශයෙන් පිරිනමනුයේ අසීමිත ශ්‍රද්ධාවෙනි.

අති පූජනීය නාඋයනේ අරියධම්ම නාහිමිපාණන්ගේ 78 වන ජන්ම දිනය අරමුණුකොට කෙරෙන මෙම ධර්ම දානමය පිංකමෙන් ලැබෙන කුසලානුභාවයෙන් උන්වහන්සේට කායිකව හා මානසිකව පීඩාදෙන සියලුම කර්ම රෝග දුරු වේවා! කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් ලැබෙන්නා වූ භාවනාමය ආශිර්වාදයත් තව තවත් යෝගාවචර ප්‍රතිපදාව රැක ගනිමින් සෙසු සබ්‍රහ්මචාරී වහන්සේලාට අවවාද අනුශාසනා දෙමින් ශතවර්ෂාධික කාලයක් ආයු වළඳා, සුවසේ පාරමී පූර්ණ කර ගැනීමටත්, උතුම් බුදුබව ලැබීම පිණිසත් හේතු වේවා! වාසනා වේවා!

තමන්ගේ විවේකය ගැන නොසලකා කෙතරම් දුක් පීඩා තිබුණත් සියල්ල විඳ දරමින් හුදී ධර්මකාමීන් වෙත මෙත් සිතුවිල්ලෙන් මෙම "**පටිච්චසමුප්පාද සංවණ්ණනා**" ග්‍රන්ථය නොසිතූ ආකාරයට තම අත්දකීම් ගොනුකොට සම්පාදනය කරන්නට යෙදුන අපගේ කල්‍යානමිත්‍ර ස්වාමීන් වහන්සේ, පූජ්‍ය දිගන සුගතවංශ හිමිපාණන්ට නමනස්කාර පූර්වකව අපගේ කෘතවේදී භාවය පිළිගන්වන අතර තව තවත් මෙවැනි ග්‍රන්ථ සම්පාදනය කිරීමට ශක්තිය ධෛර්ය කායික හා චිත්ත විවේකය ලැබේවායි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු.

ත්‍රිපිටකාචාර්ය, අභිධර්මවිශාරද පූජ්‍ය දිගන සුගතවංශ ස්වාමින් වහන්සේට අප විසින් සසරේ රැස් කරගන්නා සියලුම කුසල් සම්භාරයෙන් උන්වහන්සේගේ සියලුම සම්‍යක් ප්‍රාර්ථනා සඵලවීම පිණිස හේතුවාසනා වේවා!.

සම්බුද්ධ ශාසනය රක්නා වූත්, බබළවන්නාවූත් සියලුම සම්‍යක් දෘෂ්ඨික දෙවි දේවතාවුන් වහන්සේලා ද, සියලු භික්ෂූන් වහන්සේලා ද, මෙම ධර්ම දානමය කුසලය අනුමෝදන් වෙත්වා!

එසේම, මෙම ධර්ම දානානිසංශ පුණ්‍යසම්භාරය අප නමින් මිය පරලොව ගිය දෙමාපියන් ඇතුළු ඥාති බන්ධු වර්ගයාට නිවන් අවබෝධ වීම පිණිස ම හේතු වේවා! අපගේ දෙමාපියන් දෙපළටත්, මාගේ ආදරණීය බිරිඳ ඇතුළු දරුවන්ටත් නිදුක් නිරෝගී සැප ලැබ සුවසේ පාරමිතා පූරණය කර නිවන අරමුණු කර ගැනීමට මෙම ධර්ම දානමය කුසලය හේතු වේවා! අනන්ත අප්‍රමාණ දෙව්මිනිසුන් සහිත ලෝකයාට නිවන් සුව පිණිස හේතු වූවා වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේ දේශනා කොට වදාළා වූ ශ්‍රී සද්ධර්මය මුලු මහත් ලෝක ධාතුව තුළ බැබළේවා!

රුවන් රාජපක්ෂ 2016-04-16

## පටුන

### සූත්‍රාන්ත නය ක්‍රමය


**ප්‍රථම දේශනාව - 11 - 58**

i අවිජ්ජා පච්චයා සංඛාරා - 16

ii සංඛාර පච්චයා විඤ්ඤාණං - 26

iii විඤ්ඤාණ පච්චයා නාමරූපං - 31

iv නාමරූප පච්චයා සළායතනං - 32

v සළායතන පච්චයා ඵස්සෝ - 35

vi ඵස්ස පච්චයා වේදනා - 36

vii වේදනා පච්චයා තණ්හා - 40

viii තණ්හා පච්චයා උපාදානං - 47

ix උපාදාන පච්චයා භවො - 50

x භව පච්චයා ජාති - 52

xi ජාති පච්චයා ජරාමරණං - 53

xii තත්ථ කතමො පරිදෙවො - 56

xiii තත්ථ කතමො දෝමනස්ස - 57

**දෙවන දේශනාව - 59 - 89**

චතුර්විධ සංක්ෂේපය - 63

වට්ටත්‍රය - 67

අභිධර්ම නය ක්‍රමය - 84

**තුන්වන දේශනාව - 93 - 105**

01 පච්චය චතුක්කං - 94

i පළමු නය ක්‍රමය - 97

ii දෙවන නය ක්‍රමය - 101

iii තුන්වන නය ක්‍රමය - 102

iv හතරවන නය ක්‍රමය - 104

| | | |
|---|---|---|
| **සතරවන දේශනාව** | - | **107 - 136** |
| 02 හේතු චතුක්කං | - | 107 |
| 03 සම්පයුත්ත චතුක්කං | - | 110 |
| 04 අඤ්ඤමඤ්ඤ චතුක්කං | - | 112 |
| මාතිකා නය | - | 113 |
| අකුසල නිද්දෙසො | - | 113 |
| 01 ලෝභ මුල සිත් 08 | - | 115 |
| 02 දෝස මුල සිත් 02 | - | 132 |
| **පස්වන දේශනාව** | - | **137 - 163** |
| 03 මෝහ මූල සිත් | - | 137 |
| කුසල නිද්දෙසො | - | 151 |
| 01 කාමාවචර කුසල් | - | 155 |
| **හයවන දේශනාව** | - | **165 - 190** |
| 02 රූපාවචර කුසල් | - | 165 |
| 03 අරූපාවචර කුසල් | - | 175 |
| 04 ලෝකෝත්තර කුසල් | - | 179 |
| අව්‍යාකෘත නිද්දේසෝ | - | 187 |
| 01 අහෙහ්තුක කුසල විපාක සිත් | - | 187 |
| **හත්වන දේශනාව** | - | **191 - 210** |
| 02 සහේතුක කාමාවචර කුසල විපාක සිත් | - | 205 |
| 03 රූපාවචර විපාක සිත් | - | 209 |
| 04 අරූපාවචර විපාක සිත් | - | 210 |
| **අටවන දේශනාව** | - | **213 - 234** |
| 05 ලෝකෝත්තර විපාක සිත් | - | 213 |
| 06 අහේතුක අකුසල විපාක සිත් | - | 223 |
| **නවවන දේශනාව** | - | **235 - 253** |
| අවිජ්ජා මූලක කුසල නිද්දේසෝ | - | 235 |
| කුසල මූලක විපාක නිද්දේසෝ | - | 247 |
| අකුසල මූලක විපාක නිද්දේසෝ | - | 253 |

# පටිච්චසමුප්පාදය

## ප්‍රථම දේශනාව

**(පටිච්චසමුප්පාද විභඞ්ගො - 1. සුත්තන්ත භාජනීයං)**

**"අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති..."**

ශ්‍රද්ධාවන්ත වාසනාවන්ත ගුණගරුක පින්වතුනි,

මේ අවස්ථාවේ අපි බලාපොරොත්තු වන්නේ තථාගත බුදුපියාණන් වහන්සේ විසින් දේශනාකොට වදාළ පරම ගම්භීර පටිච්ච සමුප්පාද නය ක්‍රමය දේශනා මාතෘකාවන් අර්ථ විග්‍රහ කරගෙන ඔබ අප සැමදෙනාගේ ජීවිත යථා අවබෝධය ඇතිකර ගැනීම පිණිසයි.

**පටිච්චසමුප්පාද** යන වචනයේ අර්ථය; **පටිච්ච** යනු හේතුවක්, කාරණයක්, ප්‍රත්‍යයක්, උපකාරයක් යන අදහසයි. **සං උප්පාද** හටගැනීමය යනු මෙතැනදී පැහැදිලි කරගත යුතු වන්නේ **පච්චය, පච්චයුප්පන්න** මෙන්ය. යම්කිසි හේතුවක් කාරණයක් නිසා, යම්කිසි දෙයක හටගැනීමක් වෙයි නම්, ඒ හටගැනීම තමා පටිච්චසමුප්පාදයෙන් කියන්නේ. මෙතැනදී පැහැදිලි කරගත යුත්තේ අපි රැස්කරගන්නා කුසලාකුසල කර්ම තියෙනවානම්, කුසලා කුසල කර්ම ශක්තිය නිසා එක් එක් පුද්ගලයින්ගේ, සත්ත්වයින්ගේ ජීවිත නිර්මාණය කෙරේ. භවයෙන් භවයට මේ සියලු සත්ත්වයන් රැගෙන යැමත්, භවයෙන් භවයට සත්ත්වයන් ඉපදෙමින් මැරෙමින් යන, ගමන තමයි පටිච්චසමුප්පාදයෙන් තෝරා දෙන්නේ. උදාහරණ ලෙස පුංචි පැළයක් අපි හදන්නෙමු. මේ පැළය

ක්‍රමයෙන් ලොකු වෙයි. ලොකු වුනාට පසු මේ පැළය වැඩෙන්න වැඩෙන්න ඒ තියෙන පත්‍ර, කොළ, ගෙඩි, මල් සියල්ලක්ම කෙළින්ම පොළොවට වැටෙති. ඊට පසු නැවත එය පොහොර බවට පත්වී, නැවත ඒ ගසේම මුල්වලින් සාරය ඇදලා ගනී. තමන් හදපු ගහ වැඩි වැඩී යනවිට ඒ ගහේම නිෂ්පාදනය වන කොළ, ගෙඩි, පත්‍ර ආදී හැම දෙයක්ම ඒ ගහටම නැවත උපකාර වේ. මේ සිද්ධාන්තය තමා සාමාන්‍යයෙන් සිදුවනුයේ. පොළොවට යම්කිසි පොහොර ගතියක් හැදෙන්නේ ගසේම තියෙන පත්‍ර ආදිය එකතුවීමෙනි. අන්න ඒවගේ අපි මේ එකතු කරගන්න දෙයින්ම තමයි අපට නැවත ජීවිතයක් හැදෙන්නේ. අපි එකතු කරගන්න දේම උපකාරි වෙලායි නැවත දෙයක් හැදෙන්නේ. නැවත නැවත අපි මේ ගමන යන්න නම්, නැත්නම් මේ සංසාරයේ කැරකෙන්න නම්, අපි එකතු කරගන්නේ කුසලාකුසල කර්මයි. රහතන්වහන්සේ නමක් ගැන බැලුවහොත් උන්වහන්සේ එකතු කරන්නේ නැහැ. උදා:- මැරුණු ගසක් ගත්විට ගස මැරුණට පසු ඒ ගසේ කොළ, ගෙඩි, මල් සියල්ල බිමට වැටෙනවා. නමුත් එම ගසේ මුල්වලට ශක්තියන් නැහැ ඒ වැටුණු ගෙඩි, මල්, කොළවල සාරය උරාගන්න. ගහ මැරිලා. ඒ වාගේ තමයි රහතන්වහන්සේ නමක් වූ පසු උන්වහන්සේ නොයෙක් ක්‍රියා කරනවා. අපි වාගේ දන්දෙනවා. භාවනා කරනවා. මොන දේ කළත් ඒ සියලු දේම රහතන්වහන්සේගේ ජීවිතයට උපකාරි වෙන්නේ නැහැ. අර ගහ මැරෙන්න ආසන්නයේ බිමට වැටුණු පත්‍ර වාගේ උන්වහන්සේ සිතින් ඒවා උපාදාන වෙන්නේ නැහැ. බොහොම සරලව තේරුම් ගත හැකියි. කරුණු කාරණා ඇතුළත් මහා සාගරය වගේ විස්තර සහිතයි. පළමුව කෙටියෙන් සරලව දේශනා කරගෙන යන අතර පසුව පටිච්චසමුප්පාද කරුණුවලට, පට්ඨාන එකතු කරන්න අවශ්‍යයි. පට්ඨාන කරුණු එකතු කර විස්තර කළවිට ගොඩක් ගැඹුරින් හොඳට අපගේ තීක්ෂණ බුද්ධිය පහළ වෙන්නෙ. මෙන්න මේ ක්‍රමය තමයි පටිච්චසමුප්පාදය. ඒ වගේම අපේ ජීවිතත් අපි එකතු කරගන්න දේ අනුව අපේ ජීවිත හැදෙනවා. අපි එකතු කරගන්නේ නැත්නම් අපි රහත්වෙලා. පටිච්චසමුප්පාදයෙන් කරන්නේ මේ හේතු ඵල අනුව එනම් පහළවෙන සියලුම චිත්ත ධර්මයන්, පහළවෙන සියලුම

චෛතසික ධර්මයන්, පහළවෙන සියලුම රූප ධර්මයන්, එනම් පහළවෙන පරමාර්ථ ධර්ම 3, ඇතිවන හේතුවන ප්‍රත්‍යයන්, හේතු ඇතුළු නොයෙක් ධර්ම කාරණා උපකාර එකතුවෙලා තමයි මේවා සකස්වන්නේ. නමුත් නිර්වාණය කියන්නේ එහෙම හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා දෙයක් නොවේ. අසංඛතයි, අප්පච්චයයි ආදී නම්වලින් නිර්වාණය වෙනමම අර්ථ විග්‍රහ කෙරේ.

මේ පටිච්චසමුප්පාදය ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර දේශනා අපමණයි. ගණන් කරන්න බැරිතරම්. ඒ කියන්නේ කුඩා කුඩා ප්‍රමාණයේ කුඩා කුඩා සූත්‍ර පවා තියෙනවා. අංගුත්තර නිකාය ගතහොත් කුඩා සූත්‍ර බොහොමයක් තියෙනවා. සංයුක්ත නිකාය ගතහොත් වෙනම පටිච්චසමුප්පාද සංයුක්ත නමින් වෙනම දේශනා තියෙනවා. පටිච්චසමුප්පාද කරුණු ඒ අතර ඇතුළු කරලා ඒ අතරතුර දේශනා කර තිබෙනවා. දීඝ නිකායේ මහා නිදාන සූත්‍රය ප්‍රධාන කොටගත් බොහෝ තැන්වල පටිච්චසමුප්පාද කරුණු සඳහන් වෙනවා. මජ්ඣිම නිකායේ සම්මා දිට්ඨි සූත්‍රය ආදී එකතු කරගත්ත බොහෝ සූත්‍ර දේශනාවල පටිච්චසමුප්පාද නොයෙක් ආකාරයෙන් දේශනා කර තිබෙනවා. මේ පටිච්චසමුප්පාද නමැති සාගරයට බැසගතහොත් වටිනා වටිනා දේවල් එක එක පැතිකඩවලින් අපට මෙහි අර්ථ අහුලගන්න ලැබෙනවා.

දිනක් බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නා කාලේ ආනන්ද ස්වාමීන් වහන්සේ විවේකීව සිටින අවස්ථාවක පටිච්චසමුප්පාදය ගැන මෙනෙහි කළා. සිහිකරන විට සිතුවා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මෙය ගැඹුරුයි කියා. නමුත් මට මෙහි ගැඹුරක් තේරෙන්නේ නැහැනේ යනුවෙනි. ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා විමසනවා, "ස්වාමිනි, බුදුරජාණන් වහන්ස, මේ පටිච්චසමුප්පාද ධර්මය ගැඹුරුය'යි දේශනා කළත් මට නම් ගැඹුරක් තේරෙන්නේ නැත"යි පැවසුවා.

"**මං හෙවං ආනන්ද අවච, මං හෙවං ආනන්ද අවච**, ආනන්දයෙනි, එහෙම කියන්න එපා, එහෙම කියන්න එපා. **ගම්භීරොචායං ආනන්ද පටිච්චසමුප්පාදො.** ආනන්දය, මේ පටිච්චසමුප්පාදය යනු ගැඹුරු දෙයක්.

**ගම්භීරාව භාසො**, ගැඹුරට බැසගත් දෙයක්. ගැඹුරු බව පෙනෙන දෙයක්. ආනන්දය, මේ නොයෙක් සත්ත්වයෝ භවයෙන් භවයට, හරියට කුරුළු කැදැල්ලක් එකට එක පුංචි කෙඳිවලින් බැඳිලා අවුල්වී තියෙන්නා සේ. උණ පඳුරක් වැල්වලින් අවුල්වී තියෙන්නා සේ. මේ සත්ත්වයෝ භවයෙන් භවයට, අවුලෙන් අවුලට පත්වී ගමන් කරන්නේ, මේ සසර ඇවිද්දුවේ. මේ පටිච්චසමුප්පාදය ගැන තියෙන නොදැනීම නිසයි. අනවබෝධය නිසයි. ඒක නිසා ආනන්දය එහෙම හිතන්න එපා.” නමුත් අර්ථකථාචාර්යයන් වහන්සේලා පැහැදිලි කරන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේට එහෙම වචනයක් පවා පිටවෙන්න හේතුව උන්වහන්සේ බහුශ්‍රැතයි. ධර්ම භාණ්ඩාගාරිකයි. සෝවාන් ආර්ය ශ්‍රාවකයෙක් සිවුපිළිසිඹියා ඥානලාභී බව අපි තේරුම් ගත යුතුයි. උන්වහන්සේ ශාසන තීර්ථයට, ශාසන තොටුපොළට බැසගත් අයෙක්. එබැවින් උන්වහන්සේට ගැඹුරු දේ වැටහීමට පුළුවනි. උන්වහන්සේ ළඟ තමයි මේ සියලු ධර්මය රැඳුණේ. බුදුරජාණන් වහන්සේගෙන් පසුව දේශනා කරන ලද සියලු ධර්මය රැඳුණේ ආනන්ද ස්වාමීන්වහන්සේ ළඟයි. එබැවින් එවැනි වචනයක් පිටවීම, සිතුවිල්ලක් පහළවීම සාධාරණයි. බුදුරජාණන් වහන්සේ මෙ ආකාරයෙන් මේ පටිච්චසමුප්පාදය පිළිබඳව පවතින වටිනාකම දේශනා කළා. මේ ධර්මයේ පවතින වටිනාකම; මේ ධර්මය අවබෝධ නොකළ හෙයින් අපි මේ හැමෝම නොයෙක් දේවල්වලට භාජනය වී තිබෙන්නේ, අපට මේ දුක කියන එක තේරෙන්නේ, දුක් කන්දරාවක් කියන මේ හැමදේම එන්නේ, හැමදෙයක්ම ලැබිලා තියෙන්නේ අපි මේ ඉපදුන නිසා, හැම දෙයකටම හේතුව. පටිච්චසමුප්පාදය ගැන අවබෝධයක් තියෙනවානම්, අපි ගිනි ඇවිළුණු කෙනෙක්, වහාම ගින්න නිවාගන්න මහන්සි ගන්නවා සේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ යම්කිසි කෙනෙක් රාග ගින්නෙන්, ද්වේශ ගින්නෙන්, මෝහ ගින්නෙන්, මාන ගින්නෙන්, නොයෙක් ගිනිවලින් දැවි දැවී ඉන්න අපි මේ ගින්න නිවාගන්නයි මහන්සි ගන්නේ. ගින්න නිවාගන්නට නම් මේ පටිච්චසමුප්පාදය ගැන අවබෝධයක් තියෙන්න ඕනේ. අවබෝධයක් නැතිනම් ගින්න නිවාගන්න බැහැ. හැමදාම ගිනි පත්තු කරගන්නවා.

හැමදාම ගිනි පත්තු කර කර, මේ ගිනි අවුල අවුලා යනවා. ගිනි අවුලන්න අවුලන්න අපේ ජීවිත දුබල වෙනවා. අපේ ජීවිත දුබලෙන් දුබලට පත්වෙලා, මොනවා වෙයිද කියා අපි දන්නේ නැහැ. ඒ නිසා අපි හොඳින් තේරුම් ගත යුතුයි මේ පටිච්චසමුප්පාදය කියන්නේ බොහොම වටිනා ධර්මයක්, මෙය තේරුම්ගත් තරමට තමයි අපට සසර තේරෙන්නේ.

"**අනමතග්ගො අයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති,** මහණෙනි, මේ සසර යනු, මුලක් මැදක් අගක් නොපෙනන මේ සංසාරය අනවරාග්‍රයි." ඒ කියන්නේ මේ සංසාරයේ මුලක් මැදක් අගක් අපට පෙනෙන්නේ නැහැ. මම මේ කියන සත්ත්වයා සසරට එකතුවුනේ කවදා ද? සසර කොපමණ කලක් ඇවිදගෙන ආවාද? සසර ඉවරවෙන්නේ කවදා ද? හිතන්න බැහැ. දකින්න බැහැ. මේ හැම දෙයක්ම සිද්ධවෙලා තියෙන්නේ '**අවිජ්ජා නීවරණානං...**', අවිද්‍යා නම් වූ නීවරණයෙන් වැසී, '**තණ්හා සංයොජනානං**', තණ්හාවෙන් උපාදාන කරගෙන, ඉන් බැඳී මේ සත්ත්වයෝ සංසාරයේ ඇවිදී. අද අපි මනුෂ්‍යයෙක්. අද එකතු කරගන්න දේ අනුව අපි දන්නේ නැහැ ඊළඟ ජීවිතයේ මොන විදියේ විපර්යාස වෙයිද කියලා. ඒක නිසා මේ ජීවිතය ගැන අවබෝධ ඇතිකර ගන්නට නම් මේ පටිච්චසමුප්පාදය ගැන අවබෝධයක් තිබිය යුතුයි.

එයයි අනමතග්ග සංයුක්තය පුරාවටම දකින්න ලැබෙන්නේ. පටිච්චසමුප්පාදය යන බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර, විනය පිටකයේ බොහෝ දේශනා කරපු තැන් ද, අභිධර්ම පිටකය පුරාවටම දකින්න ලැබෙනවා. නොයෙක් තැන්වල නමුත් මෙතැනදී අපි අභිධර්ම පිටකයේ විභඞ්ගප්‍රකරණයේ පච්චයාකාර විභඞ්ගය ආධාර කරගෙන මේ අර්ථ විග්‍රහය ආරම්භ කරමු. හේතුව පච්චයාකාර විභඞ්ගය තුළ සියලුම ධර්මයන් අන්තර්ගත වෙලා තිබේ. සූත්‍රාන්ත ක්‍රමයට විග්‍රහ වෙන ආකාරය, අභිධර්ම නය ක්‍රමයට විග්‍රහවන ආකාරය ආදී හැම දෙයක්ම මෙහි ඇතුළත් වේ. දේශනා මාතෘකා අනුව පළමුව කෙටියෙන් වචන අර්ථ ගැන සරල අවබෝධයක් තිබිය යුතුය. මෙහි වචන අර්ථ අවබෝධයක් තිබුණු පමණට මෙහි ගැඹුරට අවබෝධ කර ගැනීමේ හැකියාව ලැබේ.

## i අවිජ්ජා පච්චයා සඞ්ඛාරා

අවිජ්ජා යනු නොදැනීම, මෝඩකම, අඥානකම. නොදැනීම යනු කුසල් අකුසල් මොනවාද කියා නොදැනීම. හොඳ නරක, යහපත අයහපත නොතේරීමයි. මේ කිසිම දෙයක නොතේරුම්කම අවිජ්ජාව ලෙස සාමාන්‍යයෙන් දැක්විය හැක. සත්ත්වයෝ ඉපදීම, මැරෙන බව නොදැනීම ආදී මේ හැම දෙයක්ම නොදැනීම අවිජ්ජාවයි.

තවත් ගැඹුරින් සැලකුවහොත් දන්දීමේ විපාක නොදැනීම, වැඳුම් පිදුම් කිරීමේ විපාක නොදැනීම, මව්-පිය උපස්ථාන කිරීමේ, උපකාර කිරීමේ විපාක තිබෙන බව නොදැනීම, මෙලොව පරලොවක් තිබෙන බව නොදැනීම, මේ ලෝකයේ ඕපපාතික සත්ත්වයෝ පහළවන බව නොදැනීම, මේ ලෝකයේ යහපත් සිල්වතුන් ගුණවතුන් වහන්සේලා ඉන්න බව නොදැනීම, පටිච්චසමුප්පාදය ගැන නොදැනීම, ගැඹුරු චතුරාර්ය සත්‍යය ගැන නොදැනීම, අරිය මාර්ගඵල ගැන නොදැනීම. මේ ආකාරයෙන් නොදැනීම තමයි අවිද්‍යාව ලෙස සලකන්නේ. ප්‍රධාන වශයෙන් අවිද්‍යාව ලෙස සලකන්නේ මේ සියල්ලේ නොදැනීමයි.

නොදැනීම නිසා සංඛාර හටගන්නවා. මෙතැනදී පැහැදිලිවම චතුරාර්ය සත්‍යය පිළිබඳව නොදැනීම නිසා තමයි තව තව එකතු කරන්නේ. සංඛාර යනු රැස්කිරීමයි. කුසලාකුසල කර්මයන් රැස්කිරීමයි. මේ රැස්කිරීම නිසා විඤ්ඤාණ පහළවෙනවා. ප්‍රතිසන්ධි විඤ්ඤාණ ප්‍රධාන කොටගත් විපාක විඤ්ඤාණ පහළ වේ. මේ විඤ්ඤාණ නිසා නාමස්කන්ධ, රූපස්කන්ධ, පංචස්කන්ධ පහළවෙනවා. මේ නාම රූප නිසා නැවත නැවත අරමුණු නිෂ්පාදනය කරන්න පුළුවන්. නැවත එකතු කරන්න හැකි ආයතන ටික පහළවෙනවා. සළායතන නිසා නැවත චක්ඛු සම්පස්සය ආදී ස්පර්ශ පහළවේ. මේ ස්පර්ශ නිසා වේදනාව හටගනී. වේදනාව නිසා තණ්හාව හටගනී. තණ්හාවෙන් නැවත උපාදාන කරගන්නවා. උපාදනයෙන් පසුව නැවත කර්ම රැස්කරගෙන නැවත ජීවිතයක් උපද්දවාගන්නවා. නැවත ජීවිතයක් උපද්දවාගෙන ජීවිතය ජරාවට, ව්‍යාධි, මරණ ආදී නොයෙක් දුක් කන්දරාවකට නැවත භාජනය වෙනවා. මෙය සාමාන්‍ය සරල අදහසයි.

පෙර ජීවිතවල රැස්කරගත් අවිද්‍යා සංඛාර නිසා මේ ජීවිතයේ අපි විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා විඳිනවා. මේ ජීවිතයේ ලැබෙන මේ ඵස්ස වේදනා ආදිය නිසා නැවත නැවත තණ්හාව උපාදානවලින් රැස්කරගන්න කර්ම ශක්තිය උපකාර කරගෙන ජාති, ජරා, මරණ ඇතිවේ. මෙය තමයි සංසාරේ අතරක් නැර කැරකීමට හේතුව. මෙය කිසිම කෙනෙකුට නැවතීමට හැකියාවක් නැත. නැවතීම සිදුවන්නේ රහත්වුවහොත් පමණී. රහත් වූ උතුමන්වහන්සේට මේ ගමන නැවතීමට හැකිය. බුදුරජාණන් වහන්සේ පහළවුනා මුත් සත්ත්වයින්ගේ සසර ගමන නැවතීමට හැකියාවක් නැත. බුදුරදුන් දේශනාකළ එම ධර්මය අසා, පුහුණු කර, පිළිපැද, භාවනා කර නිවන් අවබෝධ කරගත් පුද්ගලයාට මේ ගමන නැවතීමට හැකියාව ලැබේ. ඊළඟට බුදුරජාණන් වහන්සේ මේ පටිච්චසමුප්පාද දේශනාවේ අංග එකින් එකට පැහැදිළි කළ සේක.

**තත්ථ කතමා අවිජ්ජා? දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධ ගාමිණී පටිපදාය අඤ්ඤාණං, අයං වුච්චති.** **"අවිජ්ජා"** අවිද්‍යාව යනු කුමක්ද? මේ දුක ගැන තිබෙන නොදැනීම. දුකට හේතුව ගැන නොදැනීම. දුක්ඛ නිරෝධය ගැන නොදැනීම. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව ගැන නොදැනීම යන නොදැනීම තමයි අවිද්‍යාව. මෙය ප්‍රධාන වශයෙන් බුදුරජාණන් වහන්සේ අවිද්‍යාව තෝරන ආකාරයයි. තථාගතයන් වහන්සේ දේශනාකරන ලද බොහෝ තැන්වල දක්නාලද සූත්‍රයක් නම්, **"චතුන්නං භික්ඛවෙ ධම්මානං අනනුබොධා අප්පටිවෙධා."** මහණෙනි, ධර්ම හතරක් නොදැනීම නිසා, අනවබෝධය නිසා නුඹලාත් මමත් මේ බොහෝ කෙළවරක් නැති සංසාරයේ අතරක් නැර ඇවිද්දා. සියලු සත්ත්වයන්ගේ මේ සසර ඇවිදීමට ප්‍රධාන හේතුවක්, කාරණාවක් වනුයේ චතුරාර්ය සත්‍යය ගැන තිබෙන නොදැනීම, අනවබෝධය, නොවැටහීම. බුදුරජාණන් වහන්සේ තවදුරටත් පැහැදිළි කළේ, අද මමත් නුඹලාත් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත්තා. අවබෝධ කරගත් නිසා ප්‍රඥා ඇස පහළ කරගත්තා. ප්‍රඥා ඇස පහළ වූ නිසා නැවත අවිද්‍යාව

පහළවන්නේ නැහැ. එනම් මතක තබාගත යුතුයි, මෙම චතුරාර්ය සත්‍යය ගැන යම් කෙනෙකුට ද අවබෝධ වෙන්නේ, අවබෝධවීම යනු පොත පතින් කරුණුවලින් ලබාගත් දැනුම නොවේ, කෙළින්ම මාර්ග ඵලවලින් මෙය අවබෝධවේ නම්, කෙළවර අර්හත්වයෙන් අවබෝධ වෙනවා නම්, අන්න එදාට අවිද්‍යාව සම්පූර්ණයෙන් සිතින් බැහැරවුනා වෙනවා. නැතිනම් සෝවාන් වූ ආර්ය උතුමන් ළඟත් චතුරාර්ය සත්‍යය ගැන යම් අවබෝධයක් තියෙනවා. නමුත් අවිද්‍යාව තියෙන නිසා නැවත භවයකට ගමන් කරනවා. ටික දුරක් හෝ ගමන් කරනවා අවිද්‍යාව නැති වෙනකම්. සකෘදාගාමී ආර්යයන්වහන්සේ තුළත් මේ අවිද්‍යාව පවතී. අනාගාමී ආර්යයන්වහන්සේ තුළත් අවිද්‍යාව පවතින හෙයින් උන්වහන්සේ මේ ජීවිතේ නිවන් නොදකින හෙයින් පංච සුද්ධාවාස වෙත ගොස් තමන්ගේ ප්‍රාර්ථනා අනුව තව තව ඉහළට ගමන් කරන්නේය. අවිද්‍යාව තියෙනතාක් කල් චතුරාර්ය සත්‍යය අංග සම්පූර්ණ වන්නේ නැහැ. අවිද්‍යාව නැතිවුන දවසට තමයි චතුරාර්ය සත්‍යය ගැන අවබෝධයක් ඇතිවන්නේ.

දුක්ඛ ආර්ය සත්‍යය අභිධර්ම නය ක්‍රමයට තෝරන ආකාරය හඳුනාගත යුතුයි. ඒ අනුව සමුදය සත්‍යය යනු ලෝභ චෛතසිකයයි. නිරෝධ සත්‍යය යනු නිර්වාණයයි. මාර්ග සත්‍යය යනු ලෝකෝත්තර මාර්ග සිත්හි සම්ප්‍රයුක්ත මාර්ගාංග 8 දෙනා පමණී. මාර්ග සත්‍යය ගන්නා විට ලෝකෝත්තර කුසල් 4 තිබේ. සෝවාන් මාර්ග, සකෘදාගාමී මාර්ග, අනාගාමී මාර්ග, අර්හත් මාර්ග මේ සමඟ උපදින මාර්ගාංග 8 ක් පවතී. සෝවාන් මාර්ග ප්‍රථම ධ්‍යානයේ දී මාර්ගාංග 8 ක් තිබේ. දුතියා ධ්‍යාන ආදී අනෙක් ධ්‍යානවල මාර්ගාංග 7 ක් පමණී. මේ මාර්ගාංගයන් තමයි මාර්ග සත්‍යය. දුක්ඛ සත්‍යය කියන විට තේරුම්ගත යුත්තේ ලෞකික ධර්ම. සිත් වශයෙන් 81 ක් ලෞකිකයි. චෛතසික 52 ම ලෞකිකයි. රූප 28 ම ලෞකිකයි. චෛතසික 52 න් ලෝභ චෛතසිකය සමුදය සත්‍යයට ගිය බැවින් මෙතැනදී චෛතසික 51 ක් පවතී. එනම් ලෞකික සිත් 81, චෛතසික 51, රූප 28 කියන මේ පරමාර්ථ ධර්ම සියල්ලක්ම දුක්ඛ සත්‍යයි.

නැවතත් දුක්ඛ සත්‍යය - ලෞකික සිත් 81, චෛතසික 51, රූප 28 යි. සමුදය සත්‍යය - ලෝභ චෛතසිකයයි. නිරෝධ සත්‍යය - නිර්වාණයයි. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය යනු ලෝකෝත්තර මාර්ග සිත්හි යෙදෙන මාර්ගාංග 8 දෙනායි.

මාර්ගාංග 8 හැර ඉතිරි ලෝකෝත්තර මාර්ග සිත් 4 යි. ඉතිරි ඵල සිත් 4 හා චෛතසික. මේ හැම දෙයක්ම සත්‍ය සංග්‍රහයෙන් විනිර්මුක්ත වේ. මේවා චතුරාර්ය සත්‍යට ඇතුළත් වන්නේ නැත. මෙය මතක තබා ගත යුතු කරුණකි.

මෙන්න මේ චතුරාර්ය සත්‍යය ගැන අවබෝධයක් නැතිකම තමයි අවිද්‍යාව ලෙස සලකන්නේ. මෙය කෙටි තේරුමකි. තවදුරටත් **අඤ්ඤාණං, අදස්සනං, අනභිසමයො, අනනුබොධො, අප්පටිවෙධො, අසංගාහණා,** ආදී මේ ආකාරයට බුදුරජාණන්වහන්සේ අවිද්‍යාව නොයෙක් අර්ථවලින් විස්තර කරනු ලබයි. **අඤ්ඤාණ, ලක්ඛණා, අවිජ්ජා, අසම්මොහන රසා** ආදි ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨාන ලෙස තෝරා ගත හැකිය. තේරුම් කරගත් තරමට පමණි මෙහි අවබෝධය ලැබෙන්නේ. මේ අනුව අවිද්‍යාව තේරුම් ගත යුතුයි.

බුදුරජාණන් වහන්සේ පැහැදිළි කරන්නේ "**තත්ථ කතමා අවිජ්ජා පච්චයා සංඛාරා?**, අවිද්‍යාව නිසා හටගන්නා සංස්කාර මොනවාද?" සංඛාර කියනවිට සංඛාර සියල්ලම 10 ක් පවතී. 10 පිළිබඳව විස්තර දක්වයි. 1. පුඤ්ඤාභි සංඛාර, 2. අපුඤ්ඤාභි සංඛාර, 3. අනෙඤ්ජාභි සංඛාර, 4. කාය සංඛාර, 5. වචී සංඛාර, 6. චිත්ත සංඛාර, (මනෝ සංඛාර), 7. සංඛත සංඛාර, 8. අභිසංඛත සංඛාර, 9. අභිසංඛරණ සංඛාර, 10. ප්‍රයෝගාභි සංඛාර.

පුඤ්ඤාභි සංඛාර යනු කාම-රූප පුණ්‍ය චේතනා. අපුඤ්ඤාභි සංඛාර යනු අකුසල චේතනා. අනෙඤ්ජාභි සංඛාර අරූප කුසල චේතනා. කාය සංඛාර යෙහි තේරුම් දෙකක් පවතී. (අ) අපේ හිතේ පහළවන කුසල් අකුසල් නිසා අපේ අතපය ක්‍රියාත්මක වෙනවා. කයෙන් නොයෙක් දේවල් කරනවා. කරන ක්‍රියාවන් කාය විඤ්ඤත්තිය නිසා නැවත කුසල් අකුසල් රැස්කරගන්නවා. එයත් කාය සංඛාරය ලෙස සැලකෙනවා. කුසල

කායික ක්‍රියා, අකුසල කායික ක්‍රියා යන කායික ක්‍රියාවන් කාය සංඛාරයි. මේවා හටගන්නේ සිතිනි. (ආ) ආනාපාන සති දේශනාවට අනුව " පසසමභයං කාය සඞඛාරං" එනම් හුස්ම රැල්ල සංසිඳවීමයි. මේ හුස්මරැල්ල සංසිඳවීම තමයි මෙහිදී කාය සංඛාරය ලෙස ගැනෙන්නේ. වචී සංඛාර අපේ හිතේ පහළවන කුසලාකුසල නිසා අපි කථා කරනවා. වචී විඤ්ඤත්තිය පහළ වෙනවා. මේ වචී විඤ්ඤත්ති පහළවීම නිසා අපි නැවත නැවත රැස්කරගන්නවා කුසල් අකුසල්. වාක් ක්‍රියා. කුසල වාක් ක්‍රියාව, අකුසල වාක් ක්‍රියාව තමයි වචී විඤ්ඤත්තිය. අනෙක් තේරුම නම් විතක්ක විචාර කියන මේ චෛතසික දෙදෙනාටත් වචී විඤ්ඤත්තිය කියනු ලබයි. චිත්ත සංඛාර (මනො සංඛාර) සමාන පද දෙකකි. චිත්ත සංඛාර යනු අපේ සිතේ පහළවන කුසල චේතනා, අකුසල චේතනා පවති. මේ කුසලාකුසල චේතනා නිසා නැවත නැවත අපි ඒවා පහළ කරගන්නවා. අපි හිතින් පහළ කරගන්නවා කුසල් අකුසල්. ඒවා තමයි චිත්ත සංඛාර. තවත් තේරුමක් පවතී. චෛතසික 52 න් විතක්ක විචාර 2 හැර ඉතිරි චෛතසික 50 චිත්ත සංඛාර ගණයට ගැනේ. කාය සංඛාර, චිත්ත සංඛාර, වචී සංඛාර තිදෙනාගේ තේරුම් ආනාපන සති දේශනාවේ චතුත්ථ ධ්‍යානය දක්වා යන විට දී කාය සංඛාර නැවතීම, වචී සංඛාර නැවතීම ආදිය එහිදී වැදගත් වේ. මේ දේශනාව ගැන චුල්ල වේදල්ල සූත්‍රයේ දී කච්චායන මහ රහතන්වහන්සේ මේ තේරුම් 3 ගැන හොඳින් පැහැදිළි කෙරෙනවා.

සංඛත සංඛාර යනු හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් හැමදෙයක්ම සංඛත සංඛාරයි. ඉර, හඳ, තාරකා, අහස, පොළොව, ගස් කොළන්, ජලය, ගෙවල් දොරවල්, ඉඩකඩම්, යානවාහන, මිනිස් ජීවිත යන හැම දෙයක්ම සංඛතයි. අසංඛත වන්නේ එනම් නිර්වාණයයි. අසංඛත තව දෙකක් පවතී. එය අප්‍රකටයි. නමුත් ඇත්තටම එහි ද තේරුමක් පවතී. නාම සම්මුතිය, බුද්ධ. මේ බුද්ධ යන්න නාම සම්මුතියක්. මේ නාම සම්මුතිය කවුරු කළත්, කොපමණ කීවත් මෙහි ගෙවීමක්, නැතිවීමක් වෙන්නේ නැහැ. විනාශවීමක් වෙන්නෙත් නැහැ. ඒ නාම සම්මුතියටත් අසංඛත යන වචනය භාවිතා කරනවා. හැබැයි අප්‍රකටයි. අනෙක අජටාකාශය, හිස් අවකාශය. හිස් කිසිවක් නැහැ, එයත් අසංඛත ධාතුවක්

ලෙස පැහැදිළි කරනවා. අසංඛත ධාතු ලෙස ගත්විට නිර්වාණයයි, නාම සම්මුතිය හෙවත් ප්‍රඥප්තිය, ආකාශයයි. නමුත් අපි මෙතැනදී පැහැදිළි කරගත යුත්තේ සංඛත කියනවිට ඉහත කරුණු 3 හැර අනෙක් සියල්ලම සංඛතයි. නොයෙක් දේවල් එකතුවෙලා හැදී තිබෙන හෙයින් සංඛත සංඛාර වේ. අභිසංඛත සංඛාර යනු අපි එකතු කරගත් මේ කර්ම නිසා ඇතිවුනු මේ භූමි, කාම ලෝක, රූප ලෝක, අරූප ලෝක, මේ හැම දෙයක්ම අභිසංඛත සංඛාරයි. අභිසංඛරණ සංඛාර යනු අපි රැස්කරන කුසලාකුසල චේතනාවයි. ප්‍රයෝගාභි සංඛාර යනු අපේ ළඟ පහළවන උත්සාහ, වීරිය, උනන්දුකමයි. මේ ආකාරයට සංඛාර වශයෙනී තේරුම් 10 ක් පවතී. දේශනාවේ බුදුරජාණන් වහන්සේ පැහැදිළි කරන්නේ, **අවිජ්ජා පච්චයා සඞ්ඛාර** කියන විට **පුඤ්ඤාභි සඞ්ඛාරො, අපුඤ්ඤාභි සඞ්ඛාරො, ආනෙඤ්ඤාභි සඞ්ඛාරො, කාය සංඛාරො, වචී සඞ්ඛාරො, චිත්ත සඞ්ඛාරො,** සංඛාර 6 ක් ගැන කථා කරයි.

පුඤ්ඤාභි සංඛාරො, පුණ්‍ය නමැති අභිසංඛාරය, පුණ්‍ය නමැති චේතනා. පුණ්‍ය යන්නෙහි තේරුම - "**හදයං පුනාතීති පුඤ්ඤං.**" හදය යනු සිතට කියන වචනයකි. සමාන වචනයකි. "**කතමං තස්මිං සමයෙ චිත්තං හොති යංතස්මිං සමයෙ චිත්තං, මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණඛන්ධො තජ්ජා මනො විඤ්ඤාණධාතු**" ආදී ක්‍රමයට අභිධර්මයේ ධම්ම සංගණී ප්‍රකරණයේ සිත පිළිබඳව බුදුරජාණන් වහන්සේ තෝරා දක්වනු ලබයි. ඒ සිත කියා තෝරන තැනදී සමාන වචන සමූහයකින් දක්වයි. "හදයං" යනු සිතට සමාන වචනයකි. නමුත් හදය කියන විට තවත් තේරුම් කිහිපයක් පවතිනවා නැතුව නොවේ. ප්‍රධාන වශයෙන් සිත උපදින්නේ හදය ඇසුරු කරගෙනයි. ඒක නිසා මෙතැන හදය යනු සිතට සමාන වචනයකි. හදය නමැති සිත "**පුනාතිති පුඤ්ඤං**" "**පු**" කියන්නේ "**පව නේ.**" "**පු**" කියන ක්‍රියා ධාතුව "**පව නේ.**" පිරිසිදු කිරීමේ අර්ථය සහිතයි. ඇතැම්විට "**පුනාති**" යන්න "**පිනවති**" අර්ථයට ගනු ලබයි. පිනවන්නේ නැත. පිනවීම ගතහොත් අකුසලේදිත් පිනවීම කළ හැකිය. අකුසලයෙනුත් අපේ සිත පිනවයි. කුසලයට වඩා අකුසලෙන් තමා

අපේ සිත පිනවන්නේ. බොහෝ දෙනා අද කාලයේ, වර්තමානයේ ලෝක දිහා බලනවිට සතුටු වන්නේ අකුසලයෙන්. රාත්‍රී සාදවලට යාම, සින්දු ඇසීම, ගැයීම, විනෝදවීම, මත්ද්‍රව්‍ය පානය කිරීම, නොයෙක් සාද පවත්වමින් ආදී හැමදෙයකින් සතුටු වන්නේ අකුසලයෙනි. අකුසලයකින් සිත සතුටුවේ නම්, එය පිනක් කියනවා නම් වැරදි වේ. එනම්, හදවත, අපේ සිත පිරිසිදු වන්නේ නැහැ අකුසලයකින්. සිත පිරිසිදු වන්නේ කුසලයෙනි. එනම් "පු" කියන්නේ පව නේ. පිරිසිදු අර්ථයි. එනම් සිත පිරිසිදු කරන බැවින් පින. එනම් සිතක් පිරිසිදු වන්නේ කුසල චේතනාවෙනි. පින යනු සිත පිරිසිදු කරන දේවල්ය. පුඤ්ඤාභි සංඛාර වේ.

අපුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤ යනු "න පුඤ්ඤ - අපුඤ්ඤ" 'න' කාරය 'අ' බවට පත්වෙනවා පාලි ව්‍යාකරණයට අනුව.

ඒ ව්‍යාකරණ සූත්‍රයට අනුව "න පුඤ්ඤ", 'න' කාරය 'අ' බවට පත්වේ. න කුසල අකුසල හා සමාන වේ. අපුඤ්ඤ යනු සිත අපිරිසිදු කරන දේවල්ය. එනම් අකුසලයි.

ආනෙඤ්ජාභි සංඛාර යනු **"සො සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ, අනංගනෙ, විගතූපක්කිලෙසෙ, මුදුභූතෙ කම්මනියෙ, ඨිතෙ, ආනෙඤ්ජප්පත්තෙ,"** කෙනෙකුගේ සිත අභිඤ්ඤාවට, අභිඤ්ඤා බලය පිහිටුවා ගන්න යනවා නම්, අභිඤ්ඤා පාදක සිතේ පවතින ස්වභාවයයි මෙයින් කියවෙන්නේ. ඒ පින සමාහිත සිතක් විය යුතුය. කර්මණ්‍ය වූ සිතක් විය යුතුය. ආනෙඤ්ජපත්තෙ යනු නොසැලෙන සිතක් විය යුතුය. එනම්, නොසැලෙන සිත් මොනවාද? චතුත්ථ ධ්‍යාන සිත්ය. චතුත්ථ ධ්‍යාන සිත් කියූ විට කොටස් 2 කට බෙදා දැක්විය හැක. රූපාවචර චතුත්ථ ධ්‍යාන, අරූපාවචර චතුත්ථ ධ්‍යානය. නමුත් ආනෙඤ්ජපත්ත කියන විට මෙතැනදී නොසැලෙන කියන එකට රූපාවචර චතුත්ථ ධ්‍යාන අත්හරිනවා. එය පුඤ්ඤාභි සංඛාරවලට. විශේෂයෙන්ම අරූපාවචර චේතනා තමයි ආනෙඤ්ජාභි සංඛාර කියනුයේ. නැවතත් බුදුරජාණන් වහන්සේ මේවා එකින් එකට පැහැදිලි කරනවා. ඒ අනුව කාය සංඛාර - කායික ක්‍රියා, වචී සංඛාර - වාක් ක්‍රියා, මනෝමය ක්‍රියා - චිත්ත සංඛාර වේ.

"තත්ථ කතමෙ පුඤ්ඤාභි සඞ්ඛාරො?" පුඤ්ඤාභි සංඛාර කියන්නේ මොනවාද? කුසල චේතනා, කාමාවචර, රූපාවචර, දානමය, සීලමය, භාවනාමය. එනම් දානය නිසා කාමාවචර වශයෙන් යම්තාක් අපේ සිත්වල ඇතිවන කුසල චේතනා තියෙනවාද, ඒවා පුඤ්ඤාභි සංඛාර වේ. සීලය නිසා අපේ සිතේ ඇතිවන යම්තාක් කාමාවචර කුසල චේතනා තියෙනවාද, ඒ හැම දෙයක්ම පුඤ්ඤාභි සංඛාර වේ. භාවනාව නිසා අපේ සිතේ ඇතිවන යම්තාක් කාමාවචර කුසල චේතනා තියේද, රූපාවචර කුසල චේතනා තියෙනවාද, ඒ හැම දෙයක්ම පුඤ්ඤාභි සංඛාරයි. මෙය භාවනාවේදී අපට ලැබෙන ක්‍රමයකි. දානයක් දෙන අවස්ථාවේදී අපේ සිතේ ඇතිවන්න පුළුවන් කුසල චේතනා කීයක් පහළවේද? 8 කි. සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල චේතනා, සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික කුසල චේතනා, සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික / සසංඛාරික කුසල චේතනා, උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික / සසංඛාරික කුසල චේතනා, උපෙක්ඛා සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික / සසංඛාරික කුසල චේතනා.

මේ ආකාරයට මහා කුසල් සිත් 8 අනුව තමයි දන්දීමේ කුසල චේතනාව, සීලය නිසා සිල්සමාදන්වන විට, සීලය ආවර්ජනා කරන විට, අපේ සිතේ ඇතිවෙනවා කුසල චේතනා. මේ කියන කුසල් සිත් අටෙන් එක එක පහළවන්න පුළුවන්. පහළවන කුසල චේතනා තමයි පුඤ්ඤාභී සංඛාර. භාවනාමය කියාගන්නා විටදී, භාවනාවේදී කාමාවචර කුසල චේතනාද රූපාවචර කුසල චේතනාද පහළවන්නට පුළුවන්. භාවනා යයි ගැනීමේදී සමථ කර්මස්ථානවලින් සමථ වශයෙන් සිත දියුණු කරනවා. සමථ වශයෙන් අපි වඩන විට පරිකර්ම සමාධි, උපචාර සමාධි, අනුලෝම සමාධි, ගොත්‍රභූ සමාධිය දක්වාම අපේ සිත වැඩකරනවා. ධ්‍යානයට කලින් පහළවන චිත්තක්ෂණ, ඒවා සමාධි. ඒ පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ කියන මේ චිත්තක්ෂණ අපට මේ දානයකින්, සීලයකින් උපදවාගන්නට අමාරුයි. එනම් එය ධ්‍යාන චිත්ත වීථියත් සමඟ යන දෙයකි. නමුත් පරිකර්ම සමාධිය උපචාර සමාධිය

දක්වා සමහරක්විට වැඩකරන්න පුළුවන්. බලසම්පන්න කුසලය තමා එය. සාමාන්‍යයෙන් අපි දුන්න දානය මෙනෙහි කරලා සිත සමාධිකරගන්න පුළුවන්. ඒ වේලාවේදී ධ්‍යාන බවට පත්වන්නේ නැහැ. නමුත් පරිකර්ම සමාධියේ, උපචාර සමාධියේ සිත පවත්වන්න පුළුවන්. ඒ ධ්‍යාන කුසල් පහළවෙන්න උපකාරවෙන්න පුළුවන්. ඊළඟට තමන් සමාදන් වූ සීලය නැවත ආවර්ජනා කිරීමේදී, සීලානුස්සතිය වඩන විටදී, අපට පරිකර්ම සමාධිය උපචාර සමාධිය දක්වා සිත දියුණු කරගන්න පුළුවන්. නමුත් අනුලෝම ගෝත්‍රභූ කියන චිත්තක්ෂණ පහළවන්නේ ඒ ධ්‍යාන චිත්ත වීථියක පමණයි. පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ කියන මේ චිත්තක්ෂණ, එවන් චිත්තක්ෂණ මහා බලසම්පන්න කාමාවචර කුසල්ය. කෙනෙකුකට පුළුවන් නම් පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ කියන කාමාවචර කුසල් පහළ කරගන්න, එය බොහෝම වටිනවා. ඒවා තමයි කාමාවචර කුසල් අතුරෙන් මහා බලසම්පන්න කුසල්. ඒ නිසා කියන්නේ භාවනාවේදීත් කාමාවචර කුසල් පහළ වෙනවා. ධ්‍යාන අවස්ථාවේදී ප්‍රථමා, දුතිය, තතිය, චතුත්ථ ධ්‍යාන සිත්වලට කියන්නේ රූපාවචර කුසල චේතනාව. සමථ කර්මස්ථාන 40 ක් තියෙනවා. මේවා 40 ට බෙද බෙදා දකින්න ඕනේ. මොන කර්මස්ථානයේදී ද ධ්‍යාන උපදින්නේ, කුමන කර්මස්ථානවලද පරිකර්ම සමාධි, මොන අවස්ථාවේදී ද උපචාර සමාධිය ඇතිවෙන්නේ. අවස්ථා හඳුනගෙන අපට පුළුවන් තේරුම්ගන්න. අපි කෙසේද මේ සංස්කාර එකතු කරගන්නේ යන්න වටහා ගත හැක.

අපුඤ්ඤාභි සංඛාර යනුවෙන් පැහැදිලි කරන්නේ අකුසල චේතනායි. අකුසල චේතනා 12 ක් පවතී. ලෝභය මුල්කරගත් අකුසල චේතනා 8 යි, ද්වේශය මුල්කරගත් අකුසල චේතනා 2 යි, මෝහය මුල්කරගත් අකුසල චේතනා 2 යි. ලෝභය මුල්වෙලා හටගන්නා අකුසල චේතනා; සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික / සසංඛාරික, මෙලෙසම දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික / සසංඛාරික, අකුසල චේතනා. උපේක්ඛා සහගත වශයෙන් 4 යි. මෙලෙස ලෝභ මූල අකුසල චේතනාවක් පවතී. ද්වේශය යනු අපේ සිතේ ඇතිවන

ශෝකය, මානසික වේදනාව, දෝමනස්සය, උපායාසය, පරිදේවය, ද්වේශයකි. මේ හැම දෙයක්ම හටගන්නේ අරමුණත් සමග තිබෙන ගැටීම නිසා. යම්කිසි අරමුණක් අපට ආවා. ඒ අරමුණ සමග ගැටුණු නිසා තමයි, අපේ හිත හැප්පුණු නිසා තමයි ද්වේශය මතුවෙන්නේ. මෙය අකුසල චේතනාවක් බව පැහැදිලි කරගත යුතුයි. මෝහය, විචිකිච්ඡාව නිසා, උද්ධච්චය නිසා ඇතිවන මෝහ මුල්කරගත් අකුසල චේතනා සියලුම අකුසල චේතනා 12 ක් පවතී. ඒ අකුසල චේතනාවලට කියන්නේ අපුඤ්ඤාභි සංඛාරයි.

**"තත්ථ කතමො අනෙඤ්ජාභි සඞ්ඛාරො?"** අනෙඤ්ජාභි සංඛාර යනු මොනවාද? නොසැලෙන චේතනා, අරූපාවචර කුසල චේතනා. අරූපාවචර කුසල චේතනා 4 ක් පවතී. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤා-නාසඤ්ඤායතනය. මේ ආකාරයට 4 ක් පවතී. මේවා අරූපාවචර කුසල චේතනා වේ.

**"තත්ථ කතමො කාය සඞ්ඛාරො? කාය සඤ්චෙතනා, කාය සඞ්ඛාරො, වචී සඤ්චෙතනා, වචී සඞ්ඛාරො, මනො සඤ්චෙතනා, චිත්ත සඞ්ඛාරො."** කායික චේතනා කාය සංචේතනාව කාය සංඛාරයි. කාය සංචේතනාව යනු විතක්ක, විචාර, චෛතසික සම්ප්‍රයුක්තවීම නිසා අපේ සිතේ ඇතිවෙනවා කුසල චේතනා, අකුසල චේතනා. ඒ වගේම ප්‍රථම ධ්‍යාන කුසල් චේතනා පූර්ව සිත් ද පහළවෙනවා. පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ කියන චිත්තක්ෂණ පහළවෙනවා. විතක්ක, විචාර චෛතසික නිසා. ඒ එක පැත්තකින්. එහෙමත් නැත්නම් කායික ක්‍රියාව කාය විඤ්ඤත්තිය සිතේ පහළවන විට සිතට අනුව ඉපදුන චිත්ත කිරිය වායෝ ධාතුව නිසා අපේ අත පය එහෙට මෙහෙට ක්‍රියා කරමින් නොයෙක් ක්‍රියා කරනවා. මේ කියන කාය විඤ්ඤත්තිය නිසා යම්තාක් අපි කායික ක්‍රියා කරනවානම් කුසල් වශයෙන් අකුසල් වශයෙන් ඒ හැම දෙයක්ම කාය සංඛාරයි. අපි කරන හැම දෙයක් තුළම කුසල් හෝ අකුසල් තියෙනවා. කෙනෙකුට සිතන්න පුළුවන්, මම ඇවිද්දා, මම දන්නේ නැහැ නොදන්නාකමින් යම්කිසි ක්‍රියාවක් සිදුවුනා කියා.

කුසලයක් අකුසලයක් නොවුනට ක්‍රියාව සිදුවෙලා කර්මයක් සිදුවෙන්නේ නැහැ චේතනාව සම්ප්‍රයුක්ත වන්නේ නැති නිසා. චේතනාවයි බලවත් වන්නේ. වචී සංචේතනා, වචී සංඛාර. එනම් වාචික ක්‍රියා තමයි වචී සංඛාර. මනෝ සංචේතනා චිත්ත සංඛාර. මනෝ සංචේතනා යනු සිතෙන්ම සිතනවා. අතීතයේ කළ කුසල් සිහිපත් කරනවා. අතීතයේ කළ අකුසල් සිහිකරනවා. අනාගත වශයෙන් අපි සිතනවා. වර්තමාන වශයෙන් භාවනා කර කර අරමුණු කරනවා. මේ කියන විදියට මනෝ සංචේතනාව මගින් හැම දෙයක්ම පහළ වෙන්න පුළුවනි. ධ්‍යාන කුසල් පවා මනෝ සංචේතනා. කාමාවචර කුසල්, රූපාවචර කුසල්, අරූපාවචර කුසල් මේ හැම දෙයක්ම මනෝ සංචේතනාවයි. සංඛාර යනු චේතනාවයි. එනම් කුසලාකුසල කිරීම. චේතනා තමයි සංඛාර කියනුයේ. කුසලාකුසල කර්ම ශක්තිය තමයි සංඛාර කියන්නේ. අපේ ළඟ අවිද්‍යාව තිබුණු තරම, අවිද්‍යාව තියෙන තාක් කල් අපි මේවා එකතු කරනවා. අපේ ළඟ අවිද්‍යාව තියෙන තාක් කල් අපි භයයි සසරට. ඊළඟ ජීවිතයේදී සතර අපායට ගියහොත්, දුප්පත් උනොත්, ඒ නිසා මේ ජීවිතයේ හොඳට දන් දෙන්න ඕනේ. සිල් රකින්න ඕනේ. අපි භයයි. භය නිසා මීට වඩා හොඳ ජීවිතයක් බලාපොරොත්තුවෙන් තමා හැම දෙයක්ම කරන්නේ. ඒක තමයි අවිද්‍යාව. අවිද්‍යාවෙන් තොරව අපිට කිසිම දෙයක් කරන්න බැහැ. නමුත් අවිද්‍යාව අපේ කුසල් සිතේ නැහැ. අවිද්‍යාව උපස්ථම්භක වුණා. උපකාරයි. ඒකයි අපි තේරුම් ගන්නට ඕනේ. මේ අවිද්‍යාව නිසා තමයි අපි හැම දෙයක්ම එකතු කරන්නේ, රැස්කරන්නේ.

## ii සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං

අවිද්‍යාව නිසා රැස්කරගත් කුසලාකුසල චේතනාව තියෙනවා. මේ කුසලාකුසල චේතනාව නිසා අපට හටගන්නවා විඤ්ඤාණය. මේ කියන්නේ අතීත භවයේ අවිද්‍යාව හා සංඛාර. මේ භවයේ විඤ්ඤාණය විපාක ගැනයි කියන්නේ. යම්කිසි කුසල් අකුසල් අපි රැස්කරගත්තා. ඒකේ විපාක ගැන තමයි කථා කරන්නේ. විඤ්ඤාණ කියන කොට, එහෙනම් විපාක විඤ්ඤාණ කියනකොට අපි මෙතැනදි තේරුම් ගන්න

ඕනේ විඤ්ඤාණ බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරන්නේ "**තත්ථ කතමං සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං?**" සංඛාර ප්‍රත්‍ය නිසා හටගන්නා විඤ්ඤාණ මොනවාද? "**චක්ඛු විඤ්ඤාණං, සොත විඤ්ඤාණං, ඝාන විඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, කාය විඤ්ඤාණං, මනො විඤ්ඤාණං ඉදං වුච්චති සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**" චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය සහ මනෝ විඤ්ඤාණ මේ විපාක විඤ්ඤාණයන් තමයි විපාක විඤ්ඤාණයන් කියලා කියන්නේ. මෙතැනදී විපාක කියන විටදී ප්‍රතිසන්ධි විපාක ප්‍රවෘත්ති විපාක ලෙස කොටස් 2 කට බෙදා අර්ථ විග්‍රහ කළ යුතුය. ප්‍රතිසන්ධි විපාක ගෙන දෙන සිත් කීයක් පවතිනවාද? එබඳු විඤ්ඤාණ 19 ක් පවතිනවා. කාමාවචර වශයෙන් ප්‍රතිසන්ධි කෘත්‍යය ගෙන දෙන සිත් 10, රූපාවචර 5, අරූපාවචර වශයෙන් 4. මේ 19 අපි කියන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණ, ප්‍රතිසන්ධි කෘත්‍යය නැතිනම් ප්‍රතිසන්ධි ගෙන දෙන සිත්. මේක තමයි බොහොම වැදගත්. පටිච්ච සමුප්පාදයේ ප්‍රතිසන්ධි විපාකය තමා බොහොම වැදගත්. උදාඃ- කෙනෙක් මරණයට පත්වෙන විට මරණාසන්න ජවන වීථියක් පහළ වෙනවා. ඒ මරණාසන්න ජවන චිත්ත වීථියට අනුව තමයි ඒ පුද්ගලයාගේ ඊළඟ ජීවිතයේ ප්‍රතිසන්ධිය ලබන්නේ. මේ මරණාසන්න ජවන චිත්ත වීථිය පහළ වෙන්නේ ජවන් චිත්තක්‍ෂණ. ජවන් යනු කුසල චේතනා හෝ අකුසල චේතනා. ඒ කියන්නේ සංඛාර පහළ වෙන්නේ. මේ පහලවෙන කුසල චේතනා, අකුසල චේතනා සංඛාර නිසා පුද්ගලයින්ගේ ඊළඟ ජීවිතයේ ප්‍රතිසන්ධිය සිද්ධ වෙනවා. දැන් අකුසල් වශයෙන් ගතහොත්, අකුසල චේතනා 12 යි. මේ අකුසල චේතනා 12 න් 12 ටම පුළුවන්කමක් නැහැ මරණාසන්න ජවනයට එන්න උද්ධච්චය හැර. උද්ධච්චය කියන අකුසල චේතනාවට ප්‍රතිසන්ධිය ගෙනදීමට හැකියාවක් නැහැ. එයට බලයක් නැත. නමුත් අනෙක් ඒවාට උපකාර කරනවා. උද්ධච්චය යනු හැම සිතකටම උපකාරයි. නමුත් තනිවම බලයක් ගැනීමට නොහැක. මේ උද්ධච්චය අකුසල චේතනාව හැර ඉතිරි අකුසල චේතනා 11 ම මරණාසන්න ජවනයට පහළ වෙනවා. මරණාසන්න ජවනට අකුසල චේතනාවක් පහළ වුනොත් අපේ ප්‍රතිසන්ධි ගෙන දෙන්නේ අකුසල විපාක උපේක්ඛා සහගත

සන්තීරණ සිතිනි. මතක තබාගත යුතු කරුණකි. එනම් ප්‍රතිසන්ධි විපාකය අකුසල විපාක උපේක්ඛා සහගත සන්තීරණ සිත. එනම්, අකුසල චේතනා 11 ජවන් වශයෙන්, සංඛාර වශයෙන් පහළ වුනා නම්, සංඛාර පච්චයා විඤ්ඤාණං කියලා කියන්නේ. එතැනදි අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ විපාක සිත.

ඉන්පසු පහළ වෙනවා සංඛාර වශයෙන් කුසල්. අපට කොටස් 2 කට බෙදිය හැක. ඤාණ සම්ප්‍රයුක්ත කුසල් හා ඤාණ විප්‍රයුක්ත කුසල්. මේ ඤාණ විප්‍රයුක්ත කුසල් නැවත කොටස්වලට බෙදේ. ප්‍රබල, ප්‍රණීත, මහේශාක්‍යය. ද්විහේතුක කුසල් පහළ වෙනවා. දුබල සසහගතව දුබල ද්විහේතුක කුසලයක්. ඤාණ විප්‍රයුක්තයි. මුල, මැද, අග ඤාණ විප්‍රයුක්තයි. දුබල කුසලයකි. මේ දුබල කුසලයක් පහළ වුවහොත්, මරණාසන්න අවස්ථාවේදී දුබල කුසල චේතනා පහළ වුනොත්, නාම ධර්ම වශයෙන් ඤාණ විප්‍රයුක්ත සිත පහළ වෙන්නේ නමුත් මෙහි තිබෙන බලය දුබලයි. ප්‍රතිසන්ධි ගෙන දෙන්නේ සුගතියක. සුගතියකට ගෙනදුන් මුත් අංග විකල, මන්ද බුද්ධික, අඳ, ගොළු, බිහිරි බවින් යුක්තවෙලා උපදින්නේ කුසල විපාක උපේක්ඛා සහගත සන්තීරණ සිතිනි. මතක තබාගත යුතු කරුණකි. ද්විහේතුක දුබල කුසලයක් පහළ වුනොත් සිදුවනුයේ මේ ආකාරයටයි.

මරණාසන්න ජවනය පහළ වෙනවා ද්විහේතුක උත්කෘෂ්ඨ කුසලයක් හෝ ත්‍රිහේතුක ඕමක කුසලයක්. ත්‍රිහේතුක ඕමක යනු නාම ධර්ම සමානයි. නමුත් බලය දුබලයි. මරණාසන්න ජවනයට අනුව ද්විහේතුක උත්කෘෂ්ඨ, ත්‍රිහේතුක ඕමක ප්‍රතිසන්ධිය ලබන්නේ කාමාවචර මහා විපාක ඤාණ විප්‍රයුක්ත සිත් 4 ට අනුරූපව. මේ අය ද්විහෙතුක ප්‍රතිසන්ධියි. ඒ අයට භාවනා කර ධ්‍යාන ලබන්න බැහැ. ගමන බොහොම දුර්වලයි. ධර්මයක් අවබෝධ කරගන්න බැහැ. හරියට රැකිරක්ෂා කර මුදලක් සොයාගන්න බැහැ. බොහොම දුගී දුප්පත් වෙලා බොහොම දුකසේ තමයි මේ හැම දෙයක්ම ලැබෙන්නේ, කරන්නේ. නමුත් ඒ ඇත්තන්ට කුසල් කරන්න පුළුවන්. සාමාන්‍ය කුසල් කරගන්න පුළුවන්. ප්‍රතිසන්ධිය දුබලයි. මෙය ද්විහේතුක ප්‍රතිසන්ධියකි.

කාමාවචර මහා කුසල්, කුසල චේතනා පහළවෙනවා ජවන් වශයෙන්. උත්කෘෂ්ඨව පහළවෙනවා. ඒ ඇත්තන්ගේ ප්‍රතිසන්ධිය ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක්. එනම් කාමාවචර ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලබන්නේ. ඒ වෙලාවේ සහේතුක මහා විපාක ඤාණ සම්ප්‍රයුක්ත විපාක 4 තමා පහළවෙන්නේ. ඒ අනුව අසංඛාරික සසංඛාරික භේදය, සෝමනස්ස උපෙක්ඛා භේදය අපි තේරුම් ගන්නට ඕනේ.

මේ අනුව මතක තබාගත යුතුයි පුඤ්ඤාභි සංඛාර කියනවිට කුසල චේතනා 8 නිසා අපට ලැබෙන ප්‍රතිසන්ධි විපාක. අපුඤ්ඤාභි සංඛාර කියනවිට අකුසල චේතනා නිසා අපට ඇතිවන ප්‍රතිසන්ධි විපාක.

රූපාවචර කුසලයක් මරණාසන්න ජවනයට පහළ වෙනවා. එනම් රූපාවචර කුසල ප්‍රථම ධ්‍යානය. මේ ප්‍රථම ධ්‍යාන කුසල චේතනාවේ නාම ධර්ම සමානයි. නමුත් මෙහි තිබෙන බලය; හීන බලය, මධ්‍යම බලය, ප්‍රණීත බලය ලෙස කොටස් 3 කට බෙදිය හැක. මරණාසන්න ජවනය ලෙස පහළ වුනොත් ප්‍රථම ධ්‍යානය හීන වශයෙන් ඒ තැනැත්තාගේ ප්‍රතිසන්ධිය සිදුවන්නේ ප්‍රථම ධ්‍යාන බඹතලයේ. පළමු බඹතලයේ බ්‍රහ්මපාරිසජ්ජාවේ උපදින්නේ. විපාක සිත එතැනයි පහළ වනුයේ. ඊළඟට ප්‍රථම ධ්‍යානය මධ්‍යම වශයෙන් වැඩිවුවහොත් ප්‍රථම ධ්‍යාන බඹතලයේ දෙවැනි බඹතලයේ තමයි උපදින්නේ. ප්‍රථම ධ්‍යානය ප්‍රණීත වශයෙන් වැඩුවහොත් තුන්වෙනි බඹතලයේ උපදින්නේ. බ්‍රහ්මපාරිසජ්ජා, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්ම මේ තුන්දෙනා ප්‍රථම ධ්‍යාන බඹතලයි. පරිත්තාභ, අප්පමාණාභ ආභස්සර ද්‍විතිය ධ්‍යාන බඹතලයි. පරිත්තාභසුභ, අප්පමාණසුභ, සුභකිණ්ණක තතිය ධ්‍යාන බඹතලයි. වේහප්පල, අසඤ්ඤතල සහ පඤ්චසුද්ධාවාස සියල්ල චතුත්ථ ධ්‍යාන බඹතලයි. අභිධර්ම නය ක්‍රමයේදී ද්‍විතිය ධ්‍යාන තතිය ධ්‍යාන 2 ම එකම බඹතලයේ විපාකයි. ප්‍රථම ධ්‍යානයේ විතක්ක, විචාර. ද්‍විතිය ධ්‍යානයේ විචාර, ප්‍රීති, සුඛ. පඤ්චම නය ක්‍රමයෙන් ගත්විට ඒ විදිහටය. මේ අනුව රූපාවචර ධ්‍යාන කුසලයක් මරණාසන්න ජවනයට ආ විට ඒ ධ්‍යාන කුසලයට අනුරූපව විපාකය ප්‍රතිසන්ධිය ලැබෙනවා. ඒ අනුව පුඤ්ඤාභි සංඛාර යන රූපාවචර කුසල චේතනා 05 නිසා වන ප්‍රතිසන්ධි විපාකයි.

අරූපාවචර, මරණාසන්න මොහොතේ අරූපාවචර ධ්‍යාන කුසලයක් ආකාසානඤ්චායතන ධ්‍යාන කුසලයක් පැමිණියොත් ප්‍රතිසන්ධිය ආකාසානඤ්චායතන බඹතලයේ ආකාසනඤ්චායතන විපාක සිතින් උත්පත්තිය ලබනවා. ඔය ආකාරයට ඉතිරි අරූපාවචර කුසල් සිත් 3 ත් ධ්‍යාන කුසල විපාක වශයෙන් තේරුම් ගත යුතුය.

**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන විටදී ප්‍රතිසන්ධි විඤ්ඤාණය තමා බොහොම බලවත්. ප්‍රධාන වශයෙන් සිදුවනුයේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. නමුත් දේශනාවේ තියෙන්නේ චක්ඛු විඤ්ඤාණය කියන විට චක්ඛු විඤ්ඤාණ සිත් 2 යි, සෝත විඤ්ඤාණ සිත් 2 යි, ඝාන විඤ්ඤාණ සිත් 2 යි, ජිව්හා විඤ්ඤාණ සිත් 2 යි, කාය විඤ්ඤාණ කියන විට සිත් 2 යි, මනෝ විඤ්ඤාණ කියන විට; ඔක්කොම විපාක සිත් 36 යි. ලෝකෝත්තර විපාක අත්හැරිය විට 32 යි. 32 න් දෙපස් විඤ්ඤාණ ඉවත් වූ විට ඉතිරි සිත් 22 ටම කියනුයේ මනෝ විඤ්ඤාණයයි.

ප්‍රවෘත්ති විපාක වශයෙන් ඉපදුන නිසා චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ කියන මේ සිත් පහළ වෙනවා.ඊට අමතරව අර මනෝ විඤ්ඤාණ 22 ක් තිබේ. එම සිත් 22 න් අපට පහළවනවා කාමවචර භූමියේ නම් ප්‍රතිසන්ධිගත් සිතින්ම භවාංග සිතත් අපේ මේ ජීවිතය පුරාවටම පහළ වෙනවා. ඊළඟට සම්පටිච්ඡන සිත් 2 ක් පහළ වෙනවා. කාමාවචර භූමියේදී සන්තීරණ සිත් 3 ක් පහළ වේ. මහා විපාක සිත් 8 ක් පහළ වේ. තදාරම්මණ 2 ක් වශයෙනි. මේ සියල්ල 13 සහ දෙපස් විඤ්ඤාණ 10 සමඟ 23 යි. එනම් කාමාවචර භූමියේ අපට ප්‍රවෘත්ති විපාක වශයෙන් සිත් 23 ක් පහළවේ.

රූපාවචර භූමියේදී සිත් විපාක වශයෙන් රූපාවචර භූමියේ සිටින බ්‍රහ්මයන්ට අනිවාර්යයෙන්ම චක්ඛු විඤ්ඤාණ සිත් 2, සෝත විඤ්ඤාණ සිත් 2 පහළ වේ. ඒ අයටත් අකුසල විපාක සිත් පහළ වෙන්නට පුළුවන. සම්පටිච්ඡන, සන්තීරණ පහළ වේ. කාමාවචර ජවන් ඇතිවුවහොත් තදාරම්මණ පහළ වේ. තදාරම්මණ හැමවෙලේම පහළ වන්නේ නැහැ. කෙනෙක් විපස්සනා භාවනාව වඩනවා විපස්සනාවෙන් පසුව

තදාරම්මණ පහළ නොවේ. භවංගය බවට පත්වේ. ඊළඟට ධ්‍යාන කුසල් වඩාගෙන යනවා. ඉන්පසුවද තදාරම්මණ පහළ නොවේ. සමහරක් කුසල් කරනවිට ජවනයෙන් අවසානවන කුසල් පවතී. ඒ ඒ අවස්ථානුකූලව තදාරම්මණ හැමවෙලේම පහළ වන්නේ නැත. එය තේරුම් ගත යුතුය. ප්‍රවෘත්ති විපාක යනු මේ අපි ගන්නා වූ අරමුණු නිසා පහළවන, චිත්ත වීථි පුරාවට පහළවන යම්තාක් විපාක සිත් තියෙනවා නම්, ඒ විපාක සිත්වලට කියන්නේ ප්‍රවෘත්ති විපාක යනුවෙනි. ප්‍රවෘත්ති විපාක යනු ඒ ඒ මොහොතේ එදිනෙදා ලැබෙන විපාකයි. ප්‍රවෘත්ති යනු එදිනෙදා සිදුවන දේවල් අපිට දැනගන්න ලැබීමයි. ඒ වාගේම අපි කරන දේ අනුව අපට පහළවන සිත් ප්‍රවෘත්ති විපාක වේ. මෙය තමයි සංඛාර පච්චයා විඤ්ඤාණං.

## iii විඤ්ඤාණ පච්චයා නාම රූපං

නාම රූප කියනවිට **අත්‍ථි නාමං, අත්‍ථි රූපං** ලෙස කොටස් 2 කට බෙදෙයි. නාම වෙනම, රූප වෙනම. නාම කියනවිට වේදනා ස්කන්ධය, සංඥා ස්කන්ධය, සංඛාර ස්කන්ධය. නාම කියනවිටදී මෙතැනදී විඤ්ඤාණය නිසයි නාම රූප හටගන්නේ. විඤ්ඤාණය තමයි ප්‍රධානියා. ඒ යටතේ තමයි අනික් අය සිටින්නේ. විඤ්ඤාණ ස්කන්ධය හැර නාම ස්කන්ධ 3 යි. ඊළඟට රූප ස්කන්ධය පහළවෙනවා. මේ රූප ස්කන්ධ කියනවිට, "**චත්තාරො මහාභූතා, චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං**" සතර මහාභූතත්, සතර මහාභූත නිසා හටගත් උපාදාය රූප තියෙනවානම් ඒ උපාදාය රූපයන්ටත් රූප කියනු ලැබේ. මෙයයි රූප ස්කන්ධය. "**ඉති ඉදඤ්ච නාමං, ඉදඤ්ච රූපං**" මෙය තමයි නාම - රූප ලෙස හඳුන්වන්නේ. නාම - රූප යනු රූප, වේදනා, සංඥා, සංඛාර කියන නාම ස්කන්ධ 3 ටයි, රූප ස්කන්ධයටයි. පටිච්ච සමුප්පාද නය ක්‍රමයේදී නාම - රූප ලෙස ගනු ලැබේ. අනෙක් අවස්ථාවල නාම - රූප ලෙස ගනු ලබන්නේ විඤ්ඤාණ ස්කන්ධය නාම ගොඩට ඇතුළත් වේ. මෙයද ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති වශයෙන් හඳුනාගත යුතුවේ. කෙනෙක් උත්පත්ති ලබනවිට කොහොමද නාම - රූප පහළ වන්නේ. ගබ්භසෙය්‍යක සත්ත්වයෝ, එනම් මවු කුසක් ඇසුරු කරගෙන උපදින

සත්ත්වයෝ. මේ ගබ්භසෙය්‍යක සත්ත්වයෝ මවු කුසක පිළිසිඳගන්නා අවස්ථාවේදී ඇතැම්විට රූප 20 ක් පහළවේ. ඇතැම්විට රූප 30 ක් පහළවේ. 20 ක් පහළ වනුයේ නපුංසකයින්ටය. භාව රූපයක් නොමැති හෙයිනි. භාව රූපයක් සහිත 30 ක් වේ. එනම් භාව දසක, කාය දසක, වස්තු දසක රූප 30 සහ වේදනා ස්කන්ධය,, සංඥා ස්කන්ධය සහ සංඛාර ස්කන්ධ සහිතව. එනම් නාම ධර්ම 33 ක් පහළ වේ. ඕපපාතික වශයෙන් පහළවන සත්ත්වයෝ සිටියි. දිව්‍යලෝකයේ ඕපපාතිකව පහළ වේ. මනුෂ්‍ය ලෝකයෙත් පහළ වේ. දිව්‍ය ලෝකයේ පහළවන විට එක පාරටම පහළවන්නේ භාව දසකයි, කාය දසකයි, වස්තු දසකයි, ජීවිත නවක කලාපයි, වේදනා, සංඥා, සංඛාර කියන මේ ධර්ම ටිකයි. මෙය පළමු චිත්තක්ෂණයයි. ඉන්පසු අනෙක් ඒවා විවෘත වේ. මනුෂ්‍ය ලෝකයේදීත් එසේම වේ. මනුෂ්‍ය ලෝකයේදී අංග සම්පූර්ණව පහළවන විට චක්ඛු, සෝත, ඝාන ආදී ඒ ආයතනත් සමඟ පහළවේ. අපායේ උපදින සත්ත්වයින්ටත් මේ ආකාරයට රූප කලාප පඤ්ච ස්කන්ධය පහළ වේ. හැබැයි අරූපී තලයට පහළ වන්නේ නාම විතරයි. මේ සම්බන්ධව පටිච්ච සමුප්පාද විභංගයේම අභිධර්ම භාජනයේදී වෙන වෙනම පැහැදිළි කෙරේ. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමං**, එනම් අරූප තලයයි. රූප නැත. කෙළින්ම, අරූපී තල ගැනයි කථාකරන්නේ. **නාම පච්චයා ඡට්ඨායතනං** ආදී නොයෙක් ආකාරයට පැහැදිළි කරනවා. අපට ඒ ඒ තැන්වලදී භව අනුව විස්තර පසුව පැහැදිළි කර ගත හැකිය.

## iv නාම රූප පච්චයා සළායතනං

සළායතන යනු ආයතන 6 කි. ආයතන 6 නම්; "**චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං, ජිව්හායතනං, කායායතනං, මනායතනං**" චක්ඛායතනය යනු චක්ඛු ප්‍රසාදයයි. ඒ සමඟ තව රූප 62 ක් උපකාරීවේ. ඒ රූප 62 නම්; කාය දසක, භාව දසක, චක්ඛු දසක කලාපයේ චක්ඛු ප්‍රසාදය හැර 9 යි. ජීවිත නවක, චිත්තජ අට්ඨමක, ආහාරජ අට්ඨමක, උතුජ අට්ඨමකයි. මේ ආකාරයෙන් රූප 62 ක් චක්ඛායතනයට උපකාරවේ. යම්කිසි දෙයක් නිෂ්පාදනය කරන තැනට අපි ආයතනයක් කියනවා.

අරමුණු නිසා චිත්ත පරම්පරාව උපද්දවන්නේ මේ චක්ඛායතනයයි. මේ චක්ඛායතනය නැතිනම් චක්ඛු ප්‍රසාදය නැතිනම් රූපාරම්මණය ගැනීමේ හැකියාවක් අපට නැත. රූපාරම්මණය ගන්න බැහැ යනු චක්ඛු ද්වාරික චිත්ත වීථි නැහැ. අරමුණු පහළ වන්නේ නැහැ. මේ හැම දෙයක්ම අරමුණු පහළ කරගන්නට චක්ඛායතනය වැදගත්ය. චක්ඛායතනය නිසා තමයි චක්ඛුද්වාරික නාම ධර්මයන් පහළ වනුයේ. ඒක තමයි හේතුව චක්ඛායතනය. **"චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"** එනම් චක්ඛු ප්‍රසාදයත් බාහිර රූපාරම්මණයත් නිසාත් ඇතිවන විඤ්ඤාණය තමයි චක්ඛු විඤ්ඤාණය. චක්ඛායතනය තමයි චක්ඛු ප්‍රසාදය. සෝතායතනය ඒවාගේමයි. ඝානායතනය, ජිව්හායතනයත් ඒවාගේමයි. කායායතනය නම් රූප කලාප 53 යි. කායප්‍රසාදයට 52 උපකාර වෙනවා. චක්ඛායතනය, සොතායතනය, ඝානායතනය, ජිව්හායතනය, කායායතනය රූපයන්. මනායතනයත් රූපයක් ද? නැත මනායතනය යනු සිත්ය. හදය, හදවත ඇසුරු කරගෙන පහළවන චිත්ත තමයි මනායතනය කියන්නේ. මනායතනය යනු සිත් 89 යි. එනම් හදවත ඇසුරු කරගෙන පහළවන සිත් නම් ඒ මනායතනයයි. චක්ඛු විඤ්ඤාණ සිත්, චක්ඛු ප්‍රසාදය ඇසුරු කරගෙන පහළ වන සිත් ඒත් මනායතනයයි. සෝත ප්‍රසාදය ඇසුරු කරගෙන පහළ වන සිත් ඒත් මනායතනයයි. දෙපස් විඤ්ඤාණ ඇතුළත් සියලුම සිත්වලට මනායතනය ලෙස කියනු ලැබේ.

මෙයට විරුද්ධ තවත් බාහිර විරුද්ධ ආයතන 6 ක් පවතී. චක්ඛායතනයට උපකාරි වන්නේ බාහිර රූපය නිසා එය රූපායතනයයි. එයත් රූපයක්. සෝතායතනයට උපකාර වන්නේ බාහිර ශබ්දය, ශබ්දායතනය. එයත් රූපයක්. ඝානායතනයට උපකාර වන්නේ බාහිර ගන්ධය, එය ගන්ධායතනය. එයත් රූපයක්. ජිව්හායතනයට උපකාර වන්නේ බාහිර රසය, එයත් රූපයක්, රසායතනය. කයට ලැබෙන ස්පර්ශය රූපයක්. පඨවි, තේජෝ, වායෝ, එය පොට්ඨබ්බායතනය. මනායතනයට උපකාර වන්නේ ධම්මායතනය. ධම්මායතනය යනු අරමුණු. එනම් චෛතසික 52, ඕලාරික රූප 12, හැර සුඛුම රූප 16 පවතී. රූප 28

කොටස් 2 කට බෙදූ විට ඕලාරික රූප චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, රූප, ශබ්ද, ගන්ධ, රස, පඨවි, තේජෝ, වායෝ මේවා ඕලාරික රූප වේ. මේ රූප 12 හැර ඉතිරි රූප 16 සුඛුම රූප වේ. ඒ සුඛුම රූපත් ධම්මායතනයක්, නිර්වාණයත් ධම්මායතනයක්. ධම්මායතනය අභිධර්ම නය ක්‍රමයට අනුව මෙලෙස දැක්විය හැක. මේ ආයතන සියල්ල විපාක සමඟ තමයි කථා කරන්නේ. දැන් විපාක සිතත් සමඟ කථා කරන විට ප්‍රතිසන්ධි විඤ්ඤාණය ලැබුවා. උදා:- ගබ්භසෙය්‍යක සත්ත්වයින් ලෙස ප්‍රතිසන්ධි ලැබුවා. සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමඟ වේදනා, සංඥා, සංඛාර සහ රූප ස්කන්ධ පහළ වුනා. එනම් විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාම රූප පච්චයා සළායතනං කියන විට එතැනදී කාය දසකය කායායතනය පහළවෙලා තියෙනවා. වස්තු දසකය සහ භාව දසකය යනු ධම්මායතනය. එනම් හදය රූපය ධම්මායතනයයි. සුඛුම රූපයකි. වේදනා, සංඥා, සංඛාර කියන්නේ ධම්මායතනය පහළවෙලා තියෙනවා. ප්‍රතිසන්ධි විඤ්ඤාණය කියන්නේ මනායතනය පහළවෙලා තියෙනවා. විපාක වශයෙන්. එනම් නාමරූප පච්චයා සළායතන. මෙය තමයි විපාක සිත් සමඟ කථා කරන් යනවිට තේරුම් ගත යුත්තේ. නමුත් මෙය ප්‍රවෘත්ති විපාක සමඟ සම්බන්ධ වන විට වෙනස්ය. ප්‍රවෘත්ති විපාක යනු චක්ඛු විඤ්ඤාණ ආදිය තමයි පහළවෙන්නේ. සංඛාර නිසා චක්ඛු විඤ්ඤාණ පහළ වුනා. එනම් විඤ්ඤාණ පච්චයා නාම රූපං කියන විට චක්ඛු විඤ්ඤාණය සිතේ පහළවන වේදනාව සංඥා, සංඛාර කියන නාම ස්කන්ධයි. චක්ඛු විඤ්ඤාණ සිතත් සමඟ පහළවෙනවා කර්මජ රූප. ඒවා සියල්ල රූප ස්කන්ධ වේ. නාම රූප පච්චයා සළායතන කියනවිට මේ හැම දෙයකටම උපකාර වුනා චක්ඛු ප්‍රසාදය. බාහිර රූපායතනය. අන්න නාම රූප පච්චයා සළායතනං. මේ ආකාරයට ප්‍රවෘත්ති විපාක සමඟ තෝරාගත හැකිය. එතකොට ප්‍රවෘත්ති විපාක වශයෙන් චක්ඛායතන, සෝතායතන, ඝානායතන, ජිව්හායතන, කායායතන, මනායතන පහළ නොවුනොත් අපට ස්පර්ශයක් පහළවන්නේ නැහැ. සළායතන පච්චයා ඵස්ස පහළ වන්නේ නැහැ.

## V සළායතන පච්චයා ඵස්සො

ඵස්ස යනු, මේ තුන්දෙනාගේ එකතුවයි. චක්ඛුව, බාහිර රූපාරම්මණය, චක්ඛු විඤ්ඤාණය යන තුන්දෙනාගේ එකතුව තමා සම්ඵස්සය. එනම් නාම ධර්ම සමූහය සම්ඵස්සය. ඊළඟට පැහැදිළි කරන්නේ චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස මනො සම්ඵස්සය. මෙලෙස ස්පර්ශ 6 ක් පවති. චක්ඛු සම්ඵස්ස යනු චක්ඛු විඤ්ඤාණ සිතත් සමඟ පහළ වන නාම ධර්ම සමූහය. මේ චක්ඛු සම්ඵස්ස නිසා තමයි සම්පටිච්ඡන, සංතීරණ, වොත්ථපන, ජවන, තදාරම්මණ වශයෙන් සිත් පහළ වන්නේ. චක්ඛු සම්ඵස්සය අපට උපකාර කරන්නෙ එළෙසයි. තව දුරටත් මේවා පැහැදිළි කිරීම පිණිස පට්ඨාන නය ක්‍රමය අවශ්‍යයි. සෝත විඤ්ඤාණය සමඟ පහළවන සියලු නාම ධර්මයෝ සෝත සම්ඵස්සයයි. මේ සෝත සම්ඵස්සය උපකාර කරනවා සම්පටිච්ඡන, සංතීරණ, වොත්ථප්පන, ජවන, තදාරම්මණ පහළ වීමට ඝාන සම්ඵස්සය, ජිව්හා, කාය, මනෝ සම්ඵස්සය මෙසේ දත යුතුයි. මනෝ සම්ඵස්සය යනු භවාංග සිතේ නාම ධර්ම තමා මනෝ සම්ඵස්සය. භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේද වෙලා තමයි මනෝද්වාරාවර්ජන පහළ වන්නේ. අන්න මනෝ සම්ඵස්සය උපකාර වෙනවා. උදාඃ- අතීතයේ, මීට කලින් දුටු රූපයක්, ශබ්දයක්, මොහොතකට කලින් කරපු දෙයක් අපි සිහිකරනවා. සිහිකරන්නේ කවුද? මනෝ සම්ඵස්සයයි. මනෝ සම්ඵස්සය තමයි මෙය සිහිකරලා දෙන්නේ භවාංගයයි. මේ සියල්ල අපට නොපෙනුනාට, අපි දැන් කරන කර්මය කවුද රැගෙන යන්නේ? ප්‍රතිසන්ධි විඤ්ඤාණය නතර වුනා නම් කවුද මෙය රැගෙන යන්නේ? භවාංගයයි. අපි මේ කරපු විපාක ටික මේ භවාංගය තුළයි පවතින්නේ. බලය ඒවායේ තමයි මෙය රැගෙන යන්නේ. ඒ අතරතුර, **"පභස්සරමිදං භික්ඛවෙ චිත්තං"** මහණෙනි, භවංග සිතක් යනු ප්‍රභාෂ්වර සිතක්. අපට මුළු ජීවිත කාලයම භවාංග සිත පවත්වන්නට පුළුවන් නම් ප්‍රභාෂ්වරයි. නමුත් එය පවත්වන්නට පුළුවන් කමක් නැහැ. උදාඃ- අරූපී, රූපී බ්‍රහ්ම ලෝකවල ඇතැම් බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධිය ලබා ඒ ධ්‍යාන විපාකයේම සිටී. එනම් භවාංග සිතෙන්ම ඒ අය ගතකරන්නේ. ඒ අතර

තුර බුදුන් දකින්න ඇස් විවෘත කරනවා, බණ අහන්න කන් විවෘත කරනවා. ඒ අතර කාමාවචර කුසල් පහළ වෙනවා. ඒ අතරතුර ධ්‍යාන කුසල් වඩන්න පුළුවන් නමුත් බොහෝ විට විපාකයෙන්ම ඉන්නවා. ආකාසානඤ්චායතන ලොවේත් විපාකයෙන්ම ඉන්නවා. අරූපිතලවල අයට නිවන් දකින්න බැරි ඒ නිසයි. හැබැයි මෙහි සෝවාන් වෙලා ගිය අයට ඒ විපාක ශක්තියෙන් නිවන් දකින්න පුළුවන් බලය ඇත. අපේ භවාංගය තුළ තමා අතීතයේ රැස්කරන ලද කුසල් අකුසල් බල සියල්ලම රැඳී පවතින්නේ. නමුත් බලන්න බැහැ මෙහි පරිමාණය. අන්වීක්ෂයෙන් බැලීමට නොහැකියි. එයයි මෙහි තිබෙන විශේෂත්වය. ඒ නිසා මේ ලෝකයේ අයට සිත ගැන තෝරාගන්න බැරි. උදාඃ- පරිගණකයක ධාරිතාව කොපමණ පිරී තිබෙනවාද? ආදී බැලිය හැක. නමුත් මේ සිතේ ආකාරය බලන්නට බැහැ. භවාංග සිත තමයි මෙය පවත්වාගෙන යන්නේ. මේ භවාංග සිත තුළ තමයි මේ කියන ශක්තිය පවතින්නේ. මනෝ සම්ඵස්සය යනුවෙන් භවාංගය තෝරන්නේ. අපි ගත් අරමුණු, ඒ හැම මතකයක්ම භවාංගය සමඟ බැඳිලයි තියෙන්නේ. භවාංග තමයි මතුකරලා මනෝද්වාර සිත් පහළ කරන්නේ. මෙය ප්‍රායෝගිකයි සිතිය යුතු දෙයකි. මෙයයි මනෝ සම්ඵස්සය කියා හඳුන්වන්නේ.

## vi ඵස්ස පච්චයා වෙදනා

**"තත්ථ කතමා ඵස්ස පච්චයා වෙදනා? චක්ඛු සම්ඵස්සජා වෙදනා, සොත සම්ඵස්සජා වෙදනා, ඝාන සම්ඵස්සජා වෙදනා - පෙ - "**

පටිච්ච සමුප්පාද අර්ථ විග්‍රහයේ ඵස්ස පච්චයා වේදනා පැහැදිලි කිරීමයි. බුදුරජාණන් වහන්සේ ඵස්ස කියන විට චක්ඛු ස ම් ඵ ස ් ස , සොත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස සහ මනෝ සම්ඵස්ස ලෙස සම්ඵස්ස 6 ක් දේශනා කළා. මේ සම්ඵස්ස 6 ප්‍රධාන වශයෙන් විපාක සිත්වලයි කථා කරන්නේ. අතීතයේ රැස්කරගත් කුසලාකුසල කර්ම ශක්තිය නිසා අද අපට ලැබුණු විපාක තමයි මේ සම්ඵස්ස 6 න් කියන්නේ. උදාඃ- චක්ඛු සම්ඵස්සය කියන විට සළායතන පච්චයො ඵස්ස කියා. එතකොට චක්ඛු සම්ඵස්සයක් හැදෙන්නේ. චක්ඛු සම්ඵස්සයක් පහළ වෙන්නේ. චක්ඛායතනයත්, රූපායතනයත්,

මනායතනයත්, ධම්මායතනයත් යන ආයතන 4 නිසයි. එනම් චක්ඛු විඤ්ඤාණ සිත මනායතනයයි. චක්ඛු ප්‍රසාදය චක්ඛායතනයයි. ලැබෙන රූපාරම්මණය රූපායතනයයි. චක්ඛු විඤ්ඤාණයට අමතරව පහළවෙන ඒ සමඟ පහළවෙන චෛතසික ටික සබ්බ චිත්ත සාධාරණ වේ. මේ සිත් සමූහයම ධම්මායතනයයි. මේ විදියට ඒ ආයතන 4 දෙනා නිසා තමයි චක්ඛු සම්ඵස්ස කියන සමූහය පහළවුනේ. දැන් පැහැදිළි කරන්නේ චක්ඛු සම්ඵස්සය නිසා පහළ වන වේදනා මොකක්ද කියා. දැන් මෙතැනදී චක්ඛු සම්ඵස්සය එහෙමත් නැත්නම් චක්ඛු විඤ්ඤාණ නාම ස්කන්ධය තුළ පහළවන මේ වේදනා ස්කන්ධය. වේදනා ස්කන්ධයම අපට කියන්න පුළුවන් චක්ඛු සම්ඵස්ස වේදනාව කියා එක පැත්තකින්. නමුත් ප්‍රධාන වශයෙන් ගන්නවානම් මේ චක්ඛු සම්ඵස්සය නිසා පහළවන ඒ චිත්ත වීථි යම්තාක් වේදනා තියෙනවාද ඒ සියලුම වේදනාවන්ට අපි කියනවා චක්ඛු සම්ඵස්ස වේදනාව කියා. උදා:- සම්පටිච්ඡන සංතීරණ කියන මේ සිත්වල පහළවන වේදනාව විපාකයි. වොත්ථපන සිත සමඟ පහළවන වේදනාව ක්‍රියා වේ. ඊළඟට පහළ වෙනවා ජවන්,කුසල පැත්තෙන් කුසල් ජවන්, අකුසල පැත්තෙන් අකුසල ජවන්. ඒ ජවන් ගත වේදනාව ඇවිදින් එක්කෝ සෝමනස්ස වේදනාව, නැතිනම් අකුසල පැත්තෙන් දෝමනස්ස වේදනාව වෙන්න පුළුවන්. උපේක්ඛා වේදනාව වෙන්න පුළුවන්. කුසල පැත්තෙන් සෝමනස්ස වේදනා, උපේක්ඛා වේදනාව වෙන්න පුළුවන්. මේ කියන වේදනාව පහළවෙනවා. තදාරම්මණ කියන්නේ විපාක. තදාරම්මණ වේදනා පහළවෙනවා. මෙතැනදී පැහැදිළි කරගන්න ඕනේ චක්ඛු සම්ඵස්සය කියන ප්‍රධාන හේතුව නිසා ඒ චිත්ත වීථියේ අන්තර්ගත යම්තාක් චිත්තක්ෂණ තියෙනවාද ඒ සියලු චිත්තක්ෂණයන්හි පහළවන වේදනාව තමයි චක්ඛු සම්ඵස්සජා වේදනාව කියලා කියන්නේ.

දැන් සෝත සම්ඵස්ස, සෝත සම්ඵස්ස කියන විට සෝත සම්ඵස්ස ඇතිවනුයේ ආයතන නිසයි. සෝතායතනය යනු සෝත ප්‍රසාදය, සද්දාරම්මණය නමැති සද්දායතනය, ඊළඟ සෝත විඤ්ඤණය නමැති මනායතනය, ඊළඟට ඒ සමඟ එකතුවන චෛතසික සියල්ලක්ම ධම්මායතනය. මෙන්න මේ කියන ආයතන නිසා සෝත සම්ඵස්සය

පහළ වුනා. මේ සෝත සම්ඵස්ස නිසා පහළවන යම්තාක් චිත්ත වීථි පරම්පරාවක් තියෙනවාද ඒ සෑම චිත්තක්ෂණයකම අන්තර්ගත වේදනාව සෝත සම්ඵස්සජා වේදනාවයි.

ඝාන සම්ඵස්ස, ඝාන සම්ඵස්සයත් හටගන්නේ ආයතන නිසයි. ඝාන ප්‍රසාදය නමැති ඝානායතන, ගන්ධාරම්මණය නමැති ගන්ධායතනය, ඝාන විඤ්ඤාණය නමැති මනායතනය චෛතසික ධර්ම නමැති ධම්මායතනය මේ කියන ආයතන 4 නිසා පහළ වුනා ඝාන සම්ඵස්සය. මේ ඝාන සම්ඵස්සය නිසා පහළවන ඝානද්වාරික යම්තාක් චිත්ත වීථි පරම්පරා තියෙනවාද ඒ සෑම චිත්තක්ෂණයකම අන්තර්ගත වේදනාව ඝාන සම්ඵස්සජා වේදනාවයි. හැබැයි මතක තියාගත යුතුයි ප්‍රධාන වශයෙන් අපි ගන්නේ විපාක සිත්වල වේදනාව විතරයි. නමුත් ඒ විපාක සිත්වල වේදනාව සමඟ සියලු වේදනාවන් මෙතැනදී ගනු ලබයි. මොකද හේතුව මේ වේදනාව නිසා තමයි ඊළඟට අරමුණු පහළවෙන්නේ. නැතිනම් විපාක ඇතිවන වේදනාවන් අපට වැඩක් නැහැ. නැවත අපි මේ භවය අල්ලාගන්නේ නැහැ. ඒ පහළවන ජවන්ගත වේදනාව තමයි ඊළඟ භවයට අවශ්‍ය දේවල් රැස්කරගන්න තණ්හා කර ගන්නේ. මෙයයි හේතුව.

ඒවාගේම ජිව්හා සම්ඵස්සයත් ඒ වගේමයි. ජිව්හා සම්ඵස්සය, ජිව්හායතනය, රසායතනය, මනායතනය, ධම්මායතනය, කියන ආයතන නිසා පහළවුනා. ජිව්හා සම්ඵස්සය නිසා පහළවන ජිව්හා ද්වාරික යම්තාක් චිත්තක්ෂණ, චිත්තවීථි චිත්ත පරම්පරා තියෙනවාද ඒ සියලුම චිත්ත පරම්පරා චිත්තවීථීන් අපි හඳුනවන්නේ ජිව්හා සම්ඵස්ස වේදනාව කියයි.

කාය සම්ඵස්සය - කාය සම්ඵස්සය කියන විට කායායතනය, පොට්ඨබ්බායතනය, මනායතනය ධම්මායතනය. මේ කියන ආයතන 4 නිසා පහළවුනා කාය සම්ඵස්සය. මේ කාය සම්ඵස්සය නිසා පහළවෙනවා යම්තාක් කායද්වාරික වීථි, චිත්ත වීථි පරම්පරා පහළ වෙනවා නම් ඒ හැම චිත්තක්ෂණයක් චිත්තක්ෂණයක් ගැන වේදනාව අපි හඳුන්වන්නේ කාය සම්ඵස්ස වේදනාව කියයි. කාය සම්ඵස්සයේදී නම් සුඛ වේදනාව, දුක්ඛ වේදනාව. සුඛ සහගත කාය විඤ්ඤාණයක් ගත් විට මේ කයට ලැබෙනවා සැප වේදනාව. දුක්ඛ සහගත කාය

විඤ්ඤාණයක් පහළ වුනොත් මේ කයට ලැබෙනවා දුක්ඛ වේදනාව. ඒ අනුව අපි හදය වස්තුව ඇසුරු කරගෙන පහළ වෙන ඒ චිත්තක්ෂණයන් තුළ සෝමනස්ස වේදනා, දෝමනස්ස වේදනා, උපේක්ඛා වේදනා, කුසලාකුසල වේදනා වශයෙන් බෙදා ගත යුතුයි. මෙන්න මේ කියන ප්‍රධාන ස්පර්ශ 5 ට අමතරව පහළවන මනෝ සම්ඵස්සය යනු භවාංග සිතයි. මනෝ සම්ඵස්සය ලෙස භවාංග සිත හඳුන්වනු ලබන්නේ. භවාංග සිත යනු විපාක සිතකි. භවාංග සිත තමයි මනෝ ද්වාරය. දැන් භවාංග සිත තුළින් තමයි අපට අරමුණු මතුකරලා දෙන්නේ. උදා:- චක්ඛු විඤ්ඤාණය තමයි බාහිර වර්තමාන අරමුණක් රූපාරම්මණයක් අරගෙන අපට දෙන්නේ. නමුත් භවාංගය කරන්නේ අතීතාරම්මණ, අනාගත ආරම්මණ ගන්නේ. මීට කලින් ඇසින් ගත්ත යම්තාක් රූපාරම්මණ තියෙනවාද, ශබ්දාරම්මණ, ගන්ධාරම්මණ, රසාරම්මණ තියෙනවාද, ඵොට්ඨබ්බාරම්මණ තියෙනවාද, ඒවා අතීතයට ගියා. උත්පාද, ඨිති, භංග වී අතීතයට ගියා. ඒ අතීතයට ගිය අරමුණු නැවත මනෝද්වාරයෙන් අපට මතුකරනවා. උදා:- අපි ඊයේ දවසේ පින්කමක් කළා නම්, නැවත අද අපි වාඩිවෙලා සිහිකරනවා. සිහිකරන විට පහළ වෙන්නේ මනෝ සම්ඵස්සය උපකාර වෙලා මනෝද්වාරික චිත්තවීථි පහළ වෙනවා. ඒවාගේම වර්තමාන වශයෙන් භාවනා කර්මස්ථානයක් ගෙන වඩන විටදී ඒවායින් කෙළින්ම මනෝ සම්ඵස්සය නිසා මනෝද්වාරික චිත්ත වීථි පහළ වෙනවා. අනාගත අරමුණක් ගත්විට අනාගතය ගැන හිතලා යම්කිසි දෙයක් හිතනවා, හෙට කරන්න තියෙන කුසලක් ගැන. අපි සිහිකරනවා මේ විදියට කරන්න ඕනෑය කියා. පිළිවෙලින් පිළිවෙලට හිතනවා. ඒ හිතන අවස්ථාවේ පහළවෙන්නේ මනෝ සම්ඵස්සය නිසා මනෝ ද්වාරික වීථි. මනෝ සම්ඵස්සය නිසා පහළවෙන මනෝ ද්වාරික යම්තාක් චිත්තක්ෂණවල පහළ ජවන්ගත වේදනාවක්, විපාක සිත්ගත වේදනාවක්, චිත්තක්ෂණගත වේදනාවක් වේද, ඒ සියලුම වේදනා අපි හඳුන්වන්නේ මනෝ සම්ඵස්ස වේදනාව ලෙසිනි. වේදනාව යනු විඳීමයි. යම්කිසි සැපක් විඳිනවානම් සැප වේදනාවයි. දුකක් විඳිනවානම් දුක වේදනාවයි. මධ්‍යස්ථව යමක් විඳිනවානම් එය මැදහත් වේදනාවයි.

## vii වෙදනා පච්චයා තණ්හා

මෙය පැහැදිලි කරනවිට, "**තත්ථ කතමා වෙදනා පච්චයා තණ්හා?**" මෙතැනදී තණ්හාව කියනවිටදී, තණ්හාව යනු ලෝභයයි. තෘෂ්ණාවෙන්, ආශාවෙන් බැඳුන ස්වභාවය තමයි තණ්හාව. දේශනාවේ සඳහන් කරනවා රූප තණ්හා, සද්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ටබ්බ තණ්හා සහ ධම්ම තණ්හා 6 ගැන. ප්‍රධාන වශයෙන් 6 කි. එනම් අරමුණු 6 තමා තණ්හාව ලෙස පෙන්වන්නේ. රූපයක් දැකීමේ ආශාව රූප තණ්හාව. ශබ්දයක් ඇසීමේ ආශාව ශබ්ද තණ්හාව. ගඳ සුවඳ විඳීමේ ආශාව ගන්ධ තණ්හාව. රස, තිත්ත දැනීමේ, අනුභව කිරීමේ ආශාව රස තණ්හාව, සැප දුක් ස්පර්ශ විඳීමේ ආශාව ඵොට්ඨබ්බ තණ්හාවයි. ඒවාගේම ධම්මාරම්මණ අතීතයේ විඳපු සැපයක් නැවත සිහිකරමින් විඳීම ධම්ම තණ්හාවයි. බුදුරජාණන් වහන්සේ සමාන වචන 100 කින් ධම්මසංගණී ප්‍රකරණයේ දේශනාකොට තිබේ. අපට මේ තණ්හා ඉපදෙන අයුරු ගැන මේ තණ්හා නම් ලෝභ චෛතසිකයයි. මේ ලෝභ චෛතසිකය උපදින්නට නම්, මේ තණ්හාව නොයෙක් ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ පැහැදිලි කොට තිබේ. මේ කියන තණ්හාව ඇතිවුනේ වේදනාව නිසයි. අපි දැන් කුසලක් කරගෙන යනවා. මේ කුසලාරම්මණය කරන ගමන් ඇතිවන දේ; උදා:- මහා සංඝරත්නයට දානයක් දෙනවා. දානය දෙනවිට මහා සංඝරත්නය දැකීමේ ආශාව, කුසල පාක්ෂික කුසලාරම්මණයක් වුනත් ආශාව තුළ කැමැත්ත තුළ, පසුව ඇතිවන තණ්හාව තුළයි මෙහිදී පැහැදිලි කරන්න යන්නේ. තමන් බොහොම ශ්‍රද්ධාවෙන් පූජා කළ වස්තුව ගැන බොහොම ආශාවක් හිතේ ඇතිවෙනවා. ඒ වෙලාවේ බණ පදයක් ඇසුවානම් ශබ්ද තණ්හාවක් ඇතිවුනා. ආශාවයි. මේ සියල්ල එකතු කරමින් හිතන්න පටන්ගන්නවා. කුසලයෙන් පසු හෝ කුසලයට පෙර, කුසලටය පෙරත් සිතනවා. අද මහා සංඝරත්නය මෙපමණක් වඩිනවා මගේ දානයට. වැඩියොත් මම මෙහෙමයි දානය පිළිගන්වන්නේ. මෙහෙමයි වන්දනා කරන්නේ. මේ වාගේ ධර්ම දේශනාවක් අසන්නට ලැබෙයි. කියා සිතන විට තණ්හාවෙන් බැඳෙනවා. මෙහිදී කුසල චිත්තක්ෂණයන් තුළ තණ්හාව නැහැ. නමුත්

ඒ කුසලය නිසා වටේටම ලෝභ සහගත සිතුවිලි ගලාගෙන එන්නට පටන් ගන්නවා. මෙතනදී වේදනාව නිසා ඇතිවන තණ්හාව කුසල් සිතක් පහළ කරගෙන හෝ පහළ කරගන්නට කලින් හෝ කුසලට තණ්හාවක් ආශාවක් ඇතිකරගන්නවා. එතකොට ඒ ආශාව ඇතිවන්නේ එම දර්ශනය නිසයි. ශ්‍රවණය නිසා, ඝ්‍රාණනය නිසා, සායනපූසනය නිසා ඇතිවෙන ආශාවෙන් නැතිනම් ධම්මාරම්මණය නිසා ඇතිවන ආශාවක් වෙන්නට පුළුවන්. මේ වේදනාව නිසා තමයි මේ ආශාව තණ්හාව ඇතිවන්නේ. වේදනාවක් පහළවුනේ නැතිනම්, එනම් අරමුණක් තියෙනවා. අරමුණේ, අපට බොහෝ විට බලපාන්නේ සැප වේදනාවයි. සෝමනස්ස වේදනාවයි. අපට මේ වේදනාව තේරුණේ නැත්නම්, වේදනාව කියන එක අල්ලාගන්නේ නැත්නම්, තණ්හාවක් පහළවන්නේ නැහැ. රහතන් වහන්සේ නමක් දානයක් දෙනවා. නමුත් උන්වහන්සේ තුළ මේ කියන ක්‍රියාදාමය සම්පූර්ණයෙන්ම පහළ වේ. නමුත් ජවන්වල පහළ වන්නේ ක්‍රියා මාත්‍රය විතරයි. උන්වහන්සේට ඒ තුළ අතීත වශයෙන් හෝ අනාගත වශයෙන් හෝ ආශාවක් නැත. පසුවට හෝ ඉදිරියට ආශාවක් ඇතිවන්නේ නැහැ. හේතුව තණ්හාව නැතිකරලා නිසා වේදනාව පවතී. විඳීම තියෙනවා. නමුත් ඒ විඳීම අපි වාගේ ආශා කරන්නේ නැහැ, වේදනාවට. නමුත් අපි ඒක විඳගන්නවා. ආශාවෙන් අල්ලා ගන්නවා. මේ තණ්හාව කියන්නේ අන්න ඒකයි.

බුදුරජාණන් වහන්සේ ධම්මචක්ක පවත්වන සූත්‍රයේ දී තණ්හාව තවත් ආකාරයට බෙදනවා. එතැනදී පැහැදිලි කරනවා **"යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභි නන්දිනී සෙය්‍යථීදං? කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා"** නැවත නැවත පුනර්භවයක් ඇති කරන, ඒ තුළ හමුවන යම් තණ්හාවක්, ආශාවක් තියෙනවාද ඒක තමයි තණ්හාව, සමුදය කියලා කියන්නේ. එය කොටස් 3 කට බෙදේ. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා. කාම තණ්හා යනු කාම ආශාවයි. වස්තු කාම, ක්ලේශ කාම ලෙස කොටස් 2 ක් වේ. වස්තු කාම යනු නොයෙක් වස්තූන්ට තියෙන ආශාව වේ. මේ නොයෙක් වස්තූන්ට තියෙන ආශාව මත, වස්තු කාමය නිසා අපේ හිතේ තියෙන කෙලෙස් ක්ලේශ

කාම වේ. වස්තු කාම යනු නොයෙක් වස්තූන්ට, දරුවන්ට තියෙන ආශාව, තමන් භාවිතා කරන උපකරණවලට තියෙන ආශාව. මේ හැම දෙයකටම ආශා කිරීම වස්තු කාම වේ. ඒ ආශා කිරීමත් සමඟ හිතේ පහළවෙන ලෝභ සහගත සිතුවිලි ආදී සියල්ලක්ම ක්ලේශ කාම වේ.

භව තණ්හාව යනු කුමක් ද? ගොඩාක් අය සිතන්නේ මෙය භවයට ඇති කැමැත්ත බවයි. නමුත් මෙතැන දී එවැන්නක් අදහස් නොවේ. භව තණ්හාව නම් ශාස්වත දෘෂ්ඨියයි. විභව තණ්හාව යනු උච්ඡේද දෘෂ්ඨියයි. ශාස්වත දෘෂ්ඨිය එතැන දී ඇතිවන්නේ. උදාඃ- අපි බෞද්ධයෝ වශයෙන් සිතනවා අඩුයි. නමුත් අපටත් සිතෙන අවස්ථා පවතී. නැතුව නොවේ. වෙනත් බෞද්ධ නොවන ඇත්තෝ සිතන්නේ මේ ජීවිතය සදාකාලිකයි, ඉන්න ටික හොඳට ඉන්න ඕනේ. කාලා බීලා සතුටින් ඉන්න ඕනේ කියලා බොහොම සතුටින් ජීවිතය ගත කරන්න උත්සාහ කරනවා. මේ කාමයත් සමඟ ඒ අය හිතාගෙන ඉන්නේ ජීවිතය සදාකාලිකයි කියන අදහසින් තමා සියලු දෙයක්ම කරන්නේ. අර සදාකාලිකයි කියන අදහසින් මේ හැම දෙයක්ම කරන්නේ. ඒ තුළ ඇතිවෙනවා භව තණ්හාව. හැමදාම අපි යමක් කරනවා. මෙහි වෙනසක් තේරෙන්නේ නැහැ. දුකක්, අඩුවක් තේරෙන්නේ නැහැ. උදාඃ- මුදල් තියෙන පුද්ගලයෙකුට කොපමණ මුදල් වියදම් කළත් එහි අඩුවක් තේරෙන්නේ නැහැ. අද ඔහු ලොකු සැපයක් විඳිනවා නම් හෙටත් ඒ සැපය විඳීමට හැකියි. ඔහුට එය නොදැනෙන බැවින් ඔහු සිතන්නේ එම සැපය සදාකාලිකයි කියා. අන්න සදාකාලිකයි කියන මතය ඇති වන්නේ භව තණ්හාව නිසයි. විභව තණ්හාව යනු උච්ඡේද දෘෂ්ඨියයි. අපි මේ ජීවිතයේ ඉන්න ටික හොඳට ඉන්න ඕනේ. ඊළඟ ජීවිතයේ කව්ද දන්නේ අපට පෙනෙන්නේ නැහැ. උපදිනවාද දන්නේ නැහැ. පෙනෙන්නේ නැහැ. කොහේ යනවාද කියා අප දන්නේ නැහැ. මෙතැනින් අපට කෙළවරක් තියෙයි කියා උපරිම විඳින්න හදන නිසා උච්ඡේද දෘෂ්ඨියත් සමඟ බැඳුණු තණ්හාව පවතී. මෙය අපට හැම අරමුණක් සමඟම තියෙනවා. උදාඃ- අපට බුදුරජාණන් වහන්සේ දකින්න ආසයි. විහාරයකට යන විට, බුදුරජාණන් වහන්සේ වඳින විට, ඒ තුළ

ආශාව ඇතිවෙලා ඒ තුළම භව තණ්හා, විභව තණ්හා ඇතිවෙන්න පුළුවන්. යම්කිසි කාරණාවක්, යම්කිසි අරමුණක් මත, යම් වස්තුවකට අපි ආශා කරනවාද, ඒ වස්තුව පිළිබඳ හිතේ පවතිනවාද ලෝභ සහිත සිතුවිලි. ඒවාට තමයි තණ්හාව කියන්නේ. තණ්හාව 108 වැදෑරුම් වශයෙන් බෙදීමට හැක. එනම්; රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, තණ්හා, ධම්ම තණ්හා නමැති 6 දෙනා, කාම, භව, විභව තණ්හාවලින් වැඩිවූ විට (6 × 3 = 18) 18 කි. මේ රූප තණ්හාව නිසා කාම, භව, විභව කියන තුනම පහළ වෙනවා. මෙයයි තේරුම. අනෙක් ඒවාත් සමඟ පහළ වේ. අජ්ඣත්තා, බහිද්ධා ලෙස එනම්, ආධ්‍යාත්මික අරමුණු ලෙසත්, බාහිර අරමුණු ලෙසත් පහළ වේ. (18 × 2 = 36). අතීත, අනාගත, වර්තමාන වශයෙන් පහළ වන බැවින් (36 × 3 = 108). බුදුරජාණන් වහන්සේ 108 වැදෑරුම් තෘෂ්ණාව ප්‍රහාණය කළා කියන්නේ, ආධ්‍යාත්මික වශයෙන් වැඩෙන දහඅට වැදෑරුම් තෘෂ්ණාවත්, බාහිර වශයෙන් වැඩෙන දහඅට වැදෑරුම් තෘෂ්ණාවත්, අතීත වශයෙන්, අනාගත වශයෙන්, වර්තමාන වශයෙන් වැඩෙන තෘෂ්ණාව අතරක් නෑර සෝදා හැරියා. නමුත් අපි තුළ මේ 108 ම පවතී. අපට රූප ආශාවක් ඇතිවුණොත් ඒ තුළ කාම ආශාවක් ඇතිවෙනවා. ඒ තුළ භව, විභව ආශා ඇතිවෙනවා. අපට ශබ්දයක් ඇසුනොත් ඒ තුළ කාම ආශාව, ඒ තුළ භව ආශාව, ඒ තුළ විභව ආශාව ඇතිවෙනවා. උදා:- සින්දුවක් අහන්න ආශාව ඇතිවේ. ශබ්ද තණ්හාව ඇතිවේ. එයට ඇලුම් කිරීම කාම තණ්හාව. ඒ සින්දුව නමැති වස්තුවට ආශා කිරීම කාම තණ්හාව. ඒ සින්දුවට ඇලුම් කිරීමේ ආශාව මත ක්ලේශ කාමය ඇතිවේ. හැම වෙලාවේම ඇසීමේ ආශාව භව තණ්හාව. ඉන්න ටික කාලේ මේවා අහන්න ඕනේ, එනම් උච්ඡේද දෘෂ්ඨිය සමඟ විභව තණ්හාව. එකම අරමුණ එක්ක මේ ඔක්කොම බැඳිලා. මෙය වෙන වෙනම දකින්න බැරිකම, අවබෝධ කරගැනීමට බැරිකම තමයි පවතින්නේ. අපේ හිතට යම්කිසි ආශාවක් ගලාගෙන එනවා නම්, ඒ ආශාව අරමුණත් සමඟ මේ සියලුම තණ්හා ගොඩවල් ටික බැඳිලයි තියෙන්නේ. කුසල් අකුසල් හැමදෙයක්ම. කුසලයක් ගත්විට කුසල අවස්ථාවේ නැහැ. බණ අහන විට බණ අහලා හිතනවා මට මේ වගේ හැමදාම බණ අහන්න ඇත්නම් හොඳයි කියා ඇලුම් කරනවා.

බණ අහන්න පෙර ඇතිවෙනවා නම් ඇතිවෙන තණ්හාවෙන් තමයි අපට නැවත කුසල් කරන්න සුදුසු ජීවිත ලැබෙන්නේ. අකුසලයට අපි තණ්හා කළොත් ඒ ළඟ ජීවිතවල භවයක් පාසා දුගතියටයි යන්නේ. පහළටයි යන්නේ. නමුත් කුසලයට ආශා කරනවිට ඉහළටයි යන්නේ. ඒ ජීවිතය පිනෙන් පුරව පුරවා යනවා. නමුත් පින වටා ආශාව තිබේ. ඉදිරියට පටිච්චසමුප්පාදයේ පඤ්චක නය ක්‍රමය තෝරන විට වඩාත් පැහැදිළි වේ. මෙහි සම්බන්ධය හොඳින් අවබෝධ කර ගත හැක.

ගොඩක් දෙනෙක් කියන කථාව නම් බෞද්ධ රටවල මිනිසුන් දුප්පත්ය. ඒකට හේතුව මොකක්ද? බෞද්ධ රටවල සිටින මිනිස්සු මොනදේ කළත් නිවන් දකින්න ඕනේ කියා සිතනවා මිස වෙන දෙයක් හිතන්නෙ නැහැ. බොහෝ දුරට නිවන් දකින්න හිතන්නේ වයසක මවුකෙනෙක්. දුප්පත් අයෙක් වුනත් දානේ හැන්දක් හරි පූජා කරලා හිතන්නේ මට මේක නිවන් දකින්න හේතු වේවා කියලා. ඒ අයගේ ඒකායන ප්‍රාර්ථනාව නිවනයි. නිවන් යන ගමනේ දී ලැබෙන්න පුළුවන් නොයෙක් වරප්‍රසාද. නමුත් ඒ වරප්‍රසාද ගැන තැකීමක් කළේ නැහැ. පින කරාම මට හොඳ ජීවිතයක් ලැබෙන්න ඕනේ, මට හොඳ දරුමල්ලෝ ලැබෙන්න, මිල මුදල් ලැබෙන්න, මට ධන ධාන්‍ය ලැබෙන්න ඕනේ කියා ප්‍රාර්ථනාවක් ඔස්සේ ගියේ නැහැ. නිවනට ගියේ. නිවන අරමුණු කළේ. නමුත් නිවනට යන මාර්ගයේ දී ඒ අවශ්‍ය දේවල් ලැබෙනවා. නමුත් අර විශේෂ ප්‍රාර්ථනාවක් නොකළ නිසා ඒ විශේෂ දේවල් ලැබෙන්නේ නැහැ.

උදා:- බුදුරජාණන් වහන්සේගේ කාලයේ කීයෙන් කී දෙනෙක්ද නිවන් දැක්කේ. එතකොට නිවන් දැකපු ආර්යයන් වහන්සේලා ආපු පසුබිම බලන විට පුදුමාකාරයි. සුනීත ස්වාමීන් වහන්සේ, උන්වහන්සේට රහත්වෙන්න තරම් පින පිරුණු සසර පාරමී පුරාගෙන ඇවිත් තිබුණේ. නමුත් අවසාන ජීවිතයේ පහත් කුලයක දුගී දුප්පත් වෙලා කුණු අදින මනුෂ්‍යයෙක් වෙලා ඉපදුණේ. අපිට හිතෙන්න පුළුවන් ඒ තරම් නිවන් දකින්න පින් කළා නම් ඒ වාගේ තැනක ඉපදුනේ ඇයි කියලා. හේතුව නම්; පින් කළා නිවන් දකින්න, නමුත් වටපිටාව තණ්හාවෙන් උපාදාන

කරගෙන ප්‍රාර්ථනා පිහිටුවලා නැහැ. සෝපාක ස්වාමීන් වහන්සේගේ කථාවත් එසේමයි. සෝණ කුටිකණ්ණ ස්වාමීන් වහන්සේගේ යටිපතුල්වල පවා රෝම කූප වැවී තිබුණා. හේතුව නම්; එම නිවෙසේ සියලු තැන්වල පලස් එළා තිබුණේ. වැසිකිළියට යන මාර්ගයේ පවා සම්පූර්ණ පලස් දමා යටිපතුල් බිම නොගැවෙන ලෙසයි ජීවත් වුනේ. පොළොවේ පය වදින්නේ නැති තරම්. එතරම් ම සුඛෝපභෝගී ජීවිතයක් ගත කළේ. නමුත් උන්වහන්සේත් නිවන් දැක්කා. අන්න ඒ වගේ අපි තේරුම් ගත යුතුයි, ඒ ඒ අයගේ ප්‍රාර්ථනා අනුව තමයි මේ ගමන යන්නේ. ප්‍රාර්ථනා බැඳෙන්නේ මේ තණ්හාවත් සමඟයි. ඇතැම් අය කුසලය කර නිවන විතරක් ප්‍රාර්ථනා කරනවා. ඇත්තටම කවදා හරි නිවන කරා ගමන් කරනවා, නමුත් යන මාර්ගය බොහෝම දුක්ඛිත වෙන්න පුළුවන්. වටපිටාව බොහෝම දුගී දුප්පත් වෙන්න පුළුවන් වාර අනන්තයි. හිතන පතන සැප සම්පත් නැහැ. ඒ හැම දෙයක්ම වෙනස් වෙවී යනවා. ඒකයි කියන්නේ තණ්හාවේ තියෙන වෙනස. අපි කුසල් කරලා නැවත නැවත ප්‍රාර්ථනා කරනවා, අනේ මට මේ කුසල් කරන්න හොඳ මනුෂ්‍ය ජීවිතයක් ලැබෙන්න ඕනේ. ඒ වගේම නැවත නැවත කුසල් කරන්න නම්, හොඳ ත්‍රිහේතුක මනුෂ්‍ය ජීවිතයක් ලැබෙන්න ඕනෙ. නැවත නැවත මට කුසල් කරගෙන පාරමී පුරාගෙන යන්නට නම්, දුගී දුප්පත් නොවූ, අසරණ නොවූ, ධන ධාන්‍ය යස ඉසුරින් ආයු, වර්ණ, සැප, බල, ඥානයන්ගෙන් යහපත් ගුණ සපිරි බෝසත් ගුණැති දෙමාපියන්, සහෝදර, සහෝදරියන්, ගුරුවර, ඥාතීන්, හිතවතුන්, අසල්වැසියන්, රටවාසීන් ආදී සැමදෙනා ලබමින් මට නිවන් මග යන්න ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. නමුත් මම කියන්නේ නැහැ එසේ ප්‍රාර්ථනා කළ යුතුයි කියා. නමුත් නිවන් ප්‍රාර්ථනා කරන ගමන් ඒ හැම දෙයක්ම ප්‍රාර්ථනා කරන කොට නිවන කරා යන මාර්ගය සියලු දේවල්වලින් ආලෝකමත් වෙවී යනවා. මේ නිසා බෞද්ධ රටවල මිනිස්සු පතන ඒකායන ප්‍රාර්ථනය නිවනයි. අනිත් බෞද්ධ නොවන ඇතැම් දුප්පත් රටවල් තිබේ. බහුතරයක් බොහොම දියුණුයි. නමුත් ඒ අය තුළ නිවන කියා අපේක්ෂාවක් නැහැ. නමුත් ඒ අයත් අසරණ අයට පිහිට වෙනවා. නොයෙක් ආකාරයේ

පරිත්‍යාග කිරීම් කරනවා. නමුත් ඒ අය තුළ ආශාවත් සමඟ තණ්හාවත් සමඟ බැඳුණු පරිසරයක් තිබෙන්නේ. යමක් කළාට කුසලයක් කියා අවබෝධයක් නැහැ. නමුත් ප්‍රාර්ථනා පිහිටුවාගෙනයි එන්නේ. මේ අය දන්නවා යමක් දුන්නොත් විපාක ලැබෙයි කියා. එහෙම සිතනවා. අද කවුරු නමුත් මනුෂ්‍යයෝ කා තුළත් ඒ තුළ විශ්වාසයක් තියෙනවා. අපි අසරණයෙකුට පිහිට වෙන්න ඕනේ කියන දේ අබෞද්ධයෝ තුළත් තියෙන දෙයක්. ඒ අනුව තමයි ඒ අයගේ පරිසරය වෙනස් වී තිබෙන්නේ. පෙර සසර පින්කර ඇති බැවින් මනුෂ්‍ය ජීවිත ලැබුණා. ධන සම්පත්වලින් පිරුණා. නමුත් බෞද්ධ නොවේ. ඇතැම් අය බෞද්ධ බවට පත්වෙනවා. අපි තේරුම් ගන්න ඕනේ බෞද්ධ රටවල මිනිස්සු දුප්පත් වෙන්නේ, එක ප්‍රධාන කාරණයක් නම් ඒකායන ප්‍රාර්ථනය නිවන නිසා බෞද්ධ රටකට ඇවිල්ලා ඉපදෙනවා. නමුත් වටපිටාව නැහැ. මට නිවන් දකින්න අවශ්‍ය නම් මැරිලා ගොස් බෞද්ධ රටකම ඉපදෙනවා මිස වෙන තැනක ඉපදුනොත් නිවන් දකින්න බැහැ. එයයි හේතුව. ඒ එක් පැත්තකින්. අනෙක් පැත්ත හිතන්න ඕනේ අපි ගොඩාක් දෙනෙක් බෞද්ධ රටවල ඇවිත් උපදින්නෙත් පින් රැස්කරන්නයි. අපාගත සත්ත්වයෝ ඉන්නවා, කොහොම හරි ඒ අය උඩට ආ යුතුයි. ඒ ඇවිත් බෞද්ධ නොවන තැනක ඉපදුනොත් නැවතත් පහළට වැටෙනවා. නමුත් සසර කවුරු නමුත් හැමෝම බෞද්ධයෝ. අද වෙන වෙන ආගම් දරාගෙන කැඩී කැඩී ගියාට ඔය හැම සත්ත්වයක්ම බුදුදහම පිළිගන්න අයයි. හැම සත්ත්වයෙක්ම බුදුදහමට අනුව ජීවත් වූ පිරිසක්. හේතුව නම්, ලෝක විනාශයේ දී කවුරු නමුත් ධ්‍යාන වැඩිය යුතුයි. ධ්‍යාන වඩලා බඹලොව යා යුතුයි. බඹ ලොව ගිය පසුයි සියල්ල විනාශ වන්නේ. එතකොට හැම සත්ත්වයෙක් ම බෞද්ධ ආගම සමඟ සහ පරිසරය සමඟ හැදිලා තියෙනවා සසරේ දී. මේ ජීවිතයේ වෙනස් වුනාට, ගොඩාක් දුරට අපි සංගිතිය යුතු කරුණකි. මෙය ධර්මයේ තියෙන කරුණක් නොවේ. නමුත් අදහසකි. දුක්ඛිත ජීවිත ලැබූ සත්ත්වයෝ එතැනින් චුත වෙලා මේ බෞද්ධ රටවලට ඇවිත් උපදිනවා පින් හොයාගෙන. ඒ උපදිනවිට ඒ අයගේ සසර ගොඩාක් කල් දුක් වින්ද නිසා, ගොඩාක් සැප විඳලා

නැති නිසා, ඒ අයගේ පරිසරය ගොඩාක් වෙනස්ය. එහෙම වෙන්නත් පුළුවන්. දෙව්ලොවින් කෙනෙක් මනුෂ්‍ය ලෝකයට පැමිණියා නම්, මහා තේජාන්විත විය යුතුයි. ඇත්තටම තේජාන්විත බෞද්ධයොත් අද කාලේ නැතිව නොවේ. ඒ වගේම තේජාන්විත භික්ෂූන් වහන්සේලා සිටියි. ඒවාට සසර හේතු පවතී. නමුත් බහුතරයක් දුප්පත් ලෙස ඉපදීමට හේතුව නම් පෙර ජීවිතවල, කිට්ටු ජීවිතවල සැප විඳි ජීවිත නොවන බැවිනි. සමාන්‍ය දුක් විඳි ජීවිත, දුප්පත්ම අසරණ වූ මනුෂ්‍ය ජීවිත, නැතිනම් වෙනත් රටවල දුගී දුප්පත්වී ඉපදුන ජීවිත. අපායේ සිට ආ ජීවිත බවට සිතිය හැක. මේ හැම දෙයක්ම කර්මානුරූපව නිර්මාණය වන දෙයක් නිසාවෙනි. මේ අනුව කුසලයක් කරන විට තණ්හාව බැඳිලයි තියෙන්නේ. අකුසලයක් කරන විට කොහොමත් තණ්හාව බැඳිලයි තියෙන්නේ. තණ්හාවෙන් තොරව අපට කිසිදෙයක් කළ නො හැකියි.

## viii තණ්හා පච්චයා උපාදානං

**උප + ආදානං = උපාදානං** - දැඩිව ගැනීම. එනම් තණ්හාවත් සමඟ බැඳුණු එකක් තමා උපාදානය. තණ්හාව ඇති වුනා නම් උපාදානය අනිවාර්යයෙන් ම ඇතිවෙනවා. තණ්හාවෙන් තොර උපාදානයක් පහළ වෙන්නේ නැහැ. උපාදානය කොටස් 4 කට බෙදෙයි. කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන. කාම උපාදානය යනු කාම තණ්හාවම තමයි. නොයෙක් වස්තූන්ට කාම තණ්හාව හැම දෙයක්ම හා බැඳුණු එකයි. යම්කිසි අරමුණකට යම්කිසි වස්තුවකට, යම්කිසි දෙයකට දක්වන ආශාව තණ්හාවයි. එය දැඩිව අල්ලා ගැනීම උපාදානයයි. තණ්හාව එක්ක උපාදානය බැඳිලයි තියෙන්නේ. කාම උපාදානයත් එක්ක ගත්විට මේ කාමයට තියෙන ආශාව, කැමැත්ත තමයි කාම උපාදානය කියන්නේ.

දිට්ඨි උපාදානය - දිට්ඨිය යනු දශ වස්තුක සම්මා දිට්ඨියක් පවතී. දුන් දේ විපාක තිබේ. වැඳුම් පිදුම් කිරීමේ විපාක තිබේ. මහා දන් පූජා කිරීමේ විපාක තිබේ. මවුපිය උපස්ථාන කිරීමේ විපාක තිබේ. හොඳක් කළ විට හොඳ විපාක, නරකක් කළ විට නරක විපාක තිබේ. ඔය විදියට

අපි දන්නවා හොඳ දේවල්. මේවා තුළ දැඩි ග්‍රහණය වෙනවා. ඒවා ආශාවෙන් කරනවා. ඒවා අපි ග්‍රහණය කරගෙන නැවත නැවත කරනවා. ඒ තුළ දිට්ඨිය ඇතිවෙනවා. ඒවාම ග්‍රහණය කරගෙන කරනවා. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් පහළ වෙන්නේ. කුසලය කරන අවස්ථාවේ නැත. නමුත් දැඩිව කරනවා. ඒ තුළ දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් පහළ වෙනවා. නමුත් ඒ තුළ මිථ්‍යා දෘෂ්ඨියක් නොවෙයි කියවෙන්නේ. දිට්ඨි උපාදානය කියන්නේ මිථ්‍යා දෘෂ්ඨියක් නොවේ. ආශාව ඇතිවුනා නම් එය දැඩිව, සත්ත්ව පුද්ගල සංඥාවෙන් ආත්ම දෘෂ්ඨියෙන්, ඒක අපි දැඩිව ග්‍රහණය කිරීමයි දිට්ඨි උපාදානය කියන්නේ.

සීලබ්බත උපාදානය - යනු ශාසනයෙන් බැහැර වූ නොයෙක් ශීල ව්‍රත සමාදන්වීමයි. අද කාලයේ හැටියට මස් මාංශ ගැනීමත් ව්‍රතයක් එක් පැත්තකින්. මස් මාංශ බුදුරජාණන් වහන්සේ තහනම් කළ දෙයක්, හොඳ නැහැ. අකැපයි. බුදුරජාණන් වහන්සේ තහනම් කළ දෙයක් නොවෙයි. නමුත් ඒ තුළ අපි වතක් විදියට සමාදන් වෙනවා. මම දැන් අවුරුදු 10 ක් විතර මස් මාංශයෙන් වැළකිලා ඉන්නේ. අවුරුදු 5 ක්, සතියක් තුළ, ඒකත් එක්තරා ව්‍රතයක්. ඒ තුළත් අපි ආශාවක් දක්වනවා. එනම් සීලබ්බත උපාදානය. බුදුරජාණන් වහන්සේ නො කළ දෙයක් බැවිනි. බුදුරජාණන් වහන්සේ දේශනා නො කළ නොයෙක් දෘෂ්ඨි සමාදන් වෙනවා. බුද්ධ කාලයේ සිටියා එළුවෝ වගේ ජීවත්වුන මනුෂ්‍යයෝ, බල්ලෝ විදියට ජීවත්වුන මනුෂ්‍යයෝ, ඇඳුම් නැතිව ඇඳුමට ඇති ආශාව නැතිව ජීවත්වුන මනුෂ්‍යයෝ, කේසකම්බල - කෙස්වලින් කම්බිලි හදාගෙන පොරවගත්තා ආශාව නැතිකරගන්න. එක එක දේවල් කරන්නේ ඒකත් ආශාවක් එක්තරා. එය සීලබ්බත පරාමාස වේ.

අත්තවාද උපාදානය - ආත්ම දෘෂ්ඨියයි. විසි වැදෑරුම් ආත්ම දෘෂ්ඨිය සක්කාය දිට්ඨියෙන් යුක්තයි. "**රූපං අත්තනො සමනුපස්සති රූපස්මිංවා අත්තානං අත්තනිවා රූපං රූපස්මිං අත්තානං**", රූපය ආත්මය ලෙස දකිනවා. ආත්මය රූපය ලෙස දකිනවා. රූපය තුළ ආත්මය තියෙනවා. ආත්මය තුළ රූපය තියෙනවා. අපේ ළඟ මේ රූපයට තියෙන ආශාව නිසයි මේ හැම දෙයක්ම කරන්නේ. මේ රූපය කියන්නේ ආත්මය යයි ගනු ලබයි. රූපයට පුංචි තුවාලයක් වුනත් බෙහෙත් කරන්නේ පොඩි

පොඩි ප්‍රශ්නයක් වුනොත් නොයෙක් දේවල් කරනවා. අපි කවුරුවත් රහත්වෙලා නැති බැවින් අපි හැමෝම ළඟ මේ ආශාව තියෙනවා. එතකොට මේ රූපය අපි ආත්මය ලෙස අල්ලාගෙනයි සිටින්නේ. අල්ලගෙන නිසා තමයි අත්තවාද උපාදානය.

වේදනාව ආත්මය ලෙස, ආත්මය වේදනාව ලෙස, වේදනාව ආත්මය තුළ, ආත්මය වේදනාව තුළ. මේ ලෙස ම සංඥා, සංඛාර, විඥාන කියන පඤ්චස්කන්ධය ම ආත්ම දෘෂ්ඨියෙන් මම මගේ කියන මමත්වයෙන් අල්ලාගෙන සිටින තාක්කල් අත්තවාද උපාදාන පහළ වෙනවා. මෙහි දී පැහැදිළි කරගත යුතුයි තණ්හාව, නිසා මේ උපාදානය පහළ වන්නේ කෙසේද කියා. රූප තණ්හාව නිසා අපට ඇතිවෙනවා කාම උපාදානය. මෙය පැහැදිළියි. වැරදි දෘෂ්ඨියක් ලෙස මෙය අල්ලා ගන්නවා. උදාඃ- මලක් ගත්විට මේ මල හැමදාම මේ විදියට තියෙනවා නම් ලස්සනයි කියා එය දෘෂ්ඨියෙන් ග්‍රහණය කරනවා. දිට්ඨි උපාදානය. ඊළඟට මේ මල උපමා කරගෙන සීලබ්බත පරාමාස පහළ කරගන්න හැකි අවස්ථා තිබීමට පුළුවන. මල් කියන ඒවා බුදුරජාණන් වහන්සේට පූජා කරන්න හොඳ නැහැ. ඇතැම් විට මොන දේකින් හෝ පහළ වෙන්නට පුළුවනි. මල කියන එක බොහොම ලස්සනයි මේ වගේ මගේ ජීවිතය ලස්සන වෙන්නට ඕනේ. එනම් තමාගේ ජීවිතය ආත්ම දෘෂ්ඨියට මේ මල උපමා කරගන්නවා. එවිට උපාදානය පහළ වෙනවා. මෙයින් කියන්නේ මේ තණ්හාවයි. උපාදානයයි. යන දෙදෙනා එකට බැඳුණු දෙදෙනෙකි. තණ්හාවෙන් උපාදානය ගලවන්නත් බැහැ. උපාදානයෙන් තණ්හාව ගලවන්නත් බැහැ. මේ දෙන්නා කොයි වෙලාවේ කොයි ආකාරයට පහළ වෙනවාද දන්නේ නැහැ. හරියට මැජික්කාරයෝ වගේ තමයි. එක වෙලාවට එක එක විදියට අපේ හිත්වල පහළ වෙනවා. උපාදානය කියන්නේ ඒකයි.

## ix උපාදාන පච්චයා භවෝ

උපාදාන පච්චයා භව කියන විටදී මේ භව කොටස් 2 කට බෙදෙයි. කම්ම භව, උප්පත්ති භව, **අත්ථි කම්ම භවො, අත්ථි උප්පත්ති භවො.** කම්ම භවය යනු කර්මයයි. "**පුඤ්ඤාභිසඞ්ඛාරො, අපුඤ්ඤාභිසඞ්ඛාරො,**

**ආනෙඤ්ජාභිසඞ්ඛාරො, අයං වුච්චති කම්ම භවො”**. දැන් බලන්න උපාදානය කරගත්තේ මොනවාටද? තණ්හාවයි උපාදානය කරගත්තේ. ඒ කුසලයකට නැතිනම් අකුසලයකට, කර්මයකට ය. උපාදානය කිරීම නිසා අපට නැවත පහළ වෙනවා කුසල් නැත්නම් අකුසල්. උදා:- බුදුරජාණන් වහන්සේ අපි දැක්කා එක පාරක් මේ ජීවිතයේ දී. ඉතිං මොකද වෙන්නේ මේ ජීවිතයේ දැක්කා කියලා. බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ලීලාව, බුද්ධ ඓශ්චර්යය දකින විට මගේ හිතේ ඇතිවුනු ශ්‍රද්ධාව අප්‍රමාණයි. මට නැවත නැවත දකින්නට තියෙනවා නම් කොච්චර වටිනාවාද? අන්න නැවත අපි දකින්න හිතනවා. එනම් තණ්හාවෙන් උපාදාන ඇති කරගත්තා. ඒ තුළ අප්‍රමාණ කුසල් පහළ කරගත්තා. ඒ වගේම අකුසල පැත්තෙන් ගත් විට දී අර මුලින් මතක් කළා වගේ මිහිරි ගීතයක් අහනවා පාරේ බස් එකේ දී. නමුත් පස්සේ මේක හොයනවා කොහෙද තියෙන්නේ? කවුද කිව්වේ? හොයාගෙන යනවා. නැවත නැවත අහන්න ඕනේ කියලා. අන්න තණ්හා උපාදානය. ඒ තුළ අකුසල් පහළ වෙනවා. මේ කම්ම භවය යනු තණ්හාවෙහි උපාදානයයි. එය හේතු කරගෙන අපේ හිතේ ඇතිවන කුසල කර්ම ශක්තිය, අකුසල කර්ම ශක්තිය තමයි කම්ම භව කියන්නේ. ධ්‍යාන වඩනවා. ධ්‍යානවලත් මේ කියන දේ තියෙනවා. මොකද හේතුව අපි දන්නවා ධ්‍යන වැඩුවොත් අපිට බඹ ලොව යන්න පුළුවන්. ධ්‍යාන වැඩුවොත් මේ මනුෂ්‍ය ලෝකයේ තියෙන දුක්ඛිත භාවයෙන් ටික කලකට හරි අත්මිදෙන්න පුළුවන්. මේ ධ්‍යාන වැඩුවොත් කාම ලෝකයෙන් ටිකක් හෝ අතමිදිලා සැපෙන්, පහසුවෙන් ඉන්න පුළුවන්. අර ඒ ආශාව හිතේ ඇතිකරගෙන තණ්හාවෙන් උපාදාන ඇතිකරගෙන මේ ධ්‍යාන වඩන්නේ. නැතිනම් අපට ධ්‍යාන වැඩීමේ උවමනාවක් නැහැ. හිත දියුණු කරගන්න ඇතැම් විට භාවනා වඩන්නේ ලෝකයේ ප්‍රසිද්ධ වෙන්න. අනික් අයට මේවා පැහැදිළිව කියලා දෙන්න ඕනේ ලෝකයට. අර ඒ තුළ නොයෙක් අකුසල් සිතුවිලි ගලාගෙන එනවා පිටුපස්සෙන් හෝ ඉදිරියෙන්. මේ කියන කම්ම භවය නම් කුසලාකුසල කර්ම ශක්තියයි.

උප්පත්ති භවය කියලා කියන්නේ ජාතිය. උප්පත්ති භවයයි ජාතියයි කියන දෙක සමානයි. ඒ උපදින ස්ථාන ගැන කියාපානවා උප්පත්ති

භවයේදී. කාම භව, රූප භව, අරූප භව, සඤ්ඤී භව, අසඤ්ඤී භව, නේවසඤ්ඤීනාසඤ්ඤී භව, ඒකවොකාර භව, චතුවෝකාර භව, පඤ්චවෝකාර භව. මේ කියන ස්ථානවලට කියන්නේ උප්පත්ති භව, උපදින ස්ථානය. දැන් කාම භවය කියන විට සතර අපායයි, මනුෂ්‍ය ලෝකයයි, දිව්‍ය ලෝක 6 යි සියල්ල 11 ක් තිබේ.

සතර අපායේ කෙනෙක් උපදිනවා. මෙහි උපදින්නේ අහේතුක ප්‍රතිසන්ධි වශයෙන්. මනුෂ්‍ය ලෝකයේ උපදිනවා ද්විහේතුක වශයෙන්, ත්‍රිහේතුක වශයෙන්. ඔය අතුරතුර නොයෙක් ප්‍රේත කොට්ඨාශ ද්විහේතුක හෝ අහේතුක වෙන්න පුළුවනි.

රූප භවය යනු බ්‍රහ්ම ලෝක 16 යි. බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම යනු ප්‍රථම ධ්‍යාන විපාක භූමි තලයි. පරිත්තාභ, අප්පමාණභ, ආභස්සර ද්‍රුතිය ධ්‍යාන භූමි තලයි. පරිත්ත සුභ, අප්පමාණ සුභ, සුභකිණ්හක, යනු තෘතිය ධ්‍යාන විපාක භූමි තලයි. වේහප්පල, අසඤ්ඤ තලය, අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨක මේ හත ම චතුත්ථ ධ්‍යාන විපාක භූමි තලයි. කෙනෙක් මේ ජීවිතයේ ධ්‍යාන වඩලා ඒ ධ්‍යාන බලයෙන් බඹලොව ඉපදෙන්න පුළුවනි. ප්‍රථම ධ්‍යානයට අනුරූපව ද්‍රුතිය ධ්‍යානයට අනුරූපව, තෘතිය ධ්‍යානයට අනුරූපව, චතුත්ථ ධ්‍යානයට අනුරූපව ඒ ඒ භූමිතලයන්හි උපදී. නමුත් බෞද්ධ නොවන ඇතැම් අය චතුත්ථ ධ්‍යානයට සමවැදිලා සමවතින් නැගිටලා හිතනවා මේ සිතෙන් තොරව ඉන්න පුළුවන් නම් බොහොම හොඳයි කියා, සංඥා විරාග භාවනාව වඩනවා. ඒ සංඥා විරාග භාවනාව වැඩීම නිසා ඒ අය අසඤ්ඤ තලයේ උපදිනවා. යම්කිසි අනාගාමීන් වහන්සේ නමක්, අනාගාමි තත්ත්වයට පත්වෙලා පඤ්ච සුද්ධාවාසයේ උපදින්න පුළුවන්. මේ ආකාරයට පැහැදිලි කරගත යුතුයි සඤ්ඤී භව, අසඤ්ඤී භව, නෙවසඤ්ඤීනාසඤ්ඤී භව. අසඤ්ඤී භව යනු අසඤ්ඤතලයයි. නේවසඤ්ඤීනාසඤ්ඤී භව යනු නේවසඤ්ඤානාසඤ්ඤා භවයයි. අරූපී භව යනු සතර අරූපී තලයයි. ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන හිත විතරයි තියෙන්නේ රූපය නැහැ. මේ කියන භූමි 31 බෙදන්න පුළුවන් සංඥා

භව ලෙස භූමි තල 29, එනම් අසංඥ්ඥ තලය යනු රූප ස්කන්ධය පමණක් ඇති භවයයි. නේවසඥ්ඥා-නාසඥ්ඥායතනය යනු සංඥාව ඇත්තෙත් නැති නැත්තෙත් නැති භවයයි. තවද "ඒක වෝකාර භව, චතු වෝකාර භව, පංච වෝකාර භව" ලෙස බෙදයි. ඒක වෝකාර යනු එක් ස්කන්ධයක් ඇති භවයයි. චතු වෝකාර යනු ස්කන්ධ 4 ක් ඇති භවය, පඤ්ච වෝකාර යනු ස්කන්ධ 5 ම තියෙන භවය. දැන් අසඥ්ඥ තලයේ තියෙන්නේ රූපස්කන්ධය පමණයි, ඒක වෝකාර භවයක්. අරූපී තල 4 හි නාමස්කන්ධ විතරයි, චතුවෝකාර භවයයි. මේ භව 5 හැර ඉතිරි 26 ම පඤ්ච වෝකාරය, පඤ්ච ස්කන්ධයම පවතී. මේ උපදින ස්ථානයටයි අපි කියන්නේ භව පච්චයා ජාති කියලයි.

## x භව පච්චයා ජාති

බුදුරජාණන් වහන්සේ මේ ජාතිය තෝරනවා. "**යං තෙසං තෙසං සත්තානං තම්හි -පෙ-**" ජාතිය කියලා කියන්නේ ඒ ඒ සත්ත්වයන්ටත්, ඒ ඒ සත්ත්ව නිකායට අනුරූපව ඉපදීමයි. පහළවීමයි. **සඤ්ජාතිය** පහළවීමයි. **ඔක්කන්ති** - බැස ගැනීමයි. මවුකුසකට සත්ත්වයෙක් බැස ගන්නවා සාමාන්‍ය කෙනෙක් මවු කුසේ හටගන්නවා. ජාතිය. සඤ්ජාතිය යනු ඕපපාතික ලෙස පහළවීම. ඔක්කන්ති මවු කුසයට, බිත්තරයකට සත්ත්වයකේ බැසගන්නවා. බිත්තරයකට සත්ත්වයෙක් බැසගත්තත් කාලයක් එය පවතිනවා. එහි ශක්තිය පවතිනවා. ඊට පසුවයි එළියට පැමිණෙන්නේ සත්ත්වයෙක් විදියට. දරුවෙකුත් එහෙමයි. මවු කුසේ පිළිසිඳ ගත්විට උපරිම මාස 9 ක් 10 ක් ඉඳලා තමයි එළියට ගමන් කරන්නේ. **අභිනිබ්බත්ති** කියන්නේ පහළවීම. "**ඛන්ධානං පාතුභාවො**" ස්කන්ධයන්ගේ පහළවීම ප්‍රතිසන්ධි අවස්ථාවේ ම එක එක සත්ත්වයන්ට අනුරූපව වෙනස් ය. ප්‍රතිසන්ධි අවස්ථාවේදී ම පඤ්ච ස්කන්ධය පහළවෙනවා. රූපස්කන්ධයේ කොටසක් ඇතැම් සත්ත්වයන්ට අරූපී තලවල පහළ වන්නේ නාම ස්කන්ධය පමණි. අසඥ්ඥ තලයේ පහළ වන්නේ රූප ස්කන්ධය පමණී. මෙය ස්කන්ධයන්ගේ පහළවීමයි. "**ආයතනානං පටිලාභො**" ආයතනයන්ගේ ලැබීමයි. දැන් ප්‍රතිසන්ධි අවස්ථාවේ පහළ වන ආයතන නම්, මනායතනය, ධම්මායතනය හා

කායායතනයන් වේ. නමුත් අනෙක් රූප තිබුණාට ආයතන වශයෙන් ගැනීමට නොහැකි වේ. මනුෂ්‍ය ලෝකයේ ඕපපාතික සත්ත්වයෙක් පහළවන විට මේ සියලුම ආයතන සමඟ පහළ වෙනවා. දිව්‍ය ලෝකයේත්, බ්‍රහ්ම ලෝකයේත් එහෙමයි. බ්‍රහ්මරාජයන් තුළ ඝාන, ජිව්හා, කාය, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ ආයතන නැහැ. අරූපී තලය ගත්විට මනායතනයි, ධම්මායතනයයි පමණි ඇත්තේ. අසඤ්ඤ තලයේ රූපායතනයයි, ධම්මායතනයයි පමණි. මේ ආකාරයට සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි සිත පහළවීම, පඤ්ච ස්කන්ධය පහළවීම, ඉපදීම, ආයතන ඇතිවීම, ලැබීම තමයි අපි ජාතිය කියලා කියන්නේ.

## xi ජාති පච්චයා ජරා මරණං

"**තත්ථ කතමං ජාති පච්චයා ජරා මරණං? අත්ථි ජරා, අත්ථි මරණං**" ජාතිය නිසා තමයි ජරාව මරණය කියන එකයි අපට සිද්ධවෙන්නේ. මේ ජරාව කියන්නේ කුමක්ද? "**යා තෙසං තෙසං -පෙ-**" ජරාව කියන්නේ අපේ මේ පඤ්ච ස්කන්ධය ජරාවට පත්වෙනවා, දිරනවා, කැඩි කැඩී යනවා, පැළි පැළී යනවා. මෙලෙස ක්‍රම ක්‍රමයෙන් ගෙවි ගෙවී, විනාශ වෙවී විනාශ වෙවී, යන එකට තමයි ජරාව කියන්නේ. මේ ජරාව රූප ජරා, නාම ජරා ලෙස කොටස් 2 කට බෙදිය හැක. රූප ස්කන්ධයේ ඇතිවන දිරීම රූප ජරාවයි. නාම ස්කන්ධයේ උප්පාද, ඨිති, භංග වශයෙන් වන දිරීම නාම ජරාවයි. රූප ස්කන්ධයේත් එහෙමයි. දැන් අපේ රූපයක් පහළ වුනොත් චිත්තක්ෂණ 17 ක් ආයු විඳලා එය භංග වෙනවා. එහෙම නම් මේ රූපයන්ගේ ජරාව රූප ස්කන්ධය ක්ෂණයක් ක්ෂණයක් පාසාම, මොහොතක් මොහොතක් පාසාම, මේ නාම රූපත් විනාශයට පත්වෙනවා. එය විදර්ශනා භාවනාවෙන් අපට දකින්න පුළුවන්. නමුත් සාමාන්‍යය මනසින් අපට මෙය දකින්න බැහැ. සාමාන්‍ය මනසින් අපි දකිනවා නම් ළමා කාලයේ තිබුණු ස්වරූපය නොවේ ටිකක් තරුණ වන විට, එනම් අවුරුදු 20 - 30 වන විට තිබුණු රූපය නොවෙයි 40 - 50 වන විට මේ රූපය ක්‍රම ක්‍රමයෙන් වෙනස්වෙලා යනවා. වයසට යනවා. විනාශයට යනවා. මේක තමයි ජරාව කියන්නේ. අපි ඉපදුනු නිසයි මේ

ජරාව ලැබුණේ. ඉපදුනේ නැත්නම් මේ ජරාව ලැබෙන්නේ නැහැ. ඊළඟ මරණය ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව නිකායවල චුතවීමක්, **අන්තරධානං** - අතුරුදන් වීමක්, **චවනතා** - චුතවීමක්, **භෙදො** - බිඳීමක්, **මච්චු මරණං** - මරණයට පත්වීමක්, **කාලකිරියා** - කළුරිය කිරීම එනම් කාලය ඉක්මවීමෙන් වන මරණයයි. **ඛන්ධානං භෙදො** - මේ ස්කන්ධයන්ගේ බිඳීමක් **කලෙබරස්ස නික්ඛෙපො** - මෘත ශරීරයෙන් බැහැරවීමක්, **ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො** - මේ ජීවිත ඉන්ද්‍රියාගේ සිඳීමක් වෙනවා නම් ඒ තමයි මරණය. මරණය නම්, රූපය මරණයට පත්වීම, නාමය මරණයට පත්වීමයි. රූප ජීවිත ඉන්ද්‍රිය නාම ජීවිත ඉන්ද්‍රිය වශයෙන් ප්‍රධාන කොටස් 2 ක් තිබේ. මේ රූපය පාලනය කරන්නේ රූප ජීවිත ඉන්ද්‍රියෙනි. නාමය පාලනය කරන්නේ නාම ජීවිත ඉන්ද්‍රයෙනි. මේ කයෙන් සිත වෙන්වුනා නම්, බැහැරවුනා නම්, නාම ජීවිත ඉන්ද්‍රිය බැහැරවුනා නම්, රූප කයට පවතින්න පුළුවන් කමක් නැහැ. එහෙනම් මේ සිත වෙන්වුනා කියන්නේ රූප ජීවිත ඉන්ද්‍රියයත් වෙන්වෙලා ගියා. රූප ජීවිත ඉන්ද්‍රිය කර්මජ රූපයක් මේ සිතත් සමඟ බැඳිලා තියෙන්නේ. සිත පහ වෙන්නේ යම් වෙලාවක ද, කර්මජ රූප නූපදින්නේ යම් තැනක ද, ජීවිත ඉන්ද්‍රිය රූපය උපදින එක නවතිනවා. සිත බැහැර වෙනවා නම් කයින් ඒ වෙලාවේම මේ රූපයත් බැහැර වෙනවා. මරණය කියන විට රූප මරණය, නාම මරණය. ප්‍රධාන වශයෙන් මේ පඤ්ච ස්කන්ධය තුළ නාම කය ඉවත්වුනා නම්, මරණයට පත්වුනා. නාම ජීවිත ඉන්ද්‍රිය විනාශ වුනා නම් රූප ජීවිත ඉන්ද්‍රියත් එදාට විනාශ වෙනවා. ජීවිත ඉන්ද්‍රිය විනාශ වීමයි මරණය. මරණය කියන එක ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිවෙනවා. සම්මුති වශයෙන් මරණය ඇතිවෙනවා. එනම් **ආයුක්ඛය, කම්මක්ඛය, උභයක්ඛය, උපච්ඡෙදයක්ඛය** වශයෙන් බෙදෙනවා. ආයුෂය ගෙවීමෙන් මරණයට පත්වෙනවා. කර්මය ගෙවීමෙන් මරණයට පත්වෙනවා. ආයුෂය-කර්මය දෙකම ගෙවීමෙන් මරණයට පත්වෙනවා. ඒ අතරතුර උපදින අකුසල කර්ම නිසා අතරතුර මරණයට පත්වෙනවා. කෙසේ හෝ ජරාවයි මරණයයි කියන එක අපට ලැබුණේ ජාතිය නිසයි. රූප-ජාතිය රූප ස්කන්ධය, නාම-ජාතිය සංස්කාර

ස්කන්ධය. ස්කන්ධ වශයෙන් ගත් විට රූප-මරණය රූප ස්කන්ධය, නාම-මරණය සංස්කාර ස්කන්ධය. රූපායතනයයි ධම්මායතනයයි මේ විදියට පරමාර්ථ වශයෙන් බෙද බෙදා දකින්න පුළුවන්. මේ ජාති, ජරා, මරණත් සමඟ අපට පහළ වෙනවා. නැවත ඒ අතරතුර මරණය කියන එක ක්‍ෂණයක් පාසා ඇතිවන සම්මුති මරණයට යන්නේ නැතිව, පරමාර්ථ මරණයට යන විට මේ අතරතුර ශෝක, පරිදේව ඇතිවෙනවා. දුක, දෝමනස්සය, උපායාසය ඇතිවෙනවා. ශෝකය - ශෝකයක් ඇතිවෙන්නේ කොහොමද? දේශනාවේ සඳහන් වෙනවා " **ඤාතිව්‍යසනෙන, රොගව්‍යසනෙන, භොගව්‍යසනෙන, සීලව්‍යසනෙන, දිට්ඨිව්‍යසනෙන"** තමන්ගේ ඥාතීන්ගේ විනාශයක්, ව්‍යසනයක්, කරදරයක් නිසා අපේ හිතේ ශෝකය හටගන්නවා. රෝගයක් තමන්ට ඇතිවුනා නම්, ඒ රෝගය නිසා තමන් ශෝක වෙනවා, ව්‍යසනයට පත්වෙනවා. තමන්ගේ උපභෝග පරිභෝග සම්පත්වල විනාශය, හානිය නිසා ශෝකය හටගනී. ශීලයට යම්කිසි හානියක්, කරදරයක්, බාධාවක් වුනා නම්, තමන්ගේ සිතේ ශෝකය හටගන්නවා. දිට්ඨි - තමන් ගත් වැරදි අවබෝධයක් නිස, වැරදි ග්‍රහණයක් නිසා තමන් ශෝක වෙනවා. වැරදි දැක්මක් නිසා ශෝක වෙනවා. මේ කියන වේලාවල සිතේ ඇතිවෙන ශෝකය යනු සිතේ ඇතිවන දෝමනස්ස වේදනාවයි. මෙය ද්වේශ සහගත වේ. ශෝකය හටගන්නේ ද්වේශ සහගත සිත් සමඟයි. දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සිත් සමඟයි. **අඤ්ඤතරඤ්ඤතරෙන** - යම් කිසි කරුණක් නිසා අපේ සිතේ ඇතිවෙනවා නම්, ශෝකයක්, වේදනාවක් එය තමයි **අන්‍තො සොකො, අන්‍තොපරි සොකො** - ඒ ඇතුළේ හටගත් ශෝකය, ශෝක ස්වභාවය, උල් සහිත ශෝකය, හුලක් වාගේ ඇතිවන ශෝකය තමයි ශෝකය. **දොමනස්සො සොකසල්ලං** යනු එයයි. දෝමනස්ස යනු ශෝකයයි. හුලක් නමැති ශෝකයයි. මේ කියන ශෝකය අපට ඇතිවුනේ ඇයි? ඉපදුන නිසයි. ජාතිය සමඟ, ජරාව සමඟ, මරණය සමඟ අපට මේ ශෝකය ගලාගෙන එනවා.

## xii තත්‍ථ කතමො පරිදෙවො

ඊළඟට පහළ වෙනවා පරිදේවය. මේ යට ඇතිවුන ශෝකය ඉවසාගන්න බැරිව පිටට ගලාගෙන එනවා. අඬා වැළපෙනවා. පරිදේවයයි. සිතට යම්කිසි පීඩාවක් වේදනාවක් ආවානම් මේ වේදනාව දරාගන්න බැරිව උපරිම ඇවිල්ලා කඳුළුවලින් එළියට එනවා, නැතිනම් මුවින් වචන පිටවෙලා එළියට එනවා, දරාගන්න බැරිව පරිදේවය. ශෝකය හටගත්තේ යම්කිසි කරුණක් නිසා ද, ඥාති නිසා, භෝග නිසා, දිට්ඨි නිසා, රෝග නිසා, සීලය නිසා, යම්කිසි හේතුවක් නිසා ද ඒ ආකාරයටම තමයි මේ කියන පරිදේවය හටගන්නේ. පරිදේවය හටගන්නෙත් අපි ඉපදුන නිසයි.

දුක්ඛං - දැන් සිදුවන්නේ කායික දුක. "**කායිකං අසාතං කායිකං දුක්ඛං - පෙ -** " මේ ශෝකයයි පරිදේවයයි දෙක එකට එකතු වී මේ කයට පුදුමාකාර වේදනාවක්, ඇතැම් විට කයට පහර දෙනවා, පොළොවේ ගසාගන්නවා දරාගන්න බැරිව. ඒ වාගේ පුදුමාකාර වේදනාවක් අපි විඳිනවා. මේ කයට වේදනාවක් දෙනවා. මේ කයට ඇතිවන දුක්ඛ ස්පර්ශය, කයට ඇතිවන දුක්ඛ ස්වභාවය, මේ කායික දුක තමයි මෙහි දී **දුක්ඛං** ලෙස සැලකෙන්නේ. මෙතැන දී පමණක් නොව අපට හැම වෙලාවේ දී ම කායික දුක ඇතිවෙන්න පුළුවන්. මේ කායික දුකත් සමඟ ශෝකය හටගන්න පුළුවන්. කායික දුකත් සමඟ පරිදේවය හටගන්න පුළුවන්. මේවා වෙනස් වෙවී පිළිවෙලට නොවී මතුවෙන්නත් පුළුවන්. කෙනෙක් අපිට පහර දෙනවා. එවිට කයට පුදුමාකාර වේදනාවක් ඇතිවේ. මේ වේදනාව නිසා හිතේ පුදුමාකාර ශෝකයක් ඇතිවේ. මේ ශෝකය නිසා අපි අඬා වැළපෙනවා. මෙය කායික දුක හේතුවෙනි.

## xiii තත්‍ථ කතමා දොමනස්සං

දෝමනස්සය - මානසික දුක. මේ කායික දුකත් සමඟ හිතේ ඇතිවන මානසික දුක තමයි දෝමනස්සය කියන්නේ. එනම් මානසික

දුක තමයි ශෝකය,පරිදේවය, උපායාසය. හිතට ඇතිවන වේදනා, දරාගන්න බැරි වේදනාව තමයි දෝමනස්සය.

උපායාසය - හිතේ ඇතිවුන පුංචි ශෝකය කඳුළු බවට පත්වෙලා අඬා වැළපෙන විට එය පරිදේවය වේ. මේ අඬලා අඬලා මේ දුක දරාගන්න බැරිවන විට සිහිය නැතිව වැටෙනවා. එය තමයි උපායාසය. මිය ගිය පුතෙක් වෙනුවෙන් "මගෙ රත්තරං පුතේ" කියමින් බැගෑපත් වෙලා පුදුමාකාර ආයාචනයක් කරනවා දෙමාපියො වශයෙන්. නැතිනම් මවු නැතිවූ විට දරුවෝ ආයාචනයක් කරනවා. එහෙම කියමින් සිහිය නැතිව වැටෙනවා. එනම් උපරිම ශෝකය, උපරිම තත්ත්වයට ගියා. එනම් උපායාසයයි. උපායාසය ඇතිවෙන්නෙත් ඥාති ව්‍යසන, භෝග ව්‍යසන, රෝග ව්‍යසන, සීල ව්‍යසන, තමන් ගත් වැරදි අවබෝධයක් නිසා ඇතිවෙන්න පුළුවන්. උපමාවක්:- වතුර උණු කරන විටදී වතුර උණුවෙන ස්වභාවය ගනිමින් පුංචි හඬක් ඇතිවේ. 'සූ' නමින් මේ හඬ සමඟ බුබුළු දමන්න පටන් ගනී. හොඳට වතුර පැහෙන විටදී බුබුළු වැඩිවෙලා පිටට උතුරන්න පුළුවන්. අන්න ඒ වාගේ තමයි මුලින් ඇතිවෙන 'සූ' ගාන ස්වභාවය තමයි ශෝකය. වතුර උඩට බුබුළු දමා මතුවන ගතිය තමයි පරිදේවය. එය පිටාර ගලාගෙන ගොස් හිස් වෙන්නත් පුළුවන් වතුර භාජනය. මෙය තමයි උපායාසය.

මේ විදිහට තමයි බුදුරජාණන් වහන්සේ අපට **"එව මෙ තස්ස කෙවලස්ස - පෙ -"** මේ විදියට තමයි දුක කියන එක හටගන්නේ. **"එව මෙ තස්ස කෙවලස්ස දුක්ඛඛන්ධස්ස සමුදයො හොති - පෙ - "** මේ කියන හැමෝගෙම එකතුව නිසා, සමාගම නිසා, හටගැනීම නිසා තමයි අපට මේ දුක කියන එක පහළ වෙන්නේ. අපට දුකක් පහළ වෙන්නට නම් එක හේතුවක් නොවේ හේතු ගණනාවක් එකට බැඳිලා තියෙනවා. එනම් හේතු ගණනාවක්, සමුදායක් එකට එකතුවෙලා තමයි මේ දුක හටගෙන තියෙන්නේ. එනම් මේ හැම දෙයකටම ගත් විට අවිද්‍යාව නිසා සංස්කාර, සංස්කාර නිසා විඥාන, විඥාන නිසා නාම රූප, නාම රූප නිසා සළායතන, සළායතන නිසා ඵස්ස, ඵස්ස නිසා වේදනා,

වේදනා නිසා තණ්හා, තණ්හා නිසා උපාදාන, උපාදාන නිසා කම්ම භව, කම්ම භව නිසා උප්පත්ති භව, උප්පත්ති භව සමඟ ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන මේ හැම දෙයක්ම අපට ලැබිලා තියෙනවා. මෙහිදී මාතෘකා පද විස්තර කරමින් අර්ථ තෝරාගැනීමයි සිදු වුනේ.

බුදුරජාණන් වහන්සේ මේ පටිච්ච සමුප්පාදය බෙදා වෙන්කර දක්වනවා. හේතු වශයෙන්, කාල වශයෙන්, සන්ධි වශයෙන්, සංක්ෂේප වශයෙන්, අර වශයෙන්, වට්ට වශයෙන් පැහැදිළි කර තිබේ. අට්ඨ කථාවේත් මේ ගැන පැහැදිළි කරනවා. ඉන්පසු අභිධර්ම දේශනාවට අනුව පැහැදිළි කරගත යුතුයි.

මේ දැක්වුනේ සූත්‍රාන්ත ක්‍රමය, සූත්‍රවල විග්‍රහ කරගෙන ආ පිලිවෙලයි. අභිධර්ම භාවිතයේ දී තරමක් වෙනස්. එකම කරුණු ගොඩක් එකම තාලයට දැක්වේ.

සාදු! සාදු! සාදු!

# දෙවන දේශනාව

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

"තත්‍ථ තයො අද්ධා ද්වාසංගානි වීසතාකාරා තිසන්‍ධි චතු සංඛෙපං තීනි වට්ටානි ද්වෙමූලානි ච වෙදිතබ්බානීති'ති"

ශ්‍රද්ධාවන්ත, වාසනාවන්ත පින්වතුනි,

තථාගත බුදුපියාණන් වහන්සේ විසින් අපට අර්ථ විග්‍රහයක් කරදුන් පටිච්ච සමුප්පාද පරම ගම්භීර අර්ථ විග්‍රහයට අනුව, අද දවසේ දී අප බලාපොරොත්තු වෙනවා පටිච්ච සමුප්පාද ද්වාදසාංග (අංග දොළස) කොටස්වලට බෙද බෙදා, අර්ථ හසුරුවාගන්නේ කෙසේද යන්න පිළිබඳව.

බුදුරජාණන් වහන්සේ ප්‍රධාන වශයෙන් අපට මාතෘකා ටික ඉදිරිපත් කළා. මේ මාතෘකා පද අනුව අට්ඨකථාචාරීන් වහන්සේලා, ඒ වාගේම නොයෙක් තැන්වල බෙද බෙදා ගැඹුරින් විස්තර කර තිබේ. මේ සියල්ලම තථාගත දේශනාවන් ලෙස සැළකේ. එසේ සැළකීමට හේතුව නම්, ධම්මසංගණිප්‍රකරණ අට්ඨකථාවේ සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේ දහවල් දානය වැළඳීමෙන් පසු, භුක්තානුමෝදනා ධර්ම දේශනා වශයෙන් දීඝ නිකාය, මජ්ඣිම නිකාය තරම් ධර්ම සම්භාරයක් දේශනා කොට තිබේ. සවස් කාලයේදී සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය තරම් ධර්ම සම්භාරයක් දේශනා කොට තිබේ. ඒ අනුව දිනපතා ම මෙය සිදුවී තිබේ. එනම් බුදුරජාණන් වහන්සේ යම්කිසි මාතෘකාවක් හෝ සූත්‍ර දේශනාවක් ඉදිරිපත් කළ සේක් ද, ඒ පිළිබඳව අර්ථ විග්‍රහයක් ද කර තිබෙන බවයි. නමුත් අද අපට ත්‍රිපිටකයේ දක්නට ලැබෙන්නේ බුදුරජාණන් වහන්සේගේ මූලික සූත්‍ර දේශනාව පමණී. තථාගතයන් වහන්සේගේ අර්ථ විග්‍රහය පැමිණ නැත. ඒ අනුව අට්ඨ කථා ඉතිහාසය ගැන සඳහන් කිරීමේ දී පළමුවැනි අට්ඨ කථාව මහා අට්ඨ කථාව ලෙස සැලකේ. අතීතයේ ලියැවුණු පළවෙනි අට්ඨ කථාවයි. මහා අට්ඨ කථාව

ලිවීම ආරම්භ කොට ඇත්තේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ කාලයේ සිටයි. එනම් බුදුරජාණන් වහන්සේගේ ශාසන කාලයේ සිටයි. මෙයින් අපි තේරුම් ගත යුත්තේ තථාගතයන් වහන්සේ එදා දේශනා කළ දේශනාවත්, සූත්‍ර මාතෘකාවත්, තථාගතයන් වහන්සේ විසින් කරන ලද අර්ථ විග්‍රහයෙන්, මුඛ පරම්පරාවෙන් පැමිණ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ පටන් මහා අට්ඨ කථාව ලියැවුණු බවයි.

ඒ මහා අට්ඨ කථාව ක්‍රම ක්‍රමයෙන් ලියැවී ලංකාවට පැමිණියා. ඒ වන විට කුරුන්දිය අට්ඨ කථාව, මහා පච්චරිය අට්ඨ කථාව, අන්ධක අට්ඨ කථා, සංක්ෂේප අට්ඨ කථා, නමින් අට්ඨ කථා 5 ක් ද, අතීතයේ පටන් ලියැවී තිබුණි. එනම් මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වඩින විට දී සමහරක් අට්ඨ කථාව රැගෙන විත් තිබූ බවයි. ඒ අට්ඨ කථාවන් සියල්ලක් ශුද්ධ කොට බුද්ධඝෝෂ ස්වාමීන්වහන්සේ පාලි භාෂාවට සකසන ලදී. මෙයින් අප තේරුම් ගත යුත්තේ අට්ඨ කථාවල තියෙන අර්ථ විග්‍රහයන් බුදුරජාණන් වහන්සේගේත්, මහා ශ්‍රාවකයන් වහන්සේලාගේත්, මහ රහතන් වහන්සේලාගේත් ඇසුරට භාජනය වූ වචන බවයි. එබැවින් අට්ඨ කථාව ප්‍රතික්ෂේප කළ නො හැකිය.

මාතෘකා කරගත් ඉහත පාඨය ඇතුළත් වනුයේ අභිධර්මාර්ථ සංග්‍රහයේය. අභිධර්ම සංග්‍රහය ලියැවුණේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ අතිනි. අනුරුද්ධ ස්වාමින් වහන්සේ දකුණු ඉන්දියාවෙන් පැමිණි අයෙකි. උන්වහන්සේ ලංකාවට පැමිණ මෙහි ගතකළ කාල සීමාවේ දී මෙය ලියවුණි. බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ද දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණ කටයුතු කළ අයෙකි.

පටිච්ච සමුප්පාදය කොටස් වශයෙන් බෙදිය හැකිය. කාල වශයෙන් කොටස් 3 කට බෙදිය හැක. එනම් අතීත, වර්තමාන, අනාගත වශයෙනි. පටිච්ච සමුප්පාදයේ අංග දොළසකි.

| | | |
|---|---|---|
| **අවිජ්ජා පච්චයා සංඛාරා** | - | **අතීත භවය** |
| **විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, කම්ම භව** | - | **වර්තමාන භවය** |
| **උප්පත්ති භවය හෙවත් ජාති, ජරා, මරණ** | - | **අනාගත භවය** |

මෙහිදී අප තේරුම් ගත යුත්තේ පළමු වැනි අතීත ආත්මයේ අවිජ්ජාවත්, සංඛාරත් නිසා අපට මේ ජීවිතයේ ප්‍රතිසන්ධි විඤ්ඤාණ ප්‍රධාන කොට විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, කම්ම භව, සමඟ විපාක විඳිමින්, හා එකතු කරමින් සිටිනවා. මේ එකතු කරගන්නා දේ නිසා නැවත අපට උප්පත්ති භවයක්, ජාතියක්, ජරාවක්, මරණයක්, ශෝකයක්, පරිදේවයක්, උපායාසයක්, දුක්ඛ දෝමනස්සයක් ඊළඟ ජීවිතයේ දී ලැබේ. දෙවැනි අතීත ජීවිතයේ රැස් කරගන්නා ලද අවිද්‍යා සහ සංඛාර නිසා පෙර ආත්මයේ විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, කම්ම භව සියල්ල විපාක විඳිමින් රැස් කරගත්තා. ඒ ජීවිතයේ රැස් කරගන්නා ලද කර්ම ශක්තිය නිසා මේ ජීවිතයේ දී උප්පත්ති භවය ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස යනා දී සියල්ල ලැබී තිබේ. මේ ජීවිතයේ අවිද්‍යා සහ සංඛාර නිසා ඊළඟ ජීවිතයේ දී විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, කම්ම භව ලැබේ. එබැවින් දෙවැනි අනාගත ජීවිතයට උප්පත්ති භවය, ජාති, ජරා, මරණ ඇතිවේ. මේ කියන ආකාරයට භව 3 කට බෙදා දැක්වුවත්, අතීත භව, වර්තමාන භවය, අනාගත භවය, දෙවන අතීත භවය, වර්තමාන භවය. මේ වර්තමාන භවය පළමු වැනි අනාගතයට, දෙවන අනාගතය යනාදි ලෙස බෙදා දක්වන විට මේ පටිච්ච සමුප්පාද අංග සියල්ලක්ම සෑම භවයකට සම්බන්ධයි.

මේ ද්වාදස අංග ත්‍රි සන්ධි වශයෙන් දැක්වේ. සන්ධි-විසන්ධි. විසන්ධිවීම යනු වෙන්වීම. සන්ධි යනු සම්බන්ධවීමකි. අංග 12 අතර සන්ධි වන ස්ථාන 3 ක් පවතී.

සංඛාර පච්චයා විඤ්ඤාණං - සංඛාර අතීත භවයේ කර්ම ශක්තිය. සංඛාර නිසා මේ ජීවිතයේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයට සම්බන්ධ වේ. අතීත භවය එක්වන අවස්ථාවකි. මෙය හේතු - ඵල ලෙස දැක්වේ. අතීත හේතු නිසා වර්තමාන ඵලය. සංඛාර හේතුව නිසා විඤ්ඤාණ ඵලය. හේතු - ඵල සන්ධියයි.

ඵල - හේතු සන්ධියඃ වේදනාව නිසා තණ්හාව. වේදනාව යනු අපි මේ ජීවිතයේ විඳින ඵලයකි. මේ වේදනාව නිසා නැවත තණ්හාව එකතු කරගන්නවා. වේදනා ඵලයෙන් තණ්හා හේතුව ඵල හේතු සන්ධියයි.

කම්ම භවය - ජාතියට නැතිනම් උප්පත්ති භවයට. එතැන නැවත හේතු - ඵල සම්බන්ධයකි. කර්මය රැස් කරගත් හේතුව නිසයි ඵලය ඇතිවන්නේ. මෙය හේතු - ඵල සන්ධියයි. මේ අනුව සන්ධි වශයෙන් 3 කි. එනම්; හේතු - ඵල සන්ධිය, ඵල - හේතු සන්ධිය, හේතු - ඵල සන්ධිය වශයෙනි. සමාන බවක් ඇති මුත් අර්ථ විග්‍රහයේ දී වෙනස් බවක් තිබේ.

**හේතු - ඵල = සංඛාර පච්චයා විඤ්ඤාණං**

**ඵල - හේතු = වේදනා පච්චයා තණ්හා**

**හේතු - ඵල = භව පච්චයා ජාති (භවය කොටස් 2 කට බෙදේ.)**

චතුර්විධ සංක්‍ෂේපය - සංක්‍ෂේපය යනු බෙදා දක්වනු ලැබූ කොටස් 4 කි. අවිද්‍යාව නිසා සංස්කාරය හටගන්නවා. එය එක් සංක්‍ෂේපයකි. විඤ්ඤාණ, නාම රූප, ඵස්ස, වේදනා එක් සංක්‍ෂේපයකි. මේ හතර තමයි වීසිති ආකාරයට බෙදා දක්වනු ලබන්නේ. එනම්, හේතුවක් නිසා ඵලය, ඵලයක් නිසා හේතුව යන ආකාරයටයි. අවිද්‍යාව නමැති හේතුව නිසා සංඛාරය නමැති ඵලය හටගත්තා අතීත භවයේ. මෙය එක් සංක්‍ෂේපයකි. අවිද්‍යාවයි සංස්කාරයයි යන දෙකම හේතු කරගෙන විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා කියන ඵල 5 ලැබුණා මේ ජීවිතයේ දී. මෙය දෙවන සංක්‍ෂේපයයි. මේ වේදනාව නිසා නැවත ඇතිවෙනවා තණ්හා, උපාදාන, කම්ම භව. මේ තුන්වන සංක්‍ෂේපයයි. ඒ ඵල නිසා නැවත හේතු, මේ හේතු නිසා නැවත උප්පත්ති භව, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, ආදිය ලැබේ. එනම් ඵලය, හේතුවක් නිසා ඵලය. ඵලය නිසා හේතුව. නැවත හේතුවක් නිසා ඵලය. නැවතත් අතීත හේතු 2 ක් තිබේ. ප්‍රධාන වශයෙන් අවිද්‍යා සංස්කාර. මෙය එක් සංක්‍ෂේපයකි. ඒ හේතු නිසා වර්තමාන ඵල 5 ක් ලැබේ. එය දෙවන සංක්‍ෂේපයයි. මේ වර්තමාන ඵල 5 නිසා නැවත හේතු 3 ක් සැදේ. මෙය තෙවන සංක්‍ෂේපයයි. මේ හේතු 3 නිසා නැවත ජාති ආදි ඵල ලැබේ. මෙය හතරවන සංක්‍ෂේපයයි.

## චතුර්විධ සංක්ෂේපය

1. අවිද්‍යාව නිසා සංස්කාරය - (අතීත හේතු 2)
2. විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා - (වර්තමාන ඵල 5)
3. තණ්හා, උපාදාන, කම්ම භව - (හේතු 3)
4. උප්පත්ති භව, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස

මෙම සංක්ෂේප 4 වීසති ආකාරයට බෙදා දක්වයි.

**අතීතෙ හෙතවො පඤ්ච ඉදානි ඵල පඤ්චකං**

**ඉදානි හෙතවො පඤ්ච ආයතිං ඵල පඤ්චකං**

**අතීතෙ හෙතවො පඤ්ච** - අතීතයේ වූ හේතු 5 ක් නිසා

**ඉදානි ඵල පඤ්චකං** - වර්තමානයේ ඵල 5 ක් ලැබේ.

**ඉදානි හෙතවො පඤ්ච** - මේ වර්තමාන හේතු 5 ක් නිසා

**ආයතිං ඵල පඤ්චකං** - අනාගතයේ ඵල 5 ක් ලැබේ.

මෙය ඉතාමත් නිවැරදිව හඳුනාගත හැකි ක්‍රමයකි.

අවිද්‍යා, තණ්හා, උපාදාන, සංඛාර, කම්ම මේ 5 අතීත හේතු 5.

අතීත හේතු 5 නිසා වර්තමාන ඵල 5 නම්;

විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා.

මේ වේදනාව නිසා නැවතත්, අවිද්‍යා, තණ්හා, උපාදාන, සංඛාර, කම්ම යන වර්තමාන 5 ක් සෑදේ. මේ හේතු 5 නිසා අනාගතයේ විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා ලැබේ.

අවිද්‍යා කියන විට දී, අවිද්‍යාව යටතේ තණ්හා උපාදාන තිබේ. සංඛාර කියන විට දී, සංඛාර යටතේ කම්ම භව තිබේ. මේ නිසා අවිද්‍යා සංඛාර කියන අතීත සංක්ෂේපය තුළ හේතු සංක්ෂේපය කොටස් 5 කට බෙදනවා. අවිද්‍යාව යටතේ තණ්හා, උපාදාන සමඟ 3 ක්, සංඛාර, කම්ම භව සමඟ 2 ක් සියල්ල 5 යි. එනම් අතීත හේතු 5 සෑදුණු අයුරුයි.

අවිද්‍යා, සංඛාරය නිසා වර්තමානයේ විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා ලැබුණා. මෙය පැහැදිළි කරුණකි. මෙය තමයි **ඉදානි ඵල පඤ්චකං** - මේ වර්තමානයේ ලැබුණු ඵල 5 යි.

**ඉදානි හෙතවො පඤ්ච** මේ වර්තමාන හේතු 5 ක් ගැන, එනම් වේදනාව නිසා තණ්හා උපාදාන, කම්ම භවය, තණ්හා උපාදානයත් සමඟ අවිද්‍යාව බැඳී තිබේ. කම්ම භවය සමඟ සංඛාර බැඳුණා. මේ ආකාරයටයි 5 සැදෙන්නේ. වචන මාර්ගයෙන් ආවාට මේවා එකට ගලපලායි තිබෙන්නේ. තණ්හා, උපාදාන සමඟ ලැබෙණුයේ අවිද්‍යාවයි. අවිද්‍යාව නැතිනම් තණ්හා, උපාදාන පහළ වෙන්නෙත් නැත. අවිද්‍යාව පහළවූවා කියන්නේ තණ්හා, උපාදාන එතැන තිබේ. තණ්හා, උපාදාන පහළවූවා යන්නෙන් අවිද්‍යාව එතැන තිබේ. කම්ම භවය පහළවූවා යන්නෙන් සංඛාර පවතී. සංඛාර පහළවූවා නම් කම්ම භවය එතැන පවතී. පටිච්ච සමුප්පාද අංග 12 අනුව අවිද්‍යා සංඛාර කියන විට හේතු 5 ක් එතැන තිබේ.

විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා - ඵල 5

තණ්හා, උපාදාන, කම්ම භව - වර්තමාන හේතු 5

උප්පත්ති භවය හෙවත් ජාති, ජරා, මරණ, සෝක, පරිදේව ආදිය

ජාති කියන විට දී විඤ්ඤාණය යි, ප්‍රතිසන්ධි විඤ්ඤාණය යි, ජාති, ජරා, මරණ හැම එකකම ප්‍රතිසන්ධි නාම රූපයි, සළායතන, ඵස්ස, වේදනා.

ප්‍රතිසන්ධි අවස්ථාවේ දී ප්‍රතිසන්ධි සිත පහළවීම ජාතිය. ප්‍රතිසන්ධි චිත්තක්ෂණය තුළ ජාතිය - රූප ජාති, නාම ජාති, රූපය හට ගැනීම, නාමය හට ගැනීමයි. එනම් පඤ්ච ස්කන්ධයේ හටගැනීම ජාතිය යි. ප්‍රධාන වශයෙන් මෙහි දී ගනු ලබන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය යි. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වුනා යනු ජාතිය තුළ විඤ්ඤාණය යි. **විඤ්ඤාණ පච්චයා නාම රූපං**, විඤ්ඤාණය නිසා ඉතිරි නාම ස්කන්ධ 3 යි (විපාක නාම ස්කන්ධ 3) කර්මජ රූප ස්කන්ධය යි. එනම් **විඤ්ඤාණ පච්චයා නාම රූපං** වේ. ජාතියේ ම නාම රූපය පවතී. **නාම රූප පච්චයා සළායතනං**. ප්‍රතිසන්ධි නාම රූප ළඟම සළායතන නම්; සිත - මනායතනය යි. සෙසු නාම ස්කන්ධය - ධම්මායතනය යි. මෙහි දී සළායතන සමඟ අනෙක් ආයතන සම්බන්ධ කෙරේ. කර්මජ රූප ධම්මායතනයට අයිති වේ. මෙය තව දුරටත් ගිය විට දී, ප්‍රතිසන්ධි සිත

පහළවන විට දී අරමුණක් තිබුණි. එම අරමුණත් ආයතනයක් බවට පත්වේ. මෙම ආකාරයට ප්‍රතිසන්ධි සිතේ පහළවන ආයතනය දැක්විය හැක.

**සළායතන පච්චයා ඵස්සො**, ප්‍රතිසන්ධි සිතේ පහළවුණු ඵස්ස චෛතසිකය ඵස්ස ලෙස එක් ආකාරයකින් සැළකිය හැක. අරමුණයි වස්තුවයි එකට එකතුවීම. සියල්ල එකතුවීමත් ඵස්සය ලෙස සැළකිය හැක.

**ඵස්ස පච්චයා වෙදනා** යනු ප්‍රතිසන්ධි සිතේ පහළ වූ වේදනාවයි. මේ ආකාරයට ප්‍රතිසන්ධි සිතේ ජාතිය අරමුණු කරගෙන ඵල 5 බැලීමට පුළුවන. ඒ භවයේ හැම වේලාවේම චිත්ත පරම්පරා පහළ වෙනවා. ඒ පහළවන හැම චිත්ත පරම්පරාවක ම අපට ඔය විදියට බැලීමට හැක. එවිට වර්තමාන හේතු 5 නිසා අනාගත ඵල 5 ක් ලැබේ. අනාගත ඵල 5, බුදුරජාණන් වහන්සේ මාතෘකා වශයෙන් වෙන වෙනම දේශනා කර නැතත් එක තැනකින්ම එය ඔප්පුකර තිබේ. ජාතිය තුළින් දක්වා ඇත. හැම සිතකම හටගැනීම, ජරාවේ දී හැම සිතකම පැවතීම, මරණ කියන විට දී ඒ සිත සහ රූප විනාශවීම යි. උප්පාද, ඨිති, භංග ලෙස ය. නාමයේ උප්පාද, ඨිති, භංග,ජාති, ජරා, මරණ. රූපයේ උප්පාද, ඨිති, භංග, ජාති, ජරා, මරණ වේ. මේ උප්පාද ඨිති භංගත් සමඟ ශෝක, පරිදේව ආදී ඕලාරිකව වැටහෙන දුකය. මෙහි දී ජාති, ජරා, මරණ පරමාර්ථ වශයෙන් ක්ෂණයක් පාසා තේරුම් ගත යුතුය. ඕලාරික ලෙස හෝ සම්මුති වශයෙන් ගත් විට අපි ජාතිය යනු ඉපදීම. ඉපදීම නිසා වයසට යනවිට දුක ඇතිවෙනවා. මරණයට යනවිට සම්මුති වශයෙනුත් හිතන්න පුළුවනි. සම්මුති වශයෙන් ගත්විට දී තමයි ශෝක, පරිදේව ආදිය ප්‍රකටව වැටහෙන්නේ. නැතිනම් විදර්ශනා භාවනාවේදී විදර්ශනා ඥානවලට යන විට දී උදයබ්බය භංග ඥානයෙන් පසු භය, ආදීනව, නිබ්බිදා, මුඤ්චිතුකම්‍යතා ඥාන 4 ක් පහළවේ. විපස්සනා භංග ඥානය පහළවූවා යනු ඒ භංග ඥානය තුළ හොඳට තීක්ෂණ බුද්ධිය පහළවූවා නම් ඔහුට එතනින් එහාට යාම ඉතාම සරලයි. ඉන්පසු ඉබේම වාගේ යනවා. නමුත් ඒ තුළ හොඳින් තීක්ෂණ ප්‍රඥාවෙන් යෙදිය යුතුය. නාම

රූපයන්ගේ භංගය ඔහුට ප්‍රකට වෙන විට දී භයක් ඇතිවේ. භය නම් සසරේ ඉපදුන නිසයි මේ හැම දෙයක්ම. මේ සසරට භයක් ඇතිවේ. නැවත ඉපදුනොත් නැවත මේවාට පත්වේ යන භය ඇතිවේ. මොහු ආදීනව සිතන්න පටන් ගනී. මේ සංස්කාරයන්ගේ පරිහරණය, නාම රූප පඤ්ච ස්කන්ධයන්ගේ පරිහරණයේ ආදීනව සිතයි. නිබ්බිදාව - කලකිරීම. මේ නාම රූපයන් ගැන කලකිරීමක් ඇතිවේ. මේ සංසාරය ගැන කලකිරීමක් ඇතිවේ. ආත්මය ගැන කලකිරීමක් ඇතිවේ. මේ භවය ගැන කලකිරීමට පටන් ගනී. මුඤ්චිතුකම්‍යතා කිරීමෙන් පසු අතම්දෙන්න මහන්සි ගන්නවා. මෙයින් ගැලවෙන්නට සිත පහළ කරගනී. මෙම ගැඹුරු විදර්ශනා ඥාන අවස්ථාවල දී පහළවන අවස්ථාවන් 4 කි. මේ නාම රූපයන්ගේ භංගය, මරණය, නාම රූපයන්ගේ උප්පාද, ඨිති, භංගය කෙනෙකුට දකින්න පුළුවන් නම් ඉබේම එතැන භය ආදීනව නිබ්බිදා මුඤ්චිතුකම්‍යතා ඇතිවෙනවා යනු ශෝක, පරිදේව ආදිය පරමාර්ථ වශයෙන් වැටහීමක් වැනිය. ඕලාරික වශයෙන් ශෝකයක් ඇතිවෙන විට, උදාඃ- අපි අසනීප වූ විට දී මේ වේදනාව දරාගන්න බැරිව අඬනවා, වැළපෙනවා, ශෝක වෙනවා. හේතුව නම් මේ රූප කය අපට දුක් ගෙන දෙන නිසාය. මේ දුක් ගිනි, විදර්ශනා යෝගීන් වහන්සේ, විදර්ශනා ගැඹුරු ඥානයේ දී අර භංගය දකින විට මේ පඤ්ච ස්කන්ධය පිළිබඳ ව භයක් තේරුම් ගනී. මේ පඤ්ච ස්කන්ධය තිබෙන තාක් කල් අපට ඇතිවෙන දේවල්. අපට පුදුමාකාර භයක් ගෙන දේ. එහිදී ඔහුට ඇතිවන්නේ තීක්ෂණ බුද්ධියක්, ප්‍රඥාවත් සමඟ ඇතිවන භයකි. නමුත් අපට ඕලාරික ලෙස කයට දැනෙන වේදනාවත් සමඟ ඇඬීමක්, වැළපීමක් ඇතිවෙනවා නම්, ඒ ප්‍රඥාවත් සමඟ නොවේ. අපට තේරෙන්නේ ඇඬන්නේ, වැළපෙන්නේ මේ කයට තියෙන ආශාව නිසයි. නමුත් අපි සිතිය යුතුයි එතැනත් ජාති, ජරා, මරණ පවතින බව. ඒ නිසා තමයි අපට ශෝක, පරිදේව ලැබෙන්නේ. ඒ නිසා මෙය පරමාර්ථ වශයෙනුත්, සම්මුති වශයෙනුත් දැකිය යුතුයි. මෙහි දී අපි තේරුම් ගත යුත්තේ අපට ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව ආදිය පරමාර්ථ වශයෙනුත්, සම්මුති වශයෙනුත් දකින්න පුළුවනි. අද බොහෝ දෙනා

මෙය සම්මුති වශයෙන් දකිමිනුයි අල්ලා ගන්නේ. සම්මුති වශයෙන් දකිමින් මෙය තව තවත් වඩවාගෙන යයි. කෙනෙකුට පරමාර්ථ වශයෙන් නාම රූපවල උප්පාදය ජාතිය, ඨිතිය ජරාව, භංගය මරණය. ඒවාගේ මෙය නිසා ඇතිවන භය ශෝකය ලෙස ගත හැකිය. මෙහි භය ආදීනව දකින්න දකින්න අනිත් හැම දෙයක්ම දකින්නට පුළුවනි. මේ විදියට පරමාර්ථ වශයෙන් දකින්න පුළුවන් නම් ඔහුට දුකින් මිදීමට හැකිවේ. සම්මුති වශයෙන් දකින අය තව තවත් දුක් රැස්කර ගනිමින් යයි.

වට්ටත්‍රය

මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ, අතීත, වර්තමාන ලෙස සම්බන්ධ කරමින් සංක්ෂේප 4 වීසති ආකාරයට බෙදා දක්වනුයේ; අතීත හේතු 5, වර්තමාන ඵල 5, වර්තමාන හේතු 5, අනාගත ඵල 5 වශයෙන් අපි මෙය තේරුම් ගත්තා. මෙය වට්ට ක්‍රමයට හඳුනාගත යුතුය. වට්ටය යනු සංසාර, ගමන වට්ට දුක සංසාර දුකයි. මෙහි වට්ට 3 ක් තිබේ.

1. **ක්ලේශ වට්ට** (අවිද්‍යා, තණ්හා, උපාදාන)
2. **කම්ම වට්ට** (සංඛාර, කම්ම)
3. **විපාක වට්ට** (විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා)

මෙය තමයි අපේ චක්‍රය. මෙය නිසා තමයි කරකැවෙන්නේ. ක්ලේශ වට්ට නම් කෙලෙස්. කෙලෙස්වල ස්වභාවයයි. කම්ම වට්ට නම් කෙලෙස් නිසා රැස්වෙන දෙයයි. විපාක වට්ට නම් රැස්කරගත් නිසා ඇතිවන ප්‍රතිඵලයයි.

මෙය බොහොම පැහැදිලිව දේශනා කර තිබේ. පටිච්ච සමුප්පාදයේ අවිද්‍යා, තණ්හා, උපාදාන. මේ තිදෙනා ක්ලේශ වට්ට වේ. සංඛාර, කම්ම - කම්ම වට්ටය වේ. විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා - විපාක වට්ටයයි. මෙය වඩාත් තේරුම් ගැනීමට අප කුසලයක් කරන අවස්ථාවක් සලකා බලමු. අපි කුසලයක් කරන්නේ ඇයි? කුසල් කරන්නේ සිතේ තිබෙන කෙලෙස් ගතිය නිසයි. කෙලෙසුන්ගේ උපකාරයක් නැත්නම් අපට කුසල් කිරීමට නො හැකිය. අප දන් දුන්නේ නැත්නම්

ඊළඟ ජීවිතයේ දුගී දුප්පත් වෙලා, අසරණ වෙලා ජීවත්වීමට සිදුවේ. මේ ජීවිතයේ මෛත්‍රිය වැඩුවේ නැත්නම් ඊළඟ ජීවිතයේ අවලස්සන වෙලයි උපදින්නේ. මේ ජීවිතයේ භාවනා කර ධ්‍යාන වඩා ගත්තේ නැතිනම් ඊළඟ ජීවිතයේ අපායේ යන්න වේවි. අපි මේ සසරට තියෙන භය නිසා, අපේ සිතේ තිබෙන කෙලෙස් ගතිය නිසයි අපි කුසල් කරන්නේ. උදා:- රහතන්වහන්සේ නමක්, අපි වගේම දන් දෙනවා. අපි වගේම භාවනා කරනවා. උන්වහන්සේ ඒවා කළාට උන්වහන්සේගේ සිතේ කෙලෙස් නො මැත. උන්වහන්සේ කෙලෙස්වලින් තොරවයි කරන්නේ. ඒ කරන ක්‍රියාවෙන් එහා පැත්තේ දෙයක් නැත. එහා පැත්තෙත් මෙහා පැත්තෙත් නැත. නමුත් අපි කරන ක්‍රියාව තුළ එහා පැත්තෙත් මෙහා පැත්තෙත් තිබේ. එනම් අපි කුසලයක් කරන්න කලිනුත් නොයෙක් පැතුම් ප්‍රාර්ථනා තියෙනවා. කුසලයෙන් පසුව ද නොයෙක් පැතුම් ප්‍රාර්ථනා තිබේ. කෙලෙස් නැතිනම් අපට කුසල් කරන්න බැහැ. කෙලෙස් නිසා තමයි කුසල් කරන්නෙත් අකුසල් කරන්නෙත්. රහතන් වහන්සේට කෙලෙස් නැති නිසා කුසල් කරන්නේත් අකුසල් කරන්නේත් නැහැ. කෙලෙස් ගතිය නැතිනම් අපි කවදාවත් කුසල් කරන්නේ නැත. එහෙනම් අපි රහත්වෙලා. රහත් වෙනකල් අපි ළඟ කෙලෙස් පවතී. හේතුව නම්; අවිද්‍යාවත් සමඟයි මේ කෙලෙස් බැඳී තිබෙන්නේ. ප්‍රධාන ක්ලේශ වට්ටය අවිද්‍යා මූලයයි. අවිද්‍යාව නැතිවෙන්නේ අර්හත් මාර්ග ඥානයෙනි. රහත්වෙන තුරුම මේ අවිද්‍යාව පවතී. අනාගාමින් වහන්සේ ගත් විට, බුදුරජාණන් වහන්සේ මොවුන් කොටස් 5 කට වෙන් කර දක්වයි. අසංඛාර පරිනිබ්බායි, සසංඛාර පරිනිබ්බායි, අන්තරා පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි, උද්ධංසෝත අකනිට්ඨගාමි යනුවෙනි. උන්වහන්සේලා රහත්වූවත් හිතේ අවිද්‍යාව තියෙනවා. ඒ නිසා හිතේ ප්‍රාර්ථනා තිබේ. ඇතැම් අනාගාමීන් වහන්සේලා, මට පඤ්ච සුද්ධාවාසයේ පළමුවැනි බඹලොව සිට, අවිහයේ සිට සම්පූර්ණ ආයුෂ විඳ, අතප්පයට යා යුතුයි. අතප්පයේ ආයුෂ විඳ, සුදර්ශයට යා යුතුයි. සුදර්ශයේ ආයුෂ විඳ සුදස්සියට යා යුතුයි. සුදස්සියේ සම්පූර්ණ ආයුෂ විඳ අකනිටා බඹතලයට යා යුතුය. එහි දී ද සම්පූර්ණ ආයුෂ විඳ අවසානයේ තමයි

නිවන් දකින්න ඕනේ ලෙස සිතනවා. සිතේ තිබෙන අවිද්‍යාව නිසයි. අනාගාමීන් වහන්සේලා තුළත් අවිද්‍යාව තිබෙන තාක් යම් යම් ප්‍රාර්ථනා තිබෙනවා. නමුත් අපේ තරම් ප්‍රාර්ථනා ඕළාරික නැහැ. එසේ වන්නේ අවිද්‍යාව පමණයි පවතින්නේ. තණ්හා, උපාදාන, නැති බැවිනි. අනික් බඹලොව ගත් විට ඇතැම් බ්‍රහ්මරාජයෝ පළමු බඹතලයෙන් දෙවැනියට, දෙවැනියෙන් තුන්වැනියට යා යුතුයි කියා, නැතිනම් මනුලොවට ගොස් පින්කර නැවත පැමිණෙන්න ඕනේ යනුවෙන් ප්‍රාර්ථනා කරනවා.

ඇතැම් අය අසඤ්ඤ තලයට යන්නේ ඇයි?

මේ සිතට නින්දා කිරීමෙනි. සිත නිසා හැම දුක් කරදරයක් ම ලැබෙන්නේ. හිත නිසා තමයි මේ හැම ප්‍රශ්නයක් ම. ඒ නිසා මට හිත නැතිව රූපෙන් පමණක් සිටින්නට ඇත්නම් යයි සමහර යෝගීන් වහන්සේලා පුරුදු කරනවා. එබැවින් අසඤ්ඤ තලයට යනවා. සමහරක් අය සිතනවා මේ රූපය නිසයි ප්‍රශ්න තියෙන්නේ, සිතේ නොවේ. සිත විතරක් තිබුණා නම් ප්‍රශ්න නැහැයි සිතමින් අරූපී තලවලට යන්න සිතනවා. හැම කෙනෙකුන්ගේම මේ කටයුතු සිදුවන්නේ කුමක් නිසාද? සිතේ තිබෙන කෙලෙස් ගතිය නිසයි. කෙලෙස් ගතිය තමයි අපි කියන්නේ ක්ලේශ වට්ටය කියා.

සක්කාය දිට්ඨි, සීලබ්බත පරාමාස, විචිකිච්ඡා, කාම රාග, පටිඝ, රූප රාග, අරූප රාග, මාන, උද්දච්ච, අවිද්‍යා. අපි තුළ තණ්හාව තිබෙනවා. තණ්හාව නැතිකරලා හෝ නැතුව නොවේ. අපේ ළඟ තිබෙන තණ්හාව ඕළාරිකයි. නමුත් අනාගාමීන් වහන්සේලාගේ තණ්හාව සීමිතයි. දැන් අනාගාමීන් වහන්සේ තුළ රූප රාග, අරූප රාග තිබෙනවා. මේ රූප බඹ තලයට, අරූප බඹ තලයට යෑමේ තණ්හාවයි. නමුත් ඒ තණ්හාව ඇවිදින් අපි දකින, අපේ ළඟ තියෙන තණ්හාව තරම් ඕළාරික නැහැ. තණ්හාව නැතුව නොවේ, තණ්හාව තිබෙනවා. බලවත් නැත. උපාදාන තිබේ බලවත් නැත. උපාදාන කියන විට දී කාම උපාදානයේ කොටසක් සියුම් ලෙස තිබේ. අවිද්‍යාව නිසා උපාදානය නමුත් උපාදාන අනුව අපි තුළ මේවා බලවත්ව තිබේ. තණ්හාව කියන විට හැම තණ්හාවක් ම, උපාදාන කියන විට උපාදාන 4 ම අප ළඟ තිබේ. සෝවාන් වූ උතුමන්

තුළ තණ්හාව එසේම පවතී. උන්වහන්සේ තණ්හාව නැතිකර නැත. තණ්හාව සම්පූර්ණයෙන් ම නැතිවන්නේ අනාගාමීන් වහන්සේ තුළයි. මෙහි දී කාම තණ්හාව තිබේ. කාම උපාදානයත් තිබේ. දිට්ඨි උපාදානය, අත්තවාද උපාදානය, සීලබ්බත උපාදානය නැතිකර ගත් මුත් කාම උපාදානය තිබේ. ඒ නිසයි සෝවාන් ආර්යයන් වහන්සේ නමක් ඕලාරික වන්නේ. ආත්ම 7 කට යන්න. සත්තඛත්තුපරම කියන තත්ත්වයට යන්නේ. ඒ ඒ අනුව වෙනස් වේ.

අට්ඨකථාචාරීන් වහන්සේලා විශේෂයක් පෙන්වනවා. 7 දෙනෙක් ගැන සඳහන් කරනවා. විශාඛා මහ උපාසිකාව හා අනාථ පිණ්ඩික සිටුතුමයි, මේ දෙදෙනා සෝවාන් වූ ආර්ය ශ්‍රාවක ශ්‍රාවිකා දෙදෙනෙක්, මේ දෙදෙනා විශේෂිතයි යනුවෙන් සළකන්නේ. සාමාන්‍ය සෝවාන් වූ කෙනෙක් 8 වැනි ආත්මයක් ලබන්නේ නැහැ කවදාවත්. මේ තමයි රතන සූත්‍රයේ දී කරන සඟගුණ අර්ථ විග්‍රහය. "**නතෙ භවං අට්ඨමං ආදියන්ති**" අටවෙනි ආත්මයක් ලබන්නේ නැත කියා. නමුත් විශාඛා මහ උපාසිකාවයි, අනාථ පිණ්ඩික සිටුතුමයි අකනිට්ඨා බඹතලය දක්වා ගමන් කරන බව. ඒ අයගේ විශේෂිත පුණ්‍ය ප්‍රාර්ථනා සසරේ සිට කරගෙන ආ සහ මේ ජීවිතයේ කරගන්නා ලද පුණ්‍ය ප්‍රාර්ථනා අනුවයි මේ දේ සිද්ධ වෙන්නේ. නමුත් මෙය අසාධාරණ යි. අසාධාරණ සිදුවීමකි. සාධාරණ සිදුවීමක් නොවේ. හේතුව නම් ප්‍රාර්ථනා බලවත්වීම යි. කාම තණ්හාවයි, අවිද්‍යාවයි ඉතාම බලවත්. බලවත්ව සිත්වල වැඩී තිබේ. විශාකා මහ උපාසිකාව පූර්වාරාමය හදලා දරු මුණුබුරෝ වටකරගෙන ගීතිකා කියමින් විහාරාරාමය වටේ ම ගිය බව සඳහන් වේ. ඒ ගීතිකා කියමින් යන විට ඇතැම් භික්ෂූන් සිතුවා විශාඛාව උමතු වෙලාවත් ද කියා. එතරම් ම ගීතිකා කියූ බැවින්. පුදුමාකාර සතුටකින් දරු මුණුබුරෝ වටකරගෙන මම මෙවැනි පූජාවක් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට සිදු කළා කියමින් සතුටින් ගියේ. ඒ තුළ මොනතරම් කාම තණ්හාව, අවිද්‍යාව සමඟ බැඳී තිබේ ද? එසේම අනේ පිඩු සිටුතුමා දිනපතාම භික්ෂූන් වහන්සේලා 500 නමකට අඩුම තරමේ කැඳ බත් දාන, හීල් දාන, හැම දෙයක්ම දුන්නා. අවසානයේ දුප්පත් වෙනතුරු ම දානය දුන්නා. වෙන

අයෙකු නම් එසේ කරන්නේ නැත. එතුමා තුළ බුද්ධ ප්‍රමුඛ සංඝයාට තියෙන ගරුත්වයත්, ශාසනයේ තියෙන පැහැදීමත්, ආර්ය ශ්‍රාවකත්වය නිසායි පරිත්‍යාගය සිදු කළේ. ඒ දෙදෙනාම තුළ විශේෂත්වයක් පවතින බව අට්ඨ කථාවේ සඳහන් වෙනවා. අපිට ධර්මානුකූලව අට්ඨ කථාවෙන් කියවෙන දේ දේශනා කරනවා මිස, ධර්මයට විරුද්ධ වීම, අගෞරව කිරීම කළ නො හැකියි. අපට මේ බුද්ධ දේශනාවත්, අට්ඨ කථාවත් වෙනස් කළ නො හැකිය. හේතුව මේවා ඈත අතීතයේ සිට ආ පිළිවෙළයි. ඉතිං මේවා තුළ තිබෙන කරුණු අපට ප්‍රතික්ෂේප කරන්න බැහැ. හේතුව යම් කිසි කෙනෙක් මේ ධර්මයට නිගරු කරනවා නම්, අගෞරව කරනවා නම්, ධර්මයට අපහාස කිරීම, චෝදනා කිරීම, ධර්මයට කරන ඒ අපකීර්තිය නිසා අනිවාර්යයෙන් ම මේ අය අපායට යනවා. බුදුරජාණන් වහන්සේ කොසොල් මහ රජතුමාගේ අසදෘෂ දානය දවසේ කාල ඇමතිතුමා රජතුමාට නින්දා කරනවා, මේ අපරාධයක් කරන්නේ. මේසා විශාල ධන පරිත්‍යාගයක් නිකම් ම නිකන් සිටින මුඩු මහණුන්ට මොකද මෙවැනි පරිත්‍යාග කරන්නේ, එවැනි බොහොම අශික්ෂිත පහත් වචන සිතුවා. කථා කළා. ඒ වගේම ජුණ්හ කියන ඇමතිවරයා හොඳ පැත්ත සිතුවා. බුදුරජාණන් වහන්සේ මේ දෙදෙනා ගැන ම දුටුවා. බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළේ නැහැ. කොසොල් මහ රජතුමා බලාපොරොත්තු වුනා හොඳ ධර්ම දේශනාවක් කරයි කියා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ නැත. ඒ ඇයි? බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළා නම් ඒ කාල ඇමතියා ධර්මයටත් නිගා කරන බැවිනි. ධර්මයටත් අගෞරව කරනවා, නින්දා කරනවා, අපහාස කරනවා. ඒ තුළින් අපායට යන්න පුළුවන් නිසාවෙනි. අද කාලයේ වර්තමානයේ, බුදුදහම අවුරුදු 2500 ක් පරණයි. මේවා කටවචනයෙන් පැවත ආ දේවල්. ඇතැම් වෙලාවට වැරදි අඩුපාඩු තියෙන්න පුළුවන්. නමුත් අපි ඒවා බොහොම ඉවසීමෙන් බැලිය යුතුයි.

උදාඃ- ඡට්ඨ සංගායනාවේ ශුද්ධ කළ ත්‍රිපිටක පොත් සහ ලංකාවේ සිංහල ත්‍රිපිටක පොත් ගත් විට වෙනස් ය. ඡට්ඨ සංගායනාවේ සමහරක් වචන අර්ථ තිබේ. සිංහල පොතේ නැත. ඇතැම් ඒවා සිංහල ත්‍රිපිටක

පොතේ පවතී. ඡට්ඨ සංගායනාවේ නැත. මේ දෙකෙන් කෝකද අපි තේරුම් ගන්නේ. මෙහි දී අපි තේරුම් ගත යුත්තේ මේ දෙකේම කරුණු එක් කොට නිවැරදිව ධර්මය තේරුම් ගත යුතුයි. ප්‍රතික්ෂේප නො කළ යුතුයි. මෙහි තිබේ, මෙහි නැතය කියා නැති එක හරි තියෙන නිසා දැමිය යුතුයි. මෙය සිතා බලා තේරුම් ගත යුතුයි. ත්‍රිපිටකය ගලපන විට බොහෝ තැන්වල දැකීමට පුළුවන. සිංහල ත්‍රිපිටකයේ බුද්ධ ජයන්ති පොත් ගත් විට ඒ තුළ මුද්‍රණ දෝෂ සැහෙන පමණ වෙති. ඇතැම් විට එය තේරුම් ගැනීමට අපහසුවයි මොන මුද්‍රණ දෝෂයක්ද කියා. ඇතැම් තැන්වල පාලිය තියෙනවා. සිංහල නැත. සමහර තැන්වල සිංහල තේරුම පවතී පාලිය නැත. ධර්මයට එන කෙනෙකුට, හදාරන්න බැසගන්න එන කෙනෙකුට මුලින් ම එහි ලැබෙන්නේ වැරදි අවබෝධයකි. නමුත් එය වෙනස් කරන්න අපහසුයි. නමුත් අපි ඒවා දුටු පමණින් නින්දා අගෞරව කිරීම නුසුදුසු යි. අපි ඒවා පිළිබඳව පිළිපැදිය යුතුයි.

මේ ආකාරයට විශාඛා මහ උපාසිකාවයි, අනේපිඬු සිටුතුමායි අකනිටා බඹතලය දක්වා යනවා කියන කථාව සක්සුදක් සේ ත්‍රිපිටක බුද්ධ වචනයට ගලපන්න නො හැකියි. රතන සූත්‍ර දේශනාවේ දී අටවැනි ආත්මයක් නැති බවයි දේශනා වන්නේ. නමුත් මෙහි සඳහන් වෙන බැවින් අප සාකච්ඡා කරන්නේ. ඒ බැවින් අනාගාමීන් වහන්සේ නමක් අකනිටා බඹතලයට ගියාට අපේ තරම් තණ්හාව ඕලාරික, අවිද්‍යාව බලවත් නොවේ. අපේ උපාදානය තරම් බලවත් නොවේ. නමුත් උන්වහන්සේ තුළ අවිද්‍යාව තිබෙනවා, තණ්හාව තිබෙනවා, උපාදානය තිබෙනවා නැතිව නොවේ. මුලින් නැති බව පැවසුවත් ඕලාරිකත්වය නැති බව තේරුම් ගත යුතුයි.

අපි සාමාන්‍යයෙන් පින්කමක් කරනවා. උදා:- රුවන්මැලි මහා චෛත්‍යරාජයාණන් වහන්සේට බොහොම පිළිවෙළකට, පිරිසිදුවට, ලස්සනට මල් වට්ටියක් පූජා කරනවා. මේ මල් වට්ටිය පූජා කරන අවස්ථාවේ දී මේ මල් වට්ටිය පූජා කරන්නේ තථාගත බුදුපියාණන් වහන්සේට, තථාගත බුදුපියාණන් වහන්සේගේ සන්තානය තුළ අනන්ත අප්‍රමාණ ගුණ සමුදායකින්, පුණ්‍ය සමුදායකින්, පාරමී සමුදායකින්

සමන්විතයි. එවැනි ගුණ කදම්භයක් ඇති අසදෘෂ මහා උත්තමයන් වහන්සේට, අසමසම මහෝත්තමයාණන් වහන්සේට තමයි මේ මාගේ පුෂ්ප පූජාව යනුවෙන් බොහොම ශ්‍රද්ධාවෙන් කුසල් අරමුණෙන් මේ මල්ටික සකස් කරනවා, කුසල් අරමුණෙන් රැගෙන යනවා, කුසල් අරමුණෙන්ම ගොස් තථාගතයන් වහන්සේගේ ජීවමාන ගුණයට පූජා කරනවා. මේ මල් වට්ටිය පූජා කරන්න ඕනේ කියන සිත පහළ වූ මොහොතේ සිට කෙලෙස් හොරා පැමිණෙනවා. අපට හොරෙන් අපිව කෙලෙස් හොරු ගන්නවා. කෙසේද? මේ මල් වට්ටිය පූජා කරන්න ලස්සන මල්වට්ටි හදන විට අපේ හිත හොරෙන් වැඩ කරනවා. මේ මල් පූජා කිරීමෙන් ඊළඟ ජීවිතය ලස්සන හොඳ මනුෂ්‍ය ජීවිතයක් ලැබෙන්න ඕනේ, පිරිසිදු මනුෂ්‍ය ජීවිතයක් ලැබෙන්න ඕනේ. පිරිසිදු කයක් ඇතිව, පිරිසිදු වචනයක් ඇතිව, පිරිසිදු සන්තානයක් ඇතිව, මට පාරමී පුරන්න හොඳ ජීවිතයක් ලැබෙන්න ඕනෙ. මේ විදියට කුසලය අතරතුර නොයෙක් ආකාරයේ කෙලෙස් හොරු අපි ළඟට පැමිණෙනවා. හොඳට සිතා බලන්න. හැම කෙනෙක් තුළම මෙය ඇතිවෙනවා. ඉන්පසු මල් පූජා කර ගාථා කියා, පිරිත් කියා අවසානයෙත් සිතනවා මම අද මෙවැනි පින්කමක් කළා, කොච්චර හොඳද? පසුවත් සිතනවා. එම අවස්ථාවේ ඇසෙනවා එවැනි පින්කම් කළ අය දෙව්ලොව ගොස් තිබෙනවා. ඒ අයට මෙහෙම මෙහෙම වී සිටි බව ඇසෙනවා. එහෙනම් මමත් එවැනි පින්කමක් කළා, මටත් ලැබෙයි. මේ පින්කම කිරීමට පෙර, කරන අවස්ථාවේ, කිරීමෙන් අනතුරුව කියන කුමන හෝ වේලාවක ඔය කියන ක්ලේශ වට්ටිය බලවත්ව වැඩකරනවා. නමුත් ක්ලේශ වට්ටිය උදව්වෙලා තමයි ඔය කුසලය කරන්නේ. මුලින්ම අපට මේ ක්ලේශ වට්ටිය ගැන තේරුමක් නැහැ. අපට මේ ක්ලේශ වට්ටය පසුව ප්‍රකටව වැටහෙන්න පටන් ගනී.

උදාඃ- ධර්මයේ තියෙන සුමනා රාජ කුමාරිකාවගේ කථාව. පෙර ජීවිතයක සුමනා නමැති රාජ කුමාරිකාව දිය නුමුසු කිරිබතක් සකස් කර විපස්සී බුදුරජාණන් වහන්සේට පූජා කරනවා. මේ කිරිබත් පාත්‍රය සමන්පිච්ච මල්වලින් ආවරණය කරනවා. ඒ වන විට විපස්සී බුදුරජාණන්

වහන්සේ ඇතුළු මහා සංඝයාට දානය දෙන්න අමාරුයි. ඥාතිවන සහෝදරයෙක් තමයි ඒ වනවිට දන් පූජා කළේ. එක් ඇමතිවරයෙක් දාන වාරයක් භාර ගන්නවා. රැකවල් දමා කිසිවෙකුටත් පැමිණීමට ඉඩ නැත. මේ කුමාරිකාව මේ දිය නුමුසු කිරිබතක් පිළියෙළ කොට දෑ සමන් මල්වලින් වසා රැගෙන යනවා. කිසිවෙකුට මෙය පෙනෙන්නේ නැහැ කිරිබත් කියා. දෑ සමන් මල් පමණි. කවුරුත් බලනවා. මල් නිසා පූජා කිරීමට ඉඩ දුන්නා. මෙතුමිය ගොස් මුලින්ම බුදුරජාණන් වහන්සේට පූජා කළා. ඒ සමඟ ප්‍රාර්ථනාවක් ද කළා. "ස්වාමීනි මට මේ ජීවිතයේ නිවන් දකින්න නො ලැබුණොත්, මේ කරපු පූජා බලයෙන් මා නිවන් දක්නා ජීවිතය දක්වා ම මම රාජ කුමාරිකාවක් වී ඉපදේවා, ඒ වාගේම මගේ නම සුමනා ම වේවා", යනාදී ලෙස ප්‍රාර්ථනා කළා. බුදුරජාණන් වහන්සේ අධිෂ්ඨාන කළා කිරිබත් දානය සියලුම රහතන් වහන්සේලාට බෙදීමට. ඒ වෙලාවේ සිදුකළ ප්‍රාර්ථනාව භවයක් පාසා මේ බුදුසසුන දක්වාම උපන්නේ රාජ කුමාරිකාවක් වෙලයි. උපදින හැම භවයකම නම සුමනා විය.

කළේ හොඳ කුසලයක්, සංඛාර කම්ම, ක්ලේශ වට්ටය ප්‍රාර්ථනාව නිසා කුසලය සංවිධානය කරගත්තා. එය බලවත් ක්ලේශ වට්ටයක් වුනා. එතුමිය ප්‍රාර්ථනා කළා "මට නිවන් දක්නා ජීවිතය දක්වාම රාජ කුමාරිකාවක් වී, කාන්තාවක් වී, නම සුමනා ම වේවා" කියන එක. මෙවැනි දෙයක් සිතුවේ අවිද්‍යාව නිසයි. චතුරාර්ය සත්‍යය අවබෝධ වුනා නම් මෙවැනි ප්‍රාර්ථනා කවදාවත් සිතන්නේ නැත. අවිද්‍යාව නිසා ප්‍රාර්ථනා කරන විට ලැබුණා වාගේ ආසාවක් හිතේ ඇතිවුණා. ආශා කරනවා. ඒ ආශාව සමඟ උපාදාන කරගන්නවා. අනිවාර්යයෙන්ම ලැබුණා වාගේ තමයි සිතෙන් උපාදාන කර ගන්නේ. අවිද්‍යා, තණ්හා, උපාදාන කියන ක්ලේශ වට්ටය සකස් වුණා. මේ කෙලෙස් වට්ටය නිසා කරන ලද කුසලය සංඛාර බවට පත් වුණා. කරන ලද කුසලය බලවත් වුණා. ප්‍රාර්ථනාව බලවත් නම් කුසලය බලවත් වේ. කුසලය බලවත් නම් ප්‍රාර්ථනාව බලවත් වේ. කුසලය දුබල නම් ප්‍රාර්ථනාව දුබල වේ. ප්‍රාර්ථනාව දුබල නම් කුසලය දුබල වේ. මෙයයි මෙහි වැදගත්කම.

සංඛාර බලවත් වුණා ඒ ජීවිතයේ මරණාසන්න අවස්ථාවේ දී. කුමාරිකාව බුදුරජාණන් වහන්සේට කිරිබත් පූජා කළේ තරුණ කාලයේ විය හැකිය. නමුත් මරණාසන්න මොහොත එන්නේ අවුරුදු ගණනාවකට පසුය. නමුත් මරණාසන්න මොහොතේ දී මතක් වුණා විපස්සී බුදුරජාණන් වහන්සේට දිය නුමුසු කිරිබතක් දෑ සමන් මල් සමඟ පූජා කළා කියන එක. එදා ඒ ප්‍රාර්ථනා කළ වේලාවේ අවිද්‍යා, තණ්හා, උපාදාන පහළ වුණා. නැවත එය කම්ම හෝ කම්ම නිමිත්ත, ගති නිමිත්තක් බවට පත්වෙලා, මරණාසන්න මොහොතෙ අරමුණක් වෙලා කුසල් සිතේ පහළ වුණා. සංඛාර නිසා කර්ම ශක්තිය ඇති වුණා. උප්පාද, ඨිති, භංග වෙන විට කර්මය එකතු වෙනවා. කම්ම භවය ඇතිවෙලා මේ සංඛාර කම්ම නිසා අවිද්‍යා, තණ්හා, උපාදාන ක්ලේශ වට්ටය වුණා. කෙලෙස් වට්ටය නිසා කම්ම වට්ටය ඇති වුණා. සංඛාර කම්ම කියන කම්ම වට්ටය නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය විපාක වට්ටය ආරම්භ වුණා. මේ ආකාරයට තම විඤ්ඤාණය, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා දක්වා විපාක වට්ටය කරකැවෙන්නේ.

රුවන්මැලි සෑයට මල් පූජා කිරීමේ දී ද නොයෙක් ප්‍රාර්ථනා බැඳෙනවා. එකක් නොවේ. මට හොඳ මනුෂ්‍ය ජීවිතයක් ලැබේවා! ලස්සන මනුෂ්‍ය ජීවිතයක් ලැබේවා! ඒවාගේම හොඳ ධන සම්පත් තියෙන මනුෂ්‍ය ජීවිතයක් ලැබේවා! ඒ ලැබෙන ජීවිතයේදී මට හොඳට මහණදම් පුරන්න ලැබේවා! ආදී නොයෙක් ප්‍රාර්ථනා බැඳෙනවා. ප්‍රාර්ථනා ගොඩකි. එක කුසලයක් සමඟ බැඳුණු ප්‍රාර්ථනාවටත් මොන තරම් කෙලෙස් හොරු පැමිණිලාද අපව පැහැරගන්න. ඒ අතර තුර තමයි අපි හිතන්නේ කුමක්ද? නිවන් දකින්න ලැබේවා කියා. මොකද හේතුව නිවන් දකින්න කලින් භවය හදාගත යුතුයි. අඩිතාලම තිබිය යුතුයි. නිවන් දකින්න ඕනේ නමුත් නිවන් දකින්න කලින් කෙලෙස් වට්ටය සකසා ගත්තා. මාර්ගය සකසා ගත්තා. හොඳ මනුෂ්‍ය ජීවිතයක්, ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක්, ඒ වගේම කිසිම දෙයක අඩුපාඩුවක් නොමැති හොඳ මනුෂ්‍ය ජීවිතයක්, සිතූ පැතූ සම්පත් පහළ වෙන මනුෂ්‍ය ජීවිතයක් මේ ආකාරයේ නොයෙක් කෙලෙස් ප්‍රාර්ථනා බැඳගෙන තමයි නිර්වාණය

ප්‍රාර්ථනා කරන්නේ මරණාසන්න අවසථාවේ දී බලවත් කුසලයක් කළ බැවින්. රුවන්මැලි සෑය කියන්නේ අද කාලයේ තියෙන අසදෘෂ මහා චෛත්‍යයකි. එවැනි චෛත්‍යයකට එක මලක් හෝ පූජා කරනවා කියන්නේ අප්‍රමාණ කුසලයකි. හේතුව ජීවමාන සර්වඥ ධාතූන් වහන්සේලා සොළොස් නැළියෙන් දෙ නැළියක්, එක ද්‍රෝණයක් ම තැන්පත් වී තිබෙන්නේ රුවන්මැලි සෑයේය. ඇතැම් බෞද්ධයෝ සිතයි ඒක නම් පුදුම අසාධාරණයක් ඇයි ලංකාවට පමණක් එක ද්‍රෝණයක් ම ගියේ කියා. ඒ පුණ්‍ය දේශයේ වූ පුණ්‍ය භාග්‍යයේ හේතුවෙනි. එවැනි එක ද්‍රෝණයක් ම තැන්පත් වූ රුවන්මැලි සෑය කෙනෙකුට වඳින්න භාග්‍යය ලැබෙනවා නම්, කෙනෙකුට ප්‍රදක්ෂිණා කරන්න ලැබෙනවා නම්, කෙනෙකුට එක මලක් පූජා කරන්න ලැබෙනවා නම් මොනතරම් භාග්‍යයක්ද?

රහතන් වහන්සේලා පවා මෙයට ගරුකළ අවස්ථා පිළිබඳව කථා තිබේ. දිනක් එක රහතන් වහන්සේ නමක්, ගුරුවරයෙකු ගෝලයා වන අභිඥාලාභී පෘථග්ජන සාමණේරයන් සමඟ මධ්‍යම රාත්‍රියේ චෛත්‍ය වන්දනාවට සූදානම්. ඒ වෙලාවේදී ගෝලයා පිටුපසින් ගොස් විමසනවා 'ස්වාමීනි, මල් ටිකක් ගෙනැවිත් දෙන්න ද කියා'. 'දරුව මල් ලැබුණොත් කව්ද නුපුදන්නේ මෙවැනි චෛත්‍යයකට' කියා පවසනවා. ඒ කියන්නේ රහතන් වහන්සේලා පවා මොනතරම් කැමති ද? ඒත් උන්වහන්සේලාට කෙලෙස් නැත. බුදුරජාණන් වහන්සේට කරන්නා වූ ජීවමාන ගෞරවයක් හා සමාන බැවිනි. මේ ගෝලනම හිමාලයට ගොස් මල් පොකුරක් පෙරහන් කඩකට ගෙන එනවා. රහතන් වහන්සේ, 'මේ සා මහා චෛත්‍යයකට මේ වාගේ මල් ටික ද තියන්නේ' යන ප්‍රශ්නය නැඟුවා. නැත ස්වාමීනි අධිෂ්ඨාන බලයෙන් මල් පූජා කරන්න. එවිට පේසා වළලු සහිත සෑ මළුව සම්පූර්ණයෙන් ම මල්වලින් වැසුවා. ඒත් ගොටුවේ මල් ඉවර නැත. 'ස්වාමීනි, ඉවර නම් ගොටුව අනික් පැත්ත හරවන්න.' මෙය අධිෂ්ඨාන බලයයි. රහතන් වහන්සේලා පවා පුදුමාකාර ගෞරවයක්, පුදුමාකාර භක්තියක්, පුදුමාකාර පූජාවක් කර තිබෙනවා.

නමුත් උන්වහන්සේගේ සිතේ කුසල් පහළ වුනේ නැත. ක්‍රියා මාත්‍රය පමණයි. උන්වහන්සේට පවා සිතන්න පුළුවන් අපි රහත්වෙලා මොකටද මේවා කරන්නේ. නමුත් උන්වහන්සේලා ගරුකළා. තවත් දිනක සැරියුත් ස්වාමීන් වහන්සේ වනයක සක්මන් මළුවේ ආසනයක භාවනා කරනවා. නමුත් සක්මන් මළුවවත් වටේටත් පිරිසිදු කර නැත. බුදුරජාණන් වහන්සේ මෙය දැක, එතැනට වැඩම කර සිරිපතුල ඒ ඉදිරියෙන් තබා වැඩම කරනවා. සැරියුත් ස්වාමීන් වහන්සේ භාවනාවෙන් නැගිටලා බලන විට දී බුදුරජාණන් වහන්සේ වැඩම කර තිබෙනබව දකිනවා. හේතුව කුමක්ද කියා සිතුවා. වටපිටාව පිරිසිඳු කර නැතිබවයි තථාගතයන් වහන්සේ දේශනා කළේ. 'සාරිපුත්‍රයෙනි, රහත්වුනත් වටපිටාව පිරිසිඳු කර භාවනා කළ යුතුයි' යනුවෙනි. මෙයින් අපි තේරුම් ගත යුත්තේ අපි කරන්නේ කුසල් රහතන් වහන්සේලාත් මේවා සිඳු කරනවා. රහතන් වහන්සේලා නිවන් දුටුවා කියා කිසිම දෙයක් සිඳු නොකර නො සිටියි. බුද්ධ වත කරනවා. සෑ මළු අමදිනවා. සෑම දෙයක්ම උන්වහන්සේලා සිඳු කරති. නමුත් ක්‍රියා මාත්‍රයක් පමණි. උන්වහන්සේලා සිතේ කෙලෙස්වලින් නොවේ සිඳු කරන්නේ. අපි කරන්නේ කෙලෙස්වලිනි. ඒ වාගේ චෛත්‍යයකට කරන ලද පින්කමක් සිහි කරන විට දී නොයෙක් ප්‍රාර්ථනා බැඳෙනවා. මරණාසන්න අවස්ථාවේ දී මේ කියන සියල්ලක්ම ගලාගෙන ඒමට පටන් ගන්නවා. ඒක ප්‍රාර්ථනාවක් නොවේ. ගලාගෙන එන්න පටන් ගන්නවා. කුසල බලවත් ප්‍රාර්ථනා ගොඩකි. එහි දී බලවත් ප්‍රාර්ථනා අනුව තමයි සංඛාර කම්ම පහළ වෙන්නේ. ඒ අනුව තමයි ඊළඟ ජීවිතය ලැබෙන්නේ. මෙය තමයි සාමාන්‍ය සිද්ධාන්තය. නමුත් මෙයද වෙනස් වේ. අපි කර්මය ගැන කථා කිරීමේ දී මෙය වෙනස් වේ.

මොකද කර්මය ගැන කියන විට ගරුක, ආසන්න, ආචිණ්ණ, කටත්තා යනුවෙන් මෙය බෙදයි. ඊට පසුව ජනක, උපත්ථම්භක, උපපීලක, උපඝාතක බෙදෙනවිටදි වෙනම කර්ම විග්‍රහයකි. මෙහි දී තේරුම් ගත යුත්තේ මොන දේ කළත්, අපි මේ ජීවිතයේ ප්‍රාර්ථනා පොදි බැඳගෙන මොන දේ කළත්, මරණාසන්න අවස්ථාව ගැන අස්ථිරයි.

මොන දේ සිදුවෙයි ද කිව නො හැකිය. බුදුරජාණන් වහන්සේ පහදා දෙන්නේ මුළින්ම එන්නේ ගරුක කර්මය බවයි. ගරුක කියන විට දී අකුසල පැත්තේ ගරුක තමයි මුළින්ම එන්නේ. කුසල පැත්තේ ගරුක දෙවනුව එන්නේ. යම් කෙනෙක් මව මැරීම, පියා මැරීම, බුදුන්ගේ ලේ සෙලවීම, සංඝ භේදය, රහතුන් මැරීම මේ කියන පඤ්චානන්තරිය කර්මයයි, මිථ්‍යා දෘෂ්ඨියයි මේ කියන 6 තමයි බලවත් ම ගරු අකුසල කර්ම. කෙනෙක් මරණාසන්න මොහොතේ දී මොන දේ කරලා තිබුණත් මේ අකුසල කර්ම ගලාගෙන එයි. අජාසත් රජු ගේ කථාවේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අජාසත් රජු එදා සාමඤ්ඤ ඵල ගැන විමසනවා. ඒ අහන ප්‍රශ්නය තමයි 'ස්වාමීනි ගිහි කෙනෙක් හැටියට ළමයෙක් ඉගෙනගත් විට දී රැකී රක්‍ෂාවක් කළහොත් ඔහු වැටුපක් ලබයි. ඒ නිසා ඔහු සතුටෙන් ජීවත් වෙයි. ඔහුගේ දෙමාපියන්, අසල්වාසීන් සතුටින් ජීවත් වෙයි. ඔහු ඉගෙනගත් නිසා ලැබූ විපාක, රැකියාව කරන නිසා විපාක. ස්වාමීනි අපට මේවා ඇස් ඉදිරියේම දකින්න පුළුවන්. නමුත් ඔබ වහන්සේගේ මේ සාමඤ්ඤ ඵල තියෙනවාද? කෙනෙක් පැවිදි වූ පසු ද මේ ඵල තියෙනවාද?' තථාගතයන් වහන්සේ කරුණු 14 කින් මේ මේ සාමඤ්ඤ ඵල පැවිදි රසය, පැවිදි සැපය ගැන වර්ණනා කරනවා. එක් කරුණක් දේශනා කරනවා. 'මහරජ, නුඹ සිතන්න නුඹගේ සේවකයෙක්, නුඹට කුලී වැඩ කළ, දූත මෙහෙවර කළ, පහත් කුලයේ සේවකයෙක්, කසාවත පොරවගෙන මහණ වෙනවා. නුඹ පසු කාලයක විමසනවා බැලමෙහෙවරකම් කළ දාසයා ගැන. ඒ අය පැවිදි වූ බව ආරංචි වෙනවා. මහණ වූ පසුත් නුඹ කථා කරන්නේ දාස භාවයෙන්ද? සලකන්නේ දාසයෙක් ලෙසද?' 'නැත ස්වාමීනි, මම රජ මාලිගාවට වඩම්මවලා, ආසන පනවලා, වෙනදා වාගේ නොවේ වාඩිකරවා හොඳට දන් පැන් පූජා කරනවා ශාසනයේ පැවිදි වී ඇති බැවින්.' 'මහරජ, කලින් නුඹ ම සැලකුවා දාසයෙක් ලෙස, නමුත් අද නුඹ පැවිද්දක් ලෙසයි සලකන්නේ. එනම් පැවිදිවීමේ සාමඤ්ඤ ඵලයයි. පැවිදිවීමේ වටිනාකම රජුන්, බමුණන්, දෙවියන්, බ්‍රහ්මයන් හැම රාජ මහාමාත්‍ය යන හැම කෙනෙකුගේම වන්දනයට, ගෞරවයට භාජන වෙනවා. පැවිදි

උතුමන්ට පැවිද්දේ ලැබෙන ආනිසංසයි.' මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ පැවිද්දේ ආනිසංස දේශනා කරනවා. අවසානයේ මහරජ බුදුරජාණන් වහන්සේගෙන් සමාව ඉල්ලා සිටිනවා මගේ පව් මට කමාකරන්න කියා. ඒ වෙලාවේ දුකක් ඇතිවෙනවා 'මගේ නොදන්නාකම නිසා ධාර්මික මගේ පියතුමා මම මැරුවා. මට මෙයින් ගැලවෙන්න ඕනේ. මට පව් සමාකරන්න' කියා. බුදුරජාණන් වහන්සේ දේශනා කර සිටිනවා, 'ඔව් මහරජ, පව් සමාකරන්නම්' කියා. බුදුන්වහන්සේට පව් සමාකරන්න බැහැ. නමුත් ඒ වේලාවේ දී මහරජ දුක් වේදනාවෙන් ගැලවී යනවා. ඊට පසු බුදුරජාණන් වහන්සේ සංඝයාට දේශනා කරනවා 'මහණෙනි, මේ මහරජතුමා දැහැමි පියරජතුමා මරණයට පත්කළේ නැත්නම් අද සෝවාන් වෙනවා. මේ දේශනාව අවසානයේ සෝවාන් මාර්ගඵල ලබනවා. අට්ඨ කථාවල සඳහන් වෙනවා, පසු කාලයේ මහරජතුමා බුදු සසුනට පුදුමාකාර මෙහෙවරක් කළ බව. ඔහු පව් සමාකළ හා සමානව, නැවත පවක් සිදු නොකර ශාසනයට පිහිට වුණා. උදව් කළා. භික්ෂූන්ට උදව් කළා. පුදුමාකාර සේවයක්, මහ මෙහෙවරක් සිදු කළා. ඒ කරගත් කුසල් බලය නිසා සහ බුදුරජාණන් වහන්සේ ඉදිරියේ පව් සමාකළ නිසාත්, ඉන් මතුවට එවැනි පාපයක් නොකළ නිසාත්, මරණාසන්න මොහොතේ දී පීතෘ ඝාතනය මතක් වූ නමුත් අවීචි මහ නරකයට ගියේ නැහැ. ඔසුපත් නරකයක ඉපදුනා. අවීචි මහ නරකයට ගියානම් ගැලවෙන්න බැහැ. ඔසුපත් නරකය ඇවිත් එහි කාලයක් සිට මතු අනාගතයේ විජිතාවි නම් පසේ බුද්ධත්වයට පත්වෙලා නිවන් දකිනවා.

මෙහිදී තේරුම් ගත යුත්තේ ගරුක කර්මය බලවත්, අජාසත් රජු ශාසනයට කරන ලද මෙහෙය අප්‍රමාණයි. නමුත් පීතෘ ඝාතන ගරුක කර්මය මරණාසන්න මොහොතේ මතක්විය. ඒ නිසා මව්පියන්ට නින්දා අපහාස කිරීම, අගෞරව කිරීම, තැලීම්, ගැහීම්, බැනීම් ආදිය ආනන්තරීය පාපකර්ම හා සමානයි. අට්ඨ කථාවේ සඳහන්වෙන ආකාරයට යම් කෙනෙක් බුදුන්ගේ දේ විනාශ කරනවා නම්, ධර්මය සතු දේ විනාශ කරනවා නම්, සංඝයා සතු දේ විනාශ කරනවා නම්, දැවීම් කඩා බිඳ

දැමීම් සිදුකරනවා නම්, මෙම තෙරුවන් සතු දේවල්, **"ආනන්තරිය සදිසි ආනන්තරිය ආහච්ච තිට්ඨති"** ආනන්තරිය හා සමානයි. ආනන්තරිය වාගේම ඇලී ගැලී විපාක දීමට සමර්ථයි. එවැනි දෙයක් සිදු කළා නම්, ඒවාත් මරණාසන්න මොහොතේ දී මතක් වේ. ගරුක කර්ම ලෙසට. එයින් නරකාදියට යයි. ඒ වාගේම කුසල පැත්තේ ගරුක තිබුණ විටදී, අකුසල් පැත්තේ ගරුක නැතිනම්, කුසල ගරුක ඒමට හැකියාව තිබේ මරණාසන්න අවස්ථාවේ දී. කුසල ගරුක නම් ධ්‍යාන, සමාධි, සමාපත්ති, අභිඤ්ඤා, විපස්සනා ඤාණ, වැනි දෙයක් මරණාසන්න මොහොතේ සිහිවෙලා උපස්ථම්භක වී සුගතියට යයි. ගරුක කම්ම නැතිනම් ආසන්න කර්මය සිහිපත් වේ. සමහර විට මරණාසන්න මොහොතේ ඒ ළඟ, කිට්ටුව කරගත් දේවල්, එහිදීත් අකුසල තමා මුලටම එන්නේ. ධර්මාශෝක රජතුමාගේ කථාවේත් සඳහන් වේ. අප අසා ඇති පරිදි ධර්මාශෝක රජතුමාගේ අවසාන මොහොතේ සිතට ද්වේශයක් ආ බව පැවසේ. එබැවින් දාර පිඹුරෙක් වී ඉපදුන බව සඳහන් වේ. අනිත් හේතුව එතුමා කළ ශාසනික මෙහෙය ආදී සියල්ල යටපත් වී මරණාසන්න මොහොතේ ආ අකුසලය බලවත් විය. පසු කාලයේ දී ඉන් ගැලවී ඉවත් විය. (මෙය ඇසූ කථාවකි.)

ඒ ආකාරයට ආසන්නයේ කරන කුසල, මේ නිසා බොහෝ දෙනෙක් මරණාසන්න කිට්ටුවේ දී පිරිත් අහන්න, දන් දෙන්න, බණ අහන්න, නොයෙක් පින්කම්වල යෙදෙති. මරණාසන්න මොහොතේ මෙම ආසන්න කුසලය ඊළඟ ජීවිතය හොඳ කරගන්න උපකාර වේ. මරණාසන්න මොහොත සකස් කරගෙන ඊළඟ ජීවිතය හොඳ මනුෂ්‍ය ජීවිතයක් ලැබුණාට ඒ පුද්ගලයා කුසල් සිදුකර නැත්නම් ඒ ජීවිතය සැපවත් කරන්නට නොහැකිය. ජනක කර්මයටම හැකියාවක් නැත. සැපවත් කිරීමට අද කාලයේ මනුෂ්‍යයන් හොඳ ජීවිත ලබා තිබේ. බොහොම හැඩහුරුකම් තිබෙන ලස්සන මනුෂ්‍ය ජීවිත, නමුත් දුගී දුප්පත් වෙලා, අසරණ වෙලා, කෑමට ආහාර වේල නොලැබේ. දුක සේ ජීවත් වේ. එක් පැත්තකින් හොඳයි, අනෙක් පැත්තෙන් දුර්වලයි. හේතුව ජනක කර්මය හොඳවීමයි. නමුත් උපස්ථම්භක කර්ම නැහැ ඒ ජීවිතය

සැපවත් කරන්නට. ඇතැම් අය අංග විකල, මන්ද බුද්ධික වී, මහේශාක්‍ය කුලවල, මහා ධන සම්පත් තියෙන කුලවල දරුවන් වී ඉපදෙනවා. මහ ධනවත් පවුල්වලට තියෙන ලොකු ගැටළුවකි මෙය. දුබල කුසලයකින් මනුෂ්‍ය ජීවිතය ලැබුවත්, පෙර ජීවිතයේ කරගත් මහා කුසල් තිබේ. ඒ කුසල් නිසා දුබල ජීවිතය දුර්වල වුනත් මහා සැප වින්දනය කරනවා.

සුනඛයෙක් ගත් විට, ඇතැම් උසස් පවුල්වල සතුන් ඇති කරයි. සුනඛයා අහේතුක ප්‍රතිසන්ධියක් වුවත්, මරණාසන්න මොහොතේ දුබල කර්මයක් ආ මුත් පෙර මහා බලසම්පන්න කුසල් තිබුණි. ඒ නිසා තමයි ඒ ජීවිතය උපස්ථම්භක කර්මවලින් සැපවත් කරන්නේ. මෙහි දී අපි තේරුම් ගත යුත්තේ කුමක් කළත්, මේ හැම දෙයක්ම කර්මානුකූලව වෙනස් කිරීමට හැකි බවයි.

ආසන්න කර්ම නැතිනම් ඊළඟට ආචිණ්ණ කර්මයක් මරණාසන්න ජවනයට අරමුණු වේ. ආචිණ්ණ යනු පුරුදු කරගත් දෙයකි. මෙහිදීත් අකුසල මුලට පැමිණේ. දිනපතාම සතුන් මරා වෙළඳාම් කර ජීවත්වන පුද්ගලයෝ සිටියි. මෙය ආචිණ්ණ කර්මයක් සත්ත්ව ඝාතනය. බෞද්ධ රටකට, කර්මය කර්මඵලය විශ්වාස කරන රටකට මේ ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු දෙයකි. එවැනි කර්මාන්තයක් ඉවත් කළහොත් නොයෙක් විද්‍යානුකූල ගැටළු මතුවේ. නමුත් බෞද්ධයෙක් වශයෙන් මෙය සිදු නොකළ යුතුයි. ලංකාව, බුරුමය, තායිලන්තය වැනි රටවල කිරීම නුසුදුසුය. නමුත් ඇතැම් රටවල මේවා අග්‍රගණයේ මහා ව්‍යාපාර වේ. මුදල් ආදායම් උපදවාගන්නා ක්‍රම වේ. බෞද්ධයෝ වශයෙන් මේවා සිදුකරනවා නම්, බුදුරජාණන් වහන්සේගේ ධර්මයට පටහැනිව ක්‍රියා කිරීමකි. දිනක් බුදුරජාණන් වහන්සේ මහා සංඝයාත් සමඟ වඩින අතරමගදී අරිය නම් පොඩි දරුවෙක් බිලී කොක්කෙන් මාළු බාමින් සිටියි. බුදුරජාණන් වහන්සේ දුටුවා මේ ළමයාගේ නම අරිය බව. ඔහුගේ සිත වෙනස්කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා අමතා, ‘මහණ, ඔබගේ නම කුමක්දැ’යි විමසන විට, ‘ස්වාමිනි, මගේ නම මහා මොග්ගල්ලාන’, ‘මගේ නම සාරිපුත්ත’, ‘මගේ නම ආනන්ද’ මෙවිට

දරුවාගේ අවධානය යොමුවේ. එවිට 'දරුව, ඔබගේ නම කුමක්දැ'යි විමසනවා. 'මගේ නම අරිය'. **"නතෙන අරියො හොති, යෙන පාණානි හිංසති. අහිංසා සබ්බ පාණානං, අරියොති පවුච්චති"** 'අරිය කියන අය කවදාවත් පව් කරන්නේ නැහැ. සත්ත්ව හිංසා කරන්නේ නැහැ. ඒ නිසයි අරිය කියා කියන්නේ.' මේ වෙලේ නම් බුදුරජාණන් වහන්සේ ඒ දරුවා එයින් මුදවාගත් සේක. බෞද්ධයෝ ලෙස මහා සත්ත්ව ව්‍යාපාර, සතුන් මැරීම, ඇතැම් විට මහා ව්‍යාපාර මට්ටමින් නොයෙක් අකුසල් කිරීම සුදුසු නොවේ. මේවා ආචිණ්ණ කර්ම බවට පත්වෙලා මරණාසන්න මොහොතේ දී මතක් වන බැවිනි.

අප අසා තිබෙන කථාවක් නම්, පාරවල්වල සිටින බල්ලන් එකතු කරගෙන ගොස් විෂ වායු දමා මරණයට පත් කරන තැනක මනුෂ්‍යයකුගේ රාජකාරිය වූයේ බල්ලන් කාමරයට දමා විෂ වායුව යවන බොත්තම තද කිරීමයි. මොහු මෙය හැමදාම රාජකාරියක් ලෙස සිදු කරන ලදී. ඔහුගේ අවසාන කාලයේ දී ඔහුගේ නාසය කුණු වී වැටුණි. හේතුව දිට්ඨධම්මවේදනීය වශයෙන් ලැබුණි. මරණාසන්න මොහොතේ දී ද මතක් වනුයේ ඒ අකුසලයම වේ.

ගෝඝාතක වස්තුව - මනුෂ්‍යයෙක් හරක් මරමින් ජීවත් විය. මොහු හැමදාම හරක් මරමින්, ඒ මස් වෙළඳාම් කරමින් ජීවත් විය. හරක් මස් නැතිව මොහු කවදාවත් ආහාර ගන්නේ නැත. දිනක් හරක් මස් කොටසක් ඉතිරි කරගෙන ඇවිදින් බිරිඳට දී නෑමට ගියා. ඒ වේලාවේදී මේ ගෙදරට අවා මනුෂ්‍යයෙක් හරක් මස් ඉල්ලා සිටියා. තම ගෙදරට අමුත්තෙක් ආ බැවින් බිරිඳ කියා සිටියා මස් නැති බව. නමුත් මොහු දුටුවා ගෙදර මස් තිබෙන බව. බලහත්කාරයෙන්ම මස් රැගෙන ගියා. බිරිඳ දන්නවා ස්වාමියා මස් නැතිව ආහාර නොගන්නා බව. නමුත් තිබූ එළවළුවලින් ආහාර පිලියෙල කළා. හරක් මරලා, මස් විකුණලා, නාගෙන හරි මහන්සියෙන් හා බඩගින්නෙන් ඔහු ආහාර ගැනීමට පැමිණියා. නමුත් බත් පිඟානේ මස් නැති බැවින් තරහා ගොස් ගේ පිටුපස බැඳ දමා සිටි වසු පැටවාගේ කට ඇර දිව කපාගත්තා. එය ගෙනවිත් අඟුරු මත දමා පුච්චා බත් පිඟාන ගෙන කෑමට පටන් ගන්න හදනවා. වසු පැටියා දිව

නැතිව ලේ වගුරවමින් පණ අදිනවා. මෙහි දී ඔහුට දිට්ඨධම්මවේදනීය විපාක ලැබුණා. මස් කෑල්ල කඩලා බත් සමඟ මිශ්‍ර කරලා කටට කිට්ටු කරද්දීම තමන්ගේ දිව කඩාගෙන වැටුණා බත් පිඟානට. අර වසු පැටියා වින්දේ මොන දුකක් ද, ඒ ආකාරයෙන්ම මොහුගේ දිව නැතිව ලේ වගුරවමින් දුක් වින්දා. ඒ පුද්ගලයා ආචිණ්ණ කම්ම වශයෙන් දිනපතා පුරුදු කළේ සතුන් මරණ එක. මරණාසන්න මොහොතට ආවා. එහි විපාක දිට්ඨධම්ම වේදනීය විපාකත් සමඟ නරකාදියට ගියා. එබැවින් අකුසල ආචිණ්ණ බරපතල වේ.

කුසල ආචිණ්ණත් ඒ වගේම තමයි. දිනපතා සිල් සමාදන් වෙනවා. දිනපතා භාවනා කරනවා. දිනපතා දන් දෙනවා. මේ හැම දෙයක්ම පුරුදු කරන එක ආචිණ්ණ කර්මයක්. කුසල ආචිණ්ණ කර්මයක්. ඒ කුසලය අපට හොඳ ජීවිතයකට උපකාරී වෙනවා.

කටත්තා කර්ම යනු පෙර ජීවිතයේ පුරුදු කරගත් දෙයක්. ගොඩක් දුරට මනුෂ්‍ය පථයට නොව බ්‍රහ්ම ලොවට බලපාන දෙයකි. බ්‍රහ්ම ලෝකයේ සිටින බ්‍රහ්මරාජයින් එයින් චුත වන විටදී බලපායි. අසංඥතලයෙන් චුත වන විටදී විශේෂයෙන්ම. එහිදී කරන කුසලයක් නැත. රූප පමණයි ඇත්තේ. නමුත් එයින් චුත වන විටදී මරණාසන්න ජවනයේ අරමුණක් පහළ විය යුතුය. එසේ පහළ වන්නේ අසංඥතලයට යාමට පෙර ජීවිතයේ කරගන්නා ලද කුසලයක් මතයි තීරණය වන්නේ. පෙර ජීවිතවල පුරුදු කරගත් දෙයක් කටත්තා කර්මය ලෙස දැක්වේ. මේ අනුව මරණාසන්න ජවනය සකස් වන පිළිවෙළ වටහාගත යුතුය.

ක්ලෙශ වට්ටය - අවිජ්ජා, තණ්හා, උපාදාන නම් ක්ලේශ වට්ටය නිසා සංඛාර කම්ම කියන කම්ම වට්ටය සකස් වේ. මේ කම්ම වට්ටය නිසා විපාක වට්ටය ප්‍රතිසන්ධි විඤ්ඤාණය සහිත විඤ්ඤාණ, නාම රූප, සලායතන, ඵස්ස, වේදනා ලැබෙනවා. මේ වේදනාවන් සමඟ නැවත තණ්හා උපාදාන කියන මේ ක්ලේශ වට්ටය අවිද්‍යාවත් සමඟ ඇතිවේ. මෙය නිසා සංඛාර කියන කම්ම භවය නමැති කම්ම වට්ටය සකස් වෙනවා. මේ කම්ම වට්ටය නිසා නැවත ජීවිතයක්, උප්පත්ති

භවයක්, ජාති, ජරා, මරණ ආදිය ලැබේ. ඒවා විපාක වට්ටයි. ක්ලෙශ වට්ටය නිසා තමයි කම්ම වට්ටය පහළ වන්නේ. ක්ලේශ වට්ටය නැතිනම් කම්ම වට්ටය පහළ වන්නේ නැත. කම්ම වට්ටය නැතිනම් විපාක වට්ටය පහළ වන්නේ නැත. රහතන් වහන්සේ තුළ ක්ලේශ වට්ටයක් නැහැ. ක්ලේශ වට්ටයක් නොමැති බැවින් කම්ම වට්ටයක් නැත. කම්ම වට්ටයක් නොමැති බැවින් විපාක වට්ටයක් නොමැත. මෙය තමා ත්‍රි වට්ටය. වට්ටුපච්ඡේදය නිර්වාණයට කියන නමකි. මේ ත්‍රිවිධ වට්ටයන්, සංසාර වට්ටය සම්පූර්ණවම සිඳලා නිර්වාණය සාක්ෂාත් කරගත් නිසා නිර්වාණයට වට්ටුපච්ඡේදය යයි කියනු ලැබේ. එනම් මේ ක්ලේශ වට්ට, කම්ම වට්ට, විපාක වට්ට කියන මේ වට්ට 3 න් අතමිදීමයි. මේ ආකාරයට තමයි පටිච්චසමුප්පාදය ගලපා තියෙන්නේ.

## අභිධර්ම නය ක්‍රමය

පටිච්චසමුප්පාදය අභිධර්ම නය ක්‍රමයට අනුව විස්තර කිරීමටයි දැන් බලාපොරොත්තු වන්නේ. මෙහිදී සමානව තමයි අර්ථ විග්‍රහය සිදුවන්නේ. පටිච්ච සමුප්පාදයේ ප්‍රධාන වශයෙන් අංග 12 ක් වූවාට මෙහිදී අංග 12 සම්බන්ධ කර නොගැනේ. අවිද්‍යා, සංඛාර, විඤ්ඤාණ, නාම, ඡට්ඨායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ. මෙය බෙදා දක්වයි. මූල වශයෙන් අවිද්‍යා මූලය, සංඛාර මූලය, විඤ්ඤාණ මූලය, නාම මූලය, ඡට්ඨායතන මූලය, ඵස්ස මූලය, වේදනා මූලය, තණ්හා මූලය, උපාදාන මූලය, මෙලෙස මූල 9 කට බෙදා අර්ථ විග්‍රහ කරනු ලැබේ.

දේශනාවේ පදයක් ගානේ අර්ථ දක්වා බැලුවහොත්; **"අවිජ්ජා පච්චයා සංඛාරො, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමං, නාම පච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතන පච්චයා ඵස්සො, -පෙ-"**

මෙතැනදී චතුෂ්ක 4 ක් දක්වයි. 1. පච්චය චතුෂ්ක, 2. හේතු චතුෂ්ක, 3. සම්පයුක්ත චතුෂ්ක, 4. අඤ්ඤමඤ්ඤ චතුෂ්ක. චතුෂ්ක යනු හතරක් යන්නයි. පච්චය යන වචනය සම්බන්ධ කරමින් 4 කට නය ක්‍රම දක්වයි. හේතු වශයෙන් 4 ක, සම්පයුක්ත වශයෙන් 4 කට, සහ අඤ්ඤමඤ්ඤ

වශයෙන් චතුෂ්ක 4 ලෙස දැක්වේ. අවිද්‍යා මූලයෙන් චතුෂ්ක 4 × 4 = 16 ක් තිබේ. මේ ලෙස සංඛාර, විඤ්ඤාණ, ෂට්ඨායතන ආදී ලෙස බෙදා දක්වමින් යනවිට චතුෂ්ක වැඩිකරමින් ගණනය කරනු ලැබේ. මෙහි දී කෙටියෙන් එක් අර්ථ විග්‍රහයකින් පසුව එය තේරුම් ගත හැකිය.

මෙයින් අදහස් වන දේ; **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො.** සාමාන්‍යයෙන් යෙදෙන්නේ අවිජ්ජා පච්චයා සංඛාරා වශයෙනි. මෙහි දී අවිජ්ජා ප්‍රත්‍යයෙන් සංස්කාරය හටගනී. මෙහි දී සංඛාර යනු එක චිත්තක්ෂණයකි. එක් චිත්තයක් ගැනයි කියවෙන්නේ. සංඛාර කියන විටදී පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර, අනෙඤ්ජාභි සංඛාර වශයෙන් සමූහයක් හඳුනා ගත්හ. කුසල චේතනා, අකුසල චේතනා සියල්ලක්ම හඳුනා ගත්හ. සියල්ලම චේතනා 29 කි. මෙතැන දී එක් භවයක සම්බන්ධය ගැනයි සලකා බලනුයේ. එක් ආත්මයකට ප්‍රතිසන්ධියක් වන ආකාරයයි සලකා බලන්නේ. අවිද්‍යාව නිසා අතීතයේ සංස්කාර සියල්ල රැස්කළා. නමුත් අවිද්‍යාව නිසා එක් සංඛාරයක් පමණි මරණාසන්න ජවනයේදී පහළ වෙන්නේ. එබැවින් **සංඛාරො** - එක වචනයෙන්ම එක චිත්තක්ෂණයයි මරණාසන්න අවස්ථාවේදී ඇතිවෙන්නේ. එක් කුසල චිත්තක්ෂණයකි. කුසල ආරම්මණයකි. එය කුසල හෝ අකුසල වේ. නමුත් ඒ ජීවිතයේ රැස් කරන ලද කුසල් අප්‍රමාණයි. අකුසල් ද අප්‍රමාණ වේ. ඒ ජීවිතයේ පුරුදු කළ ක්ලේශ වට්ටය අප්‍රමාණයි. නමුත් එක ක්ලේශ වට්ටයක් නිසා එක කුසල චේතනාවක් පහළ වේ මරණාසන්න අවස්ථාවේ දී. එක චිත්තක්ෂණයක් බැගින් **සංඛාරො** ලෙස යෙදේ. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** - ප්‍රතිසන්ධි විඤ්ඤාණය ගැනයි සලකා බලන්නේ. **විඤ්ඤාණ පච්චයා නාමං** - විඤ්ඤාණය නිසා නාම ස්කන්ධය පහළවීමයි සලකා බලනුයේ. **නාම පච්චයා ඡට්ඨායතනං** - නාම ප්‍රත්‍යය නිසා ඡට්ඨායතනය පහළ වේ. ඡට්ඨායතනය යනු මනායතනයයි. නාම ප්‍රත්‍යය නිසා මනායතනය පහළ වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො-** මනායතනය නිසා ඵස්සය පහළ වේ. **ඵස්ස පච්චයා වෙදනා**-මේ ඵස්සය නිසා වේදනාව, **වෙදනා පච්චයා තණ්හා**-පෙ-මේ ආකාරයටයි මෙහි සරල අදහස.

දෙවැනි පදයෙන් **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො - පෙ -** අවිද්‍යාව නිසා ඒක චිත්තක්ෂණික සංඛාරය පහළ වේ. සංඛාර නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං** - මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම ස්කන්ධ පහළ වේ. **නාම පච්චයා ඵස්සො** - මේ නාමය නිසා ඵස්ස චෛතසික පහළ වේ. මෙතැනදී ෂඩ්ායතනය ගැන සාකච්ඡා නොකෙරේ. **ඵස්ස පච්චයා වෙදනා** - මේ ඵස්සය නිසා වේදනාව, වේදනාව නිසා තණ්හාව, තණ්හාව නිසා උපාදාන, උපාදාන නිසා භව, භව නිසා ජාති, ජරා මරණ පහළ වේ.

තුන්වැනි පදයෙන් **අවිජ්ජා පච්චයා සංඛාරො** - අවිද්‍යාව නිසා ඒක චිත්තක්ෂණික සංඛාරය, **සංඛාර පච්චයා විඤ්ඤාණං** - ප්‍රතිසන්ධි විඤ්ඤාණය. **විඤ්ඤාණ පච්චයා නාම රූපං** - ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම රූප පඤ්චස්කන්ධය මෙහිදී සාකච්ඡා කෙරේ. **නාම රූප පච්චයා ඡට්ඨායතනං** - නාම රූප නිසා මනායතනය, ෂඩ්ායතනය නම් මනායතනයයි. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** - ෂඩ්ායතනය නිසා ඵස්සය, ඵස්සය නිසා වේදනා, වේදනා නිසා තණ්හා, තණ්හා නිසා උපාදාන, උපාදාන නිසා භව, භව නිසා ජාති, ජාති නිසා ජරා මරණ මෙලෙස ඇතිවේ.

හතරවැනි පදයෙන් **අවිජ්ජා පච්චයා සංඛාරො** - අවිද්‍යාව නිසා ඒක චිත්තක්ෂණික සංඛාරය. ඒක චිත්තක්ෂණික යනු එක සිතකි. සංඛාර වනුයේ එක් සිතකි. කුසල් සිත් 8 ක් පවතී. එම එක් කුසලයක් මරණාසන්න අවස්ථාවේ දී සංඛාර වේ. අකුසල් 11 න් එකක් ඇතිවේ. රූපාවචර කුසල 5 න් එක් කුසලයක් ඇතිවේ. එක් එක් සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය අනුව එක් කුසලයක් පහළ වේ. එය ඒක චිත්තක්ෂණික සංඛාරයයි. ඒක වචනයෙන් දක්වා තිබේ. එක චේතනාවක් යෙදෙන බැවිනි. නාම රූප නිසා සළායතන, සළායතන යනු ආයතන 6 යි. මෙතැනදී **සළායතන පච්චයා ඵස්සො** විය යුතුය. නමුත් ෂඩ්ායතනයක් යෙදී තිබේ. **ඵස්ස පච්චයා වෙදනා** - ස්පර්ශය නිසා වේදනාව. වේදනාව නිසා තණ්හාව, තණ්හාව නිසා උපාදානය, උපාදානය නිසා ජාති, මේ ආකාරයට හටගනී.

මේ දැක්වූ කරුණු විග්‍රහකොට තේරුම් ගත යුතුය.

පළමුවැනි එකේ නාම රූප කියන ස්ථානයේ යෙදී තිබෙන්නේ නාම පමණී. සළායතන කියන ස්ථානයට ඡට්ඨායතන යන්න යෙදී තිබේ. මෙය අපරිපුණ්ණ ලෙස හැඳින්වේ. මෙහිදී ප්‍රතිසන්ධිය සම්පූර්ණ නොමැති හෙයිනි. ප්‍රතිසන්ධියේදී සම්පූර්ණ ආයතන පහළ වී නොමැති හෙයින් මේ ලෙස යෙදේ. අට්ඨකථාවේ විවිධ වූ නය ක්‍රම පෙන්වනු ලබයි. ඒ නය ක්‍රමවලට වඩා මෙහිදී තේරුම් ගත යුතුය. කෙනෙක් අරූපී තලයේ උපදිනවා. කෙනෙක් අරූප ධ්‍යාන වඩා ආකාසා-නඤ්චායතන ආදි අරූප ධ්‍යාන කුසල් මේ ජීවිතයේ වඩා අවිජ්ජා නිසා ධ්‍යාන වැඩිම අරූපී බඹතලයේ උපදින්න සිතා ප්‍රාර්ථනා කරයි. උදාහරණ ලෙස ආකාසානඤ්චායතනයෙන් බඹලොව යයි. අවිද්‍යාව නිසා ක්ලේශ වට්ටයයි. එනම් සංඛාරෝ ඒක චිත්තක්ෂණික වශයෙන් ආකාසා-නඤ්චායතන කුසලය සංඛාර බවට මරණාසන්න අවස්ථාවේ දී පත්වේ. (අවිජ්ජාව නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය ලබනවා.)

මේ සංඛාර නිසා මරණාසන්න ජවනයේ පහළ වූ සංඛාරය නිසා ආකාසානඤ්චායතන කුසලය නිසා විඤ්ඤාණ අරූපීතලයේ ප්‍රතිසන්ධි ලබනවා. ප්‍රතිසන්ධි නාම ස්කන්ධය පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං** - එහි රූප නැත ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා, උදව්වෙලා නාම ස්කන්ධ, වේදනා, සංඥා, සංඛාර පහළ වේ. එනම් **විඤ්ඤාණ පච්චයා නාමං, නාම පච්චයා ඡට්ඨායතනං** - ඡට්ඨායතන යනු, මෙහි දී ආයතන 6 ගැන සළකන්නේ නැත. චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය යන ආයතන 6 යි. ආයතන 6 න් අරූපී තලයේ ප්‍රතිසන්ධි ගෙන දෙන විඤ්ඤාණය ඡට්ඨායතනයයි. ඡට්ඨායතනය යනු මනායතනයට සමාන වචනයකි. ආයතන 6 ම ගැන කථා කිරීමේදී සළායතන ලෙස යෙදේ. අරූපී තලයේ ප්‍රතිසන්ධිය ලැබූ පසු **නාම පච්චයා මනායතනං** - නාමය මනායතනයට උපකාර වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** - ඒ සිතේ පහළවන ඵස්ස, **ඵස්ස පච්චයා වෙදනා**, ඒ සිතේ පහළවෙන වේදනාව. ඊළඟට තණ්හාවක්

වනුයේ කෙසේද? කෙනෙක් ප්‍රතිසන්ධිය ලැබුවාට පසු ඒ ප්‍රතිසන්ධි චිත්තක්‍ෂණ ටික දුරක් ගොස් භවාංග ගත වුනාට පසු භවයට ආසා කරන සිත චිත්ත පරම්පරාවක් පහළ වේ. මනෝද්වාරික චිත්ත වීථියක් පහළ වේ. උපාදාන කරගනිමින් මෙසේ පහළ වේ. මේ භවය ලැබුවාට පසු මේ භවයට ආසා කර ඒ භවයේ පදිංචි වේ. උදාඃ- ගෙදරක පදිංචියට යනවා නම්, ඒ ගෙදරට ගොස් බලා හොඳ නම් එහි පදිංචියට යයි. එසේම මේ භවයට ගොස් ඒ භවය සුදුසු නම් ඇලුම් කරන තණ්හාව. ඇලුම් කළේ ප්‍රතිසන්ධියේ ලැබූ වේදනාව නිසා තණ්හාව පහළ වූ බැවිනි. ඇතැම් විට ඒ භවයට ඇලුම් කරන්නේ නැතිනම් එතැනින් චුත වේ. වෙන භවයකට යයි මෙය තණ්හාවයි. ඇලුම් කරනවා චිත්ත වීථියේ තණ්හාව නිසා. උපාදානය කරගත්තා ඒ භවය. **උපාදාන පච්චයා භවො** - උපාදාන කියන විටදී පෙර ඉගෙනගත් උපාදානය නොවේ කියවෙන්නේ. මෙහි දී භව යනු නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි. වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියන මේ නාම ස්කන්ධයේ හටගැනීම්ය. මෙතැන දී භවය ලෙස සළකන්නේ. **භව පච්චයා ජාති** - ජාති යනු ප්‍රතිසන්ධි සිතේ හටගැනීමයි. නාම ස්කන්ධයේ හටගැනීම ජාතිය උත්පාද අවස්ථාව. ජරා මරණ යනු ඨිති භංග අවස්ථාවයි. මෙහිදී ජරා මරණ ලෙස නවතා තිබෙන අතර සෝක, පරිදේව ආදිය යෙදී නැත. අරූපී තලයේ ප්‍රතිසන්ධි ගැනයි මේ කියවෙන්නේ බව පැහැදිලි වේ.

නැවත මතක් කරගතහොත් අවිද්‍යාව නිසා මරණාසන්න අවස්ථාවේදී ආකාසානඤ්චායතන කුසලය පහළ වේ. මේ කුසල ශක්තිය නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය ආකාසානඤ්චායතන බ්‍රහ්ම තලයේ ලබනවා. ඒ විඤ්ඤාණය නිසා එතැන නාම ස්කන්ධ පහළ වේ. විඤ්ඤාණයේ උපකාරයෙන් වේදනා, සංඥා, සංඛාර විපාක ස්කන්ධ පහළ වේ. මේ විපාක ස්කන්ධ නිසා එය උදව් කරනවා ප්‍රතිසන්ධි විඤ්ඤාණය නමැති මනායතනයට, ෂට්ඨායතනයට මේ ෂට්ඨායතනයට නිසා එතැන ස්පර්ශය පහළ වේ. විපාක ගත ස්පර්ශයයි. ඒ ස්පර්ශය නිසා වේදනාව පහළ වේ. උදාඃ- මනෝ සම්ඵස්සය - මනෝ සම්ඵස්සය වේදනා ලෙස ද කිව

හැක. ඵස්ස ප්‍රධාන කොට සියලුම විපාක නාම ස්කන්ධ ටික අපට මනෝ සම්ඵස්සය ලෙස කිව හැක. ප්‍රතිසන්ධිය මනෝ සම්ඵස්සයයි. ප්‍රතිසන්ධි මනෝ සම්ඵස්සය නිසා එතැන ඇතිවෙනවා ප්‍රතිසන්ධි මනෝ සම්ඵස්ස වේදනාව. ඒ වේදනාව නිසා තමයි එයා භවයට ආශා කළේ. තණ්හා චිත්ත වීථිය පහළ වේ. උපාදන කර ගත්තා. මෙහි දී භවය ලෙස ගත්තේ, උපාදාන නිසා භවය කියන විටදී මෙතැන දී උපාදන යනු කලින් ඉගෙනගත් කාම උපාදාන ආදී උපාදාන නොවේ. ඒ උපාදාන සම්බන්ධයක් තොරව. මෙහිදී උපාදාන යනු සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි. උපාදාන නිසා භවය. **භව පච්චයා ජාති** මේ ආකාරය ගනී. භවය මෙහි දී උප්පත්ති භවයයි.

තණ්හාව යනු භවයට ආශා කළා. භවයට ආශා කළ චිත්ත වීථිය පහළ වුණා තණ්හාව වශයෙන් උපාදානය කියන විටදී එය ඇලුම් කරනවා යනු උපාදානය නොවේ පහළ වෙන්නේ සතර නාම ස්කන්ධයන්ය. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ඒ සිතේ පහළවන සතර නාම ස්කන්ධයන් තමා උපාදාන කියන්නේ. උපාදාන නිසා භවය යනු උප්පත්ති භවයයි. එනම් භවයේ හටගැනීම. ඒ තැන ස්ථානය, **භව පච්චයා ජාති** යනු ප්‍රතිසන්ධි සිතේ හටගැනීමයි ජාතිය. ජාතිය නිසා ජරා මරණ.

දෙවැනි පදයේදීත් ඔය සම්බන්ධය තමා තිබෙන්නේ. එහි ලොකු වෙනසක් දක්නට නැත. එහි වෙනස නම්, **විඤ්ඤාණ පච්චයා නාමං**, ෂට්ඨායතනය යෙදී නැත. එහි වෙනස නම් පෙර ආකාරයමයි. අවිද්‍යාව නිසා ආකාසානඤ්චායතන කුසලාරම්මණයක් පැමිණ ඒ කුසල නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය ලබනවා. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම ස්කන්ධ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති ස්කන්ධ ටික පහළ වෙනවා. ඒ ස්කන්ධ සමග එතැන මනෝ සම්ඵස්සන පහළ වේ. එතැන ෂට්ඨායතන ලෙස අමුතුවෙන් එක් කරගත්තේ නැත. මනෝ සම්ඵස්සය පහළ වුණා. මනෝ සම්ඵස්සය නිසා මනෝ සම්ඵස්ස වේදනාව පහළ වෙනවා. ඒ වේදනාව නිසා භවයට ආසාවන තණ්හාවක් ඇති වෙනවා. ඒ තණ්හාව සමග උපාදානය යනු ඒ නාම ස්කන්ධයන්ගේ හටගැනීම

ඇති වෙනවා. නැවත උපාදානය. උපාදානය නිසා උප්පත්තිභවය ඇතිවෙනවා. උප්පත්ති භවය නිසා ජාති, ජරා, මරණ ඇතිවේ. මෙයත් අරූපී භවයටම සම්බන්ධ කර සාකච්ඡා කරන දෙයක්. නමුත් මෙහි පොඩි පොඩි වෙනස්කම් පවතී. ඒවා ඉදිරියට සාකච්ඡා කරමු.

ඊළඟට අවිද්‍යාව නිසා සංස්කාර හටගන්නවා. සංස්කාර නිසා විඤ්ඤාණ, විඤ්ඤාණ නිසා නාම රූප, නාම රූප නිසා ෂට්ඨායතන, ෂට්ඨායතන නිසා ඵස්ස, ආදිය පහළ වේ. මෙහි වෙනස නම් නාම රූප ස්ථානයේ නාම රූප පවතී. නමුත් සළායතන ස්ථානයේ ෂට්ඨායතනය පමණයි පවතින්නේ. මෙහි දී අදහස්වනුයේ ගබ්භසෙය්‍යය සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධියයි. කාම ලෝකයේ මනුෂ්‍යයන්ගේ ප්‍රතිසන්ධියයි. අවිද්‍යා කෙලෙස් වට්ටය නිසා සංඛාර නමැති කම්ම වට්ටය පහළ වේ. ඒක චිත්තක්‍ෂණික වශයෙන් එක් කුසල චේතනාවක් පහළ වන බැවිනි. සංඛාර නිසා විපාක වට්ටය නමැති ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණයත් සමඟ නාම රූප. එවිට හදය වස්තුව ආදි රූප කර්මජ රූප ලෙස. ඊළඟට වේදනා, සංඥා, සංඛාර, මේවා නාම වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම රූප පහළ වේ. **නාම රූප පච්චයා ඡට්ඨායතනං** - මෙහි දී මනායතනය පමණි. මෙහි දී සළායතන ගැනයි සිතනුයේ. ප්‍රතිසන්ධි අවස්ථාවේ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය නැත මනායතනය පමණි. ෂට්ඨායතනය නිසා මනෝ සම්ඵස්සය, මනෝ සම්ඵස්සය නිසා වේදනාව, වේදනාව නිසා භවයට ආසා කරන තණ්හා වීථිය තණ්හාවයි. තණ්හාව සමඟ උපාදානය නමැති සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම. උපාදානය නිසා භවය. ඉපදුන ස්ථානය තමයි භවය. භවය නිසා ජාති, ජරා, මරණ.

ඊළඟට දේශනා කරනවා අවිද්‍යාව නිසා සංස්කාරය, සංස්කාරය නිසා විඤ්ඤාණය, යන ආකාරයට මෙහි වෙනසක් නැත. නාම රූප ස්ථානයේ නාම රූප පවතී. සළායතන ස්ථානයේ සළායතන පවතී. මෙහිදී ඕපපාතික සත්ත්වයන් ගැනය. අවිද්‍යාව නිසා ක්ලේශ වට්ටය, ක්ලේශ වට්ටය නිසා කම්ම වට්ටය පහළ වෙනවා. සංඛාර ප්‍රතිසන්ධි

විඤ්ඤාණය විපාක වට්ටය පහළ වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණයත් එක්කම සාමාන්‍ය ඕපපාතික සත්ත්වයන් ගත් විට එම සත්ත්වයන් තුළ නාම රූප පහළ වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමඟ එම සත්ත්වයා අවුරුදු 16 - 18 නමැති තරුණ වයසේ දී නාම රූප පහළ වේ. නාම රූප නිසා සළායතන, මේ නාම රූපයත් සමඟ සළායතන පහල වෙනවා. මේවා වැඩ කරන්නේ නැත. වැඩ නොකළාට චක්ඛායතන, සෝතායතනාදි සියල්ල පහළ වී තිබේ. මෙය සළායතනයයි. **ඡට්ඨායතන පච්චයා ඵස්සො.** මෙතැන හේතුව මේ සළායතන පහළ වුනාට මේවායේ විඤ්ඤාණය පහළ වී නැත. චක්ඛායතනය තිබුණාට චක්ඛු විඤ්ඤාණය නැත. සෝතායතන තිබුණාට සෝත විඤ්ඤාණය නැත. ඝාණායතනය තිබුණාට ඝාන විඤ්ඤාණය නැත. ජිව්හායතනය තිබුණාට ජිව්හා විඤ්ඤාණය නැත. කායායතනය තිබුණාට කාය විඤ්ඤාණය නැත. නමුත් මනායතනය පමණයි තිබෙන්නේ. සළායතන කියන විට ආයතන සියල්ල පහළ වෙලා මෙහි දී ප්‍රතිසන්ධි සිත ගැනයි සලකා බලන්නේ. ප්‍රතිසන්ධියට මනො සම්ඵස්සය එනම් මනායතනයයි. ප්‍රතිසන්ධි මනායතනය තමයි මනො සම්ඵස්සයට උපකාරි වන්නේ. මෙයයි **ඡට්ඨායතන පච්චයා ඵස්සො** මනෝ සම්ඵස්සය නිසා වේදනාව, මනෝ සම්ඵස්සජා වේදනා, වේදනා නිසා භවයට ආශා කරන තණ්හාව, තණ්හාව නිසා උපාදානය උපාදානය නිසා භව ආදිය පහළ වෙනවා. මෙහිදී ඕපපාතික සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි අවස්ථාවයි සලකා බලන්නේ. ප්‍රතිසන්ධි චිත්තක්ෂණයෙන් පසුව භවාංග ගත වෙන්න පුළුවන් එයට ක්ෂණිකව අරමුණු ගන්න හැකිවේ. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, පහළ කර ගැනීමට හැකිවේ. අන්න ඒ වේලාවේදී තමයි **සළායතන පච්චයා ඵස්සො.** එය ප්‍රතිසන්ධි සිතෙන් අනතුරුව ඇතිවන ක්‍රියාදාමයකි. ප්‍රතිසන්ධි සිතෙන් අනතුරුව රූප දකින විට චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්සය වේදනාදී පහළ වීමට පටන් ගනී. සෝත සම්ඵස්සය පහළ වෙන්න පටන්ගනී. ඝාණායතනය ඝාණ සම්ඵස්සය, ජිව්හායතනය ජිව්හා සම්ඵස්සය, කායායතනය නිසා කාය සම්ඵස්සය

පහළ වීමට පටන් ගනී. **සළායතන පච්චයා ඵස්සො** කියන විට ප්‍රතිසන්ධියෙන් අනතුරුව ඕපපාතික සත්ත්වයන්ගේ සිද්ධාන්තයයි. බාහිර අරමුණු එන්න පටන් ගත්තාට පස්සේ, බාහිර අරමුණු එනකන් ඡට්ඨායතනය පමණයි වැඩකරන්නේ ඕපපාතික සත්ත්වයන්ගේ.

මෙය ප්‍රායෝගිකව දැකිය හැකි අවස්ථාවකි. සත්ත්වයන් භවවලට බෙදා ඒ ඒ භවවලට ගැලපීමට හැකි අවස්ථාවකි මෙය. සම්පූර්ණ ආයතන ගැන පරිපූර්ණයි. අවසාන කොටස්. මේ ආකාරයට පඤ්ච චතුෂ්කය කෙටියෙන් ඉදිරිපත් කරනු ලැබුවේ.

මෙතැනින් අපි රැස්කරගත් උතුම් වූ කුසල ශක්තිය පුණ්‍ය සම්භාරය මේ ඝෝර කටුක භයංකාර සංසාර ගමනින් එතෙරව ලබන ක්ලේශ වට්ට, කම්ම වට්ට, විපාක වට්ටයන්ගෙන් එතරව ලබන වට්ටුපච්ඡේද සංඛ්‍යාත අමා මහ නිර්වාණ ශාන්තිය පිණිස මේ උතුම් කුසල් උපකාර වේවා!

සාධු! සාධු! සාධු!

# තුන්වන දේශනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං - පෙ -**

ශ්‍රද්ධාවන්ත, වාසනාවන්ත පින්වතුනි,

ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ බුදුවීමෙන් වර්ෂ 7 ක් ගිය තැන තව්තිසා දිව්‍ය භවනට වැඩම කොට මාතෘ දිව්‍යරාජයාණන් ප්‍රමුඛ කොට ගෙන දෙවියන් බ්‍රහ්මයන් ඉදිරියෙහි පරම ගාම්භීර වූ අභිධර්ම දේශනාව 7 වන වස් කාලය පුරාවට මනුෂ්‍ය ගණනින් මාස 3 ක් දිව්‍ය වේලාවෙන් දිව්‍ය විනාඩි 9 ක් කියන මේ කාලය තුළ දී තථාගතයන් වහන්සේ දේශනා කළ සේක. දිනපතා තථාගතයන් වහන්සේ පිණ්ඩපාත වේලාව සලකාගෙන නිර්මිත බුදුරුවක් මවා "නැවත මා වඩිනා තුරු මෙතරම් ධර්ම කොට්ඨාශයක් දේශනා කරත්වා" කියා අධිෂ්ඨානය ඇතිව තථාගතයන් වහන්සේ උතුරුකුරු දිවයිනට පිණ්ඩපාතය සඳහා වැඩම කර ඒ ලැබෙන පිණ්ඩපාත දානය රැගෙන අනවතප්ත විල් තෙර ළඟදී පැන් පහසුවෙන් ඒ සියලු දාන කෘත්‍ය අවසන් කර විවේක ගැනීම පිණිස දිවා විහරණයට සඳුන් වනයට වැඩම කරන සේක. ඒ වේලාවේ දී ධර්මසේනාධිපති සාරිපුත්‍ර මහරහතන් වහන්සේ බුද්ධෝපස්ථානය පිණිස වැඩම කරනු ලබයි. සාරිපුත්‍ර මහරහතන් වහන්සේ ඒ බුද්ධෝපස්ථානය කරන අවස්ථාවේ දී තථාගතයන් වහන්සේ විස්තර වශයෙන් දේශනා කරනු ලැබූ අභිධර්ම දේශනාව මාතෘකා පද වශයෙන් පමණක් සාරිපුත්‍ර මහරහතන් වහන්සේට ඉගැන්වූ සේක. සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ ඉන් අනතුරුව තමන්වහන්සේගේ 500 ක් වූ ශ්‍රාවක පිරිසට, දේශනා කළහ. එදා බුදුරජාණන් වහන්සේ තව්තිසා දිව්‍ය භවනට වැඩම කරන්න මත්තෙන් සැවැත් නුවර දී යමක මහා පෙළහර පාන ලදී. ගන්ඩබ්බ රුක මුල දී

ඒ යමක මහා පෙළහර පෑමේ දී පැහැදුණු කුල පුත්‍රයන් 500 දෙනෙක් සසුන් ගත වූහ. ඒ කුල පුත්‍රයන් 500 දෙනාම සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේට භාර කළහ. එම 500 දෙනාට සාරිපුත්‍ර තෙරුන්වහන්සේ විස්තරත් නැති, කෙටිත් නැති අභිධර්ම දේශනාව දේශනා කළ සේක. මේ ආකාරයට ස්ථාන 3 කදී දේශනා වූ දේශනාවකි අභිධර්ම දේශනාව. එනම් බුදුරජාණන් වහන්සේ තව්තිසා දිව්‍ය භවනේ දී දේශනා කළ සේක. ඒ වාගේම සඳුන් වනයේ දී සැරියුත් මහරහතන් වහන්සේට දේශනා කළ සේක. ඊළඟට සැරියුත් ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ට උගන්වා වදාරණ සේක. මේ ආකාරයෙන් ස්ථාන 3 ක දී දේශනා වූ විශේෂිත දේශනාවකි අභිධර්ම දේශනාව. ඒ දේශනාව ග්‍රන්ථ වශයෙන් සංගීතිකාරක මහරහතන් වහන්සේලා විසින් කොටස් 7 කට බෙදන ලදී. ඒ කොටස් 7 හි දෙවන ග්‍රන්ථය කමී විභංග ප්‍රකරණය වේ. ඒ විභංග ප්‍රකරණගත පටිච්චසමුප්පාද විභංගය කොටස් කීපයකට බෙදේ. සූත්තන්ත භාජනීය සහ අභිධර්ම භාජනීය ලෙස. මේ අභිධම්ම භාජනීය නමැති කොට්ඨාශයට අයිති මාතෘකා පාඨයක් තමයි පටිච්ච සමුප්පාද අර්ථ විග්‍රහය සඳහා අප විසින් මේ මාතෘකා කරගන්නට යෙදුනේ. බුදුපියාණන් වහන්සේ මේ අභිධම්ම භාජනීය විස්තරයේ දී ප්‍රධාන වශයෙන් චතුෂ්ක 4 කට බෙදා, මාතෘකා 4 ක් දක්වන ලදී. චතුෂ්ක යනු 4 කොටස් 4 කට බෙදා ගැනීමයි. එනම් **පච්චය චතුෂ්කය, හේතු චතුෂ්කය, සම්පයුක්ත චතුෂ්කය, අඤ්ඤමඤ්ඤ චතුෂ්කය** ලෙසය.

## 01 පච්චය චතුක්කං

පච්චය චතුෂ්කයේ පච්චය; **අවිජ්ජා පච්චයා සංඛාරො**, බුදුරජාණන් වහන්සේ මේ පච්චය වචනය මුල් කරගෙන, මේ පච්චය කියන වචනය හේතු කරගෙන මාතෘකා පද 4 ක් දේශනා කර තිබේ. මාතෘකා පද 4 හි ප්‍රධාන මාතෘකාව අවිජ්ජා මූලක නමැති ක්‍රමයෙන් විස්තර කරනු ලබයි. ඊළඟට හේතු චතුෂ්කය. මෙහිදී ද බුදුරජාණන් වහන්සේ පැහැදිළි කරනුයේ **අවිජ්ජා පච්චයා සංඛාරො**, අවිද්‍යාව නිසා සංස්කාරය හටගනී. එයට හේතුව නම් අවිද්‍යා හේතුවයි. මේ ක්‍රමයට හේතු චතුෂ්කය අර්ථ විග්‍රහ කරනු ලබයි.

සම්ප්‍රයුක්ත චතුෂ්කය යනු, **අවිජ්ජා පච්චයා සංඛාරෝ**, අවිද්‍යාව නිසා සංස්කාර තෙමේ හටගනී. මේ සංස්කාර තෙමේ හටගන්නට උපකාර වන්නේ අවිද්‍යා සම්පයුක්ත වීමයි. මේ ආකාරයට සම්ප්‍රයුක්ත චතුෂ්කය අර්ථ විග්‍රහ කිරීමේ දේශනාව ආරම්භ වේ.

අඤ්ඤමඤ්ඤ චතුෂ්කය යනුවෙන් හැඳින්වෙනුයේ **අවිජ්ජා පච්චයා සංඛාරෝ, සංඛාර පච්චයාපි අවිජ්ජා**, මේ අවිද්‍යාව නිසා සංස්කාර තෙමේ හටගනී, සංස්කාර තෙම නිසා අවිද්‍යාව හටගනී යන මේ ඔවුනොවුන්ගේ ප්‍රත්‍ය සම්බන්ධය යි. මේ ආකාරයට අඤ්ඤමඤ්ඤ චතුෂ්කය පැහැදිලි කෙරේ. නැවතත් සිහිකර ගනී නම් සාමාන්‍යයෙන් පටිච්චසමුප්පාදය තමයි පච්චය චතුෂ්කය. ඊළඟට **හේතු** යන වචනය සම්බන්ධ කරගෙන, මේ අවිද්‍යාව හේතු කරගෙන, අවිද්‍යාව නිසා සංස්කාර හටගත්තා. එයට හේතුව අවිද්‍යාවයි. හේතු ප්‍රත්‍යය ප්‍රධාන කොටගත්, හේතු කියන වචනය උදව් කරගෙන ප්‍රත්‍ය විග්‍රහ කරයි. නැත්නම් චතුෂ්කය විග්‍රහ කරයි. **සම්ප්‍රයුක්ත චතුෂ්කය** යනු සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ප්‍රධාන කොට ගෙන සම්ප්‍රයුක්ත විග්‍රහය, චතුෂ්ක නය ක්‍රමය දේශනා කෙරේ. **අඤ්ඤමඤ්ඤ චතුෂ්ක** ක්‍රමය යනු අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ප්‍රධාන කරගෙන කෙරෙන පටිච්චසමුප්පාද අර්ථ විග්‍රහයකි. මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාද අර්ථ විග්‍රහය ආරම්භ කළ සේක. මාතෘකා කළ පද නැවත නැවත විස්තර කර ගත යුතුය. මෙහිදී විශේෂයෙන්ම දේශනා කර තිබෙන්නේ මාතිකා පදයි. මාතිකා යනු අර්ථ විග්‍රහ කිරීමට පෙර ඉදිරිපත් කරනු ලබන මාතෘකා පදයි. මේ මාතිකා පද අනුව ඉදිරියට කුසල් සිතක් ගානේ, අකුසල් සිතක් ගානේ, අව්‍යාකෘත සිතක් ගානේ පටිච්චසමුප්පාද අංගයන් වැඩෙන්නේ කෙසේද යන සම්බන්ධය දේශනා කෙරේ. එයයි අපට වඩාත් වැදගත් වන්නේ. යම්කිසි යෝගාවචරයෙක් තමන් විදර්ශනා පාදක භාවනා කර්මස්ථාන වඩාගෙන යන විටදී මේ නාමරූප ධර්මයන්ගේ වැටහීමක්, අවබෝධයක් ඇතිකර ගනී. ඒ පාදක විදර්ශනා ඥානය පහළ කරගත් පසු, ඒ ඥානය පච්චය පරිග්‍රහ ඥානයෙන් දියුණු කරගත හැකිවේ. පච්චය පරිග්‍රහ ඥානයේ දී පටිච්චසමුප්පාද නය ක්‍රමය ප්‍රධාන වශයෙන් කොටස් 5 කට

භාවනා කරන්නට හැකි වේ. බුදුරජාණන් වහන්සේ **අනුලෝම පටිච්චසමුප්පාදයක් දේශනා කළ සේක. මුල සිට අග දක්වා යන පටිච්චසමුප්පාදය, දෙවනුව අග සිට මුල දක්වා යන පටිලෝම පටිච්චසමුප්පාදයක් දේශනා කළ සේක. මැදින් පටන්ගෙන මුලට එන පටිච්චසමුප්පාදයක් දේශනා කළ සේක. මැදින පටන්ගෙන අගට එන පටිච්චසමුප්පාදයක් දේශනා කළ සේක.** ඊළඟට පඤ්චස්කන්ධ පටිච්චසමුප්පාදයක් දේශනා කළ සේක. අතීත හේතු 5 ක් නිසා වර්තමාන ඵල 5 ක්, වර්තමාන හේතු 5 ක් නිසා අනාගත ඵල 5 ක් ලෙස පඤ්චස්කන්ධ ක්‍රමයට පටිච්චසමුප්පාදය හේතු ඵල අනුව දේශනා කළ සේක.

මේ පටිච්චසමුප්පාද නය ක්‍රම 5 යෝගාවචරයෙකුට භාවනා වශයෙන් වඩා ගැඹුරට වැඩිය හැකි වේ. එක සිතක් සිතක් ගානේ අපේ සන්තානය තුළ පහළ වෙන චිත්ත පරම්පරා, කුසල් සිත් පරම්පරාවන්, අකුසල් සිත් පරම්පරාවන්, විපාක සිත් පරම්පරාවන්, ක්‍රියා සිත් පරම්පරාවන් චිත්ත වීථි වශයෙන් ඇති වේ. ඒ පහළ වෙන සෑම චිත්තක්ෂණයක් චිත්තක්ෂණයක් ගානේ මේ පටිච්චසමුප්පාද ධර්මයන් බැලිය යුතු වේ. එයයි බුදුරජාණන් වහන්සේගේ අර්ථ විග්‍රහය. ඒ අර්ථ විග්‍රහයට කලින් මාතෘකා පද ටිකයි දේශනා කෙරෙනුයේ. පළමුව මාතෘකා පදවල තිබෙන අර්ථය හඳුනාගත යුතුයි. මීට පෙරත් මාතෘකා පද පිළිබඳව කෙටි අර්ථ විග්‍රහයක් කරන ලදී. මෙහිදී චතුෂ්කය කොටස් 4 කි. පච්චය මාතෘකාව යටතේ පද 4 ක් තිබේ. උදා:- **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං.** මේ අනුව අවිද්‍යා නිසා සංස්කාර තෙමේ හටගනී. සංස්කාර නිසා විඤ්ඤාණ තෙමේ හටගනී. විඤ්ඤාණ නිසා නාම හටගනී. නාම ප්‍රත්‍යයෙන් ඡට්ඨායතනය හෙවත් මනායතනය හටගනී. ඡට්ඨායතන ප්‍රත්‍යයෙන් ඵස්ස චෛතසිකය, ඵස්සය හටගනී. ඵස්ස නිසා වේදනාව හටගනී. වේදනාව නිසා තණ්හාව හටගනී. තණ්හාව නිසා උපාදානය හටගනී. උපාදානය නිසා භවය හටගනී. භවය නිසා ජාතිය හටගනී. ජාතිය නිසා ජරාමරණ හටගනී. මෙයින් දුක්ඛ ස්වභාවය පැහැදිළි කරගත හැක.

මෙය අප සාමාන්‍යයෙන් දන සිටි ආකාරයට හා සූත්‍ර දේශනාවල දකින්න ලැබෙන පටිච්චසමුප්පාද අංගයන්වලට වඩා වෙනස් වේ. නමුත්

බුදුරජාණන් වහන්සේ මෙතැනදී දේශනා කරන්නේ ඒ පටිච්චසමුප්පාද අංගයන් එක් එක් භව අනුව බෙදනු ලබන ආකාරයයි. අරූපීතල සත්ත්වයන්ට කෙසේද පටිච්චසමුප්පාද අංගයන් ගලපන්නේ? අසංඥතල සත්ත්වයන්ට, බ්‍රහ්මලෝක බ්‍රහ්මයන්ට, දෙව්ලොව දෙවියන්ට, මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයන්ට කෙසේද මේ පටිච්චසමුප්පාද අංගයන් ගලපන්නේ? ඕපපාතික සත්ත්වයන්ට, සංසේදජ, අණ්ඩජ, ජලාබුජ සත්ත්වයන්ට කෙසේද පටිච්චසමුප්පාද අංගයන් ගලපනු ලබන්නේ? මේ සත්ත්ව කොට්ඨාශ, සත්ත්වයන් ජීවත්වන භූමි අනුව මේ පටිච්චසමුප්පාදය වෙනස් වේ. නමුත් අප මෙහිදී මාතෘකා කොට ඇත්තේ සම්පූර්ණ පොදු දේශනාව වේ. ඒ පොදු මාතෘකාව තමයි අප හැමෝම හඳුනාගෙන සිටින්නේ. මෙම පොදු මාතෘකාව විවිධ කොට්ඨාශවලට බෙදීමෙන් අර්ථ සාදාගැනීමට සිදුවේ. නමුත් බුදුරජාණන් වහන්සේ අභිධර්ම දේශනාවේදී එය වෙන වෙනම බෙදා දක්වනු ලබයි. එය අපට බොහොම වැදගත්වේ.

## i පළමු නය ක්‍රමය

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො** - අවිද්‍යාව නිසා සංස්කාරය හටගනී. අතීත හේතු දෙකකි. යම් කෙනෙක් ආකාසානඤ්චායතනය වඩා ඒ කුසලය මරණාසන්න මොහොතේ දී මතුවේ. ඒ තැනැත්තා ඒ ධ්‍යාන කුසලය වඩන ගමන් සිතනවා, මට මේ කුසලය හේතු කරගෙන අරූපීතලයේ උපදින්න ලැබේවා කියා. එනම් අවිද්‍යාව පදනම් වී තිබේ. ඒ අවිද්‍යාව හේතු කරගෙන, අවිද්‍යාව නිසා මරණාසන්න අවස්ථාවේ දී ආකාසානඤ්චායතන අරමුණු කොට කුසල් ජවන් සිත් පහළ වුණා. ඒ කුසල ශක්තිය හේතු කරගෙන, **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** - කුසල් සංස්කාර හේතු කරගෙන, අරූපී තලයේ ආකාසානඤ්චායතන බඹලොව ප්‍රතිසන්ධි ලබයි. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය යනු විපාක සිතකි. අවිද්‍යාව නමැති ලෝභ මූල අකුසල් සිත හේතු කරගෙන සංස්කාර නමැති ආකාසානඤ්චායතන කුසල් චේතනාව පහළ විය. සංස්කාර නම් වූ ආකාසානඤ්චායතන නිසා හටගත් කුසල චේතනාව හේතු කරගෙන ආකාසානඤ්චායතන විපාක නම් වූ ආකාසානඤ්චායතන බඹලොව ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ විය.

**විඤ්ඤාණ පච්චයා නාමං** - ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග නාම ධර්ම පහළ විය. එය අරූපී තල චතුත්ථ ධ්‍යාන බඹලොවකි. චතුත්ථ ධ්‍යානය නිසා විතක්ක, විචාර, ප්‍රීති සහ සුඛ නැත. සුඛ වෙනුවට උපෙක්ඛාව යෙදෙයි. ධ්‍යාන නාම ධර්ම සියල්ල 31 කි. නාම ධර්ම 31 න් විඤ්ඤාණය යනු එක ස්කන්ධයකි. විඤ්ඤාණය නමැති නාම ස්කන්ධය, වේදනා, සංඥා, සංඛාර යන සෙසු නාම ස්කන්ධය සෙසු නාම ස්කන්ධයට උපකාරී වේ.

**නාම පච්චයා ෂට්ඨායතනං** - මෙතැනදී සළායතන ගැනයි සලකන්නේ. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය සහ මන නමැති ආධ්‍යාත්මික ආයතන 6 ගැනයි. නමුත් බාහිර ආයතන ගැනද කථා කිරීමට හැකියි. ආකාසානඤ්චායතන බඹ ලොව ඉපදුන ඒ සත්ත්වයා ෂට්ඨායතනය පමණයි පවතිනුයේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නමැති මනායතනයයි. වේදනා, සංඥා, සංඛාර නමැති ස්කන්ධ 3 යි නැවත උදව් කරන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය නමැති මනායතනයට හෙවත් ෂට්ඨායතනයට.

**ෂට්ඨායතන පච්චයා ඵස්සො** - ප්‍රතිසන්ධි මනායතනය ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග පහළ වූ ඵස්ස චෛතසිකයට උපකාර කරයි.

**ඵස්ස පච්චයා වෙදනා** - ඒ සිතේ පහළ වූ වේදනාවට, එනම්, උපෙක්ඛා සහගත වේදනාවයි.

**වෙදනා පච්චයා තණ්හා** - මෙහිදී ගැටළුවක් මතු වේ. හේතුව නම් ඒ සිතේ තණ්හාව නොමැති බැවිනි. එහි තණ්හාව නැතිනම් කෙසේද තණ්හාව ගැන මෙහිදී සාකච්ඡා කෙරෙන්නේ. සාමාන්‍යයෙන් සත්ත්වයෙක් භවයක් අල්ලා ගන්නා විටදී, ඒ ප්‍රතිසන්ධියෙන් අනතුරුව භවංග ගත වී, ඒ සත්ත්වයා ඒ භවයට ඇලුම් කරන ලෝභ සහගත සිතක් පහළ වේ. නැතිනම් ඒ සත්ත්වයාට එම භවයේ සිටිය නොහැක. භවයේ රැඳීමට නොහැකිය. උදා:- (අ) යමෙක් යම් ස්ථානයකට ගිය විටදී එම ස්ථානය හොඳයි නම්, ලස්සනයි නම්, එහි රැඳී සිටීමට කැමති වෙයි. එම ස්ථානය හොඳ නැති නම්, කවදාවත් එහි නොසිටී. (ආ)

භික්ෂූන් වහන්සේනමක් සඳහා නැවතීමට කුටියක් අවශ්‍ය වූ හෙයින් කුටියක් කරා වැඩම කර, එම කුටිය තමන්ට සුදුසු ද නැති ද සොයා බලයි. එය සුදුසු නැතිනම් එය තණ්හාවෙන් බාර ගන්නේ නැතිව, වෙනත් සුදුසු කුටියක් කරා වැඩම කොට එය සුදුසු වේ නම් එහි රැඳී සිටීමට කැමති වේ.

මේ ආකාරයෙන් සත්ත්වයෙක් ප්‍රතිසන්ධිය ලැබූ පසු ඒ ප්‍රතිසන්ධි සිතෙන් අනතුරුව ඒ ඉපදුන ස්ථානයට ආශා කරන තණ්හා සිතක්, චිත්ත පරම්පරාවක්, ලෝභමූල සිතක් ඇතිවේ. එය භව නිකන්තික ලෝභ චිත්ත වීථියයි. එබැවින් ප්‍රතිසන්ධි වේදනාව නිසා, වේදනාව හේතු කරගෙන, තණ්හාව පහළ වේ. මෙහිදී තවදුරටත් පැහැදිළි කෙරේ නම්, ප්‍රතිසන්ධි මනෝ සම්ඵස්සජා වේදනාව නිසා පහළ වේ.

**තණ්හා පච්චයා උපාදානං** - සාමාන්‍යයෙන් තණ්හාව යනු ලෝභයකි. තණ්හාවට උපාදාන වන්නා වූ කරුණක් නොව මෙහිදී අදහස් වන්නේ. උපාදාන 4 ක් තිබේ. කාම, දිට්ඨි, භව, අවිද්‍යා වශයෙනි. නමුත් මෙහිදී අදහස් වනුයේ ඒ භවයට ඇලුම් කර එහි දක්වන උපාදානයක් නොවේ. නමුත් එහිදී ද උපාදානයක් පවතී. ඒ උපාදානය ගැනීමට හැකිය. නමුත් මෙහිදී විශේෂයෙන් ස්කන්ධ වශයෙන් බෙදීමේදී උපාදානය ලෙස සලකන්නේ සංස්කාර ස්කන්ධයයි. ඒ නිසා **තණ්හා පච්චයා උපාදානං** යැයි ගන්නා විට ඒ තණ්හාව නිසා නැවත තණ්හා සිතක් පහළ වෙනවා සංස්කාර ස්කන්ධය ලෙසින්. ප්‍රතිසන්ධි විඤ්ඤාණ සිතෙත් සංස්කාර පවතී. මේ සංස්කාර ස්කන්ධයයි උපාදානය. මෙය පරමාර්ථ වශයෙන් බෙදා දක්වනු ලැබේ.

**උපාදාන පච්චයා භවො** - මේ උපාදානය යනු සංස්කාර ස්කන්ධයයි. මේ උපාදානය හැර ඉතිරි නාම ස්කන්ධයන්ට භවය යැයි කියනු ලැබේ. මේ පිළිබඳව ඉදිරි දේශනාවල පැහැදිළිව අවබෝධ කරත හැක. "**තත්ථ කතමො උපාදාන පච්චයා භවො, ඨපෙත්වා උපාදානං, වෙදනාඛන්ධො, සඤ්ඤාඛන්ධො, සඞ්ඛාරඛන්ධො, විඤ්ඤාණඛන්ධො, අයං වුච්චති උපාදාන පච්චයා භවො**" උපාදානය නිසා භවය හටගන්නවා යනු උපාදානය හැර (උපාදනය යනු සංස්කාර ස්කන්ධයේ කොටසකි)

ඉතිරි වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි භවය. එනම් ප්‍රතිසන්ධි සිතේ සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි භවය. සාමාන්‍යයෙන් භවය කොටස් 2 කට බෙදා අර්ථ විග්‍රහ කරනු ලැබේ. **කම්ම භවය, උප්පත්ති භවය.** කම්ම භව යනු කර්ම ශක්ති යයි උප්පත්ති භවය යනු ඉපදුනු ස්ථානයයි. යම් තැනක ප්‍රතිසන්ධිය ලැබුවා නම් ඒ වෙලාවේ සතර නාම ස්කන්ධයන් ඉපදුනා යනු එතැන භවයයි.

**භව පච්චයා ජාති** - ජාති යනු ඒ නාම ස්කන්ධයන්ගේ මුල්ම හටැනීම, ප්‍රතිසන්ධි උත්පාදක්ෂණයයි. ජාතිය කොටස් 2 කට; රූප ජාති, නාම ජාති ලෙස බෙදිය හැක. මෙහිදී සාකච්ඡා වනුයේ පටිච්චසමුප්පාද දේශනාවට අනුවයි. අරූපී තලය නිසා අරූපී තලයේ රූප ජාතිය නැත. නාම ජාතිය පවතී. නාම ජාතිය යනු නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි. නාම ජාතිය ස්කන්ධ වශයෙන් බෙදීමේදී, සංස්කාර ස්කන්ධය නාම ස්කන්ධයේ හටගැනීමයි. උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව නම් වේ.

**ජාති පච්චයා ජරා මරණං** - ප්‍රතිසන්ධි චිත්තක්ෂණය පහළ වූ නිසා ජාතිය ඇති වේ. ජාතිය නිසා ජරා මරණ ඇති වේ. නාම ධර්මයන් ඨිති මොහොතට පත්වීම, නාම ධර්මයන් භංගවීම, ප්‍රතිසන්ධි සිත භංගවීම යයි. මේවා ජරා මරණ නම් වේ. මේ ආකාරයට පටිච්ච සමුප්පාදය අවබෝධ කරගත හැකියි.

(මෙහිදී සාකච්ඡා වනුයේ ප්‍රතිසන්ධි අවස්ථාවය. නැතිනම් සෑම චිත්තක්ෂණයකදීම උත්පාදක්ෂණය තමයි ජාතිය. සෑම චිත්තක්ෂණයකම ඨිතික්ෂණය තමයි ජරාව. සෑම චිත්තක්ෂණයකම භංගක්ෂණය තමයි මරණය. මේ නාම ධර්මයන්ගේ, නාම ස්කන්ධයන්ගේ ජාති, ජරා, මරණ තේරුම් ගැනීමට අපහසුයි. කය වයසට ගියත්, සිත වයසට නොයන බව අසා තිබේ. සිතට කෙලෙස්, කුසල් කියන දේ වයසට ගියත් පහළ වේ. ළමා කාලයේත් පහළ වේ. සිත වයසට නොයයි. එබැවින් මේ සිත තේරුම් ගැනීමට අපහසුයි. නමුත් මේ රූප කයේ නම්, ජාති, ජරා, මරණ ඉක්මණින් වැටහේ. අපට සාමාන්‍යයෙන් බැලූ බැල්මට මේ

රූපය ඕලාරික හෙයින් ඉපදුන නිසා වයසට යාම, මරණයට පත්වීම, පෙනේ. නමුත් මෙය පරමාර්ථ වශයෙන් බලනවිට දී, සෑම චිත්තක්ෂණයකම රූප කලාප හටගනී. ඒ රූප කලාප හටගැනීම තමයි ජාතිය. එම රූප කලාප චිත්තක්ෂණ 17 ක් දක්වා ජීවත් වේ. පළමු චිත්තක්ෂණය පහළ වී දෙවැනි චිත්තක්ෂණයේ සිට 16 වැනි චිත්තක්ෂණය දක්වාම පවතී. මෙය ඨිතිය. එනම් ජරාවයි. 17 වැනි චිත්තක්ෂණය සමගම ඒ රූපයන් භංගවී යයි. ඒ භංගවීම මරණයයි. මෙය පරමාර්ථ වශයෙන් රූපයාගේ, ජාති, ජරා, මරණය. නමුත් මෙහිදී දේශනාවේ රූප ගැන කථා කිරීමක් නොමැත.)

මෙය අරූපී තලයට සම්බන්ධ කරගත් විට ඉහත ආකාරයටයි අර්ථ විග්‍රහ වන්නේ බුදුරජාණන් වහන්සේ මෙහිදී පච්චය විග්‍රහයක් කරයි. සාමාන්‍යයෙන් පොදුවේ හැම භවයකටම මේ දේශනාව කළ හැකිය. එනම් රූපය සම්බන්ධ කරගන්නේ නොමැතිව මේ කියන අර්ථ විග්‍රහය හැම භවයකටම යෙදිය හැක. අසංඥ තලය හැර අරූපී තල 4 ට, බ්‍රහ්ම ලෝකයට, දිව්‍ය ලෝකයට සහ මනුෂ්‍ය ලෝකයට, හැම ලෝකයකටම සම්බන්ධ කර ගත හැකිය. රූප ස්කන්ධය අත් හැරයි අර්ථ විග්‍රහය කළ යුත්තේ. මෙ ඍජුවම අරූපී තලයටයි සම්බන්ධ වන්නේ. නමුත් අසංඥ තලය හැර අනෙක් හැම භවයකටම සම්බන්ධ කළ හැකි අතර, රූපය අත්හැර සාකච්ඡා කළ යුත්තේ. ප්‍රතිසන්ධි අවස්ථාවේ දී තමයි සහජාත වශයෙන් කර්මජ රූප පහළ වෙන්නේ. නමුත්, ඊළඟ අවස්ථාවේ සහජාත වශයෙන් චිත්තජ රූප ද පහළ වේ. ඒ හේතුවෙන් මේ නය ක්‍රමයේ දී රූපය ගැන අත්හැර සාකච්ඡා කළ හැක.

## ii දෙවන නය ක්‍රමය

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමං** - පෙ - මෙහිදී කරන අර්ථ විග්‍රහය නම්, අවිද්‍යාව නිසා සංස්කාර තෙමේ හටගනී. සංස්කාරය නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය හටගනී. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම ස්කන්ධයන් පහළ වේ. (වේදනා, සංඥා, සංඛාර, නාම ස්කන්ධයන්.) නාම ස්කන්ධ නිසා ඵස්ස පහළ වේ. නාම ස්කන්ධ කියන විටදී මෙහිදී වේදනා, සංඥා, සංඛාර,

විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධයම සම්බන්ධ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං** හි විඤ්ඤාණ ස්කන්ධය නිසා වේදනා, සංඥා, සංඛාර ස්කන්ධයන් පහළ විය. **නාම පච්චයා ඵස්සො** හි දී වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධය නිසා මනෝ සම්ඵස්සය පහළ වේ. (පළමු පදයේ දී, නාමය විඤ්ඤාණ ස්කන්ධය හැර, දෙවැනි පදයේ දී, විඤ්ඤාණ ස්කන්ධය තිබේ. විඤ්ඤාණ ස්කන්ධය ඉතිරි නාම ස්කන්ධයන්ට උදව් වේ.) **නාම පච්චයා ඵස්සො** හි සතර නාම ස්කන්ධයන් ස්පර්ශයට උපකාර විය. මෙතැනදී ෂඩ්ායතනය සම්බන්ධ කරගෙන නැත. ෂඩ්ායතනය සම්බන්ධ කර නොගත් මුත් අර්ථ වෙනසක් සිදු නොවේ. ප්‍රතිසන්ධි අවස්ථා ගැන සලකා බලන හෙයිනි. ෂඩ්ායතනය යනු නැවත මනායතනය සම්බන්ධ කරගැනීමයි. මනායතනය නාම ධර්ම තුළ ෂඩ්ායතන සඳහන් නොවුනත් සම්බන්ධය පවතී. **ඵස්ස පච්චයා වේදනා,** ස්පර්ශය නිසා වේදනා, වේදනාව නිසා තණ්හාව, තණ්හාව නිසා උපාදානය, උපාදානය නිසා භවය, භවය නිසා ජාතිය, ජාතිය නිසා ජරා මරණ. මෙය අපට ඍජුවම අරූපී තලයේ සත්වයන්ට සම්බන්ධ කළ හැකිය. අරූපී තලයේහි ෂඩ්ායතන සම්බන්ධයක් නොවී ප්‍රතිසන්ධි අවස්ථාවේ දී ඍජුවම නාම ස්කන්ධයෝ සමඟ මනෝ සම්ඵස්සය, මනෝ සම්ඵස්සජා වේදනාව සම්බන්ධ කරගෙන විස්තර කළ හැක. පච්චය යටතේ දෙවැනි නය ක්‍රමය සම්බන්ධ වන්නේ අරූපී තලයටම පමණි.

## iii තුන්වන නය ක්‍රමය

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො** - පෙ - මෙහිදී පවතින වෙනස නම්, සළායතන වෙනුවට ෂඩ්ායතන සම්බන්ධවීමයි. මේ නය ක්‍රමය දේශනා කරනුයේ ගබ්භසෙය්‍ය සත්ත්වයන්ටය. මවු කුසක් ඇසුරු කරගෙන උපදින සත්ත්වයන් සිටී. ඒ සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි අවස්ථාව ඔවුන්ගේ පටිච්චසමුප්පාදයයි. අවිද්‍යාව නිසා සංස්කාර තෙම, සංස්කාර නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය, ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම රූප. මවු කුසක ප්‍රතිසන්ධි ගන්නා විට ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමඟම නාම රූප පහළ වේ.

"ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො"
"ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො"
"ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං නිසසය පච්චයෙන පච්චයො"
"ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤ අත්ථි පච්චයෙන පච්චයො"
"ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤ අවිගත පච්චයෙන පච්චයො"

මේ ආකාරයෙන් ප්‍රතිසන්ධි නාමරූපයන් එකට පහළ වේ. එනම් ඔවුනොවුන් එකට බැඳී සහජාත වශයෙන් නිස්සය කරගෙන, අත්ථි, අවිගත වශයෙනි. ඒ ප්‍රතිසන්ධි අවස්ථාවේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා වේදනා, සංඥා, සංඛාර නාම ස්කන්ධ 3 පහළ වේ. කර්මජ රූප 3 ක්, ප්‍රධාන වශයෙන් මිටි 3 ක්, කාය දසක, භාව දසක, වස්තු දසක ලෙස හෘදය වස්තුව ඇසුරු කරගෙන පහළ වේ. ප්‍රතිසන්ධි සිතක් පැමිණීමට පෙර හෘද වස්තු රූපයක් මවු කුසේ පැවතුණේ නැත. ප්‍රතිසන්ධි සිතත් සමඟ එකටම මෙය පහළ විය. මෙය **විඤ්ඤාණ පච්චයා නාම රූපං** ලෙස හැඳින්වේ. නාම රූප පහළ විය. **නාම රූප පච්චයා ෂටඨායතනං;** ප්‍රතිසන්ධි නාම රූප නිසා මනායතනය පහළ වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වූ බැවින් ප්‍රතිසන්ධි මනායතනයට නාම රූප උදව් වේ. **ෂටඨායතන පච්චයා ඵසෙසා;** මනායතනය නිසා ඵස්ස, තවත් පැත්තකින් මනෝ සම්ඵස්සය. ඵස්සය නිසා වේදනාව, මනෝ සම්ඵස්සජා වේදනාව. මේ ප්‍රතිසන්ධි සිත නිසා මේ භවයට ඇලුම් කිරීමේ ලෝභ මූල සිතක් පහළ වේ. තව ආකාරයකින් උපාදානය නිසා උපාදාන සිතකුත් පහළවීමට ඉඩ ඇත. තණ්හාව සමඟ උපාදානය බැඳී පවතින හෙයිනි. මේ තණ්හා සිතේම උපාදානය බැලීමට පුළුවනි. එනම් මේ තණ්හාව නිසා උපාදානය පහළ වූ බැවිනි. **උපාදාන පච්චයා භවො;** ප්‍රතිසන්ධි අවස්ථාව සම්බන්ධ කරගත් විට ප්‍රතිසන්ධි සිතේ උපාදානය සංස්කාර ස්කන්ධයයි. සංස්කාර ස්කන්ධය නිසා භවය පහළ වේ. වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ

යන සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම භවය හෙවත් උත්පත්තියයි. මේ භවය නිසා ජාතිය. ඒ සතර නාම ස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය ජාතිය යි. උත්පාදක්ෂණය හේතුවෙන් ජරාවට සහ මරණයට (ඨිතියට සහ භංගයට) ගමන් කරයි. මෙයි ගබ්භසෙය්‍ය සත්ත්වයන්ට අදාළ දේශනාවකි.

## iv හතරවන නය ක්‍රමය

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො - පෙ - නාම රූප පච්චයා සළායතනං, ඡට්ඨායතන පච්චයා ඵස්සො;** සිංහල ග්‍රන්ථවල සඳහන් වනුයේ **සළායතන පච්චයා ඵස්සො** ලෙසය. නමුත් ඡට්ඨ සංගායනාවේ දී **ඡට්ඨායතන පච්චයා ඵස්සො** ලෙස දක්වේ. අවිද්‍යාව නිසා සංස්කාර තෙම, සංස්කාර නිසා විඤ්ඤාණය (ප්‍රතිසන්ධි), ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම රූප පහළ වේ. නාම රූප නිසා සළායතන පහළ වේ. සළායතන සම්බන්ධයක් දක්වේ නම්, ඕපපාතික සත්ත්වයන් පිළිබඳවය. ප්‍රතිසන්ධි සිතක් සමඟ සළායතන; සියලු ආයතන අංග සම්පූර්ණව පහළ වන්නේ ඕපපාතික සත්ත්වයන්ට පමණයි. එබැවින් **නාම රූප පච්චයා සළායතනං** වේ. ඕපපාතික සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි අවස්ථාවේ දී) මේ ප්‍රතිසන්ධි නාම රූප සමඟ චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන නමැති සියලු ආයතනයන් පහළ වේ.

සිංහල ත්‍රිපිටකයට අනුව සළායතන පච්චයා ඵස්සො; මේ අවස්ථාව ප්‍රතිසන්ධි අවස්ථාවට ගැලපිය නොහැක. සළායතන පැවතුනාට සළායතනයන්ගේ ස්පර්ශයක් ප්‍රතිසන්ධි සිතත් සමඟ පහළ නොවේ. ඇසෙන් අරමුණක් ගන්නා අවස්ථාවේ දී, කනෙන් ශබ්දයක් ගන්නා අවස්ථාවේ දී, ඒ අරමුණක් ගන්නා අවස්ථාවේ දී තමයි කෙළින්ම ආයතන පහළ වෙන්නේ. සළායතන නිසයි ස්පර්ශය පහළ වෙන්නේ.

උදා:- චක්ඛු සම්ඵස්සය, සෝත සම්ඵස්සය, ඝාන සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කාය සම්ඵස්සය සහ මනො සම්ඵස්සය යන ඵස්ස 6 ක් පවතී. ඕපපාතික සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධික්ෂණයේ දීම ආධ්‍යාත්මික ආයතන සම්පූර්ණයි. එබැවින් **නාම රූප පච්චයා සළායතනං** වේ.

**සළායතන පච්චයා ඵස්සො** කියන විටදී ප්‍රතිසන්ධි අවස්ථාව නොවේ යයි අදහස් කරන්නේ, ප්‍රතිසන්ධි අවස්ථාවෙන් පසුව ඒ තැනැත්තා යම් අරමුණක් යම් ද්වාරයකින් ගන්නා අවස්ථාවේ දී චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස ආදිය පහළ වේ. එබැවින් සිංහල පොතේ සඳහන් මාතෘකා පදය ප්‍රතිසන්ධි අවස්ථාවට ගැලපිය නොහැකි වේ. නමුත් ඡට්ඨ සංගායනාවේ කෙරෙන අර්ථ විග්‍රහය ගැලපීමට හැකි වේ. **නාම රූප පච්චයා සළායතනං;** ප්‍රතිසන්ධි සිතත් සමඟ සියලු ආයතන පහළ විය. **ඡට්ඨායතන පච්චයා ඵස්සො;** ප්‍රතිසන්ධිය ලැබුවත් ප්‍රතිසන්ධි සිතේ පවතින්නේ විඤ්ඤාණ ස්කන්ධය පමණි. මනෝ සම්ඵස්සයයි. අනෙක් ආයතන ප්‍රතිසන්ධි සිතත් සමඟ පහළ නොවේ. නමුත් මනායතන පවතී. සළායතන පහළ වූවාට මනායතන පමණයි ඵස්ස චෛතසිකයට උදව් වනුයේ. ඕපපාතික සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි සිත නිසා මනෝ සම්ඵස්සය පහළ වේ. එනම් ඵස්ස චෛතසිකයයි. **ඵස්ස පච්චයා වෙදනා;** ඒ සිතේ පහළ වන වේදනාවයි, **වෙදනා පච්චයා තණ්හා;** ඒ භවයට ඇලුම් කරන තණ්හා සිතයි. **තණ්හා පච්චයා උපාදාන;** උපාදානය අර්ථ 2 කට ගත හැකිය. ඒ භවයේ තණ්හාවත් සමඟ පහළ වුනු දිට්ඨි උපාදානය සහ ඒ ප්‍රතිසන්ධි සිතේ පහළ වූ සංස්කාර ස්කන්ධය තමයි උපාදාන ලෙස සැලකෙන්නේ. **උපාදාන පච්චයා භවො;** වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධයන්ගේ පහළවීමයි. **භව පච්චයා ජාති;** ඒ ප්‍රතිසන්ධි සිතේ උත්පාදක්ෂණය. ඊළඟට ඨිතික්ෂණය සහ භංගක්ෂණය වේ. මේ ආකාරයෙන් පටිච්චසමුප්පාද නය ක්‍රමයෙන් පළමු චතුෂ්ක හතර තෝරාගනු ලැබේ.

සාදු! සාදු! සාදු!

# සතරවන දේශනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

## 02 හේතු චතුක්කං

මෙහිදී සිද්ධාන්තය එක හා සමානයි. නමුත් අර්ථ විග්‍රහයේ දී සුළු සුළු වෙනස්කම් පවතී.

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො අවිජ්ජා හෙතුකො** - යමෙකුගේ සිතේ සංස්කාර හටගනී. සංස්කාර හටගැනීමේ ප්‍රධාන හේතුව අවිද්‍යාවයි. එබැවින් බුදුරජාණන් වහන්සේ දේශනා කරනුයේ, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො.** එනම්, **අවිජ්ජා හෙතුකො.** උදා:- කුසලයක් කරන අවස්ථාවේ දී කිරීමට පෙර හෝ පසු සෑම අවස්ථාවක දීම මෙම කුසලය සිදුකරන්නේ අවිද්‍යාව සමඟය. සෑම විටම අවිද්‍යාව හේතු වේ. එබැවින්, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො අවිජ්ජා හෙතුකො** - එනම්, අවිද්‍යාව හේතුවයි. අවිද්‍යාව ගත්විට විට ප්‍රධාන වශයෙන් ලෝභ මූල සිත්ය. ලෝභ මූල චිත්ත පරම්පරාවන් පහළ වේ. එම චිත්ත පරම්පරාවන්ගේ පවතින අවිද්‍යා ස්වභාවය, මෝහ ස්වභාවය සමඟ තණ්හා උපාදාන මේ සෑම දෙයක්ම අවිද්‍යාව ලෙස ගැනේ. මේ අවිද්‍යාව නිසා සංස්කාරය හටගනී, එනම් කුසලාකුසල චේතනායි. කුසලාකුසල චේතනාව හටගැනීමේ ප්‍රධාන හේතුව අවිද්‍යාවයි.

**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං සඞ්ඛාර හෙතුකං** - කුසලාකුසල චේතනා නිසා හටගන්නා ප්‍රතිසන්ධි විඤ්ඤාණය ප්‍රධාන කොටගත් විඤ්ඤාණයි. මේ විඤ්ඤාණ හටගැනීමේ ප්‍රධාන හේතුව නම් සංස්කාරයයි. සංස්කාර නැතිනම් විඤ්ඤාණ හටනොගනී. අවිද්‍යාව නැතිනම් සංස්කාර හටනොගනී. සංස්කාර නැතිනම් විඤ්ඤාණ හටනොගනී.

**විඤ්ඤාණ පච්චයා නාමං විඤ්ඤාණ හෙතුකං** - ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා සෙසු නාම ස්කන්ධ පහළ වේ. එයට හේතුව

විඤ්ඤාණයයි. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වූ නිසා තමයි අනෙක් නාම ධර්ම පහළ වූයේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වූයේ නැතිනම් අනෙක් නාම ධර්ම පහළ නොවේ.

**නාම පච්චයා ෂටායතනං නාම හෙතුකං** - මේ ත්‍රිවිධ නාම ස්කන්ධ පහළ වූ බැවින් මනායතනය පහළ විය. වේදනා - සංඥා-සංස්කාරයන නාම ස්කන්ධයාගේ පහළවීම නැතිනම් මනායතනයේ පහළවීමක් ද නැත. එනම් නාමය හේතුවයි.

**ෂටායතන පච්චයා ඵසෙසා ෂටායතං හෙතුකං** - ඵස්ස චෛතසිකය පහළ වූයේ මනායතනය නිසයි. මනායතනය නොමැති නම්, ඵස්ස චෛතසිකයේ ද පහළවීමක් නැත. එබැවින් ඵස්ස චෛතසිකයේ හේතුව මනායතනයයි. (මෙහි ඵස්ස යනු මනෝ සම්ඵස්සයයි.)

**ඵස්ස පච්චයා වෙදනා ඵස්ස හෙතුකං** - ඒ සිතේ වේදනාව පහළ විය. මේ වේදනාව පහළ වූයේ ඵස්ස චෛතසිකය, ස්පර්ශය නිසයි. ස්පර්ශය නොතිබුණා නම්, වේදනාව පහළ නොවේ. වේදනාවට හේතුව ඵස්ස හේතුවයි.

**වෙදනා පච්චයා තණ්හා වෙදනා හෙතුකං** - මනෝ සම්ඵස්සජා වේදනාව නිසා පහළ වන භවයට ඇලුම් කරන තණ්හාව, ඒ තණ්හාව ඇතිවූයේ වේදනාව නිසාය. එනම් වේදනා හේතුවයි.

**තණ්හා පච්චයා උපාදානං තණ්හා හෙතුකං** - තණ්හා නිසා උපාදානය හටගනී. භවයට ආසාව නිසා උපාදානය ඇතිවේ. ඒ උපාදානය ඇතිවූයේ තණ්හාව නිසයි. භවය එතැනින් අල්ලා ගැනීමයි.

**උපාදාන පච්චයා භවො** - එතැන දී **උපාදාන හෙතුකං** ලෙස යෙදී නොමැත. මෙහිදී සාකච්ඡා කරනුයේ ප්‍රතිසන්ධි අවස්ථාව බැවිනි. ප්‍රතිසන්ධි නාමස්කන්ධ හතර දෙනාගේ හටගැනීම භවය වේ. ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගේ හටගැනීම භවය නම්, එයට උපාදානයක් නැත. **උපාදාන හෙතුකං** ලෙස කිව නොහැක.

**වෙදනා පච්චයා තණ්හා වෙදනා හෙතුකං** - වේදනාව නිසා තණ්හාව හටගනී. ප්‍රතිසන්ධි වේදනාව නිසා මේ භවයට ඇලුම් කරන

තණ්හා මූල සිතක් පහළ වේ. එයට හේතුව නම් ප්‍රතිසන්ධියේ දී ලැබූ වේදනාව, මනෝ සම්ඵස්සජා වේදනාවයි.

**තණ්හා පච්චයා උපාදානං** - භවයට ඇලුම් කිරීම නිසා උපාදානයක් හටගනී. **තණ්හා හෙතුකං** - තණ්හාව නිසා උපාදානය හටගනී යනු තණ්හා මූල සිතක් පහළ වේ. මේ තණ්හා මූල සිත තුළ උපාදාන පවතී. කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන පවතී. නමුත් මෙතැනදී කාම උපාදානය නොගනී. එය තණ්හාව බැවිනි. තණ්හා නිසා දිට්ඨි ප්‍රධාන කරගත් උපාදානය ඇතිවේ. එම තණ්හා මූල සිත තුළ, ඒ තණ්හාව නිසා උපාදානය හටගනී. තණ්හාව හේතුවයි.

**උපාදාන පච්චයා භවො** - උපාදානය නිසා භවය හටගනී. මේ කියන උපාදානය පෙර තණ්හාවත් සමඟ ඇති වූ උපාදානය නොවේ. ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි වූ, සංස්කාර ස්කන්ධයයි උපාදානය. මෙහි වෙනස අවබෝධ කර ගත යුතුයි. මෙහිදී **උපාදාන පච්චය භවො** යන්න තණ්හාව සමඟ ඇති වූ උපාදානය නොවේ. ප්‍රතිසන්ධි සිත සමඟ සංස්කාර ස්කන්ධයයි උපාදානය. මේ උපාදානය නිසා භවය නමැති සතර නාමස්කන්ධයෝ හටගනී. එබැවින් මෙහිදී **උපාදාන හෙතුකං** ලෙස කිව නොහැක.

**භව පච්චයා ජාති** - මේ සතර නාමස්කන්ධයන් හටගැනීම උත්පාදක්ෂණය. උත්පාදක්ෂණය නිසා ඨිතිය, ඨිතිය නිසා භංගය ඇතිවේ. මෙහිදී අදහස් වනුයේ විපස්සනා භාවනාවේ දී පටිච්චසමුප්පාද අංග සියල්ල එකම ප්‍රතිසන්ධි චිත්තක්ෂණයේ දී බැලීමයි. අවිජ්ජා, සංඛාර අතීත හේතුවෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වී, එම ප්‍රතිසන්ධි විඤ්ඤාණය තුළ විඤ්ඤාණ, නාම, ඡට්ඨායතන, ඵස්ස, වේදනා, උපාදානය, භවය, ජාතිය, ජරා හා මරණ නමැති මේ සියලුම අංග බැලිය යුතුයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ද වැඩිය යුතුයි.

මේ ආකාරයෙන් අනෙක් නය ක්‍රම සම්බන්ධ වේ.

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො අවිජ්ජා හෙතුකො - පෙ -** මෙහි වෙනස නම් විඤ්ඤාණය නිසා නාමය හටගනී. විඤ්ඤාණය හේතු විය. නාම

නිසා ස්පර්ශය හටගනී. නාම (මනොසම්ඵස්සය) හේතුවයි.මනෝ සම්ඵස්සය නිසා වේදනා හටගනී. ඵස්ස හේතුවයි. ඉතිරි ඒවා පෙර ලෙසම යෙදේ.

ඊළඟ නය ක්‍රමයේ දී, **විඤ්ඤාණ පච්චයා නාම රූපං විඤ්ඤාණ හෙතුකං** - ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා නාම රූප පහළ වේ. එයට විඤ්ඤාණය හේතු විය. **නාම රූප පච්චයා ඡට්ඨායතනං නාම රූප හෙතුකං; නාම රූප පච්චයා සළායතනං නාම රූප හෙතුකං; ඡට්ඨායතනං පච්චයා ඵස්සො ඡට්ඨායතන හෙතුකං;** මනායතන නිසා ස්පර්ශය හටගනී. මනායතනය හේතුවිය.

මෙහි වෙනස පවතින්නේ හේතුව යන්න තුළයි. පච්චය යනුත් හේතුව යන අර්ථයමයි. මෙය දේශනා විලාසයයි.

## 03 සම්පයුත්ත චතුක්කං

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො අවිජ්ජා සම්පයුත්තො - පෙ -; සම්පයුත්ත** නම්; ඒකුප්පාද, ඒකනිරෝධ, ඒකාලම්බන, ඒකවස්තුක සතර නාමස්කන්ධයන්ගේ එකට ඉපදීම යනාදී එකට යෙදීමයි. අවිද්‍යාව නිසා සංස්කාරය හටගනී. අවිද්‍යාව සම්ප්‍රයුක්ත විය. මෙහිදී ඒ සිතට සම්ප්‍රයුක්තවීමක් අදහස් නොවේ. අවිද්‍යාවේ උපනිශ්‍රය නිසා සංස්කාරය හටගත්හ. අවිද්‍යාව සම්ප්‍රයුක්ත වී චිත්ත පරම්පරා පහළ විය. ඒ නිසා සංස්කාර පහළ විය. සංස්කාර පහළවීමට හේතුව අවිද්‍යාව සම්ප්‍රයුක්ත වීමයි.

මේ සිතට ඒකුප්පාද වශයෙන් සම්බන්ධවීමක් නොමැත. අතීත හේතු 2ක සම්බන්ධ කිරීමේ දී එකම චිත්තක්ෂණයට සම්ප්‍රයුක්තවීමක් නොවේ. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං සඞ්ඛාර සම්පයුත්තං;** කම්ම විඤ්ඤාණය, විපාක විඤ්ඤණ වශයෙන් විඤ්ඤණයේ කොටස් 2 ක් පවතී. මේ කම්ම අවස්ථාව, කම්ම විඤ්ඤාණයි. එම කුසල චේතනා අවස්ථාව නිසා පහළ වන ප්‍රතිසන්ධි විඤ්ඤාණය විපාකවිඤ්ඤාණයි. මෙය සාමාන්‍ය අර්ථ විග්‍රහයයි. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන විට දී ඒ මරණාසන්න ජවන් සිතේ පහළ වූ සංඛාර, (කුසල චේතනාව) නිසා

කම්ම විඤ්ඤාණ (සිත) පහළ විය. මෙහිදී සංඛාරයි. එම සංඛාර නිසා විපාක විඤ්ඤාණය පහළවේ. එබැවින් මෙහිදීත් **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණ** ලෙස යෙදිය හැක. භාවනාවේ දී මේ ස්ථාන ගැනත් සිතා බැලිය යුතුය. සංඛාර සම්ප්‍රයුක්ත ඒකුප්පාද, එකම චිත්තක්ෂණයට යොදා සාකච්ඡා කළ හැක. තවදුරටත්

**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං සඞ්ඛාර සම්පයුත්තං;** කුසල සංඛාර නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණ පහළ වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණයේ පහළවීමට හේතු වූයේ, සම්ප්‍රයුක්ත වූයේ සංඛාරයයි. එනම් මරණාසන්න ජවනයේ පහළ වූ කුසල සංඛාරයි. (හෝ අකුසල සංඛාර) මේ ක්‍රමයට අනුව ගත් විට විපාක විඤ්ඤාණය තුළ සංඛාර නැත. ඒකුප්පාද වශයෙන් සම්ප්‍රයුක්ත වීමක් ගැනීමට නොහැක. **විඤ්ඤාණ පච්චයා නාමං විඤ්ඤාණං සම්පයුත්තං;** ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා ඉතිරි නාමස්කන්ධ 3 පහළ විය. එයට හේතුව මේ විඤ්ඤාණය සම්ප්‍රයුක්ත වීමයි. එනම් ඒකුප්පාද වශයෙන් එතැන එකට සම්ප්‍රයුක්තවීම නිසයි. **නාම පච්චයා ඡට්ඨායතනං නාම සම්පයුත්තං;** නාමස්කන්ධය නිසා ඡට්ඨායතනය (මනායතනය) පහළ වේ. එයට හේතුව නාම සම්ප්‍රයුක්ත වීමයි. මෙම සම්ප්‍රයුක්තවීම ප්‍රතිසන්ධි චිත්තක්ෂණයේ දීම බැලිය හැක.

**ඡට්ඨායතන පච්චයා ඵස්සො ඡට්ඨායතන සම්පයුත්තො;** ඒ මනායතනය නිසා සම්ඵස්සය පහළ වේ. එයට හේතුව මනායතනයයි. මනායතනයට ඵස්ස සම්ප්‍රයුක්ත වීමයි. **ඵස්ස පච්චයා වෙදනා ඵස්ස සම්පයුත්තං;** ස්පර්ශය නිසා ඒ සිතේ වේදනාව පහළ වේ. එය ඵස්ස සම්ප්‍රයුක්තයයි. **වෙදනා පච්චයා තණ්හා වෙදනා සම්පයුත්තං;** වේදනාව නිසා තණ්හාව හටගනී. ප්‍රතිසන්ධි වේදනාව නිසා භවයට ඇලුම් කරන තණ්හා සිත පහළ වේ. ඒ වේදනාව උපනිශ්‍රය වශයෙන් තණ්හාවට උපකාර විය. ඒ තණ්හාව සිතේ මේ ප්‍රතිසන්ධි වේදනාවට සම්ප්‍රයුක්ත නොවේ. නමුත් ඒ තණ්හා සිතේ වේදනා චෛතසිකය පහළ වේ. එම වේදනාව හේතු වේ. මෙහිදී පටිච්චසමුප්පාදයෙන් පැනීමක් නොවේ මෙය මාතිකාවයි. නිද්දේසයේ දී එක් සිතක් ගානේ, තෝරන විටදී මෙය වඩාත් පැහැදිලි වේ.

**තණ්හා පච්චයා උපාදානං තණ්හා සම්පයුත්තං;** තණ්හා මූලක සිතේම දිට්ඨි උපාදාන ආදිය පහළ වේ. ඒවා එකට සම්ප්‍රයුක්ත වේ. (තණ්හාව සම්ප්‍රයුක්තවීම නිසා) **උපාදාන පච්චයො භවො;** උපාදානය නිසා භවය හටගනී. මෙහිදී උපාදාන සම්ප්‍රයුක්ත වීමක් සිදුවී නොමැත. ප්‍රතිසන්ධි සංස්කාර ස්කන්ධය නිසා සතර නාමස්කන්ධයන් හෙවත් භවය හටගනී. **භව පච්චයා ජාති;** උත්තපාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණයයි. මේ ආකාරයෙන් ඉතිරි නය ක්‍රම 3 සම්ප්‍රයුක්ත වශයෙන් සම්බන්ධ කරගත යුතුය.

## 04 අඤ්ඤමඤ්ඤ චතුක්කං

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරො; සඞ්ඛාර පච්චයාපි අවිජ්ජා;** අනුලෝම ප්‍රතිලෝම ලෙසිනි. අවිද්‍යාව නිසා සංස්කාර තෙමෙ හටගනී. සංස්කාර නිසා අවිද්‍යාව හටගනී. මෙය ප්‍රායෝගිකව සිතා බැලුවහොත් අප තුළ තිබෙන චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම, අනවබෝධය, නැමැති අවිද්‍යාව නිසා කුසලාකුසල සංස්කාර රැස්කරයි. කුසලාකුසල සංස්කාර රැස්කරන තරමටම අවිද්‍යාව වැඩේ. අවිද්‍යාව නිසා සංස්කාරය ද, සංස්කාරය නිසා අවිද්‍යාව ද වැඩේ.

රහතන් වහන්සේ නමක් තුළ අවිද්‍යාව නැත. අවිද්‍යාව නොමැති හෙයින් සංස්කාර හට නොනගී. සංස්කාර නොමැති හෙයින් අවිද්‍යාව ද හටගන්නේ නැත. නමුත් අප තුළ අවිද්‍යාව නිසා සංස්කාරය ද, නැවතත් සංස්කාරය නිසා අවිද්‍යාව ද ඇති වේ.

**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා සඞ්ඛාරො;** අනුලෝම ප්‍රතිලෝම ලෙසිනි. කුසලාකුසල සංස්කාර හේතුවෙන් විඥ්ඥාණය පහළ වේ. මේ විඥ්ඥාණ සමග නැවත සංස්කාර පහළ වේ. ඔවුනොවුන්ගේ සම්බන්ධතාවයයි මෙහිදී අදහස් කරනුයේ. විඥ්ඥාණය නිසා නාමය, නාමය නිසා විඥ්ඥාණය ද; නාමය නිසා ෂඩ්ඨායතනය, ෂඩ්ඨායතනය නිසා නාමය ද; ෂඩ්ඨායතනය නිසා ඵස්සය, ඵස්සය නිසා ෂඩ්ඨායතනය ද; ඵස්ස නිසා වේදනා, වේදනා නිසා ඵස්සය ද; වේදනාව නිසා තණ්හාව, තණ්හාව නිසා වේදනාව ද හටගනී. තණ්හාව නිසා උපාදානය හටගනී. උපාදානය නිසා තණ්හාව හටගනී. උපාදානය නිසා භවය ඇති වේ.

මෙහිදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනුයේ අවිද්‍යාව නිසා හැම දෙයකම හටගැනීමක් පවතින බව. මේ හැම දෙයක්ම අවිද්‍යාවට උපකාර කෙරේ.

## මාතිකා නය

**අවිජ්ජා පච්චයා....** ලෙස දක්වූ බැවින් අවිජ්ජා මූලකය. අවිජ්ජාව මූල්කරගත් දේශනාවකි. මේ ආකාරයෙන් **සඞ්ඛාර පච්චයා අවිජ්ජා** - සංස්කාරය නිසා අවිද්‍යාව හටගනී. සංස්කාරය මුලට පැමිණ තිබේ.

**සඞ්ඛාර පච්චයා අවිජ්ජා, අවිජ්ජා පච්චයා සඞ්ඛාරා - පෙ -; විඤ්ඤාණ පච්චයා අවිජ්ජා පච්චයා සඞ්ඛාරා - පෙ -;** අවිද්‍යා මූලක නය, සංඛාර මූලක නය, විඤ්ඤාණ මූලක නය, නාම මූලක නය යනාදී ලෙස විස්තර කරනු ලබයි. මෙය දේශනා විලාශයයි.

## අකුසල් නිද්දෙසො

පටිච්චසමුප්පාද ධර්මයන් සිතක් සිතක් ගානේ කෙසේද අපේ සන්තානය තුළ ක්‍රියා කරන්නේ, පවතින්නේ යන ආකාර පැහැදිළි කරයි. පළමුව අකුසල් සිත් ගැන බුද්ධ දේශනාවට අනුව සිදුකර ඇති අර්ථ විග්‍රහය පැහැදිළි කරගත යුතුයි.

අකුසල යනු, කුසල නොවන හෙයින් අකුසල නම් වේ. කුසල නම් අකුසල නොවන හෙයිනි. කුසල පදය තෝරාගත් විට අකුසල පදය ගැන වැටහේ. අකුසල - කුසල් නොවන නිසයි. මෙහි තේරුම් 4 ක් පවතී. ගිලන්කම ඇතිකරන නිසා, **අනාරෝග්‍යත්වයෙන් අකුසල නමිනි.** ගිලන්කම නම් අපේ හිතේ ගිලන්කමයි. අපේ සිත ගිලන් වන්නේ අකුසලය නිසයි. අකුසලයක් නොමැති නම්, සිත කවදාවත් ගිලන් නොවේ. සිත ගිලන්වීම නිසා කයත් ඉබේම ගිලන් වේ. මේ අනුව ගිලන් අර්ථයෙන් අකුසල නම් වේ. **දුක් විපාක ගෙනදෙන අර්ථයෙන්, අකුසල් පහළවීම** නිසා අපට දිට්ඨධම්මවේදනීය වශයෙනුත් දුක් ගෙන දෙයි. ඒ වගේම කර්මය රැස්වෙලා ඊළඟ ජීවිතවලටත් මේ දුක් අපට ලබාදෙයි. මේ අකුසලයෙන් සිදුකරනුයේ අපව ගිලන් කිරීම, අපට දුක් විපාක ගෙනදීමයි. නිතරම අකුසල් සිතක් පහළවීම යනු අප්‍රමාණ කෙලෙස් කඳු, ගණන් කරන්න බැරි තරම් ගලා ඒම. මෙසේ වැරදි දේවල් එකතු කරමින් මේ

දුක් විපාක ගෙන දෙයි. සංයුක්ත නිකායේ ධාතු සංයුක්තයේ පුද්ගල වර්ණනාවේ සඳහන් පරිදි දිනක් බුදුරජාණන් වහන්සේ දුටුවා සැරියුත් මහරහතන් වහන්සේ සමග 500 ක් භික්ෂූන් වහන්සේලා එකට සක්මන් කරන බව, මුගලන් මහරහතන් වහන්සේ සමග 500 ක් භික්ෂූන් වහන්සේලා එකට සක්මන් කරන බව, මේ ආකාරයෙන් අනුරුද්ධ තෙරුන් ආදී පිරිස සක්මන් කරන බව දුටුවා. ඒ අතර දෙව්දත් තෙරුන් වහන්සේ සමග ද 500 ක් පිරිස එකට සක්මන් කරන බව දුටුහ.

"මහණෙනි! අර බලන්න, ආයුෂ්මත් සැරියුත් සමග සක්මන් කරන 500 දෙනාම ප්‍රඥාවන්තයි, මුගලන් තෙරුන් සමග සක්මන් කරන 500 දෙනාම ඍද්ධිවන්තයි" යනාදී ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක. ඒ අතර දෙව්දත් භික්ෂුව නරක අදහස්වලින් පිරුණු පුද්ගලයෙක් බැවින් ඇසුරු කරන 500 දෙනාම නරක අදහස් ඇති පුද්ගලයින් වේ. අසූචි අසූචි සමග එකතු වූ විට දුර්ගන්ධය තව වැඩි වේ. අපවිත්‍ර ද්‍රව්‍ය එකතු වෙන්න වෙන්න දුර්ගන්ධය වැඩි වේ. එසේම ගිතෙල්, මීපැණි ආදී ප්‍රණීත ද්‍රව්‍ය එකතු වෙන්න වෙන්න තව තවත් ප්‍රණීත බව වැඩි වේ. සුවඳ දේවල් එක්වෙන්න එක්වෙන්න සුවඳ වැඩි කරයි. එසේම පුද්ගලයින්ගේ ගතිගුණ ලක්ෂණ අනුව පුද්ගලයින් ද එකට එකතු වේ. මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ පැහැදිළි කර දුන් සේක.

ඒ වාගේම දශබල ඥානයන්ගෙන් එක් ඥානයක් නම්, "**සත්තානං නානාධිමුත්තිකතං පජානාති**" සත්ත්වයන්ගේ නොයෙක් අදහස් දැනගැනීමේ නුවණ, හීනාධිමුක්තිකය, පණීකාය මුක්තිකතය වශයෙන්ද බෙදේ. හීන අදහස්, පහත් අදහස් තියෙන පුද්ගලයෝ, උසස් අදහස් තියෙන පුද්ගලයෝ, පහත් අදහස් පවතින අය හැමදාමත් පහත් ගොඩට එකතු වේ. උසස් අදහස් ඇති අය උසස් ගොඩට එකතු වේ. මේ ආකාරයෙන් වැරදි දේවල් එකතු කරන්න කරන්න තමන්ගේ සිතෙත් වැරදි දේවල් එකතු වෙනවා පමණක් නොව වටපිටාවෙන් ද වැරදි දේවල්, වැරදි පුද්ගලයින් ඇසුරු කිරීමට සිදු වේ. ඒ අනුව අකුසල් යනු වැරදි එකතු කරන අර්ථයෙන් ය. **අදක්ෂකාරී අර්ථයෙන් ද**, යමෙක් යමකට දක්ෂ නම් ඔහුට හොඳ කුසලතාවයක් ඇති බව පවසයි. යමකට

දක්‍ෂ නැතිනම් එය පවතින දුර්වලතාවයකි. ඒ දුර්වලතාවයට ද අකුසල ලෙස යොදයි. මේ ආකාරයෙන් අකුසල නමැති වචනය යෙදෙන අවස්ථා පවතී.

සිත් වශයෙන් ගත්විට අකුසල් සිත් 12 ක් තථාගතයන් වහන්සේ අපට දේශනා කළ සේක. ඒ අකුසල් සිත් 12 අතර පළමු චිත්ත කොට්ඨාශය ලෝභ මූල සිත් ලෙස හැඳින්වේ. ලෝභය මුල් වී, ප්‍රධාන වී හටගත් සිත් ය. මේ ලෝභ මූල සිත් 8 ක් පවතී.

## 01 ලෝභ මූල සිත් 08

සෝමනස්ස, උපෙක්ඛා ලෙස; දිට්ඨිගත සම්ප්‍රයුක්ත, විප්‍රයුක්ත ලෙස; අසංඛාරික, සසංඛාරික ලෙස සිත් 4 බැගින් යෙදේ.

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත.
2. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත.
3. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත.
4. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත.
5. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත.
6. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත.
7. උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත.
8. උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත.

පළමු අකුසල් සිත, **යස්මිං සමයෙ අකුසලං චිත්තං** - පෙ - ලෙස තථාගතයන් වහන්සේ දේශනා කළ සේක.

මෙම අකුසල් සිත සතුටෙන් යුතුව, වැරදි දැක්මෙන්, මිථ්‍යා දෘෂ්ඨිය පෙරටු කරගත්, කෙනෙකුගේ කිසිම උපකාරයක් නොමැතිව, තමන්ගේම උත්සාහයෙන්, පහළ වන අකුසල් සිතක් වේ. මේ අකුසල් සිත රූපාරම්මණය, ශබ්දාරම්මණය, ගන්ධාරම්මණය, රසාරම්මණය, ඵොට්ටබ්බාරම්මණය, ධම්මාරම්මණය නිසා පහළ වේ. මෙසේ පහළ වුන අකුසල් සිත තුළ ධර්මයෝ පහළ වෙත්. බුදුජාණන් වහන්සේ

ධම්මසංඞ්ඝණීප්‍රකරණ දේශනාවේ දී පහළ වන චෛතසික ධර්මයන්, නාම ධර්මයන් ගැන පැහැදිළි කරන සේක. **ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති.** මේ ආකාරයෙන් ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකග්‍රතා දේශනා කරන ලද සේක. නමුත් පටිච්චසමුප්පාද නය ක්‍රමයේ දී තථාගතයන් වහන්සේ අකුසල් සිතක් ගානේ පහළවන පටිච්ච සමුප්පාද අංග හටගැනීම පද 16 කි. ඒ පද 16 ටම අනුව පළමු අකුසල් සිත තෝරා ගත යුතුය.

## පච්චය චතුක්ක නය ක්‍රමයෙන් අකුසල්

පච්චය චතුෂ්කයට අනුව, පළමු අකුසල් සිත අර්ථ විග්‍රහ කරන අකාරය සලකා බලමු. බුදුරජාණන් වහන්සේ මේ පච්චය චතුෂ්කය දේශනා කරන ලද්දේ ප්‍රධාන වශයෙන් ඒ ඒ භවයන් අරමුණු කරකගෙනය. නමුත් මෙහිදී ඒ භවයන් අරමුණු කළාට, අට්ඨකථාචාරීන් වහන්සේලා විසින් මෙය පැහැදිළි කරන්නේ, භවයට අරමුණු කොටයි. නමුත් තථාගතයන් වහන්සේ මෙහිදී කෙළින්ම මාතෘකා පද ඉදිරිපත් කරන සේක. පෙර සඳහන් දේශනාව මාතිකාවයි.

මාතිකා යනු **"මාතාවිය මාතිකා"** මවක් මෙන් උපකාර වේ. යම්කිසි දේශනාවකට බැස ගැනීමට මාතෘකාව, මූලයයි. එය මවක් මෙන් අර්ථ විග්‍රහය සඳහා උපකාර වනු ඇත. මවගේ උදව් නිසා දරුවෙකු හැදී වැඩී, පෝෂණය වී, ලොකුමහත් වී, රටට ලෝකයට වැඩදායක පුද්ගලයෙක් බවට පත් වේ. ඒ වාගේ මේ මාතිකා පදය නිසා කිසිදු කරදරයක්, බාධාවක්, අවුලක් නැතිව බුදුරජාණන් වහන්සේගේ දේශනා සියල්ලක්ම අපට නිවැරදිව අර්ථ විග්‍රහ කිරීමේ හැකියාව ලැබේ.

මෙහිදී බුදුරජාණන් වහන්සේ මාතිකා චතුෂ්ක වශයෙන් පද 4 ක් දේශනා කළේ, අපට සිතක් ගානේ මේවා අවබෝධ කරගැනීම පිණිසය. බුදුරජාණන් වහන්සේ චතුෂ්ක වශයෙන් අපට මේ පටිච්චසමුප්පාදය දේශනා කළේ ඇයි? අපේ සිතේ පහළවන සෑම සිතක් ගානේ මේ අංගයන් නිවැරදිව දැක අවබෝධය පිණිසයි. විදර්ශනා වශයෙන් භාවනා කොට, අවබෝධ කොට දැක ගැනීම පිණිස දේශනා කරන ලදී.

පළමු අකුසල් සිත යටතේ චතුෂ්ක 4 ඉගෙන ගෙන තිබේ. පළමු නය ක්‍රමය, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො -පෙ-** දෙවන නය ක්‍රමයේදී (ෂට්ඨායතන යෙදී නැත), තුන්වැනි නයක්‍රමය, **අවිජ්ජා පච්චයා -පෙ- විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා ඡට්ඨායතනං -පෙ-**, සතරවෙනි නයක්‍රමයේ වෙනස, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො -පෙ- නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො -පෙ-.**

## i පච්චය චතුෂ්කයේ පළමු නය ක්‍රමය

අකුසල් සිතක් ගානේ මේ කියන නය ක්‍රමය ප්‍රායෝගික ලෙසින් පැහැදිළි කරගත යුතුයි. පොත පතේ සඳහන් පරිදි තථාගතයන් වහන්සේගේ වචනයක් ගානේ අර්ථ විග්‍රහයේ මූලික අවබෝධයක් නොලත් අයෙකුට අවුල් සහගත වේ. තථාගතයන් වහන්සේගේ අර්ථ විග්‍රහය ඉතාමත් පැහැදිළියි. තථාගතයන් වහන්සේ කළ අර්ථ විග්‍රහයට සමාන කළ හැකි අර්ථ විග්‍රහයක් මේ ලෝකයේ කොතැනකවත් නැත. තථාගතයන් වහන්සේ වැනි උතුමන් වහන්සේ නමක් මේ ලෝකයේ පහළ වන්නේ මෙවැනි උතුම් ධර්මයක් දේශනා කිරිම සඳහාමයි. තථාගතයන් වහන්සේ කළ මේ අර්ථ විග්‍රහයේ අපට අමුතුවෙන් සැකසිය යුතු දෙයක් නොමැත. මේ මූල පදයේ තේරුම වටහාගනිමු.

**අවිජ්ජා** - "**අඤ්ඤාණං අදස්සනං -පෙ-**"; **අවිජ්ජා** කියන පදය නොයෙක් අර්ථවලින්, සමාන පදවලින් එක්කොට විස්තර කොට ඇත. පොදු අර්ථය ගත්විට අවිද්‍යාව යනු මෝහ චෛතසිකයයි. අකුසල මූලය.

**සඞ්ඛාරො** - "**චෙතනා, සංචෙතනා, චෙතයිත්තං**"; යම් සිතුවිල්ලක් චේතනාවක් තිබේ නම්, චේතනාව සංඛාරයයි. **සඞ්ඛාරො** යනු චේතනාවයි.

**විඤ්ඤාණං** - "**යං චිත්තං, මනො, මානසං, හදයං, පණ්ඩරං, මනායතනං, මනින්ද්‍රියං, විඤ්ඤාණං, විඤ්ඤාණක්ඛන්ධො, තජ්ජ මනො විඤ්ඤාණ ධාතු**"; යනාදි ලෙස මේ සිත නොයෙක් වචනවලින් බුදුරජාණන් වහන්සේ අර්ථ විග්‍රහ කොට දේශනා කරයි. **විඤ්ඤාණය** යනු සිතයි.

**නාමං-"වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො"**; සාමාන්‍යයෙන් නාම කියන විටදී ස්කන්ධ 4 ම අයිති වේ. නමුත් මෙහිදී **විඤ්ඤාණ පච්චයා නාමං** - විඤ්ඤාණය නිසා හටගන්නා නාමය. එනම් විඤ්ඤාණ ස්කන්ධය හැර ඉතිරි නාමස්කන්ධ තුනයි.

**ඡට්ඨායතනං** - ඡට්ඨායතනය යනු **"යං චිත්තං මනො මානසං - පෙ-"**; ආදි දේශනාවේ සඳහන්වන මනායතනය ඡට්ඨායතනයයි.

**ඵස්සො** - **"ඵුසනා සම්ඵුසනා -පෙ-"**; යම් ස්පර්ශයක් ස්පර්ශවන ආකාරයන් තිබේ, එනම් එය ඵස්ස චෛතසිකයයි. මෙහිදී ඵස්ස චෛතසිකයයි ඵස්සය ලෙස ගැනෙනුයේ.

**ඵස්ස පච්චයා වෙදනා, වෙදනා; "චෙතසිකංසාතං -පෙ-"**; මේ චෛතසිකයන්ගෙන් සිතේ යම්කිසි සතුටක් ප්‍රසාදයක් ඇතිවන ගතියක් තිබේනම් එය වේදනාව ලෙස හැඳින්වේ. වේදනාව සිතක් ගානේ වෙනස්වේ. ඇතැම් සිත් සෝමනස්ස සහගත සිත්; එවිට සෝමනස්ස වේදනාව, උපේක්ඛා සහගත සිත්වල උපේක්ඛා වේදනාව, දෝමනස්ස සහගත එවිට දෝමනස්ස වේදනාවයි. සුඛ සහගත, දුක්ඛ සහගත යනාදිය වේදනාවට අනුව, ඒ වේදනාවේ ස්වභාවය අනුව වෙනස්ව යෙදේ.

**වෙදනා පච්චයා තණ්හා, තණ්හා** - **"යො රාගො සරාගො -පෙ-;** තණ්හාව නොයෙක් ආකාරයෙන් ඇලීම, බැඳීම, ආසාව පැහැදිළි කරයි. තණ්හාව යනු ලෝභ චෛතසිකයයි.

**තණ්හා පච්චයා උපාදානං; උපාදානං** - උපාදාන 4 කි. කාමූපාදාන, දිට්ඨූපාදාන, සීලබ්බතූපාදාන, අත්තවාදූපාදාන. කාමූපාදාන යනු ලෝභ චෛතසිකයයි. තණ්හාවට ලෝභ චෛතසිකයැයි කී බැවින් නැවතත් **තණ්හා පච්චයා තණ්හා** ලෙස අර්ථ විග්‍රහ කළ නොහැකිය. **තණ්හා පච්චයා උපාදානං** හිදී උපාදානය - කාමූපාදනය ගත් විට එහි අර්ථ විග්‍රහය **තණ්හා පච්චයා තණ්හා** ලෙස වේ. තණ්හාව නිසා තණ්හාව ලෙස අමුතුවෙන් හටගැනීමක් නැත. එතැන තණ්හාව පවතින බැවිනි. කාමූපාදනය එතැන දී නොගනී. විශේෂයෙන් මෙහිදී දිට්ඨිය පමණක් ගැනේ.

**උපාදාන පච්චයා භවො; භවො** - භවය යනු හටගැනීමයි. කම්ම භව, උප්පත්ති භව ලෙස කොටස් 2 කි. නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි භවය. සතර නාම ස්කන්ධයෝ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ උපාදාන නිසා හටගැනීමයි. මෙහිදී දිට්ඨි චෛතසිකය බැවින් සංස්කාර ස්කන්ධයයි. උපාදාන නිසා වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධයන් හටගනී.

**භව පච්චයා ජාති; ජාති** - නාම ජාති, රූප ජාති වේ. නමුත් මෙහිදී පටිච්ච සමුප්පාදයේ රූප ගැන කථා නොකරයි. එබැවින් නාම ජාතිය පමණයි. නාම ස්කන්ධයන්ගේ හටගැනීම නාම ජාතියයි.

**ජාති පච්චයා ජරා මරණ** - මේ නාම ජාතියේ ඨිති අවස්ථාව ජරාව ලෙස ද, නාම ස්කන්ධයන්ගේ භංගය මරණය ද නම් වේ.

මේ අර්ථය ප්‍රායෝගිකව චිත්තක්‍ෂණයක් තුළ බැලිය යුතුය.

රූපාරම්මණයක් නිසා භවංග, භවංග චලන, භවංග උපච්ඡේද, පංචද්වාරවජ්ජන යන චිත්තක්‍ෂණ හෘද වස්තුව ඇසුරු කරගෙනද, චක්‍ෂුපාසාදයතුල චක්ඛු විඤ්ඤාණ සිත ද පහළ වේ. එම චක්ඛු විඤ්ඤාණ සිතෙන් ගත් අරමුණ සම්පටිච්ඡන චිත්තක්‍ෂණයට භාර දෙයි. සම්පටිච්ඡන සිතෙන් සංතීරණ සිතට, සංතීරණයෙන් වොත්ථපන සිතට භාර දෙයි. වොත්ථපන සිතෙහි යෝනිසෝ මනසිකාර, අයෝනිසෝ මනසිකාර ලෙස භේදයක් තිබේ. වොත්ථපන සිත අයෝනිසෝ මනසිකාර වුවහොත් ජවනවලදී අකුසල් ජවන් පහළ වේ. එනම් වොත්ථපනය අයෝනිසෝ මනසිකාරයයි. අයෝනිසෝ මනසිකාරය හේතුවෙන් පහළවන ජවන් 7 හි පළමු ලෝභ මූල අකුසල් සිත සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික අකුසල් සිත නම් වේ. පළමු ජවනයේ සිටම ජවන් හතේම මේ නය ක්‍රමයෙන් පටිච්ච සමුප්පාද අංගයන් බැලිය හැකි වේ. පළමු අකුසල් සිතේ පහළවෙන චෛතසික; නාම ධර්ම; සබ්බ චිත්ත සාධාරණ 7, ප්‍රකීර්ණක 6, අකුසල් සාධාරණ චෛතසික 4, ලෝභ දිට්ඨි 2, සිත සමග 20 ක් වේ. මේ නාම ධර්ම 20 ජවන් 7 හි පවතී.

| | |
|---|---|
| සිත | 1 |
| සබ්බ චිත්ත සාධාරණ (ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකාග්‍රතා, ජීවිතීන්ද්‍රිය, මනසිකාර) | 7 |
| ප්‍රකීර්ණක (විතක්ක, විචාර, අධිමොක්ඛ, වීරිය, ප්‍රීති, ඡන්ද | 6 |
| මෝහ චතුෂ්කය (අකුසල සාධාරණ චෛතසික) (මෝහ, අහිරික, අනොතප්ප, උද්ධච්ච) | 4 |
| දිට්ඨිගත සම්ප්‍රයුක්ත (ලෝභ, දිට්ඨි) | 2 |
| | 20 |

පළමු ජවන් චිත්තක්ෂණයේ පහළවන අවිද්‍යාව නම් මෝහ චෛතසිකයයි. **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො;** මේ මෝහ චෛතසිකය නිසා අකුසල චේතනාව හටගනී. ඒ සිතේ පහළවන චේතනා චෛතසිකය සංඛාර වේ. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං;** ඒ අකුසල චේතනාව නිසා එම අකුසල් කම්මවිඤ්ඤාණය වේ. **විඤ්ඤාණං පච්චයා නාමං;** ඒ විඤ්ඤාණය නිසා පහළවන ඉතිරි චෛතසික 19 නාම ධර්ම වේ. ඒ චෛතසික 19 හි වේදනා චෛතසිකය වේදනා ස්කන්ධයයි. සංඥා චෛතසිකය සංඥා ස්කන්ධයයි. ඉතිරි චෛතසික 17 ම සංස්කාර ස්කන්ධයයි. **නාම පච්චයා ඡට්ඨායතනං;** මෙහිදී වේදනා, සංඥා, සංඛාර යන ස්කන්ධ 3 නිසා මනායතනය උපදී. මේ අවස්ථාවේ දී හෘදය වස්තුවේ මනායතනය ක්‍රියාකරන බැවිනි. **ඡට්ඨායතන පච්චයා ඵස්සො;** මේ මනායතනය නිසා ඵස්ස ප්‍රධාන කොට මනෝ සම්ඵස්සය පහළ වේ. දේශනාවේ සඳහන් වනුයේ ඵස්ස චෛතසිකය ලෙසිනි. නමුත් ඵස්ස යනු මනෝ සම්ඵස්සයයි. මනෝ සම්ඵස්සය පවතිනුයේ මනායතනය නිසයි. එනම් මනායතනය, සම්ඵස්සයට උපකාර විය.

**ඵස්ස පච්චයා වෙදනා;** ඒ සිතේ පහළවන වේදනා චෛතසිකය මෙහිදී වේදනා වේ. **වෙදනා පච්චයා තණ්හා;** ඒ කියන අකුසල සහගත සෝමනස්ස වේදනාව නිසා ලෝභය පහළ වේ. එනම් තණ්හාවයි. ඒ සිතේ පහළවන තණ්හාව, ලෝභ චෛතසිකයයි. **තණ්හා පච්චයා**

**උපාදානං;** මේ තණ්හාව නිසා දිට්ඨි උපාදානය ඒ සිතේ දිට්ඨිය පහළ විය. (දිට්ඨි චෛතසිකය) උපාදානයයි. **උපාදාන පච්චයා භවො;** දිට්ඨි උපාදාන නිසා සතර නාම ස්කන්ධයෝම පවතී. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධයෝම පවතී. **භව පච්චයා ජාති;** සතර නාම ස්කන්ධයන්ගේම එකට හටගැනීම උත්පාදක්ෂණ ජාතියයි. ජවන් චිත්තක්ෂණ 7 හි ගත් විට එහි උත්පාදක්ෂණය ජාතිය වේ. ජරා යනු නාම ධර්මයන්ගේ ඨිති අවස්ථාවයි. පළමු අකුසල් සිතේ සතර නාම ස්කන්ධයන්ගේ ඨිති අවස්ථාව ජරාව නම් වේ. මේ සතර නාම ස්කන්ධයන්ගේ භංගය මරණය නම් වේ.

මේ ආකාරයෙන් පටිච්ච සමුප්පාදය භාවනා මාර්ගයේ දී වැඩිය යුතුය. කෙටියෙන් භාවනා උපදේශ ලදමුත් පුළුල් ලෙස දැකිය යුතුය. භාවනා මනසිකාරයේ යෙදිය යුතුය. ඒ තුළින් නියම ආකාරයේ චිත්තක්ෂණයක් ගානේ මේ පටිච්ච සමුප්පාද අංගයන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් වේ. නැතිනම් මේ පටිච්ච සමුප්පාද යනු අතීත, වර්තමාන, අනාගත යන භව තුනෙහි සම්බන්ධය පමණක් ලෙස කෙනෙකුට සිතිය හැක. මෙය එක් ක්‍රමයක් පමණි. පටිච්ච සමුප්පාදය මහා සාගරයක් බඳුය. ආනන්ද ස්වාමීන් වහන්සේට මෙහි ගැඹුරු බවක් නොදැනෙන බව ප්‍රකාශ කළ අවස්ථාවේ දී, බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ අමතා "ආනන්දය, එසේ නොකියන්න"යි දේශනා කරන ලද්දේ, මේ පටිච්ච සමුප්පාදය ගැඹුරු බව තියෙන, ගැඹුරු බව පෙනෙන ධර්මයක් හෙයිනි. මෙම පටිච්ච සමුප්පාදය, අතීත හේතු නිසා වර්තමාන ඵල, වර්තමාන හේතු නිසා අනාගත ඵල, ලෙස එක් ක්‍රමයකින් තේරුම් ගැනීමට පුළුවනි. මුලින් පටන් ගෙන අග දක්වා, අග සිට මුල දක්වා, මැදින් පටන් ගෙන අග දක්වා යන නය ක්‍රම ද පවතී. චිත්තක්ෂණයක් ගානේ පටිච්ච සමුප්පාද අංගයන් බැලීමට හැකිය. මෙය ඉතාම වැදගත් වන අතර තවත් නය ක්‍රමයකි.

## ii පච්චය චතුෂ්කයේ දෙවැනි නය ක්‍රමය

අවිද්‍යාව නිසා සංස්කාරය. අකුසල් සිතේ පහළ වන මෝහය නිසා චේතනාව, අකුසල චේතනාවයි. අකුසල චේතනාව නිසා

විඤ්ඤාණය, අකුසල සිත පහළ විය. **විඤ්ඤාණං පච්චයා නාමං;** අකුසල් සිත නිසා ඉතිරි නාමස්කන්ධ පහළ විය. **නාම පච්චයා ඵස්සො;** මෙහිදී දෙවැනි නය ක්‍රමයේ දී ඡට්ඨායතනය ගෙන නොමැත. එනම් ඵස්ස චෛතසිකය ගෙන තිබේ. එනම් ඍජුවම නාම ස්කන්ධයන් මනෝ සම්ඵස්සයට සම්බන්ධ කර ඇත. එතැන දි නාම ස්කන්ධයන් මනෝ සම්ඵස්සයට සම්බන්ධ කර ඇත. එතැන දී නාම ස්කන්ධය ගත්විට, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාම ස්කන්ධයන්ගේම සම්බන්ධය ගත යුතුය. සාමාන්‍යයෙන් **විඤ්ඤාණ පච්චයා නාමං;** හිදී විඤ්ඤාණ ස්කන්ධය හැර ඉතිරි නාම ස්කන්ධ 3 පමණයි ගනු ලැබුවේ. එනම් විඤ්ඤාණය නිසා නාම ස්කන්ධ 3 පහළ විය. **නාම පච්චයා ඵස්සො** හි වේදනා, සංඥා, සංඛාර පමණක් නොව විඤ්ඤාණයන් සම්බන්ධ කරගෙන තිබේ. (මුලින් ගත් අවස්ථාවේ දී නාම පච්චයා ඡට්ඨායතනයේ දී වේදනා, සංඥා, සංඛාර ස්කන්ධ 3 නිසා මනායතනය පහළ වූ බව කියැවේ.) **නාම පච්චයා ඵස්සො** හි සතර නාම ස්කන්ධයන් නිසාම ඵස්ස චෛතසිකය පහළවන බව, ඵස්සය හැර ඉතිරි නාම ස්කන්ධ නිසා ඵස්සය පහළ වේ.

ඵස්ස නිසා වේදනාව, වේදනාව නිසා තණ්හාව, තණ්හාව නිසා දිට්ඨි උපාදානය, දිට්ඨි උපාදානය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම භවයයි. සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම උත්පාදක්ෂණය - ජාතිය, ඨිතික්ෂණය - ජරාව, භංගක්ෂණය - මරණය වේ.

## iii පච්චය චතුෂ්කයේ තුන්වැනි නය ක්‍රමය

**තුන්වෙනි නය ක්‍රමයේ දී පැහැදිලි කරනුයේ** අවිද්‍යාව නිසා සංස්කාර තෙම, අවිද්‍යාව - මෝහය නිසා අකුසල චේතනාව, අකුසල චේතනාව නිසා අකුසල විඤ්ඤාණ සිත. **විඤ්ඤාණ පච්චයා නාම රූපං;** පළමු අකුසල සිත පහළවීම නිසා නාම රූප හටගනී. නාමය යනු සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීමයි. මෙය පැහැදිලිය. නාම රූප කියන විටදී රූපය ආ බැවින් රූප කොටස් දෙකකට අර්ථ විග්‍රහය කළ යුතුය. (අ) සහජාත වශයෙන් පහළවන, චිත්තජ රූප. (ආ) කර්මජ රූප. ඒ ඒ

චිත්තක්ෂණයේ උත්පාදක්ෂණයේ දී මුළු ශරීරය පුරාම කර්මජ රූප පහළ වේ. චක්ඛායතනය, සෝතායතනය, ඝානායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය යන සියල්ල පහළ වේ. **නාම රූප පච්චයා ෂට්ඨායතනං;** මෙහිදී රූපය කොටස් 2 කට ගන්නා ලදී. හෘදය වස්තුව ඇසුරු කරගෙන සහජාත වශයෙන් චිත්තජ රූප පහළ වේ. උත්පාදක්ෂණය නිසා මුළු ශරීරය පුරාම කර්මජ රූප පහළ වූ බැවින් **විඤ්ඤාණ පච්චයා නාම රූපං** ලෙස පැහැදිලි කරන ලදී. **නාම රූප පච්චයා ෂට්ඨායතන** ලෙස මෙහිදී පැහැදිලි කරනුයේ කුමක්ද හෘදය වස්තුව තුළ පමණක් පහළ වන චිත්තජ රූප, කර්මජ රූප පවතී. ඒවා නිසා ෂට්ඨායතනය පහළ වෙනවාද? නැද්ද? යන ප්‍රශ්නය සලකා බැලිය යුතුය. මෙහි නාම රූප හිදී සහජාත වශයෙන් ඒ චිත්තක්ෂණයේ පහළ වෙන නාම රූප හඳුනාගන්නා ලදී. **(විඤ්ඤාණ පච්චයා නාමරූපං) නාම රූප පච්චයා ෂට්ඨායතනං** හි නාම ස්කන්ධයන් කෙළින්ම මනායතනයට උපකාරී විය. එය මුලින්ම දේශනා කරන ලදී. **නාම පච්චයා ෂට්ඨායතනං;** වේදනා, සංඥා, සංඛාර නමැති නාම ස්කන්ධයෝ 3 සහජාත වශයෙන් පහළ වූවත් මෙහිදී මනායතනයට උපකාර නොවේ. කර්මජ රූප සහජාත වශයෙන් පහළ වුවත් මෙහි සඳහන් වන කර්මජ රූප මනායතනයට උපකාර නොවේ. එනම් විප්පයුත්ත වේ. එසේ නම් නාම රූප හි උදව් කරන්නේ කුමන රූප ද? පළමු ජවනයට පෙර පහළ වන වොත්ථපන සිතත් සමග හෘදය වස්තුව පහළ විය. පළමු ජවන සිත පහළ වන්නේ, ඒ හදය වස්තුව ඇසුරු කරගෙනය. මෙහිදී නාම රූප ගැන සඳහන් කරන විටදී සහජාත නාම මනායතනයට උපකාර වේ. පුරේජාත වශයෙන් පහළ වූ හදය වස්තු රූපය, මනායතනයට උපකාර වේ. මෙය **නාම රූප පච්චයා ෂට්ඨායතන** නම් වේ. **ෂට්ඨායතන පච්චයා ඵස්සො;** මනායතනය නිසා මනෝ සම්ඵස්සය, මනෝ සම්ඵස්සය නිසා වේදනාව, වේදනාව නිසා තණ්හාව (ලෝභ චෛතසිකය), තණ්හාව නිසා දිට්ඨි උපාදානය, දිට්ඨි උපාදානය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හටැනීම (භවය), උත්පාදක්ෂණය (ජාතිය), ඨිතික්ෂණය (ජරාව), භංගක්ෂණය (මරණය) නම් වේ.

## iv පච්චය චතුෂ්කයේ හතරවන නය ක්‍රමය

**අවිජ්ජා පච්චයා සංඛාරො;** අවිද්‍යාව නිසා සංස්කාර තෙම හෙවත් මෝහය නිසා අකුසල චේතනාව පහළ වේ. **සංඛාර පච්චයා විඤ්ඤාණං;** අකුසල චේතනාව නිසා අකුසල සිත් පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාම රූපං; (අත්ථි නාමං අත්ථි රූපං)** චිත්තජ රූප සහ කර්මජ රූප සහජාත වශයෙනුත් පහළ වේ. **නාම රූප පච්චයා සළායතනං;** මුලින් පැහැදිලි කරන ලද්දේ **නාම රූප පච්චයා ඡට්ඨායතන** ලෙසිනි. වොත්ථපන සිතත් සමග පහළ වූ හදය වස්තු රූපය මනායතනයට උපකාරි වනබව පෙර හඳුනාගන්නා ලදී. මෙහිදී අදහස් වනුයේ **නාම රූප පච්චයා සළායතනං;** යනුවෙනි. මේ අවස්ථාවේදී පට්ඨාන දේශනාව උපකාරයෙන් පැහැදිලි කරගත යුතුය.

**චත්තාරො මහාභූතා උපාදාය රූපානං සහජාත පච්චයෙන පච්චයො, අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො, නිස්සය පච්චයෙන පච්චයො, අත්ථි පච්චයෙන පච්චයො, විගත පච්චයෙන පච්චයො,** යනාදී ලෙස දේශනාවේ සඳහන් වේ. **චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො, නිස්සය පච්චයෙන පච්චයො, සහජාත පච්චයෙන පච්චයො,** ලෙස ද දැක්වේ.

සතර මහා භූතයන් නිසා උපදින උපාදාය රූපයන් පවතී. සතර මහා භූතයන් නිසා උපදින උපාදාය රූප නම්, සතර මහා භූත රූප 4 හැර ඉතිරි රූප 24 වේ. මෙහි මාතෘකාව නම් නාම රූප නිසා සළායතන පහළවීමයි. සහජාත වශයෙන් නාම රූප, කර්මජ රූප මුළු ශරීරය පුරාම පහළවේ. ඒ ඒ කලාපවල තිබෙන මහාභූත රූපවල උපකාරයෙන් කර්මජ රූප පහළ වේ. උදාඃ- පළමු ජවන් සිත හෘදවස්තුව තුළ පහළ වේ. පහළ වනවිට වොත්ථපන සිතත් සමග පහළ වූ චක්ඛු ප්‍රසාදය හා බැඳුණු දසක රූප කලාප පවතී. දසක රූප කලාපයන්ගේ පවතින මහාභූත නිසා ඒ දසක කලාපය පවතී. එනම් මහාභූතයන් ඇසුරු කරගෙන නැවත දසක කලාපයක් සහජාත වශයෙන් පළමු ජවන් සිතත් සමග පහළ වේ. පළමු ජවන් සිත පහළවීමට උපකාරීවේ. ශරීරය පුරා පවතින සතර මහා භූතයන් නිසා ඒ ඒ උපාදාය රූපයන් පහළ වේ. ඒ

අනුව **රූප පච්චයා සළායතනං** කියන විටදී පැහැදිලි කරගත යුත්තේ, ඇස ඇසුරු කරගෙන තිබෙන මහාභූත නිසා චක්ඛායතනය, චක්ඛු ප්‍රසාදය පහළ විය. කණ ඇසුරු කරගෙන තිබෙන සතර මහා භූතයන් නිසා සෝත ප්‍රසාදය පහළවිය. මේ ආකාරයෙන් ඝානායතනය, ජිව්හායතනය, කායායතනය යන ආයතන 5 පහළවිය. මෙයයි **නාම රූප පච්චයා සළායතනං** ලෙස හඳුන්වන්නේ රූපය නිසා ආයතන 5 ක් පහළ වේ. ඒ ඒ කලාපීය මහා භූතයන් නිසා චක්ඛායතනය, ඒ ඒ කලාපීය මහාභූතයන් නිසා සෝතායතනය, ඒ ඒ කලාපීය මහාභූතයන් නිසා ඝානායතනය, ඒ ඒ කලාපීය මහාභූතයන් නිසා ජිව්හායතනය, කායායතනය, ආදී රූපායතන 5 ක් පහළ විය. **නාම පච්චයා ඡට්ඨායතනය.** නාමය වේදනා, සංඥා, සංඛාර යන නාම ස්කන්ධ නිසා සහජාත වශයෙන් මනායතනය පහළ විය. මෙය ක්‍රම 2 කට බැලිය හැක. වොත්ථපන සිතත් සමග කර්මජ රූප මුළු ශරීරය පුරාම පහළ විය. ඒ වොත්ථපන සිතත් සමග බැඳුණු ප්‍රසාද රූපයේ, ආයතනයවල මහාභූත රූප පවතී. වොත්ථපන සිතත් සමග පහළ වූ රූප වල මහා භූත නිසා පළමු ජවන් සිතේ ආයතන පහළ විය. වොත්ථපන සිතත් සමග පහළ වූ කලාපීය මහා භූතයන් හේතුවෙන් ජවන් චිත්තක්ෂණයේ අලුතින් ආයතන පහළ කරදෙනු ලබයි. මේ එක් ක්‍රමයකි. මේ ක්‍රමයයි මෙහිදී ප්‍රධාන වශයෙන් බැලිය යුත්තේ. ජවන් චිත්තක්ෂණය සමග සහජාත වශයෙන් කර්මජ රූප පහළවීම යනු මීට පෙර පහළ වූ වොත්ථපන සිතත් සමග පහළ වූ කලාපීය මහා භූතයි. මේ කරුණු දෙක පැටලීමකින් තොරව බැලිය යුතුය. මේ අනුව **නාම රූප පච්චයා සළායතන** වේ.

නැවතත් පැහැදිලි කරගතහොත්, මනායතනයට නාමය උදව් විය. රූපය අනෙක් රූපායතන 5 ට උදව් විය. රූපය යනු වොත්ථපන සිතත් සමග පහළ වූ ඒ ඒ කලාපීය මහා භූතයන් නිසා ජවන් චිත්තක්ෂණයට අලුතින් ආයතන පහළ කර දුනි. **සළායතන පච්චයා ඵස්සො;** ඵස්ස යනු මනෝ සම්ඵස්සය පමණී. මෙහිදී සළායතන පහළ වූවාට **ඡට්ඨායතන පච්චයා ඵස්සො** ලෙස දේශනා කර තිබේ. ඇතැම් පොත්වල **සළායතන**

**පච්චයා ඵස්සො** ලෙස දැක්වේ. **සළායතන පච්චයා ඵස්සො** ලෙස මෙහිදී ගත නොහැක. එක් චිත්තක්ෂණයක් ගානේ බලමින් යන පටිච්ච සමුප්පාදයක් නිසා එක අවස්ථාවේ දී චිත්තක්ෂණ 6 ක් පහළවීමේ හැකියාවක් නැත. පළමු අකුසල් ජවනය හෘදය වස්තුවේ පහළවන අවස්ථාවේ දීම චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ ආදි සිත් පහළවීමේ හැකියාවක් නැත. ඒ නිසා නිවැරදිව ඡට්ඨසංගායනාවේ සහ ඇතැම් ත්‍රිපිටක පොත්වල **ඡට්ඨායතන පච්චයා ඵස්සො** ලෙස දේශනා කර තිබේ. නාම රූප නිසා සළායතන පහළ වේ. රූපායතනසමඟයි. නමුත් හදවතේ තිබෙන මනායතනය නිසයි මනෝ සම්ඵස්සය පහළ වූයේ. ජවන්ගත විඤ්ඤාණයම වූ, මනායතනය නිසා පළමු අකුසල් ජවන් මනෝ සම්ඵස්සය පහළ විය. **ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා,** තණ්හාව ලෝභයයි. තණ්හාව නිසා දිට්ඨි උපාදානය, උපාදානය නිසා භවය, සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම. භවය නිසා උත්පාදක්ෂණය, (ජාතියා) ඨිතික්ෂණය, (ජරාව), මරණය (භංගය) නම් වේ. මේ ආකාරයෙන් පළමු අකුසල් සිත යටතේ පච්චය චතුෂ්කය අර්ථ විග්‍රහ කළ හැක.

පළමු අකුසල් සිත යටතේම හේතු චතුෂ්කය අවිද්‍යාව හේතු කරගෙන සංස්කාර චේතනාව හටගනී. අවිද්‍යාව නිසා සංස්කාර හටගනී. අවිද්‍යාව සම්ප්‍රයුක්තවීම නිසා, සහජාත වශයෙන් මේ සම්ප්‍රයුක්තවීම දැකිය හැක. අඤ්ඤමඤ්ඤ පච්චය ඔවුනොවුන් එකට බැඳුණ ලක්ෂණයයි. මේ පච්චය, හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ යන සතර ආකාරයට (නැවත 16 ආකාරයකට) ජවන් චිත්තක්ෂණයක් ගානේම පළමු අකුසල් සිත විපස්සනා වශයෙන් දැකිය යුතුය. පුද්ගල සංඥාව, ආත්ම දෘෂ්ඨිය බිඳ දැමීමට, මමය මාගේය යන දෘෂ්ඨියද බිඳදැමීමට තිබෙන; ඉතාමත් ගැඹුරු, වටිනා (එකම) ප්‍රධාන නය ක්‍රමයක් ලෙස මෙය බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

2 වන අකුසල් සිත

"**කතමෙ ධම්මා අකුසලං** -පෙ-" පළමු අකුසල් සිත හා සමානවම දෙවන අකුසල් සිත ද යෙදේ. වෙනස පවතින්නේ අසංඛාර සසංඛාර පමණි. දෙවන අකුසල් සිත සෝමනස්ස සහගත දිට්ඨි සම්ප්‍රයුක්ත

සසංඛාරිකය. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන අරමුණු නිසා පහළවන මේ අකුසල් සිතෙහි අවිද්‍යාව නිසා සංඛාරය හටගනී. අවිද්‍යාව යනු මෝහ චෛතසිකයයි. සංඛාරය අකුසල චේතනාවයි. සංඛාර නිසා විඤ්ඤාණය හටගනී. අකුසල සිතයි. විඤ්ඤාණය නිසා නාම හටගනී. එනම් වේදනා, සංඥා, සංඛාර යන ස්කන්ධ 3යි, ඇතැම් ස්ථානවල **විඤ්ඤාණ පච්චයා නාම රූපං** හිදී සහජාත වශයෙන් පහළවන සතර නාම ස්කන්ධය, කර්මජ රූප සහ චිත්තජ රූප සලකනු ලබයි. **නාම පච්චයා ඡට්ඨායතන** යෙදෙන තැන්හි වේදනා, සංඥා, සංඛාර යන නාම ස්කන්ධ නිසා මනායතනය පහළවීමය. ඇතැම් තැන්වල නාම පච්චයා ඡට්ඨායතනය නොමැතිව **ඵස්ස** සම්බන්ධ කර තිබේ. එනම් සතර නාම ස්කන්ධය නිසා පහළවන මනෝ සම්ඵස්සයයි. මෙහි එක් අවස්ථාවක දී හෘදය වස්තුව ඇසුරු කරගෙන සහජාත වශයෙන් පහළ වූ නාම රූප ගැන සඳහන් වේ. නමුත් මෙතැන දී සහජාත රූපයන්ගේ සම්බන්ධයක් මනායතනයට නොගැනේ. මෙහිදී ජවන් චිත්තක්ෂණ සලකන බැවින් ඊට පෙර පහළ වූ වොත්ථපන සිතත් සමඟ පහළ වූ හෘදය වස්තු රූපය මනායතනයට උපකාරී වේ. මෙය **නාම රූප පච්චයා ඡට්ඨායතන** නම් වේ. **නාම රූප පච්චයා සළායතනං;** යැයි නොකිය යුතුයි. සහජාත වශයෙන් නාම රූප පහළ වුවත්, නාම රූප නිසා මනායතනය හටගනී. ඍජුවම සහජාත වශයෙන් මනායතනයට උදව් වේ. මීට පෙර පහළ වූ වොත්ථපන සිතත් සමග පහළ වූ කර්මජ රූපයන්ගේ කලාපීය මහා භූත රූපයන් නැවත උපකාරී වේ. සෙසු ආයතන පහළවීම සඳහා රූපය උපකාරී වී රූපායතන 5 ක් පහළ වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො;** මෙහිදී **සළායතන පච්චයා ඵස්සො** ලෙස නොයෙදේ. ආයතන 6 ටම එකවර චිත්තක්ෂණ 6 ක් පහළ නොවන බැවිනි. මනායතනය නිසා මනෝ සම්ඵස්සය පහළ වේ. **ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදාන;** උපාදාන 4 ක් පවතී. කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන. කාම උපාදාන යනු චෛතසික වශයෙන් ලෝභ චෛතසිකයයි. එනම් තණ්හාවයි. දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන. මේ තුනම පරමාර්ථ වශයෙන් එකම චෛතසිකයකි. එනම් දිට්ඨි චෛතසිකය

මෙහිදී අර්ථ වශයෙන් 3 කි. නමුත් එකම ධර්මයම පැහැදිළි කෙරේ. යම්කිසි දෙයක වැරදි දෘෂ්ඨියක් වැරදි දැක්මක් තිබේ නම්, දිට්ඨිය ක්‍රියා කරයි. තමන් රකින ශීලය අනෙක් ශීලයන් හා පරාමර්ශනය කරයි නම්, මේ ශාසන ගුණයට වඩා අනෙක් ආගම් හොඳයි යයි සිතා ඒවාට නැමේ ද, මේ සීලබ්බත උපාදනයයි. ආත්මය පිළිබඳ විසිවැදෑරුම් සක්කාය දිට්ඨිය ඇතිවීමට පුළුවන. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති පඤ්චස්කන්ධය ගැන ආත්ම දෘෂ්ඨිය රූපය ආත්මය ලෙස, ආත්මය රූපවත් ලෙස ආත්මයතුල රූපයක් ඇත, රූපය තුළ ආත්මයක් ඇත. මේ ආකාරයට පඤ්චස්කන්ධය පිළිබඳව ඇතිවන ආත්ම දෘෂ්ඨියයි. එකම දිට්ඨි චෛතසිකය මෙහිදී ක්‍රියා කරනුයේ. එබැවින් **තණ්හා පච්චයා උපාදානං** හිදී උපාදාන 2 ක් පවතී. ලෝභය හා දිට්ඨියයි. තණ්හාව නිසා දිට්ඨිය හටගනී. තණ්හාව නිසා තණ්හාව හටගනී යන්න නැවත කීමේ අවශ්‍යතාවයක් නොමැත. එබැවින් **තණ්හා පච්චයා උපාදානං** හිදී දිට්ඨි චෛතසිකය පමණක් පැහැදිළි කෙරේ. **උපාදාන පච්චයා භවො;** භවය හටගැනීමයි. එනම් සතර නාම ස්කන්ධයාගේ හටගැනීමයි. **භව පච්චයා ජාති;** සතර නාම ස්කන්ධයන්ගේ උත්පාදක්ෂණයයි. ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය නම් වේ. මේ ආකාරයෙන් පටිච්ච සමුප්පාද නය ක්‍රමයේ දෙවැනි අකුසල් සිත පැහැදිළි කරගත යුතුවේ.

## 3 වන හා 4 වන අකුසල් සිත්

**සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං; තුන්වැනි අකුසල් සිතය.** සෝමනස්ස සහගත දිට්ඨිත විප්පයුත්ත අසංඛාරික, සසංඛාරික සිත් 2 ක් පවතී. දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික වන විට චෛතසික 2 ක් වැඩිවේ. ථීන, මිද්ධ චෛතසික 2 වැඩිවීමෙන් නාම ධර්ම 22 ක් (සිතත් සමග) වේ. දිට්ඨිගත විප්පයුත්ත කියන විටදී අර්ථ 2 ක් පැහැදිළි කරගත යුතුය. එක් අර්ථයක් නම්, කිසිදු දිට්ඨියක්, මානයක් නොමැතිව පිරිසිදු ලෝභ මූල සිත වැඩ කිරීමට පුළුවන. තවත් තේරුමක් නම් දිට්ඨිය කෙසේවත් නොයෙදෙන බැවින් ලෝභයයි මානයයි යෙදීමට පුළුවනි.

මේ අනුව ලෝභය - මානය හෝ ලෝභය පමණක් යෙදීමට පුළුවනි. මේ ක්‍රමයට චිත්තක්ෂණ ක්‍රමය පැහැදිළි කරගත යුතුය. **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත;** මේ අසංඛාරික සිතේ පටිච්ච සමුප්පාද අංග පැහැදිළි කරගනී නම්, **අවිජ්ජා පච්චයා සංඛාරො;** ඒ අකුසල් සිතේ පහළ වූ මෝහය නිසා අකුසල චේතනාව, අකුසල චේතනාව නිසා අකුසල නාමස්කන්ධයන්, අකුසල නාමස්කන්ධයන් නිසා අකුසල මනායතනය (ෂට්ඨායතනය), අකුසල මනායතනය නිසා මනෝ සම්ඵස්සය, මනෝ සම්ඵස්සය නිසා වේදනාව, වේදනාව නිසා තණ්හාව, තණ්හාව යනු ලෝභයයි. **තණ්හා පච්චයා ... උපාදානයක්** නොමැත. විප්පයුත්තයි. එහිදී **තණ්හා පච්චයා අධිමොක්ඛො.** තණ්හාව නිසා අධිමොක්ඛය. අධිමොක්ඛය යනු ඒ අරමුණ දැඩිවම අල්ලා ගැනීමයි, දැඩිව් බැස ගැනීමයි. නොසෙල්වෙන කණුවක් සේ ඒ අරමුණේම ගිලාබැස්ම අධිමොක්ඛයයි. එබැවින් තණ්හාව නිසා අධිමොක්ඛය. **අධිමොක්ඛ පච්චයා භවො;** අධිමොක්ඛය නිසා හටගන්නා සතර නාමස්කන්ධයයි. අධිමොක්ඛය චෛතසිකය හැර. සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය, ඨිතික්ෂණය හා භංගක්ෂණය ජාති, ජරා, මරණ ලෙස පැහැදිළි කෙරේ.

මේ ආකාරයටම පළමු චතුෂ්කයේ දෙවැනි පදයේ වෙනස **නාම පච්චයා ඵස්සො;** සතර නාමස්කන්ධයන් නිසා මනෝ සම්ඵස්සය පහළ වේ. **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික;** මෙහිදී ආයතනයක් සම්බන්ධ නොවේ. **ඵස්ස පච්චයා වෙදනා....;** මේ ආකාරයෙන් පැහැදිළි කරගෙන යාමේදී **තණ්හා පච්චයා අධිමොක්ඛ;** අධිමොක්ඛ චෛතසිකය යෙදේ. ඉතිරි පද පෙර ආකාරයෙන් පැහැදිළි කෙරේ.

තුන්වැනි නය ක්‍රමයේ දී, තුන්වැනි අකුසල් සිත **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික; විඤ්ඤාණ පච්චයා නාමරූපං;** විඤ්ඤාණ නිසා සහජාත වශයෙන් නාම රූප පහළ වේ. සතර නාමස්කන්ධයන් මෙන්ම චිත්තජ රූපයන්, කර්මජ රූපයන් පහළ වේ. **නාමරූප පච්චයා ඡට්ඨායතනං;** මෙහිදී රූප ලෙස සළකන්නේ

වොත්ථපන සිතත් සමග පහළ වූ හෘදය වස්තු රූපයයි. සහජාත නාමයි. සහජාත නාම රූප නිසා පහළ වූ මනායතනය, ඡට්ඨායතනයයි. **ඡට්ඨායතන පච්චයා ඵස්සො;** මනෝ සම්ඵස්සය. **තණ්හා පච්චයා අධිමොක්ඛො;** අධිමොක්ඛ ස්වභාවය තේරුම් ගත යුතුයි.

ඊළඟ නය ක්‍රමයේ දී, **විඤ්ඤාණ පච්චයා නාමරූපං;** සහජාත වශයෙන් පහළ වන නාමරූප, චිත්තජ රූප සහ කර්මජ රූපයි. **නාමරූප පච්චයා සළායතනං;** සළායතන සලකන විටදී වොත්ථපන සිතත් සමග පහළ වූ කර්මජ රූප පවතී. ඒ ඒ කලාපීය මහාභූතයන් නිසා නැවත ආයතන පහළ වේ. පළමු ජවන් චිත්තක්ෂණ අවස්ථාවේ දී ඒ පහළවන ආයතන නිසා **නාමරූප පච්චයා සළායතනං** ලෙස පැහැදිළි කරයි. **සළායතන පච්චයා ඵස්සො** ලෙස දේශනා කොට නැත. **ඡට්ඨායතන පච්චයා ඵස්සො;** ලෙස දේශනා කළ සේක. මෙහිදී හෘදවස්තුව ඇසුරු කරගෙන පහළ වූ තුන්වන අකුසල චිත්තක්ෂණය තුළ පවතින මනායතනය නිසයි මනෝසම්ඵස්සය පහළ වන්නේ. මනායතනය නිසා මනෝසම්ඵස්සය පහළ වේ. මේ ආකාරයෙන්, **ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා අධිමොක්ඛං;** චෛතසිකය පහළ වේ. ඒ ඒ අරමුණේ නොසෙල්වී පැවතීම අධිමොක්ඛයයි. " **අධිමුච්චනං අධිමොක්ඛො**" දැඩි සේ යෙදීම අධිමොක්ඛය වේ. **අධිමොක්ඛ පච්චයා භවො;** සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම. **භව පච්චයා ජාති, ජරා, මරණං;** ඒ සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණයයි. මේ ආකාරයෙන් ඉහත ස්වභාවයන් අවබෝධ කරගත යුතුයි.

හතරවෙනි අකුසල් සිත **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික** ය. මෙහි කිසිම වෙනස් නැත. නාමධර්මයන්ගේ ථීන මිද්ධ එකතුවීමේ වෙනස පමණක් පවතී. පිරිසිදු ලෝභ සිතක් නම්, චෛතසික ධර්ම 18 ක්, සිතත් සමග 19 කි. මේ 19 ට ථීන මිද්ධය එකතු වී 21 ක් වේ. මානය ගත් විට, සිතත් සමග චෛතසික 20 කි. ථීන මිද්ධය සමග 22 ක් වේ. මේ ආකාරයෙන් නාමධර්ම හඳුනාගත යුතුය. මේ ආකාරයෙන් සෝමනස්ස සහගත සිත් 4 ගැන අවබෝධ කරගත හැක.

උපෙක්ඛා සහගත සිත්, මෙහිදී ද වෙනස් නැත. වේදනාවේ වෙනස පමණයි යෙදෙන්නේ. උපෙක්ඛා සිත් 4 ක් පවතී. උපෙක්ඛා සහගත **දිට්ඨිගත සම්පයුත්ත** අවස්ථාවේ දී වේදනාව උපෙක්ඛා වේදනාව වේ. **ඵස්ස පච්චයා වෙදනා;** වන විටදී උපෙක්ඛා වේදනාව යෙදේ. **තණ්හා පච්චයා උපාදානං** යෙදෙනුයේ **දිට්ඨිගත සම්පයුත්ත** බැවිනි. දිට්ඨි උපාදානය යෙදේ. **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත** අවස්ථාවේ දී **ඵස්ස පච්චයා වෙදනා** හිදී උපෙක්ඛා වේදනාව පහළ වේ. **තණ්හා පච්චයා අධිමොක්ඛො;** අධිමොක්ඛ චෛතසිකය පහළ වේ. මෙපමණයි පවතින වෙනස වන්නේ. මේ සිත් 3 හිම පහළවන පටිච්ච සමුප්පාද අංගයන් සහජාත වශයෙන් පහළවන ආකාරය පැහැදිලි කරගත හැක.

මෙය භාවනා වශයෙන් වඩන විටදී වඩාත්ම පැහැදිලි වේ. නමුත් ඊට පෙර ධර්මාවබෝධය, වැටහීම තිබිය යුතුය. වැටහීම තිබූ තරමට භාවනාවේ දී ප්‍රායෝගික වේ. මෙය තමන් ප්‍රායෝගිකව දකින තරමට අවබෝධය ඇති වේ. එහි ධර්මතාව ඉබේටම ප්‍රකට වේ. පරමාර්ථ ධර්මයන්ගේ ස්වභාවය කවදාවත් වෙනස් නොවේ. නමුත් කරුණු අමතක විය හැක. පරමාර්ථ ධර්මයන්ගේ නියම ස්වභාවය නුවණින් දකී නම්, එය හැමදාම මතක තිබේ. වෙනස් නොවේ. හැම අයෙකුගේම අකුසල් සිත සමානයි. නමුත් අකුසල් සිත හේතුවෙන් කරන ක්‍රියාව වෙනස් ය. සිතේ ස්වභාවය සමානයි. පරමාර්ථ ධර්ම සමානයි. නමුත් ක්‍රියාව අනුව බලය අඩුවැඩිවීම පුද්ගලයන් අනුව සිදුවේ. ප්‍රණීත ආහාරයක් දුටුවිට කිහිප දෙනෙක් ආශාවක් රසයක් ඇතිකර ගනී. එකම අරමුණ නමුත් ග්‍රහණයේ දී වෙනසක් පවතී. ලෝභ සිතෙන් ග්‍රහණය කරගත්තා නම් එකම නාමධර්ම සමුදායක් පහළ විය. නමුත් යොදන චිත්ත ශක්තිය, ඒ දැක්ම, බලය අනුව අකුසල් සිතේ බලය උස් පහත් වේ. නමුත් පරමාර්ථ සමානයි. බලය වෙනස් වේ. මේ ධර්මය යනු ප්‍රායෝගිකව යෙදිය යුතු දෙයකි. මූලික දැනුම ලබාගෙන එහි ස්වභාවය දැකිය යුතුය. භාවනාවෙන් ලද අත්දැකීම අරටුවක් හා සමානය. සිහිමුලාවන මොහොත දක්වාම එය රැඳී පවතී. නුවණ පැවැත්වීමට නොහැකිව ඉන්ද්‍රිය විකලත්වයට පත් වූ දිනක දුබල වුවත් ඒ දක්වා බලවත් වේ. ධර්මය අරටුවක් හා

සමාන කරගත යුතුය. තමා ඉගෙන ගත් දේ ප්‍රායෝගිකව යෙදීමෙන් දියුණු කරගත හැක. මේ ආකාරයෙන් අකුසල් සිතක් ගානේ පටිච්ච සමුප්පාද අංගයන් යෙදෙන අයුරු බැලිය යුතුය. ඒ ආකාරයෙන් නිවැරදි වැටහීමක් ඇතිකර ගත හැක.

## 02 දෝෂ මූල සිත්

දෝස මූල සිතක් ගත් විටදී "**යස්මිං සමයේ අකුසලං චිත්තං -පෙ- දොමනස්ස සහගතං පටිඝං සම්පයුත්ත -පෙ-**" පච්චය චතුෂ්කයේ පළමු වැනි නය ක්‍රමයයි. යම් වෙලාවක අපගේ සිත තුළ පටිඝය, ද්වේශය යෙදුන සිතක් පහළ වේ. ද්වේශය මානසික වේදනාවන් සමග යෙදේ. දෝමනස්ස වේදනාවත් සමග සිතක් පහළ වේ. ඒ සිත පහළවීමට රූපාරම්මණයක් ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන අරමුණක් ඇති වේ. අප්‍රිය අමනාප පුද්ගලයෙක් දකීමට ලැබුණහොත් තරහක් ඇතිවේ. ඒ වාගේම අප්‍රිය අකමැති ශබ්දයක්, ගන්ධයක්, කටුක අමිහිරි ආහාරයක්, කටුක ස්පර්ශයක්, කටුක අරමුණක් සිහිකරනවා, මේ අවස්ථාවලදී දෝමනස්ස සහගත අකුසල් සිත පහළ වේ. මේ අකුසල් සිත් තුළ පටිච්ච සමුප්පාද අංගයක් දකිය හැක.

**අවිජ්ජා පච්චයා සංඛාරා;** ඒ අකුසල් සිතේ පහළවන මෝහය නිසා පළමුවෙනි දෝස චේතනාව නමැති සංඛාරය පහළ වේ. සංඛාර නිසා විඤ්ඤාණය, දෝස චේතනාව නිසා දෝස මූල සිත, විඤ්ඤාණය පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං;** මේ දෝස මූල සිත නිසා වේදනා, සංඥා, සංඛාර, නමැති නාම ස්කන්ධ පහළ වේ. **නාම පච්චයා ඡට්ඨායතනං;** වේදනා, සංඥා, සංඛාර කියන දෝස මූල සිත සමග පහළ වූ නාමස්කන්ධයන් නිසා දෝස මූල විඤ්ඤාණය නැතිනම් මනායතනය, ඡට්ඨායතනය පහළ වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො;** මේ ඡට්ඨායතනය නිසා දෝස මූල, පටිඝ මූල සම්ඵස්සය පහළ වේ. **ඵස්ස පච්චයා වෙදනා;** මනෝසම්ඵස්සය දෝස මූල හෙයින් වේදනාව දෝමනස්ස වේ. මානසික දුක් වේදනාවක් කලින් පහළ වූ සෝමනස්ස සිත සමග සතුටු වේදනාවක්, උපේක්ඛා සිත සමග උපේක්ඛා වේදනාවක්, ඇතිවේ. මෙහිදී මානසික දුක් වේදනාවන් ඇති වේ. මෙහිදී **වේදනා පච්චයා තණ්හාව** නොයෙදේ.

ලෝභ මූල සිතක් නොවන බැවිනි. ලෝභ මූල සිතේ **වේදනා පච්චයා තණ්හාව** යෙදේ. සතුටු වේදනාවක් ලදහොත් එයට ඇලෙයි. උපෙක්ඛා වේදනාවක් ලදහොත් ඇලීමක් පවතී. නමුත් දුක් වේදනාවක් ලදහොත් ඉබේම අරමුණත් සමග ඇලීම, ගැටීම ඇතිවේ. ඒ අරමුණ ගෙනා පුද්ගලයා සමග ගැටීම මේ ආදී හැම දෙයකම හැපීමෙන් ඇතිවේ. **වෙදනා පචචයා පටිඝං;** වේදනාව නිසා ද්වේශය හටගනී. මානසික දුක් වේදනාව සමග වේදනාව ඉපිලි ඉපිලී එන්නට පටන් ගනී. දෝමනස්ස වේදනාව, මානසික දුක් වේදනාව නිසා පටිඝය ඇතිවේ. **පටිඝ පචචයා අධිමොක්ඛො;** උපාදානයක් නොයෙදේ. උපාදාන 2 ක් පවතී. ලෝභය හා දිට්ඨියයි. මේ චෛතසික 2 ම ද්වේශය සමග පහළ නොවේ. එබැවින් මෙහිදී **පටිඝය නිසා අධිමොක්ඛය** ඒ අරමුණ තුළ දැඩිවම බැස ගැනීම අල්ලා ගැනීමයි. එහෙත් උපාදාන ස්වභාවය, ලක්ෂණය මතුවූවාට මෙය අධිමොක්ඛ චෛතසිකයයි. අධිමොක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම භවය, භවය නිසා ඒ නාම ස්කන්ධයන්ගේ උත්පාද, ඨිති, භංග-ජාති, ජරා, මරණ කියන මේ ස්වභාවය ඇති වේ.

ප්‍රධාන මාතෘකා පදවලදී සිතක් ගානේ පටිච්ච සමුප්පාද අංග ගනු ලැබේ. සිතක් ගානේ සලකන විටදී එක් එක් තැන්වලදී වෙනස්කම් ඇතිවේ. ඒ වෙනස්වීම පටිච්ච සමුප්පාද අංග හේතු ඵල වශයෙන් ගත යුතුයි. දෝමනස්ස වේදනාව නිසා පටිඝය හටගනී. දෝමනස්ස වේදනාවක්, හටගන්නේ නැතිනම්, මානසික දුක් පීඩාවක් හටගන්නේ නැත. එනම් හේතු - ඵලයි. මේ සිතට අනුව පටිඝය නිසා උපාදානයක් පහළ වන්නේ නැත. නමුත් උපාදානයක් උපනිශ්‍රය වශයෙන් පහළ වේ. උදා:- චිත්තක්ෂණයක් ගානේ සලකන විටදී උපාදානයක් නැත. නමුත් චිත්ත වීථිය හමාර වූ විට නැවත නැවත සිහිකරන විටදී මේ අරමුණ දැඩිව උපාදාන කරගනී. දැඩිව උපාදාන කරගත් හෙයින් සිතේ වෛරය ඇතිවේ. උදා:- කෙනෙක් දොස් කීවා. නැවත සිතන්න, සිතන්න දුකෙන් වැළපෙන්න පටන් ගනී. හේතුව උපාදානයයි උපනිශ්‍රයයි. එක් කරුණක් එක් ආකාරයකින් පැහැදිලි කරගත් පසු දහස් ආකාරයකින් විස්තර වේ.

එයින් මෙය සාගරයක් බඳුය. සාගරය දෙස බැලූ විට අගක්, මුලක්, ගැඹුරක් නොදනේ. නමුත් ඒ තුළ බැලූවිට ලස්සන දේවල්, ගැඹුරට යන්න යන්න ගමන භයානක වුවත් පුදුමාකාර දේවල් දකගනී. මේ ධර්මය ද එක පැත්තකින් පමණක් දක විස්තර කිරීමට නොහැක. මාතෘකා පද අනුව එකින් එක විස්තර කිරීම පමණක් මිස එක තැනක් විස්තර කිරීමට මුළු සාගරයටම බැස ගත යුතුයි. ධර්මය නමැති සාගරයේ ම පිහිනිය යුතුයි. මෙහිදී තණ්හාව නොමැති හෙයින් පටිඝයයි. පටිඝය නිසා උපාදානයක් ඒ චිත්තක්ෂණයේ නැත. නමුත් අධිමොක්ඛය පවතී. මේ කියන ස්වභාවය පටිච්ච සමුප්පාද හේතු ඵල අනුව අතීත හේතු 5 ක් නිසා වර්තමාන ඵල 5 ක්, වර්තමාන ඵල නිසා අනාගත ඵල විස්තරයේ දී නැවත වෙනස් ආකාරයකට උපනිශ්‍රය වී ගලාගෙන එයි. ආසේවන සිදු නොවේ. ජවනයෙන් ජවනයට උදව් කරන ස්වභාවයයි. උපනිශ්‍රය යනු ඒ ජවනය භංග වූ පසු එයම අරමුණු වී නැවත සිතුවිලි පහළ වේ.

දෙවැනි චතුෂ්කයේ පවතින වෙනස, **නාම පච්චයා ඵස්සො;** (මෙහිදී නාම පච්චයා ඡට්ඨායතන හෝ සළායතන නොමැත.) සතර නාමස්කන්ධයන් නිසා දෝස මූල සිතේ මනෝ සම්ඵස්සය පැහැදිළි කෙරේ. පෙර පරිදිය. වෙනසක් නොමැතිව, වේදනාව, දෝමනස්ස වේදනාව යෙදේ. **වෙදනා පච්චයා පටිඝය;** හැපීම ද්වේශයයි. ද්වේශය නිසා අධිමොක්ඛය එය දැඩිව ගැනීමයි.

තුන්වැනි නය ක්‍රමයේ වෙනස, **විඤ්ඤාණ පච්චයා නාමරූපං; නාමරූප පච්චයා ඡට්ඨායතනං;** දෝස මූල සිත පහළවන අවස්ථාවේ සහජාත වශයෙන් ඒ චිත්තක්ෂණයේම චිත්තජ රූප, සතර නාමස්කන්ධයන් සහ කර්මජ රූප පහළ වේ. එයයි නාමරූප පහළවීම. **නාමරූප පච්චයා ඡට්ඨායතනං;** හි පළමු ජවන් චිත්තක්ෂණයට පෙර පහළ වූ වොත්ථපන සිත සමග පහළ වූ හෘදය වස්තු රූපය මනායතනයට උදව් කරයි. මනෝ සම්ඵස්සය, ඵස්ස නිසා දෝමනස්ස වේදනාව, මානසික දුක් වේදනාව, වේදනාව නිසා පටිඝය (ද්වේශය), ද්වේශය නිසා ඒ තුළ බැසගැනීම අධිමොක්ඛය, මේ ආකාරයෙන් අංගයන් පහළ වේ.

හතරවෙනි නය ක්‍රමයේ දී **විඤ්ඤාණ පච්චයා නාමරූපං; නාමරූප පච්චයා සළායතනං; ඡට්ඨායතන පච්චයා ඵස්සො;** දෝමනස්ස සිත නිසා සහජාත වශයෙන් නාමරූප පහළ විය. කර්මජ රූප, චිත්තජ රූප සහ නාමස්කන්ධය පහළ විය. නාමරූප නිසා සළායතන පහළ වේ. මෙහිදී නාමය නිසා වේදනා, සංඥා, සංඛාර නමැති දෝමනස්ස සහගත සිතේ තිබූ නාමස්කන්ධ 3 නිසා දෝමනස්ස සිතේ පැවති මනායතනය පහළ විය. වොත්ථපන සිතත් සමග පහළ වූ කර්මජ රූපයන්ගේ කලාපීය මහාභූත රූප පඨවි, ආපෝ, තේජෝ, වායෝ නිසා නැවතත් ආයතන පහළ වේ. චක්ඛායතනය තුළ පවතින සතර මහා භූතයන් නිසා නැවත චක්ඛායතනයක් පහළ වේ. සෝතායතනයක්, ඝානායතනයක්, ජිව්හායතනයක්, කායායතනයක් පහළ වේ. මේ ආයතනයන්ගේ හටගැනීම සළායතන නම් වේ. **සළායතන පච්චයා ඵස්සෝ** ලෙස දේශනා කොට නැත. මෙය එක් චිත්තක්ෂණයක බැලිය නොහැකි හෙයිනි. එබැවින් **ඡට්ඨායතන පච්චයා ඵස්සො** ලෙස පැහැදිලි කරයි. සළායතන පහළ වූවාට මනායතනය බලවත්ය. මනායතනය නිසා මනෝ සම්ඵස්සය පහළ වේ. චක්ඛායතනය තුළ, සෝතායතනය තුළ, ඝානායතනය තුළ, ජිව්හායතනය තුළ, කායායතනය තුළ, පහළ වූ මනායතනයක් නැත. නමුත් හෘදය වස්තුව තුළ පහළ වූ මනායතනය පවතී. එයින් මනෝ සම්ඵස්සය පහළ වේ. මනෝ සම්ඵස්සය නිසා දෝමනස්ස වේදනාව, දෝමනස්ස වේදනාව නිසා පටිඝය, පටිඝය නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම. මෙහිදී අධිමොක්ඛ චෛතසිකය හැරයි. අධිමොක්ඛය උපකාර කරන බැවිනි. උපාදාන පච්චයා භවො කියන අවස්ථාවේ දී දිට්ඨි හැර ඉතිරි නාමස්කන්ධ 3 යි ගනු ලබන්නේ. පළමු දෝමනස්ස සහගත සිතේ උප්පාද, ඨිති, භංග අවස්ථා ජාති, ජරා, මරණ නම් වේ. උත්පාදයක් පහළ වූවා යනු අනිවාර්යෙන් ඨිතියක්, භංගයක් පහළ වේ. ඒ ඒ තැන්වලදී නාමරූප යෙදුනා නම්, රූප ජාතියයි. නාම ජාතියයි දෙකම වටහා ගත යුතුය. රූප මරණය, මරණය වටහා ගත යුතුය. නාමයක් පමණක් යෙදුනා නම්, නාමය, පමණක් ජාති, ජරා, මරණය ලෙස වටහා ගත යුතුය. ඒ ඒ මාතෘකා නය ක්‍රමයට අනුව වටහා ගත යුතුය.

මේ කියන නය ක්‍රමයටම හේතු සම්ප්‍රයුක්ත අඤ්ඤමඤ්ඤ චතුෂ්ක යනාදී නය ක්‍රම 16 කට වටහා ගත යුතුය.

දෙවැනි සිත දෝමනස්ස සහගතයි. පටිඝසම්පයුත්තයි. සසංඛාරිකයි. වෙනසක් නැත. නාම ධර්මයන්ගේ වෙනස පමණයි ඇත්තේ. දෝමනස්ස සිත් ගත් විට, එහි චෛතසික 4 ක් යෙදේ. දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච. මේ 4 එකටම ක්‍රියා නොකරයි. දෝස මූල සිත ගත්විට පහළවන චෛතසික;

| | | |
|---|---|---|
| ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය, මනසිකාර, (සබ්බ චිත්ත සාධාරණ) | - | 7 |
| විතක්ක, විචාර, විරිය, අධිමොක්ඛ, ඡන්ද (ප්‍රීති නැත) | - | 5 |
| මෝහ, අහිරික, උද්ධච්ච, අනොත්තප්ප | - | 4 |
| දෝස | - | 1 |
| | | 17 |

සසංඛාරික වූ විට ථීනමිද්ධ සමග 19 ක් වේ.

ඊර්ෂ්‍යාව, මසුරුකම, කුක්කුච්චය යන තිදෙන හැර ද්වේශය තනිවම පහළ වේ. නමුත් ද්වේශය නොමැතිව මච්ඡරිය පහළ නොවේ. අපි යමකට ඊර්ෂ්‍යා කරනවා නම් සිතේ ද්වේශයත් සමග පහළ වේ. යමකට මසුරුකම දක්වයි නම් ද්වේශය සමග පහළ වේ. කුක්කුච්ච කරනවා නම් ද්වේශයත් සමග පහළ වේ. ද්වේශය - මසුරුකම, ද්වේශය - ඊර්ෂ්‍යාව, ද්වේශය - කුක්කුච්චය යෙදිය හැක. ඒ අනුව නාම ධර්මයන්ගේ වෙනස ඒ ඒ චිත්තක්ෂණය අනුව යොදා ගත යුතුය. මේ ආකාරයෙන් ද්වේශමූල සිත් 2 ක් පැහැදිලි කරගත යුතුය. මේ ක්‍රමයට එක් චිත්තක්ෂණයක් ගානේ පටිච්ච සමුප්පාද අංගයන් බුදුරජාණන් වහන්සේ දේශනා කොට පැහැදිලි කරන සේක.

සාදු! සාදු! සාදු!

# පස්වන දේශනාව

## 03 මෝහ මූල සිත්

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

**කතමෙ ධම්මා අකුසලා?....උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්තං -පෙ-**

ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සිතක් සිතක් ගානේ පටිච්ච සමුප්පාද නය ක්‍රමයට පටිච්ච සමුප්පාද අංගයන් ඔස්සේ පටිච්ච සමුප්පාද අංගයන් හඳුනාගෙන, එම අංගයන් ඔස්සේ ඒ පරමාර්ථ ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනාවට නංවන භාවනා මාර්ගයට අවශ්‍යවන මූලික උපදෙස් මාලාවන්, මූලික ධර්ම සම්භාරයන්, ධර්ම කරුණු එකතු කරමින් අර්ථ විග්‍රහ කරන්නට යෙදුණ විභංගප්‍රකරණ පටිච්ච සමුප්පාද විභංගයට අන්තර්ගත වන අකුසල මාතෘකාව යටතේ විචිකිච්ඡා සම්බන්ධයෙන් කළ මාතෘකා දේශනාවයි මෙයින් පැහැදිලි කරන්න්ට යෙදෙන්නේ.

ඉහත මතෘකාවට අනුව බුදුරජාණන් වහන්සේ කරනු ලබන අනුශාසනාව නම්, යම් කාලයක, යම් වේලාවක, යම් තැනකදී අකුසල් සිතක් පහළ විය හැකි බවයි. කුමන අකුසල් සිතක්ද? උපේක්ෂා වේදනාව සහිත විචිකිච්ඡාව යෙදුනු අකුසල් සිතක් පහළ විය හැක. විචිකිච්ඡාව යනුවෙන් අදහස් වන්නේ, අප සිත තුළ තියෙන සැකය, සංකාවයි. මේ විචිකිච්ඡාව ඇතිවන කරුණු 8 ක් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

(1) "**බුද්ධෙ කඞ්ඛති විචිකිච්ඡති**" බුදුරජාණන් වහන්සේ ගැන සිතා මෙවැනි ගුණ තිබේ, මෙවැනි ආශ්චර්යය තිබේය, මේවා විශ්වාස කළ හැකිද? බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙක් ලෙසයි ඉපදුනේ. එසේ නම් සාමාන්‍ය කෙනෙක් විය යුතුය. මෙවැනි විශේෂ ගුණ තිබිය හැකිද? යනාදි ලෙස බුදුරජාණන් වහන්සේ ගැන සැක උපදවා ගැනීම.

(2) බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ගැන සැක උපදවා ගැනීම. **"ධම්මෙ කංඛති විචිකිච්ඡති"** තථාගතයන් වහන්සේ දේශනා කළ මේ සම්මුතිය, පරමාර්ථ, සූත්‍ර, අභිධර්මය යනාදි ත්‍රිපිටක ධර්මය ගැන යම්කෙනෙක් කරුණු කාරණා විමසා මේ පිළිබඳව සැක සංකා උපදවා ගනී. මෙය විශ්වාස කළ නොහැකිය, මෙය බුද්ධ වචනයක් විය නොහැකිය, මෙය පසුව ලියවූ දෙයක්, බුද්ධ වචනය වී නම් භාෂා ශෛලිය වෙනස් විය යුතුය, යනාදී නොයෙක් අයුරින් සිතා සැක උපදවා ගැනීමයි.

(3) **"සංඝෙ කඞ්ඛති විචිකිච්ඡති"** මහා සංඝයා ගැන සැක උපදවා ගැනීම. මහා සංඝරත්නය යැයි කියූ විටදී අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝරත්නය පමණක් යැයි සිතීම. අතීතයේ පහළ වූ අග්‍ර ශ්‍රාවක, මහා ශ්‍රාවක, මහරහත් ආදී මාර්ග ඵලලාභී උතුමන් වහන්සේලා පමණයි සංඝරත්නය, අනික් පිරිස සංඝ ගණයට නොගැනේ. මෙවැනි මති මතාන්තර ගැන සැක සංකා උපදවා ගැනීමයි.

(4) **"සික්ඛාය කංඛති විචිකිච්ඡති"** තමන් රකින සීලය ගැන සැක උපදවා ගැනීම විශේෂයෙන් පංච සීලය ගිහි අයට අදාළ දෙයක්, ගිහි ජීවිතය රැකෙන දෙයක්. ප්‍රධාන අඩිතාලම පංච සීලය තුළ යමෙක් හැසිරේ නම්, ඔහු රැකෙනවා. අද සමාජය තුළ දක්නට ලැබෙන සමාජය ගමන් කරන සම්පූර්ණ ගමන නැවැත්විය හැකියාවක් පංච සීලය පවතී. මේ පංච සීලය රකින අයෙක් අබෞද්ධයන් අතර නැත, වෙනත් ආගම් දර්ශනවල නිදහස තිබේ යැයි සිතයි. බුදු දහම තුළ සීලය නිසා සම්පූර්ණ හිර කිරීමක් සිදුකොට ඇතය. අපේ මේ සීලයට වඩා ඒ අයගේ ප්‍රතිපදාව හොඳයි. ඒ අය හොඳට දියුණු වී ධන ධාන්‍යයෙන්, යස ඉසුරින් සැප සම්පත් විඳී. අපි පංච සීලය රකිමින් එක තැනම රැඳෙනවා, යනාදි විවිධ මතිමතාන්තර සිතමින් සීලය ගැන කුකුස් කිරීම. ඒ වාගේම මේ ශික්ෂාපද බුදුරජාණන් වහන්සේ දේශනා කළාද? යයි සැක සංකා උපදවා ගනී. තමන් රකින සීලය ගැන තමන්ට සැකයක් සංකාවක් ඇති වී මේ සීලය පළුදු වුනාද, නැද්ද යනාදී මතිමතාන්තර ඇතිකර ගැනීම, මොනයම් හෝ ක්‍රමයකින් තමන් රකින ශීලය ගැන ඇතිවන සැක සංකාව තුළින් විචිකිච්ඡාව උපදී.

(5) "**පුබ්බන්තෙ කංඛති විචිකිච්ඡති**" පෙර දේවල් ගැන සැක උපදවා ගැනීම. යම්කිසි දෙයක් පහළ වී උත්පාද, ඨිති, භංග වී අතීතයට ගියා. මේ ජීවිතයේම අතීතයට ගිය දේවල් ගැන, අතීත ජීවත ගැන, අතීතය ගැන කෙනෙකුට සැක සංකා උපදින්න පුළුවනි.

(6) "**අපරන්තෙ කංඛති විචිකිච්ඡති**" පහළ නොවූ අනාගතය ගැන සැක සංකා උපදවා ගැනීම.

(7) "**පුබ්බන්තා පරන්තෙ කංඛති විචිකිච්ඡති**" අතීත අනාගත කාල දෙකම (වර්තමානයත් අයිති කරගත හැකිය) ගැන සැක සංකා උපදවා ගැනීම.

(8) "**ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු**" පරම ගම්භීර පටිච්ච සමුප්පාද අංගයන් ගැන, පටිච්ච සමුප්ද නය ක්‍රමය ගැන, සංසාර ගමන ගැන, සංසාර චක්‍රය ගැන සැක සංකා උපදවා ගැනීම. අප අතීතයේ ඉපදුනා ද, කවුද දන්නේ? කවුද පැවසුවේ? කවුද දුටුවේ? අතීතයේ ඉපදුන නිසා වර්තමානයේ ඉපදුනා ද (වර්තමාන භවය පෙනේ විඳින සැප දුක දකියි) මේ භවයෙන් චුත වී ඊළඟ භවයට කොහෙද යන්නේ? කවුද දන්නේ කාටද කියන්නේ? කාටද පෙනෙන්නේ? මේ වාගේ කෙනකු සැක සංකා උපදවාගනී නම් මේ විචිකිච්ඡා සිත උපදින්න පුළුවනි.

මේවා අරමුණක්, රූපාරම්මණ, ශබ්දරම්මණ, ගන්ධාරම්මණ, රසාරම්මණ, ඵොට්ඨබ්බාරම්මණ සහ ධම්මාරම්මණ වශයෙන් ලැබේ නම් ඒ අරමුණ නිසා මේ විචිකිච්චඡා සිත උපදින්න පුළුවනි.

මේවා අරමුණක්, රූපාරම්මණ, ශබ්දරම්මණ, ගන්ධාරම්මණ, රසාරම්මණ, ඵොට්ඨබ්බාරම්මණ සහ ධම්මාරම්මණ වශයෙන් ලැබේ නම් ඒ අරමුණ නිසා මේ විචිකිච්ඡා සම්ප්‍රයක්ත සිත පහළ වීමට පුළුවනි. බුදුපියාණන් වහන්සේ වදාරණ මේ විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත පහළ වනුයේ ජවන් ගතවය. රූපාරම්මණය නිසා, බුද්ධ රූපයක් දැක මේ පිළිබඳව සැක සංකා පහළ කරගෙන යම්කිසි දේවල් සිතමින් ඒ රූපාරම්මණය ගත් අවස්ථාවේ දී රූපාරම්මණය නිසා චක්ඛු ද්වාරික වශයෙන් ජවන් සිත් 7ක් පහළ වේ. මේ ජවන් සිත් 7 පහළ වන්නේ විචිකිච්ඡා සම්ප්‍රයුක්තවයි. මේ විචිකිච්ඡා සිත සමඟ උපදින නාම ධර්ම තිබේ. (නාම ධර්ම සිතත් සමඟ16කි. සිත නැති 15කි.)

| | |
|---|---|
| ඵස්ස, වේදනා, සංඥා, චේතනා | |
| ඒකාග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය, මනසිකාර | 07 |
| විතක්ක, විචාර, වීර්ය | 03 |
| මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, විචිකිච්ඡා | 05 |
| | 15 |

සිත සමග 16 යි

සබ්බ චිත්ත සාධාරණ 7 ම ඇතුළත් වේ. ප්‍රකිර්ණක චෛතසික 6 න් මේ සිත උපෙක්ඛා සහගත නිසා, ප්‍රිතිය නොයෙදේ. මෝහ මූල නිසා ඡන්දය නැත. මේ සිත විචිකිච්ඡා නිසා අධිමොක්ඛය නැත. චෛතසික 3ක් බැහැර වී ඉතිරි 3 යෙදේ. හැම අකුසල සිතකට සාධාරණ වූ චෛතසික 4 සහ විචිකිච්ඡා චෛතසිකය සම්ප්‍රයුක්ත වේ. මේ ආකාරයට නාම ධර්ම 15කි. සිත සමග 16කි. මේ නාම ධර්ම ගොඩ තුළ පටිච්ච සමුප්පාද අගයන් පරමාර්ථ වශයෙන් දැකිය හැක. පරමාර්ථ වශයෙන් දැක හඳුනාගෙන විදර්ශනා වශයෙන් වැඩිය හැක. බුදුපියාණන් වහන්සේ වදාරණ සේක් නම්, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො** විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත තුළ පහළ වන මෝහ චෛතසිකය අවිද්‍යාවයි. මෝහ චෛතසිකය නිසා සංඛාර උපදී, සංඛාර යනු, ඒ සිතේ පහළ වන අකුසල චේතනාව, චේතනා චෛතසිකයයි. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**, විඤ්ඤාණ යනු ඒ අකුසල සිතය. විචිකිච්ඡා සිතය. විඤ්ඤාණය පහළ විය. මෝහය ප්‍රධාන හේතුව විය. මෝහය නිසා අකුසල චේතනාව පහළ විය. මෝහය ප්‍රධාන හේතුව විය. මෝහය නිසා අකුසල චේතනාව පහළ විය. අකුසල චේතනාව නිසයි විචිකිච්ඡා සිත පහළ වන්නේ. විචිකිච්ඡා සිත නිසා නාම ධර්ම පහළ වේ. විචිකිච්ඡා සිත ගත්විට විඤ්ඤාණ ස්කන්ධය, සෙසු වේදනා, සංඥා, සංඛාර ස්කන්ධත්‍රය පහළවීම සිදුවේ. **නාම පච්චයා ඡට්ඨායතනං** වේදනා, සංඥා, සංඛාර කියන ස්කන්ධ 3 නිසා, නාම ධර්ම නිසා ඡට්ඨායතනය උපදී. මනායතනය, එනම් සිත උපදී. ඡට්ඨායතන පච්චයා ඵසෙසා ඵස්ස යනු ස්පර්ශය නම් වේ. ස්පර්ශය ඵස්ස චෛතසිකයයි. ඵස්ස ප්‍රධාන කොට මනෝ සම්ඵස්සය අරමුණු කළ හැක. **ඵසස පච්චයා වේදනා** මේ ස්පර්ශය නිසා උපෙක්ඛා

වේදනාව ඇතිවේ. "**නෙවසාතං නාසාතං**" ආදි ලෙස සැපත් නැති දුකත් නැති මැදහත් වේදනාව උපදී. මේ සිත සමග **වේදනා පච්චයා..... තණ්හා** නොවේ. තණ්හාව යෙදිය නොහැක. මෙය ලෝභ මූල සිතක් නොවන හෙයිනි. තණ්හාව උපදින්නේ ලෝභ මූල සිත් සමගයි. තණ්හාව පරමාර්ථ වශයෙන් ගත් විට ලෝභයයි. ලෝභය මේ මෝහ මූල සිතේ උපදින්නේ නැත. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මෙතැනදී **වෙදනා පච්චයා විචිකිච්ඡා** ලෙස දේශනා කළ සේක.

මේ උපෙක්ෂා වේදනාව සමග විචිකිච්ඡාව පහළ වේ. විචිකිච්ඡාව යනු සැකයයි. විචිකිච්ඡාව නිසා භවය, **විචිකිච්ඡා පච්චයා භවො** අධිමොක්ඛයක් නැත. විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතේ අධිමොක්ඛයක් යෙදෙන්නේ නැත. හේතුව නම්, විචිකිච්ඡා යන මේ සැකය ඒ මොහොතට, ඒ චිත්තක්ෂණය තුළ පහළ වීම නිසා අපට කිසිම ස්ථාවරයක් නැත. ඒ අරමුණේ ස්ථාවරය නැති හෙයින් අධිමොක්ඛය නොයෙදේ. අධිමොක්ඛය තුළින් අරමුණ ස්ථාවර කරයි. විචිකිච්ඡාව චිත්තක්ෂණය උපදින මොහොතේ අධිමෝක්ඛය යෙදෙන්නේ නැත. නමුත් විචිකිච්ඡා නමැති චිත්තක්ෂණ මොහොතට අධිමොක්ඛය නොයෙදුනාට මේ විචිකිච්ඡාව බලවත් වී ප්‍රතිසන්ධිය ගෙන දිය හැකිය. උදා:- භාවනා කර්මස්ථාන වඩාගෙන යන විටදී අපට යම්කිසි සැකයක් පහළ වේ. යම්කිසි උද්ධච්චයක් පහළ වේ. උද්ධච්චය යනු සිත එක අරමුණක තියාගත නොහැකිව නොයෙක් අරමුණු කරා සිත ගමන් කරයි. සිත අවුල් කරයි. භාවනාවෙන් නැගිට්ටාට පසුව අපේ සිතට කා වදින්නේ විචිකිච්ඡාව ද? උද්ධච්චය ද? ප්‍රායෝගිකව බැලූ විට විචිකිච්ඡාවයි. උද්ධච්චය නොවෙයි. උද්ධච්චය අමතක වේ. උද්ධච්චය ඒ වේලාවේදී ඉපදුනා, පැවතුනා, භංගවුණා. අවසන් වේ. උද්ධච්චය නැවත මතක් නොවේ. නමුත් ඒ වෙලාවේදී යම්කිසි සීල සැකයක්, ධර්ම ගැටළුවක් මතුවුණා නම්, ඒ මොහොතට අරමුණ ස්ථාවර නොවේ. නමුත් ඒ තුළ ලොකු ශක්තියක් ඇතිවෙලා අපට මේ නැවත නැවත මතුකර දෙයි. මෙයයි මෙහි තිබෙන බරපතලකම. මේ ආකාරයෙන් විචිකිච්ඡා සිතේ ස්වභාවය වටහාගත යුතු වේ.

**භව** යනු සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තියයි. **භව පච්චයා ජාති**ඃ ඒ ඒ ජවන් අවස්ථාවලදී. සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය ජරාව නාමස්කන්ධයන්ගේ ඨිතියයි. නාමස්කන්ධයන්ගේ විනාශය, භංගය මරණය වේ. මේ එක් නය ක්‍රමයකි. මේ නය ක්‍රමයට අනුව දෙවැනි නය ක්‍රමයේ පවතින වෙනස නම්, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමං, නාම පච්චයා ඵස්සො,** මෙහිදී ෂටායතනයක් ගැන සඳහන් නොවේ. ෂට්ඨායතනය ගැන සඳහන් නොවුනාට එය එතැන පවතී. මෙහි එය පැහැදිලි කරගත යුතුය. විචිකිච්ඡා විඤ්ඤාණ සිත නමැති විඤ්ඤාණය නිසා විචිකිච්ඡා නාම ධර්ම නමැති නාමස්කන්ධය පහළ වේ. එතැනදී පහළ වන්නේ පටිච්ච සමුප්පාද නය ක්‍රමයට අනුව විඤ්ඤාණ පච්චයා නාමංඃ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, නමැති සතර නාමස්කන්ධයම එහිදී අරමුණු කෙරේ. සතර නාමස්කන්ධයන් නිසා ස්පර්ශය හටගනී. මනෝ සම්ඵස්සය. **ඵස්ස පච්චයා වේදනා,** උපෙක්ඛා වේදනාව, වේදනාව නිසා විචිකිච්ඡා නමැති චෛතසිකයයි. විචිකිච්ඡාව නිසා සතර නාමස්කන්ධයන්ගේ භවය හටගැනීම, භවයෙන් පසු සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය, මේ ආකාරයෙන් දෙවැනි නය ක්‍රමය පැහැදිලි කරගත හැක.

තුන්වැනි නය ක්‍රමයේදී වෙනස් වන්නේ, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා ෂටායතනං,** මෙහි වෙනස ෂට්ඨායතනය නිසා විචිකිච්ඡා සිතේ පහළ වූ මෝහය නමැති අවිද්‍යාව නිසා විචිකිච්ඡා චේතනාව උපදී. සංඛාරයයි. මේ සංඛාරය නිසා විචිකිච්ඡා සිත ඇති වේ. විචිකිච්ඡා සිත නිසා නාමරූප ඇතිවේ. සහජාත වශයෙන් ඇතිවන චිත්තජ රූප සහ කර්මජ රූපයි. සෑම විචිකිච්ඡා ජවනයකම උත්පාදක්ෂණයක් දී සහජාත වශයෙන් චිත්තජ රූප සහ කර්මජ රූප පහළ වේ. සෑම චිත්තක්ෂණයකම උත්පාද, ඨිති, භංග. සෑම කුඩා අනු චිත්තක්ෂණයක් ගානේම කර්මජ රූප පහළ වේ. උත්පාදක්ෂණයේ පමණක් නොවේ, නාම යනු වේදනා, සංඥා, සංඛාර, නාම ස්කන්ධයන් හටගැනීමයි. මේ නාමරූප නිසා

ෂට්ඨායතනය උපදී. මෙහිදී කරුණු දෙකක් පැහැදිලි වේ. විචිකිච්ඡා නිසා නාමරූප උපදිනවා යනු සහජාත වශයෙන්, ඒකට ඉපදීම වශයෙන්, උත්පාදක්ෂණයේම පහළ වෙන චිත්තජ රූප, කර්මජ රූප හා නාම ධර්මයි. **නාමරූප පච්චයා ෂට්ඨායතනං** හි මේ ඉපදුනු රූප නොවේ සලකන්නේ. පළමු ජවනයට කලින් පහළ වූ, වොත්ථපන සිතත් සමඟ පහළ වූ, හෘදය වස්තුව ප්‍රධාන කොට කර්මජ රූප ආදිය පහළ විය. ඒ හෘදය වස්තුව උපදින නාම ධර්මයන්ට උදව් විය. හෘදය වස්තුව, වේදනා, සංඥා සංඛාර නමැති නාමස්කන්ධ ෂට්ඨායතනයට (මනායතනයට) උපකාරී වේ. විචිකිච්ඡා මනායතනයට, **නාමරූප පච්චයා ෂට්ඨායතන** හි පුරේජාත වශයෙන් පහළ වූ හෘදය වස්තුව උපකාරී විය. **විඤ්ඤාණ පච්චයා නාමරූපං**, මෙහිදී වෙනත් තේරුමක් පවතී. **නාමරූප පච්චයා ෂට්ඨායතනං** හි තවත් තේරුමක් පවතී. මෙවැනි අවස්ථාවන් හොඳින් මතක තබාගත යුතුය.

බුදුරජාණන් වහන්සේ මේවා ඉතාමත්ම පැහැදිලිව දේශනා කොට තිබේ. අභිධර්ම හා සූත්‍ර අපට ප්‍රායෝගිකව කරුණු කාරණා සහිතව ඔප්පු කළ හැකි, භාවනා අත්දැකීමෙන් දැකිය හැකි දෙයකි. විනය ප්‍රායෝගිකව දැකිය හැකි දෙයක් නොවෙයි. එය ප්‍රඥප්තියකි. සූත්‍රයක් ගත් විට හොඳින් අර්ථ විග්‍රහ කරගෙන අටුවා ටීකාවල, නොයෙක් සූත්‍ර දේශනාවල තිබෙන කරුණු ඒක රාශී කොට අභිධර්ම කරුණු එකතු කළ විට එම සූත්‍ර දේශනාවේ කරුණු ඉතාමත් නිවැරදිව පැහැදිලිව හොඳින් තේරුම් ගත හැකිය. බුදුරජාණන් වහන්සේ විනය ශික්ෂා පදයක් පැන වූ විට, දේශනා කළ විට, නිවන් දුටු අයෙක් නොමැත. බුදුරජාණන් වහන්සේ සූත්‍ර දේශනාවක්, අභිධර්ම දේශනාවක් දේශනා කරන විටදී, විග්‍රහ කරන විටදී පිරිස නිවන් දුටුහ. සූත්‍ර හා අභිධර්ම යනු නිවනට අත්‍යවශ්‍ය දෙයකි. විනය තුළින් අපව රකී. එය අපේ ශීලයයි. ඒ තුළින් ආරක්ෂාවක් ලැබේ. ඒ ආරක්ෂාව, ශක්තිය මේ සූත්‍ර, අභිධර්ම කරුණු කාරණා ඔස්සේ නිවන් මග සාදාගැනීමට උපකාරී වේ.

ඊළඟ නය ක්‍රමයේදී **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණ, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං ෂට්ඨායතන පච්චයා ඵස්සෝ - පෙ -**

විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතේ පහළවන මෝහ නමැති අවිද්‍යාව නිසා විචිකිච්ඡා චේතනාව නමැති සංඛාරය පහළ වේ. මේ විචිකිච්ඡා චේතනාව නමැති සංඛාරය නිසා, විචිකිච්ඡා සිත නමැති විඤ්ඤාණය පහළ වේ. විචිකිච්ඡා සිත නමැති විඤ්ඤාණය නිසා සහජාත වශයෙන් නාමරූප පහළ වේ. කර්මජ රූප, චිත්තජ රූප සහ නාමස්කන්ධයි.

**නාමරූප පච්චයා සළායතනං** : සහජාත නාමරූප නිසා, ඒ ඒ මොහොතේ සෑම ජවන් චිත්තක්‍ෂණයක් ගානේම, විචිකිච්ඡා ජවන් සිතක් ගානේම චිත්තජ රූප සහ කර්මජ රූප උපදී. ජවනයේදී මේ චිත්තජ රූපයන් උපදින්නට උදව් වූයේ විචිකිච්ඡා සිතයි. සිත උපකාරී වේ. කර්මජ රූපයන් උපදින්න සිතත් උපකාරී විය. සිතේ බලය නොමැතිව කර්මජ රූප නූපදී. උදා : කෙනෙක් මරණයට පත්වන වෙලාවේ දී, මරණයනේ පසු කර්මජ රූප පහළ නොවේ. සිතේ සම්බන්ධයක් නොමැතිව සිත වෙන් වී ගිය හෙයිනි. සිත දුබලවන විටත් පහළ නොවේ. මරණයට චිත්තක්‍ෂණ 17 කට කලින් කර්මජ රූප නවතී. හේතුව නම් කර්මජ රූපයන්ගේ පැවැත්ම සිතත් සමඟ පැවැතීමයි. චුතියට චිත්තක්‍ෂණ 17 කට කලින් කර්මජ රූප උත්පාද වූ පසු ඒ සියල්ලම චුති චිත්තක්‍ෂණයත් සමඟ භංග වේ. අප මරණයට පත්වන වේලාව තේරුම් ගැනීමට නොහැකි මුත් සිත ඒ ගැන දැන ගනී. චුතියට චිත්තක්‍ෂණ 17 කට කලින් කර්මජ රූප නැවතීම යනු අනිවාර්යයෙන්ම 17 වෙනි චිත්තක්‍ෂණය චුති චිත්තක්‍ෂණය වේ. එය භංග වන විට පහළ වී තිබූ කර්මජ රූප සියල්ලම භංග වී යයි. සිතත් සමඟයි කර්මජ රූප බැඳී පවතින්නේ. එපමණක් නොව සිත උපකාරී වුවත් කර්මජ රූප කලින් පහළ වෙලා නැතිනම් කර්මජ රූප පහළ නොවේ. උදා: අරූපී තලයේ සිතත් සමඟම රූපය සම්බන්ධයි නම් අරූපී තලයේ රූපයක් නැත. ප්‍රතිසන්ධි සිතත් සමඟ රූපයක් පහළ වූයේ නැත යනු, එයින් චුත වෙන තුරු කිසිදු රූපයක් පහළ වන්නේ නැත. සිතට රූපයක් පහළ කිරීමේ ශක්තිය තිබුණාට මෙහි රූපය පහළ නොවේ. ප්‍රතිසන්ධි සිතත් සමඟ අරූප භවයේ රූප පහළ වන්නේ නැති නිසාවෙනි. මෙහිදී තේරුම් ගත යුත්තේ සිත උපකාරී වූවාට පෙර කර්මජ රූප පහළ වී

තිබිය යුතුය. එසේ පහළ වී තිබුණහොත් සිතේ බලය සමඟ නැවත කර්මජ රූප උපදී.

පළමු ජවනයට කලින් පහළ වූ, වොත්ථපන සිතත් සමඟ කර්මජ රූප මුළු ශරීරය පුරා පහළ විය. ප්‍රධාන වශයෙන් මෙහි මාතෘකාව ආයතනයයි. චක්ඛායතන, සෝතායතන, ඝානායතන, ජිව්හායතන, කායායතන, යනු ප්‍රධාන රූපායතන 5 යි. ආධ්‍යාත්මිකයි. මේ ආයතන 5 තුළ, පඨවි, ආපෝ, තේජෝ, වායෝ, යන කර්මජ මහා භූතයන් නිසා නැවත අලුත් කලාපයන් බිහිකරයි. උදා:- වොත්ථපන සිතත් සමඟ චක්ඛායතනය පහළ විය. ඒ චක්ඛායතනයේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, භූත රූප 4 ක් පවතී. මේවා කර්මජ භූත රූප නම් වේ. මේ කර්මජ මහා භූතයන් නිසා පළමු ජවනයේ දී අලුත් චක්ඛායතනයක් උපදවා දෙයි. මේ ආකාරයෙන් ක්‍රම 2 ක් පවතින බව වටහා ගත යුතුය. සහජාත ජවන් චිත්තක්ෂණය සමඟ කර්මජ රූප පහළ වන බව සත්‍ය මුත්, ඒ කර්මජ රූප පහළවන විට, වොත්ථපන සිතත් සමඟ පහළ වූ ඒ ආයතන ගත මහා භූතයන්ගේ උපකාරය ලැබුණි. එහි උපකාරයක් නොමැති නම් පහළ වන්නේ නැත. **නාමරූප පච්චයා සළායතනං** පළමු ජවන් සිත පහළ වෙද්දී මුළු ශරීරය පුරාම ආයතන පහළ විය. ඇහැ තුළ චක්ඛායතනය, කන තුළ සෝතායතනය පහළ විය. නාසය තුළ ඝානායතනය, දිව තුළ ජිව්හායතනය, මුළු ශරීරය පුරාම කායායතනය පහළ විය. රූපය නිසා ආයතන 5 ක් පහළ විය. නාම නිසා මනායතනය පහළ විය. එනම් නාමරූප නිසා මේ ආයතන 6 ම පහළ විය. **සළායතන පච්චයා එස්සො** ලෙස දේශනා කොට නොමැත. **සළායතන පච්චයා එස්සො** ලෙස දේශනා කොට ඇත්තේ පොදු දේශනාවයි. හැම කරුණකටම පොදුවේ දේශනා කිරීමකි. මෙහිදී දේශනා කරන්නේ එක් සිතක් පිළිබඳවයි. එක් සිතක් ගැන සලකන විටදී **සළායතන පච්චයා එස්සො** කිව නොහැක.

එසේ යෙදුවහොත් හෘදය වස්තුව තුළ එක සිතක්, මුළු ශරීරය පුරා සිත් කීපයක් පහළ වේ යැයි යන වැරදි මතිමතාන්තර ඇතිකර ගැනීමට ඉඩ ඇත. එබැවින් **ඡට්ඨායතන පච්චයා එස්සො**: ඡට්ඨායතනය යනු

මනායතනයයි. විචිකිච්ඡා සිත නමැති මනායතනය නිසා සම්ඵස්සය පහළ විය. **ඵස්ස පච්චයා වෙදනා**: උපෙක්ෂා වේදනාව, වේදනාව නිසා විචිකිච්ඡාව, සැකය නාමධර්ම චෛතසිකයයි. විචිකිච්ඡාව නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පාදය භවයයි, උත්පාදක්ෂණය ජාතියයි, ධීතිය ජරාවයි, භංගය මරණයයි. මේ ආකාරයෙන් විචිකිච්ඡා සිත සමඟ පළමු පච්චය චතුෂ්කය පැහැදිලි කරගත හැක.

ඊළඟට හේතු චතුෂ්කය, ඒ ඒ චිත්තක්ෂණය තුළ හේතුව දැකිය හැක. **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො අවිජ්ජා හෙතුකො** විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතේ මෝහය නිසා, විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතේ චේතනාව පහළ විය. එයට හේතුව අවිද්‍යාවයි. අවිද්‍යාව පහළ වූයේ නැතිනම් චේතනාව පහළ නොවේ. අවිද්‍යාව හේතු විය. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, සඞ්ඛාර හෙතුකො**: සංඛාරය නිසා, විචිකිච්ඡා චේතනාව නිසා පහළ වූ විචිකිච්ඡා සිත. මේ සිත පහළවීමට ප්‍රධාන හේතුව සිතුවිල්ලයි. මේ ආකාරයෙන් චතුෂ්ක 4 ම හේතු ක්‍රමයට පැහැදිලි කරගත යුතුය.

සම්ප්‍රයුක්ත **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො අවිජ්ජා සමපයුත්තා**: විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතේ මෝහය නමැති අවිද්‍යාව නිසා විචිකිච්ඡා නමැති චේතනාව පහළ විය. එයට අවිද්‍යාව සම්ප්‍රයුක්ත විය. එකට යෙදීමයි. එසේ නොමැතිව පහළ වීමක් නොවේ. මේ ආකාරයට සම්ප්‍රයුක්ත නය ක්‍රමය ද පැහැදිලි කරගත යුතුය.

අඤ්ඤමඤ්ඤ, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො සඞ්ඛාර පච්චයාපි අවිජ්ජා**: මේ විචිකිච්ඡා සිතේ පහළ වන අවිද්‍යාව නමැති මෝහය නිසා විචිකිච්ඡා චේතනාව පහළ වේ. මේ විචිකිච්ඡා චේතනාව නිසා මෝහය පහළ වේ. ඔවුනොවුන්ගේ සම්බන්ධය දක්වයි. මේ ආකාරයෙන් අඤ්ඤමඤ්ඤ චතුෂ්කය ද පැහැදිලි කරගත හැක. මෙලෙස විචිකිච්ඡා සිත පැහැදිලි කරගත යුතුය.

උද්ධච්ච සිත පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද මාතෘකා පාඨය නම් - **කතමෙ ධම්මා අකුසලා ? යස්මිං සමයෙ අකුසලං චිත්තං - පෙ - උපෙක්ඛා සහගතං උද්ධච්ච සම්පයුත්තං - පෙ -**

මේ වේලාවක උද්ධච්ච සිතක් පහළ වේ. යම්කිසි රූපාරම්මණයක්, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන අරමුණක් නිසා අපේ සිතේ උද්ධච්චයක් පහළ විය හැක. උද්ධච්චය යනු සිතේ විසිරුණු ස්වභාවයයි. ගතියයි. උදා : කොඩියක් ගසක් මුදුණක එල්ලූ විට නිතරම සුළඟ නිසා සෙලවීම සිදුවේ. අපේ සිතත් නිතරම සෙලවෙනවා. කම්පාවෙනවා. විසිරෙනවා. අළු ගොඩකට ගලකින් ගැසූ විට එය විසිරී යයි. ඒ වාගේ අපේ සිතෙත් යම් අරමුණු නිසා විසිරෙන ස්වභාවය උද්ධච්චය ලෙස හැඳින් වේ. මේ උද්ධච්ච සිතත් සමඟ නාම ධර්ම 15 ක් පහළ වේ. සිත සමඟ 16 කි.

ඵස්ස, වේදනා,සංඥා, චේතනා, ඒකග්‍රතා, ජීවිතින්ද්‍රිය,

මනසිකාර යන සබ්බ චිත්ත සාධාරණ චෛතසික සම්ප්‍රයුක්ත වේ. —— 7

ප්‍රකීර්ණ චෛතසික සිත් 6 න් මෝහ මූල සිතක් නිසා ඡන්දය නැත. උපේක්ඛා සහගත නිසා ප්‍රීතිය පහළ නොවේ. ඒ අනුව විචක්කය, විචාරය, අධිමොක්ඛය, වීර්යය පහළ වේ. —— 4

අකුසල සාධාරණ, මෝහ, අහිරික, අනොත්තප්ප. උද්ධච්ච —— 4

—— 15

සිත සමඟ 1 —— 16

මේ නාම ධර්ම 16 තුළ පටිච්ච සමුප්පාද අංගයන් හඳුනාගෙන විදර්ශනා භාවනා වශයෙන් වැඩිය යුතුයි. **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො**ඃ උද්ධච්ච සිත සමඟ පහළ වූ මෝහ චෛතසිකය තමයි අවිද්‍යාව. මෝහ චෛතසිකය නිසා සංස්කාරය පහළ වේ. සංඛාර යනු උද්ධච්ච චේතනාවයි.

උද්ධච්ච චේතනාව නිසා උද්ධච්ච සිත පහළ වේ. සිතුවිල්ල නිසයි සිත පහළ වන්නේ. ඒ සිත නිසා නාමස්කන්ධ පහළ වේ. වේදනා,

සංඥා, සංඛාර ඉතිරි නාම ධර්මයන් පහළ වේ. සිත හැර ඉතිරි චෛතසික ධර්මයන් පහළ වේ. **නාම පච්චයා ෂටායතනං** : සිත හැර ඉතිරි නාම ධර්ම නිසා මනායතනය පහළ වේ. සිත පහළ වේ

**ෂටායතනං පච්චයා ඵස්සො:** මේ මනායතනය නිසා ස්පර්ශය පහළ වේ. **ඵස්ස පච්චයා වේදනා** : උපේක්ෂා වේදනාවයි. වේදනාව නිසා උද්ධච්චය, සිතේ අවුල් ස්වභාවය නමැති නාම ධර්ම ප්‍රකට වීම ආරම්භ වේ. උද්ධච්ච සිත පහළ වීම යනු උද්ධච්ච චෛතසිකය බලවත් වීමයි. විචිකිච්ඡාව පහළ වූවා යනු විචිකිච්ඡාව චෛතසිකය බලවත් වීමයි. මේ ආකාරයෙන් තේරුම් ගත යුතුය. **වේදනාව නිසා උද්ධච්චය, උද්ධච්චය නිසා අධිමොක්ඛය.** ඒ චිත්තක්ෂණයේ උද්ධච්ච සිත තුළ අරමුණ තදින්ම අල්ලා ගත්තා. අධිමොක්ඛ පහළ විය. නමුත් උත්පාද ඨිති භංග වී ගිය පසු බලවත් නොවේ. ඒ ඒ මොහොතට බලවත් වේ. ඊටපසු බලවත් නොවේ. භාවනා කරන විටදී අපේ සිත වෙනත් අරමුණු කරා ගොස් අවුල් වී පවතී. ටික වේලාවකට පසු සිත පිට ගොස් ඇති බව දැනගනී. නමත් සිතූ දේවල් මතක නැත. භාවනා අරමුණේ සිටි බවයි සිතෙන්නේ. සිතේ උද්ධච්චයයි. අරමුණු ගොඩාක් ගලාගෙන එයි. කුමන අරමුණ ගන්නේද යන්න සිතාගත නොහැකිය. ඒ අවස්ථාවේ ඒ චිත්තක්ෂණයේ දී උද්ධච්චය බලවත්ය. නමුත් උත්පාද ඨිති භංග වී ගිය පසු බලවත් නොවේ. එබැවින් උද්ධච්ච සිත මරණාසන්න අවස්ථාවට නොපැමිණෙන්නේ. ප්‍රතිසන්ධියක් ගෙනදීමට නොහැකිය. උද්ධච්ච සිත මරණාසන්න ජවනයක් බවට පත්වන්නේ නැත. ප්‍රතිසන්ධියක් ගෙනදීමට තරම් ශක්තියක් නැත. එය චිත්තක්ෂණයට බලවත් වූවාට නැවත සිතමින් කර්ම ශක්තියක් ගොඩනැගීමේ හැකියාවක් නැත. නමුත් විචිකිච්ඡාව චිත්තක්ෂණ ඒ මොහොතට බලවත් නොවූවාට නැවත නැවත සිතමින් විශාල කර්ම ශක්තියක් ගොඩනැගිය හැක.

කෙනෙක් බුදුරජාණන් වහන්සේ ගැන සිතමින් සැක උපදවාගෙන සිටී. එය මරණාසන්න මොහොතට පැමිණ ඒ පුද්ගලයා අපායට පමුණුවන්නට හැකිය. චිත්තක්ෂණ මොහොතට විචිකිච්ඡාව සමඟ අරමුණු ශක්තිමත් නොවූවාට ඒ තුළින් පහළවන කර්ම ශක්තිය බලවත්

නිසා නැවත සිත තුළ ඒ අරමුණ බලවත් වීමේ හැකියාව නිසා මරණාසන්න වීමේ මොහොතට පැමිණේ. උද්ධච්චය චිත්තක්ෂණ මොහොතට බලවත් වූවාට උත්පාද, ඨිති, භංග වී ගිය පසු බලවත් නොවේ. බලවත් නොමැති හෙයින් කර්ම ශක්තියත් බලවත් නොවේ. මරණාසන්න මොහොතට නොපැමිණේ.

වේදනාව නිසා උද්ධච්චය, උද්ධච්චය නිසා අධිමොක්ඛඃ ඒ අරමුණු තුළම පිහිටා සිටීම. අධිමොක්ඛය නිසා නාමස්කන්ධයන්ගේ හටගැනීම භවය. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නමැති සතර නාමස්කන්ධයන්ගේ හටගැනීමභවයයි. සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය ජාති, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය වේ. මේ ක්‍රමයට අනුව අනෙක් නය ක්‍රමයන්හි වෙනස් තැන් සලකා බැලූ විටඃ **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො -පෙ- නාම පච්චයා ඵස්සොඃ** උද්ධච්ච සහගත සිතේ පහළ වූ අවිද්‍යාව නිසා උද්ධච්ච සහගත චේතනාව පහළ විය. උද්ධච්ච සහගත චේතනාව නිසා උද්ධච්ච සහගත සිත පහළ විය. උද්ධච්ච සහගත සිත නිසා වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධ පහළ වේ. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සතර නාමස්කන්ධයන් නිසා (ඵස්සය හැර) ඵස්ස චෛතසිකය, මනෝ සම්ඵස්සය පහළ වේ. උද්ධච්ච මනෝ සම්ඵස්සය පහළ වේ. ඵස්ස නිසා උපෙක්ඛා වේදනාව, වේදනාව නිසා උද්ධච්චය, උද්ධච්චය නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා භවය, භවය නිසා ජාති, ජරා, මරණ ඇති වේ.

තුන්වැනි නය ක්‍රමයේ වෙනස, : **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො - පෙ - විඤ්ඤාණ පච්චයා නාමරූපංඃ නාමරූප පච්චයා ඡට්ඨායතනංඃ** උද්ධච්ච සිත නිසා සහජාත වශයෙන් චිත්තජ රූප, කර්මජ රූප පහළ විය. එය රූපය ලෙස ද නාමස්කන්ධයන්ගේ හටගැනීම නාමය හෙවත් නාමරූප පහළ විය. **නාමරූප පච්චයා ඡට්ඨායතනංඃ** උද්ධච්ච ජවන් සිතට කලින් සිත සමඟ පහළ වූ පුරේජාත හදය වස්තුව ඡට්ඨායතනය පහළ විමට උදව් වේ. පුරෙජාත හෘදය වස්තු රූපය ලෙසත්, සහජාත වශයෙන් නාමස්කන්ධයන් වේදනා, සංඥා, සංඛාර, නාමස්කන්ධයන් නිසා **නාමරූප පච්චයා ඡට්ඨායතන** නමැති මනායතනය හඳුනාගනී.

ඡට්ඨායතනය නිසා ඵස්ස, ඵස්ස නිසා වේදනා, වේදනා නිසා උද්ධච්චය උද්ධච්චය  නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා භවය, භවය නිසා ජාති, ජරා, මරණ ඇති වේ.

හතරවැනි නය ක්‍රමය, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරො - පෙ - නාමරූප පච්චයා සළායතනං: ඡට්ඨායතනං පච්චයා ඵස්සො :**  උද්ධච්ච සහගත සිතේ පහළ වූ අවිද්‍යාව නමැති මෝහය නිසා උද්ධච්ච චේතනාව නමැති සංඛාරය පහළ වේ. මේ උද්ධච්ච සිත නමැති විඤ්ඤාණය නිසා සහජාත වශයෙන් නාමරූප පහළ වේ.  චිත්තජ රූප, කර්මජ රූප - රූප වශයෙන්, වේදනා, සංඥා,සංඛාර, නාම වශයෙන් පහළ වේ.  මේ කියන නාමරූප නිසා සළායතන පහළ වේ. මෙහිදී කරුණු 2 ක් පවතී. සහජාත වශයෙන් සළායතන පහළ විය. නමුත් අපි තේරුම් ගත යුතුයි. මීට පෙර පහළ වූ සිත සමඟ පහළ වූ ඒ ඒ  ආයතනගත කර්මජ මහා භූතරූපයන්ගේ උපකාරයක් තිබූ බැවින් නාමරූප පහළ විය. **ඡට්ඨායතනං පච්චයා ඵස්සො:** උද්ධච්ච සිත පහළ වූයේ හෘද වස්තුවේ, එක ආයතනයක් පමණක් ඇත. රූපායතනය පැවතියාට සිතක් පහළ වී නැත. සිතක් පහළ වූ විටයි සම්ඵස්සයක් පහළ වන්නේ.

ආයතනයක් පහළ වූ පමණින්ම සම්ඵස්සයක් පහළ නොවේ. එබැවින් **ඡට්ඨායතනං පච්චයා ඵස්සො** නැමැති නම් වේ. උද්ධච්ච නැමැති මනායතනය නිසා සම්ඵස්සය, ඵස්සය නිසා උපේක්‍ෂා වේදනාව. උපේක්ක්‍ෂා වේදනාව නිසා උද්ධච්චය, උද්ධච්චය නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය  නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය, ඒ සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය නිසා උත්පාදක්‍ෂණය ජාතිය, ඨිතික්‍ෂණය ජරාව, භංගක්‍ෂණය මරණය නම් වේ. මේ පච්චය චතුෂ්කය ආකාරයෙන්ම හේතු චතුෂ්කය, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ චතුෂ්කයද මෙලෙස 16 ආකාරයකට මෙය පැහැදිලි කරගත යුතුය. මේ ආකාරයෙන් පටිච්ච සමුප්පාද නය ක්‍රමය සිතක් සිතක් ගානේ බලන විපස්සනා නය ක්‍රමය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සේක.

මේ ආකාරයෙන් අකුසල් සිත් 12 පිළිබඳ  කෙටි අර්ථ විග්‍රහයක් ඉදිරිපත් කරන ලදි. වර්තමාන හේතු, අතීත හේතු යොදමින් බලන විටදී

මෙහි අර්ථය මහා විශාල සාගරයක් බඳුය. ඒවා ඉදිරියට එකතු කළ හැකිය. මෙම සරල ක්‍රමයට ඒ ඒ චිත්තක්ෂණය තුළ පහළ වන පටිච්ච සමුප්පාද අංග නය ක්‍රමය තේරුම් ගත හැකිය.

කුසල නිද්දෙදෙසො

කුසල මාතෘකා යටතේ, කුසල යන වචනය ගැන කෙටි අර්ථයක් හඳුනාගත යුතුය. කුසල යන වචන සෑදීමේ දී භාවිතයේ දී ද හොඳ තේරුමක් පවතී. මේ වචන සෑදෙන අයුරු නම්,

කුසල 'කු' පූර්ව සල ධාතුව

'කු' - **කුච්ඡිතෙ පාපකෙ අකුසලෙ ධම්මෙ**"-පිළිකුල් සහගත අකුසල ධර්මයන්ට සමාන පදයකි 'කු'

'සල' - "**සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති**" - සොලවන, කම්පාකරන, විනාශ කරන, සුන්නද්ධූලි කරන හෙයින් කුසල වේ.

අකුසලයන් විනාශ කරන අර්ථයෙන් කුසල නමිති. නැවත දැක්වුවහොත්,

කුසා - කුස නාමය, කුසා - කුස තණවලට කියන නාමයකි.

කුසග්ගෙන - කුස නමැති අගින්

කුසා - අකුසලයන්ට සමාන වචනයකි.

"**කුච්ඡිතෙන වා ආකාරෙන සන්තානෙ සයන්තීති කුසා**" - පිළිකුල් ආකාරයෙන් තම තමන්ගේ සිත්වල වැතිරි තිබෙන, නිදා සිටින අකුසලයන්ට කුස නම් කියති.

"**කුස සඞ්ඛාතෙ ලාමකෙ අකුසලෙ ධම්මෙ ලුනන්ති ඡින්දන්ති ති කුසල**" - ඒ කුස සංඛ්‍යාත ලාමක අකුසල ධර්මයන් ඡේදනය කරන නිසා, ඉවත් කරන හෙයින් කුසල නමිති.

"**කුසෙන ලාතබ්බාති කුසල**", "**කුසං වුච්චති ඤාණං**" - කුස ඥාණයට ද ප්‍රඥාවට ද කියති . කුස තණ ගස වැරදි ආකාරයට ඇල්ලූ විට

දෙපැත්තෙන් කැපෙයි. ඒ වාගේම ඥාණයට කුස කියයි. කුස නමැති ඥානයෙන් අකුසලයක් ලියා දමයි, කපා දමයි, එලෙසින් විනාශ කර දමයි. එයින් කුසල නම් වේ. දේශනාවේ කුසල නමැති වචනයට අර්ථ 4 ක් දක්වයි.

**ආරොග්‍ය අර්ථය, අනවජ්ජ අර්ථය, ඉට්ඨි විපාක අර්ථය, කොසල සම්භූතාර්ථය.**

**ආරොග්‍යාර්ථයෙන් -** නිරෝගී අර්ථයෙන්, කුසල් සිත් පහළ වෙන්න වෙන්න සිත නිරෝගීයි. සිත ගිලන් වන්නේ නැත. සිත නිරෝගී හෙයින් කයත් නිරෝගියි. කුසල් සිතක් පහළ වන විට ලේ ධාතුව පිරිසිදුයි. ලේ ධාතුව පිරිසිදු වීම නිසා පිරිසිදු ලේ ධාතුව මුළු ශරීරය පුරාම ගමන් කර මුළු ශරීරය නිරෝගී කරයි. කුසල් සිතක් පහළ වීම යනු කුසල චිත්තජ රූප ඉතාමත් ප්‍රසන්න වීමත්, නිරෝගී වීමත් වේ. කුසල චිත්තජ රූප මුළු ශරීරය පුරාම ගමන් කර මුළු ශරීරයම ප්‍රසන්නව නිරෝගී කරයි. මේ ආකාරයෙන් නිරෝගී අර්ථය තෝරාගත යුතුයි.

අපට අසනීපයක් ඇති වූ වීට කයට වේදනාවක් ඇති වේ. ඒ කායික වේදනාව ගැන සිතා ඒ සමඟ මානසික දුක් වේදනාවන් ද ඇති වේ. මෙය අකුසල් ය. ඒ අවස්ථාවේ දී භාවනා මනසිකාරයක යෙදුනහොත්, (භාවනා මනසිකාරයක යනු කුසල්ය. කුසලය තුළින් ඒ ඇති වූ කායික වේදනාව, මානසික වේදනාව සියල්ලක්ම නැති කරයි.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ මණිකාර කුළුපග තිස්ස තෙරුන් වහන්සේගේ කථාව: (උදාහරණ ලෙස දැක්විය හැකිය) මෙම ස්වාමින් වහන්සේ ගෙයක් ගානේ පිණ්ඩපාතය කරමින් ජීවත් වූ අතර, කුල ගෙවල් ඇසුරු කරගෙන ගෙවල්වලට වැඩ දානය වැළඳුවේ නැත. කොසොල් මහ රජතුමාගේ මැණික්කරුවෙකු ස්වාමින් වහන්සේ දැක පැහැදී - ස්වාමීනි, ඔබවහන්සේ මාගේ නිවසට හැමදාම පිණ්ඩපාතය වඩින්න- කියා ආරාධනා කළාම ස්වාමීන් වහන්සේ ද ආරාධනාව පිළිගෙන අවුරුදු 12 ක්ම ඒ නිවසට පිණ්ඩපාතය වැඩි සේක. අවුරුදු 12 කට පසු එක් දිනක් වඩින විට මැණික්කකරුවා දඩමසක් සකස් කරමින්

සිටියදී ස්වාමීන් වහන්සේ ද වැඩම කළ අතර චාරිත්‍රානුකූලව පැනවූ ආසනයේ ගෙතුළ වැඩ සිටියහ. ඔහු නැවතත් දඩමස් පිළියෙළ කරන්න යෙදුනා. මේ අතර සේවකයෙක් මැණික් ගලක් ඔපමට්ටම් කරගැනීමට පැමිණියා. හදිසියේ සහ කලබලයෙන් ලේ තැවරුණු අතින්ම මැණික් ගල ගෙන මේසය මත තබා ඇතුළු ගෙට පිවිසුණා. ඒ වේලාවේ නිවසේ ඇතිකළ ලිහිණි පැටියා ලේ සුවඳට මස් කුට්ටියක් යයි සිතා මැණික් ගල ගිලදැමුවා. මෙය දුටුවේ ස්වාමීන් වහන්සේ පමණයි. මැණික්කරු පැමිණ බලන විට මැණික් ගල තිබුණේ නැත. සැමතැනම සොයා බලමින් සියලු දෙනාගෙන්ම විමසුවා. කවුරුත් දන්නේ නැත. අවුරුදු 12 ක්ම කුළුපගව සිටි ස්වාමීන් වහන්සේ කෙරෙහි සැකයක් පහළ විය. කිසිවකු ඒ වෙලාවේ නිවසට පැමිණියේත් නැත. එහෙයින් ස්වාමීන් වහන්සේ ගන්න ඇතැයි සිතුහ. මැණික් ගල ගත්තා දැයි ස්වාමීන් වහන්සේගෙන් විමසුවා. ගත්තේ නැති බව ස්වාමීන් වහන්සේ ද පිළිතුරු දුන්නා. මෙලෙස ප්‍රශ්න විමසමින් සිටියදී දැඩි කෝපයට පත්ව ඉවසා දරාගත නොහැකිව ස්වාමීන් වහන්සේට පහර දෙන්න බණින්න පටන් ගත්තා. නමුත් ස්වාමීන් වහන්සේ නිශ්ශබ්ද විය. අවසානයේදී පහර දී හිස් වෙළුමකින් හිස බැඳ තද කරන්න පටන් ගත්හ. එවිට නාසයෙන්, කටින් ලේ ගලන්න පටන් ගත්හ. ලේ සුවඳට ලිහිණි පැටියා ලේ බොන්න පැමිණියා. තරහෙන් කිපී සිටි පුද්ගලයා ලිහිණි පැටියාට ද පහර දුන්නා. ස්වාමීන් වහන්සේට සිහි ආ වේලාවේ ලිහිණි පැටියා මැරී සිටින බව දැක - පින්වත අර ලිහිණි පැටියාගේ උදරය පලන්න- යයි පැවසුවා. උදරය පලන විට මැණික් ගල තිබුණා. ඒ වේලාවේ මේ පුද්ගලයා දෙපා නමැද සිය දහස්වර සමාව ඉල්ලා සිටියා. ඔබවහන්සේ සිල්වත් බැවින් එය දුටුවත් පැවසුවේ නැත, සත්ව ඝාතනයක් වේ යැයි සිතා. සමාව ඉල්ලුවා. ඒ වේලාවේ ස්වාමීන් වහන්සේ ද අධිෂ්ඨාන කළා නැවත කුල ගෙවල් ඇසුරු කරන්නේ නැතැයි කියා. පසු කලෙක දී ඒ ස්වාමීන් වහන්සේ දරුණු වේදනාවමම උපකාරී කරගෙන වේදනානුපස්සනාව වැඩූහ. කාලයක් පුරා පැවිදිව බණ භාවනා කිරීමේ පුරුද්දක් තිබූ හෙයින් වේදනාව නිසා දුක් වුනේත්, පුද්ගලයා කෙරෙහි ද්වේෂය පහළ

කරගත්තේත් නැත. ඒ වේලාවේ සිත ගිලන් වූයේ නම්, කය ගිලන්වීමේ ස්වභාවය මතු වෙනවා. නමුත් ස්වාමීන් වහන්සේ සිත ගිලන් කරගත්තේ නැතිව, කුසල් මතු කරගෙන වේදනානුපස්සනාව වැඩූහ. ඒ වේදනානුපස්සනාවෙන් හොඳට සිත සමාධි කරගෙන විදර්ශනාව වඩා ඒ වේදනාවම උපනිශ්‍රය කරගෙන රහත් වූහ.

අපේ කය නිතර ගිලන් වේ. කය ගිලන් වී සිත ගිලන්වන වාර ගණන වැඩියි. නමුත් කෙනෙක් ඥානවන්ත නම්, ඒ ගිලන් ස්වභාවය නැති කරගෙන කුසල් සිත් වඩා, සිතයි කයයි නිරෝගී කරගත හැකිය. නිරෝගී අර්ථයෙන් කුසලය මෙසේ පැහැදිලි කරයි.

**අනවජ්ජාර්ථයෙන්,** වැරදි දුරුකිරීම් අර්ථයෙන් කුසල් සිත් පහළවන වීට සිතේ වැරදි ගති, වැරදි සිතුවිලි බැහැර වේ. වැරදි පැවතුම්, වැරදි චාරිත්‍ර වාරිත්‍ර, වැරදි ගතිපැවතුම් බැහැර වේ. අපේ ළඟ ලෝකයා විසින් සම්මත වැරදි කියන දේවල්, අපේ සිතේ කෙලෙස් මතුවෙලා මේ වැරදි හදන එක සිදු කරයි. කුසල් පහළ වන විට වැරදි ඈත්වෙලා අයින් වෙලා යයි.

**ඉෂ්ඨවිපාකාර්ථයෙන්,** සැප විපාක ගෙනදීමේ අර්ථයෙනි. කෙනෙකුට යම් සැපයක් ලැබීමයි. ලෞකික වශයෙන් හොඳ පැවිදි ජීවිතයත් ලබා ධර්මය ඉගෙන ගන්න, අහන්න ලැබෙනවා. මේ සැප යයි සම්මත ලෝකයේ ලෞකික, ලෝකෝත්තර වශයෙන්, සම්මුති පරමාර්ථ වශයෙන් තියෙන සැප. මේ යම්කිසි සැපයක් කෙනෙකුට ලැබෙන්නේ පෙර ජීවිතවල වඩන ලද කුසල් නිසාය. ඒ පෙර ජීවිතයේ වඩන ලද කුසල් නිසා අද මේ ජීවිතයේ සැප ලබයි නම්, මේ ජීවිතයේ කුසල් වඩන විට ඒ කුසලයන්ගේ සැප විපාක මතු ගෙන දේ. මෙය සැප විපාක ගෙනදීම් අර්ථයෙන් කුසල නම් වේ. අකුසල් යනු දුක් විපාකයි. අකුසල් වඩන්න සතුරන් ඇති වේ. කුසල් වඩන විට මිතුරන් ඇති වේ.

**දක්‍ෂාර්ථයෙන්,** සම්මුති වශයෙන් භාවිතා කරන වචනයකි. බුදුරජාණන් වහන්සේ එය අනුමත කළ සේක. කෙනෙක් යමකට දක්ෂයි. ඉගෙන ගැනීමට, ක්‍රීඩාවට, විවිධ දක්ෂතා පවතී. නිවැරදි දෙයකට දක්‍ෂ නම් එය දක්‍ෂතාවය, කුසලතාවය ලෙස හැඳින් වේ.

කුසල යනු **නිරෝගී අර්ථයෙන්, වැරදි දුරු කිරීමේ අර්ථයෙන්, සැප විපාක ගෙනදීම අර්ථයෙන් කුසල වේ.** කුසල ස්වභාවය මතු කරගන්න කුසල් සිත් හඳුනාගත යුතුය. බුදුරජාණන් වහනසේ අභිධර්ම දේශනාවට අනුව කුසල් සිත් වශයෙන් සිත් සියල්ල 2 1 දේශනා කරන ලදි.

01 කාමාවචර කුසල්

කාමාවචර මහා කුසල් සිත් 8 - රූපාවචර කුසල් සිත් 5

අරූපාවචර කුසල් සිත් 4 - ලෝකෝත්තර කුසල් සිත් 4

කාමාවචර කුසල් සිත් 8 වඩාත් බලවත් වේ. අනෙක් ඒවා බලවත් නොවේ. කාමාවචර සිත් සැමදෙනාම වඩයි. මේ කුසල් වැඩීමෙන් සැම දෙයක්ම සම්පූර්ණ වේ. කෙනෙක් බුදුවීමට ප්‍රාර්ථනා කරයි නම්, ධ්‍යාන පමණක් වඩා නිවන් දැකිය නොහැකිය. රූපාවචර, අරූපාවචර යනු ධ්‍යාන කුසල් ය. නමුත් ධ්‍යාන කුසල්වලට පෙර තව බොහෝ කුසල් පවතී. දසපාරමී ගත් විට, දාන පාරමිතා, සීල පාරමිතා වැඩෙන්නේ කාමාවචර කුසල් අනුවය. කාමාවචර කුසල් බොහොම බලසම්පන්නයි. එබැවින් මහා කුසල් යැයි කියයි. කාමාවචර කුසල් සිත් 8

| | |
|---|---|
| සෝමනස්ස සහගත කුසල් සිත් | 4 |
| උපෙක්ඛා සහගත සිත් | 4 |
| නැවත කුසල් සිත් | 8 |
| ඥාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් | 4 |
| ඥාණ විප්පයුක්ත කුසල් සිත් | 4 |
| අසංඛාරික කුසල් සිත් | 4 |
| සසංඛාරික කුසල් සිත් | 4 |

අකුසලයේ දී අසංඛාරික, සසංඛාරික භේදයේ දී ලොකු වෙනස් පවතී. එනම්, අකුසල් සිතක් අසංඛාර නම්, සසංඛාර නම්, නාම ධර්මයන්ගේ වෙනසක් පවතී. ථීන මිද්ධ, මේ අකුසල චෛතසික ක්‍රියා කරන්නේ සසංඛාරික අකුසල සිත් සමඟය. නමුත් කුසලයේ අසංඛාර,

සසංඛාර භේදයක්, නාම ධර්මයන්ගේ වෙනසක් නොමැත. නමුත් ඒ තුළ ශක්තියේ යම් වෙනසක් පවතී.

පළමු සිත, සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිත. බුදුරජාණන් වහන්සේ මේ ආකාරයෙන් දේශනා කළ සේක.

**"කතමෙ ධම්මා කුසලා යස්මිං -පෙ-"**

පළමුවැනි චතුෂ්ක 4 හි පළමුවැනි නය ක්‍රමයේ මාතෘකා එකතු කොට දේශනා කර ඇත.

ධම්මසංගණීප්‍රකරණයේ දී කුසල් සිත නාම ධර්ම එකතු කරමින් පැහැදිලි කරයි. සතුටෙන් යුක්ත, නුවණින් යුක්ත, කිසිම කෙනෙකුගේ මෙහෙයවීමක් නැති අසංඛාරික කුසල් සිතක් පහළවීමට පුළුවන. මේ කුසල් සිත රූපාරම්මණයක්, ශබ්දාරම්මණයක්, ගන්ධාරම්මණයක්, රසාරම්මණයක්, ඵොට්ඨබ්බාරම්මණයක්, ධම්මාරම්මණයක් යන අරමුණක් නිසා පහළ විය හැක. ඒ පහළ වූ කුසල් සිතේ කුසල ධර්මයන් බුදුරජාණන් වහන්සේ මෙසේ පැහැදිලි කරන සේක. සතිපට්ඨාන, ඍධිපාද, සතර සම්‍යක්ප්‍රධාන, ඉන්ද්‍රිය ධර්ම, බල ධර්ම, බොජ්ඣග, මාර්ගාංග, ආහාර, හේතු, ස්කන්ධ, ආයතන, ධාතු, යනාදී පරමාර්ථ කුසල ධර්මයන්, එනම්, කුසල් සිතත් සමග පහළවන ධර්මයන් ධම්මසංගණීප්‍රකරණයේ විග්‍රහ කරනු ලබයි.

නිවන් දැකීමට සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වැඩිය යුතුය. මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම හැම කුසල් සිතක් ගානේම වැඩෙයි. මේ කුසල් සිතත් සමග පහළවන පටිච්ච සමුප්පාද අංගයන් මෙහිදී පැහැදිලි කෙරේ.

කුසල් සිතක් සමඟ පහළවන නාම ධර්මඃ කාමාවචර කුසලයක් සමග ගත් විට නියත සහ අනියත ලෙස කොටස් 2 කට බෙදාගත යුතුය. නියත වශයෙන් යෙදෙන නාම ධර්ම පවතී. අනියත වශයෙන් යෙදෙන නාම ධර්ම පවතී. නියත යෝගී, අනියත යෝගී වේ. පළමු කුසල් සිත ඤාණ සම්ප්‍රයුක්තයි. ඒ නිසා **ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකාග්‍රතා, ජීවිතඉන්ද්‍රිය, මනසිකාර, විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය,**

**ප්‍රීති ඡන්ද, යන අන්‍ය සමාන චෛතසික 13 ම යෙදේ. ශ්‍රද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලෝභ, අදෝස, තත්‍රමජ්ඣත්තතා, කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි, කාය ලහුතා, චිත්ත ලහුතා, කාය මුදුතා, චිත්ත මුදුතා, කාය කම්මඤ්ඤතා, චිත්ත කම්මඤ්ඤතා, කාය පාගුඤ්ඤතා, චිත්ත පාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා,** යන සෝතන සාධාරණ චෛතසික 19 ම සම්ප්‍රයුක්ත හෙයින් ප්‍රඥාව යෙදේ. නාම ධර්ම සිතත් සමග 34 ක් යෙදේ. නමුත් මෙය නියත යෝගීයි. මෙය අනිවාර්යයෙන්ම යෙදෙනවා. ඇතැම් විට කරුණා අරමුණක් ගන්නා විටදී කරුණා චෛතසිකය යෙදේ. මුදිතා අරමුණක යෙදෙන අවස්ථාවේ දී මුදිතාව යෙදේ. සම්මා වාචා අරමුණක් අවස්ථාවේ දී සම්මා වාචාව යෙදේ. සම්මා ආජීව, සම්මා කම්මන්ත මේ ආකාරයට ඒ ඒ අරමුණු අවස්ථාවේ දී ඒ ඒ අරමුණු යෙදේ. කුසල් සිත උපෙක්ඛා සහගත වුවහොත් ප්‍රීතිය නොයෙදේ. එකක් අඩු වේ. සාමාන්‍ය බ්‍රහ්ම විහාර, ධ්‍යාන බ්‍රහ්ම විහාරවලදී නාම ධර්ම වෙනස් වේ. කාමාවචර කුසලයක් සමග පහළ වන බ්‍රහ්ම විහාර අදෝසය නමැති මෛත්‍රිය, මුදිතාව, කරුණාව, තත්‍රමජ්ඣත්තතාව, උපෙක්ඛාවයි. සාමාන්‍ය කාමාවචර භූමියේ දී කාමාවචර කුසල් සිතක් ගානේ පහළ වන්නේ තත්‍රමජ්ඣත්තතාවයි. රූපාවචර සිතක් ගත් විට උපේක්ඛා බ්‍රහ්ම විහරණ යනු චතුත්ථ ධ්‍යානයයි. මෛත්‍රියෙන් ප්‍රථම, ද්‍විතිය, තෘතිය ධ්‍යානද, කරුණාවෙන් ප්‍රථම, ද්‍විතිය, තතිය ධ්‍යාන ද, මුදිතාවෙන් ප්‍රථම, ද්‍විතිය, තතිය ධ්‍යාන ද, උපෙක්ඛා බ්‍රහ්ම විහරණයෙන් චතුත්ථ ධ්‍යානයද, මෙම ධ්‍යාන බ්‍රහ්ම විහරණ වේ. (චතුෂ්ක ධ්‍යාන නය ක්‍රමයෙනි)

මෙහි පටිච්චසමුප්පාද අංග පැහැදිලි කිරීමේ දී **අවිජ්ජා පච්චයා සඞ්ඛාරෝ** ලෙස දේශනා කළේ නැත. මෙහිදී චතුෂ්ක 4 ක් ගැන සඳහන් වේ. **පච්චය චතුෂ්කය හේතු චතුෂ්කය සම්ප්‍රයුක්ත අඤ්ඤමඤ්ඤ.** චතුෂ්කයි මේ යටතේ පැහැදිලි වනුයේ ඒක චිත්තක්ෂණික වශයෙනි. එක් මොහොතක ඇතිවන ස්වභාවයයි පැහැදිලි වනුයේ. පළමු කුසල් සිත ජවන් වශයෙන් පහළවන ජවන් 7 න්, ඒ පළමුවැනි ජවන්ගත අවස්ථාවේ දී පහළවන පටිච්ච සමුප්පාද අංගයන් පැහැදිලි කරන හෙයින් අවිද්‍යාව නොයෙදේ. අවිජ්ජා යනු මෝහයයි. එය අකුසල

පාක්ෂිකයි. ඒ නිසා කුසල් සිත තුළ අවිජ්ජාව නැත. එබැවින් **කුසල මූල පච්චයා සංඛාරො** ලෙස පැහැදිලි කරයි. - **තීනිමානි භික්ඛවෙ කුසලමූලානි** -. බුදුරජාණන් වහන්සේ සූත්‍ර දේශනාවලත් පැහැදිලි කරන සේක් නම්, **අලෝභො, අදොසො, අමෝහො.** ඒ අනුව කුසල මූල නම්, අලෝභය, අදෝසය සහ අමෝහයයි. අලෝභය - නො ඇලීම, අදෝසය - මෛත්‍රිය, අමෝහය - ප්‍රඥාව. මෙම කුසල මූල 3 නිසා සංඛාරය පහළ වේ. එනම්, පළමු **සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික** සිතේ පහළවන කුසල චේතනාවයි.

**සඞ්ඛාර පච්චයා විඥ්ඤාණං:** මේ කුසල චේතනාව නිසා සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත, විඥ්ඤාණය පහළ වේ. **විඥ්ඤාණ පච්චයා නාමං:** මේ කුසල් සිත නිසා වෙදනා, සංඥා, සංඛාර ස්කන්ධ 3 පහළ වේ. වේදනාව යනු කුසල් සිතේ පහළවන සෝමනස්ස වේදනාව, වේදනා ස්කන්ධයයි. කුසල සංඥාව, සංඥා ස්කන්ධයයි. සංඛාර, කුසල චේතනාව ප්‍රධාන කොට ඇති සියලුම චෛතසික ධර්මයන් සංඛාර ස්කන්ධයයි. **නාම පච්චයා ඡට්ඨායතනං:** වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධ 3 දෙනා නිසා මනායතනය පහළ වේ. කුසල් සිත නමැති මනායතනය පහළ වේ. ඡට්ඨායතනය නම් නාමස්කන්ධය නිසා පහළවන මනායතනයයි. **ඡට්ඨායතන පච්චයා ඵස්සො:** ඒ කුසල් සිතේ පහළවන ඵස්ස චෛතසිකයයි. **ඵස්ස පච්චයා වෙදනා:** ඒ ඵස්ස චෛතසිකය නිසා පහළවන කුසල වේදනාව, සෝමනස්ස වේදනාවයි. **වේදනා පච්චයා .......තණ්හාව** නොයෙදේ. තණ්හාව ලෝභයයි. ඒ කුසල් සිත තුළ තණ්හාව පහළ නොවේ. ඒ චිත්තක්ෂණය සමඟ ඇති නොවේ. එහෙයින් බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලබන්නේ **වේදනා පච්චයා පසාදො** සෝමනස්ස වේදනාව නිසා ප්‍රසාදය, ශ්‍රද්ධාව පහළ වේ. සිතේ ඇතිවන විශ්වාසය ශ්‍රද්ධාවයි. ගෞරවය, ප්‍රසාදය ශ්‍රද්ධාවයි. බුදුරජාණන් වහන්සේ දකින විට සිතේ සතුටක් ඇති වේ. ඒ සතුට සමඟ පුදුමාකාර ශ්‍රද්ධාවක් ඇති වේ. සෝමනස්ස වේදනාව, ශ්‍රද්ධාව පහළවීමට උදව් විය. **පසාද පච්චයා අධිමොක්ඛො:** ඒ චිත්තක්ෂණයේ දී අරමුණු හොඳින් බැස ගනී. තදින්

අල්ලා ගනී. අධිමොක්ඛයයි. අධිමොක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය පහළ වේ. උත්පත්තිය ජාතිය, ඨිතිය ජරාව, භංගක්ෂණය මරණය වේ.

ඊළඟ නය ක්‍රමයේ පවතින වෙනස, **විඤ්ඤාණ පච්චයා නාමං: නාම පච්චයා ඵස්සො:** සෝමනස්ස සහගත සිත නිසා, පළමු කුසල් සිත නිසා නාමස්කන්ධ ඇති වේ. නාමස්කන්ධ නිසා ස්පර්ශය ඇති වේ. මුලින් සඳහන් නය ක්‍රම අනුවම ඉතිරිය පැහැදිලි කරගත හැක.

තුන්වෙනි නය ක්‍රමයේ වෙනස, **විඤ්ඤාණ පච්චයා නාමරූපං: නාමරූප පච්චයා ඡට්ඨායතනං: විඤ්ඤාණ පච්චයා නාමරූපං** ලෙස අදහස් කරන වීට කුසල් සිත සමඟ පහළවන කුසල චිත්තජ රූප, කර්මජ රූප, රූප ලෙස ගැනේ. වේදනා, සංඥා, සංඛාර, නාමස්කන්ධ - නාම වේ. ඡට්ඨායතනං හි දී රූපයෙන් ලබන උපකාරය ලෙස සලකන්නේ ඒ කුසල ජවනයට කලින් පහළ වූ පුරේජාත හෘදය වස්තුවයි. වේදනා, සංඥා, සංඛාර නිසා පහළවන මනායතනයයි. ඉතිරි අංග මුලින් ඒවා හා සමානයි.

හතරවෙනි නය ක්‍රමයේ වෙනස, **විඤ්ඤාණ පච්චයා නාමරූපං: නාමරූප පච්චයා සළායතනං: ඡට්ඨායතන පච්චයා ඵස්සො:** පළමු කුසල් සිත සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිත නිසා සහජාත වශයෙන් (චිත්තජ රූප, කර්මජ රූප: රූප වේදනා සංඥා සංඛාර නාමස්කන්ධ - නාම) නාමරූප පහළ විය. **නාමරූප පච්චයා සළායතනං** හි දී රූප පුරේජාත වශයෙන් පහළ වූ කලාපීය මහා භූතයන් නිසා පහළ වූ ආයතන, සහජාත නාම ධර්මත් උපකාරී වේ. නාමරූප නිසා සළායතන පහළ විය. **ඡට්ඨායතන පච්චයා ඵස්සො:** මනායතනය නිසා මනෝසම්ඵස්සය පහළ විය. මේ ආකාරයෙන් පච්චය චතුෂ්කය යටතේ පැහැදිලි කරගත යුතුයි.

මේ ආකාරයට හේතු චතුෂ්කය, කුසල මූලය නිසා සංස්කාර හටගනී. කුසල මූලය හේතුවයි. කුසල චේතනාව නිසා කුසල සිත පහළ වීය. චේතනාව හේතුවයි. කුසල සිත නිසා කුසල නාම, ඇතැම් විට කුසල

නාමරූප පහළ වේ. කුසල් සිත හේතුවයි. මේ ආකාරයෙන් හේතුව තෝරාගත යුතුයි.

සම්ප්‍රයුක්ත චතුෂ්කයේ දී කුසල මූලය නිසා චේතනාව පහළ වේ. ඔවුනොවුන්ගේ සම්ප්‍රයුක්තය කුසල මූලය සම්ප්‍රයුක්තවීම නිසයි.

අඤ්ඤමඤ්ඤ, ඔවුනොවුන්ගේ එකතුව නිසයි. මේ ආකාරයෙන් චතුෂ්ක 4 වෙන වෙනම පැහැදිලි කරගත යුතුය. මෙය පළමු කුසල් සිත යටතේ පටිච්ච සමුප්පාද අංගයන් හේතු-ඵල සම්බන්ධයයි. අවිද්‍යාවෙන්ම ආරම්භ විය යුතු දැයි කෙනෙකුට සිතිය හැක. නැත. පටිච්ච සමුප්පාදය හේතු-ඵල ධර්මයකි. **කුසල මූලයන් නිසා කුසල චේතනාව, කුසල චේතනාව නිසා කුසල් සිත, කුසල සිත නිසා කුසල නාමයන්, කුසල රූපයන්, කුසල නාමරූප නිසා ඇතැම් විට සළායතන, ඇතැම් විට ඡට්ඨායතන, ඡට්ඨායතනය නිසා කුසල සම්ඵස්සය, කුසල සම්ඵස්සය නිසා කුසල සම්ඵස්ස වේදනාව, කසල සම්ඵස්ස වේදනාව ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය භවය, භවය නිසා ඒ චිත්තක්ෂණයේ උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය. මේ ආකාරයෙන් කුසල් සිතක් ගානේ පැහැදිලි කරගත යුතුය.**

දෙවැනි කුසල් සිතේ කිසිදු වෙනසක් නැහැ. සසංඛාරික භේදය යෙදේ. සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික කුසල් සිත තේරුම් ගත යුතුය.

තුන්වෙනි කුසල් සිත සෝමනස්ස සහගත ඤාණ විප්පයුක්ත අසංඛාරික. මෙහිදී කුසල් සිත සෝමනස්ස සහගත නමුත් නුවණ නැත. ඤාණ විප්පයුක්තයි. අසංඛාරිකයි. මෙතැන දී පෙර පරිදි **කුසල මූල පච්චයා සඞ්ඛාරො: සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං:** - පෙ-, මෙහිදී කුසල මූල පැහැදිලි කරගත යුතුය. අලෝභ, අදෝස, අමෝහ කුසල මූල 3 කි. මේ සිත ඤාණ විප්පයුක්ත හෙයින් අමෝහය යෙදෙන්නේ නැත. අලෝභ, අදෝස කුසල මූල 2 නිසා සෝමනස්ස සහගත ඤාණ විප්පයුක්ත අසංඛාරික කුසල චේතනාව. මේ කුසල චේතනාව නිසා සෝමනස්ස

සහගත ඤාණ විප්පයුක්ත අසංඛාරික කුසල් සිත උපදී. මේ ආකාරයෙන් නය ක්‍රම 4 ම පැහැදිලි කරගත යුතුය.

සෝමනස්ස සහගත ඤාණ විප්පයුක්ත සසංඛාරි මෙහිදී ද කිසිම වෙනස් නැත. කුසල මූලයේ දී අමෝහය යෙදෙන්නේ නැත. අලෝභ, අදෝස පමණයි යෙදෙන්නේ.

උපෙක්ඛා සහගත කුසල් සිත්, පළමු සිත උපේක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සිත. **කුසල මූල පච්චයා සඞ්ඛාරොඃ** - පෙ- මෙහිදී ද කිසිදු වෙනසක් නැත. වේදනාවේ වෙනස පමණයි යෙදෙන්නේ. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල යටතේ, කුසලයෙහි දී අලොභ, අදොස, අමොහ තුන් දෙනාම යෙදේ. මේ කුසල මූලය නිසා උපෙක්ඛා සහගත අසංඛාරික කුසල චේතනාව පහළ වේ. මේ කුසල චේතනාව නිසා උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිත, විඤ්ඤාණය පහළ වේ. මේ විඤ්ඤාණය නිසා උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත නාමස්කන්ධ පහළ වේ. ඒ නාමස්කන්ධ නිසා උපේක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික මනායතනය පහළ වේ. මේ මනායතනය නිසා උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික මනෝ සම්ඵස්සය පහළ වේ. ඒ ඵස්සය නිසා උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිතේ උපෙක්ඛා වේදනාව පහළ වේ. **වේදනා පච්චයා ප්‍රසාදෝ** යනු ඒ උපෙක්ඛා වේදනාව නිසා උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සිතේ ඇති ශ්‍රද්ධාවයි, ප්‍රසාදය. ප්‍රසාදය නිසා අධිමොක්ඛය. අධිමොක්ඛය නිසා භවය, භවය නිසා ජාති ජරා මරණ. මේ ලෙස උපෙක්ඛා සහගත සිත තේරුම් ගත යුතුය.

උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික සිතත් මේ හා සමානවම යෙදේ. ඊළඟට උපෙක්ඛා සහගත ඤාණ විප්පයුක්ත අසංඛාරික සිත. ඤාණ විප්පයුක්තයේ දී කුසල මූල අලෝභය, අදෝසය, පමණි. අමෝහය නැත. වේදනාවේ දී උපෙක්ඛා වේදනාවයි.

අටවැනි කුසල් සිත, උපෙක්ඛා සහගත ඥාණ විප්පයුක්ත සසංඛාරික සිත. එහිදී ද අලෝභ, අදෝස පමණි. අමෝහය නැත. වේදනාව උපෙක්ඛා වේදනාවයි.

මේ කුසල් සිත් 8 ම පච්චය. හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ යන චතුෂ්ක 4 ටම තේරුම් ගත යුතුය. මෙලෙස තේරුම් ගැනීමෙන් පටිච්ච සමුප්පාද අංගයන්, හේතු ඵල ධර්මයන්, කාමාවචර ඒ ඒ ජවන්ගත කුසලයක් ගානේ බැලිය හැකිය. වෙන වෙනම දකිමින්, නැවත මේ හේතු ඵල ධර්මයන් එකට යෙදී තිබෙන ආකාරය දැකගත යුතුය. ඒවා අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වඩා විදර්ශනා ඥාණ දියුණු කරගත යුතුය. මේවා වැඩීම තුළින් පච්චය පරිග්‍රහ ඥාණය තවදුරටත් තීක්ෂණ වූ විට සංඛාරුපෙක්ඛා ඥාණය දක්වා සිත දියුණු කරගැනීමට පුළුවනි. පාරමී ධර්ම හොඳින් මස්තකප්‍රාප්ත වූවා නම් සංඛාරුපෙක්ඛා ඥාණයෙන් එහා පැත්තේ අනුලෝම ඥාණ, ගෝත්‍රභූ ඥාණ පහළ කරගෙන සෝවාන් මාර්ග ඵල පිළිවෙලින් අමා මහ නිවන් සුව සාක්ෂාත් කරගැනීමට හැකියාව ලැබේ.

පටිච්ච සමුප්පාද අංගයන් පිළිබඳ සිතක් ගානේ කෙරෙන විග්‍රහයේ දී කාමාවචර කුසල් සිත් 8 ගැන යෙදෙන පටිච්ච සමුප්පාද අංගයන්, හේතු ඵල ධර්මයන් කෙටියෙන් අර්ථ විග්‍රහ විය, වචනයක් වචනයක් ගානේ එහි ස්වභාවය හඳුනාගත්තා නොවේ. වචන තේරුම් සමග නය ක්‍රමය ගමන් කරන්නේ කෙසේද යන ක්‍රමය පමණක් පැහැදිලි කෙරුණි

මෙවැනි උතුම් ධර්මයක් ඉගෙන ගැනීමෙන්, දරාගැනීමෙන්, කටපාඩම් කිරීමෙන්, සාකච්ඡා කිරීමෙන්, දේශනා කිරීමෙන්, ශ්‍රවණය කිරීමෙන් ජනිත කරගත් උතුම් කුසල ශක්තිය, පුණ්‍ය සම්භාරය, මෙවැනි සුමිහිරි දහමක් ලෝකයාට දේශනා කොට වදාළ තථාගත බුදුපියාණන් වහන්සේට උතුම් සම්බුද්ධ පූජාවක් වේවා! උත්තරීතර ධර්මරත්නය උදෙසා කරන දහම් පූජාවක් වේවා! මේවා කට වචනයෙන්, කටපාඩමින් දරාගෙන පැමිණ පොත්පත්වල ලියා රැගෙන ආ පැමිණි අෂ්ඨාර්ය පුද්ගල සංඝරත්නය උදෙසා සංඝගත පූජාවක් වේවා! මෙවැනි උතුම් ධර්මයන්

ඉගෙන ගන්නට, කටපාඩම් කරගන්නට, අර්ථ හඳාරන්නට, අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කල ආචාර්ය උපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේලාට ගුරු පූජාවක් වේවා! හැදූ වැඩූ දෙමාපියන්ට, සහෝදර සහෝදරියන්ට, සිවුපසයෙන් ඇප උපස්ථාන කරන සියලුම දායකාදී මවුපිය දූදරු සැමදෙනාට, දෙවියන් බ්‍රහ්මයන් ඇතුළු සකල ලෝකයාට, මියගිය ඥාතීන් ඇතුළු සියලු සත්ත්වයන්ට නිවන් සුව පිණිස උපකාරී වේවා! අවසාන වශයෙන් ඔබ අපි සැමදෙනාම ප්‍රාර්ථනා කරන බෝධි ඥානයන්ගෙන් සමථ විදර්ශනා භාවනා ඥාන, ප්‍රතිපත්ති ඥාන මුදුන් පමුණුවාගෙන, පරම ගම්භීර චතුරාර්ය සත්‍ය අවබෝධයෙන්, පටිච්ච සමුප්පාද අවබෝධයෙන්, නිවන් සුව අවබෝධ කරගන්නට, නිවන් මාර්ගය එළිපෙහෙළි කරගන්නට සියලු ශක්තිය ධෛර්යය ලැබේවා! අවසාන වශයෙන් බුදු, පසේබුදු මහරහතන් වහන්සේලා නිවී සැනහී පැමිණ වැඩ වදාළ අජරාමර අමා මහ නිවනින් සැනසීම පිණිසම උපකාර වේවා කියා ප්‍රාර්ථනා පිහිටුවා ගනිමු.

සාදු! සාදු! සාදු!

# භයවන දේශනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

**කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ -පෙ-**

**පඨමං ඣාන උපසම්පජ්ජ විහරති -පෙ-**

## 02 රූපාවචර කුසල්

ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ අකුසල් සිතක් ගාණේ වැඩෙන පටිච්ච සමුප්පාද අංගයන් ද, කාමවචර මහා කුසලයන් කුසල් සිතක්, සිතක් ගානේ පහළ වන පටිච්ච සමුප්පාද අංගයන් ද දේශනා කොට, රූපාවචර කුසලයන් සම්බන්ධ කරගෙන ඒ කුසල් සිතක්, සිතක් ගානේ වැඩෙන පටිච්ච සමුප්පාද අංගයන්, හේතුඵල ධර්මයන් හඳුනාගන්නා නය ක්‍රමය දේශනා කරන ලදී. එය මාතෘකා කරන දේශනා පාඨයයි ඉහතින් දැක්වූයේ.

අභිධර්ම නය ක්‍රමයට කුසල් සිත් 21 බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ඒ කුසල් සිත් 21 භූමිභේදයෙන් මෙසේය. සතර අපාය, මනුලොව, දෙව්ලොව නැමැති කාමාවචර භූමිවලට අදාළ සිත් 54ක් තිබේ. ඒ සිත් 54 න් කාමාවචර පුද්ගලයන් තුළ ප්‍රධාන වශයෙන් වැඩෙන කුසල් සිත් 8 ගැන දේශනා කළ සේක. මේ කාමාවචර කුසලය ඉක්මවා යන රූපාවචර කුසල් 5 ක් තිබේ. ඒවා ධ්‍යාන කුසල් ලෙස හැඳින්වේ. යම්කිසි කෙනෙක් ධ්‍යාන වඩයි නම් ඒ ධ්‍යාන වඩන අවස්ථාවේ දී වැඩෙන කුසල්, ධ්‍යාන කුසල් ලෙස සලකයි. රූපාවචර කුසල් ඉක්මවා යන අරූපාවචර කුසල් තිබේ. ඒවා අරූප ධ්‍යාන නමිනි. මේ සියලු ලෞකික කුසල් කාමාවචර කුසල් 8, රූපාවචර කුසල් 5, අරූපාවචර කුසල් 4 මේ කුසල් සිත් 17 ලෞකික, ලෝකීය කුසල් ලෙස හඳුන්වයි. මේ ලෝකීය, ලෞකික කුසල් ඉක්මවා යන ප්‍රබලතම කුසලය ලෝකෝත්තර කුසල් නමිනි. ලෝකෝත්තර කුසල් නම් කාම ලෝකයන්,

රූප ලෝකයන්, අරූප ලෝකයන් ඉක්මවා ඉහළට ගමන් කළ හැකි කුසලයකි. අතීත හේතුවල සම්බන්ධයක් නොමැතිව, ඒ ඒ මොහොතට කුසල් සිතක් ගානේ ක්‍රියා කරන හේතු ධර්ම, හේතු ඵල මොනවාද යන්න මෙහි දී පැහැදිලි කරනු ලැබේ.

ඒ අනුව ප්‍රථම ධ්‍යානය යනු, සරල අදහසට අනුව, විතක්ක, විචාර ප්‍රීති, සුඛ, ඒකග්‍රතා, සහිත ප්‍රථම ධ්‍යානය. ධ්‍යාන උපදවා ගන්නවා යනු **"පච්චනීක ධම්මෙ ඣාපෙතී ති ඣානං ආරම්මණෙක්ඛ උපනිජ්ඣායන ලක්ඛණං ඣානං"** නමුත් මෙහි දී **"ආරම්මණ උපනිජ්ඣායන ලක්ඛණං"** සම්බන්ධ කරගත හැක. එහෙත් රූපාවචර භූමියේ දී පමණකි. මෙහි දී ප්‍රධාන වශයෙන් ගනු ලබන්නේ, පංචනීවරණ ධර්මයන් යටපත් කරන බැවින් ධ්‍යාන නම් වේ. ප්‍රථම ධ්‍යාන සිත් ගත් විට, ප්‍රථම ධ්‍යානය උපදින අරමුණු හඳුනාගත යුතුය. දේශනාවේ **"පඨවි කසිණං"** පමණයි සඳහන්ව ඇත්තේ නමුත් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, නීල, පීත, ලෝහිත, ඕදාත, ආලෝක ආකාස කසිණ 10ක් පවතී. මේ කසිණ 10 නිසා ප්‍රථම ධ්‍යාන උපදින්න පුළුවනි. ආනාපාන සති භාවනාව නිසා ප්‍රථම ධ්‍යානය උපදවන්න පුළුවනි. කායගතා සති භාවනාව, දෙතිස් කුණුප භාවනාවෙන් ප්‍රථම ධ්‍යාන උපදවා ගත හැක. දස අශුභයෙන් ප්‍රථම ධ්‍යාන උපදවා ගත හැක. මේ ආකාරයෙන් ප්‍රථම ධ්‍යාන උපදින අවස්ථා පවතී. මෛත්තා, කරුණා, මුදිතා, බ්‍රහ්ම විහරණ 3හි ප්‍රථම ධ්‍යාන උපදවා ගතහැක. මේ ප්‍රථම ධ්‍යාන තුළ පවතින හේතු ඵල සලකා බැලිය යුතුය.

ප්‍රථම ධ්‍යාන කුසලය තුළ ක්‍රියා කරන නාම ධර්ම හඳුනාගත යුතුය. කර්මස්ථානයට අනුව වෙනස්කම් පවතී. කරුණා ධ්‍යානයට සමවැදුනු විට කරුණාව, එක්වී මුදිතා ධ්‍යානයේ දී මුදිතා ධ්‍යානයට එකතු වේ. සාමාන්‍ය ලෙස ගත් විට නාම ධර්ම 33 යි සිත සමග 34 ක් වේ. නාම ධර්ම 34 හඳුනාගත් ධ්‍යාන චිත්තක්ෂණයේ, ධ්‍යාන චිත්තවීථිය හඳුනාගත යුතුය. ධ්‍යාන චිත්තවිථි උපදින ක්‍රම 2 ක් පවතී. ප්‍රධාන වශයෙන් පුද්ගලයන් අනුව ක්‍රම 2 කට බෙදෙයි. තික්ඛ ප්‍රඥා, මන්ද ප්‍රඥා ලෙසය. මන්ද ප්‍රඥා යනු මන්දගාමී නුවණයි. ප්‍රඥා යනු තීක්ෂණ නුවණයි. ධ්‍යාන උපදවා ගන්නා මාර්ග 4 ක් පවතී.

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා - දුක් ප්‍රතිපදාවෙන් ගමන් කර දුක සේ අවබෝධ කරගනී.

දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා - දුක සේ ප්‍රතිපදාව ගමන් කර සැප සේ අවබෝධ කරගනී.

සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා - සැප සේ ගමන් කර දුක සේ අවබෝධ කරගනී.

සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා - සුව සේ ගමන් කර සැප සේ ඉක්මනින් අවබෝධ කරගනී.

ඡන්දය අධිපති කරගෙන, වීර්යය අධිපති කරගෙන, සිත අධිපති කරගෙන, ප්‍රඥාව අධිපති කරගෙන, ධ්‍යාන උපදවා ගනී. මේ ආකාරයෙන් ධ්‍යාන උපදවා ගන්නා මාර්ග බොහොමයක් බුදුපියාණන් වහන්සේ දේශනා කොට තිබේ. තීක්ෂණ සහ මන්ද පුද්ගලයන්ගේ චිත්තවීථි අතර සුළු වෙනසක් පවතී. මේ ධ්‍යාන වැඩෙන්නේ කුමන ද්වාරික වශයෙන්ද? සිතක් පහළවන විට සිත උපදින දොරටු පවතී. දොරටු හයක්, චක්ඛු ද්වාර, සෝත ද්වාර, ඝාන ද්වාර, ජිව්හා ද්වාර, කාය ද්වාර, මනෝ ද්වාර වශයෙනි. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය යන පංච ද්වාරයන්ගෙන් ධ්‍යාන සිත් උපදින්නේ නැත. ධ්‍යාන සිතක් උපදින්නේ මනෝ ද්වාරයෙනි. මනෝද්වාරාවර්ජනයෙන් ධ්‍යාන සිතක් උපදී නම් ධ්‍යාන වීථිය ක්‍රියා කරන ආකාරය හඳුනාගත යුතුය.

මනෝද්වාරයෙන් ධ්‍යාන සිතක් උපදී නම්, භවංග, භවංග චලන, භවංග උපච්ඡේද චිත්තක්ෂණ 3ක් පහළ වී මනෝද්වාරාවජ්ජන චිත්තක්ෂණය පහළ වේ. මනෝද්වාරාවජ්ජනය යනු යෝනිසෝ මනසිකාරයයි. මේ යෝනිසෝ මනසිකාරයට පටිභාග නිමිත්ත අරමුණු වේ. උදා: පඨවි කසිණයෙන් උපදවාගත් පටිභාග නිමිත්තක් චන්ද්‍ර මණ්ඩලය හෝ සූර්‍ය මණ්ඩලය සේ මේ පටිභාග නිමිත්ත මනෝද්වාරයට අරමුණ වේ. මනෝද්වාරයට අරමුණ වූ පසු පරිකම්ම චිත්තක්ෂණය, උපචාර, අනුලෝම ගෝත්‍රභූ චිත්තක්ෂණ, ප්‍රථම ධ්‍යාන චිත්තක්ෂණ, භවංග චිත්තක්ෂණ පහළ වේ. මෙය මන්ද ප්‍රඥයාගේ ක්‍රියා කරන ආකාරයයි. මන්ද ප්‍රඥයාගේ පරිකම්ම චිත්තක්ෂණය, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ

අනුලෝම චිත්තක්ෂණ, ප්‍රථම ධ්‍යාන චිත්තක්ෂණ, භවංග චිත්තක්ෂණය ලෙස පහළ වේ. මන්ද ප්‍රඥයාගේ පරිකම්ම චිත්තක්ෂණයක් පහළ වේ. අනුලෝම යනු ධ්‍යානයට අනුලෝමවීම සමීපවීම, ගෝත්‍රභූ - කාමාවචර ගෝත්‍රය බිඳ රූපාවචර ගෝත්‍රයට රැගෙන යාමයි. ගෝත්‍රභූ සිතින් සිදුවන්නේ එයයි. පංච නීවරණයෙන් දැවී ප්‍රථම ධ්‍යාන සිත උපදවා ගැනීමයි. මෙහි දී අවබෝධ කළ යුතු වන්නේ පරිකම්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ මෙම චිත්තක්ෂණ 4 කාමාවචර වේ. මේවා කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත සෝමනස්ස සහගත මහා කුසල්ය. මීට පෙර දී අප හඳුනාගන්නා ලද කාමාවචර කුසල්වල පටිච්ච සමුප්පාද අංගයන් පරිග්‍රහ කරන ආකාරයටම ධ්‍යාන චිත්ත වීථියේ දී පරිකම්ම, අනුලෝම, ගෝත්‍රභූ යන චිත්තක්ෂණ 4හි පටිච්ච සමුප්පාද අංගයන් බලා ධ්‍යාන චිත්තක්ෂණයට යා යුතුය. ඉන්පසු ධ්‍යාන චිත්තක්ෂණයේ දී ද පටිච්ච සමුප්පාද අංගයන් නය ක්‍රමයට අනුව හේතු ඵල බැලිය යුතුය.

තීක්ෂණ ප්‍රඥාවේ දී භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේද, මනෝද්වාරජ්ජන, (පරිකම්ම නොයෙදේ) උපචාර, අනුලෝම, ගෝත්‍රභූ ධ්‍යාන, භවංග ලෙස යෙදේ. ධ්‍යාන චිත්ත වීථියක් අවසානයේ තදාරම්මණ පහළ නොවේ. ධ්‍යාන චිත්ත වීථියේ දී ධ්‍යාන චිත්තක්ෂණ එක වරක් පමණයි පහළ වන්නේ. මේ පහළ වන ධ්‍යානය අධිෂ්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛණාදි ක්‍රමයට පංචවසීතාවයෙන් වසී කළ යුතුය. පංචවසීතාවයෙන් වසීකරන විටදී අධිෂ්ඨාන බලයෙන් වෙලාව අධිෂ්ඨාන කර ධ්‍යාන චිත්තක්ෂණය කාලය අනුව වැඩිකර ගත හැකිවේ. ධ්‍යාන චිත්තක්ෂණ විනාඩි 10.15 පැයක් දෙකක් දක්වා පවත්වා ගත හැක. මෙය අපහසු කාරියකි. ධ්‍යානය සහ ධ්‍යාන සමාපත්තිය වෙනස්ය. ධ්‍යාන උපදවා ගත හැක. නමුත් සමාපත්තිය අපහසුය. සමාපත්තිය හොඳින් වසී වූයේ නැතිනම් අපහසු වේ. නමුත් කැඩි කැඩී හෝ යමෙක් වඩනවා නම් ඒ ශක්තිය මතු සංසාරයට උපකාරි වේ. ඒ ශක්තිය විදර්ශනා වැඩීමට උපකාරි වේ. ඒ ශක්තිය තුළින් විදර්ශනා වඩා නිවන් දැකිය හැකිය. සමාපත්ති නොමැති කාලයක විදර්ශනාවේදී සිත වෙහෙසෙයි. මහන්සිය වෙයි. නමුත්, මහන්සි වී පවත්වා ගැනීමට නොහැකි නම්,

ධ්‍යානචිත්ත වීර්යද දුබල වේ. නම්, එයින් සැහීමකට පත්නොවී, සිත ශක්තිමත් කරගෙන එයින් ඉදිරියට ගමන් කළ යුතුය. ඔහුට විදර්ශනා වැඩීමේ හැකියාවක් පවතී. එසේ වඩා නිවන් දැකිය හැක. මේ ජීවිතයේ නිවන් නොදැකිය මුත් එලෙස භාවනා වඩමින් සිටිය දී සිත ඉබේම භාවනාවට හුරුවේ. උදාඃ- කෙනෙක් පැවිදි වූ විට ම ධර්මය දේශනා කිරීමේ හැකියාවක් නැත. පළමු අවස්ථාවේ දී ධර්මය දේශනා කිරීම අපහසු වේ. වචන පිළිවෙලට ගලා නොඑයි. නමුත් කාලයක් තිස්සේ ධර්මය දේශනා කිරීමේ හුරුව ලැබීම නිසා මාතෘකා එක් පදයකින් 'බුද්ධ' 'ධම්ම' ලෙස එක් වචනයකින් දින ගණන් ධර්මය දේශනා කළ හැක. කාලයක් පුරා කරන ලද හුරුව නිසා ඉබේම ගලාගෙන එයි. නා-උයනේ ලොකු ස්වාමින් වහන්සේ ධර්මය දේශනා කරන විට හැප්පිලි කිසිත් නැතිව ගංගාවෙක් ඉහළ සිට පහළට ගලා එන්නා සේ වචන පෙළ ගලා ගෙන එයි. කොහි සිට ගලා එනවාද යන්න සිතාගත නොහැකිය. මේ ජීවිතවල හුරුව පමණක් නොව සංසාර හුරුවයි. ඒ අතර තුර පාලි වචන, නිදාන කථා උපමා කථා ආදී නොයෙක් විස්තර ගලා එයි. මෙසේ වන්නේ කාලයක් තිස්සේ හුරුවක් සමඟිනි. මෙය තේරුම් ගත යුතුය. ධ්‍යානය යි, ධ්‍යාන සමාපත්තිය යි දෙකකි. බොහෝ දෙනාට ධ්‍යාන උපදවා ගත හැකිය. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලැබුවා නම් උපදවා ගත හැකිය. නිසි ගුරුවරයෙකුගෙන් ඒ නිසා කර්මස්ථාන ලැබිය යුතුය. සමාපත්ති උපදවා ගැනීමට බැරිකමක් නැත. ඒ සඳහා මහන්සි විය යුතුය.

ධ්‍යාන චිත්තක්ෂණයේ දී පහළවන හේතු නය ක්‍රමය මෙසේ පැහැදිලි කළ සේක. මෙහි දී පච්චය චතුෂ්කය, හේතු චතුෂ්කය, සම්ප්‍රයුත්ත චතුෂ්කය, අඤ්ඤමඤ්ඤ චතුෂ්කය අනුව පැහැදිලි කරගත යුතුය. එක් චතුෂ්කයක නය ක්‍රම 4ක් පවතී. දේශනාවේ මෙලෙසින් දක්වා ඇත.

**කුසල මුල පච්චයා සංඛාරො,** කුසල මූලය නිසා සංඛාර තෙම හටගනී. කුසල මූලය, ප්‍රථම ධ්‍යාන කුසල් සිතෙහි පහළවන අලෝභ ආදෝස අමෝහ කුසල මුල් 3 නිසා ප්‍රථම ධ්‍යාන කුසල චේතනාව උපදී.

**සංඛාර පච්චයා විඤ්ඤාණං** ප්‍රථම ධ්‍යාන කුසල චේතනාව නිසා ප්‍රථම ධ්‍යාන සිත උපදී. විඤ්ඤාණ නිසා නාම උපදී. වේදනා සංඥා සංඛාර ස්කන්ධ 3 දෙනයි. **නාම පච්චයා ඡට්ඨායතනං,** මේ නාමය නිසා මනායතනය උපදී. මනායතනය නිසා මනෝසම්ඵස්සය උපදී. ඵස්සය නිසා සෝමනස්ස වේදනාව උපදී. වේදනාව නිසා ප්‍රසාදය හෙවත් ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව නිසා අධිමොක්ඛය උපදී. ඒ අරමුණ තුළ තදින් බැස ගැනීම අධිමොක්ඛය නිසා භවය උපදී. අධිමොක්ඛ චෛතසිකය හැර වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නැමැති සතර නාම ස්කන්ධයන්ගේ පැවැත්ම උත්පත්තිය භවයයි. ජාතිය නම්, ධ්‍යාන චිත්ත වීථියේ උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය පෙර විස්තර සහිතව ඉදිරිපත් කර ඇති හෙයින් මෙහි දී සරලව පැහැදිලි කෙරේ.

මේ ආකරයෙන් ඉතිරි නය ක්‍රමය පැහැදිලි කරගත යුතුය.

දෙවැනි නය ක්‍රමය

**කුසල මූල පච්චයා සංඛාරො -පෙ-**

ප්‍රථම ධ්‍යාන කුසල් සිතේ පහළවන කුසල හේතු 3 නිසා කුසල චේතනාව පහළවේ. කුසල චේතනාව නිසා කුසල් සිත පහළ වේ. ඒ කුසල් සිත නිසා කුසල නාමස්කන්ධ 3 දෙනා පහළවේ. **නාම පච්චයා ඵස්සො,** වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නැමැති ප්‍රථම ධ්‍යාන සතර නාම ස්කන්ධයන් නිසා මනෝසම්ඵස්සය පහළ වේ. මෙහි පවතින වෙනස එපමණයි. **ඵස්ස පච්චයා වෙදනා,** ස්පර්ශය නිසා සැප වේදනාව, සැප වේදනාව නිසා ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම. ධ්‍යාන චිත්තක්ෂණයේ උත්පත්තිය - ජාතිය, ඨිතික්ෂණය - ජාරාව, භංගක්ෂණය - මරණය වේ.

මේ නය ක්‍රම මනුෂ්‍ය පථයේ දී වෙන වෙනම බැලිය හැක. බ්‍රහ්මලෝකයේ දී ද බැලිය හැක. කුසල්වල ගැටළුවක් නොවේ. නමුත් විපාකවලට යෑමේ දී සුළු සුළු වෙනස්කම් පවතී. ඒවා ඉදිරියට සාකච්ඡා කරනු ලැබේ.

තුන්වෙනි නය ක්‍රමයේදි **කුසල මූල පච්චයා සංඛාරො - පෙ - විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූපං පච්චයා ජට්ඨායාතනං -පෙ -** ප්‍රථම ධ්‍යාන කුසල මූලයන් නිසා ප්‍රථම ධ්‍යාන කුසල චේතනාව උපදී. ප්‍රථම ධ්‍යාන කුසල් සිත නිසා නාමරූප උපදී. නාමරූප යනු කුසල් සිතත් සමඟ උපදින චිත්තජ රූප සහ සිත හැර සතර නාම ස්කන්ධයන්ය. මෙහි දී කර්මජ රූප ද උපකාරී කර ගත හැක. බොහෝ දුරට කර්මජ රූප පිළිබඳව සාකච්ඡා නොකෙරේ. කර්මජ රූප උපදින ආකාරය අනුව මෙහි වෙනස්කම් ඉදිරියට දැකිය හැක. පට්ඨාන නය ක්‍රමයේ දී සෑම සිතක් ගානේම උත්පාදක්ෂණයේ, ඨිතික්ෂණයේ, භංගක්ෂණයේ දීත් කර්මජ රූප පහළවන බව සඳහන් වේ. සෑම චිත්තක්ෂණයක දී ම උත්පාද, ඨිති, භංග යන සෑම අනු චිත්තක්ෂණයක් ගානේම කර්මජ රූප පහළ වේ. සිත සමග කථා කිරීමේ දී චිත්තජ රූප බොහෝ දුරට සාකච්ඡා කෙරේ. කර්මජ රූප ද බැලිය යුතුය. භාවනා වශයෙන් යෝගීයෙක් අනිවාර්යයෙන්ම කර්මජ රූපද වැඩිය යුතුය. ඒ අනුව නාමරූප උපදී. **නාමරූප පච්චයා ජට්ඨායතනං.** මෙහි දී නාමරූප යනු සහජාත වශයෙන් පහළ වූ නාමරූප නොවේ. ධ්‍යාන චිත්තක්ෂණයට කලින් පහළ වූ ගෝත්‍රභූ චිත්තක්ෂණය සමග හෘදය වස්තුව පහළ විය. එම හදය වස්තු රූපයයි, ධ්‍යාන චිත්තක්ෂණයේ නාම ධර්මයි යන මේ නාමරූප (මෙහිදී පුරේජාත වස්තු රූපය උපකාරිවන බව හඳුනාගත යුතුයි.) පහළ විය. මෙය මනායතනයට උපකාරි වේ. (පුරෙජාත හදය වස්තු රූපය පැහැදිලි කරගත යුතුවේ.) **ජට්ඨායතන පච්චයා ඵස්සො, මනායතනය** නිසා මනෝසම්ඵස්සය, මනෝසම්ඵස්ස නිසා සෝමනස්ස වේදනාව, සෝමනස්ස වේදනාව නිසා ප්‍රසාදය, ශ්‍රද්ධාව. ශ්‍රද්ධාව නිසා අධිමොක්ඛය. අධිමොක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ උත්පත්තිය ජාතිය, ජරාව, මරණය; උත්පාද ඨිති භංග යයි.

හතරවෙනි නය ක්‍රමයේ දී **කුසල මූල පච්චයා සංඛාරො, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණං පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, ජට්ඨායතනං පච්චයා ඵස්සො** - පෙ - ප්‍රථම ධ්‍යාන කුසල මූලයන් නිසා ප්‍රථම ධ්‍යාන කුසල චේතනාව පහළ විය. ප්‍රථම ධ්‍යාන

කුසල චේතනාව නිසා ප්‍රථම ධ්‍යාන සිත උපදී. ප්‍රථම ධ්‍යාන සිත නිසා සහජාත වශයෙන් උපදින චිත්තජ රූප, වේදනා, සංඥා, සංඛාර නාම ස්කන්ධ නාම රූප වේ. නාමරූප පච්චයා සළායතනයේ දී සහජාත වශයෙන් නාමරූප පහළ වුවත් පුරෙජාත වශයෙන් ගෝත්‍රභූ චිත්තක්ෂණය සමග මුළු ශරීරය පුරාම කර්මජ රූප පහළ විය. ප්‍රධාන වශයෙන් චක්ඛායතන ආදී පංචායතනයන් පහළ විය. මේ පංචායතනයන් තුළ පඨවි, ආපෝ, තේජෝ, වායෝ (භූත රූප 4) ක්, කර්මජ මහා භූත රූප පවති. මේ කර්මජ මහා භූත රූප උපකාරි ශක්තියත් සමග ධ්‍යාන චිත්තක්ෂණයේ දී මුළු ශරීරය පුරාම ආයතන පහළ විය. මෙය **නාමරූප පච්චයා සළායතනං** ලෙස දැක්වේ. සහජාත වශයෙන් වේදනා සංඥා සංඛාර කැමැති නාම ස්කන්ධ මනායතනයට උපකාරි විය. සළායතන පහළ විය.

මේ දේශනාව මනුෂ්‍ය පථයටත්, දෙව්ලොවටත් ගැලපේ. දෙව්ලොව මනුලොව සිටින සත්ත්වයන් ප්‍රථම ධ්‍යාන උපදවයි නම් ඒ වෙලාවට මේ **නාමරූප පච්චයා සළායතනය** පැහැදිලි කරගත හැකිය. ප්‍රථම ධ්‍යාන බ්‍රහ්මලොව සිටින සත්ත්වයෙක් නැවතත් ප්‍රථම ධ්‍යාන උපදවයි. ප්‍රථම ධ්‍යාන උපදවන විට දී බ්‍රහ්ම ලොව බ්‍රහ්මයන්ට සළායතන උපදී ද? නැද් ද? බ්‍රහ්ම ලොව ආයතන කීයක් පවතී ද? චක්ඛායතනය, සෝතායතනය පමණයි පිහිටා ඇත්තේ. ඝාණ, ජිව්හා, කායායතන නැත. භාව රූපත් නොමැත. එනම් ස්ත්‍රී, පුරුෂ භේදයක් නොමැත මනායතනය ඇත. ප්‍රථම ධ්‍යාන බඹලොව සිටින බ්‍රහ්මයෙක්, සත්ත්වයෙක් නැවත ප්‍රථම ධ්‍යාන උපදවන විටදී කර්මජ රූප ඉපදුන මුත් එහි දී සළායතන පහළ නොවේ. ආයතන 3 යි පහළ වන්නේ. ඒ ඒ භූමි අනුව මෙහි වෙනස්කම් පවති. **ඡට්ඨායතන පච්චයා ඵස්සො,** සළායතන පහළ වූවාට හෘදය වස්තුව ඇසුරු කරගෙන පහළ වූ මනායතනය පමණක් මනෝසම්ඵස්සයට උපකාරී වේ. **ඵස්ස පච්චයා වේදනා,** මේ ස්පර්ශය නිසා සෝමනස්ස වේදනාව පහළ වේ. සෝමනස්ස වේදනාව නිසා ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හැටගැනීම ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය. මේ ආකාරයෙන් නය

ක්‍රම 4 ට පැහැදිලි කරගත හැකිය. ඉහතින් පැහැදිලි කළේ පච්චය චතුෂ්කය යටතේ ඇති නය ක්‍රම 4 යි.

මේ ආකාරයෙන් හේතු චතුෂ්කය. **කුසල මූල පච්චයා සංඛාර** කුසල මූල හේතුකොට, ප්‍රථම ධ්‍යාන කුසල මූලයක් නිසා ප්‍රථම ධ්‍යාන කුසල චේතනාව පහළ වේ. එය කුසල මූල හේතුවයි.

සම්ප්‍රයුක්ත යටතේ **කුසල මූල පච්චයා සංඛාරෝ කුසල මූල සම්පයුත්තං** ප්‍රථම ධ්‍යාන කුසල මූලයන් නිසා ප්‍රථම ධ්‍යාන කුසල චේතනාව පහළ වේ. එනම් කුසල මූල ඔවුනොවුන්ගේ සම්ප්‍රයුක්තයි.

**කුසල මූල පච්චයා සංඛාරෝ සංඛාර පච්චයාපි කුසල මූලං කුසල මූල සංඛාරෝ** ඔවුනොවුන් එකට බැඳී අඤ්ඤමඤ්ඤ වශයෙන් උපදී. මෙය චතුෂ්ක 4 ට අදාළ වේ. මේ අනුව ක්‍රම 16 පැහැදිලි කරගත යුතුය.

භාවනා වඩන යෝගාවචරයා මේ කියන ධර්මයන් ඒ ඒ මොහොතට දකින්න පුළුවනි. මෙහි වෙනසක් නැතිව පැහැදිලිව දැකිය හැක.

මෙහි දී ප්‍රථම ධ්‍යානය ගැන පමණයි සාකච්ඡා කළේ. අභිධර්ම නය ක්‍රමයට ධ්‍යාන 5 ක් තිබේ. (සිත් වශයෙන් බලන විට දී) ද්‍විතිය ධ්‍යානය විතක්කය හැර විචාර, ප්‍රීති, සුඛ, ඒකග්‍රතා යෙදේ. තික්ඛ ප්‍රඥා, මන්ද ප්‍රඥා, භේදය මෙහි දී සමානය. පරිකම්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ චිත්තක්ෂණ අවස්ථාවලදී පහළ වන්නේ සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල්ය. ද්‍විතිය ධ්‍යාන චිත්තක්ෂණය විතක්කය හැරයි. නාම ධර්මවලදී විතක්කය හැර සිත සමග නාම ධර්ම 33 කි. ඒ අනුව ද්‍විතිය ධ්‍යාන කුසල මූලයන් නිසා ද්‍විතිය ධ්‍යාන කුසල චේතනාව, ද්‍විතිය ධ්‍යාන කුසල චේතනාව නිසා ද්‍විතිය ධ්‍යාන කුසල් සිත පහළ වේ. ද්‍විතිය ධ්‍යාන කුසල් සිත නිසා නාම ස්කන්ධය (විඤ්ඤාණ හැර) උපදී. ඇතැම් විට නාම උපදී. ඇතැම් විට නාමරූප උපදී. සළායතන, ඡට්ඨායතන උපදී. ඵස්ස වේදනා ආදී මුලින් පැහැදිලි කරගත් නය ක්‍රම අනුව පැහැදිලි කරගත යුතුයි. වෙනස පවතින්නේ එක නාම ධර්මයක අඩු වීමක් පමණි.

තුන්වන ධ්‍යානයේ දී විතක්ක විචාර හැර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යෙදේ. ප්‍රීති සුඛ ඒකාග්‍රතා අවස්ථාවේ දී ද පරිකර්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ චිත්තක්ෂණ පහළ වේ. ඒවා සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත කුසල් වේ. ධ්‍යාන කුසල් සිත පච්චය, හේතු සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ නය ක්‍රමවලට පැහැදිලි කරගත යුතුය.

හතරවන ධ්‍යාන සිත සුඛ ඒකග්‍රතා සහිත චතුත්ථ ධ්‍යානය. මේ ධ්‍යානයේ දීත් පරිකම්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ පහළ වේ. ඒ චිත්තක්ෂණ කාමාවචර සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්තයි. චතුත්ථ ධ්‍යාන සිත සෝමනස්ස සහගතයි. මෙහි දී විතක්ක, විචාර, ප්‍රීති නැත. ඒ අනුව නාම ධර්ම හඳුනාගෙන කුසල මූලය නිසා චතුත්ථ ධ්‍යාන කුසල චේතනාව පහළ විය. චතුත්ථ ධ්‍යාන කුසල චේතනාව නිසා කුසල් සිත පහළ විය. කුසල් සිත නිසා නාමරූප, නාම නිසා ඡට්ඨායතනය, නාමරූප නිසා සළායතනය, නාමරූප නිසා ඡට්ඨායතනය යනාදි ලෙස වෙනස් අර්ථ හඳුනාගත යුතුය.

පස්වන ධ්‍යානයේ දී සුඛ ඒකග්‍රතා, වෙනුවට එහිදී ලොකු වෙනසක් පවතී. උපෙක්ඛා ඒකග්‍රතා පංචම ධ්‍යාන උපදිනවිටත් පරිකම්ම, උපචාර අනුලෝම ගෝත්‍රභූ චිත්තක්ෂණ පහළ වේ. නමුත් ඒවා සෝමනස්ස සහගත නොවේ. ධ්‍යාන සිත උපෙක්ඛා සහගත නම් ධ්‍යානයට පාදක කුසල් සිත් උපෙක්ඛා සහගතයි. උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත සිත් පහළ වේ. මුල් චිත්තක්ෂණ 4 දී ධ්‍යාන චිත්තක්ෂණ උපෙක්ඛා සහගතයි. නාමධර්ම 30 සිතත් සමග 31 යි. **කුසල මූල පච්චයා සංඛාරො** ආදි ක්‍රමයට දේශනා කර යන විට **ඵස්ස පච්චයා වේදනාවේ** දී උපේක්ඛා වේදනාවයි. ශ්‍රද්ධාව, අධිමොක්ඛය භවය, ජාති, ජරා මරණ ඇතිවේ. මේ ලෙස රූපාවචර ධ්‍යාන 5 ට ම පටිච්ච සමුප්පාද අංගයන් වෙන වෙනම දකින්න වඩන්න අවබෝධ කරගන්න පුළුවනි.

බුදුරජාණන් වහන්සේ කෙටියෙන් මාතෘකා පද දේශනා ඉදිරිපත් කළ අතර ඒ තුළ විශාල අර්ථ සම්භාරයක් පවති. ඒ අර්ථ සම්භාරය වෙන වෙනම දකිමින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණයට අනුව වඩන විටදී, හේතු - ඵල ධර්මයන් වඩන විටදී පච්චය පරිග්‍රහ ඥානය

අපේ සන්තාන තුළ ඉතාමත් ප්‍රබල වේ. මෙය අඩිතාලමක් කරගෙන සම්මස්සන ඥාන ආදිය උපදවාගෙන සංඛාරුපෙක්ඛා ඥානය දක්වා සිත දියුණු කළ හැක. සංඛාරුපෙක්ඛා ඥානය දක්වා සිත දියුණු කරගත් ඒ යෝගාවචරයාගේ පාරමී පිරී තිබුණි නම් ඊළඟට තිබෙන අනුලෝම ගෝත්‍රභූ ඥානයන් උපදවාගෙන සෝවාන් මාර්ගඵල පිළිවෙලින් අමා මහ නිවන් සුව සාක්ෂාත් කරගන්න පුළුවන්කම ලැබේ.

මෙහි දී සාකච්ඡා කරන්නේ අරූපධ්‍යාන සම්බන්ධවයි.

## 03 අරූපාවචර කුසල්

**කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං - පෙ-** අකාසානඤ්චායතන ධ්‍යානය, විඤ්ඤානඤ්චායතන ධ්‍යානය, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය නේවසඤ්ඤා-නාසඤ්ඤායතන ධ්‍යානය යන චතුත්ථ අරූප ධ්‍යාන 4 ක් ඇත. මෙහි දී නය ක්‍රමය පැහැදිලි කරගත යුතුය. තික්ඛ ප්‍රඥා, මන්ද ප්‍රඥා ලෙස බෙදූ විටදී, ආකාස කසිනය හැර ඉතිරි කසිණ 9 ආකාසානඤ්චායතන සමාධිය උපදවා ගත හැකිය. පඨවි කසිණය අරමුණු කරගෙන පඨවි කසිණය තුළින් රූපාවචර චතුත්ථ ධ්‍යානය දක්වා උපදවා, පටිභාග නිමිත්ත උපකාරයෙන් ඒ චතුත්ථ ධ්‍යානයෙන් නැගිට ඒ පතුරුවාගත් පටිභාග නිමිත්ත තුළ අවකාශ දැකිය හැක. එවැනි තැනක සිත යොමුකර ගෙන **'අනන්තො ආකාසො'** යනුවෙන් වඩාගෙන යනවිට දී රූපය පළුදු කරගෙන අකාසානඤ්චායතන සමාධිය මතුවේ. මෙය ආකාසානඤ්චායතන ධ්‍යාන නමිනි. මෙය වඩන එක් මාර්ගයකි.

තව මාර්ගයක් නම්, චන්ද්‍ර මණ්ඩලය වටා වායෝ ධාතුවක් අවකාශයක් පවතී. ඒ අවකාශයෙන් සඳමඬලට අධාරයක් පවති. ඒ වාගේ සමාධිය උපදවාගත් පසු සමාධිය දරාගෙන සිටින අවකාශයක් පවති. මේ අවකාශය අරමුණු කරගත් විට අකාසානඤ්චායතන සමාධිය උපදවා ගන්න පුළුවනි. මේ ක්‍රම 2 න් ම පුළුවනි.

මේ ආකාසානඤ්චායතන සමාධිය උපදවා ගත් පසු පරිකම්ම උපචාර අනුලෝම, වෝදාන දක්වා සිත ක්‍රියා කරයි. ඊට පසු ආකාසානඤ්චායතන

චතුත්ථ ධ්‍යාන චිත්තක්ෂණ පහළ වේ. පරිකම්ම, උපචාර, අනුලෝම, වෝදන මේ ධ්‍යාන චිත්තක්ෂණයන් උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුසල්ය. ආකාසානඤ්චායතනය ධ්‍යානය සිත තුළ උපේක්ඛා සහ ඒකග්‍රතා යෙදේ. මේ ආකාසානඤ්චායතන ධ්‍යාන සිතේ පටිච්චසමුප්පාද අංග බැලිය යුතුය.

**කුසල මූල පච්චයා සංඛාරො,** ආකාසානඤ්චායතන කුසල් සිතේ පහළවන අලෝභ, අදෝස, අමෝහ මේ කුසල මුල් 3 නිසා ආකාසානඤ්චායතන කුසල චේතනාව පහළ වේ. ආකාසානඤ්චායතන කුසල චේතනාව නිසා ආකාසානඤ්චායතන කුසල් සිත පහළ වේ.

ආකාසානඤ්චායතන කුසල් සිත නිසා සහජාත වශයෙන් වේදනා, සංඥා, සංඛාර කියන ආකාසානඤ්චායතන නාමස්කන්ධ පහළ වේ. මේ නාමස්කන්ධ නිසා ආකාසානඤ්චායතන මනායතනය පහළ වේ. එනම්, ජට්ඨායතනය නිසා මනෝසම්ඵස්සය, ඵස්ස නිසා වේදනා, උපේක්ඛා වේදනාවයි. උපෙක්ඛා වේදනාව නිසා ප්‍රසාදය, ප්‍රසාදය නිසා අධිමෝක්ඛය, අධිමෝක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම. උත්පාදාක්ෂණය - ජාතිය, ඨිතික්ෂණය - ජරාව, භංගක්ෂණය - මරණය වේ.

මේ අනුව දෙවැනි නය ක්‍රමයේ වෙනස **නාම පච්චයා ඵස්සො,** වේදනා සංඥා, සංඛාර විඤ්ඤාණ නැමැති අකාසානඤ්චායතන නාමස්කන්ධ නිසා ආකාසානඤ්චායතන මනෝසම්ඵස්සය පහළ වේ. ඵස්ස පච්චයා වේදනා ආදී ක්‍රමයටම යෙදේ.

ආකාසානඤ්චායතන බඹලොව සිටින සත්ත්වයෙක් ආකාසානඤ්චායතන ධ්‍යාන කුසල් සිත නැවත උපදවන අවස්ථාවේ ඒ සත්ත්වයන්ගේ **නාම පච්චයා ජට්ඨායතනං, නාම පච්චයා ඵස්ස** පමණයි පහළ වන්නේ. රූප නැති බැවිනි. ඉතිරි නය ක්‍රම 2 මෙහි දී ගැලපිය නොහැක. ඒ ඒ භූමිය අනුව වෙනස් වේ. බුදුරජාණන් වහන්සේ පොදුවේ නය ක්‍රම 4 ක් දේශනා කරන ලද හෙයින් ඒවා හැම සත්වයෙක් වෙනුවෙන් වෙන වෙනම බැලිය හැක. මෙහි තිබෙන වැදගත්කම මෙයයි. මනුලොව, දෙව්ලොව, සහ බ්‍රහ්ම ලෝකයන්ට මේ නය ක්‍රම 4 ම වැඩිමට පුළුවනි. එහි දී සළායතන වෙනසක් පවතී. අරූපි තලයේ දී නාම පමණයි. රූප නොමැති හෙයිනි.

තුන්වන නය ක්‍රමයේ වෙනස **විඤ්ඤාණ පච්චයා නාමරූපං** වේ. විඤ්ඤාණය නිසා නාමරූප උපදී. ආකාසානඤ්චායතන කුසල් සිත නිසා සහජාත වශයෙන් කුසල චිත්තජ රූප නාම ස්කන්ධ, නාමරූප සහජාත වශයෙන් පහළ වේ. **නාමරූප පච්චයා ඡට්ඨායතනං** පුරෙජාත හෘදය වස්තු රූපයත් සහජාත නාම ස්කන්ධයත් උපකාරි වී මනායතනය පහළ වේ. මෙලෙස වෙනස අවබෝධ කරගත යුතුය. **විඤ්ඤාණ පච්චයා නාමරූප, නාමරූප පච්චයා සළායතනං,** විඤ්ඤාණය නිසා සහජාත වශයෙන් නාමරූප පහළ වේ. **නාමරූප පච්චයා සළායතනං,** ආයතනවල කලාපීය මහා භූතයන් නිසා ආයතන උපදී. සහජාත සහ පුරෙජාත උපකාරි වේ. මෙලෙස නාමරූප, නිසා සළායතන පහළ විය. **ඡට්ඨායතන පච්චයා ඵස්සො,** ධ්‍යාන සිත නිසා ඵස්සය උපදී. **ඵස්ස පච්චයා වෙදනා** වේදනාව උපේක්ඛා වේදනාව, වේදනාව නිසා ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව නිසා අධිමෝක්ඛය පහළ වේ. මෙහි දී ශ්‍රද්ධාව ගැන සැලකීමේ දී උපේක්ඛා ස්වභාවය තුළ ශ්‍රද්ධාව තිබේ ද? නැද්ද? යන්න ගැටළුවකි. මෙහිදී ශ්‍රද්ධාව පවතී. ශ්‍රද්ධාව සම්ප්‍රසාදන ආදී කොටස්වලට බෙදාගෙන යන විටදී මෙය ප්‍රඥාව සමඟ ලැබූ ශ්‍රද්ධාවකි. ඉපිලී යන ශ්‍රද්ධාවක් නොවේ. යම්කිසි සතුටක් ඇතිවන විට එතැන ඉපිලෙන ශ්‍රද්ධාවක් පවතී. ඒ ඉපිලෙන ශ්‍රද්ධාව තුළින් ලෝභයක් මතු විය හැකිය. පසුවට උපෙක්ඛාව සමග මතුවන ශ්‍රද්ධාවේ දී ලෝභයක් ඇති නොවේ. නමුත් ඒ ශ්‍රද්ධාව පළුදු වුවහොත් ගැටීමක් ඇතිවිය හැකිය. ද්වේෂයක් ඇති වේ. කුසල් සිතක් සෝමනස්ස වන විටදී ඉපිලි යන විට ශ්‍රද්ධාව බලවත් වේ. එතැන දී තණ්හාව උපාදානය ඇතිවේ. යම් කුසලයක් කළ පසු පුදුමාකාර සතුටක් ඇතිවේ. ඒ සතුටු ඇතිවීම යනු තණ්හාව උපාදානය ග්‍රහණය කරගෙන හමාරය. සාමාන්‍යයෙන් උපේක්ඛා සහගතව සතුට නොමැතිව කටයුතු කරයි. ශ්‍රද්ධාව තිබේ නමුත් ඒ වෙලාවේ දී ඉක්මනින් සිත ගැටෙන්න පුළුවනි. ද්වේශය මතුවිය හැකිය. උපේක්ඛාව තුළින් ගැටීම ඇතිවේ. උදාඃ- සතුටෙන් තොරව උපේක්ඛාව තුළින් විඳගෙන සිටින විට එම කටයුත්තට බාධාවන වචනයක් ඇසීමෙන් තරහ උපදී. සතුට තිබිණි නම් එවැනි දෙයක් ඇසුණමුත් අවධානය යොමු නොවේ.

උපේක්ඛාව මතුවන විට බොහෝ දුරට ගැටීම මතුවිය හැකිය. සෝමනස්ස නිසා තණ්හා, උපාදානය ඇතිවේ. නමුත් උපෙක්ඛාවේ දී තණ්හා උපාදානය ඇති වේ. නැතුව නොවේ. ද්වේශයට වඩාත් බරය. ධ්‍යාන කුසල්වලදී මෙය සිදු නොවේ. ධ්‍යාන කුසල් යනු ප්‍රණීත අවස්ථාවන්ය. ඒවා උපේක්ඛා සහගත වූවාට මේ ස්වභාවය මතු නොවේ. කාමාවචර භූමියේ දී මේ ස්වභාවය මතුවේ. ආකාසානඤ්චායතන ධ්‍යාන කුසලය පච්චය චතුෂ්කය හේතු, සම්ප්‍රයක්ත, අඤ්ඤමඤ්ඤ ආකාරවලට වෙන වෙනම පැහැදිලි කරගත යුතුය.

මෙලෙසම විඤ්ඤානඤ්චායතනය, ආකිඤ්ඤඤ්චායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය මේ කුසල් මේ නය ක්‍රමයට ම පැහැදිලි කරගත යුතුය. ධ්‍යාන උපදවාගන්නා මාර්ගයන් පමණයි වෙනස වන්නේ. නාම ධර්ම, පටිච්චසමුප්පාදය, හේතු ඵල සමානයි. අරමුණ පමණයි වෙනස් වන්නේ. මේ ආකාරයෙන් අරූපාවචර කුසල් පැහැදිලි කරගැනීමට පුළුවනි.

කාමාවචර, රූපාවචර, අරූපාවචර හැම කුසලයක් අවසානයේම '**එවමෙ තසස කෙවලසස දුකඛකඣසස සමුදයා හොති**' ලෙස සඳහන් වේ. මෙසේ මේ සියලුම දේවල් දුක්ඛස්කන්ධයාගේ හටගැනීම සමුදය නම් වේ. දුක්ඛස්කන්ධයන් හටගැනීම යොදන්නේ ඇයි? සාමාන්‍යයෙන් අපි දුක්ඛයක් ලෙස සලකන්නේ යම්කිසි පීඩාවක් මානසික වේදනාවක්. එවැනි අවස්ථාවක දී දුක්ඛ ලෙස පවසයි. සිතට සිතන දේ ලැබෙන විට, සිතන සිතන දේ කිරීමට හැකිවන විට එය සැපක් ලෙස සලකයි. මෙය දුක සැප ලෙස අපි බෙදාගෙන සිටිමු. සාමාන්‍ය ලෝකයා දකින්නේ මේ ලෙසයි. අභිධර්ම නය ක්‍රමයේ දී සියලුම දේවල් දුක ලෙස හඳුන්වයි. ලෝකෝත්තර භූමිය හැර සියලුම කුසල්, කාමාවචර, රූපාවචර, අරූපාවචර යන හැම කුසලයක්ම දුකක් ලෙස ගැනේ. උදාඃ- පහනක් දැල්වේ. මේ පහනට තෙල් දමන්න දමන්න එය දැල්වේ. දැල්වුවත් දුකයි. නිවුණත් දුකයි. තෙල් දමන්න පහන පත්තු වෙනවා යනු කුසල් කරන්න කරන්න සසරේ ඇවිදියි. කාමාවචර කුසල් රූපාවචර ධ්‍යාන කුසල් අරූපාවචර ධ්‍යාන කුසල් තුළින් ඒ ඒ බඹලොව ගොස් කාලයක්

සැප විඳීමට හැක. දැල්වෙන පහන නිවුණහොත් කුසල් නැතිනම් අපායට වැටේ. අපායේ නොයෙක් දුක් විඳිමින් සිටී. නිවන් දුටු පසු නිවෙන පහන වෙනස්ය. එහි දී පහන් දැල්ල නිවුණු පසු එය ගිය දිහා සෙවිය නොහැක. කපුරු පෙත්තක් දැල්වූ විට කිසිවක් ඉතිරි නොවේ. කෙනෙක් පිරිනිවිනා යනු කිසිම දෙයක් ඉතිරු වී නැත. පහන් දැල්ල නිවුනාට එහි අපද්‍රව්‍ය ඉතිරි වී පවතී. එනම් ජීවිතය අඳුරු වුනා හා සමානයි. නැවත පහන් තිරය වෙනස් කළ විට, තෙල් දැමූ විට අලුත් පහනක් සේ දැල්වේ.

කෙනෙක් පින් අඩු වී අපායට පැමිණියා යනු ජීවිතය අඳුරුයි. නමුත් එයින් මිදී පැමිණ, පහනට අලුතින් තෙල් දමා නැවුම් පහනක් සේ ඇවිලේ ද, එසේම නැවත ජීවිතය සැපවත් වේ. '**උක්ඛිත්ත පුඤ්ඤ තෙජෙන කාමරූප ගතිංගතා**' අපිව අපි කරන පින් බලයෙන් කාම ලෝකයෙන් රූප ලෝකයට, රූප ලෝකයෙන් අරූප ලෝකයට ඔසවා තබයි. '**භවග්ගතම්පි සම්පත්තා පුනා ගච්ඡන්ති දුග්ගතිං**' මේ භවයේ කෙළවරට ගොස් නැවත දුක් අගට පැමිණේ. '**නත්ථි කොචි භවො නිච්චො' ඉතිවුත්තං මහෙසිනා**' මේ කිසිම භවයක් ස්ථිර නොවේ. අස්ථිරයි. පින තිබෙන කල් ඉහළට යයි. පින ඉවරවෙනවිට පහළට වැටේ. එබැවින් කොපමණ ධ්‍යාන උපදවා ගත්තත් රූපාවචර, අරූපාවචර කොපමණ කුසල් කලත් අපි ඒ ඒ භවයට ගොස් උපදී. සැප විඳී. නමුත් කවදාහරි පහළට ගමන් කරන්න වේ. එබැවින් මේ සියලු දෙයක් ම දුක ඉපදීමට හේතුවක් වන බවයි. ලෝකෝත්තර කුසල් අවස්ථවේ දී මේ ලෙස සඳහන් නොවේ.

## 04 ලෝකෝත්තර කුසල්

ලෝකෝත්තර කුසල් 4ක් පවති. සෝතාපත්ති මාර්ග, සකෘදාගාමි මාර්ග, අනාගාමී මාර්ග, අර්හත් මාර්ග මේ කියන ලෝකෝත්තර කුසල් සිත් 4 ධ්‍යානය ක්‍රමයට අනුව තේරුම් ගත යුතුය. කෙනෙක් සෝවාන් මාර්ගයට පත්වෙන විට ධ්‍යානයකින් තොරව මාර්ගයට පත් නොවේ. අනිවාර්යෙන්ම කෙනෙක් සෝවාන් මාර්ගයට පත්වෙනවා යනු අඩුම තරමේ ප්‍රථම ධ්‍යානය තත්ත්වයටවත් පත්වේ. සමථ භාවනා නොවඩා

විදර්ශනා වඩන විටදී ඒ යෝගාවචරයාට ධ්‍යාන නැත. නමුත් ඒ යෝගාවචරයා සෝවාන් මාර්ගයට පත් වන්නේ ප්‍රථම ධ්‍යාන සිතිනි. කොපමණ විදර්ශනා වැඩුවත් සමථය වඩන්නේම නැතිවුවත් ඒ තැනැත්තා සෝවාන් මාර්ගයට පත්වන්නේ ප්‍රථම ධ්‍යානයෙනි. කිසිදු ධ්‍යානයකින් තොරව මාර්ගඵලවලට පත්වීමට නොහැකිය. පංචම නය ක්‍රමයට අනුව සෝවාන් මාර්ගය ප්‍රථම, ද්‍රුතිය, තතිය, චතුත්ථ, පංචම යන ධ්‍යානයකින් පත්විය හැක. චතුත්ථ, නය ක්‍රමයට සෝවාන් මාර්ගය ප්‍රථම, ද්‍රුතිය, තතිය, චතුත්ථ ධ්‍යානයකින් පත්විය හැකිය. සෝවාන් මාර්ග සිත තුළට ගොස් ඒ සිතේ පටිච්ච සමුප්පාද අංගයන් බැලිය යුතුයි. ධ්‍යාන උපදවාගත් විට රූපාවචර ධ්‍යානවල, අරූපාවචර ධ්‍යානවල පටිච්ච සමුප්පාද අංග බැලිය හැක. ධ්‍යාන උපදවා, නොමැති නම් කුසල් සිත්වල පටිච්ච සමුප්පාද අංග බැලිය හැකිය. භාවනා කර නාමරූප හඳුනාගැනීමට නොහැකි නම්, සිත්හි දරාගගැනීම පමණයි කළ හැක්කේ. සෝවාන් මාර්ග කුසලයෙහි පටිච්ච සමුප්පාද අංගයන් බැලීමේ දී ඒ තත්ත්වයට පත්විය යුතුය. ඒ තත්ත්වයට පත් නොවී බැලිය නොහැක. නමුත් කටපාඩම් කරගෙන මතක තබාගෙන හඳුනාගත යුතුය. ඒ ඒ තැන්වලට නොගිහින් ධර්මයේ ඒ කරුණු බැලිය නොහැක. උදාඃ තැනකට නොගිහින් ඒ ස්ථානයේ හොඳ නරක කිව නොහැක. ඒ වාගේම පුද්ගලයෙක් දුටු පමණින් හොඳ නරක තීරණය කළ නොහැක. පුද්ගලයා ඇසුරු කළ යුතුයි. එයින් ඔහු හොඳ ද, නරක ද, සිල්වත් ද, ගුණවත් ද, යන්න ඇසුරින් පුද්ගලයෙක් ගැන තේරුම් ගත හැකිය. ඇසූ පමණින් දුටු පමණින් තීරණය කළ නොහැක. ඇසුරු කිරීමෙන් තේරුම් ගතහැක්කා සේ මේ ධර්මය තේරුම් ගැනීමටත් එය ඇසුරු කළ යුතුය. ධ්‍යාන සිතක් ඇසුරු කළ අයෙකුටයි ධ්‍යාන සිත වැටහෙන්නේ. ධ්‍යානයක් ඇසුරු නොකර ඒ ධ්‍යානය කෙසේ ද යන්න කිව නොහැකිය. සෝවාන් මාර්ග ආදියෙහි ස්වභාවය තේරුම් ගැනීමට ඒ තත්ත්වයට පත්විය යුතුය. ඇසුරු කළ යුතුයි.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ දී මිතුරන් දෙදෙනෙක් පැවිදි වූහ. එක් ස්වාමින් වහන්සේ නමක් ධර්මය ඉගෙනීමට අවශ්‍යය

බවත්, අනෙක් ස්වාමීන් වහන්සේට භාවනා දියුණු කර ගැනීමට අවශ්‍ය බවත් බුදුරජාණන් වහන්සේට දන් වූහ. තමන්ගේ මාර්ගයේ ගමන් කිරීම සඳහා දෙදෙනාටම අවසර දුන් සේක. මෙසේ කාලයක් ගත වූ පසු පරියප්ත දෙසට යොමු වූ ස්වාමින් වහන්සේ ත්‍රිපිටකය හොඳින් ඉගෙනත් අතර, කටපාඩමින් දරාගෙන කරුණු කාරණා හොඳින් විග්‍රහ කිරීමට සමත්විය. ත්‍රිපිටකය පිළිබඳ හසල බුද්ධියක් තිබුණ මුත්, මාර්ගඵලාදිය ලබා නොමැත.

භාවනා මාර්ගයට යොමු වූ ස්වාමින් වහන්සේ රහත් විය. ඒ නමුත් ත්‍රිපිටකය ගැන අවබෝධයක් නොමැත. නිවන් දුටු හෙයින් මාර්ගඵල පිළිබඳ අවබෝධයක් තිබුණි. දිනක් පරියප්ති ස්වාමින් වහන්සේට තමාගේ පැවිදි සහෝදරයා බැලිය යුතුයයි අදහසක් පහළ විය. තමා ගමන් කළ මාර්ගය ද, මිතුරා ගමන් කළ මාර්ගය ද නිවැරදි. ඒ පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කිරීමේ වැරදි අදහසින් සිටින විට, බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේගේ සිත දුටු සේක. එබැවින් මගේ බුද්ධ පුත්‍රයා ආරක්ෂා කළ යුතු යැයි සිතූ බුදුපියාණන් වහන්සේ රහතන් වහන්සේ වැඩ සිටි දිශාවට වැඩම කළ සේක. මෙහිදී බුද්ධපුත්‍රයා යයි ඇමතුවේ රහතන් වහන්සේටයි. ත්‍රිපිටකධාරී ස්වාමින් වහන්සේට නොවේ. බුදුපියාණන් වහන්සේ වැඩම කළ හෙයින් ත්‍රිපිටකධාරී ස්වාමින් වහන්සේට ප්‍රශ්න විමසීමට නොහැකි විය. බුදුපියාණන් වහන්සේ දෙපැත්තෙන්ම ප්‍රශ්න විමසා සිටි අතර, ත්‍රිපිටක සම්බන්ධ කරුණක් ඇසීමේදී ත්‍රිපිටකධර ස්වාමින් වහන්සේ බොහොම හොඳින් අර්ථ විග්‍රහ කරන නමුත් ධ්‍යාන අදී කුසල මාර්ග ඵලයක් ගැන විමසන විට පිළිතුරු දීමට නොහැකිවිය. ඒ සම්බන්ධව අවබෝධයක් නොමැති හෙයිනි. පොතෙහි කරුණු දන්නාමුත් අවබෝධයක් නැති නිසා නියම ලෙස විසඳීමට නොහැකිය. නමුත් බුදුපියාණන් වහන්සේ රහතන් වහන්සේගෙන් මාර්ගඵල විමසන අතර, රහතන් වහන්සේ හොඳින් පැහැදිලි කළ සේක. ඒ සම්බන්ධව අවබෝධයක් ඒ තත්ත්වයට පත් වී ඇති හෙයිනි. මෙයින් තේරුම්ගත යුතු කරුණ නම් අපි ඒ තත්ත්වයට පත්නොවී අපිට යමක් කීමට නොහැකිය.

අද කාලයේ බොහෝ විද්වතුන් අභිධර්මය ප්‍රතික්ෂේප කරන අතර, ඇතැම් අය අභිධර්මයට සලකන බවකුත් තිබේ. මෙය බුද්ධ දේශනාවක් නොවේ යැයි පවසයි. එවැනි වචනයක් පිට කිරීමට ඔවුන් බුදුපියාණන්ට වඩා උසස් තත්ත්වයන්ට පත්විය යුතුය. බුදුපියාණන් වහන්සේ කළ ධර්මය තුළ වැරදි නිවැරදි කිරීමට තරම් සුදුසු කිසිවෙකු දෙවියන් මනුෂ්‍යයන් බ්‍රහ්මයන් අතර නොමැත. ඒ නිසා බුදුන් තුළ විශාරදත්වයක් පවතී. මෙය විශාරද ඥානවලදී පැහැදිලි කරනු ලැබේ. කෙනෙක් බුදුපියාණන් වහන්සේ දේශනා කළ දෙයක් නොවේ යයි පවසයි නම් ඔහු එතරම් විශාරද කෙනෙක් විය යුතුය. ධර්මයේ ඒ ඒ තත්ත්වයන්ට පත්නොවී අපට ඒවා පිළිබඳව පැවසිය නොහැක. මහ මුහුද ගැඹුරු ද පළල් ද කියා මතුපිටින් බලා කිසිවෙකුට කිව නොහැකිය. මහ මුහුද ඉතා භයානක දෙයක් ලෙස මතු පිටින් සිතයි. නමුත් මහ මුහුද තුළට ගිය අයෙක් මහ මුහුදට බිය වන්නේ නැත. ඔහු මහ මුහුදේ වටිනාකම, ඇතුළට යන්න එහි සම්පත් තිබෙන බව දනී. ත්‍රිපිටකය ද මහා සාගරයකි. බාහිරින් ත්‍රිපිටකය දිහා බලා මෙය ප්‍රතික්ෂේප කරයි. ත්‍රිපිටකයට බැසගත් අයෙක්, අභිධර්මයට බැසගත් අයෙක් සිටී නම් කවදාවත් අභිධර්මය වැරදි යැයි නොකියයි. ධර්මය ප්‍රතික්ෂේප නොකරයි. මේ අනුව ඒ තත්ත්වයට පත් නොවී කිසිවක් කිව නොහැකි බව තේරුම් ගත යුතුය.

මෙහිදී ලෝකොත්තර ධ්‍යානවලදී, ලෝකෝත්තර තත්ත්වයට පත්වී නොමැති හෙයින් බුද්ධ දේශනාව පමණක් අනුගමනය කරනු ලැබේ. බුද්ධ දේශනාවට අනුව ලෝකෝත්තර ධ්‍යාන පැහැදිලි කර ගත යුතුය.

**ලොකොත්තරං ඣානං භාවෙති නියානිකං අපචයගාමිං -පෙ-**

යමෙක් ලෝකෝත්තර ප්‍රථම ධ්‍යානයට සමවදී. එහිදී සක්කායදිට්ඨි ආදි දිට්ඨි සියල්ලක් බැහැර කරගෙන සෝවාන් මාර්ගයට පත්වේ. මේ මාර්ගයට පත්වෙන විටදී චිත්ත වීථිය පුද්ගල භේදය අනුව මන්ද ප්‍රඥා, තික්ඛ ප්‍රඥා ලෙස කොටස් 2 කට බෙදාගත යුතුය. මන්ද ප්‍රඥයාට පරිකම්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ චිත්තක්ෂණ 4 ම පහළ වේ. පරිකම්ම හැර උපචාර අනුලෝම ගෝත්‍රභූ චිත්තක්ෂණ 3 තීක්ෂණ ප්‍රඥාව ඇත්තාට පහළ වේ. පරිකම්ම උපචාර අනුලෝම මේ චිත්තක්ෂණ 3 ට අරමුණ

වන්නේ සංඛාර ධර්මයන්ය. මේ සංඛාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස වඩන විටදී ඒවායෙහි එක් ස්වභාවයක් මෙහිදී අරමුණ වේ. එම සංඛාර ධර්ම නිසා කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් පහළ වේ. ප්‍රථම ධ්‍යානයට අදාළ සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත කුසල් සිත උපදී. ගෝත්‍රභූ සිතින් මේ පෘථග්ජන ගෝත්‍රය කඩා දමා ආර්ය භූමියට පත්කරයි. මේ කාම ලෝකය, රූප ලෝකය, අරූප ලෝකයන් කඩා වෙන්කොට අපව ලෝකෝත්තර තත්ත්වයට, ආර්ය තත්ත්වයට, එම භූමියට පත්කෙරේ. මේ ගෝත්‍රභූ සිත මහා බලවත්ය. මේ ගෝත්‍රභූ සිතට පත්වන විටදී මේ සංඛාර ධර්මයන්හි උපකාරය ලැබේ. නමුත් නිවන් අරමුණ කරයි. නිවන අරමුණු කරන නිසා පෘථග්ජන ගෝත්‍රය බිඳේ. ප්‍රථම ධ්‍යානයේත් ගෝත්‍රභූ සිතක් පවතී. ධ්‍යාන සිත්වල මේ ගෝත්‍රභූ චිත්තක්ෂණය පවති. නමුත් ඒ ගෝත්‍රභූ චිත්තක්ෂණවලට නිවන අරමුණු වෙන්නේ නැත. නිවන අරමුණු වෙන්නේ නැති හෙයින් මාර්ගඵල ලැබෙන්නේ නැත. මේ චිත්තවීථියේ ගෝත්‍රභූ චිත්තක්ෂණයේ දී නිවන අරමුණු කරයි. නිවන අරමුණු කළත් එතැන පහළ වන්නේ කාමාවචර මහා බලසම්පන්න ඥාන සම්ප්‍රයුක්ත කුසලයයි. නමුත් ඒ කුසලය උපකාරී වී සෝවාන් මාර්ග චිත්තක්ෂණය පහළ වේ. මාර්ග චිත්තක්ෂණය නිවන අරමුණු කරමින් පහළ විය. ඒ වේලාවේ දී සක්කායදිට්ඨි, සීලබ්බත පරාමාස, විචිකිච්ඡා මේ සංයෝජන 3 ප්‍රහීණය වේ. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත්යි. විචිකිච්ඡා සිතයි යන සිත් 5 සම්පූර්ණයෙන්ම ඡේදනය වී යයි. එවිට සෝවාන්මාර්ග චිත්තක්ෂණය පහළ වේ. මේ මාර්ග චිත්තක්ෂණයෙ දී පටිච්ච සමුප්පාද අංග බැලිය යුතුයි.

**කුසල මූල පච්චයා සංඛාරො,** ඒ සෝවාන් මාර්ග චිත්තක්ෂණයේ පහළ වූ අලෝභ, අදෝස, අමෝහ කුසල මූලයන් නිසා සෝවාන් මාර්ග චේතනාව පහළ වේ. ඒ සෝවාන් මාර්ග චේතනාව නිසා සෝවාන් මාර්ග සිත පහළ වේ. සෝවාන් මාර්ග සිත නිසා වේතනා, සංඥා, සංඛාර සෝවාන් මාර්ග නාම ස්කන්ධ පහළ වේ. සෝවාන් මාර්ග නාම ස්කන්ධ නිසා මනායතනය පහළ වේ. මනායතනය නිසා ඵස්සය පහළ වේ. ඵස්ස නිසා සෝමනස්ස වේදනාව පහළ වේ. සෝමනස්ස වේදනාව

නිසා ප්‍රසාදය පහළ වේ. අචල ප්‍රසාදය යනු කවදාවත් බිඳෙන්නැති ප්‍රසාදයයි. අචල ප්‍රසාදය නිසා අධිමෝක්ඛය පහළ වේ. අරමුණේ බැස ගැනීම, අධිමෝක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ උත්පත්තිය - උප්පාද, ඨිති, භංග, ජාති, ජරා, මරණ පහළ වේ. සෝවාන් මාර්ග චිත්තක්ෂණයේ මේ අකාරයෙන් පටිච්ච සමුප්පාද අංගයන් බැලිය හැකිය.

පච්චය යටතේ අනෙක් නය ක්‍රම 3 හි නම් **නාම පච්චයා ඵස්සො** මේ වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ නාමස්කන්ධ 4 නිසා ඵස්සය පහළ වේ.

තුන්වෙනි නය ක්‍රමයේ වෙනස, **විඤ්ඤාණ පච්චයා නාමරූපං** සෝවාන් මාර්ග සිත නිසා (විඤ්ඤාණය නිසා) නාමරූප පහළ වේ. නාමරූප යනු චිත්තජ රූපයි, නාමස්කන්ධයි **නාමරූප පච්චයා ඡට්ඨායතනය** පුරෙජාත හෘදය වස්තුවයි. සහජාත නාමය එකතු වී මනායතනය පහළ වේ.

හතරවෙනි නය ක්‍රමයේ වෙනස, **විඤ්ඤාණ පච්චයා නාමරූපං.** මෙහි ප්‍රධාන වශයෙන් චිත්තජ රූප සලකණු ලැබේ. **නාමරූප පච්චයා සළායතනං.** පුරෙජාත කර්මජ මහා භූතයන් නිසා උපදින ප්‍රසාද රූප අරමුණු කර ගත් විට සළායතනය. නමුත් **ඡට්ඨායතන පච්චයා ඵස්සො** මනායතනය නිසා ඵස්සය. මේ ආකාරයෙන් පච්චය චතුෂ්කය, හේතු චතුෂ්කය, සම්ප්‍රයුත්ත, අඤ්ඤමඤ්ඤ චතුෂ්ක ක්‍රම 4 ට මේ ස්වභාවයෙන් දැකිය හැක. නමුත් එක් එක් භූමිවලදී මේවා වෙනස් වන ආකාරය ද තේරුම් ගත යුතුය.

අරූප තලයේ කෙනෙකුට නිවන් දැකිය හැකිද? අරූප තලයේ එනම් ආකාසානඤ්චායතනාදී බඹලොවක පෘථග්ජනව අවම වශයෙන් සෝවාන් මාර්ග ඵලවලට පත්නොවී එහි උපදී නම් නිවන් දැකිය නොහැකිය. ආර්ය භූමියට, ආර්ය තත්ත්වයට පත් නොවී අනාර්යව කෙනෙක් අරූපී තලයේ ඉපදුණි නම් කවදාවත් ආර්ය භූමියට එහිදී පත් නොවේ. එම සත්වයා පහළට පැමිණිය යුතුය. නමුත් අවම වශයෙන් සෝවාන් තත්ත්වයට පත්වෙලා අරූපී තලයට ගියා නම් එයා කවදාවත් පහළට එන්නේ නැත. එතැනින් නිවන් දකී. මේ ආකාරයෙන් නිවන

තේරුම් ගත යුතුය. මේ සෝවාන් මාර්ග සිත ධ්‍යානවලට අනුරූපව වෙනස් වේ.

ප්‍රථම ධ්‍යාන නම් ධ්‍යාන අංග 5 අනුව නාම ධර්ම වෙනස් වේ. ප්‍රථම ධ්‍යාන සිතේ නාම ධර්ම සෝවාන් මාර්ග වන විටදී සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව මාර්ගාංග බවට පත් වේ. මාර්ගාංග 8 දෙනා ම එකවර උපදී. එනම් සිතත් සමඟ 37 කි. (නාම ධර්ම 33 සම්මා වාචා, සම්මා කම්මන්ත කම්මන්ත ආජීව) කරුණා, මුදිතා අත් හරියි. මෙය ප්‍රථම ධ්‍යානයට අනුවයි. දුතිය ධ්‍යානයට අනුව සිත සමග 36 තතිය ධ්‍යානයට අනුව 35, චතුත්ථ ධ්‍යානයට අනුව 34, පංචම ධ්‍යානයට 34 යි.

මේ ආකාරයට සෝවාන් මාර්ග අවස්ථාවලදී ධ්‍යාන අංග හඳුනාගෙන මේ චතුෂ්ක නය ක්‍රමයට පැහැදිලි කරගත හැකිය.

සෝවාන් මාර්ගය මෙලෙස හඳුනාගත් ගත් නමුත් සෝවාන් ඵලය මෙහි දී ගත නොහැකිය. එය විපාක සිත්වලට අයිති වේ. ඒවා අව්‍යාකෘත ගණයේ දී විස්තර කෙරේ. සෝවාන් මාර්ග සිතින් පසු සකෘදාගාමී මාර්ග සිතයි. සකෘදාගාමී මාර්ග සිතත් මේ ආකාරයෙන් වේ. ගෝත්‍රභූ සිතක් නොමැති වෙනස පවති. පෘථග්ජන ගෝත්‍රය කඩා නිම වී ඇති හෙයිනි. ගෝත්‍රභූ සිත වෙනුවට වෝදාන සිත පහළ වේ. ඉතාම පිරිසිදු ප්‍රභාෂ්වර සිතකි. පරිකම්ම උපචාර අනුලෝම වෝදාන සකෘදාගාමි මාර්ග චිත්තක්ෂණය පහළ වේ. මේ මාර්ග චිත්තක්ෂණයත් ප්‍රථම ධ්‍යානයට අනුව, දුතිය, තතිය, චතුත්ථ, පංච ධ්‍යානයට අනුව පංචක නය ක්‍රමයෙන් චතුත්ථ නය ක්‍රමයට අනුව පැහැදිලි කරගත යුතුයි.

අනාගාමි මාර්ග, මෙහි දී ද ගෝත්‍රභූ සිත වෙනුවට වෝදාන සිත යෙදෙයි. ඒ අනුව පරිකම්ම, උපචාර, අනුලෝම, වෝදාන අනාගාමි මාර්ග ඊළඟට අරහත් මාර්ග සිත පහළ වේ. මෙහි දී ද තික්ඛ ප්‍රඥා, මන්ද ප්‍රඥා භේදය ද හඳුනාගත යුතුය. ඇතැම් අයට පරිකම්ම යෙදේ. ඇතැම් අයට පරිකම්ම නොයෙදේ. ඇතැම් අය ප්‍රථම ධ්‍යානයෙන් සමවැදුනා නම් පරිකම්ම උපචාර, අනුලෝම, ගෝත්‍රභූ මේවා සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුත්ත කාමාවචර කුසල්ය. දුතියා ධ්‍යානයෙන් කාමාවචර

සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්තයි. තතියා ධ්‍යානයෙන් සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්තයි. චතුත්ථ ධ්‍යානයෙන් සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්තයි. පංචම ධ්‍යානයෙන් පත්වේ නම්, උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්තයි. මෙලෙස චිත්තක්ෂණ හඳුනාගෙන ඒ ඒ චිත්තක්ෂණවලට අනුව ක්‍රියා කරන පටිච්චසමුප්පාද අංගයන් ධර්මයන් දැකිය යුතුය. මෙහි දී අවසානයට දේශනා වනුයේ **'එවමෙතෙසං ධම්මානං සමුදයො හොති'** ඒ ඒ ධර්මයන්ගේ හට ගැනීම මෙසේ තේරුම් ගත යුතුය. මෙහි දී දුක ගැන කිය නොවේ. සෝවාන් මාර්ග කුසලයට පත්වීම යනු දුකින් නිදහස් වීමයි. නමුත් යම්කිසි හේතුවක් නිසා හටගැනීමක් ඇත්නම් ඵලයක්ද හටගත්තේ යැයි දැකිය හැක. සකෘදාගාමි, අනාගාමී, අර්හත් යන මේ මාර්ග කුසල්වලට පත්වීම යනු නැවත දුක්ගෙන දෙන්නේ නැත. දුක් අවසන් කළ බැවිනි. නමුත් ඒ සිත්වල හේතුඵල දැකිය හැක.

මේ ක්‍රමයට බුදුපියාණන් වහන්සේ විසින්, කාමාවචර කුසල් සිතක් ගානේ, රූපාවචර කුසල් සිතක් ගානේ, අරූපාවචර කුසල් සිතක් ගානේ, ලෝකෝත්තර කුසල් සිතක් ගානේ, ක්‍රියා කරන පටිච්චසමුප්පාදය නය ක්‍රමය හේතු-ඵල අනුව, හේතු-ඵල ධර්මයන් වටහා ගන්නා අයුරු දේශනා කරන ලද සේක. භාවනාවන් වඩන විටදී එක් හේතුවක් ගානේ බලමින් ගොස්, නැවත මේ හේතු සියල්ල එකට එකතුවී, එකට ප්‍රත්‍යයව තිබෙන, එකට හේතුවී තිබෙන, එකට හටගන්නා, ඔවුනොවුන් එකට බැඳිලා හට ගන්නවා නය ක්‍රම 4ට බැලිය හැක. මෙයයි පටිච්චසමුප්පාදයේ තිබෙන වැදගත්කම මේ පටිච්චසමුප්පාද නය ක්‍රමයට අතීත හේතු සම්බන්ධ කර හෝ අනාගත හේතු-ඵල කිසිවක් සම්බන්ධ කර නොමැත. ඒ ඒ මොහොතට ඇතිවන හේතු ඵලයි. ඒ ඒ සිතේ පහළ වන හේතු නිසා ඵල, මෙම හේතු-ඵල ඒ ඒ චිත්තක්ෂණ මොහොතට පැහැදිලි කරන නය ක්‍රමයක් බව පැහැදිලි කරගත යුතුය.

අකුසල් සිත් 12, කුසල් සිත් 21 මේ සිතක් ගානේ පහළවන පටිච්ච සමුප්පාද ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරගන්නට යෙදුණා.

## අව්‍යාකත නිද්දෙසො (අව්‍යාකෘත සිත්)

අව්‍යාකෘත යනු කුසල් නොවූ, අකුසල් නොවූ සියලුම සිත් වේ. එනම් විපාක සිත් සහ ක්‍රියා සිත්ය. පළමුවෙන්ම විපාක සිත් ගැන පැහැදිලි කරයි. මේ විපාක සිත් කොටස්වලට බෙදිය හැක. කාමාවචර විපාක, රූපාවචර විපාක, අරූපාවචර විපාක, ලෝකෝත්තර විපාක ලෙසින්. මේ කාමාවචර විපාක කොටස් 3 කට බෙදිය හැක. අකුසල විපාක සිත් වශයෙන් 7, අහේතුක කුසල විපාක සිත් වශයෙන් 8, මහා විපාක සිත් වශයෙන් 8, කාමාවචර විපාක සිත් සියල්ල 23 යි. කාමාවචර භූමි විපාක සිත් 23 අතර පළමුවෙන්ම කුසල පැත්තට අදාළ විපාක ගැන පැහැදිලි කරයි. කුසල පැත්තට අදාළ අහේතුක විපාක සහ මහා විපාක තිබේ.

## 01 අහේතුක කුසල විපාක සිත්

පළමු සිත නම් '**යස්මිං සමයෙ කාමාවචර කුසලස්ස -පෙ-**

**'චක්ඛු විඤ්ඤාණ ............... උපෙක්ඛා සහගතං -පෙ-.'**

යම් දවසක, යම් වෙලාවක පෙර ජීවිතයේ සිදුකරගත් කාමාවචර කුසලයකගේ විපාකයක් වශයෙන් රැස් වූ කර්ම ශක්තියක් අනුව අපට විපාක චක්ඛු විඤ්ඤාණ සිතක් පහළ වේ. උපේක්ඛා සහගතව රූපාරම්මණයක් නිසාවෙනි. බුදු රුවක් දකින්න ලැබීම, මහා සංඝරත්නය දකින්න ලැබීම, මහා රහත් උතුමන් වහන්සේලා දකින්න ලැබීම, සිල්වතුන් ගුණවතුන් දකින්න ලැබීම. මේ දැකීමට ලැබෙන අරමුණ රූපාරම්මණයකි. ඒ රූපාරම්මණය නිසා චක්ඛු විඤ්ඤාණ සිත උපදියි. මේ සිත විපාක සිතකි. මේ විපාකය පෙර ජීවිතයේ කරගන්නා ලද කුසලයක විපාක වශයෙනි. මේ අනුව පැහැදිලි කරගත යුත්තේ පෙර ජීවිතයේ වැඩූ කුසලයක් නිසා අපට **අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත** උපදී. මේ චක්ඛු විඤ්ඤාණ සිතේ ඒ ඒ මොහොතට සහජාත වශයෙන් පහළ වන හේතු-ඵල තේරුම් ගත යුතුය. මෙහි වෙනස්කම් කීපයක් පවතී. මුලින්ම '**තස්මිං සමයෙ සංඛාර පච්චයා විඤ්ඤාණං**' ලෙස ආරම්භ කෙරේ. **අවිජ්ජා ලෙස කුසලමූල පච්චයා, කුසල මූල කිසිවක් භාවිතා කළ නොහැක.** මෙය චක්ඛු විඤ්ඤාණ

විපාක සිතක් බැවිනි. මේ සිතේ පහළ වන නාම ධර්ම උපරිම 7 කි. සිත සමග 8 කි.

ඵස්ස, වේදනා. සංඥා, චේතනා, ඒකග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය, මනසිකාර යන නාම ධර්ම 7 පමණයි පහළ වන්නේ. මේ නාම ධර්ම 7 සහ සිත සම්බන්ධයෙන් හේතු-ඵල දැකිය යුතුය. **සංඛාර පච්චයා විඤ්ඤාණං** - චක්ඛු විඤ්ඤාණ චේතනාව නිසා චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං** - චක්ඛු විඤ්ඤාණ සිත නිසා වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධ පහළ වේ. චක්ඛු විඤ්ඤාණ නාමස්කන්ධ නිසා ෂට්ඨායතනය උපදී. ෂට්ඨායතනය යනු මෙහි දී චක්ඛායතනය තුළ පහළවන මනායතන යයි. ෂට්ඨායතනය නිසා චක්ඛු විඤ්ඤාණ මනෝසම්ඵස්සය. මනෝසම්ඵස්සය නිසා චක්ඛු සම්ඵස්සජා වේදනව, උපෙක්ඛා වේදනාවයි. මේ වේදනාව නිසා තණ්හාව, ප්‍රසාදය, අධිමොක්ඛය, උපාදානය යෙදෙන්නේ නැත. කෙළින්ම වේදනාව නිසා භවය පහළ වේ. වේදනාව හැර සංඥා සංඛාර විඤ්ඤාණ ස්කන්ධයෙන් හටගැනීම. ජාතිය, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ස්කන්ධ 4 හි උත්පත්තිය චක්ඛු විඤ්ඤාණ සිත. උත්පාදක්ෂණය ජාතිය, චක්ඛු විඤ්ඤාණ ඨිතික්ෂණය ජරාව භංගක්ෂණය මරණය නම් වේ. මේ ආකාරයට පළමු අහේතුක කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත අරමුණු කරගෙන පටිච්ච සමුප්පාද අංගයන් බැලිය හැක. මේ අනුව අංග වශයෙන් 8 ක්, මාතෘකා පදවශයෙන් 8 ක් තිබේ. පච්චය නය ක්‍රමයේ දෙවැනි ක්‍රමයේ වෙනස.

**සංඛාර පච්චයා විඤ්ඤාණං නාම පච්චයා ඵසෙසා** - චක්ඛු විඤ්ඤාණ වේදනාව නිසා චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. චක්ඛු විඤ්ඤාණ සිත නිසා වේදනා සංඥා සංඛාර නාමස්කන්ධ 3 පහළ වේ. මේ නාමස්කන්ධ 3 නිසා වේදනා, සංඥා, සංඛාර විඤ්ඤාණ චක්ඛු විඤ්ඤාණ නාමස්කන්ධ නිසා චක්ඛු සම්ඵස්සය පහළ වේ. ඵස්ස පච්චයා වේදනා චක්ඛු සම්ඵස්ස නිසා වේදනාව පහළ වේ. වේදනාව නිසා භවය පහළ වේ. භවය නිසා සතර නාමස්කන්ධයන් හට ගැනීම ජාතිය ජරාව මරණය, චක්ඛු විඤ්ඤාණ සිත සම්බන්ධ කරගත් විට **නාමරූප නැත. සළායතන නැත.** සහජාත වශයෙන් චිත්තජ රූප පහළ වෙත් ද? නැද්ද?

චක්ඛු විඤ්ඤාණ සිතේ චිත්තජ රූප පහළ වෙත් ද? නැත් ද? නැත. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාන කාය විඤ්ඤාණ, මේ පංචම විඤ්ඤාණ, සමග චිත්තජ රූප පහළ නොවේ. හෘදය වස්තුවේ පමණයි චිත්තජ රූප පහළ වන්නේ. ඒ නිසා නය ක්‍රමවලදී පච්චය චතුෂ්කයක් තිබුණාට පළමු හා දෙවැනි නය ක්‍රම පමණයි අර්ථ විග්‍රහ කළ හැක්කේ. 3, 4 නය ක්‍රමය බැහැර කෙරේ. ඒ අනුව හේතු චතුෂ්කයේ 1, 2, සම්ප්‍රයුක්ත 1, 2, අඤ්ඤමඤ්ඤ 1, 2 නය ක්‍රම පමණක් ගනු ලබයි. මේ අනුව චක්ඛු විඤ්ඤාණ, සිත තේරුම් ගත යුතුය. චක්ඛු විඤ්ඤාණ සිත සමග චිත්තජ රූප පහළ නොවන හෙයින් නාමරූප බැහැර විය. සහජාත වශයෙන් ද නැත. නාමරූප නොමැති හෙයින් සළායතන නැත. **නාම පච්චයා ඡට්ඨායතනය, නාම පච්චයා ඵස්ස** කියන නය ක්‍රම 2 පමණයි. නමුත් පට්ඨාන නය ක්‍රමයට කර්මජ රූප පහළ වන බව සඳහන් වුවත්, දැකිය හැකි වූවත් ඒ කර්මජ රූපයන්ගේ පහළවීම සහජාත පටිච්චසමුප්පාදයට සම්බන්ධ කරගත නොහැකි බව තේරුම් ගත යුතුය.

පෙරත් කුසල් අකුසල් සිත්වලදී කර්මජ රූප ගැන සාකච්ඡා කළා.ඒ ගැන බැලිය යුතුය. සාකච්ඡා කළ යුතුය. නමුත් ප්‍රධාන ස්ථානය දිය යුත්තේ චිත්තජ රූපයන්ටය. චිත්තජ රූප නිසයි පහළ වන්නේ.

මෙම චක්ඛු විඤ්ඤාණ සිත නිසා උපදින දුක්ඛ සමුදාය, දුක් එකතුව තේරුම් කරගත යුතුය. මේ කුසල විපාක චක්ඛු විඤ්ඤාණයක් පහළ වූ හෙයින්, හොඳ දෙයක් දකින්න ලැබීම නිසා කුසල් අකුසල් පහළ විය හැක. ඒ තුළින් අපට දුක් රැස් කරගෙන දෙන හෙයිනි. චක්ඛු විඤ්ඤාණ සිත තුළත් '**එවමෙ තස්ස දුක්ඛ ඛන්ධස්ස සමුදයො හොති**' ලෙස යෙදේ. මේ ක්‍රමයට දුක්ඛයාගේ එකතුව හටගැනීම, තේරුම් ගත යුතුය.

චක්ඛු විඤ්ඤාණය වටහාගත් සේ ම, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යන ප්‍රධාන විඤ්ඤාණ 5 අවබෝධ කරගත යුතුය. සෝත විඤ්ඤාණය යනු පෙර ජීවිතයේ

කරගත් කුසල විපාක වශයෙන් හොඳ ශබ්දයන් නිසා සෝත විඤ්ඤාණ කුසල සිත පහළ වීමයි.

ධර්ම දේශනාවක් ශ්‍රවණය කරන්න ලැබීමෙන් ඒ වෙලාවේ සෝත විඤ්ඤාණ කුසල විපාකයි. පෙර ජීවිතයේ කරගත් කුසල විපාකයක් අනුව හොඳ දේවල් ආඝ්‍රාහණය කරන්න ලැබේ. රසය නිසා ජිව්හා විඤ්ඤාණය උපදී. ඝාන විඤ්ඤාණය පහළ වේ. සුඛ සහගත කාය විඤ්ඤාණය සැප වේදනාව සමඟ කාය විඤ්ඤාණය පහළ වේ. සැප ස්පර්ශයකි. මේ පංච විඤ්ඤාණ සමඟ පටිච්චසමුප්පාද අංගයන් **සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම, නාම පච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං** නම් වේ.

දෙවැනි නය ක්‍රමයේ, **සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමං, නාම පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, -පෙ-**

මේ නය ක්‍රමයට පංච විඤ්ඤාණ කුසල විපාක සිත් පැහැදිලි කරගත යුතුය.

සාදු! සාදු! සාදු!

# හත්වන දේශනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

## අව්‍යාකෘත සිත්

**306. යස්මිං -පෙ-**

ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මහත් කරුණාවෙන් ලෝකානුකම්පාවෙන්, ලෝකාර්ථසිද්ධිය පිණිස, චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධය පිණිස, පටිච්ච සමුප්පාද වැනි ගාම්භීර ධර්මයන් අවබෝධ පිණිස, මාර්ගඵල නිවන් පිණිස උපකාර වන පරමාර්ථ අර්ථ ධර්ම විග්‍රහයට අදාළව පිළිවෙලින් පවත්වාගෙන එනු ලබන ධර්ම සාකච්ඡාවාරයට අදාළව විභංග ප්‍රකරණ පටිච්ච සමුප්පාද විභංගයට අයිති අව්‍යකෘත සිත් සම්බන්ධයෙන් කරන පටිච්ච සමුප්පාද අංග විග්‍රහයයි.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ මේ උතුම් දේශනාව පරමත්ථ දේශනා ලෙස හඳුන්වයි. බුදුපියාණන් වහන්සේගේ දේශනා ක්‍රම 2 ක් පවතී. සම්මුති දේශනා, පරමත්ථ දේශනා. සම්මුති දේශනා යනු නොයෙක් උපමා උපමේයයන් සේ ගල් පර්වත, අහස පොළව ආදී නොයෙක් වස්තු උපමා කරගෙන කෙනෙකුට සරල ආකාරයෙන් කරපු අර්ථ විග්‍රහයයි, සම්මුති දේශනා. පරමත්ථ දේශනා යනු, '**පරමො උත්තමො අවිපරීතොති අත්ථො පරමත්ථො**' උසස්ව වෙනස් නොවන ආකාරයට පත්වන චිත්ත චෛතසික රූප නිබ්බාන ස්කන්ධ ධාතු ආයතන සත්‍ය ආදි ධර්මයන්ගේ අර්ථ විග්‍රහයයි. යම් කෙනෙක් සම්මුති දේශනාවක් ඔස්සේ හෝ තමන්ගේ සිත පිහිටුවාගෙන ශ්‍රද්ධාදී ගුණ ධර්මයන් මතු කරගෙන ඒ සම්මුති දේශනාවෙන් උගන්වන ධර්මය තුළට පරමාර්ථ වශයෙන් බැසගත් විටයි ඒ තැනැත්තාට නිවන් අවබෝධ කර ගැනීමට

පුළුවන්කම ලැබෙන්නේ. යම් කෙනෙක් මේ පරමාර්ථ ධර්ම දකින්නේ නැතිනම්, පරමාර්ථ ධර්මයන් ගැන අවබෝධයක් වැටහීමක් නැතිනම්, පරමාර්ථ ධර්මයන් තමන්ගේ සිහිනුවණින් දකින්න ලැබෙන්නේ නැතිනම් ඒ තැනැත්තාට කවදාවත් මේ නිවන් මග සාදාගත නොහැක. ලොවුතුරා බුදු කෙනෙක් ලොව පහළවන්නේ මේ පරම පරමාර්ථ වූ පටිච්සමුප්පාද, ස්කන්ධ ආයතන ධාතු ආදී ගාම්භීර ධර්මයන් සහිත විදර්ශනා පාදක කර්මස්ථාන ඉගැන්වීමට, දේශනා කිරීමටයි. යම්කිසි යෝගාවචරයෙක් සමථ වශයෙන් විපස්සනා වශයෙන් තමන්ගේ සිතේ භාවනාමය දියුණුවක් ඇති කරගන්නවා නම් ඒ යෝගාවචරයාට අදාළ වන ධර්ම කරුණු බුදුපියාණන් වහන්සේ මේ දේශනාවන් තුළින් අපට දක්වා තිබෙන්නේය. මීට පෙර අකුසල් සිතක් ගානේ පහළවන පටිච්චසමුප්පාද අංගයන්, ඒවාගේම කුසල් සිතක් ගානේ පහළවන පටිච්චසමුප්පාද අංගයන් යන කරුණු හඳුනාගන්නා ලදී. ඒ අංගයන් වෙන වෙනම අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනා වඩන ආකාරය හඳුනාගන්නා ලදී. ඒ අංගයන් එක චිත්තක්‍ෂණයක් තුළ ඒකුප්පාද වශයෙන්, ඒක නිරෝධ වශයෙන් පවතින ආකාරය නුවණින් දැන වටහාගෙන ඒ සියලුම පරමාර්ථ ධර්මයන්, පටිච්චසමුප්පාද ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වඩා අපගේ විදර්ශනා ඥාන දියුණු කරගත හැකිය. ඒ අනුව බුදුපියාණන් වහන්සේ අකුසල සංග්‍රහය, කුසල සංග්‍රහය දේශනා කිරීමෙන් අනතුරුව අව්‍යාකෘත ධර්මයන් ගැන දේශනා කිරීමට ආරම්භ කළහ. අව්‍යාකෘත යන්න අදහස් කරන විටදී චිත්ත චෛතසික රූප නිබ්බාන නැමැති සතර පරමාර්ථ ධර්මයන්ගෙන් කොටසක් අදාළ වේ. ප්‍රධාන වශයෙන් විපාක සහ ක්‍රියා සිත්ය යන්න අව්‍යාකෘත ගණයට ඇතුළත් වේ.

පළමුව විපාක සිත් පිළිබඳව දේශනා කරයි. සියලුම සිත් 89 ක් පවතී. ඒ සිත් 89 න් අකුසල් සිත් 12, කුසල් සිත් 21, විපාක සිත් 36, ක්‍රියා සිත් 20 ක් වශයෙන් බෙදා අර්ථ විග්‍රහ කරගත හැකිය. ඒ විපාක 36 කුසල විපාක අකුසල විපාක වශයෙන් ප්‍රධාන කොටස් 2 කට බෙදිය හැක. කුසල විපාකසිත්, අහේතුක කුසල විපාක, සහේතුක කුසල විපාක ලෙස දැක්වේ. මෙහි දී පළමුව අහේතුක කුසල විපාක ගැන පැහැදිලි

කෙරේ. අහේතුක කුසල විපාක සිත් 8, සහේතුක කුසල විපාක සිත් කාමාවචර වශයෙන් 8, රූපාවචර වශයෙන් 5, අරූපාවචර වශයෙන් 4, ලෝකෝත්තර වශයෙන් 4 යි ලෙස දැක්වේ.

කාමාවචර භූමියට අදාළව අපේ සන්තාන තුළ පහළවන කුසල විපාක අහේතුක සිත් ගැන පැහැදිලි කරගත යුතුය. '**කාමාවචර කුසලස්ස**

**306 - පෙ - චක්ඛු විඤ්ඤාණං .... උපෙක්ඛා සහගතං -පෙ-**'

පූර්ව සංසාරයේ දී දියුණු කරගන්නා ලද කුසල ශක්තියක්, කුසල බලයක් නිසා අපේ සන්තාන තුළ බාහිර රූපාරම්මණයක් නිසා චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. චක්ඛු ප්‍රසාදය, ඇසුරු කරගෙන, චක්ඛු වස්තුව ඇසුරු කරගෙන ඒ බාහිර රූපාරම්මණය නිසා කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත පහළ කරගත හැකිය. කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත අද ලෝකයේ, සමාජයේ සුබයි. සැපයි. යහපත් ක්‍රියා සම්මත කරගත් යම්කිසි රූපාරම්මණයක් පවතී ද ඒ සියලුම රූපාරම්මණ පහළ වන්නේ පූර්ව ජාතිවල කළ කුසල විපාකවල ප්‍රතිඵලයක් වශයෙනි. මේ රූපාරම්මණය නිසා පහළ වන චක්ඛු විඤ්ඤාණ සිත තුළ පහළවන නාම ධර්ම එම නාම ධර්ම 7 හඳුනාගත යුතුය.

ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය, මනසිකාර යන චෛතසික 7 සහ සිත සමග නාම ධර්ම 8ක් පවති. කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත තුළ පහළවන නාම ධර්මයන් 8 තුළ ඇති ඒකුප්පාද, ඒක චිත්තක්ෂණික වශයෙන් පහළවන පටිච්චසමුප්පාදය නය ක්‍රමයට හේතුඵල ධර්මයන් හඳුනා ගත යුතුය.

**අවිජ්ජා පච්චයා - කුසල මූල පච්චයා** ලෙස ආරම්භ කළේ නැත. අවිජ්ජා යන වචනය මෙහි දී භාවිතා කළ නොහැකිය. ඒක චිත්තක්ෂණික වශයෙන් ඒ කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත තුළ අවිජ්ජා පහළ නොවන හෙයිනි. කුසල මූල පච්චයා ලෙස භාවිතා කළ නොහැකිය. කුසල මූල පහළ වන්නේ නැත. චක්ඛු විඤ්ඤාණ සිත තුළ මෙයයි හේතුව. ඒ නිසා බුදුපියාණන් වහන්සේ පළමු මාතෘකාව අත්හැර **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණය** කියන මාතෘකාව පටන්ගෙන තිබේ. සංඛාර යනු

චක්ඛු විඤ්ඤාණ සිතේ පහළ වන චේතනාවයි. සංඛාරය, චේතනාව නිසා හටගන්නා වූ චක්ඛු විඤ්ඤාණ සිතක් පවතී ද ඒ සිත විඤ්ඤාණ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං** ඒ විඤ්ඤාණය නිසා හටගන්නා වේදනා, සංඥා, සංඛාර නාම ධර්මයන් නාම වේ. **නාම පච්චයා ඡට්ඨායතනං,** ඒ චක්ඛු ප්‍රසාදය තුළ, වස්තුව තුළ, පහළවන චක්ඛු විඤ්ඤාණ අන්තර්ගත වේදනා, සංඥා, සංඛාර, නාම ස්කන්ධ නිසා චක්ඛු විඤ්ඤාණ මනායතනය. මෙය ඡට්ඨායතනය නම් වේ. **ඡට්ඨායතනං පච්චයා ඵස්සො,** චක්ඛු විඤ්ඤාණ මනායතනය නිසා චක්ඛු සම්ඵස්සය උපදී. චක්ඛු සම්ඵස්සය නිසා චක්ඛු සම්ඵස්සජ වේදනා උපේක්ඛා වේදනාව උපදී.

වේදනාව නිසා තණ්හාව පහළ නොවේ. චක්ඛු විඤ්ඤාණ සිතක් නිසා තණ්හාව පහළ නොවේ. ප්‍රසාදයත්, පටිසයක්, පහළ නොවේ. මෙහිදී තේරුම් ගත යුත්තේ මේ කියන සිත තුළ කුසල විපාකයක් වූවාට මේ තුළ පහළවන වේදනාව නිසා අකුසලයක් හෝ කුසලයක් පහළ නොවේ. නමුත් මේ වේදනාව ඉදිරියට උපකාරි වේ. මෙයයි වැදගත්කම ඒක චිත්තක්ෂණික වශයෙන් චක්ඛු විඤ්ඤාණ සිත තුළ පහළවන වේදනාවෙන් අපිට ප්‍රතිඵලයක් ගෙන නොදේ. අපි විඳින නිසාවෙනි. විපාකයක් පමණයි විඳින්නේ. මේ වේදනාව නිසා තණ්හාවක් නොමැති හෙයින්, **වෙදනා පච්චයා භවො,** මේ වේදනා ස්කන්ධය නිසා සංඥ සංඛාර, විඤ්ඤාණ නැමැති ඉතිරි නාම ස්කන්ධයන්ගේ හටගැනීම, සිදුවේ. මෙය භවය වේ. **භව පච්චයා ජාති,** චක්ඛු විඤ්ඤාණ සිතේ උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය වේ. මේ පළමු නය ක්‍රමයයි.

දෙවැනි නය ක්‍රමයේ වෙනස, **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං,** චක්ඛු විඤ්ඤාණ චේතනාව නිසා චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. චක්ඛු විඤ්ඤාණ සිත නිසා චක්ඛු විඤ්ඤාණ නාමස්කන්ධ පහළ වේ. චක්ඛු විඤ්ඤාණ නාමස්කන්ධ නිසා චක්ඛු සම්ඵස්සය පහළ වේ. මෙහි දී ඡට්ඨායතන සම්බන්ධ කර නොගනී. චක්ඛු සම්ඵස්සය නිසා වේදනාව හටගනී. වේදනාව නිසා භවය හටගනී. භවය නිසා ජාතිය හටගනී. ඒ

අනුව අපි තේරුම් ගත යුතු නම් චක්ඛු විඤ්ඤාණ සිත තුළ පටිච්චසමුප්පාද අංග 8 ක් ක්‍රියා කරන බව. ඒ අංග වෙන වෙනම දැකිය හැක. එකට දැකලා සියල්ලක්ම අනිත්‍ය වශයෙන්, දුක්ඛ වශයෙන්, අනාත්ම වශයෙන් නැවත නැවත වඩ වඩා බලන විට අපේ සන්තාන තුළ පච්චය පරිග්‍රහ ඥානය ඉතාමත් විසඳ ව සුවිසඳ වයි වැඩෙන්න පටන් ගනු ලබන්නේ දැන් මේ චක්ඛු විඤ්ඤාණ සිතත් සමග පහළවන රූප කොට්ඨාශයක් නොමැත. සහජාත වශයෙන් පහළවන චිත්තජ රූප නැති නිසා 3 වෙනි සහ 4 වෙනි නය ක්‍රමයේ අන්තර් ගත නොවේ. එම ක්‍රමවලදී 3 නය ක්‍රමයේ නාමරූපත්, 4වන ක්‍රමයේ **නාම රූප පච්චයා සළායතන** ලෙස භාවිතා නොවේ. හේතුව චක්ඛු විඤ්ඤාණ සිතේ උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය යන ක්ෂණ 3 දී ම කර්මජ රූප පහළ වේ. කර්මජ රූප පහළවීම යනු සළායතන පහළ වේ. නය ක්‍රමවලට අනුව පැහැදිලි කළ හැකිමුත් අට්ඨකථාචාරීන් විසින් පැහැදිලි කරනු ලබන්නේ චිත්තජ රූප පමණි. සහජාත ප්‍රත්‍යයේ දී **ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො.** ප්‍රතිසන්ධි ක්ෂණයේ දී සිත සමග සහජාත වශයෙන් කර්මජ රූප පහළ වේ. නැවතත් සහජාත ප්‍රත්‍යයේ දී **චිත්ත චෙතසික ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං සහජාත පච්චයෙන පච්චයො.** චිත්ත චෛතසික ධර්මයෝ නිසා සහජාත වශයෙන් චිත්තජ රූප උපදී. මෙහි දී අප පැහැදිලි කරගත යුතුයි. සහජාත ප්‍රත්‍යයේ දී කර්මජ රූප ගනු ලබන්නේ ප්‍රතිසන්ධික්ෂණයේ දී පමණයි. අනික් තැන්වලදී කර්මජ රූප පහළ වේ. නමුත් මේ නාම රූප ධර්මයන් සමග එකට එකතුවෙලා සහජාත වශයෙන් පහළ වන්නේ ප්‍රතිසන්ධි ක්ෂණයේ දීයි. සෑම චිත්තක්ෂණයක දීම උත්පාද, ඨිති, භංග යන සෑම අවස්ථාවකම කර්මජ රූප පහළ වේ. නමුත් චිත්තජ රූප පහළ වන්නේ උත්පාදක්ෂණයේ දී පමණි. එබැවින් ප්‍රධාන ස්ථානය චිත්තජ රූපවලට ලබාදේ. කර්මජ රූප උත්පාද, ඨිති, භංග අවස්ථා 3 දීම පහළ වන බැවිනුත් උත්පාදක්ෂණයේ පමණක් නොවන නිසා, උත්පාදක්ෂණය පමණක් සම්බන්ධ කරගෙන චිත්තජ රූප පමණයි සාකච්ඡා කරනුයේ. නමුත් යම්කිසි යෝගාවචරයෙක් මේ පටිච්චසමුප්පාද අනුරූපව සිතක් හඳුනාගෙන ඒ සිත තුළ පටිච්චසමුප්පාද අංගයන්

පට්ඨාන නය ක්‍රමයට බලන විට වෙනස් වේ. චක්ඛු විඤ්ඤාණ සිතගත් විට එම සිත පළමුව හඳුනාගත යුතුය. ඒ සිත හඳුනාගෙන ඒ සිතට ඇති ආරම්මණ ප්‍රත්‍ය, අනන්තර, සමනන්තර වශයෙන් සහජාත වශයෙන් අඤ්ඤමඤ්ඤ, නිස්සය, වශයෙන් උපකාර වන ප්‍රත්‍ය හඳුනාගත යුතුය. මේ සිතේ පහළවන පටිච්ච සමුප්පාද අංගයන් පට්ඨාන නය ක්‍රමයට අනුව විපස්සනාවට නගන්න හැකිය. එය වෙනම නය ක්‍රමයකි. එය මහා සාගරයකට බැසගත් හා සමානය. මුලින් සරලව වටහාගෙන, අවබෝධ කරගෙන මේ පුහුණුවෙන් ඒවා වැඩිය හැකිය. ධර්මයේ මූලික අඩිතාලම යොදාගත් විට ගැඹුරට යා හැකිය.

මේ ආකාරයෙන් චක්ඛු විඤ්ඤාණ සිත, සෝත විඤ්ඤාණ සිත පැහැදිළි කරගත යුතුය. පෙර ජීවිතවල රැස්කරගත් යම්කිසි කුසල ශක්තියක් නිසා කුසල කර්ම බලයෙන් උපදින, බාහිර ශබ්දාරම්මණය නිසා සෝත විඤ්ඤාණයක් උපදී. මේ සෝත විඤ්ඤාණය තුළ පටිච්ච සමුප්පාද අංගයක්, චක්ඛු, විඤ්ඤාණ සිත තුළ පහළ කරගත් ආකාරය, විස්තර කරගත් ආකාරයට පැහැදිළි කරගත යුතුය. කිසිම වෙනසක් නැත. එමෙන්ම ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ සිත් හඳුනාගෙන, එම පංච විඤ්ඤාණ සිත්වල පහළ වන පටිච්ච සමුප්පාද හේතුඵල අංගයන් වෙන වෙනම හඳුනාගෙන, එකට පිහිටා තිබෙන ආකාරය ඒක චිත්තක්ෂණික වශයෙන් උපදින ආකාරයක් හඳුනාගෙන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් වැඩිය යුතුය. මේ ආකාරයෙන් ඉතිරි නය ක්‍රමයන්ට අනුව පැහැදිලි කරගත යුතුයි.

මනෝ ධාතු සිත, 313 **'යස්මිං සමයෙ -පෙ- මනොධාතු- උපෙක්ඛා සහගත -පෙ-'**

අහේතුක කුසල විපාක සිත් 8 න් සිත් 5 ක් දේශනා කරන ලදී. ඉතිරි සිත් 3, සම්පටිච්ඡන සිත් 1, සංතීරණ සිත් 2කි. සම්පටිච්ඡන සිත මනෝ ධාතුවට අයිති වේ. ඒ අනුව මනෝ ධාතුව යනු, සම්පටිච්ඡන සිත් 2යි පංචද්වාරාවජ්ජන යන සිත් 3යි. මනෝ ධාතුව කියන්නේ ඇයි? **'මනන මත්තා ධාතු මනො ධාතු'** - මනන මත්තා, අරමුණු මැනීමක් හා සමානව කරන කාර්‍යයකි. මනෝ ධාතුවට කිසිම දෙයක් කළ නොහැකි.

කාර්ය නම් අරමුණක් මැනීම  වැනි දෙයකි. පංචද්වාරා වජ්ජනයෙන් මනසිකාරය සිදුකරයි. පංචද්වාරාවජ්ජන නම් වූ මනෝ ධාතුවෙන් මනසිකාරය සකසා දෙනු ලබයි. ද්වාරයට අරමුණු ගැනීම සඳහා ද්වාරයෙන් අරමුණුගත් පසු ඒ අරමුණු සම්පටිච්ඡන මනෝ ධාතුවට භාර දෙනු ලබයි. දෙපැත්තේ පහළවන මනෝධාතු සිත් 2 අරමුණු මැනීමක් සිදුකරයි. එතැනින් එහා කිසිදු දෙයක් කළ නොහැකිය. අපි යම්කිසි දෙයක් මැනීමේ දී මනින භාජනය මැනීම සඳහා උපකාරි වේ. එම භාජනයේ වෙන උපකාරයක් එතැනදී නොලැබේ. ඒවාගේ පංචද්වාරවජජන නැමැති උපකාරය නොමැතිව චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. චක්ඛු විඤ්ඤාණ සිතෙන් ගත් අරමුණ නිසා, පංච විඤ්ඤාණ සිතෙන් ගත් අරමුණු නිසා සම්පටිච්ඡන සිතත් පිළිගත්තේ නැති නම් ඒ කාරිය සිදු නොවේ. යමක් මනින්න භාජනය උපකාරී වන්නා සේ ය.

ඒ භාජනය මැනීමෙන් පසු අවසානයේ දීයි ප්‍රතිඵලය ලැබෙන්නේ. හාල් ගොඩක් භාජනයෙන් මනිමින් හෝ කිලෝවලින් මැන මැන තිබෙන ප්‍රමාණය දැන ගනී. මෙසේ මනින ක්‍රමය, මැනුම මනෝධාතුවයි. මෙතැනදී අරමුණු මැනීමකි. උදාඃ හාල් මනින භාජනය නොමැතිව, තරාදියක් නොමැතිව පවතින ප්‍රමාණය කිව නොහැකිය. මෙලෙස මැනීමක් හා සමානයි මනො ධාතුව. මනෝ ධාතුවේ විශේෂත්වය එයයි. මනෝ ධාතුව නොමැතිව, මිණුමක් නොමැතිව නොමැණිය හැකි සේ අරමුණක් මැනීමට කුමක් ද යන්න හඳුනා ගැනීමට නොහැකිය. පඤ්චද්වාරයෙන් පැමිණෙන අරමුණක් පැහැදිලිවම හඳුනාගත නොහැකිය. මනෝ ධාතු සිත, හදවතේ පහළවන කුසල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත රූපාරම්මාණය නිසා එනම් චක්ඛුද්වාරික වශයෙන්, ශබ්දාරම්මණ නිසා සෝතද්වාරික වශයෙන්, රසාරම්මණ නිසා  ජිව්හාද්වාරික වශයෙන්, ගන්ධාරම්මණ නිසා ඝාණද්වාරික වශයෙන්, පොට්ඨබ්බාරම්ණ නිසා කායද්වාරික වශයෙන්, මේ පංචද්වාරයෙන්ම එන අරමුණු පිළිගන්න පුළුන්කම ලැබේ. මනෝධාතුව හදවත තුළ පහළවන සිතක් නිසා සියලුම නය ක්‍රම බැලිය හැක. චිත්තජ රූප පහළ වන්නේ හෘද වස්තුවේ පමණයි. හෘදවස්තුව ඇසුරු කරගෙන පහළවන යම්තාක් සිත් පවතී ද චුති සිත,

ප්‍රතිසන්ධි සිතයි හැර මේ සිත් නිසා චිත්තජ රූප උපදී. එයයි විශේෂත්වය අනික් චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන අනෙක් පංච විඤ්ඤාණ සිත් සමග චිත්තජ රූප පහළ වන්නේ නැත. එබැවින් මුලින් පැහැදිලි කරන්නට යෙදුණේ පංච විඤ්ඤාණ සිත් සමග නය ක්‍රම 2 ක් අන්තර් ගත වන බව. සම්පටිච්ඡන සිත ගත් විට ඒ සිතත් **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** ලෙස ආරම්භ කෙරේ.

විපාක සිතක් බැවින් **කුසල මූල, අවිජ්ජා** ලෙස සම්බන්ධ කරගත නොහැකිය. මේ සිතතුළ ඒක චිත්තක්ෂණික වශයෙන්, සහජාත වශයෙන් ඒ ඒ මොහොතට මේ අංග පහළ නොවේ. එබැවින් **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**, සම්පටිච්ඡන චේතනාව නිසා සම්පටිච්ඡන සිත පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං**, සම්පටිච්ඡන සිත නිසා වේදනා සංඥා සංඛාර සම්පටිච්ඡන නාම ස්කන්ධයන්. සම්පටිච්ඡන නාම ධර්ම නිසා සම්පටිච්ඡන මනායතනය. මනායතනය නිසා සම්පටිච්ඡන මනෝ සම්ඵස්ස. මනෝ සම්ඵස්ස නිසා සම්පටිච්ඡන වේදනාව උපදී. වේදනාව නිසා සම්පටිච්ඡන අධිමෝක්ඛය. සම්පටිච්ඡන අධිමෝක්ඛය නිසා සම්පටිච්ඡන භවය උපදී.

භවය නිසා සම්පටිච්ඡන නාම ස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණයයි. මෙහි දී පටිච්ච සමුප්පාද අංග **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණ** -පෙ- 9ක් ක්‍රියා කරයි. අධිමොක්ඛ චෛතසිකය සම්පටිච්ඡන සිත සමග පහළ වේ. සම්පටිච්ඡන සිත සමග අධිමොක්ඛය පහළවන බැවින් **වෙදනා පච්චයා අධිමොක්ඛා.** දැඩිව ඒ අරමුණු අල්ලාගැනීම සිදුවේ. සම්පටිච්ඡන සිතෙන් අරමුණු ග්‍රහණය කරගන්නේ නැතිනම් ඉදිරියට යා නොහැක. එතැනින් බිඳෙයි. පංචද්වාරවජ්ජන සිත ආදිය බලාගෙන යනවිට මෙයින් අදහස් කරනා දෙය වැටහෙයි.

**සංඛාර පච්චයා විඤ්ඤාණ, විඤ්ඤාණ පච්චයා නාමං -පෙ-**

අහේතුක කුසල විපාක සම්පටිච්ඡන සිත තුළ පහළ වූ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සතර නාමස්කන්ධය නිසා ඵස්සය උපදී. මෙහි දී මනායතනය ගැන සාකච්ඡා නොකරයි. මනෝ සම්ඵස්ස, ඒ

නිසා වේදනාව, වේදනාව නිසා අධිමොක්ඛය, අධිමොක්ඛය නිසා භවය, භවය නිසා ජාති ජරා මරණ පහළ වේ.

තුන්වන නය ක්‍රමයේ දී **සංඛාර පච්චයා -පෙ- විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතන පච්චයා ඵස්සො,** එතැන සම්පටිච්ඡන චේතනාව නිසා සම්පටිච්ඡන සිත පහළ වේ. සම්පටිච්ඡන සිත නිසා සම්පටිච්ඡන නාමරූප, සම්පටිච්ඡන සිත හෘද වස්තුවේ පහළවන නිසා ඒ සහජාත වශයෙන් සතර නාමස්කන්ධ පහළ වේ. ඒ නාම ස්කන්ධයන් සමග සම්පටිච්ඡන චිත්තජ රූපයන් පහළ වේ. චිත්තජ රූප පහළවන නිසා **විඤ්ඤාණ පච්චයා නාමරූපං** ලෙස හැඳින්වේ. සම්පටිච්ඡන විඤ්ඤාණ ස්කන්ධය නිසා වේදනා, සංඥා, සංඛාර, ඉතිරි නාමස්කන්ධ 3 න් චිත්තජ රූපත් පහළ වේ. ඒ ඔවුනොවුන්ගේ එකතුවෙනි. **නාමරූප පච්චයා ඡට්ඨායතනය** ඡට්ඨායතනය යනු හෘද වස්තුව ඇසුරු කරගෙන පහළ වන මනායතනයි. ඡට්ඨායතනය ගත් විට කිහිපයක්ම පවතී. චක්ඛු ප්‍රසාදය ඇසුරු කරන මානයතනය, සෝත ප්‍රසාදය ඇසුරු කරන මනායතනය, ඝාණ ප්‍රසාදය ඇසුරු කරන මනායතනය, ජිව්හා ප්‍රසාදය, ඇසුරු කරන මානයතනය කාය ප්‍රසාදය ඇසුරු කරන මනායතනය ලෙස බෙදිය හැක. මේ අනුව මෙහි දී පැහැදිලි කරන්නේ හෘදවස්තුව ඇසුරු කරගෙන පහළවන මනෝ ධාතු සංඛ්‍යාත මනායතනයයි. මේ මනායතනය පහළවීමට නම්, ඊට පෙර පංච විඤ්ඤාණ සිත් පහළ විය යුතුය. උදාඃ- ඒ පංචවිඤ්ඤාණ සිත නිසා ඒ සිත සමග අලුත් හෘද වස්තු රූපයක් පහළ විය. මේ හෘද වස්තු රූපය තුළ සම්පටිච්ඡන සිත පහළ විය. සම්පටිච්ඡන නාම ස්කන්ධයන් සම්පටිච්ඡන නාමරූප කියන විටදී, එතැන දී වේදනා, සංඥා, සංඛාර සහජාත නාම ස්කන්ධයන් මනායතනයට උපකාරී වේ. පුරේජාත වශයෙන් චක්ඛු විඤ්ඤාණ සිත සමග පහළ වූ හෘද වස්තු රූපයක් ලෙස ඒ රූපය සම්පටිච්ඡන මනායතනය උපකාරී වේ. එතැන දී **විඤ්ඤාණ පච්චයා නාමරූපං,** කියන විටදී එක් අර්ථයක් ද, **නාමරූප පච්චයා ඡට්ඨායතනං** හිදී වෙනත් අර්ථයක් ද ගෙන දේ. නාමරූප කොටස් 2 කට බෙදේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො,** සම්පටිච්ඡන උපෙක්ඛා වේදනාව

නිසා අධිමෝක්ඛය. අධිමෝක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම භවය, භවය නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය ඇතිවේ. මේ ක්‍රමයට පටිච්චසමුප්පාද අංගයන්හි ස්වභාවය ඒ ඒ සිතට අනුරූපව හඳුනාගත යුතුය.

හතරවෙනි නය ක්‍රමයේ වෙනස, **සංඛාර -පෙ- නාමරූප පච්චයා සළායතනං ඡට්ඨායතන පච්චයා ඵස්සො -පෙ-**

සම්පටිච්ඡන චේතනාව නිසා සම්පටිච්ඡන සිත උපදී. සම්පටිච්ඡන සිත නිසා සම්පටිච්ඡන නාමරූප උපදී. චිත්තජ රූප සහ වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධයි. මේ සම්පටිච්ඡන නාමරූප නිසා සළායතන උපදී. සළායතන වලදී, සළායතනවලට චිත්තජ රූපයන්ගේ උපකාරයෙක් නොමැත. සළායතන පහළවීමට නම්, '**චත්තාරො මහා භූතා අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො, මහා භූතා උපාදාය රූපානං සහජාත පච්චයෙන පච්චයො**' අඤ්ඤමඤ්ඤ කියන විටදී ඔවුනොවුන් එකට බැඳී උපදී. සහජාතවල දී ඔවුනොවුන්ට එකට බැඳී හෝ නොමැතිව ඉපදිය හැක. පච්චය චතුෂ්කයේ දී පැහැදිලි කරනවිට දී චක්ඛු විඤ්ඤාණාදී නාමස්කන්ධයන්, විශේෂයෙන් පංච විඤ්ඤාණ සිත් සමග මේ පංච විඤ්ඤාණ නාමරූපයන්, චිත්තජ රූපයන් පහළ වන්නේ නැත. හේතුව එකට බැඳී නැති හෙයිනි. විශේෂයෙන් කර්මජ රූප සම්බන්ධ කර නොගන්නේ (සම්බන්ධ වන අවස්ථාද පවතී) අඤ්ඤමඤ්ඤ යෙදී ඇති බැවිනි. සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ නය ක්‍රමවලට ද තෝරන බැවිනි. අඤ්ඤමඤ්ඤ යනු ඔවුනොවුන් එකට බැඳී උපදින ස්වභාවයයි. ප්‍රතිසන්ධික්ෂණයේ දී කර්මජ රූපයන්, නාම ධර්මයන් එකට බැඳී නූපදී. ඒ නිසා පංච විඤ්ඤාණ සිත් ගැන සාකච්ඡා කිරීමේ දී කර්මජ රූපයන්ගේ බැඳීමක් නොමැති හෙයින් නාමරූප පිළිබඳව ගනු නොලැබේ. තුන්වන සහ හතරවන නය ක්‍රම ගැන පැහැදිලි වන්නේත් නැත. නමුත් සම්පටිච්ඡන සිත ගැන කථා කිරීමේ දී 3, 4 නය ක්‍රම පැහැදිලි කරයි. නමුත් චිත්තජ රූප පහළ වේ. චිත්තජ රූප පහළවනවා යනු කර්මජ රූපයන්ගේ සම්බන්ධයෙන් නැවත පැහැදිලි

කරගෙන යා යුතුය. වෙනස තේරුම් ගත යුතුය. **නාමරූප පච්චයා සළායතනං,** චක්ඛු විඤ්ඤාණ සිත සමග ආයතන, චක්ඛායතන, සෝතායතන ඝානායතන ජිව්හායතන කායායතන ආදී පංචායතන පහළ විය. මේ පංචායතනවල මහා භූත රූප 4 ක් පවතී. ඒ මහාභූතා රූප 4 එකට බැඳිලා අඤ්ඤමඤ්ඤ සහජාත වශයෙන් ඉපදුණි. ඒ 4 දෙනාගේ උපකාර නිසා, චක්ඛු විඤ්ඤාණ සිත සමඟ පහළ වූ චක්ඛායතනය පවතී. ඒ චක්ඛායතනය තුළ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, නැමැති භූත රූප 4 ක් පවතී. ඒ භූත රූප 4 හි උපකාරය නිසා සම්පටිච්ඡන සිත සමග අලුත් චක්ඛායතනයක් පහළ වන්නේය. සම්පටිච්ඡන සිතද චක්ඛායතනය පහළ වීමට උපකාර වේ. නමුත් මේ සඳහා විශේෂයෙන් භූත රූප 4 උපකාරවෙයි. භූත රූප 4 හි උපකාරය නොමැතිව චක්ඛායතනයක් පහළ නොවේ. උදා:- අන්ධ පුද්ගලයෙකුගේ චක්ඛායතනය මැරී පවතී. චක්ඛු ප්‍රසාදය ක්‍රියා නොකරයි. නමුත් සෝතායතනය තිබේ. කණින් ශබ්ද අසා අරමුණු ගැනීමේ හැකියාව පවති. මේ ශබ්ද අසන විට දී සම්පටිච්ඡන සිත පහළ වේ. ඒ සම්පටිච්ඡන සිත සමඟ, සෝතායතනය සමඟ, මීට පෙර අප හඳුනාගන්නා හැම චිත්තක්ෂණයක් ගානේ ම, මුළු ශරීරය පුරාම, කර්මජ රූප පහළවන බව. මේ කියන ආකාරයෙන් සෝත විඤ්ඤාණ සිත සමඟවත්, අනෙක් විඤ්ඤාණ සිත් සමඟවත් චක්ඛායතනයක් පහළ නොවේ. හේතුව නම් චක්ඛායතනය මුලින්ම මැරී පවතීමයි. චක්ඛායතනය මුලින්ම මැරී ඇතැයි යනු චක්ඛායතනය ආරක්ෂා කරගෙන එනු ලබන මහා භූත රූප 4 මැරී ඇති බැවිනි. චක්ඛු ප්‍රසාද රූපය සහිත රූප 10 ම මැරී පවති. චක්ඛු ප්‍රසාදයේ අක්‍රිය බව නිසා මහා භූතයන්ගෙන් අලුතින් චක්ඛායාතනයක් බිහිකළ නොහැකිය. චක්ඛු ප්‍රසාදය සහිත චක්ඛායතනයක් බිහිකළ නොහැකිය. සම්පටිච්ඡන සිත සමග අලුතින් චක්ඛායතනයක් පහළවේ. අලුතින් චක්ඛායතනයක් පහළවීමට පෙර චක්ඛායතනයක් පහළ වී තිබිය යුතුයි. එසේ පෙර චක්ඛායතනයක් නොමැතිව අලුතින් චක්ඛායතනයක් පහළ නොවේ. ප්‍රතිසන්ධිය ක්ෂණයේ දී මේ සියල්ලම පහළ විය හැකි බව කෙනෙකුට අදහසක් මතු විය හැකිය. එසේ නොවේ. කාලයක් ගත වූ

පසු එම වස්තු හැදිය යුතුයි. හැදී වැඩුණු පසුයි පහළ වන්නේ. මේ සම්පටිච්ඡන සිත සමඟ චක්ඛායතනයක් පහළ වී තිබිය යුතුය. ඒ පහළ වූ සිත සමඟ පහළ වූ චක්ඛායතනයේ පවතින මහා භූත 4 හි උපකාරයෙන් සම්පටිච්ඡන සිත සමග අලුතින් චක්ඛායතනයක් බිහි වේ. මේ ආකාරයෙන් සෝත, ඝාණ, ජිව්හා, කායායතනයන් සියල්ලමත් සම්පටිච්ඡන සිත සමඟ පහළවේ. මේ කියන ආකාරයෙන් නාමරූප පච්චයා සළායතන හි රූප යනු පුරේජාත වශයෙන් පහළ වූ ඒ ඒ කලාපීය මහා භූත 4 යි. ඒ රූපායතනවල කලාපීය මහ භූත 4 නිසාවෙනි. අලුතින් ආයතන බිහි වූයේ එතැන **රූප පච්චයා සළායතන** වේ. රූප එකතුවෙන් සළායතනය, **නාම පච්චයා මනායතනය** මේ ආකාරයෙන් තේරුම් ගත යුතුය.

**ඡට්ඨායතන පච්චයා ඵස්සො,** ජට්ඨායතන සමපටිච්ඡන මනායතනයයි. සම්පටිච්ඡන මනායතනය නිසා සම්පටිච්ඡන ඵස්සය. මෙහි දී **සළායතන පච්චයා ඵස්සො** ලෙසින් පොදු අර්ථයක් ගෙන නොදේ. මෙය මතක තබාගත යුතුය. **ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛ පච්චයා ජාති, ජරා, මරණ** වේ. පච්චය චතුෂ්කය සේ ම හේතු චතුෂ්කය, සම්ප්‍රයුක්ත චතුෂ්කය, අඤ්ඤමඤ්ඤ චතුෂ්කය, චතුෂ්ක 4 ම වෙන වෙනම අර්ථ විග්‍රහ කරගත යුතුය.

315 '**කතමෙ ධම්මා අබ්‍යාකත, යස්මිං සමයෙ -පෙ- මනොවිඤ්ඤාණ ධාතු - සොමනස්ස සහගතා -පෙ-**'

සොමනස්ස සහගත මනෝවිඤ්ඤාණ ධාතුවක් උපදී. පෙර ජීවිතයේ කරන ලද කුසලයන්ගේ විපාක වශයෙනි. සෝමනස්ස සහගත සංතීරණ සිතය. කුසල විපාක සෝමනස්ස සහගත සංතීරණ සිතයි. ඒ සිත රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන ආරම්මණයක් නිසා උපදී. ධම්මායතනයෙන් ඉපදිය හැකිද? රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, නැමැති පංචාරම්මණය නිසා පමණයි සංතීරණ සිත පහළ වන්නේ. කෙනෙක් භාවනා කරන විටදී සංතීරණ සිත පහළවීමට පුළුවනි යැයි සිතිය හැක. ධම්මාරම්මණ සංතීරණ සිත් පහළ නොවේ. පංචාරම්මණය නිසා පමණයි සංතීරණ සිත, සම්පටිච්ඡන සිත ද පහළ වන්නේ සොමනස්ස, සහගත

සංතීරණ සිත ගත් විට එහි වෙනසක් නැත. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං; විඤ්ඤාණ පච්චයා නාමං; -පෙ-**

වේදනාව සෝමනස්ස සහගත වේ. නාමධර්ම වෙනස් වේ. සම්පටිච්ඡන සිතේ නාම ධර්ම ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය මනසිකාර යන සබ්බචිත්ත සාධාරණ 7 ද පහළ වේ. මේ සම්පටිච්ඡන සිත අහේතුක නිසා ඡන්ද පහළ නොවේ. මේවා මන්දගාමී, අහේතුක සිත් හෙයින් විරිය පහළ නොවේ. උපෙක්ඛා සහගත හෙයින් ප්‍රීති පහළ නොවේ. විතක්ක, විචාර අධිමොක්ඛය පහළ වේ. සම්පටිච්ඡන සිත සමඟ නාම ධර්ම 11ක් පහළ වේ. සංතීරණ සිත ගත් විට, සෝමනස්ස සහගත සංතීරණ සිත හෙයින් ඵස්ස, වේදනා සංඥා, චේතනා, ඒකග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය මනසිකාර නාම ධර්ම 7 පහළ වේ. මේ සිත් අහේතුක බැවින් ඡන්දය පහළ නොවේ. මන්දගාමි සිත් හෙයින් විරිය පහළ නොවේ. නමුත් සෝමනස්ස සහගත බැවින් ප්‍රීතිය පහළ වේ. විතක්ක, විචාර, අධිමොක්ඛය පහළ වේ. සියල්ල 11 කි. සිත සමග 12 කි. මෙහි ද පෙර සේ නය ක්‍රම පැහැදිලි කරගත යුතුයි. මෙහි නය ක්‍රම 4 ට ම යෙදේ. **I නාම පච්චයා ඡට්ඨායතන, II නාම පච්චයා ඵස්ස, III විඤ්ඤාණ පච්චයා නාමරූප, ඡට්ඨායතන පච්චයා ඵස්ස, IV විඤ්ඤාණ පච්චයා නාමරූප, නාමරූප පච්චයා සළායතන, ඡට්ඨායතන පච්චයා ඵස්ස.** මේ ආකාරයට නය ක්‍රම 4 ට ම චතුෂ්ක 4 තේරුම් ගත යුතුය. වෙනස නම් සෝමනස්ස වේදනාව නිසා ප්‍රීතිය චෛතසිකය වැඩිවීම පමණයි.

317 **කතමෙ -පෙ-**

ඊළඟ සිත උපෙක්ඛා සහගත මනෝවිඤ්ඤාණධාතු සිතය. එනම් උපෙක්ඛා සහගත සංතීරණ සිතයි. මේ සිත තුළ පහළ වන නාම ධර්ම නම් ප්‍රීතිය හැර නාම ධර්ම 11 කි. මේ සිතත් පෙර අර්ථ විග්‍රහය හා සමානයි. කිසිම වෙනසක් නොමැත. උපෙක්ඛා වේදනාව පහල වේ. මේ ආකාරයෙන් අර්ථ විග්‍රහ කරගත යුතුය.

(සෝමනස්ස සංතීරණ සිත තුළ ක්‍රියාකාරකම් නම්, 1. සම්පටිච්ඡන සිතෙන් ගත් අරමුණු තීරණය කරයි. පංචද්වාරික වශයෙන් ගන්නා වූ අරමුණක් තිබේනම් ඒ අරමුණු තීරණය කරමින් පහළ වන්නට පුලුවනි.

2. චිත්ත වීථියක තදාරම්මණ වශයෙන් පහළ විය හැකිය. තදාරම්මණ වශයෙන් පහළවීමේ ශක්තියක් පවති. ප්‍රධාන වශයෙන් මේ කාර්යයන් 2 සිදු කරයි. බුදුරජාණන් වහන්සේ මෙය කොටස් 2 කට බෙදා අර්ථ විග්‍රහ කරනු නොලැබේ. පොදුවේ එකට දේශනා කරන බැවින් අපි විසින් කොටස් 2 කට බෙදා අර්ථ විග්‍රහ කරගත යුතුය. සංතීරණ වශයෙන් පහළවන කෘත්‍යයේ දී පංචාරම්මණික පමණයි. නමුත් තදාරම්මණ කෘත්‍යයේ දී ෂඩාරම්මණිකයි, ධම්මාරම්මණය නිසා තදාරම්මණ පහළවන බැවිනි. මේ වෙනස අවබෝධ කරගත යුතුය. එකම සිත කෘත්‍යය 2 කි. උපෙක්ඛා සහගත සංතීරණ සිතෙහි, කෘත්‍ය 3 ක් පවතී. පංචද්වාරික වශයෙන් ගන්නා අරමුණ තීරණය කිරීමේ සංතීරණ කෘත්‍යය. ඒ ඒ චිත්තවිථියේ තදාරම්මණ කෘත්‍ය, අහේතුක සුගති ප්‍රතිසන්ධික කෘත්‍ය. ද්විහේතුක දුබල ප්‍රතිසන්ධිය ගෙනදෙයි. කුසල විපාක හෙයිනි. කුසල විපාකයේ ද්විහේතුක දුබල ප්‍රතිසන්ධියකි. මනුෂ්‍ය ලෝකයේ අංග විකල, මන්ද බුද්ධික, අඳ ගොළු බිහිරි වී උපදින්නේ. කුසල විපාක උපේක්ඛා සහගත සංතීරණ සිතිනි ඔවුන් උපදින්නේ. සෝමනස්ස සහගත සංතීරණ සිතින් ප්‍රතිසන්ධියක් ගෙන නොදේ. ප්‍රතිසන්ධි කෘත්‍ය ගෙන දෙන්නේ උපේක්ඛා සහගත සංතීරණ සිත් 2 කින් පමණි.

ඒ සංතීරණ සිත් 3 ක් පවතී. එයින් සිත් 2 කින් පමණයි ප්‍රතිසන්ධිය ගෙන දෙන්නේ. සෝමනස්ස සහගත සිතින් ප්‍රතිසන්ධියක් ගෙන නොදේ. මේ අනුව ධම්මාරම්මණය යෙදී ඇත්තේ කුමන හේතුවක් නිසාදැ යි පැහැදිලි කරගත හැක. මනෝ විඤ්ඤාණ ධාතු ලෙසයි. භාවිත වී ඇත්තේ මෙයට සංතීරණ සිතත්, තදාරම්මණ සිතත් ඇතුළත් වේ. නමුත් එකම සිතින් ක්‍රියාකාරකම් 2 ක් සිදුවේ. වෙන වෙන ක්‍රියාකාරකම්වල යෙදීමට මේ එකම සිතේ හැකියාවක් පවතී. එබැවිනි ධම්මාරමණය ඇතුළත් වී ඇත්තේ. උදා:- භාවනාවේ දී හෝ ධම්මාරමණය, ලෙස අරමුණක් සිතනවා පංචද්වාරාවජ්ජන සියල්ල වැසී පවතී. අපි දැන් ධම්මාරම්මණය වශයෙන් කුමන හෝ අරමුණක් සිතනවා. ජවන සිත් පහළ වී ඉන් අනතුරුව තදාරම්මණ සිත් 2 ක් පහළ වේ. මේ තදාරම්මණ සිත් 2 කි. සෝමනස්ස සහගත සංතීරණ සිත පහළ විය හැකිය. මෙහි පවතින්නේ

සුළු වෙනසකි. එය බෙදා දක්වා නොමැත. මෙය ප්‍රායෝගිකව සිතා ටීකා, අට්ඨකථාවලට ගලපා අර්ථ විග්‍රහ කරගත යුතුය. ධම්මාරම්මණය නිසා සංතීරණ මනෝ විඤ්ඤාණයක් පහළ නොවේ. නමුත් ධම්මාරම්මණය නිසා තදාරම්මණ මනෝ විඤ්ඤාණ ධාතුව පහළ වේ. ධම්මාරම්මණය නිසා උපේක්ඛා සහගත සංතීරණ සිතින් ප්‍රතිසන්ධි මනෝ විඤ්ඤාණ ධාතුව පහළ කර දෙන්න හැකියාව තිබේ.

## 02 සහේතුක කාමාවචර කුසල විපාක සිත්

කාමාවචර මහා විපාක සිත් 8 පිළිබඳවයි මෙහි දී පැහැදිලි වනුයේ, මෙහි දී සුළු වෙනසක් පවතී. නාමධර්ම පැහැදිලි කරගත් පසු වෙනස ඉක්මනින් පැහැදිලි වේ.

319 '**යස්මිං සමයෙ -පෙ- කාමාවචරස්ස කුසලස්ස -පෙ- සොමනස්ස සහගත ඤාණසම්පයුත්තා -පෙ-**'

ප්‍රධාන වශයෙන් මේ කාමාවචර මහා විපාක සිත් චිත්ත වීථියක තදාරම්මණ වශයෙන් පහළ වේ. ප්‍රතිසන්ධියක් ගෙන දුන් යම්කිසි සිතක් මහා විපාක සිතකින් ඒ ප්‍රතිසන්ධි අවස්ථාව, භවාංග අවස්ථාව, චුති අවස්ථාව යන අවස්ථා වලදී මේ මහා විපාක සිත දැකිය හැකි.

මේ මහා විපාක සිත් එකකින් හඳුනාගෙන ඒවායේ නාමධර්ම ද හඳුනාගත යුතුය. ඒ නාම ධර්ම තුළ පහළවන පටිච්ච සමුප්පාද අංගයන් බලනවා යනු ප්‍රතිසන්ධි සිතෙන් නාමධර්ම බලා එම සිතේ පහළවන පටිච්ච සමුප්පාද අංගයන් දැකීමය. එසේම භවාංග සිත හඳුනාගෙන ඒ සිතේ පහළවන පටිච්ච සමුප්පාද අංගයන් වෙන වෙන ම දැක විදර්ශනා වැඩිය හැකිය. චුති, තදාරම්මණ චිත්ක්ෂණයේ ද බැලිය හැක.

පළමුව මේ සිත් 8 හි වෙනස තෝරාගත යුතුය. පළමු සිත සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික මහා විපාක සිත. සෝමනස්ස සහගත බැවින් ඥාන සම්ප්‍රයුක්ත බැවින්, අසංඛාරික බැවින්, විපාක සිතක් යන බැවින් නාමධර්මයන්හි යම් යම් වෙනස්කම් පවතී. විපාක සිත්වල ඒ අප්පමඤ්ඤා 2 ත්, විරති 3 ත් කිසිම විටක පහළ නොවේ. ලෞකික විපාක හෙයින් විරති 3, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව පහළ නොවේ. කරුණා, මුදිතා යන ඒ අප්පමඤ්ඤා 2 ත් විපාක සිතේ

පහළ නොවේ. නාමධර්ම වශයෙන් උපරිම 33 ක් පහළ වේ. සිත සමග 34 ක් වේ. පළමු සිත සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත නිසා නාමධර්ම 34 ම පහළ වේ. මේ නාම ධර්ම 34 ට අදාළව හේතුඵල අනුව පටිච්චසමුප්පාද අංගයන් බැලිය හැක.

සොමනස්ස සහගත ඥාන සමුප්‍රයුක්ත අසංඛාරික මහා විපාක පළමු සිත්හි පහළ වූ චේතනාව නිසා, පළමු විපාක සිත පහළ වේ. එම විපාක සිත නිසා විපාක නාමස්කන්ධ පහළ වේ. නාමස්කන්ධ නිසා විපාක මනායතනය පහළ වේ. විපාක මනායතනය නිසා විපාක මනෝසම්ඵස්සය පහළ වේ. විපාක මනෝසම්ඵස්සය නිසා සම්ඵස්සජා වේදනාව, (සෝමනස්ස වේදනාව) පහළ වේ. ඒ සෝමනස්ස වේදනාව නිසා ප්‍රසාදය, (ශ්‍රද්ධාව, චෛතසිකය,) ඒ සිතේ පහළ වේ. ශ්‍රද්ධාව නිසා අධිමොක්ඛය පහළ වේ. අධිමොක්ඛය නිසා භවය, (සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම) හට ගනී. ඒ භවය නිසා ඒ විපාක සිතේ උත්පාදාක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය - (ජාති, ජරා, මරණ) ආදිය පහළ වේ. දෙවැනි නය ක්‍රමයේ වෙනස, **නාම පච්චයා ඵස්සො** ඡට්ඨායතනය ගැන සඳහන් නොවේ. විපාක සිතේ නාමස්කන්ධ නිසා මනෝසම්ඵස්සය පහළ වේ.

ඊළඟට **විඤ්ඤාණ පච්චයා නාමරූපං, ඡට්ඨායතන පච්චයා ඵස්සො** ලෙස යෙදේ. පළමුවෙනි විපාක සිත නිසා පහළවන නාමරූප, සහජාත වශයෙන් පහළවන චිත්තජ රූපයි නාමස්කන්ධයි. පළමුවෙනි විපාක සිත තදාරම්මණ සිත් වශයෙන් පහළවන විට හෘද වස්තුව ඇසුරු කොටගෙන පහළවන අතර ඒ සිත සමඟද චිත්තජ රූප පහළ වේ. සහජාත වශයෙන් නාමස්කන්ධ පහළ වේ. **නාමරූප පච්චයා ඡට්ඨායතනං** හි දී ඒ පළමුවෙනි තදාරම්මණය පෙර පහළ වන 7 වෙනි ජවන් සිත සමඟ අලුතින් හෘද වස්තුවක් පහළ වේ. ඒ හෘද වස්තු රූපය ආධාරයෙන් තදාරම්මණ මනායතනය පහළ වේ. තදාරම්මණ මනායතනය පහළවීමට නම් හෘද වස්තු රූප උපකාරී විය. එනම් නාමරූප ලෙස හඳුන්වන විටදී පුරෙජාත රූපය, රූපය වශයෙන්. නාම වශයෙන් සහජාත නාම

වේ. ඒ අනුව **නාමරූප පච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතන පච්චයා ඵස්සො** ආදී ලෙස පැහැදිලි කරගත යුතුය.

හතරවෙනි නය ක්‍රමයේ දී වෙනස **සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, ඡට්ඨායතනං පච්චයා ඵස්සො** -පෙ-

පළමු විපාක සිත නිසා, විඤ්ඤාණ සිත නිසා සහජාත චිත්තජ රූප සමඟ නාමරූප පහළ වේ. **නාමරූප පච්චයා සළායතනං** හි දී හත්වෙනි ජවනය සමග පහළ වූ රූපායතනය (චක්ඛායතන ආදී ආයතනවල) පවතින මහා භූත රූපයන්ගේ උපකාරයෙන් තදාරම්මණ සිත සමග නැවත අලුතින් ආයතන පහළ කර දෙයි. ඒ අලුතින් පහළ වූ ආයතන 6 සළායතන ලෙස හැඳින්වේ. **සළායතන පච්චයා ඵස්සො** ලෙස දේශනා නොකොට, **ඡට්ඨායතන පච්චයා ඵස්සොඃ** ලෙස දේශනා කරයි. එනම් හෘද වස්තුව ඇසුරු කරගෙන පහළ වූ මනායතනය නිසා මනෝ සම්ඵස්සය පහළ විය.

**ඵස්ස පච්චයා වෙදනාඃ** මෙහි දී සෝමනස්ස වේදනාවයි. වේදනාව නිසා ප්‍රසාදය, ප්‍රසාදය නිසා අධිමොක්ඛය. අධිමොක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ භවය, සතර නාමස්කන්ධයන්ගේ උත්පාදක්ෂණය ජාති, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය වේ.

මේ ආකාරයට පළමු විපාක සිත හඳුනාගත් සේ ම දෙවැනි විපාක සිත හඳුනාගත හැකිය. එහි වෙනස සසංඛාරිකයි. අනික් කිසිදු වෙනසක් නොමැත.

තුන්වෙනි සිත සෝමනස්ස සහගතයි ඤාණ විප්‍රයුත්තයි. අසංඛාරිකයි. ඤාණ විප්‍රයුක්ත යනු ප්‍රඥාව නොයෙදේ. නාම ධර්ම එකක් අඩු වී සිත සමඟ නාම ධර්ම 33 ක් වේ.

සතරවෙනි සිතෙහි සසංඛාරික බවයි පවතින වෙනස අනික් ඒවාහි වෙනසක් නැත. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත උපෙක්ඛා සහගත වන විටදී නාමධර්ම 33 ක් වේ. ප්‍රීතිය නොයෙදේ. ප්‍රඥාව පවතී.

ඊළඟ සිතෙහි නාම ධර්ම සමානයි. සසංඛාරික බවයි පවතින වෙනස වන්නේ. හත්වෙනි සිත; උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරිකයි. උපෙක්ඛා සහගත හෙයින් ප්‍රීතිය නැත. ඤාණ විප්‍රයුක්ත නිසා ප්‍රඥාව නැත. ඒ අනුව නාම ධර්ම 2 ක් අඩු වී සියලු නාම ධර්ම 32 ක් වේ. ඒ නාම ධර්ම 32 ට අදාළව පටිච්චසමුප්පාද අංගයක් බැලිය යුතුය. අවසාන අටවන සිතෙහි ද කිසිදු වෙනසක් නැත. සසංඛාරික බව පමණයි වෙනස. නාම ධර්ම 32 කි.

මේ සිත් සමුදායේ දී සොමනස්ස සහගත සිත්වල දී සෝමනස්ස වේදනාව පහළ වේ. උපෙක්ඛා සහගත සිත්වල දී උපෙක්ඛා වේදනාව පහළ වේ. පෙර හඳුනාගත් ආකාරයට පච්චය චතුෂ්කයට, හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ චතුෂ්කයට අදාළව වෙන වෙනම ඒ චිත්ත විථිවල පහළවන තදාරම්මණ අවස්ථාවල දී මේ සිත් පහළ වන ආකාරය හඳුනාගෙන වෙන වෙනම පටිච්ච සමුප්පාද අංගයන් බැලිය යුතුය. සහජාත වශයෙන්, ඒක චිත්තක්ෂණික වශයෙන් බැලිය යුතුය. මේ සිත් හඳුනාගත් පසු, ප්‍රතිසන්ධි කෘත්‍ය ගෙන දෙන සිත් 19 ක් පවති. මහා විපාක 8, කුසල විපාක උපෙක්ඛා සහගත සංතීරණ සිතත් සමඟ සිත් 9 අප දැන් හඳුනා ගන්නා ලදි. මනුෂ්‍ය ලෝකයේ ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් විපාක සිත් 4න් ගෙන දේ.

අපේ ප්‍රතිසන්ධි සිත හඳුනාගත් පසු ඒ ප්‍රතිසන්ධි සිත සමඟ පහළවන නාමධර්මයන් හඳුනාගෙන ඒ සිතේ පහළවන පටිච්චසමුප්පාද අංගයන් වෙන වෙනම බැලිය හැක. ප්‍රතිසන්ධි අවස්ථාවේ දී කර්මජ රූපයන්ගේ හටගැනීම දැකිය හැකිය. චිත්තජ රූප නොමැත. මෙවැනි අවස්ථාවල වෙනස්කම් පවති. නාමරූප හටගත්තා. **නාමරූප පච්චයා ෂඩායතනය** නමුත් **නාමරූප පච්චයා සළායතන** ඒ ප්‍රත්‍යයේ දී හැමතැන්හිම ගත නොහැකිය. හේතුව නම්, මනුෂ්‍යයන් ලෙස ප්‍රතිසන්ධි අවස්ථාවේ දී හෘදය වස්තුව ඇසුරු කරගෙන පහළවන රූප පමණයි පවතින්නේ අනික් ආයතන පහළ නොවේ. ඕපපාතික ලෙස පහළ වී ඇත්නම් ඒ තැනැත්තාට සළායතන බැලිය හැකිය. ඒ ඒ අවස්ථා අනුව කරුණු තේරුම් ගත යුතුය.

## 03 රූපාවචර විපාක සිත්

අපට මෙම රූපාවචර සිත් හඳුනා ගැනීමට පමණයි හැකියාව ඇත්තේ ධ්‍යාන විපාක සිත් අපට පහළ නොවන බැවින් පටිච්චසමුප්පාද අංගයන් අපට බැලිය නොහැක. ධ්‍යාන විපාක සිත් පහළ වන්නේ ඒ ඒ බ්‍රහ්මලොව ප්‍රතිසන්ධි ලැබූ බ්‍රහ්මයන්ට පමණි. ප්‍රථම ධ්‍යානයට අනුරූපව ප්‍රථම ධ්‍යාන බඹලොව ඉපදුණු ඒ සත්ත්වයාට ඒ ප්‍රතිසන්ධි සිත භවංග සිත හඳුනාගෙන ඒ පටිච්චසමුප්පාද අංගයන් බැලිය හැක. ද්‍රුතිය ධ්‍යානයට අනුරූපව කෙනෙක් ද්‍රුතිය ධ්‍යාන බඹලොව පහළ වුණා නම් ඒ ප්‍රතිසන්ධි සිත භවංග හඳුනාගෙන පටිච්චසමුප්පාද අංග බැලිය හැකිය. මේ ආකාරයට තතිය ධ්‍යාන, චතුත්ථ ධ්‍යාන, පංචම ධ්‍යාන තේරුම්ගත යුතුය.

මෙහි දී කෙටියෙන් පැහැදිළි කරනවා නම්, යමෙක් ප්‍රථම ධ්‍යාන උපදවා ගෙන ප්‍රථම ධ්‍යානය මරණාසන්න අවස්ථාවේ දී මරණාසන්න ජවන් වශයෙන් අරමුණු වී ඒ තැනැත්තා ප්‍රථම ධ්‍යාන බඹලොව ප්‍රතිසන්ධිය ලබයි. ප්‍රථම ධ්‍යාන බඹලොව ප්‍රතිසන්ධිය ලැබූ පසු ඒ ප්‍රතිසන්ධි චිත්තක්ෂණය හෝ භවයේ චිත්තක්ෂණය තුළ දී, තදාරම්මණ වශයෙන් මේ ධ්‍යාන සිත් පහළ නොවන බැවින් බඹලොව ඉපදුණත් මේ ධ්‍යාන සිත් තදාරම්මණ වශයෙන් පහළ නොවේ. ප්‍රතිසන්ධි, භවංග, චුති වශයෙන් පමණයි පහළ වනුයේ ඒ සිත හඳුනාගෙන, **සංඛාර පච්චයා විඤ්ඤාණ,** ඒ පහළ වන ඒ ප්‍රථම ධ්‍යාන විපාක චේතනාව නිසා ප්‍රථම ධ්‍යාන සිත පහළ විය. ප්‍රථම ධ්‍යාන සිත නිසා ප්‍රථම ධ්‍යාන නාමස්කන්ධ පහළ විය. ප්‍රථම ධ්‍යාන නාමස්කන්ධ නිසා ප්‍රථම ධ්‍යාන මනායතනය පහළ විය. ප්‍රථම ධ්‍යාන මනායතනය නිසා ප්‍රථම ධ්‍යානය මනෝ සම්ඵස්සය පහළ විය. ප්‍රථම ධ්‍යානය මනෝසම්ඵස්සය නිසා ප්‍රථම ධ්‍යාන වේදනාව, සෝමනස්ස වේදනා පහළ විය. ප්‍රථම ධ්‍යාන සෝමනස්ස වේදනාව නිසා ප්‍රථම ධ්‍යානය ශ්‍රද්ධාව පහළ විය. ඒ ශ්‍රද්ධාව, ප්‍රසාදය නිසා අධිමෝක්ඛය පහළ විය. අධිමෝක්ඛය නිසා සතර නාම ස්කන්ධයන්ගේ උත්පත්තිය පහළ විය. උත්පත්තිය යනු ජාතිය, උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය (ජාති, ජරා මරණ) පහළ විය. මේ ආකාරයට ඒ ඒ අවස්ථා දැකිය හැක.

දෙවැනි නය ක්‍රමයේ දී **නාම පච්චයා ඵස්සො**, සතර නාමස්කන්ධයන් නිසා මනෝසම්ඵස්සය පහළ වන ආකාරය මනායතනයේ සම්බන්ධයක් නොමැතිව සිදුවේ.

තුන්වෙනි අවස්ථාවේ දී, **විඤ්ඤාණ පච්චයා නාමරූපං**, ඒ ප්‍රතිසන්ධි අවස්ථාවේ දී පහළවන කර්මජ රූප භවාංග සිත නිසා පහළවන චිත්තජ රූප, දකින්න පුළුවනි. **නාමරූප පච්චයා ඡට්ඨායතනං**, ප්‍රතිසන්ධි අවස්ථාවේ දී පහළ වූ කර්මජ රූපයි නාමස්කන්ධ නිසා ප්‍රතිසන්ධි මනායතනය පහළ වේ. භවංග චිත්තක්ෂණයක් පාසා පහළවන චිත්තජ රූපයි. ඒ නාමස්කන්ධ නිසා මනායතනය පහළ වේ. මෙය **නාමරූප පච්චයා ඡට්ඨායතනං** වේ. **නාමරූප පච්චයා සළායතනං** යන්න ගැන කථා කිරීමට නොහැක. බ්‍රහ්මලෝකයේ චක්ඛායතනය, සෝතායතනය සහ මනායතනය පමණයි පහළ වන්නේ. අනෙක් ආයතන පහළ නොවේ. මෙහි දී ආයතන 3ක් ගැන පමණයි සාකච්ඡා කරන්නේ. එනම් **නාමරූප පච්චයා සළායතනං** නොවේ. ආයතන 3ක් බැවින් 'තීනි ආයතනානි' **ඡට්ඨායතනය පච්චයා ඵස්සො....** යනාදි ලෙස වෙන වෙනම දැකිය යුතුය.

මේ ක්‍රමයට හේතු චතුෂ්කය, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ චතුෂ්කයන් ඒ ඒ බඹලොව අදාළ ව දුතිය ධ්‍යානයෙන් ප්‍රතිසන්ධිය ලැබුවා නම් ඒ සිතේ, භවාංග සිතේ, තතිය ධ්‍යාන ප්‍රතිසන්ධි සිතේත්, භවාංග සිතේත්, චතුත්ථ ධ්‍යාන ප්‍රතිසන්ධි සිතේ භවංග සිතේ, පංචමධ්‍යාන ප්‍රතිසන්ධි සිතේත් භවංග සිතේත්, ඒ ඒ චුති චිත්තක්ෂණවලින් බැලිය හැකිය. නමුත් චුති චිත්තක්ෂණයේ චිත්තජ රූප පහළ නොවන බැවින් පළමු සහ දෙවන නය ක්‍රම පමණයි සාකච්ඡා කළ හැක්කේ.

## 04 අරූපාවචර විපාක සිත්

අරූප විපාක සිත්හි, ආකාසානඤ්චායතන සිතෙන් යම්කිසි කෙනෙක් ප්‍රතිසන්ධිය ලැබුවා නම් ආකාසානඤ්චායතන බඹලොව ඒ උතුමන් වහන්සේලාට ඒ ප්‍රතිසන්ධි සිතේ භවංග සිතෙහි පටිච්ච සමුප්පාද අංගයන් බැලිය හැක. මෙහි දී පළමු සහ දෙවැනි නය ක්‍රමය පමණයි

සාකච්ඡා කළ හැකි වනුයේ. 3,4 නය ක්‍රමය කෙසේවත් බැලිය නොහැක. ඒ බඹලොව රූප ධර්මයන් නොමැති නිසා ආකාසානඤ්චායතන සිතෙහි පහළ වූ චේතනාව සංඛාරයි. ඒ චේතනාව නිසා ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි සිත, භවාංග සිත විඤ්ඤාණය පහළ විය. ඒ විඤ්ඤාණය නිසා ප්‍රතිසන්ධි සහ භවංග නාමස්කන්ධයන් පහළ විය. නාමස්කන්ධ නිසා ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි සහ භවංග මනායතනය, ඒ මනායතනය නිසා ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි භවාංග සම්ඵස්සය පහළ වේ. ඒ සම්ඵස්සය නිසා ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි භවංග උපෙක්ඛා වේදනාව පහළ වේ. වේදනාව නිසා ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි භවාංග ප්‍රසාදය පහළ වේ. ප්‍රසාදය නිසා අධිමොක්ඛය පහළ වේ. අධිමොක්ඛය නිසා භවය පහළ වේ. භවය නිසා ජාති ජරා මරණ පහළ වේ. ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධිය සහ භවාංග චිත්තක්‍ෂණවල මේ ආකාරයට පළමු නය ක්‍රමයට බැලිය හැක.

දෙවැනි නය ක්‍රමයේ දී වෙනස, **නාම පච්චයා ඡට්ඨායතනං** නාම ස්කන්ධ නිසා ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි භවාංග මනායතනය පහළවන ආකාරයයි. මේ ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය විඤ්ඤාණඤ්ඤායතනය නේවසඤ්ඤා -යතනය ඒ ඒ බඹලොව ප්‍රතිසන්ධි ලැබූ උතුමන් වහන්සේලාගේ ප්‍රතිසන්ධි සිතත් භවංග සිතත් චිත්තක්‍ෂණ හඳුනාගෙන පටිච්ච සමුප්පාද ආකාරයට, හේතුඵල ආකාරයට ඒ ඒ පරමාර්ථ ධර්මයන් හඳුනාගෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙස වැඩිය යුතුය. නමුත් නේවසඤ්ඤා නාසඤ්ඤා සිත විදර්ශනා කළ නොහැක.

කෙනෙක් විශේෂයෙන් මනුෂ්‍ය ලෝකයේ දී සෝතාපත්ති ඵලවලට පත්වෙලා අකාසානඤ්චායතන ආදී බඹලොව පහළ වුණා නම්, ඒ උතුමන් වහන්සේලාට මේ ආකාරයෙන් විදර්ශනා වඩා නිවන් මග සාදා ගැනීමට හැකිය. බඹලොව ගිය පමණින් අනෙක් අයට මේ ආකරයෙන් නාමධර්ම දැකිය නොහැක. නාමරූප හඳුනාගෙන විපස්සනා කළ නොහැකිය. බුදු කෙනෙක් අවශ්‍ය වේ. නැතිනම් සුදුසු අඩිතාලම අවශ්‍ය වේ. තනිවම විදර්ශනා වැඩිය නොහැක. රූපාවචර බඹලොව පහළ වුණී නම් බුදු

කෙනෙකුගේ බණ අසා තමාගේ සසර පුරුදු අනුව විදර්ශනා වඩා රහත් විය හැකිය. නමුත් සුදුසු අධිතාලම ලැබිය යුතුය. අනාගාමී වූ උතුමන් වහන්සේලාට කිසිදු ගැටළුවකින් තොරව ශුද්ධාවාස බඹලොවට ගොස් නිවන් දැකිය හැකිය. ඒ ඒ භූමීන්ට අනුව වෙනස් වන බව පැහැදිලි කරගත යුතුය.

ලෝකෝත්තර විපාක සිත්වලත් ඒ අප්පමඤ්ඤා 2 පහළ නොවේ. නමුත් විරති 3, විරති ලෙස නොව මාර්ගාංග ලෙස පහළ වේ. සම්මා වාචා, කම්මන්ත ආජීව පහළ වේ. කරුණා මුදිතා පහළ නොවේ. ඒ අනුව නාමධර්ම උපරිම 37 ක් පහළ වේ. ප්‍රථම ධ්‍යානය උපකාර කරගෙන යම්කිසි කෙනෙක් සෝතාපත්ති මාර්ගයට පත්වුණා නම්, මාර්ග චිත්තක්ෂණයෙන් අනතුරුව ඵල චිත්තක්ෂණය පහළ වේ. ඵල චිත්තක්ෂණයේ පහළවන සියලුම නාමධර්ම 37 සිත සමඟය. මේ නාමධර්ම 37 ක් තුළ, '**සංඛාර පච්චයා විඤ්ඤාණ...**' ලෙස අර්ථ විග්‍රහ කරගත යුතුය.

සාදු! සාදු! සාදු!

# අටවන දේශනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

323. **'කතමෙ ධම්මා -පෙ- ලොකුත්තරං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං ....... සංඛාර පච්චයා විඤ්ඤාණං - පෙ-එව මෙතෙසං ධම්මානං සමුදයො හොති'**

## 05 ලෝකෝත්තර විපාක සිත්

ලෝකෝත්තර විපාක සිත් සම්බන්ධයෙන්, ඒකචිත්තක්ෂණික වශයෙන් නැතිනම් ලෝකෝත්තර නැතිනම් ලෝකෝත්තර ඵල සිත්වල පහළවන ඒ පටිච්ච සමුප්පාද අංගයන් වෙන වෙනම හඳුනාගන්නා ආකාරය, එම අංග දැක ඒ තුළ විදර්ශනා වඩනා ආකාරය පිළිබඳ අර්ථ විග්‍රහයයි. මේ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරනු මිස මේ පිළිබඳව ප්‍රායෝගිකව වඩන්න, දියුණු කරගන්න අනිවාර්යෙන්ම ඒ සෝතාපත්තිඵල ආදී ඵලවලට පත්වෙලා සිටිය යුතුය. ඒ සෝවාන් ආදි උතුම් ආර්ය ශ්‍රාවකත්වයට පත් නොවුනා නම් අපට මේ පිළිබඳ නියම අවබෝධයක් ගත නොහැකිය. එනමුත් ඒ තත්ත්වයට පත්වනතුරු මේ ලෝකෝත්තර ඵල සිත්හි ස්වභාවය පටිච්චසමුප්පාද අංගයන් කරුණු කාරණා අනුව ලොව්තුරා බුදුපියාණන් වහන්සේ කරන ලද අර්ථ විග්‍රහයට අනුව අර්ථ විග්‍රහකර ගත යුතුය.

ලෝකෝත්තර යනු **'ලොකෙන උත්තරොති ලොකුත්තරො'** කාම ලෝකයෙන්, එනම් රූප ලෝකයෙන්, අරූප ලෝකයෙන් එතෙර වූ නිසා, එතෙර කරවන නිසා, උසස් භාවයට පත් වූ හෙයිනි. ලෝකෝත්තර භූමිය නම් වේ. ලෝකෝත්තර සිත්වලට අදාළ නියමිත වෙනම භූමියක් නොමැත. කාමාවචර භූමිය ලෙස වෙනම භූමියක් පවතී. කාමාවචර භූමියට සතර අපායයි, මනු ලොවයි, දිව්‍ය ලෝක 6 අයිති වේ. රූපාවචර භූමියට බ්‍රහ්මලෝක 16 ක් ඇතුළත් වේ. අරූපාවචර භූමියට අරූපාවචර

භූමි 4 ක් ඇතුළත් වේ. ලෝකෝත්තර භූමි ලෙස භූමි කීයක් පවතී ද? ලෝකොත්තර සිත්වලට, ලෝකොත්තර ගතියට වෙන් වූ නියම භූමියක් වෙනම භූමියක් නොමැත. එයට හේතු කාරණා සලකලා බැලුවහොත් කාමාවචර කුසලයක් හෝ අකුසලයක් සිදුකළ විට ඒ කුසලාකුසල කර්මශක්තියෙන් අපට විපාක ලැබේ. ඒ කුසලාකුසල කර්මශක්තියෙන් ලැබෙන විපාකයයි ප්‍රතිසන්ධිය ලෙස ප්‍රධාන වශයෙන් සැලකෙනුයේ. ඒ කුසලාකුසල ශක්තියෙන් ලබන ප්‍රතිසන්ධිය ලබන්නට නම් ඒ ප්‍රතිසන්ධියට, ඒ කුසලයට, ඒ අකුසලයට අදාළ භූමියක් තිබිය යුතුය.

කෙනෙක් අකුසල් පුරුදු කරමින් යන විටදී, අකුසල් සිත් 12 ක් සිත් වශයෙන් බෙදේ. උද්ධච්ච සිත හැර ඉතිරි අකුසල් සිත් 11 න් පුරුදු කළ අයෙකුට මරණාසන්න අවස්ථාවේ දී අකුසල් සිතක් පැමිණියොත් ඒ කර්මශක්තියට අනුරූපව ඒ තැනැත්තා සතර අපායේ ප්‍රතිසන්ධිය ගනියි. මේ අනුව තේරුම්ගත යුතුයි ප්‍රතිසන්ධියක් ගෙනදීමට,විපාකයක් ගෙනදීමට භූමියක් අවශ්‍ය වේ. දුබල කුසලයක් වැඩූ අයෙකු මරණාසන්න මොහොතකට දුබල කුසල පැමිණියහොත්, අනිවාර්යයෙන්ම මනුෂ්‍ය පථයේ ද්විහේතුක වශයෙන් අංගවිකල, මන්දබුද්ධික වී උපත ලබයි. තව පිරිසක් ත්‍රිහේතුක කුසල් වඩයි. කාමාවචර ත්‍රිහේතුක කුසල් වඩා ඒ කුසලයට අනුරූපව ප්‍රතිසන්ධිය මනුෂ්‍ය පථයේ උසස් මනුෂ්‍යයින් ලෙස හෝ දෙව්ලොව උපත ලබයි. මේ ආකාරයෙන් කාමාවචර කුසලයක් හෝ අකුසලයක් දියුණු කරනවා යනු මෙහි විපාක ඊළඟ භවයේ දී හෝ මතු සංසාරයේදී ගෙන දෙයි. ඊළඟ භවයේ විපාකදීමට ඒ කුසලයට හෝ අකුසලයට අනුරූපව උත්පත්තිය ලැබිය යුතුය. ඒ සඳහා තැනක් තිබිය යුතුය. ඒ ස්ථානය කාම භූමිය ලෙස වෙන්කරනු ලැබේ. යමෙක් ප්‍රථම ධ්‍යාන ආදි ධ්‍යාන වඩන ප්‍රගුණ කරන යෝගාවචරයෙකුට මරණාසන්න අවස්ථාවේ දී මේ ධ්‍යාන සිත පැමිණේ. මේ ධ්‍යාන සිතට අනුරූපව ඒ තැනැත්තා උත්පත්තිය ලැබිය යුතු භූමියක් තිබේ. ප්‍රථම ධ්‍යාන බඹලොව දුතිය ධ්‍යාන බඹලොව, තතිය ධ්‍යාන බඹලොව, චතුත්ථ සහ පංචම ධ්‍යාන බඹලොව ලෙසින් අභිධර්ම නය ක්‍රමයේ සිත්වලට අනුරූපව බ්‍රහ්මලෝක බෙදනු ලැබේ. තවද ප්‍රථම, දුතිය, තතිය චතුත්ථ යනාදි

ලෙස සතර නය ක්‍රමයට ද මේ බඹලොව බෙදා දක්වයි. මේ අනුව පැහැදිලි වන්නේ ඒ තැනැත්තා වඩන ධ්‍යානයට අනුරූපව ප්‍රතිසන්ධිය ගෙනදෙන භූමියක් පවතී. අරූපාවචර ධ්‍යානයක් වඩන යෝගාවචරයෙන් සිටී නම් ඒ අරූප ධ්‍යානයට අනුරූපව අරූප භවයේ උත්පත්තිය ලබයි. මෙහි දී තේරුම්ගත යුත්තේ කාමාවචර කුසල, අකුසල රූපාවචර කුසල, අරූපාවචර කුසල යන ලෞකික කුසල් සිත් 17 න්, අකුසල් සිත් 11 යන මේ කුසලාකුසල චේතනා සමුදාය කෙනෙක් වඩයි නම් එහි ප්‍රතිඵල විපාක ගෙන දෙන ප්‍රතිසන්ධිය ගෙන යම්කිසි භූමියක් පවතී. ලොකෝත්තර භූමියක් නොපවතින්නේ ඇයි? ලොකෝත්තර විපාක ලැබෙන්නේ දිට්ඨ ධම්ම වේදනීය වශයෙනි. මාර්ග සිත පහළවූවා නම් ඊළඟ චිත්තක්ෂණය අනිවාර්යෙන්ම ඵල චිත්තක්ෂණය වේ.

ඒ අතරතුර කාලයකුත් නොමැත. කාලයක් ගොස් විපාක දීමකුත් නැත. යම්කිසි කෙනෙක් සෝවාන් මාර්ග ඥානය පහළ කරගත්තා නම් ඒ මාර්ග චිත්තක්ෂණය එක් චිත්තක්ෂණයක් පමණි. ඒ මාර්ග චිත්තක්ෂණයෙන් අනතුරුව පහළ වන්නේ අනිවාර්යෙන්ම ඵල චිත්තක්ෂණයයි. විපාකයයි මෙය සන්දිට්ඨිකය. '**ස්වාක්ඛාතො භගවතො ධම්මො සන්දිට්ඨිකො, අකාලිකො......**' ආදි ධර්මයෝ ගුණ 6ක් පැහැදිලි කරයි. මේ ගුණ 6 සම්බන්ධ වන්නේ ආර්යමාර්ග ඵල හා සමඟය. කල්නොයවා විපාක දෙන හෙයින් අකාලිකයි. ඒ ඒ මොහොතම තමන්ටම දැකිය හැකි විපාක එතැනදී ම ලැබේ. සන්දෘෂ්ඨික වශයෙනි. අප විසින් කාමාවචර කුසලයක් සිදු කරයි. නමුත් මෙහි විපාක අපට අදම දකින්න නොලැබේ. කලාතුරකින් දැකිය හැකි නමුත් ඒ කුසලයේ විපාකය නොව ඒ කුසලය නිසා පෙර ජීවිතයේ කරගන්නා ලද කුසලයක විපාකය මතුවෙන්න පුළුවනි. නමුත් ඒ මොහොතේ කරන ලද විපාකය එවිටම නොලැබේ. ඒවා මතු ජීවිතවලදී ලැබේ. යම්කිසි කෙනෙක් ලෝකෝත්තර කුසල මාර්ගයකට පැමිණෙනවා යනු අනිවාර්යෙන්ම ඒ තැනැත්තා ඊළඟ චිත්තක්ෂණයෙන් ඵලය ලබයි. එබැවින් ලෝකෝත්තර ඵලය ඒ මොහොතට ලැබෙන බැවින් ඒ ඵලයට භූමියක් නොපවතින්නේ මරණාසන්න මොහොතට සෝතාපත්ති මාර්ග සිත පහළ වී සොතාපත්ති

ඵල සිතෙන් තව තැනක ප්‍රතිසන්ධියක් ගන්නවා යැයි අර්ථ විග්‍රහ කෙරේ නම් එය සම්පූර්ණයෙන්ම වැරදි කරුණකි. එසේ සිදුනොවන හෙයිනි. සාමාන්‍ය කුසලයක් මරණාසන්න මොහොතට පැමිණ ඒ කුසලයට අනුරූපව ප්‍රතිසන්ධියක් ලැබීම පැහැදිළි කරුණි. එය ලෞකික වශයෙනි. ලෝකෝත්තර වශයෙන් ගත් විට ලෝකෝත්තර මාර්ග කුසලය මරණාසන්න මොහොතට පැමිණ ලොකොත්තර ඵල සිතින් ප්‍රතිසන්ධියක් ගන්නවා යැයි අර්ථ විග්‍රහයක් ත්‍රිපිටක බුද්ධ වචනයේ කොතැනකවත් සඳහන්ව නැත. එසේවනවා නම් ලොකෝත්තර භූමියක් වෙනම පැවතිය යුතුය. සෝතාපත්ති භූමිය, සකෘදාගාමි භූමිය, අනාගාමි භූමිය අරහත්ථ ලෙස කිව යුතුය. ඒ විපාක සිතට අනුරූපව භූමියක් නොමැත. නමුත් ඒ උතුමන් වහන්සේලාගේ ගුණය අනුව වෙන් වූ භූමියක් පවතී. නමුත් ඒවායේ උපදින්නේ ඵලසිත් වලින් නොවේ. අනාගාමී ඵලයට පත්වූ අර්යයන් වහන්සේ නමක් ජීවිතයේ නිවන් නොදකියි නම් අනිවාර්යයෙන් ඒ ආර්යයන් වහන්සේ පංච සුද්ධාවාසයේ උත්පත්තිය ලබයි. වෙන කොහේවත් උප්පත්තිය නොලබයි. පංච සුද්ධාවාසයට යන්නේ අනාගාමි ඵලසිතින් නොවේ. චතුත්ථ ධ්‍යාන කුසලය මරණාසන්න මොහොතට පැමිණි හෙයින් ඒ කුසලයට අනුරූපව පංච සුද්ධාවාසයේ ප්‍රතිසන්ධිය ලබයි. සමථයානික වශයෙන් සමථ භාවනා වඩා, විපස්සනා වඩා, අනාගාමී තත්ත්වයට පත්වූවා නම් අනිවාර්යෙන්ම ධ්‍යාන පවතී. ස්වභාවයෙන් එම ධ්‍යාන මරණාසන්න මොහොතට මතු වී, ඒ ධ්‍යාන කුසලයට අනුරූපව බඹලොව පංච සුද්ධාවාසයේ උත්පත්තිය ලබයි. අනාගාමී මාර්ගය හෝ අනාගාමී ඵලය ඒ මරණාසන්න මොහොතට පහළ නොවේ. ප්‍රතිසන්ධියටත් පහළ නොවේ. නමුත් ඒ ශක්තිය නිසා පංචසුද්ධාවාසයට යයි.

(මනුලොවින් චුත වී දිව්‍ය ලෝකය හෝ බ්‍රහ්ම ලෝකයක හෝ ඉපිද සෝවාන් ආදි මාර්ග ඵලවලට පත්වන්නේ මේ ජීවිතයේ පුරුදු කරන ලද ගුණ අනුව, වැඩූ භාවනා ආදිය තිබේ. නමුත් නිවන් අවබෝධකර ගැනීමට නොහැකි වුනි නම්, ඒ ශක්තියෙන් ගොස් උත්පත්තිය ලැබූ පසු ඉතාමත් පිරිසිදු වටපිටාවක් පවතින හෙයින් පුරුදු කරන ලද ගුණ මතු වී ඒ මොහොතේම සෝවාන් ආදී මාර්ගඵල ලැබිය හැකිය. එසේම ඒ වේලාවේ

දී දෙව් කෙනෙකුගේ බණ අසා, බඹලොව දී ආර්ය බ්‍රහ්මරාජයෙකුගෙන් බණ අසා නිවන් දැකීමට පුළුවන. එසේ නොමැති නම් බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කාලයක නම්, බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා ඒ මොහොතේ නිවන් දැකිය හැක. උදාඃ මට්ටකුණ්ඩලී වස්තුව, මණ්ඩුක දිව්‍ය පුත්‍රයා)

පංච සුද්ධාවාසයේ උපදින්නේ ශ්‍රද්ධා ආදී ඉන්ද්‍රිය 5 අනුවයි. ඒ ඉන්ද්‍රිය 5 බලවත් වීමෙනි. චතුත්ථ ධ්‍යානයට සමවදින විටදී ශ්‍රද්ධාව බලවත් වූයේ නම්, අනාගාමී වහන්සේගේ ප්‍රාර්ථනාව අනුව අවිහ බඹලොව උපදි. වීර්ය, සති, සමාධි ප්‍රඥා ඉන්ද්‍රිය ධර්මවලට අනුරූපව ඒ ධ්‍යාන සිතට බලවත් වන ආකාරයට අනුව පංච සුද්ධාවාසයේ උපදී. මරණාසන්න මොහොතේ පහළ වන ධ්‍යාන කුසලයේ බලය අනුවයි. සෝවාන් මාර්ගඵල ආදියට පත්වන විටදී ශ්‍රද්ධානුසාරි, ධම්මානුසාරී ලෙස බෙදයි. පෙර ස්වභාවය මෙතැනදී ගනු නොලැබේ. පංචසුද්ධාවාසයට යනවිට මෙය නොගැනේ. සෝවාන් මාර්ග සිතක් පහළ වන විට ශ්‍රද්ධාව බලවත් වී නම් ඒ ආර්යයන් වහන්සේ ශ්‍රද්ධානුසාරි ලෙස සැලකේ. ප්‍රඥා ඉන්ද්‍රිය බලවත් වී සෝවාන් වී නම් ධම්මානුසාරි ලෙස සැලකේ. මෙහිදී මරණාසන්න මොහොතේ පහළ වන චතුත්ථ ධ්‍යාන කුසලය තුළ පහළවන ශ්‍රද්ධාදී පංච ඉන්ද්‍රියන්ගේ බලයට අනුවයි, පංච සුද්ධාවාසයේ උත්පත්තිය ලබන්නේ. අනාගාමී ඵල හෝ මාර්ගය මරණාසන්න මොහොතට නොපැමිණේ. අනාගාමී ඵලයට පත්වූ ආර්යයන් වහන්සේ තුළ ඒ සිතේ ශක්තියක් පවතී. සම්පූර්ණයෙන්ම සංයෝජන ධර්ම පහක් ප්‍රහීණ කර පවතී. ඉතාමත් පිරිසිදු සන්තානයක් පවතී. ඒ අනාගාමී ශක්තිය චතුත්ථ ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍ය වශයෙන් උපකාරී වීමෙන් පංචසුද්ධාවාසයට යනු ලැබේ. අනාගාමී ඵලයෙන් උපනිශ්‍රය නොලැබුණේ නම් යා නොහැකිය. සාමාන්‍ය කෙනෙකුට චතුත්ථ ධ්‍යානය වැඩු නමුත් අනාගාමී ඵලයේ උපනිශ්‍රයක් නොලැබෙන හෙයින් ඒ චතුත්ථ ධ්‍යානයෙන් පංච සුද්ධාවාසයට යෑමට බලයක් නොලැබේ.)

මේ ලෝකෝත්තර මාර්ගය ලබන විටදී නිවනට පිවිසීමේ දොරටු 3 ක් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදි. සුඤ්ඤත

විමොක්ෂය, අනිමිත්ත විමොක්ෂය, අප්පණිහිත විමොක්ෂය යනුවෙනි. සුඤ්ඤත විමොක්ෂය යනු, යම්කිසි කෙනෙක් නාමරූප, පංචස්කන්ධයන්. ආයතන ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සංඛාරුපෙක්ඛා ඥාණය දක්වා වඩයි. මේ 3 වැඩූමුත් ඒ 3 න්ම නිවනට නොයයි. මේ 3 ම එක අරමුණක් බවට පත් වී නිවනට පිවිසින්නේ නැත. කෙනෙක් සෝවාන් මාර්ග චිත්තවීථියට පත්වෙනවා යනු ඒ සංඛාර ධර්මයන් අනාත්ම වශයෙන් වඩයි. අනිත්‍ය, දුක්ඛ දකින්නේ නොමැතිව අනාත්ම වැඩිය නොහැක. අනිත්‍ය දුක්ඛ උදව්වෙහි අනාත්මය වඩන්නේ, අනාත්ම ලක්ෂණය යෝගාවචරයට ප්‍රකටවීම නිසා සෝවාන් මාර්ග චිත්ත වීථියේ දී භවංග, භවංග චලන, භවංග උපච්ඡේද, මනෝද්වාරාවජ්ජන පරිකම්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ මාර්ගඵල ලෙස පහළ වේ. මනෝද්වාරවජ්ජන සිතින් සංඛාර ධර්මයන් අනාත්මයි යන අරමුණ ගන්නා ලදි. මේ අරමුණ නිසා පරිකම්ම උපචාර අනුලෝම යන පහළවන ප්‍රධාන සිත් 3 න් මන්ද ප්‍රාඥයාට පහළ වේ. මේ සිත් කාමාවචර ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල වේ. ප්‍රථම ධ්‍යානයෙන් සෝවාන් මාර්ගයට පත්වනවා නම් පරිකම්ම, උපචාර, අනුලෝම ගෝත්‍රභූ දක්වා සිත් 4 ට සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත කුසල් වේ. දුතිය, තතිය, චතුත්ථ ධ්‍යානවලින් සෝවාන් මාර්ගයට පත් වේ නම් පරිකම්ම උපචාර, අනුලෝම, ගෝත්‍රභූ චිත්තක්ෂණයන් සියල්ල සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත කුසල් බවට පත්වේ.

පංචම ධ්‍යානයෙන් සෝවාන් මාර්ගයට පත්වනවා නම්, පරිකම්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ චිත්තක්ෂණයන් උපෙක්ඛා සහගත ඥාණ සම්ප්‍රයුක්ත බවට පත්වේ. සංඛාර ධර්මයන් අනාත්ම වශයෙන් වඩා පරිකම්ම උපචාර අනුලෝම දක්වා ගමන් කර ගෝත්‍රභූ සිත පහළ වේ. මේ සිත පහළවීමට නම් මේ සංස්කාර ධර්මයන් අනාත්ම වශයෙන් වඩා ආ උපනිශ්‍රයක් ලැබේ. නිර්වාණය අරමුණු කෙරේ. නිර්වාණය අරමුණු කෙරෙන්නේ නැතිනම් මේ ගෝත්‍රභූ සිතින් පෘථග්ජන ගෝත්‍රය බිඳිය නොහැකිය. පෘථග්ජන භවයෙන් උගුල්වා ඉහළ තත්ත්වයකට පත්කළ යුතුය. ඒ ඉහළ තත්ත්වයට පත්කරන්නේ ගෝත්‍රභූ සිතිනි. එවැනි ඉහළ තත්ත්වයකට පත්කිරීමට නම් ගෝත්‍රභූ සිතට ලොකු බලයක්

තිබිය යුතුයි. සංඛාර ධර්ම අනාත්ම වශයෙන් මුලින් පැමිණි පරිකම්ම, උපචාර, අනුලෝම චිත්තක්ෂණ හා සමානවම ඒ ස්වභාවධර්මයෙන්ම ගෝත්‍රභූ සිතක් පහළ වුවහොත් පෘථග්ජන ගෝත්‍රය බිඳෙන්නේ නැත. ඒ ගෝත්‍රභූ සිතට නිර්වාණය අරමුණු වේ. නිර්වාණය අරමුණු කරන පළමු චිත්තක්ෂණය වේ. ඒ ගෝත්‍රභූ සිතේ නිර්වාණය අරමුණු වෙද්දී පෘථග්ජන ගෝත්‍රය සම්පූර්ණයෙන්ම බිඳේ. පෘථග්ජන ගෝත්‍රය බිඳීමෙන් සෝවාන් මාර්ගයට පත්වේ. සෝවාන් මාර්ගයට පත් වූ පසු ඒ මාර්ග චිත්තක්ෂණයෙන් අනතුරුව ඵල චිත්තක්ෂණ 2 ක් පහළ වේ. ඒ ඵල චිත්තක්ෂණවල පහළවන නාම ධර්ම හඳුනාගෙන ඒ නාම ධර්මයන් තුළ පවතින පටිච්චසමුප්පාද අංගයන් අප දැන් පැහැදිලි කරගත යුතුය.

අනාත්මය වඩාගෙන සෝවාන් මාර්ගයට පත්වුණා නම් සුඤ්ඤත විමෝක්ෂයෙන් නිවන් දකී. සුඤ්ඤත විමෝක්ෂමාර්ගයට පත්වුණා යනු ඵලයත් සුඤ්ඤත විමෝක්ෂයයි. යම්කිසි කෙනෙක් අනිත්‍ය වඩා සෝවාන් මාර්ගයට පත්වූවා නම් අනිමිත්ත විමෝක්ෂයෙන් පත්වූ බවය. ඵලයට පත්වන්නේත් අනිමිත්ත විමෝක්ෂයෙනි. දුක්ඛ ලක්ෂණයෙන් සංඛාර ධර්ම වඩාගෙන පැමිණියා නම් ඒ දුක්ඛ ලක්ෂණය ප්‍රකට වූවා නම්, සෝවාන් මාර්ගයට පත් වන විට අප්පණිහිත විමෝක්ෂයෙන් නිවන් දුටු බව සැලකේ. ඵලයට පත්වූවා නම් අප්පණිහිත විමෝක්ෂයෙන් නිවන් දුටු බව සැලකේ.

සෝවාන් ඵල සිතේ නාම ධර්ම පළමුවෙන් හඳුනාගත යුතුය. කරුණා, මුදිතා හැර චෛතසික සියල්ල 36 ක් පහළ වේ. සිත සමඟ 37 කි.

**'තස්මිං සමයෙ සංඛාර පච්චයා විඤ්ඤාණං'** ඒ අවස්ථා පහළ වූ විපාක සිතේ චේතනාව සංඛාර වේ. ඒ ලෝකෝත්තර සෝතාපත්ති ඵල විපාක චේතනාව නිසා සෝතාපත්ති ඵල සිත පහළ වේ. සෝතාපත්ති ඵල සිත නිසා සෝතාපත්ති ඵල නාමස්කන්ධ පහළ වේ. **විඤ්ඤාණ පච්චයා නාමං** වේදනා, සංඥා, සංඛාර යන නාමස්කන්ධයන්ය. සෝතාපත්ති ඵල නාමස්කන්ධ නිසා චක්ඛායතනය පහළ වේ. සෝතාපත්ති ඵල වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධ නිසා සෝතාපත්ති ඵල මනායතනය පහළ වේ. සෝතාපත්ති ඵල මනායතනය නිසා සොතාපත්ති ඵල මනෝ

සම්ඵස්සය පහළ වේ. සෝතාපත්ති ඵල මනෝ සම්ඵස්සය නිසා සෝතාපත්ති ඵල වේදනාව පහළ වේ. ධ්‍යානයට අනුරූපව සෝමනස්ස වේදනාව, උපේක්ඛා වේදනා විය හැක. සෝතාපත්ති වේදනාවට අනුරූපව ප්‍රසාදය, ශ්‍රද්ධාව ඇතිවේ. සෝතාපත්ති ඵල සිතේ පහළවන ශ්‍රද්ධාව නිසා අධිමෝක්ඛය පහළ වේ. අධිමෝක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම, භවය ඇතිවේ. භවය යනු සෝතාපත්ති ඵල චිත්තක්‍ෂණයේ උප්පාදක්‍ෂණය ජාතිය, ඨිතික්‍ෂණය ජරාව, භංගක්‍ෂණය මරණය වේ. පළමුවෙනි නය ක්‍රමයට අනුරූපව දෙවැනි නය ක්‍රමයක් යෙදේ.

දෙවැනි නය ක්‍රමයේ වන **නාම පච්චයා ඵස්සොඃ** ඡට්ඨායතන නොයෙදේ සෝතාපත්ති ඵල සිතේ පහළ වූ චේතනාව සංඛාරයි. සෝතාපත්ති ඵල සංඛාර කියා සෝතාපත්ති ඵල උපදී. සෝතාපත්ති ඵල සිත නිසා වේදනාව, සඤ්ඤා, සංඛාර, සංඛ්‍යාත සෝතාපත්ති ඵල නාමස්කන්ධ පහළ වේ. සෝතාපත්ති ඵල නාමස්කන්ධ නිසා වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සෝතාපත්ති ඵල. සතර නාමස්කන්ධය නිසා සෝතාපත්ති ඵල මනෝසම්ඵස්සය පහළ වේ. සෝතාපත්ති ඵල මනෝසම්ඵස්සය නිසා වේදනාව. වේදනාව නිසා ප්‍රසාදය, ප්‍රසාදය නිසා අධිමෝක්ඛය, අධිමෝක්ඛය නිසා භවය, භවය නිසා ජාති ජරා මරණ එනම් උත්පාද ඨිති, භංග පහළ වේ.

තුන්වෙනි නය ක්‍රමයේ දී සෝතාපත්ති ඵලයට පත් වූ කෙනෙකුගේ සෝතාපත්ති ඵල සිතේ පහළ වූ චේතනාව නිසා සෝතාපත්ති ඵල විඤ්ඤාණය පහළ වේ. සෝතාපත්ති ඵල විඤ්ඤාණය නිසා නාමරූප පහළ වේ. චිත්තජ රූප සහ නාමස්කන්ධයි. නාමරූප නිසා ඡට්ඨායතන උපදී. මෙහි නාමරූප නම්, පුරෙජාත වශයෙන් මාර්ග සිත සමඟ පහළ වූ හෘදය වස්තුවේ උපකාරයෙන් සෝතාපත්ති ඵල මනායතනය පහළ වේ. ඒ සෝතාපත්ති ඵල මාර්ග පහළ වූ සිත සමඟ පුරේජාත හෘදය වස්තුවත් සහජාත වශයෙන් සෝතාපත්ති වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධ නිසා මනායතනය පහළ වේ. මෙයයි නාමරූප පච්චයා ඡට්ඨායතන ලෙස පැහැදිලි වනුයේ **ඡට්ඨායතන පච්චයා ඵස්සො,** ඵස්සෝ යනු සෝතාපත්ති ඵල මනෝ සම්ඵස්සයයි, ශ්‍රද්ධාව, අධිමෝක්ඛය, භවය, උත්පාද, ඨිති භංග (ජාති, ජරා, මරණ) ලෙස පහළ වේ.

හතර වන නය ක්‍රමයේ දී ඒ ඒ භූමියට අනුව වෙනස් වේ. සෝතාපත්ති ඵලයට මනුෂ්‍ය ලෝකයේ දී පත්වූවා නම්, ඒ තැනැත්තාට පෙර කී පරිදි **නාමරූප පච්චයා සළායතන** පහළ වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** ලෙස පහළ වේ. නමුත් රූපාවචර බඹලොව දී කෙනෙක් සෝවාන් ඵලයට පත් වුනි නම් ඒ බඹලොවට අනුරූපව ආයතන වෙනස් වේ. ඝාණ, ජිව්හා, කාය යන ආයතන 3 පහළ නොවන බැවිනි. සෝතාපත්ති ඵල විඤ්ඤාණය පහළ වේ. සෝතාපත්ති ඵල විඤ්ඤාණය නිසා සෝතාපත්ති ඵල නාමරූප උපදී. සහජාත වශයෙන් උපදින වේදනා, සංඥා, සංඛාර, නාමස්කන්ධ සහ චිත්තජ රූපත් මෙහි දී නාමරූප වශයෙන් පහළ වේ. සෝතාපත්ති ඵල නාමරූප නිසා සළායතන පහළ වේ. එහිදී නාමරූප ලෙස ගනු ලබන්නේ සෝතාපත්ති මාර්ග සිත සමඟ පහළ වූ කර්මජ රූප කලාප චක්ඛු දසක, සෝත දසක, ඝාණ, ජිව්හා කාය දසක පවතී. සෝතාපත්ති මාර්ග සිත සමඟ පහළ වූ ඒ පංචායතනික කර්මජ රූපයන්ගේ මහා භූත පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මහා භූත 4 නිසා සෝතාපත්ති ඵල සිතේ සළායතන උපදී සෝතාපත්ති ඵලයට පමණක් ආයතන ඉපදවීමේ හැකියාවක් නොමැත.

රූපාවචර බඹලොව උතුමන් වහන්සේ නමක් සිටි නම්, සෝතාපත්ති ඵලයට පමණක් සළායතන පහළ කිරීමේ හැකියාවට පැවතුණි නම්, ඒ බඹලොව ඝාණ, ජිව්හා, කාය පහළවීමට පුළුවනියි සිතිය හැක. එසේ නොවේ. ඒ සිතට කලින් යම් ආයතන පහළ වී තිබූ අතර ඒ ආයතනමයි නැවත පහළ වන්නේ. එසේ නොමැතිව අලුතින් ආයතනයක් පහළ කිරීමේ හැකියාවක් නොමැත. පෙර පහළ වූ ආයතනයක පවතින මහා භූත රූප 4 හි උදව්වක් නොමැතිව අලුතින් ආයතනයක් පහළ කිරීමේ හැකියාවක් නැත. ප්‍රතිසන්ධියක් ලබන අවස්ථාවේ දී කාය දසක, භාව දසක, වස්තු දසක නැමැති දසක 3ක් පහළ වේ. ඒ දසකයේ පවතින මහා භූතයන්ට හැකියාව ඇත්තේ තමන්ටම අදාළ දශකයන් පහළ කිරීමට පමණි. එසේ නොමැතිව කාය දසකයට, භාව දසකයක් බිහි කිරීමේ හැකියාවක් වත්, කාය දසකයට වස්තු දසකය බිහි කිරීමේ හැකියාවකුත් නොපවතියි. කාය දසකයේ පවතින මහා භූතරූප 4 ට කාය දසකයක්

බිහිකිරීමේ හැකියාව පමණයි. ඇත්තේ නමුත් කාය දසකයේ පවතින තේජෝවලට උතුජ රූප කලාප බිහිකිරීමේ හැකියාව පවතී. කාය දසකයේ මහා භූත රූප 4 හි එකතුවෙන් ජීවිත නවක කලාප බිහි කිරීමට හැකියාව තිබේ. එනම් පරම්පරා 3 ක් දැක්විය හැක. කාය දසක කලාපයේ මහා භූත 4 නිසා අලුතින් කාය දසකයක් පහළ කිරීමට ඒ කාය දසකයේ තේජෝ නිසා උතුජ රූප කලාප බිහිකිරීමටත් හැකියාව පවති. ඒ මහා භූත 4 නිසා ජීවිත නවක කලාප බිහිකිරීටමත් හැකියා තිබේ. ප්‍රතිසන්ධිය ලැබූ පසු ප්‍රතිසන්ධි උත්පාදක්ෂණයේ කාය දසක, භාව දසක, වස්තු දසක පමණි. ප්‍රතිසන්ධි චිත්තක්ෂණයට පත්වන විට ඒ කලාපයන්ගේ තේජෝවලින් උතුම් පරම්පරා බිහි කරන අතර ඒ ඒ කලාපයන්ගේ මහා භූත රූප 4 නිසා අලුතින් කර්මජ රූප පරම්පරා බිහි කළා. ජීවිත නවක කලාපත් බිහි කරයි. ප්‍රතිසන්ධි ඨිතික්ෂණයේ දී ජීවිත නවක කලාප බිහිවේ. ජීවිත නවක කලාප බිහිවූයේ කලින් පහළ වූ දසක රූප 3 හි පවතින මහා භූත 4 ශක්තියෙන්. ජීවිත නවක කලාපය බිහි වූයේ මේ අනුව තේරුම් ගත යුත්තේ ඒ ඒ කලාපීය කර්මජ රූපයන්ගේ මහා භූත රූප 4 ද නිසයි. අලුතින් පරම්පරා බිහිවන්නේ **නාමරූප පච්චයා සළායතනං** හි දී සෝතාපත්ති මාර්ග අවස්ථාවේ දී පහළ වූ යම්තාක් ආයතන ඒ ඒ සත්ත්වයාට අනුරූපව පවතී ද, ඒ ආයතනයන් තුළ පවතින මහාභූත 4 නිසා අලුතින් ආයතන සෝතාපත්ති ඵල චිත්තක්ෂණයත් සමඟ බිහි වේ. සෝතාපත්ති ඵල චිත්තක්ෂණයට තනියෙන් අලුතින් ආයතන බිහි කිරීමේ හැකියාවක් නොපවතී. ප්‍රතිසන්ධි චිත්තක්ෂණයට පමණයි අලුතින් කර්මජ රූප පහළ කිරීමේ බලය ඇත්තේ. වෙන කිසිදු චිත්තක්ෂණයකට තනිවම බලයක් නොපවතී.

**ඡටායතන පච්චයා ඵස්සො** : ඒ ඒ වේලාවේ පහළ වූ සෝතාපත්ති ඵල මනායතනය නිසා මනෝසම්ඵස්සය පහල වේ. මනෝසම්ඵස්සය නිසා වේදනාව, වේදනාව නිසා ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව නිසා අධිමෝක්ඛය, අධිමෝක්ඛය නිසා භවය, භවය නිසා ජාති ජරා මරණ උත්පාද, ඨිති භංගක්ෂණය පහළ වේ.

මේ ආකාරයෙන් සෝතාපත්ති ඵල සිත තෝරාගත යුතුය. පච්චය චතුෂ්කයේ නය ක්‍රම 4 ට සෝතාපත්ති ඵල සිත පැහැදිලි කරගත් ආකාරයටම හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ චතුෂ්කයන් වටහා ගත යුතුය.

සෝතාපත්ති ඵල සිත පැහැදිලි කරගත් සේ සකෘදාගාමි ඵල චිත්තක්ෂණය, අනාගාමී ඵල චිත්තක්ෂණය, අරහත් ඵල චිත්තක්ෂණය යන ඵල චිත්තක්ෂණය යන ලෙසින් 4 හි නාමධර්ම හඳුනාගත යුතුය. ධ්‍යානවලට අනුරූපව නාම ධර්මයන්හි වෙනසද වටහා ගත යුතුයි. දුතිය ධ්‍යානයෙන් සෝවාන් මාර්ගයට පත් වුණා නම් විතක්ක, විචාර චතුෂ්ක නය ක්‍රමයට අනුව නොයෙදේ. තතිය ධ්‍යානයෙන් සෝවාන් මාර්ගයට පත්වූවා නම් ප්‍රීති නැත. චතුත්ථ ධ්‍යානයෙන් උපේක්ඛා ඒකග්‍රතා නොයෙදේ. ඒ ඒ ධ්‍යානයට අනුව මාර්ගය වෙනස් වේ. ඒ මාර්ගාංග හඳුනාගෙන පටිච්චසමුප්පාද නය ක්‍රමය වටහාගත යුතුය.

## 06 අහේතුක අකුසල විපාක සිත්

කුසල විපාක චේතනාව නිසා හටගත් පටිච්ච සමුප්පාද අංගයන් මෙහි දී පැහැදිළි කෙරුනි. කුසල විපාක වශයෙන් විපාක සිත්, අහේතුක විපාක සිත් 8, සහේතුක කාමාවචර කුසල විපාක 8, රූපාවචර කුසල විපාක 5, අරූපාවචර කුසල විපාක 4, ලෝකෝත්තර විපාක 4 සියල්ල 29 කි. මේ සිත් 29 කුසල විපාක සංඛාර මූලක. කුසලයක විපාකයක් වශයෙන් හටගත් පටිච්ච සමුප්පාද නය ක්‍රමයයි.

අකුසල විපාක සංඛාර මූලක

පෙර ජීවිතයේ පුරුදු කරගත් අකුසල් හෝ මේ ජීවිතයේ පුරුදු කරගත් අකුසල් නිසා පහළ වන අකුසල විපාක සිත්වලට පටිච්ච සමුප්පාද අංගයන් මෙහි දී පැහැදිළි කරයි. මෙහි දී සාකච්ඡා කරනුයේ ඒක චිත්තක්ෂණික වශයෙනි. සහජාත වශයෙන් පහළ වන පටිච්ච සමුප්පාද නය ක්‍රමයයි.

**324. 'කතමෙ ධම්මා.... -පෙ- චක්ඛු විඤ්ඤාණං ...උපෙක්ඛා -පෙ-**

පෙර ජීවිතයේ පුරුදු කරගත් අකුසලයක ප්‍රතිඵලයක් ලෙස උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත රූපාරම්මණයක් අරමුණු කර

ගනිමින් පහළ වේ. එනම් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිතයි. මේ ලෝකයේ සුභ, අසුභ නමින් සම්මතයක් පවතී. සෑම දෙයක්ම සුභ හෝ අසුභ නොවේ. අප්‍රිය, අමනාප අරමුණින් දකින්න ලැබේ නම් එවිට චක්ඛු විඤ්ඤාණ අකුසල විපාක සිත පහළ වේ. ඒ ඒ පුද්ගලයන්ගේ දිට්ඨිය, සංඥාව, සිත අනුව ද වෙනස් වේ. අසූචි දකින විටදී එය අප්‍රසන්න බැවින් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය පහළ වේ. නමුත් ඌරෙකුට, සුනඛයෙකුට අසූචි හොඳ ආහාරයකි. ඒ ආහාරය නිසා කුසල විපාක චක්ඛු විඤ්ඤාණය පහළ වේ. ඒ ඒ පුද්ගලයන්ගේ දැක්ම අනුව සංඥාව අනුව අරමුණ ග්‍රහණය කරගන්නා ආකාරය අනුව කුසල විපාක අකුසල විපාක වෙනස් වේ. රූපාරම්මණයක් නිසා අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත සමඟ පහළ වන නාමධර්ම සියල්ල 7 කි. සිත සමඟ 8 කි. මේ නාම ධර්ම 8 තුළ පවතින පටිච්ච සමුප්පාද නාම ධර්ම හඳුනාගනී නම් '**සංඛාර පච්චයා විඤ්ඤාණ**' චක්ඛු විඤ්ඤාණ චේතනාව නිසා චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. චක්ඛු විඤ්ඤාණ සිත නිසා චක්ඛු විඤ්ඤාණ නාමස්කන්ධ පහළ වේ. චක්ඛු විඤ්ඤාණ නාමස්කන්ධ නිසා චක්ඛු විඤ්ඤාණ මනායතනය පහළ වේ. චක්ඛු විඤ්ඤාණ මනායතනය නිසා චක්ඛු සම්ඵස්සය පහළ වේ. චක්ඛු සම්ඵස්සය නිසා වේදනාව පහළ වේ. වේදනාව නිසා භවය සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම පහළ වේ. මෙහි දී ශ්‍රද්ධාව, අධිමෝක්ඛය පහළ නොවේ. ඒ නාමධර්ම චක්ඛු විඤ්ඤාණ සිත සමග පහළ නොවන බැවිනි. **භව පච්චයා ජාති** සතර නාමස්කන්ධයන්ගේ හට ගැනීම උත්පාදක්ෂණය ජාතිය, ඨිතික්ෂණය ජරාව, භංගක්ෂණය මරණය වේ. මේ ආකාරයට අකුසල විපාක සෝත විඤ්ඤාණ, අකුසල විපාක ඝාණ විඤ්ඤාණ, අකුසල විපාක ජිව්හා විඤ්ඤාණ, විඤ්ඤාණ, අකුසල විපාක කාය විඤ්ඤාණය, යන මේ සිත් හඳුනාගෙන ඒ ඒ අරමුණට අනුව ඒ ඒ සිත්වල පහළ වන පටිච්චසමුප්පාද නය ක්‍රමයන් හඳුනාගත යුතුය. පච්චය චතුෂ්කයේ නය ක්‍රම 4 වෙනම හඳුනාගෙන, එසේම හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ යන චතුෂ්ක පෙර පැහැදිලි කරන ලද ආකාරයටම කුසල විපාක චක්ඛු විඤ්ඤාණවලට අනුරූපවම, අකුසල විපාක චක්ඛු විඤ්ඤාණා දී චක්ඛු විඤ්ඤාණයන් ද

හඳුනා ගත යුතුය. පටිච්චසමුප්පාද අංගයන් සහජාත වශයෙන් උපදින ආකාරය දැක අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් අසුභ වශයෙන් වඩා ඒ තුළින් පහළ වන විදර්ශනා ඥාන ශක්තියෙන් සෝවාන් ආදී මාර්ගඵල නිවන් සුව සාක්ෂාත් කරගත හැකිය.

අකුසල විපාක මනෝ ධාතුව සහ අකුසල විපාක මනෝවිඤ්ඤාණ ධාතු ලෙස තව සිත් 2 ක් පවති. අකුසල විපාක මනෝ ධාතුව යනු අකුසල විපාක සම්පටිච්ඡන සිතයි. අකුසල විපාක වශයෙන් චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යන පංච විඤ්ඤාණ සිත් පහළ විය. අකුසල විපාක වශයෙන් රූපාදි අරමුණක් නිසා පහළ වූ පංච විඤ්ඤාණයන්ගෙන් ගත් අරමුණ හෘදය වස්තුවට භාරදිය යුතුයි. මෙය භාරගනු ලබන්නේ සම්පටිච්ඡන සිතිනි. අකුසල විපාක වශයෙන් පංච විඤ්ඤාණයේ සිතක් පහළ වී නම්, අනිවාර්යයෙන්ම ඒ අරමුණු පිළිගනු ලබන්නේ අකුසල විපාක සිතකිනි. එනම් උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත පහළ වේ. ඒ සම්පටිච්ඡන සිතේ පහළ වන නාම ධර්ම, ඵස්ස, වේදනා, සංඥා, චේතනා ඒකග්‍රතා, ජීවිත ඉන්ද්‍රිය මනසිකාර යන සබ්බ චිත්ත සාධාරණ 7 පහළ වේ. අහේතුක සිතක් නිසා ඡන්දය පහළ නොවේ. උපේක්ඛා සහගත නිසා ප්‍රීති නැත. අහේතුක විපාක සිතක් නිසා වීර්ය නොමැති හෙයින් ප්‍රකීර්ණක 3 ක් යෙදේ. විතක්ක, විචාර, අධිමෝක්ඛය යෙදේ. චෛතසික 10 සිත සමඟ 11 කි. මේ නාම ධර්ම 11 තුළ පහළවන චේතනා සංඛාරයි. සම්පටිච්ඡන චේතනාව නිසා සම්පටිච්ඡන විඤ්ඤාණය පහළ වේ. සම්පටිච්ඡන විඤ්ඤාණය නිසා සම්පටිච්ඡන වේදනාව සංඥා, සංඛාර, නාමස්කන්ධ පහළ වේ. සම්පටිච්ඡන නාමස්කන්ධ නිසා සම්පටිච්ඡන මනායතනය පහළ වේ. සම්පටිච්ඡන මනායතනය නිසා සම්පටිච්ඡන මනෝසම්ඵස්සය පහළ වේ. සම්පටිච්ඡන මනෝසම්ඵස්සය නිසා සම්පටිච්ඡන මනෝසම්ඵස්සජා වේදනාව පහළ වේ. සම්පටිච්ඡන මනෝසම්ඵස්සජා වේදනාව නිසා අධිමෝක්ඛය පහළ වේ. අධිමෝක්ඛය නිසා ඒ සම්පටිච්ඡන නාමස්කන්ධයන්ගේ හටගැනීම පහළ වේ. හටගැනීම යනු උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණයයි. මේ

ආකාරයට පටිච්ච සමුප්පාද අංගයන් ප්‍රගුණ කළ යුතුය. මේ ක්‍රමයට ඉතිරි නය ක්‍රමද පැහැදිලි කරගත යුතුය. ඉතිරි චතුෂ්ක 4 ට නය ක්‍රම 16 ට පෙර සඳහන් විස්තර අනුව පැහැදිලි කරගත යුතුය.

අකුසල විපාක සම්පටිච්ඡන සිතින් යම් අරමුණක් පිළිගත්තා නම්, ඒ අරමුණ තීරණය කරනු ලබන්නේ අකුසල විපාක සංතීරණ මනෝධාතුවෙනි. අකුසල විපාක වශයෙන් මනෝධාතුවක් පහළ වුණා නම්, ඒ මනෝ ධාතුවෙන් පිළිගත් අරමුණ තීරණය කරනු ලබන්නේ අකුසල විපාක මනෝවිඤ්ඤාණ ධාතුවෙනි. උපේක්ඛා සහගත සංතීරණ සිතයි. මේ සිත තුළ පහළ වන චේතනාව සංඛාරයයි. ඒ සංඛාරය නිසා හටගන්නා සංතීරණ සිත විඤ්ඤාණයයි. ඒ සංතීරණ සිත නිසා හටගන්නා නාමස්කන්ධ නාමධර්මයි. සංතීරණ නාමධර්ම නිසා හටගන්නා මනායතනය ඡට්ඨායතනයයි. සංතීරණ මනායතනය හටගන්නා ඵස්සය සංතීරණ මනෝසම්ඵස්සය. සංතීරණ මනෝසම්ඵස්සය නිසා හටගන්නා වේදනාව සංතීරණ මනෝසම්ඵස්සජා වේදනාවයි. සංතීරණ මනෝසම්ඵසසජා වේදනාව නිසා හටගන්නා සංතීරණ අධිමෝක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ හටගැනීමට භවය, උත්පාද, ඨිති, භංගචිත්තක්ෂණයි. සංතීරණ සිතේ උත්පාද, ඨිති, භංග, ජාති ජරා මරණ නම් වේ. මේ ආකාරයට හේතු අඤ්ඤමඤ්ඤ සම්ප්‍රයුක්ත චතුෂ්ක නය ක්‍රම හඳුනාගත යුතුය.

කුසල විපාක වශයෙන් පංචවිඤ්ඤාණ සිත් පහළ වේ. ඒ පංච විඤ්ඤාණ සිත් පිළිගනු ලබන්නේ කුසල විපාක සම්පටිච්ඡන සිතයි. ඒ සම්පටිච්ඡන සිතෙන් පිළිගත් අරමුණ තීරණය කරනු ලබන්නේ කුසල විපාක සංතීරණ සිතයි.

අකුසල විපාක වශයෙන් පංච විඤ්ඤාණ පහළ වී නම් ඒ අරමුණු පිළිගනු ලබන්නේ අකුසල විපාක සම්පටිච්ඡන සිතයි. ඒ සිතෙන් පිළිගත් අරමුණු තීරණය කරනු ලබන්නේ අකුසල විපාක සංතීරණ සිතයි.

ඒ ඒ චිත්තක්ෂණ හඳුනාගෙන ඒ ඒ චිත්තක්ෂණවලට අනුරූපව නාමධර්ම හඳුනාගෙන ඒ ඒ නාම ධර්මයන් සහජාත වශයෙන් උපදින්නට, සහජාත වශයෙන් පහළ වන පටිච්චසමුප්පාද අංගයන් දැක අනිත්‍යාදි වශයෙන් ප්‍රගුණ කළ යුතුය.

පටිච්චසමුප්පාද නය ක්‍රමයට අනුව කුසල් සිත්, අකුසල් සිත්, විපාක සිත් හඳුනාගනු ලැබුණි. ඊළඟට සිත් පිළිබඳව හඳුනාගත යුතුය.

ක්‍රියා සිත් සියල්ල 20 ක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබේ. අහේතුක ක්‍රියා වශයෙන් සිත් 3 ක්, සහේතුක කාමාවචර මහා ක්‍රියා වශයෙන් සිත් 8, රූපාවචර ක්‍රියා 5, අරූපාවචර ක්‍රියා වශයෙන් 4 ක් බෙදා දක්වනු ලැබේ.

**330. කතමෙ ධම්මා අබ්‍යාකතා? -පෙ-**

යම් වෙලාවක මනෝධාතු සිතක් පහළ වේ. ඒ මනෝධාතු සිත ක්‍රියා මාත්‍රා වශයෙන්, කුසල් අකුසල් නොවේ. කර්ම විපාකත් නොවේ. කුසල් නොවූ අකුසල් නොවූ, කුසලා කුසල නොවූ, කර්ම විපාක මනෝධාතුවක් පහළ වේ. එනම් ඒ සිත පංචද්වාරවජ්ජන සිත වේ. චිත්ත විථියක පහළ වන පංචද්වාරාවජ්ජන සිත කුසල් නොවූ, අකුසල් නොවූ, කුසලාකුසල විපාක නොවූ, මනෝධාතු සංඛ්‍යාත ක්‍රියා සිතයි. පංචද්වාරාවජ්ජන සිත උපදින්නේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු 5 ට අනුරූපවයි. මේ සිත මනසිකාර සිත ලෙසද හඳුන්වයි. රූපාදි ආරම්මණයක් පහළ වන්නේ නැත්නම් මේ සිත පහළ නොවේ. එනම් පංචාරම්මණය නිසයි පහළ වන්නේ. මේ සිතේ නාමධර්ම සමුදාය ගත් විටදී සියලුම නාම ධර්ම 11 කි. ඒ සිතේ පහළ වන චේතනාව සංඛාරයි. පංචද්වාරාවජ්ජන චේතනාව නිසා පහළ වන පංචද්වාරාවජ්ජන සිත, විඤ්ඤාණයයි. **විඤ්ඤාණ පච්චයා නාමං,** පංචද්වාරාවජ්ජන සිතේ පහළ වන චේතනාව සංඥා, සංඛාර, නාම ස්කන්ධ තමයි නාමය. **නාම පච්චයා ඡට්ඨායතන,** ඒ පංචද්වාරාවජ්ජන සිතේ පහළ වන මනායතනය ඡට්ඨායතනයයි. පංචද්වාරාවජ්ජන සිතේ පහළ වූ ඵස්සය. ඒ සිතේ පහළ වූ වේදනාව උපේක්ෂා වේදනාවයි. වේදනාව නිසා ඒ සිතේ පහළ වන අධිමෝක්ඛය, **අධිමොක්ඛය පච්චයා භවොඃ** සතර නාමස්කන්ධයන්ගේ හට ගැනීමයි. උත්පාද, ඨිති, භංගය, ජාති ජරා මරණ ලෙස නමිනි. පංචද්වාරවජ්ජන සිතට අනුරූපව ඊළඟ නය ක්‍රමයේ දී, **නාම පච්චයා ඵස්ස,** සතර නාමස්කන්ධ නිසා පංචද්වාරජ්ජන මනෝසම්ඵස්සය පහළ වන ආකාරය පංචද්වාරාවජ්ජන සිත නිසා පහළ

වන නාමරූප චිත්තජ රූපයි සතර නාමස්කන්ධයි. ඒ නාමරූප නිසා උපදින මනායතනය.

ඊළඟ නය ක්‍රමයේ දී, **විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං** පංචද්වාරාවජ්ජන විඤ්ඤාණය නිසා පංචද්වාරාවජ්ජන නාමරූප - චිත්තජ රූපයි නාමස්කන්ධයි පහළ වේ. ඒ නාමරූප නිසා සළායතනය උපදී. සළායතන යනු පංචද්වාරජ්ජන සිතට පෙර පහළ වූ භවාංග සිත සමඟ ආයතන පහළ විය. ඒ ආයතනික කර්මජ රූපයන්ගේ මහාභූත රූප 4 නිසා පංචද්වාරවජ්ජන සිත සමඟ සළායතන පහළ වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** : ඒ පංචද්වාරාවජ්ජන මනායතනය නිසා පහළවන මනෝ සම්ඵස්සය. මේ ආකාරයට පච්චය චතුෂ්කයට අනුරූපව ඉතිරි චතුෂ්ක පැහැදිළි කරගත යුතුය. අහේතුක ක්‍රියා මනෝධාතුවයි පැහැදිලි වූයේ.

අහේතුක ක්‍රියා මනෝවිඤ්ඤාණ ධාතුව, කොටස් 2 කට බෙදේ. සෝමනස්ස සහගත සහ උපේක්ඛා සහගත ලෙසිනි. සෝමනස්ස සහගත හසිතුප්පාද සිතය. මුලින් පංචද්වාරවජ්ජන මනෝධාතුව පැහැදිලි කරන ලදි. ඒ ක්‍රියා සිත පංචවෝකාර භවයේ (පංචස්කන්ධය පවතින) සියලු භවයන්හි උපදී. එනම් මනුෂ්‍යයන්ට, දෙවියන්ට, බ්‍රහ්මයන්ට අපාගත සත්ත්වයන්ට මේ පංචද්වාරවජ්ජන සිත පහළ වේ. රහතන් වහන්සේලාට පමණක් නොවේ. මේ මනෝ විඤ්ඤාණ ධාතුව සෝමනස්ස සහගත හසිතුප්පාද සිත පහළ වන්නේ රහතන් වහන්සේලාට පමණි. රහතන් වහන්සේලාට ජවන් වශයෙන් පහළ වේ. සිනහ පහළ කිරීම් වශයෙන් මේ සිත පහළ වේ. රූපාරම්මණයක්, ශබ්දාරම්මණයක්, ගන්ධ, රස, ස්පර්ශ ධම්ම ආරම්ණයක් නිසා පහළ විය හැකිය. ඒ සිතත් කුසල් නොවේ. අකුසල් නොවේ. කුසල විපාක නොවේ. ක්‍රියා පමණි. ඒ ක්‍රියා සිත තුළ පහළ වන නාම ධර්ම ඡන්දය හැර නාම ධර්ම 12 සිත සමඟ 13 යි. අහේතුක ක්‍රියාසිත් නිසා ඡන්දය පහළ නොවේ. විරිය, ප්‍රීති යෙදේ. (සොමනස්ස සහගත බැවින ප්‍රීති යෙදේ.) මේ නාමධර්ම තුළ පහළවන චේතනාව සංඛාරයි. ඒ චේතනාව පහළවන හසිතුප්පාද සිත විඤ්ඤාණයයි. ඒ හසිතුප්පාද සිත නිසා උපදින නාමස්කන්ධ නාම වේ. චිත්තජ රූප

පහළ වන විට නාමරූප බවට පත්වේ. **නාම පච්චයා ඡට්ඨායතනං** හිදී හසිතුප්පාද සිතේ වේදනා, සඤ්ඤා, සංඛාර නිසා මනායතනය පහළ වේ. සම්ඵස්සය, සෝමනස්ස, වේදනාව, වේදනාව නිසා අධිමෝක්ඛය පහළ වේ. අධිමෝක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය භවය. භවය උත්පාදක්ෂණය, ඨිති, භංග ලෙස පහළ වේ.

**නාමරූප පච්චයා සළායතන** හිදී හසිතුප්පාද සිත නිසා නාමරූප උපදී. චිත්තජ රූප සහ සතර නාමස්කන්ධයි. හසිතුප්පාද පළමු ජවනයට පෙර පහළ වූ වොත්ථපන සිත නිසා පහළ වූ ආයතනික මහා භූත පවති. ඒ මහා භූත නිසා සළායතන පහළ වේ. හසිතුප්පාද දෙවැනි ජවනය ගත් විට පළමු ජවනය හා සමග පහළ වූ මහා භූතයි උපකාරි වන්නේ. මේ ආකාරයට පුරෙජාත මහා භූත රූප උදව් කරගත යුතුයි. මෙයද නය ක්‍රම 16 ට අනුව තෝරා ගත යුතුය.

අව්‍යාකෘත සිත අහේතුක වශයෙන් පහළ වන මනෝ විඤ්ඤාණ ධාතුවකි. මේ සිත ද රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම, අරමුණු 6 නිසා පහළ විය හැකිය. මෙය මෙලෙස සඳහන් වූවාට කොටස් 2 කට බෙදා හඳුනාගත යුතුය. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නැමැති පංචාරම්මණික නිසා උපදින චිත්තවීථි පවති. ඒ චිත්තවීථීන්හි වොත්ථපන වශයෙන් පහළ වන්නේ මේ අහේතුක ක්‍රියා මනෝ විඤ්ඤාණ ධාතුවයි. ධම්මාරම්මණ වශයෙන් වඩනවිට දී මනෝද්වාරික වශයෙන් පහළ වන්නේ මේ අහේතුක ක්‍රියා මනෝ විඤ්ඤාණ ධාතුවයි. මෙහි කෘත්‍ය 2 ක් පවති. උපේක්ඛා සහගත මනෝවිඤ්ඤාණ ධාතුවේ කෘත්‍ය 2 ක් පවති. පංචද්වාරාවජ්ජන චිත්තවීථීන්හි වොත්ථපන කෘත්‍ය සිදුකරයි. මනෝද්වාරවජ්ජන සිත්හි මනෝද්වාරවජ්ජන කෘත්‍ය සිදුකරයි. වොත්ථපන සිත සහ මනෝද්වාරජ්ජන සිත යනු එකම සිතකි. එකම නාමධර්මයි. ඒ යෙදෙන ඒ ඒ අවස්ථා අනුව කෘත්‍ය අනුව වෙනස් වේ. නමුත් කෘත්‍යයෙහි සමානකමක් පවති. පංචද්වාරාවජ්ජන වශයෙන් පහළ වන විට මනෝද්වාරාවජ්ජන වොත්ථපනයෙන් යෝනිසෝ මනසිකාරය අයෝනිසෝ මනසිකාරය සිදුවේ. මනෝද්වාරාවජ්ජන අවස්ථාවේ දී යෝනිසෝ මනසිකාරය හෝ අයෝනිසෝ මනසිකාරය සිදුකරයි. උපේක්ඛා

සහගත මනෝද්වාරාවජ්ජන සිතේ පහළවන නාම ධර්ම, විරිය තිබේ. ප්‍රීති, ඡන්ද නැත. නාම ධර්ම 11 යි සිත සමග 12 කි. මේ නාමධර්ම තුළ පහළවන චේතනාව සංඛාරයි. මනෝද්වාරාවජ්ජන චේතනාව නිසා මනෝද්වාරාවජ්ජන විඤ්ඤාණය පහළ වේ. මනෝද්වාරාවජ්ජන විඤ්ඤාණ නිසා මනෝද්වාරාවජ්ජන නාමස්කන්ධ පහළ වේ. මනෝද්වාරාවජ්ජන නාමස්කන්ධ නිසා මනෝද්වාරාවජ්ජන මනායතනය උපදී. මනෝද්වාරාවජ්ජන මනායතනය නිසා මනෝද්වාරාවජ්ජන මනෝසම්ඵස්සය පහළ වේ. මනෝද්වාරාවජ්ජන මනෝසම්ඵස්සය නිසා මනෝද්වාරාවජ්ජන සම්ඵස්සජා වේදනාව, මනෝද්වාරාවජ්ජන මනෝ සම්ඵස්සජා වේදනාව නිසා මනෝද්වාරාවජ්ජන අධිමෝක්ඛය උපදී. මනෝද්වාරාවජ්ජන අධිමෝක්ඛය නිසා භවය උපදී. සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම. සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම නිසා ජාති, ජරා, මරණ, (උත්පාද, ඨිති, භංග) පහළ වේ.

**'යස්මිං සමයෙ මනො විඤ්ඤාණ ධාතු උප්පන්නා හොති කිරියා'**

කුසල් නොවූ, අකුසල් නොවූ, කර්ම විපාක නොවූ, උපේක්ඛා සහගත සිතක් පහළ වේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ ධම්ම අරමුණු නිසා ඒ සිත උපේක්ඛා සහගත මනෝද්වාරජ්ජන සිතයි. මේ සිතේ නාමධර්ම හඳුනාගෙන පටිච්චසමුප්පාද නය ක්‍රමයේ පච්චය යටතේ නය ක්‍රම 4 ට හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ ආකාර 4 ට ම පැහැදිලි කරගත යුතුය.

කාමාවචර මහා ක්‍රියා, සිත් වශයෙන් 8 ක් පවති. ඒ සිත සෝමනස්ස උපේක්ඛා වශයෙන් ඤාණ සම්ප්‍රයුක්ත, ඤාණ විප්‍රයුත්ත, අසංඛාරික, සසංඛාරික වශයෙන් බෙදේ. පෙර අහේතුක ක්‍රියා සිත් 3 ගැන හඳුනාගන්නා ලදි. ඒ අහේතුක ක්‍රියා සිත් 3 න් පංචද්වාරාවජ්ජනයයි. මනෝද්වාරාවජ්ජනයයි යන සිත් 2 හැමෝටම පහළ වේ. පෘථග්ජන, අරිය, ලෝකෝත්තර භේදයකින් තොරව පංචද්වාරාවජ්ජන වශයෙන් පංචද්වාරාවජ්ජන භූමියේ දී පංචද්වාරාවජ්ජන නොවන භූමියේ දී මේ මනෝද්වාරාවජ්ජන පහළ වේ. හසිතුප්පාද සිත ඇතුළුව මේ කාමාවචර මහා ක්‍රියා, රූපාවචර ක්‍රියා, අරූපාවාචර ක්‍රියා මේ සිත් සියල්ල ප්‍රධාන

පහළ වන්නේ රහතන් වහන්සේලාටය. ඤාණ සම්ප්‍රයුක්ත සිත් බුදුරජාණන් වහන්සේට පහළ වේ. රහත්භාවයට පත් නොවූ අයට දැකිය නොහැකිමුත් කරුණු කාරණා වශයෙන් වටහා ගත යුතුයි.

කුසල් නොවූ, අකුසල් නොවූ, කර්ම විපාක නොවූ, ක්‍රියා මාත්‍ර වශයෙන් මනෝ විඤ්ඤාණ ධාතුවක් පහළ වේ. සෝමනස්ස සහගතයි ඤාණ සම්ප්‍රයුක්තයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම අරමුණක් නිසා ඉපදිය හැකිය. ඤාණ සම්ප්‍රයුක්ත සොමනස්ස සහගත පළමු මහා ක්‍රියා සිත තුළ නාම ධර්ම, කාමාවචර ක්‍රියා සිත තුළ පහළ වන නාම ධර්ම, විරති 3 හැර (සම්මා වාචා කම්මන්ත ආජීව) ඉතිරි නාම ධර්ම 35 පහළ වේ. කරුණා මුදිතා අනියත යෝගී වශයෙන් පහළ වේ. ඒ අරමුණ අනුවයි. රහතන් වහන්සේලාට කරුණා, මුදිතා, පහළ නොවන බව කිව නොහැකිය. අනිවාර්යෙන් පහළ විය යුතුය. සිත සමග නාම ධර්ම 36 කි. මේ නාම ධර්ම 36 තුළ පහළ වන චේතනාව සංඛාරයි. **සංඛාර පච්චයා විඤ්ඤාණං** සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් ක්‍රියා විඤ්ඤාණය පහළ වේ. සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා විඤ්ඤාණය නිසා වේදනාව, සංඥා, සංඛාර, නාමස්කන්ධය, පහළ වේ. ඒ නාමස්කන්ධ නිසා මනායතනය උපදී. මනායතනය නිසා මනෝසම්ඵස්සය උපදී. මනෝසම්ඵස්සය නිසා වේදනාව උපදී. වේදනාව නිසා ශ්‍රද්ධාව උපදී. ශ්‍රද්ධාව නිසා අධිමෝක්ඛය උපදී. අධිමෝක්ඛය නිසා භවය උපදී. සතර නාම ස්කන්ධයන්ගේ හටගැනීම භවය ජාතිය උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය ජරා මරණ වේ.

මේ පළමු සිතට අනුරූපව දෙවැනි නය ක්‍රමයේ දී **නාම පච්චයා ඵස්සො;** සතර නාමස්කන්ධ නිසා මනෝසම්ඵස්සය උපදී. තුන්වැනි නය ක්‍රමයේ දී විඤ්ඤාණ පච්චයා නාමරූපං; නාමරූප පච්චයා ඡට්ඨායතනං; සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික මහා ක්‍රියා සිත නිසා චිත්තජ රූප සතර නාමස්කන්ධ සහජාත වශයෙන් උපදී. නාමරූප නිසා මනායතනය, ඡට්ඨායතනය උපදී. මෙහිදී නාමරූප නම්, මහා ක්‍රියාසිත් චිත්ත වීථියේ ජවන් වශයෙන් පහළ වේ. පළමු ජවනයේ දී නාමරූප නිසා මනායතන පහළ වූවා යනු වොත්ථපන සිත

සමඟ පහළ වූ හෘදය වස්තුව රූපය වනුයේ. සහජාත වශයෙන් පළමු ක්‍රියා ජවන් සිතේ පහළ වූ වේදනා, සංඥා, සංඛාර නාම වේ. ඒ එකතුවෙන් සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික ක්‍රියා මනායතනය පහළ වේ. මනායතනය නිසා මනෝසම්ඵස්සය, වේදනාව, ප්‍රසාදය, අධිමෝක්ඛය, උත්පාද, ඨිති, භංග පහළ වේ.

හතරවෙනි නය ක්‍රමයේ වෙනස : නාමරූප පච්චයා සළායතනං; වොත්ථපන සිත සමඟ පහළ වූ ආයතන පවතී. ඒ ආයතනවල මහා භූත නිසා පළමු ජවන් සිතේ ආයතන පහළ වේ. වෙනසක එපමණයි. මේ ක්‍රමයට පළමු මහා විපාක සිතට අනුරූපව පච්චය, හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ සියලු චතුෂ්ක වෙන වෙනම අවබෝධ කරගත යුතුය.

පළමු සිත ඤාණ සම්ප්‍රයුක්ත හෙයින් ප්‍රඥාව පවතී. දෙවන සිතේ අසංඛාරික, සසංඛාරික භේදයන් නැත. නාම ධර්ම සමානයි. තුන්වන සිතේ, හතරවන සිතේ ඤාණ විප්‍රයුක්ත හෙයින් ප්‍රඥාව නොයෙදේ. ඊළඟ සිත උපේක්ඛා සහගත නිසා ප්‍රීතිය නොයෙදේ. ප්‍රඥාව යෙදේ. ඊළඟ සිතේ ප්‍රීතියක් නැත. ප්‍රඥාවත් නොයෙදේ. මේ නය ක්‍රමවලටම තෝරා ගත යුතුය.

සිත් 8 හඳුනාගෙන, නාම ධර්ම හඳුනාගෙන, ඒ ඒ නාම ධර්ම ඔස්සේ රහතන් වහන්සේලාගේ ජවන් වීථිවල ක්‍රියාසිත් හඳුනාගෙන ඒ ක්‍රියාසිත්වල නාම ධර්ම වෙනම හඳුනාගෙන පටිච්ච සමුප්පාද වශයෙන් ඒ නාම ධර්මයන් හේතුඵල වශයෙන් දැක පොදුවේ වටහාගෙන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් වැඩිය යුතුය. රහත් උතුමන් වහන්සේලාට විශේෂයෙන් නොවඩනා මුත් වඩන අවස්ථා ද පවතී.

රූපාවචර ක්‍රියා, රහතන්වහන්සේ නමක් රූපාවචර ප්‍රථම ධ්‍යානයාදී පංචම ධ්‍යාන සමවදියි. ඒ සමවදින ධ්‍යානවල තිබෙන නාම ධර්ම හඳුනාගෙන ඒවා පටිච්චසමුප්පාද අංග ලෙස පෙර සේ වැඩිය යුතුය.

රූපාවචර ධ්‍යාන, ආකාසානඤ්චායතනාදි ධ්‍යානවලට රහතන් වහන්සේලා සමවදියි. එම ධ්‍යානවල පවතින නාම ධර්මත් හඳුනාගෙන පටිච්චසමුප්පාද නය ක්‍රමය වටහාගත හැකියි.

රූපාවචර ධ්‍යාන සිතේ නාම ධර්ම, පෘථග්ජන කෙනෙක් ධ්‍යානවලට සමවදින විට දී කුසලයක් සිදුවේ. රහතන් වහන්සේ නමක් සමවදින විටදී ක්‍රියාවකි. කුසල අකුසල නොවේ. කුසලාකුසල විපාක නොවේ. ක්‍රියා මාත්‍රයකි. රහතන් වහන්සේලාගේ ප්‍රථම ධ්‍යාන සිතේ පහළවන නාම ධර්ම 34 කි. ද්‍රුතිය ධ්‍යානයේ චතුෂ්ක නය ක්‍රමයට විතක්ක, විචාර 2 ම ඉවත් වේ. පංචම නය ක්‍රමයට විචාර පමණක් ඉවත් වේ. තුන්වන ධ්‍යානයේ දී විතක්ක, විචාර, ප්‍රීති ඉවත් වේ. සතරවන ධ්‍යානයේ සුඛ වෙනුවට උපේක්ඛා යෙදේ. නය ක්‍රම 4 ම හඳුනාගත යුතුයි. මෙය රහත් භූමියට අදාළ වන්නකි. නමුත් කරුණු වශයෙන් දරාගෙන සිටීම නිසා පාරමී බවට පත්වී නිර්වාණ මාර්ගයට උපකාරීවේ.

ක්‍රියා මූලක සංඛාර : මේ ක්‍රමය ක්‍රියා සිත් සම්බන්ධ කරගෙන පැහැදිලි කරනු ලබයි. ඒක චිත්තක්ෂණික සහජාත වශයෙන් කුසල් සිත්, අකුසල් සිත්, විපාක සිත්, ක්‍රියා සිත් පහළ වේ.

මේ සෑම සිතක ම සහජාත වශයෙන් පහළවන විට සහජාත හේතු ඵල තිබේ. ඒ සහජාත හේතු ඵලයි මෙතෙක් පැහැදිලි කරන්නට යෙදුණේ.

**'සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමං -පෙ-** වෙදනා පච්චයා ඇතැම් තැන්වල තණ්හාව අකුසල් කොටසෙහි යෙදුණි. සෝභන සිත් කුසල්හි දී ප්‍රසාද, ඇතැම් තැන්වල අධිමෝක්ඛය ඒ ඒ සිත් අනුරූපව නය ක්‍රමවල හේතුඵල හඳුනාගන්නා ලදි. ප්‍රධාන වශයෙන් බුදුපියාණන් වහන්සේ සූත්‍ර නය ක්‍රමයේ දී දේශනා කරන ලද පටිච්ච සමුප්පාද නය ක්‍රමය නොව, අභිධර්ම නය ක්‍රමයේ දී ප්‍රධාන වශයෙන් පැහැදිලි වන්නේ ඒ ඒ චිත්තක්ෂණවල දී සහජාත වශයෙන් පහළ වන හේතු-ඵල හඳුනාගැනීමයි. ඒ හේතු-ඵල අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වඩන ආකාරය දේශනා කරන ලදි. මෙය චතුෂ්ක 4 ට නය ක්‍රම 16 යටතේ විස්තර කරගත හැකිය.

ඊළඟ මාතෘකාව වෙනස්ය. පච්චය චතුෂ්කය යටතේ පමණක් උපනිශ්‍රය ප්‍රත්‍යයන් පටිච්චසමුප්පාද වඩන ආකාරය පැහැදිලි කරනු

ලබයි. හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ නැත. උපනිශ්‍රය ප්‍රත්‍ය කොටස් 2 කට බෙදිය හැකිය. අතීත කම්ම විඤ්ඤාණය මරණාසන්න ජවන චිත්ත විථියේ පහළ වන 5 වන ජවන චිත්තක්ෂණ සමග කර්ම ශක්තියක් එකතු විය. ඒ 5 වැනි ජවන් චිත්තක්ෂණයේ පහළ වූ විඤ්ඤාණය අතීත කම්ම විඤ්ඤාණයයි. මේ අතීත කම්ම විඤ්ඤාණය නිසා මේ ජීවිතයේ කුසල් අකුසල් පහළ වේ. එය උපනිශ්‍රය ප්‍රත්‍ය වශයෙන් පැහැදිළි කෙරේ. මෙය කෙලින්ම සිත් සමග පහළ නොවේ. සහජාත වශයෙන් පහළ නොවේ. උපනිශ්‍රය වශයෙන් පහළ වේ. මෙහි දී සාකච්ඡා කරනු ලබන්නේ අතීත කම්ම විඤ්ඤාණය සහ උපනිශ්‍රය ප්‍රත්‍යයයි. කුසලයක් කරන විට ඒ කුසල් සිත තුළ අවිද්‍යාව නැත. නමුත් ඒ කුසල් සිත්වලට කලින් අපි තුළ අවිද්‍යාව පවතී. අවිද්‍යාව සම්පූර්ණයෙන්ම රහත් භූමියේ දී නැති වේ. අවිද්‍යාවේ උපනිශ්‍රය නිසා කුසල් කරයි. අවිද්‍යාවේ උපනිශ්‍රය නිසා අකුසල් කරයි. මේ ජීවිතයේ උපනිශ්‍රය ප්‍රත්‍යයයි. අතීත කම්ම විඤ්ඤාණය සමග අවිද්‍යාව මේ ජීවිතයට පැමිණියා. අතීත පහළ වූ අවිද්‍යාව මේ ජීවිතයේ කුසල් අකුසල් පහළ කරගන්නට උදව් වේ. අතීත ජීවිතයේ අවිද්‍යාව වැඩුවේ නැතිනම් අපි රහත් විය යුතුයි. රහත් වී නම් මේ ජීවිතයේ ප්‍රතිසන්ධියක් නොමැත. අතීත ජීවිතයේ අවිද්‍යාව වැඩුවා උපනිශ්‍රය වශයෙන් මේ ජීවිතයේ ප්‍රතිඵල ලැබී තිබේ.

සාදු! සාදු! සාදු!

# නවවන දේශනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

**334 කතමෙ ධම්මා කුසලා? යස්මිං -පෙ- කාමාවචර කුසල චිත්තං සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං -පෙ-'**

## අවිජ්ජා මූලක කුසල නිද්දේසෝ

ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ඒක චිත්තක්ෂණික වශයෙන් පහළවන පටිච්චසමුප්පාද අංගයන් නිවැරදිව පැහැදිලි කර ඉන් අනතුරුව දේශනා කොට තිබෙන්නේ උපනිශ්‍රය ප්‍රත්‍ය නිසා, අතීත හේතූන් මත වර්තමාන පටිච්චසමුප්පාදය හටගන්නා ආකාරය පිළිබඳවයි. පටිච්චසමුප්පාද නය ක්‍රමය සැලකූ විටදී නොයෙක් අවස්ථාවල දී නොයෙක් ආකාරයට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට තිබේ. අතීත භවය, වර්තමාන භවයට සම්බන්ධ කරගනිමින් වර්තමාන භවය, අනාගත භවයට සම්බන්ධ කරගනිමින් පටිච්චසමුප්පාදය දේශනා කොට ඇත. අවිද්‍යා ආදී මුලින් ආරම්භ කොට අග දක්වා යන නය ක්‍රම දේශනා කර ඇත. අග සිට මුල දක්වා මැදින් පටන්ගෙන මුලට යන, මැදින් පටන් ගෙන අගට යන නය ක්‍රම දේශනා කර තිබේ. විශේෂයෙන් අභිධර්ම දේශනාවේ දී, ඒක චිත්තක්ෂණික වශයෙන් එනම් සහජාත වශයෙන් පහළවන සන්තානගත හඳුනාගෙන කුසල් අකුසල්, විපාක, ක්‍රියා සිත් යනාදි එක් එක් සිත් හඳුනාගෙන ඒ සිත් තුළ පහළවන සහජාත පටිච්චසමුප්පාද අංගයන් පිළිබඳවයි මේ දක්වා විස්තර කරන්නට යෙදුණේ.

බුදුපියාණන් වහන්සේගේ දේශනාවට අනුව මෙතැන් පටන්, **අවිජ්ජා පච්චයා සංඛාරා** අවිජ්ජාව හේතු කරගෙන හටගන්නා වූ කුසල සංඛාරය පිළිබඳව විශේෂයෙන් පැහැදිලි කිරීමයි. අකුසල් පහළවන විට අතීත අවිද්‍යාවත් බලපායි. සහජාත වශයෙන් සෑම අකුසල් සිතකම

මෝහ චෛතසිකය සම්ප්‍රයුක්ත වන නිසා අවිද්‍යාව අන්තර්ගත වේ. අකුසලයක් පහළ වන විට අතීත උපනිශ්‍රය ප්‍රත්‍යයක් මෙන්ම වර්තමාන සහජාත අවිද්‍යාවත් පවති. අතීත උපනිශ්‍රය අවිජ්ජාව සහ වර්තමාන සහජාත අවිජ්ජාවක් පවති. නමුත් මෙහි දී කුසල් සිත් 21 පවතී. ඒ කුසල් සිතක් ගානේ සැලකූ විට කුසල් සිතක් සමඟ සම්ප්‍රයුක්ත වන අවිද්‍යාවක් නොමැත. නමුත් අවිද්‍යාව ප්‍රහීන කර නොමැති හෙයින් අවිද්‍යාව කුසල් කිරීමට උපනිශ්‍රය වේ. ඒ උපනිශ්‍රය වන ආකාර 2 ක් පවතී. 1. අතීත කම්ම විඤ්ඤාණ උපනිශ්‍රය, 2. වර්තමාන හේතු

කුසලයක් කරන විට කුසල සංඛාරයක් මතුවන විටදී අවිද්‍යා, තණ්හා, උපාදාන හේතු 3 ක් මතු වේ. මේ හේතු 3 නිසා කුසල සංඛාර පහළ වේ. එබැවින් පටිච්චසමුප්පාදයේ දී අතීත හේතු 5 ක් වර්තමාන ඵල 5 ක්, වර්තමාන හේතු 5 අනාගත ඵල 5 ක් ලෙසින් බෙදා දක්වනු ලැබේ.

ඒ අනුව අතීත වශයෙන් මරණාසන්න ජවන අවස්ථාවේ දී කුසල සංඛාර පහළ විය. ඒ කුසල සංඛාර නැමැති කුසල හේතු, කර්ම ශක්තිය, කම්ම විඤ්ඤාණය නිසා ප්‍රතිසන්ධියක් ලබයි. කම්ම විඤ්ඤාණය සකස් වූයේ අවිද්‍යා, තණ්හා, උපාදාන නැමැති හේතු 3 නිසයි. අවිද්‍යා තණ්හා උපදාන හේතු 3 නිසා සංඛාර කම්ම සකස් විය. ඒ සංඛාර කම්ම සකස් වූ බැවින් ප්‍රතිසන්ධියක් ලබන ලදි. මෙහි ප්‍රධාන හේතුව අවිද්‍යාවයි. රහතන් වහන්සේ මරණාසන්න අවස්ථාවේ දී චිත්තවීථි පහළ වේ. චුති චිත්තක්ෂණය පහළ වේ. නමුත් රහතන් වහන්සේගේ පහළ වන අවසාන ජවන් වීථිය කුසල සංඛාරත් නොවේ. අකුසල සංඛාරත් නොවේ. අවිද්‍යාව කුසල සංඛාරයන්ට සහ අකුසල සංඛාරයන්ට උපකාරී වේ. කුසලා කුසල චේතනා යම්තාක් අපි තුළ පහළ වේ නම්, ඒ සෑම සිතුවිල්ලක් පහළ වන්නේ අවිද්‍යාව පදනම් කරගෙනයි. අවිද්‍යාව හේතු කරගෙනයි. රහතන් වහන්සේ අවිද්‍යාව අරහත් මාර්ග ඤාණයෙන් ප්‍රහීන කළ බැවින්, සම්පූර්ණයෙන් ඡේදනය කළ බැවින්, අරහත් තත්ත්වයට පත්වෙලා ක්‍රියා සිත්වලින් පමණක් ජීවත් වේ. කුසල සංඛාර, අකුසල සංඛාරත් නැත. කුසලා කුසල සංඛාර නොමැති බැවින් මරණාසන්න ජවන අවස්ථාවේ පහළ වනුයේත් ක්‍රියා සිත්ය. චුති චිත්තක්ෂණය පහළ විය. ඒ

ක්‍රියා සිත්වලට නැවත ප්‍රතිසන්ධියක් ලබාදීමට ශක්තියක් නොමැත. අපි කරන කුසලයන්ට කම්ම විඤ්ඤාණය ඒකාන්ත හේතුවක් වන්නේ නැත. අතීත හේතු 5 නිසා විපාක සිත් පහළ වන්නේය. එයයි ප්‍රධාන හේතුව. නමුත් අතීත හේතු 5 හි උපනිශ්‍රය නිසා අපි විසින් කුසල් රැස්කරනු ලබයි. අකුසල් රැස්කරනු ලබයි. මේ ජීවිතයේ කුසල් අකුසල් සිත් පහළ වෙන්නට අතීත හේතු 5 කෙලින් ම හේතුඵල නොවුණාට උපනිශ්‍රය වශයෙන් හේතු වේ. උපනිශ්‍රය වශයෙන් හේතු වූයේ නැතිනම් කුසල් අකුසල් පහළ නොවේ. රහත් වූ පසු ක්‍රියා සිත්වලට **අවිජ්ජා පච්චයා සංඛාරො** ලෙස පටිච්චසමුප්පාදය විස්තර කළ නොහැකිය. අතීතයේ පුරුදු කළ අවිජ්ජාවත්, මේ ජීවිතයේ අවිජ්ජාවත්, කිසිම අවිජ්ජාවක් ක්‍රියා සිතට උපනිශ්‍රය වන්නේ නැත. එබැවින් මෙහි දී කුසල් සිත් පමණක් ගෙන කුසල් සිත්වලට පමණක් අවිද්‍යාව උපනිශ්‍රය වන ආකාරය පැහැදිලි කර බුදුපියාණන් වහන්සේ දේශනා කරන ලද සේක. පටිච්චසමුප්පාදයේ ප්‍රධාන නය ක්‍රම 4 ක් පැහැදිලි කර ගෙන ඇත. ඒ එක් නය ක්‍රමයක් යටතේ අනු කුඩා නය ක්‍රම 4 ක් පවති. පච්චය, හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ මේ නය ක්‍රම 4 න් උපනිශ්‍රය ප්‍රත්‍ය ගැන පැහැදිලි කිරීමේ දී පච්චය චතුෂ්කය පමණයි පැහැදිලි වන්නේ. හේතු, සම්ප්‍රයුක්ත, අඤ්ඤමඤ්ඤ චතුෂ්කයන් ගනු නොලැබේ. හේතුව නම් කුසල් සිත සමග අවිජ්ජාව එකට හේතු නොවන බැවිනි. කුසල සංඛාර සමඟ අවිජාව එකට සම්ප්‍රයුක්ත නොවේ. කුසල සංඛාර සමඟ අවිජ්ජාව ඔවුන් නොවුන් බැඳෙන්නේ නැත. සම්පූර්ණයෙන්ම වෙනස් චිත්ත වීථියකි. '**අවිජ්ජා පච්චයා සංඛාරො**' ලෙස දේශනාවේ සඳහන් වෙද්දී සංඛාර යන මාතෘකාවයි. බුදුපියාණන් වහන්සේ පැහැදිලි කරනු ලබන්නේ අවිජ්ජාව පැහැදිලි කරනු නොලැබේ. නමුත් අට්ඨකතාචාරීන් වහන්සේ පැහැදිලි කරනු ලබන්නේ, අවිජ්ජාව සුත්‍රාන්ත නය ක්‍රමයට තේරුම් ගත යුතු බවයි.

සුත්‍රාන්ත නය ක්‍රමයේ දී අවිජ්ජාව සුත්‍රාන්ත නය ක්‍රමයට තේරුම් ගත යුතු බවයි. දුක්ඛ අඤ්ඤාණං, දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං

ලෙසයි. යම් කෙනෙක් චතුරාර්‍යය සත්‍ය ධර්මයන් සම්පූර්ණයෙන්ම අවබෝධ කර නොගන්නේ නම් ඒ දක්වාම අවිද්‍යාව ගමන් කරයි. සෝවාන් මාර්ගයට පත් උතුමන් වහන්සේලා තුළත් අවිද්‍යාව පවතී. සකෘදාගාමී, අනාගාමී වහන්සේ තුළත් අවිද්‍යාව පවති. නමුත් රහතන් වහන්සේ තුළ පමණයි අවිජ්ජාව නැත්තේ. රහත් මාර්ග ඥානය ලබන තුරා සෑම කෙනෙක් තුළ ම අවිද්‍යාව පවති. අවිද්‍යාව තියෙන තාක් කල් කුසල් වඩයි. අවිද්‍යාව තිබෙන තාක් කල් අකුසල් වඩයි. මෙලෙස අවිද්‍යාවේ උපනිශ්‍රය අවබෝධ කරගෙන ප්‍රායෝගික බැලිය යුතුයි.

දේශනාවේ, පළමු කුසල් සිත සෝමනස්ස සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිතක් පහළ වේ. මේ සිත් රූපාරම්මණය, ශබ්දාරම්මණයක්, ගන්ධාරම්මණයක් රසාරම්මණයක්, ඵොට්ඨබ්බ, ධම්ම යන ආරම්මණයක් නිසා පහළ වේ. යම් කිසි අරමුණක් නිසා පහළ වන කුසලයක් තිබේ. ඒ පහළ වන කුසලය තුළ '**අවිජ්ජා පච්චයා සංඛාරො**, අවිජ්ජාව උපනිශ්‍රය කරගෙන සංඛාර පහළ වේ. මේ අවස්ථාවේ මරණාසන්න ජවනයේදි හොඳින් පැහැදිලි වේ. යම් පුද්ගලයෙක් මේ ජීවිතයේදී දන, ශීල, භාවනා ආදී කුසල් සිහි කරමින් "මේ උදර කුසල් බලයෙන් මට ඊළඟ ජීවිතයේදී මීට වඩා හොඳින් කුසල් රැස්කළ හැකි උතුම් මනුෂ්‍ය ජීවිතයක් ලැබේවායි දිනපතා ප්‍රාර්ථනා කරනු ලබයි.

එය පහළ වූයේ අපතුළ පවතින අවිද්‍යාව නිසායි. චතුරාර්‍යය සත්‍ය අවබෝධ වී තිබුණි නම් එවැනි ප්‍රාර්ථනා සිදු නොකරයි. ඒ ප්‍රාර්ථනා කළ සිතුවිල්ල අනුව අපේ සන්තානයේ මනෝද්වාරික වශයෙන් ලෝභ මූල චිත්ත වීථියක් පහළ විය. ලෝභ-දිට්ඨි සහගත, සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරි, සසංඛාරි ආදී ඒ අවස්ථාවට ගැලපෙන ආකාරයෙන් අවිජ්ජාව සම්ප්‍රයුක්ත වන ජවන් චිත්ත වීථියක් පහළ විය. ඒ ජවන්ගත අවිද්‍යාව නිසා, හැමදාම අවිද්‍යාව පුරුදු කරන ලදි. ඒ ප්‍රාර්ථනා කරන ලද දෙයට ආශාව ඇති කර විය. ආශාව නිසා උපාදනය ඇති විය. තණ්හා උපාදාන මේ දේශනාවේ නොපෙනුනාට අවිජ්ජාව සමඟ තණ්හා, උපාදානය බැදෙයි. තණ්හා, උපාදාන, අවිජ්ජා 3 හේතු වී එකට බැඳී දිනපතාම මේ කුසල් දියුණු කරනු ලබයි. පළමු

දෙවැනි අවස්ථාවේ දී එතරම් අවබෝධයක් නොතිබුණත් නිතර කිරීම තුලින් උද්යෝගය, උනන්දුව ඒ වෙනුවෙන් යොදන සිත බලවත් වේ. සිත් බලවත් වී මරණාසන්න අවස්ථාවට පැමිණේ. ඒ ප්‍රාර්ථනාව සමග බලවත් වූ යම් කිසි කුසලයක් පවතී. හැමදාම එකම ප්‍රාර්ථනාවෙන් කුසල් කරන හෙයින් මීට වඩා හොඳ මනුෂ්‍ය ජීවිතයක් ලැබී ඊළඟ ජීවිතයේ හොඳට පින්කම් කරගැනීම පිණිස භාවනා කර, දන් දී, මලක් පහනක් පූජා කරමින්, කෙනෙකුට උපකාරයක් කරමින් ඒ ප්‍රාර්ථනාව සිදු කරයි. මේ එකම ප්‍රාර්ථනාව නිසා අප්‍රමාණ කුසල් සිදු කරන ලදි. මරණාසන්න අවස්ථාවේ දී ඒ ප්‍රාර්ථනාවට අනුව බලවත් වූ කුසලය, පැමිණෙන්නේය. මලක් පූජා කළ තරමින්, කෙනෙකුට උපකාරයක් කළ පමණින් ප්‍රතිසන්ධි සිතට පැමිණිය හැකි දැයි සිතීමට පුළුවනි. හේතුව නම් ඒ තැනැත්තාගේ ප්‍රාර්ථනාව බලවත්. බලවත් ප්‍රාර්ථනාවට අනුව සිදු වූ කුසලයක් බැවිනි. උදාඃ හැමදාම කෙනෙකුට බුද්ධගයා විහාරය වදින්න දඹදිව යා නොහැක. ජීවිතයේ එක්වරයි යාමට ලැබෙන්නේය. ඇතැම් අය යා නොහැකිව ඒවා සිහිපත්කර වන්දනා කරනු ලබයි. ජීවිතයේ කලාතුරකින් කෙනෙක් එවැනි තැනකට වන්දනා මාන කරන්න ගියේ නම්, ඒ අවස්ථාව ජීවිතයේ උතුම්ම අවස්ථාව බවට පත්වේ. ඒ කරන කුසල කවදාවත් අමතක නොවී, හැමදාම අනුස්මරණය වේ. ප්‍රාර්ථනාව වෙනුවෙන් කරන ලද කුසලය විශේෂයි. ඒ කුසලය බලවත් වී මරණාසන්න මොහොතට ගලා ඒමට හැකියාව තිබේ.

කලාතුරකින් රුවන්වැලිසෑයට මල් පූජා කල කුසලය සිහිපත් වී ප්‍රතිසන්ධිය ලැබූ එක් කථා පුවතක සඳහන් වන පරිදි එක් මනුෂ්‍යයෙක් නිරයට යා යුතුය. එහි දී යමරජ්ජුරුවන් මුණගැසී කුසල් සිහිකර මුත් ඔහුට සිහි නොවීය. "නුඹ දවසක් රුවන්වැලි සෑයට මල් පූජා කර මටත් පින් අනුමෝදම් කළා" කියා කුසලය සිහිපත් කර ඉහළට යැවුහ. කලාතුරකින් කරන ලද විශේෂිත කුසලයක් අනිවාර්යයෙන්ම ජීවිතයේ දී උදව් වේ. කලාතුරකින් කරන්න ලැබෙන කුසල් සිදුකළ යුතුය. එවා මඟ හැරීම නොකළ යුතුය.

මරණාසන්න අවස්ථාවට සංඛාරය, කුසල චේතනාව ගලාගෙන ඒමට හේතු වූයේ අවිජ්ජාවයි. ඒ ජීවිතයේ පුරුදු කරගත් අවිජ්ජාව නිසා කුසල සංඛාර මරණාසන්න අවස්ථාවට පහළ වේ. තවත් පැත්තකින් බැලූ විට මේ ජීවිතයේ දී කුසල් සිදු කරයි. අවිද්‍යාව පදනම් වී මෙම කුසල් සිදු කරනු ලබන්නේ. අපාගාමී වීමට, තිරිසන් සතෙක් වී ඉපදීමට, අප බිය වේ. එවැනි ආත්මයකට යාම, බිය වීම යනු හොඳ ආත්මයට යාමට බලාපොරොත්තු වීමය. හොඳ ආත්මයක් ගැන සිතීම යනු අවිද්‍යාවයි. අවිද්‍යාව යනු අන්ධකාරයයි. ලෝකයේ සත්‍ය වැසීමයි. අවිද්‍යාව නිසා ධන සම්පත් වලින් දියුණු රටවල මිනිසුන් තම ධනය වැය කරමින් දිනපතා අකුසල් රැස්කරනු ලබයි. ඒ අයට නිවැරැදි අවබෝධයක්, ධර්ම මාර්ගයේ ගමන් කිරීමට, සත්පුරුෂ ආශ්‍රයක් ලැබුණි නම්, අප්‍රමාණ කුසල් සිදු කරගත හැකිය. මෙය 'පුරාණය කෑම' ලෙස හැඳින්වේ. පෙර ජීවිතයේ සිදු කරගත් කුසල් නිසා මේ ජීවිතයේ යමක් ලැබුණි. එය තිබෙන තුරු ජීවත් වේ. මේ ජීවිතයේ ලැබුණු දෙයින් ඊළඟ ජීවිතය සඳහා යමක් සිදුකර නොගනී. ඇතැම් මිනිස්සු දීර්ඝායුෂ අවුː 100-120 තරම් විඳිති. නමුත් අකුසල්ම රැස් කරති. ඇතැම් අයට ලෙඩ රෝගාබාධාදිය නැත නමුත් අකුසල්ම රැස් කරති. මේ ජීවිතයේ කරන ලද අකුසල් නිසා නිරෝගී බව හෝ දීර්ඝායුෂ නොලැබේ. පෙර ජීවිතයේ කරගන්නා ලද කුසල් බලයෙන් ඒවා ලැබුණි. නමුත් මේ ජීවිතයේ යමක් සිදු නොකරගත් හෙයින් ඊළඟ ජීවිතය අවාසනාවන්තයි. මේ අනුව පැහැදිළි කරගත යුත්තේ අප විසින් සෑම විටම කුසල් සිදුකරනු ලබන්නේ අවිද්‍යාව පදනම් කරගෙනය. අවිද්‍යාවේ උදව් නොලැබේ නම් කුසල් කළ නොහැක. අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍ය වශයෙන් උපකාරී වේ. කුසල් කිරීමට පළමුවෙන්ම අවිද්‍යාව පැමිණේ. හේතුව නම් තවම මේ ජීවිතයේ අවිද්‍යාව ප්‍රහීන කර නොමැති බැවිනි.

අවිද්‍යාවේ උපනිශ්‍රය හේතුවෙන් කුසල සංඛාරය, චේතනාව පහළ වේ. කුසල චේතනාව නිසා පළමු කුසල විඤ්ඤාණය පහළ වේ. කුසල විඤ්ඤාණය නිසා කුසල නාමස්කන්ධ පහළ වේ. කුසල නාමස්කන්ධ නිසා කුසල මනායතනය පහළ වේ. කුසල මනායතනය නිසා කුසල

මනෝසම්ඵස්සය පහළ වේ. කුසල මනෝසම්ඵස්සය නිසා කුසල වේදනාව, සොමනස්ස වේදනාව පහළ වේ. කුසල වේදනවා නිසා ඒ කුසලය තුළ ශ්‍රද්ධාව පහළ වේ. ප්‍රසාදය නිසා ඒ කුසලයට බැසගැනීම් වශයෙන් අධිමෝක්ඛය පහළ වේ. අධිමෝක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය සිදුවේ. සතර නාමස්කන්ධයන්ගේ උත්පත්තිය යනු ජාතිය උත්පාදක්ෂණය, ඨිතිය ජරාව, භංගක්ෂණය මරණය දක්වා සිත ගමන් කරයි. මෙහි දී වැදගත් වන්නේ උපනිශ්‍රයයි. අවිද්‍යාව පමණයි උපනිශ්‍රය අනික් සියල්ල පෙර සේ අර්ථ සමානයි. කිසිදු වෙනසක් නැත.

දෙවැනි නය ක්‍රමයේ දී **නාම පච්චයා ඵස්සො:** නාමස්කන්ධ නිසා ස්පර්ශය පහළ වේ. තුන්වැනි නය ක්‍රමයේ දී වෙනස **විඤ්ඤාණ පච්චයා නාමරූපං,** කුසල විඤ්ඤාණය නිසා ඒ ජවන් ගත වේදනා, සංඥා, සංඛාර නාමස්කන්ධ සමග චිත්තජ රූප පහළ වේ. **නාමරූප පච්චයා ඡට්ඨායතනං,** වොත්ථපන සිත සමග පහළ වූ හෘදය වස්තු රූපයයි. සහජාත වශයෙන් පහළ වූ නාමස්කන්ධයි. නාමරූප නිසා පළමු කුසල් සිත නැමැති මනායතනය පහළ වේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** ඒ මනායතනය නිසා ස්පර්ශය මනෝසම්ඵස්සය පහළ වේ. කුසල වේදනාව, ශ්‍රද්ධාව, අධිමෝක්ඛය, සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම උත්පාද, ඨිති, භංග යන මේ ධර්මයක් පහළ වේ. හතරවැනි නය ක්‍රමයේ **විඤ්ඤාණ පච්චයා නාමරූපං,** කුසල විඤ්ඤාණය නිසා ඒ කුසල නාමරූප, සහජාත වශයෙන් චිත්තජ රූපයි, වේදනාව සංඥා, සංඛාර, නාමස්කන්ධ පහළ වේ. **නාමරූප පච්චයා සළායතනං,** මෙහිදි රූප යනුහෘදය වස්තුරූපය නොවේ. පෙර **නාමරූප පච්චයා ඡට්ඨායතන** හිදීහෘදය වස්තු රූපය නිසා මනායතනය සලකන ලදි. මෙහි දී රූප යනු යෝනිසෝ මනසිකාර සිත සමග පහළ වූ ආයතනික කර්මජ රූප ඒ ඒ ආයතනයන්හි පිහිටි සතර මහා භූතයන් නිසා පළමු ජවනයේදී ආයතන පහළ වේ. මෙහි දී වොත්ථපන සිත සමග පහළ වූ අධ්‍යාත්මික රූපායතන 5 හි පහළ වූ සතර මහා භූතයන් නිසා පළමු කුසල ජවනයේ දී සළායතන පහළ වූයේ. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** හිදී **නාමරූප පච්චයා සළායතන** වෙන වෙනම හඳුනාගත යුතුය. එකින් එකට සළායතන වෙනස් වේ. චක්ඛායතනයේ දී පහළ වූයේ අතීත චක්ඛායතනය

සතර මහා භූතයන් නිසා සෝතායතනය පහළ වූයේ අතීත සෝතායතනයේ මහා භූතයන් නිසා ඝාණායතනය පහළ වූයේ අතීත ඝාණායතනයේ මහා භූතයන් නිසා ජිව්හායතනය පහළ වූයේ අතීත ජිව්හායතනයේ මහා භූතයන් නිසා කායායතනය පහළ වූයේ අතීත කායායතනයේ මහා භූතයන් නිසා මනායතන පහළ වූයේ අතීත වොත්ථපන සිත සමග පහළ වූ හෘදය වස්තු රූපය නිසයි. ඒ තැන්වල දී වෙනස හඳුනාගත යුතුය. **ඡට්ඨායතන පච්චයා ඵස්සො** යනු හෘදය වස්තු රූපයයි. නාමස්කන්ධයයි නැවත අරමුණු කළ යුතුය. ඒ සහජාත වශයෙන් පහළ වන නාමස්කන්ධයි හෘදය වස්තු රූපයයි නිසා මනායතනය පහළ වේ. මනායතනය නිසා මනෝසම්ඵස්සය, වේදනාව, ශ්‍රද්ධාව, අධිමෝක්ඛය, සතර නාමස්කන්ධයන්ගේ හටගැනීම ජාති ජරා මරණ ඇතිවේ.

මේ පච්චය චතුෂ්කය පමණයි කුසල් සිතක් ගානේ පැහැදිලි කරනු ලබන්නේ පළමු කුසල් සිත තේරුම් ගත් හා සමානව දෙවැනි කුසල් සිතත් හඳුනාගත හැකිය. කුසල් සිදුකරන විට සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්තව, තව කෙනෙකුගේ උදව් ඇතිව, නැතිනම් තමන්ගේ සිතේ මන්ද උත්සාහයෙන් යුතුව කුසල් කරයි. ඒ වේලාවේ කුසල් සිත නුවණ තිබේ නම් ඥාණ සම්ප්‍රයුක්තයි. සෝමනස්ස සහගතයි. සසංඛාරිකයි. මේ කුසලය යටතේ ද අවිද්‍යාව උපනිශ්‍රය වන ආකාරය දැකිය හැකිය. අවිද්‍යාව උපනිශ්‍රය වන ආකාරය පැහැදිලි කරගගෙන කුසල් සිතක් ගානේ පහළ වන පටිච්ච සමුප්පාද ධර්මයන් පච්චය චතුෂ්කය යටතේ පමණක් අර්ථ විග්‍රහ කරගත යුතුය.

තුන්වැනි කුසල් සිත සෝමනස්ස සහගත ඥාණ විප්‍රයුක්ත අසංඛාරිකය. කෙනෙක් කුසල් කරයි සතුටින් නමුත් අවබෝධයක් නොමැත. මේ කුසලය යනු කුමක් ද? දන් දීම සම්බන්ධයෙන්, දෙමාපියන් කුඩා දරුවන්ට දානය පූජා කරන්න යැයි පවසයි. පූජා කරන වේලාවේ දී දරුවාට සතුටක් තිබේ. නමුත් අවබෝධයක් නැත. එබැවින් ඥාණ විප්‍රයුක්තයි සසංඛාරිකයි. දෙමාපියන් කරන දේ දෙස බලා හිඳ පොඩි කාලේ පුරුදු වී කරයි. සතුටෙන් යුක්තව ඥාණ විප්‍රයුක්තව

අසංඛාරික කුසල් සිත් පහළ වේ. අපටත් නුවණින් තොරව කුසල් සිත් පහළ වන අවස්ථා තිබේ. කලබල සහගතව යමක් කරන විට නුවණ යෙදෙන්නේ නැත. අමනාපයකින් යුතුව කුසල් කරන විට නුවණ නොයෙදේ. මේ අවස්ථාවේදී ඥාණ විප්‍රයුක්ත සිත් පහළ වේ. උපෙක්ඛා සහගත කුසල් 4 ක් තිබේ. උපේක්ඛා සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික උපේක්ඛා වේදනාවෙන් යුක්තව නුවණින් යුතුව අසංඛාරික වශයෙන් පහළ වේ. කිසිදු අයෙකුගේ උදව්වීමක්, උනන්දු කරවීමකින් තොරව කුසල් සිත් පහළ වේ. මේ කුසල් සිත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිත. උපෙක්ඛා සහගත ඥාණ විප්‍රයුක්ත සසංඛාරික, අසංඛාරික සිත මේ සෑම කාමාවචර කුසලයක් ගානේම ගත් විට ඒ සෑම කුසලයක් ගානේම අවිද්‍යාව උපනිශ්‍රය වේ. අවිද්‍යාව උපනිශ්‍රය වන ආකාරය නුවණින් දැන නුවණින් වටහාගෙන ඒ ඒ කුසල් සිතක් ගානේ පහළ වන පටිච්චසමුප්පාද අංගයන් දැකිය යුතුය.

රූපාවචර කුසල්, අවිද්‍යාවේ උපනිශ්‍රය පමණයි මෙහි පවතින වෙනස වන්නේ රූපාවචර කුසලයක් සිදු කරයි. දෙව්ලොව ඉපදීමට කැමැත්තක් පවති. කාමාවචර කුසල් සිදු කරයි. බඹලොව ඉපදීමට කැමතියි. එවැනි තැනකට අපේ සිත යොමු වන්නේ අප තුළ පවතින අවිද්‍යාව නිසයි. කෙනෙක් බඹලොව උපදී නම් ප්‍රතිසන්ධි අවස්ථාව පළමුව මරණාසන්න ජවනයේ දී ධ්‍යාන කුසල චිත්ත විථියක් පහළ වේ. ඒ ධ්‍යාන කුසල චිත්ත වීථිය පහළ වූයේ අවිද්‍යාව හේතු කරගෙනයි. භාවනා වඩා ධ්‍යානයක් උපදවාගෙන මේ ධ්‍යාන ශක්තිය හැමදාම පවත්වාගන්නට ශක්තිය ලැබේවායි මේ තුළින් මට හොඳ ප්‍රතිසන්ධියක් ලැබේවායි සිතයි. ඇතැම් අය බඹලොව යෑමට සිතයි. බුදු සසුන තිබෙන කාලයේ දී ධ්‍යාන වඩා බඹලොව යෑමට සිතන පිරිස අඩුයි. බොහෝ දුරට අබුධෝත්පාද කාලවල දී බඹලොව යෑමට මහන්සි ගනියි. බුදු සසුන තිබෙන කාලවල දී ධ්‍යාන උපදවා විදර්ශනා ඥාණ පහළ කරගෙන නිවන් දැකීමටයි උත්සාහ කරනුයේ. නමුත් වැරදි අවබෝධයෙන් යුතු අය ධ්‍යාන උපදවා බඹලොව යෑමට උත්සාහ කරයි. පාරමී පුරාගෙන එන බෝසතුන් වහන්සේලා බොහෝ දුරට බඹලොව යති.

රූපාවචර කුසල්, ප්‍රථම, දුතිය, තතියා, චතුත්ථ පංචමධ්‍යාන වශයෙන් පංචම නය ක්‍රමයට, චතුත්ථ නය ක්‍රමයට ප්‍රථම, දුතිය, තතිය, චතුත්ථ ධ්‍යාන ලෙස වේ. මේ ධ්‍යාන සිත් ගත් විටදී මනෝද්වාරික වශයෙන් ජවන චිත්තක්ෂණ 7 කි. ධ්‍යානයකදී එක් චිත්තක්ෂණයක් පමණි. නමුත් සමාපත්තිවලදී දිගටම යා හැකිය. ධ්‍යාන චිත්ත වීථියට කලින් අවිද්‍යාව නැමැති උපනිශ්‍රය පවතී. මේ ජීවිතයේ මනුෂ්‍යයෙක් වශයෙන් උත්පත්තිය ලැබුවේ පෙර ජීවිතයේ අවිද්‍යාව පුරුදු කරගත් නිසාය. මේ ජීවිතයේ මනුෂ්‍යයෙක් ලෙස උත්පත්තිය ලබා මේ ජීවිතයේ තවම නිවන් නුදුටුවේ නම් අපි තුළ අවිද්‍යාව තවම පවතී. චතුරාර්ය සත්‍ය ධර්මයන් සම්පූර්ණයෙන් අවබෝධ වූ දිනට අවිද්‍යාව සම්පූර්ණයෙන් ප්‍රහීණ වන්නේ ඒ දක්වා අප ළඟ අවිද්‍යාව තිබෙන නිසා, අවිද්‍යාව උපනිශ්‍රය නිසා ධ්‍යාන කුසල් වඩයි. අවිද්‍යා උපනිශ්‍රයක් නොමැතිව ධ්‍යාන කුසල් වැඩිය නොහැකියි. නමුත් අවිද්‍යාව නැතිව නිවන් දැකීමටත් නොහැකිය. අවිද්‍යාව ඇතිව නිවන් දැකීමටත් නොහැකිය. අවිද්‍යා වඩා නිවන් දැකිය නොහැක. අවිද්‍යාව උපනිශ්‍රය කරගෙන නිවන් දැකිය හැක. හොඳ ප්‍රතිසන්ධියක් නොලැබුවහොත් නිවන් දැකිය නොහැකිය. පළමුව හොඳ ප්‍රතිසන්ධියක් ලබාගැනීමට වෙහෙස විය යුතුය. එසේවීමට හොඳ කුසලයක් කරමින් ප්‍රාර්ථනා පිහිටුවා ගනිමින් අවිද්‍යාවෙන් ආවර්ජනය කර ගනී.

අරූපාවචර ධ්‍යාන, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්ඤඤායතන, නේවසඤ්ඤානා-සඤ්ඤායතනය මේ කුසල ධ්‍යාන වඩන අවස්ථාවේ දීත් මේ කියන අවිද්‍යාව උපනිශ්‍රය වේ. අවිද්‍යා උපනිශ්‍රයෙන් තොරව ධ්‍යාන වැඩිය නොහැකිය. සුද්ධෝදන රජුගේ ගුරුතුමා වූ අසිත තාපසතුමා බෝසත් කුමාරයා දුටුව අවස්ථාවේ දී තේරුම්ගත්තා මතු බුදුවන බව. නමුත් පසුව දුක්වුණා තමා ඒ වනතුරු නොසිටන බැවින්. අරූප ධ්‍යාන වඩා වශී කරගෙන අත්හැරීමට බැරිතරම් අවිද්‍යාවෙන් බැඳිලා අනිවාර්යයයෙන් අරූපි ලොව ප්‍රතිසන්ධිය ගනී. අරූප ධ්‍යාන කුසල් ද වඩනු ලබන්නේ අවිද්‍යා උපනිශ්‍රය කරගෙනය. අසිත තාපසතුමා එය අත්හැර සාමාන්‍ය කුසලයකින් දෙව්ලොව හෝ මනුලොව පහළ වුණා නම් බණ අසා නිවන් දැකිය හැකිය.

නමුත් අවිද්‍යාවෙන් බැඳුණු මහිමය නිසා එසේ කළ නොහැකි විය. අපද යමක් ග්‍රහණය කරගත්තා නම් එය අත්නොහරී. එයයි ස්වභාවය. අවිද්‍යාවෙන් ග්‍රහණය කරගත් බැවින් එහි වැරදි, නිවැරදි බව නොතේරේ. අවිද්‍යාවෙන් උපනිශ්‍රය වී කාමාවචර, රූපාවචර, අරූපාවචර කුසල් ලැබෙන්නේය. අවිද්‍යා උපනිශ්‍රයෙන් කුසල් වැඩීම තුළින් නැවත නැවත දුක් කන්දරාවක් ගෙන දෙයි. **එවමෙතස්ස කෙවලස්සස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.** කොපමණ ධ්‍යාන වඩා බඹලොව ගියත් අනිවාර්යයෙන් කළ කුසල් අවසන් වී ධ්‍යාන බලය නිම වූ විට දෙව්ලොවට, මනුලොවට ඒමට සිදුවේ. එසේ පැමිණෙනවා යනු නැවතත් ජාති, ජරා, ව්‍යාධි, මරණ, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක, අප්‍රියන් සමග එකතුවීමේ දුක කැමැති දේ නොලැබීමේ දුක, පංචස්කන්ධ කුඩුව පරිහරණය කිරීමේ දුක යනාදී අනේක විධ දුක් කන්දරාවක් ගලාගෙන ඒමට සිදුවේ. එබැවින් කොපමණ ධ්‍යාන වඩා ඉහළ බඹතලවලට, අරූපී බඹලොව ගියත් නැවත අපි මේ දුක් ගොඩට ගොදුරු වේ.

ලෝකෝත්තර කුසල්, යම්කිසි කෙනෙක් ධ්‍යාන කුසල් විදර්ශනා වඩා සෝතාපත්ති මාර්ගඵල ලබාගනී. ප්‍රථම ධ්‍යානය උපදවා ගනී. පරිකම්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ සෝතාපත්ති මග්ග සෝතාපත්ති ඵල යන අවස්ථාවන්ට පත්වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් සොතාපත්ති මාර්ග අවස්ථාව ගනු ලැබේ. සෝතාපත්ති මාර්ග කුසලය තුළ අවිද්‍යාව නැත. නමුත් අවිද්‍යාව උපනිශ්‍රය වේ. චතුරාර්ය සත්‍ය ධර්මයන් තරමක් දුරට අවබෝධ කරගන්නා ලදී. අවිද්‍යාවේ උපනිශ්‍රය බලයෙන් සෝවාන් මාර්ගය ලබන විට අවිද්‍යාවේ බලය ටිකක් හීන විය. මාර්ග චිත්තක්‍ෂණයේ දී අවිද්‍යාවේ බලය හීන කරනු ලබයි. ඒ අවිද්‍යාවේ බලය හීනවන විටදී ඊළඟ මාර්ගඵලයන්ට එය ශක්තියක් වේ. වෙහෙසී ධ්‍යාන උපදවාගනී, විදර්ශනා ඥාණ, ධර්මයක් අවබෝධ කරගන්න මහන්සි ගනු ලබන්නේ අඩුම තරමේ සෝවාන් වීමේ බලාපොරොත්තුවෙනි. ඒ සෝවාන් මාර්ගඵල ලැබීමේ අදහසින් කුසල් කරන විටදී අවිද්‍යාව උපනිශ්‍රය වේ. මේ අනුව අවිද්‍යා උපනිශ්‍රය සෝවාන් මාර්ගයටත් තිබේ. යමෙක් සෝවාන් මාර්ගය ලබා පසුව සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ග දක්වා යයි.

සකෘදාගාමි මාර්ගය ලබන විටදීත් අවිද්‍යාව උපනිශ්‍රය වේ. අවිද්‍යාවේ බලය අඩුය නමුත් උපනිශ්‍රය පවතී.

සකෘදාගාමි ඉක්මවා අනාගාමී මාර්ගය දක්වා යන විට ද අවිද්‍යාව උපනිශ්‍රය වේ. අර්හත් මාර්ග යන විට උපනිශ්‍රය තිබුණත් අර්හත් මාර්ගයෙන් අවිද්‍යාව ප්‍රහීණ කළා. සම්පූර්ණයෙන්ම චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගනී. උදා: පහන් ආලෝකයෙන් යමක් පරීක්ෂා කරමින් සිටියදී පහනේ තෙල් ඉවර වී නිවී යයි. මෙසේ කිහිපවිටක් කරන විටදී ඉර උදාවී ආලෝකය පැතිරේ. ඒ අවස්ථාවට පහනක් අවශ්‍ය නොවේ. හිරු එළියෙන් දැකිය හැකිය.

සෝවාන් මාර්ග ඥාණ ආලෝකයෙන් චතුරාර්ය සත්‍ය ටිකක් අවබෝධ කරගන්නා ලදි. සකෘදාගාමි මාර්ග ඵල ආලෝකයෙන් තව දුරටත් අවබෝධ විය. අනාගාමි මාර්ග ඥාණ ආලෝකයෙන් වැඩි දුරටත් අවබෝධ විය. හිරු උදාවූවා සේ අතරක් නැර චතුරාර්ය සත්‍ය ධර්මයෙන් සර්ව සම්පූර්ණයෙන්ම අවබෝධ කරගත්තා විය. එනම් අවිද්‍යාව සම්පූර්ණයෙන් ප්‍රහීන කළා විය.

භාවනා යෝගීයෙක් පටිච්චසමුප්පාද නය ක්‍රමයට බැලීමේදී ඒ කුසලය වැඩීමට කලින් බොහෝ දුරට අවිද්‍යා සහගත සිතුවිල්ලක් පහළ වෙයි. තණ්හාව උපදාන කරගත් සිතුවිල්ලක් පහළ වෙයි. කුසලයක් කිරීමට සිත් පහළ වන විටම අනිවාර්යෙන්ම ඒ කුසලය කිරීමට කලින් යම්කිසි සිතුවිල්ලක් පහළ වේ. මේ කුසලය සසරට උපකාර වේ යන වචන මාත්‍රය, සිතුවිලි මාත්‍රය සිතට ගලාගෙන එයි. එනම් අවිද්‍යාවේ උපනිශ්‍රයෙන් තොරව කුසල් කළ නොහැකිය. භාවනා යෝගී යෝගාවචරයෙක් විදර්ශනා භාවනාවේ දී පටිච්චසමුප්පාද අංගයන් නැවත බලන විට දී අවිද්‍යාවේ උපනිශ්‍රය නිසා කුසල් පහළ වන ආකාරය දකින විට පැහැදිලිවම ඒ කුසලය කරන්න මත්තෙන් අවිද්‍යා සහගත සිතුවිල්ලක් පහළවන ආකාරය තමාට දැකිය හැකිය. ප්‍රතිසන්ධි ලැබූ පසු, චිත්තක්ෂණ 17 ගිය පසු මනෝද්වරික ලෝභ මුල සිතුවිල්ලක් පහළ වේ. අවිද්‍යාව තණ්හාවයි, උපාදානයයි ඇතිකරගත්ත මේ භවයට ඇලුම් කරන සිතුවිල්ලක් පහළ වේ. මනෝද්වාරාවජ්ජන ජවන් චිත්තක්ෂණ 7 ලෙස ලෝභ මූල චිත්ත පරම්පරාවක් ඇතිවේ.

මේ චිත්ත විථියෙන් මේ භවයට ඇලුම් කළා ආශා කළා භවය අල්ලා ගත්තා. එහිම අවිද්‍යාව පවතී. ඒ අවිද්‍යාවම සෑම කුසලයකට උපනිශ්‍රය වේ. එතැනින් මේ ජීවිතයේ අවිද්‍යාව ආරම්භ වූ පළමු චිත්ත විථියයි. එතැනින් ආරම්භ වූ අවිද්‍යාව ජීවිතය පුරාවට චුතවන තුරුම උපනිශ්‍රය වේ. මේ ජීවිතයේ නිවන් දුටුවහොත් අවිද්‍යාව උපනිශ්‍රය නොවේ. ක්‍රියා සිත් පහළ වන බැවිනි. යම්තාක් කුසල් වඩනවාද ඒ සෑම කුසලයකටම අවිද්‍යාව උපනිශ්‍රය වේ. අකුසල් වඩවනවාද, ඒ සෑම අකුසලයකට අවිද්‍යාව උපනිශ්‍රය මෙන්ම සහජාත වශයෙන් අවිද්‍යාව යෙදේ.

## කුසල මූලක විපාක නිද්දේසෝ

343 **කතමෙ ධම්මා අව්‍යාකෘත -පෙ- චක්ඛු විඤ්ඤාණං -පෙ'**

කාමාවචර කුසල කර්මයක උපකාරය නිසා චක්ඛු විඤ්ඤාණයක් උපදී. ඒ චක්ඛු විඤ්ඤාණ සිත උපේක්ඛා සහගතයි රූපාරම්මණයක් වශයෙන් උපදින්නේ කුසල විපාක වශයෙනි. '**තස්මිං සමයෙ -පෙ- කුසලමූල පච්චයා සංඛාර පච්චයා විඤ්ඤාණං -පෙ-**' කුසල විපාක උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිතෙහි පහළවන විට පටිච්චසමුප්පාද අංගයන් සම්බන්ධ වන අකාරය. මීට පෙර **සංඛාර පච්චයා විඤ්ඤාණං** ලෙස ආරම්භ විය. නමුත් මෙහි දී **කුසල මූල පච්චයා සංඛාරො** කුසල මූල අලොභ, අදොස, අමොහ නැතිනම්, අලොභ, අදොස කුසල මූලයන්ගේ ප්‍රත්‍යයෙන් උපනිශ්‍රයෙන් උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත පහළ වේ. මේ කුසල මූල පච්චය පෙර ජීවිතයේ පවතී. මරණාසන්න අවස්ථාවේ දී පහළ වූ ජවන් චිත්ත වීථියක්. ඒ පස්වන ජවන් චිත්තක්ෂණය උත්පාද, ඨිති, භංග වෙන විට එතැන කර්ම ශක්තියක් පවතී. එය කම්ම විඤ්ඤාණය ලෙස හැඳින්වේ. මේ කම්ම විඤ්ඤාණය බෙදිය නොහැකිය. මෙය හේතු-ඵල වශයෙන් බලන විට කම්ම විඤ්ඤාණය තුළදී පස්වෙනි ජවන් චිත්තක්ෂණයේ විඤ්ඤාණයයි. නමුත් ඒ කර්ම ශක්තිය එතැන සම්බන්ධ කරගන්න විටදී දියුණු කරගත් කුසල හේතු අකුසල හේතු පදනම් වේ. ඒ බලයෙන්, ප්‍රතිසන්ධිය ලබන්නේ එක අරමුණක්, එක් සිතක් ප්‍රබල වූවාට අනික් හැම කුසල හේතු අකුසල හේතු පදනම් උපස්ථම්භක වී පවතී.

කිසිදු අපහසුවකින් තොරව මරණාසන්න අවස්ථාවේ දී මනුෂ්‍යයින් වශයෙන් කුසල් ජවන් පහළ වීම නිසායි කුසල විපාක ප්‍රතිසන්ධියක් ලබා ඇත්තේ. ඒ මරණාසන්න අවස්ථාවේ දී පහළ වූ 5 වන ජවන් චිත්තක්ෂණයේ පහළවූ කුසල මූල නිසා, කුසල මූල ප්‍රත්‍ය, උපනිශ්‍රය නිසා කුසල විපාක චක්ඛු විඤ්ඤාණ පහළ වේ. කුසල විපාක චක්ඛු විඤ්ඤාණ පහළවීමට හේතු වූයේ මරණාසන්න අවස්ථාවේ දී පහළ වූ කුසල මූල පච්චයයි. මේ චක්ඛු විඤ්ඤාණ සිතු තුළ පවතින චේතනාව සංඛාර. විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණයයි. ඒ හටගත් වේදනා සංඤ්ඤා සංඛාර නාමස්කන්ධයි. චක්ඛුවිඤ්ඤාණය මනයාතනයයි. ඒ තුළඇතිවන ඵස්සය චක්ඛුසම්ඵස්සයයි. ඇති වූ වේදනාව උපේක්ඛා වේදනාවයි. උපේක්ඛා වේදනාවෙන් පසු ඇති වූ සතර නාමසකන්ධයන්ගේ හට ගැනීම භවයයි. භවය නිසා උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය, ජාති, ජරා මරණ පහළ වේ. මේ ආකාරයට කුසල විපාක සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණ, ජිව්හා, විඤ්ඤාණය, කාය විඤ්ඤාණය යන පංච විඤ්ඤාණයන් කුසල මුල ප්‍රත්‍යයෙන් හටගන්නා ආකාරය දැකිය හැකිය. පච්චය චතුෂ්කයේ නය ක්‍රම 4 ට අනුව පැහැදිළි කරගත යුතුය.

**නාම පච්චයා ඵස්සො:** වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන **සතර නාමස්කන්ධ නිසා ඵස්සය ඇති වූ ආකාරය, පච්චය චතුෂ්කය යටතේ 1:2 ප්‍රත්‍ය පද 2 ක පමණයි ගනු ලබන්නේ** චිත්තජ රූප සම්බන්ධ කරනොගන්නා බැවිනි. නමුත් පට්ඨාන නය ක්‍රමයට චිත්තජ රූප නොමැති වූවාට කර්මජ රූපයන් ගෙන් ඒවායේ පහළවීම සිදුවේ. නමුත් පටිච්චසමුප්පාද නය ක්‍රමයේ දී ඒ පංච විඤ්ඤාණයන්හි පළමු නය ක්‍රම 2 පමණයි සලකන්නේ,

**345. කාමාවචරස්ස කුසලස්ස** -පෙ- මනෝධාතු - උපෙක්ඛා සහගත කුසල විපාක වශයෙන් පහළවන පංච විඤ්ඤාණයන්ගෙන් ගත් අරමුණ පිළිගන්නා සිත සම්පටිච්ඡන සිතවේ. මේ සිත රූප, ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන අරමුණු 5 නිසා **සම්පටිච්ඡන සිත** කුසල විපාක වශයෙන් පහළ වේ. කුසල විපාක වශයෙන් පහළ වන සම්පටිච්ඡන සිතටත්

**කුසල මූල පච්චයා සංඛාරෝ,** මරණාසන්න අවස්ථාවේ දී පහළ වූ පස්වන ජවන් ගත කුසලයේ ඇති වූ ඒ කුසල මුල හේතුවෙන් අලෝභ, අදෝස ආමෝහ හෝ අලෝභ අදෝස ඒ ඒ පුද්ගලයන්ගේ ප්‍රතිසන්ධිය අනුව වෙනස් වේ. සම්පටිච්ඡන කුසල විපාක විඤ්ඤාණය පහළ වේ. සංඛාර විඤ්ඤාණ නාම ආදිය පච්චය චතුෂ්කය යටතේ නය ක්‍රම 4 ට තේරුම් ගත යුතුය. **නාම පච්චයා ඡට්ඨායතනං, නාම පච්චයා ඵස්සො,** නාමරූප පහළ වේ. **නාමරූප පච්චයා ඡට්ඨායතනං නාමරූප පච්චයා සළායතනං, ඡට්ඨායතන පච්චයා ඵස්සො** යන නය ක්‍රම 4 ට පැහැදිළි කරගත යුතුය.

දියුණු කරගත් කාමාවචර කුසලයකට අනුරූපව මනෝ විඤ්ඤාණ ධාතුවක් අහේතුක වශයෙන් පහළ වේ. චිත්ත විථියක කුසල විපාක වශයෙන් පංච විඤ්ඤාණ පහළ වී ඒ කුසල විපාක වශයෙන් පහළ වූ පංච විඤ්ඤාණයන්ගේ අරමුණු සම්පටිච්ඡන සිත කුසල විපාක වශයෙන් පහළ වී ඒ සම්පටිච්ඡන සිතින් පිළිගත් අරමුණු තීරණය කිරීම සංතීරණ සිතින් සිදුවේ. සංතීරණ සිත උපේක්ඛා සහගත හෝ සෝමනස්ස සහගත විය හැකිය. සොමනස්ස සහගත සංතීරණ සිත පහළ වුවහොත් එයත් **කුසල මූල පච්චයා** ලෙස පහළ වේ. මරණාසන්න අවස්ථාවේ පහළ වූ කුසල මූල ප්‍රත්‍යයෙන් කුසල සංඛාර පහළ වී ඒ සංඛාර නිසා සම්පටිච්ඡන විඤ්ඤාණය, සම්පටිච්ඡන විඤ්ඤාණය නිසා නාම ස්කන්ධයන්ගේ හට ගැනීම, නාම නිසා මනායතනය, ඵස්ස, වේදනාව සෝමනස්ස වේදනාව එපමණයි වෙනස ප්‍රසාදය නැත. අධිමෝක්ඛය පහළ වේ. උපෙක්ඛා සහගත සංතීරණ සිත පහළ වූ විට වෙනස, උපේක්ඛා වේදනාව පමණි. අනික් සියල්ලක්ම සමානයි. ප්‍රධාන වශයෙන් වෙනස නම්, මරණාසන්න අවස්ථාවේ පහළ වූ පස්වන ජවන් චිත්තක්ෂණයේ ඇති වූ **කුසල මුල පච්චයා සංඛාරෝ** යන කුසල මූළය නිසා යන්නයි.

මහා කුසලයට අනුරූපව මහා විපාක, යම්කිසි කෙනෙක් පෙර ජීවිතයේ දියුණු කරගත් කුසලයක් නිසා මේ ජීවිතයේ හොඳ ප්‍රතිසන්ධියක්, චිත්තවීථිවල තදාරම්මණ වශයෙන් පහළ වන්නේ, මෙය ප්‍රතිසන්ධි අවස්ථාවයි. කෙනෙක් ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලැබුවා නම් ඒ ත්‍රිහේතුක

විපාකයට **කුසල මූල පච්චයා සංඛාරො**, මරණාසන්න අවස්ථාවේ දී ත්‍රිහේතුක කුසලයක් පහළ වී නම් ඒ ත්‍රිහේතුක කුසල හේතු නිසා ත්‍රිහේතුක ප්‍රතිසන්ධි විඤ්ඤාණ තුළ සංඛාර, චේතනාව පහළ විය. ඒ සංඛාර නිසා ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණය පහළ විය. ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණය නිසා නාමස්කන්ධ පහළ විය. ප්‍රතිසන්ධි නාමස්කන්ධ නිසා ප්‍රතිසන්ධි මනායතනය පහළ විය. ප්‍රතිසන්ධි මනායතනය නිසා ප්‍රතිසන්ධි මනෝසම්ඵස්සය පහළ විය. ප්‍රතිසන්ධි මනෝසම්ඵස්සය නිසා ප්‍රතිසන්ධි වේදනාව පහළ විය. ප්‍රතිසන්ධි වේදනාව නිසා ප්‍රතිසන්ධි ප්‍රසාදය පහළ විය. ප්‍රසාදය නිසා අධිමෝක්ඛය පහළ විය. අධිමෝක්ඛය නිසා සතර නාමස්කන්ධයන්ගේ හට ගැනීම භවය පහළ විය. භවය යනු උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භංගක්ෂණය ජාති ජරා මරණ පහළ විය.

දෙවැනි නය ක්‍රමයේ දී මරණාසන්න මොහොතේ දී පහළ වූ කුසල මූල ප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධි සංඛාර පහළ විය, චේතනාව. ඒ ප්‍රතිසන්ධි චේතනාව නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය, ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා ප්‍රතිසන්ධි නාමස්කන්ධ. ප්‍රතිසන්ධි නාමස්කන්ධ නිසා මනෝ සම්ඵස්සය. නාමස්කන්ධ කෙළින්ම මනෝසම්ඵස්සයට සම්බන්ධ වේ.

තුන්වැනි නය ක්‍රමයේ වෙනස, මරණාසන්න ජවන අවස්ථාවේ දී පහළ වූ කුසල මූල ප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධි සංඛාර ඇතිවිය. ප්‍රතිසංඛාර නිසා ප්‍රතිසංඛාර විඤ්ඤාණය. ප්‍රතිසංඛාර විඤ්ඤාණය නිසා ප්‍රතිසංඛාර නාමරූප සහජාත වශයෙන් කර්මජ රූපයි නාමස්කන්ධයි. **නාමරූප පච්චයා ඡට්ඨායතනං** ප්‍රතිසංඛාර නාමරූප නිසා ප්‍රතිසංඛාර මනායතනය ඵස්ස වේදනාව ආදිය පහළ විය.

හතරවන නය ක්‍රමයේ වෙනස, මරණාසන්න ජවන අවස්ථා පහළ වූ කුසල මූල ප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධි සංඛාර පහළ විය. ප්‍රතිසංඛාර නිසා ප්‍රතිසංඛාර විඤ්ඤාණය පහළ විය. ප්‍රතිසංඛාර විඤ්ඤාණය සමඟ නාමරූප පහළවේ. ප්‍රතිසංඛාර නාමරූප නිසා සළායතන පහළ නොවේ. ප්‍රතිසන්ධි අවස්ථාවේ දී සළායතන නැත. නමුත් කෙනෙක් ඕපපාතිකව සත්ත්වයෙක් ලෙස පහළ වී නම් ඒ පුද්ගලයා තුල ප්‍රතිසංඛාර නාමරූප නිසා ප්‍රතිසන්ධි සළායතන පහළ විය. මේ ප්‍රතිසන්ධි චිත්තක්ෂණය අරමුණු කරගත් විටය. ප්‍රතිසන්ධි චිත්තක්ෂණයෙන් පසු පහළවන භවාංග

චිත්තක්ෂණය අරමුණු කරගත් විට මේ හා සමානයි. මේ සත්ත්වයා වැඩුණු පසු පංචද්වාරයෙන් අරමුණු ගන්නා විට දී තදාරම්මණ පහළ වේ. ඒ තදාරම්මණ පහළවන විට සළායතනවල වෙනස පමණයි. එහිදී සළායතන බැලිය හැකිවේ. තදාරම්මණ වන්නේත් මේ කාමාවචර විපාක සිත්මය. සත්වයා වැඩුණු පසු භවංගවීමේ දී භවංග චිත්තක්ෂණවල දීත් සළායතන බැලිය හැකි වේ. කාමාවචර මහා විපාක සිත් 8 සම්බන්ධ කරගන්නා විට එක් පැත්තකින් ප්‍රතිසන්ධි අවස්ථාව තවත් ලෙසක භවංග අවස්ථාව, තවත් ලෙසක චුති අවස්ථාව චුති අවස්ථාවේ දී නාම පමණයි රූප නැත. පළමු නය ක්‍රම 2 පමණි. සාමාන්‍ය චිත්ත විථියක දී තදාරම්මණ අවස්ථාව මේ අවස්ථා 4 ට අනුව මහා විපාක සිත් 8 වෙනම හඳුනාගෙන, නාමධර්ම හඳුනාගෙන අතීත කුසල මූල ප්‍රත්‍යයෙන් ලබන ආකාරය තේරුම් ගත යුතුය.

කාමාවචර විපාක 8 හඳුනාගත යුතුය. සෝමනස්ස වශයෙන් සිත් 4 ක් උපේක්ඛා වශයෙන් සිත් 4 ක් ඊළඟට ඤාණ සම්ප්‍රයුක්ත වශයෙන් 4 න් ඤාණ විප්‍රයුක්ත වශයෙන් 4 ක් වශයෙන් බෙදා දක්වයි. අසංඛාරික වශයෙන් 4 ක් සංසංඛාරික වශයෙන් 4 ක් බෙදා දක්වයි. මේ අවස්ථාවලට අනුව බෙදා තේරුම් ගත යුතුය.

රූපාවචර විපාක, රූපාවචර විපාක යනු බ්‍රහ්ම ලෝකයේ උත්පත්තිය ලැබීමයි. රූපාවචර විපාක සිත් මනුෂ්‍යයින්ට පහළ නොවේ. මේ විපාක සිත් පහළ වන්නේ බ්‍රහ්ම ලෝකයේ ඒ ඒ ප්‍රතිසන්ධි ලැබූ අවස්ථාවේ දී ප්‍රථම ධ්‍යාන බඹලොව ප්‍රථම ධ්‍යාන විපාක සිතින් ද්‍විතිය ධ්‍යාන බඹලොව ද්‍විතියා ධ්‍යාන විපාක සිතින්, තෘතිය ධ්‍යාන බඹලොව තෘතිය ධ්‍යාන විපාක සිතින්, චතුත්ථ ධ්‍යාන බඹලොව චතුත්ථ ධ්‍යාන විපාක සිතින් බඹලොව පහළ වේ. යම්කිසි සත්ත්වයෙක් බඹලොව උපදීමට මත්තෙන් මරණාසන්න අවස්ථාවේ දී ප්‍රථම ධ්‍යාන කුසලය පහළ වේ. ප්‍රථම ධ්‍යාන කුසලය තුළ ප්‍රථම ධ්‍යාන කුසල මුලයක් පහළ විය. ඒ කුසල මුලයක් නිසා ඒ බඹලොව ප්‍රතිසන්ධිය ලබයි. ප්‍රතිසන්ධි සිතේ සංඛාර පහළ විය. ප්‍රතිසන්ධි විඤ්ඤාණය, නාම සමඟ මනායතනය පහළ විය. ඵස්ස, වේදනාව, ශ්‍රද්ධාව අධිමෝක්ඛය පහළ විය. භවය

උත්පාද, ඨිති, භංග පහළ විය. මේ පච්චය චතුෂ්කය යටතේ පළමු සහ දෙවැනි චතුෂ්කය නය ක්‍රමය පැහැදිලිය. තුන්වන නය ක්‍රමයේ දී නාමරූප චිත්තජ රූප පහළ වන බැවින් පැහැදිලි කරගත හැක. හතරවන චතුෂ්කයේදී **නාමරූප පච්චයා සළායතනං**, සළායතන පහළ නොවේ. ආයතන 3 ක් පමණි. මනායතනය, චක්ඛායතනය, සෝතායතනය පමණි.

රූපාවචර බඹලොව ප්‍රතිසන්ධි කෘත්‍යයන් භවාංග කෘත්‍යයන් චුති කෘත්‍යය යනුවෙන් කෘත්‍ය 3ක් දකින්නට ලැබෙන්නේය. යම්කිසි යෝගාවචරයෙන් ප්‍රථම ධ්‍යානය වඩයි. මරණාසන්න අවස්ථාවේ දී ප්‍රථම ධ්‍යානය පහළ වේ. ඒ කුසල මූල නිසා කුසල මූල ප්‍රත්‍යයෙන් ඒ තැනැත්තා ප්‍රථම ධ්‍යාන බඹලොව ප්‍රතිසන්ධිය ලබයි. භවාංග කෘත්‍ය චුති කෘත්‍ය සිදුවේ. ඒ චිත්තක්ෂණයක් පාසා සංඛාර විඤ්ඤාණ නාමරූප ආදිය බැලිය හැක.

දුතිය ධ්‍යාන වඩන යෝගාවචරයෙකුගේ දුතිය ධ්‍යානය මරණාසන්න කුසලයට පැමිණ ඒ මරණාසන්න අවස්ථාවේ දී පහළවන දුතිය ධ්‍යාන කුසල මූල හේතුවෙන් දුතියා ධ්‍යාන බඹලොව ප්‍රතිසන්ධිය ලබයි. මේ ආකාරයට තෘතිය ධ්‍යාන, චතුත්ථ ධ්‍යාන තෝරාගත යුතුය.

අරූපාවචර ධ්‍යානඃ යම්කිසි යෝගාවචරයෙන් අරූප ධ්‍යාන වඩයි. මරණාසන්න අවස්ථාවේ දී අකාසානඤ්චායතන කුසලය පහළ වී. ඒ කුසලය ඇති වූ කුසල මූල ප්‍රත්‍යයෙන් කුසල මූලයන් හේතුකරගෙන ඒ තැනැත්තා අකාසානඤ්චායතන බඹලොව ප්‍රතිසන්ධිය ලබයි. ඒ ප්‍රතිසන්ධිය ලබන අවස්ථාවේ දී ඒ සිතේ චේතනාව සංඛාරයි. ඒ සිත ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. ඒ සිතේ ඇති වූ නාමස්කන්ධයන් නාම වේ. නාම නිසා ඡට්ඨායතනය පහළ වේ. නාමය මනෝසම්ඵස්සයට සම්බන්ධ වේ. වේදනා ආදිය සමානව යෙදේ. වෙනස නාමරූප නොමැති හෙයින් පළමු සහ දෙවැනි නය ක්‍රමයයි. පච්චය චතුෂ්කය යටතේ පැහැදිලි කරගත යුත්තේ විඤ්ඤානඤ්චායතන කුසලය වඩා, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤා කුසලය වඩා මරණාසන්න මොහොතට පැමිණ ඒ ඒ අරූපී තලවල ප්‍රතිසන්ධිය ලබයි. භවාංග කෘත්‍ය, චුති කෘත්‍ය ලබයි. ඒ අවස්ථා 3 ට කුසල මූළ ප්‍රත්‍ය උපකාරය ලබයි. බ්‍රහ්මලෝක තුළත්,

අරූපි තල තුළත් තදාරම්මණ පහළ නොවේ. රූපාවචර විපාක සිත්වලින් සහ අරූපාවචර විපාක සිත්වලින් තදාරම්මණ කෘත්‍ය සිදු නොවේ.

## අකුසල මූලක විපාක නිද්දේදෝ

අකුසල විපාකඃ අකුසල විපාක 7කි. උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා, කාය විඤ්ඤාණ යන ප්‍රධාන විඤ්ඤාණ සිත් 5 මෙහි දී **අකුසල මූල පච්චයා සංඛාරො** යම් වෙලාවක උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණයක් පහළ වේ. අකුසල විපාක වශයෙනි. පටිච්ච සමුප්පාද නය ක්‍රමයේ දී ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලැබූ අයෙකුට පැහැදිලිව ම **කුසල මූල පච්චයා සංඛාරො** යන්න විපාක සිත්වලට සම්බන්ධ කළ හැකි වේ. පස්වෙනි ජවනය භංග වන විට දී කම්ම ශක්තිය පවති. මේ කර්ම ශක්තිය තුළ අකුසල හේතු පවති. අකුසල හේතු ඍජුවම ප්‍රතිසන්ධියට සම්බන්ධ වූයේ නැත. එතැන පහළ වූ කුසල හේතුවම තදින්ම උපනිශ්‍රය වූයේ කුසල විපාකයන්ටය. නමුත් ඒ තුළ අකුසල හේතු පවති.

අපි සසරෙදි රැගෙන ආ අකුසල හේතු පවති. මරණාසන්න ජවන අවස්ථාවේ දී පවතින කුසල හේතුව පැහැදිලිව දකින්න තේරුම් ගත හැකිය. නමුත් කුසල ජවනය භංගවන විට කම්ම ශක්තිය තුළ කම්ම විඤ්ඤාණය තුළ පවතින අකුසල හේතු දකින්නට නොහැක. නමුත් ඒ කම්ම විඤ්ඤාණය තුළ පවතින අකුසල හේතු නිසා අකුසල විපාක වශයෙන් චක්ඛු විඤ්ඤාණය පහළවන බව තේරුම් ගත යුතුය. කුසලයටත් අවිද්‍යා තණ්හා උපාදානයන්හි උපනිශ්‍රය යෙදුණි. ඒ උපනිශ්‍රය පවති. මෙය අපට පෙනෙන්නේ නැත. මෙය වෙන්කර දැකිය හැකි නොවේ. ශක්තියක් වේ.

උදාඃ විදුලි ආලෝකය ගලා එන්නා සේ ශක්ති විශේෂයකි.

කර්ම ශක්තිය අපට පෙනෙන්නේ නැත. නමුත් කර්ම ශක්තිය නිර්මාණය වී පවතින ශරීරය අපට පෙනෙයි. පෙර ජීවිතයේ පුරුදු කරගත් එක් කර්මයක් නොව මහා කර්ම ශක්තියක් පවති. ඒ හැම දෙයකම කර්ම ශක්තිය උපකාරය මේ ජීවිතයේ දී පහළ වන සෑම කුසලයකටත් අකුසලයකටත් කුසල විපාක අකුසල විපාක උපනිශ්‍රය

වේ. ප්‍රධාන වශයෙන් කුසල මූල වන්නේ කුසල විපාක වලටය. අකුසල මූල උපනිශ්‍රය වන්නේ අකුසල විපාකයන්ට ය. චක්ඛු විඤ්ඤාණාදී පංච විඤ්ඤාණ පහළ වන්නේ අකුසල මූල ප්‍රත්‍යයෙනි. අනික් සියලු කරුණු පංච විඤ්ඤාණ සේ පැහැදිළි කරගත යුතුය. මෙහි දීද නාමරූප නය ක්‍රම නොයෙදේ.

අකුසල විපාක මනෝධාතුවඃ අකුසල විපාක මනෝ විඤ්ඤාණ ධාතුව අකුසල විපාක සම්පටිච්ඡන සිතයි. අකුසල විපාක සංතීරණ සිතයි. මේ සිත් 2 න් චිත්ත විථියක දී අකුසල විපාක වශයෙන් චක්ඛු විඤ්ඤාණා දි පංච විඤ්ඤාණ පහළ වූවා නම් ඒ අරමුණ පිළිගන්නා සිත සම්පටිච්ඡන සිතයි.

එ අරමුණ තීරණය කරන සිත අකුසල විපාක සංතීරණ සිතයි. සංතීරණ සිත පච්චය චතුෂ්කය යටතේ නය ක්‍රම 4 ටම තේරුම් කරගත හැකිය. නාමරූප චිත්තජ රූප පහළ වන බැවිනි. සම්පටිච්ඡන සංතීරණ අවස්ථා 2 හිදී චිත්තජ රූප පහළ වන බැවිනි. මෙහි දී වෙනස නම් අකුසල මූල පච්චය පවතින්නේ කොහේද යන්න වටහා ගැනීමයි. මෙය තේරුම් ගත් විට ඒ නිසා සම්පටිච්ඡන, සංතීරණ සිත් පහළවීම තේරුම් ගැනීමට පුළුවන.

අකුසල විපාක සංතීරණ සිතේ පවතින ප්‍රධාන කෘත්‍යය නම් අපායේ ප්‍රතිසන්ධි ගෙන දීමයි. අකුසල විපාක නිසා අපායේ ප්‍රතිසන්ධිය ලැබූ තැනැත්තාට ප්‍රතිසන්ධි, භවංග, චුති වශයෙන් තදාරම්මණ වශයෙනුත් පහළ විය හැකිය. ඒ ඒ අවස්ථානුකූලව තේරුම් ගත යුතුය. මනුෂ්‍යයින්ටත් මේ අකුසල විපාක සංතීරණ සිත, සංතීරණ වශයෙන්, තදාරම්මණ වශයෙන් පහළ විය හැක. ඒ අවස්ථා 2 ම බෙදා තේරුම්ගත යුතුය. ප්‍රතිසන්ධි භවාංග චුති වශයෙන් පහළ වන්නේ නැත.

කුසල විපාක සංතීරණ මීට පෙර සාකච්ඡා කරන ලදි. කුසල විපාක සංතීරණ 2 ක් ඇත. සොමනස්ස සහගත සහ උපේක්ඛා සහගත ලෙස සෝමනස්ස සහගත සංතීරණ සිතට, සංතීරණ වශයෙන්, තදාමරම්මණ වශයෙන් පහළ විය හැක. ප්‍රතිසන්ධියක් ගෙන දීමට හැකියාවක් නැත. උපේක්ඛා සහගත කුසල විපාක සංතීරණ සිතට

සංතීරණ කෘත්‍ය කිරීමටත්, තදාරම්මණ කෘත්‍ය කිරීමටත්, ද්විහේතුක දුබල ප්‍රතිසන්ධියක් අංග විකල, මන්ද බුද්ධික මනුෂ්‍ය ප්‍රතිසන්ධි ලබා දීමට පුළුවන්කම ලැබේ. එසේ ප්‍රතිසන්ධිය ලබා දුන් පුද්ගලයන්ගේ භවාංග, චුති කෘත්‍ය කිරීමට පවා ශක්තිය තිබේ. ඒ ඒ සිත් වෙන වෙනම හඳුනාගෙන, ඒ ඒ කෘත්‍යයන් වෙනම හඳුනාගෙන ඒ කෘත්‍යයන්ට අනුරූපව මේ කියන පටිච්චසමුප්පාද නය ක්‍රමය තේරුම්ගත යුතුය.

ලෝකෝත්තර විපාකඃ ලෝකෝත්තර කුසලයක් වැඩුවා නම්, ඒ කුසල චිත්තක්ෂණයෙන් ඊළඟ චිත්තක්ෂණය ඵලය වේ. සෝවාන් මාර්ග චිත්තක්ෂණය ලබා ඊළඟ චිත්තක්ෂණය ඵලය වේ. මාර්ගය කුසලය. ඵලය විපාකයි. ඵලය ලබන අවස්ථාවේ දී **කුසල මූල පච්චයා** වේ. එය පැහැදිළිය. සෝතාපත්ති මාර්ග සිතේ පහළ වූ අලෝභ, අදෝස, අමෝහ නැමැති කුසල මූල නිසා තමයි. කුසල මූල ප්‍රත්‍යයෙන් සෝතාපත්ති ඵල සිතේ සංඛාර පහළ විය. ඒ වේලාවේම දැකිය හැකි බැවින් ඉතා පැහැදිළි කරුණකි. සෝතාපත්ති මාර්ග සිතේ කුසල සහජාත වශයෙන් පහළ විය. ආසේවන වශයෙන් උපනිශ්‍රය වශයෙන් පහළ විය. සෝතාපත්ති මාර්ග චිත්තක්ෂණය, සොතාපත්ති ඵලයට ආසේවනය නොවේ. ආසේවනය යනු ජවනයෙන් ජවනයට අසේවනය වීමයි. කුසලයෙන් විපාකයට උපනිශ්‍රා විය. කෙළින්ම විපාකය ලැබුවා සෝතාපත්ති මාර්ග සිතේ පහළ වූ කුසල හේතු නිසා සෝතාපත්ති ඵල සිතේ චේතනාව සිත ආදිය පහළ විය. සකෘදාගාමි මාර්ග සිතේ පහළ වූ කුසල මූල නිසා සකෘදාගාමි ඵල සිතේ චේතනා විඤ්ඤාණාදිය පහළ විය. අනාගාමි මාර්ග සිතේ පහළ වූ කුසල හේතු නිසා අනාගාමි ඵල සිතේ චේතනා විඤ්ඤාණාදිය පහළ විය. අර්හත් මාර්ග සිතේ කුසල මූලයන් නිසා අර්හත් ඵල සිතේ චේතනා විඤ්ඤාණාදිය පහළ විය. සෝවාන් ආදි මාර්ග කුසලයන්ට අවිද්‍යාව උපනිශ්‍රය විය. සෝවාන් ඵල ආදි ඵල චිත්තයන්ට මාර්ග සිතේ කුසල මූලයන් උපනිශ්‍රය විය.

බුදුපියාණන් වහන්සේ විසින් සෑම සිතක් ගානේම විස්තර කරන ලද පටිච්චසමුප්පාද නය ක්‍රමය පැහැදිළි කරන ලදි. අභිධර්ම ක්‍රමයට දේශනා කරන ලද පටිච්චසමුප්පාද නය ක්‍රමය නිමවිය. පටිච්චසමුප්පාද

විභංගය නිමාවට පත්විය. බුදුපියාණන් වහන්සේ දේශනා කරනු ලබන්නේ මේ පටිච්චසමුප්පාද ධර්මයන් පිළිබඳව අවබෝධයක් ලැබූ තැනැත්තාට නිවන් දැකිය හැකි බවයි.

මෙතකින් රැස්කර ගන්නා ලද පුණ්‍ය සම්භාරය ඔබ අප නමින් මියගියා වූ සියලුම ඥාති වර්ගයා මේ උතුම් කුසල් දකිත්වා, අනුමෝදන් වේවා, තම දෝතින් කරගත් පිනක් සේ සාදු කියා අනුමෝදන්ව ඒ සැමදෙනාගේම පරලොව ජීවිත වාසනාවන්ත වේවා, සුගතිගාමී වේවා! භවයක් පාසා සුගති සැප විඳ ප්‍රාර්ථනා කරන බෝධියකින් අමාමහ නිවනින් සැනසෙත්වා.

අපවත්, බුදු සසුනත් සුරකින සම්‍යක් දෘෂ්ඨික දිව්‍ය රාජ පිරිස මේ උදාර කුසල් දකිත්වා. අනුමෝදන් වේවා දෙවියන්ගේ දැහැමි රැකවරණය අපටත් බුදු සසුනටත් සැලසේවා, හැදූ වැඩූ දෙමාපියන්ට සහෝදර සහෝදරි ඥාති හිතවත් සැම දෙනාටත් බුදු සසුනටත් දිව්‍ය ආරක්ෂාව සලසා දෙමින් දෙවියො පාරමී පුරා පැතුම් පරිදි නිවනින් සැනසේවා, අපට හිතවත් අහිතවත් මැදහත් සියලු සත්ත්වයන්ටත් මේ පූජනීය ස්ථානය පටන් අවට නිවෙස්, ගම්, නගර, සමස්ථ ලෝකවාසි සියලු සත්ත්වයන්ටත් නිවන් අවබෝධය පිණිස උපකාරී වේවා,

අවසාන වශයෙන් ඔබ අප සැමදෙනා ප්‍රාර්ථනා කරන ආකාරයට නිවන් මග සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා කියන ආකාරයට මුදුන් පමුණුවා ගන්නට ලැබේවා. ගන්නා වූ හුස්ම රැල්ලක්, තබන පියවරක් පාසාම සතර සතිපට්ඨාන ආදී සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් දසපාරමී ධර්මයන් වැඩේවා සුවසේම පාරමී මග මුදුන් පමුණුවා ගන්නට ලැබේවා මතු ජාති ජාතින්හි සත්පුරුෂ කල්‍යාණ මිත්‍ර ආශ්‍රයන් සීල සමාධි ප්‍රඥා ධ්‍යාන සමාධි සමාපත්ති අභිඥා විපස්සනා ඤාණ පිළිවෙලින් බෝධි සම්භාර තම තමන්ගේ ප්‍රාර්ථනා කරන පාරමී මග මුදුන් පමුණුවා ගන්නට ලැබේවා සුවසේම පාරමී පුරාගෙන ප්‍රාර්ථනා කරන බෝධිවලින් අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණි වැඩ වදාළ අජරාමර ශාන්ත ප්‍රණීත ලෝකෝත්තර අග්‍ර අමාමහ නිර්වාණ ශාන්තිය

පිණිස මේ උතුම් කුසල් එකසේ හේතු උපනිශ්‍රය වේවා, මෛත්‍රියෙන් තම තමන්ට ආශිර්වාද ප්‍රාර්ථනා පිහිටුවා ගනිමු.

**ඉදං වො ඤාතීනං හොතු.........///**

**ආකසටඨා ච භුමමටඨා ........**

**ඉමිනා පුඤ්ඤ කමෙමන...........**

**ඉදං මේ පුඤ්ඤ කමමං ආසවක්ඛයා වහං හොතු සබ්බ දුක්ඛා පමුඤ්ඤවතු**

**ඉදං මේ පුඤ්ඤ කමමං නිබ්බානසස පචචයො හොතු**

**මම පුඤ්ඤ භාගං සබ්බ සතථානං භාපෙමි තෙ සන මෙ සමං පුඤ්ඤ භාගං ලබනතු**

සාදු! සාදු! සාදු!